බ. අ. ජා. ස. ශාලාව
කොළඹ.
2006 මැයි 22 දින.

ගරු අනුර බණ්ඩාරනායක මහතා.
සංචාරක අමාත්‍ය
අංක 64, ගාලු පාර.
කොළඹ 3.

මහත්මයාණනි.

සංචාරක ව්‍යාපාරයේ ධරණීය සංවර්ධනය කරා ඉදිරිගමනකට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, නව සංචාරක නීතිය (2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත) සමාලෝචනය කර බැලීම සඳහාත් අමාත්‍ය මණ්ඩලය විසින් අප විශේෂ කමිටුවකට ඔබ තුමාගේ නිර්දේශය පරිදි පත් කරන ලදි. අපගේ වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමු.

මෙයට - විශ්වාසී

අ/කලේ. එච්.එම්.එස්. සමරනායක, සභාපති
(සංචාරක මණ්ඩලයේ හිටපු සභාපති සහ
ස්වයං සේවයේ නියුතු සංචාරක උපදේශක)

අ/කලේ. අශෝක ගුණවර්ධන, සාමාජික
(මුදල් කොමිෂන් සභාවේ සභාපති සහ
ස්වයං සේවයේ නියුතු කළමනාකරන උපදේශක)

අ/කලේ. විනිසුරු රංජිත් ධීරරත්න, නීති උපදේශක
(ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිසුරු)

# පටුන


| මාතෘකාව | පිටුව |
|---|---|
| වැදගත් කරුණු පිළිබඳ සාරාංශය | v - vii |
| 1. වැනි පරිච්ඡේදය - පසුබිම් තොරතුරු | 1 |
| 1.1 හැඳින්වීම | 1 |
| 1.2 තිර්ණේය විෂයය | 3 |
| 1.3 කමිටු වැඩකටයුතු ආරම්භ කිරීම. | 5 |
| 1.4 ආරම්භක වාර්තාව | 7 |
| 1.5 කාර්ය සැලැස්ම සහ ක්‍රමවේදය | 9 |
| 1.6 වාර්තාවේ ව්‍යුහය | 11 |
| 1.7 ස්තුතිය | 12 |
| 2 වැනි පරිච්ඡේදය - ශ්‍රී ලංකා (ලංකා) සංචාරක මණ්ඩලය. එහි සවිබලතාවයන් සහ දුර්වලකම් (නි.වි.1) | 12 |
| 2.1 හැඳින්වීම | 12 |
| 2.2 මණ්ඩලයේ ආරම්භක පියවරවල් | 14 |
| 2.3 මණ්ඩලයේ පහසුකම් සැලසීමේ කාර්යයන් | 17 |
| 2.4 මණ්ඩලයේ නිෂ්පාදිත සංවර්ධන කාර්යයන් | 18 |
| 2.5 මණ්ඩලයේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන් | 22 |
| 2.6 මණ්ඩලයේ නියාමන කාර්යයන් | 24 |
| 2.7 මණ්ඩලයේ සංඛ්‍යාලේඛන සහ පර්යේෂණ කාර්යයන් | 26 |
| 2.8 දේශීය සංචාරක වයාපාරයේ සහ ප්‍රජා සම්බන්ධතා කාර්යයන් | 27 |
| 2.9 මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධන කාර්යයන් | 28 |
| 2.10 මණ්ඩලයේ සවිබලතාවයන් සහ දුර්වලකම්. | 29 |
| 3 වැනි පරිච්ඡේදය - ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (කලින් පැවති ලංකා හෝටල් පාසල) ඓතිහාසික සමාලෝචනය. | 34 |
| 3.1 හැඳින්වීම | 34 |

3.2 එහි ආරම්භය 34

3.3 සංචාරක මණ්ඩලයේ කළමනාකරණය යටතේ පවතින හෝටල් පාසල 37

3.4 හෝටල් පාසල විවිධ පරිශ්‍රයන් වෙත ගෙනයාම 39

3.5 හෝටල් පාසල පෞද්ගලීකරණය කිරීමේ ප්‍රයත්නයන් 41

3.6 සංචාරක මණ්ඩලයේ කළමනාකරණය යටතේ හෝටල් 42

3.7 හෝටල් පාසල වෙනුවෙන් ස්ථිර වාසස්ථානයක්. 44

3.8 හෝටල් පාසලේ කළමනාකරණය දෙවැනි වරටද වෙනස්වීම. 45

3.9 තෙවැනි වරටත් සංචාරක මණ්ඩලයේ කළමනාකරණය යටතට යළි පත්වීම. 45

3.10 තීරණ සහ නිගමන 51

4 වැනි පරිච්ජේදය - සංචාරක ව්‍යාපාරය කළමනාකරණය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය පිළිබඳ කලින් පැවති යෝජනා සම්බන්ධයෙන් සමාලෝචනය. 53

4.1 හැඳින්වීම 53

4.2 ඓතිහාසික සම්බන්ධතාවය 54

4.3 1994-2000 කාල පරිච්ජේදය තුළ ඉදිරිපත් කළ යෝජනා 57

4.4 2001 සිට 2004 දක්වා කාලපරිච්ජේදය තුළ දරන ලද ප්‍රයත්නයන්. 64

4.5 නිගමන 72

5 වැනි පරිච්ජේදය - 2005 අංක 5 දරන සංචාරක කටයුතු පනත විචාරාත්මක සමාලෝචනයක්. (නි.වි. 2) 73

5.1 හැඳින්වීම 73

5.2 2003 අංක 25 දරණ මුදල් පනත සහ බදු මුදල් නියම කිරීම 73

5.3 සංචාරක සංවර්ධන අරමුදල සහ අමතර අයවැය මුදල් සැපයීම. 76

5.4 රාජ්‍ය වැය කළමනාකරණය පාලනය කිරීම 80

5.5 සංචාරක වියදම් පිළිබඳ විශිෂ්ට පිළිවෙත් සඳහා පාදක ව්‍යුහය. 85

6 වැනි පරිච්ජේදය - 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත විචාරාත්මක සමාලෝචනයක්. (නි.වි. 3) 88

6.1 හැඳින්වීම 88

6.2 සංචාරක කටයුතු පනතින් ලබාගැනීමට අපේක්ෂා කරන්නේ කුමක්ද? 89

6.3 කළමනාකරණ මණ්ඩලවල සංයුතිය. 89

6.4 සම්බන්ධීකරණ ගැටලු 96

6.5. සංචාරක සංවර්ධන අරමුදල සහ 2003 අංක 25 දරණ මුදල් පනත 97

6.6 ලංකා සංචාරක මණ්ඩලයේ සාමාජිකයන්, නිලධාරීන් සහ සේවකයන් 98

6.7 නිගමන. 99

7 වැනි පරිච්ජේදය - ඉදිරි ගමන (නි.වි. 4) 99

7.1 හැඳින්වීම. 99

7.2 මහින්ද චින්තනය. 101

7.3 ප්‍රධාන සංචාරක කාර්යයන්. 103

7.4 යෝජිත ආයතනික සැකැස්ම 107

7.5 සංචාරක උපදේශක කමිටුව. 110

7.6 මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සහ අංශ. 111

7.7 සංචාරක සංවර්ධන අරමුදල. 111

7.8 සංචාරක සංවර්ධන ප්‍රදේශ. 113

7.9 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ iv කොටස, ix වැනි පරිච්ජේදය. 113

7.10 ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය 114

7.11 ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය. 115

පරිශිෂ්ට

(අ) පරිශිෂ්ටය - කාර්ය සැලැස්මේ සාරාංශය 119

(ආ) පරිශිෂ්ටය - තොරතුරු ලබාගැනීමට භාවිතා කල ලිපිලේඛන පිළිබඳ ලැයිස්තුව. 121

(ඇ) පරිශිෂ්ටය - කරුණු දැක්වීම ඉදිරිපත් කළ සංගම්, රජයේ නියෝජිත ආයතන සහ පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුව. 123

(ඈ) පරිශිෂ්ටය - 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත පිළිබඳ නෛතික මතය. 125

අතිරේකයන් :

(අ) අතිරේකය - අතීතයේ සැකසූ නීති සම්පාදන කෙටුම්පතේ පිටපත්

(ආ) අතිරේකය - යෝජිත නව නීති සම්පාදනය

1 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතේ සංශෝධන

2 සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය - නව පනත් කෙටුම්පතකි

## වැදගත් කරුණු පිළිබඳ සාරාංශය

ප්‍රධාන වශයෙන් 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතේ ද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේද ක්‍රියාත්මක නොකරන ලද 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ ඇතුලත් යෝජිත නීතියේද අන්තර් ගතව ඇති සංචාරක ව්‍යාපාරය පිළිබඳ පවතින වර්තමාන නීතිය සම්බන්ධයෙන් සමීප අධ්‍යයනයක් සිදු කිරීමේ අවස්ථාව කමිටුවට ලැබුණි. කොටස්කරුවන්ගේ සංගම්වල නිලධාරීන් සහ අදාළ රාජ්‍ය හා පෞද්ගලික සංවිධානවලින් තෝරාගත් පුද්ගලයන් කිපදෙනෙකු හමුවී එම අය සමඟද සංචාරක ව්‍යාපාරයේ විවිධ කාර්යබද්ධ අංශ පිළිබඳව සාකච්ඡා කිරීමේ අවස්ථාවක්ද කමිටුව විසින් ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ සියලුම රාජ්‍ය ආයතන ආරම්භයේ පටන් එම ආයතනවල කටයුතු කිරීම තීරණේය විෂයය පිළිබඳ අවශ්‍යතාවන් ගැන ඵලදායක ලෙස විමසා බැලීමේ කාර්ය සඳහා කමිටුව විසින් දැඩි සුපරීක්ෂාවකට භාජනය කරන ලදී. ඉහත සඳහන් කරන ලද කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සඳහා විශිෂ්ට ඉදිරි ගමන වෙනුවෙන් පහත සඳහන් නිර්දේශ කමිටුව ඉදිරිපත්කර සිටී.

සියලුම කරුණු සලකා බැලීමේදී 1966 අංක 10 දරන සංචාරක මණ්ඩල පනත යටතේ සංස්ථාගත කරන ලද සංචාරක මණ්ඩලය ආරම්භයේ පටන් සතුටුදායක අන්දමින් කටයුතු කරන බවත්, සංචාරක ව්‍යාපාරය පිළිබඳ අද පවතින නීති ව්‍යුහය සම්බන්ධයෙන් වෙනස් කිරීම් කීපයක් පමණක් සිදු කිරීමට අවශ්‍ය බවත් කමිටුව අදහස් කරයි.

2005 අංක 38 දරණ නව සංචාරක කටයුතු පනත මගින් නිර්මාණය කිරීමට අපේක්ෂා කළ යෝජිත නෛතික ආයතන සංඛ්‍යාව වැඩි කිරීම උචිත නොවන බවත්, එය අනවශ්‍ය අධික වියදම් දැරීමට සිදුවන කටයුත්තක් වන බවත් කමිටුවේ අදහසවේ.

සංචාරක "නිෂ්පාදිත සංවර්ධනය" "සංචාරක ප්‍රවර්ධනයෙන්" වෙන්කළ නොහැකිවන අතර එම කාර්යයන් දෙක අවශ්‍යයෙන්ම හා සහේතුකව එක් නෛතික ආයතනයක් මගින් ඉටුකළ යුතුය. (රුස්වීම්, සංචාරක කටයුතු දිරිගැන්වීම, සම්මේලන සහ ප්‍රදර්ශන) පිළිබඳව දැනට කටයුතු කරනු ලබන්නේ සමාගම් පනත යටතේ සංස්ථාගත කර ඇති වගකීම් ඉටු කිරීමට බැඳී සිටින සීමාසහිත සමාගමක්

වන ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය මගින් වන අතර, එම කාර්යාංශයේ කටයුතු අලුතින් පිහිටුවනු ලබන නෛතික ආයතනයකට පැවරීමට හේතුවක් ඇති බව කමිටුවට නොපෙනේ.

හෝටල් පාසල සහ සංචාරක පාසල මෙතෙක් සංචාරක මණ්ඩලයේ කළමනාකරණය යටතේ මැනවින් ක්‍රියාත්මක වන අතර, උසස් අධ්‍යාපන මට්ටමක් ඇති කිරීමේ වැදගත්කම සහ විශේෂයෙන් පාසල සංවර්ධනය වන මෙම අවධියේදී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි පාසලේ පාඨමාලාවල ඇතුලත් කරුණු වැඩිදියුණු කිරීම පිළිබඳව සලකා බැලීමේදී වෙනස් ආකාරයෙන් පිහිටුවනු ලැබූ කළමනාකරණ මණ්ඩලයක් යටතේ පාසල වෙනම නෛතික ආයතනයක් වශයෙන් කටයුතු කළ යුතු බව නිර්දේශ කිරීමට අවශ්‍ය වන බව කමිටුව අදහස් කරයි. මේ සඳහා අවශ්‍ය නීති සම්පාදන කෙටුම්පත මෙම වාර්තාවේ "ආ" අතිරේකයේ දැක්වේ.

සංචාරක සංවර්ධන අරමුදලක් පිහිටුවීම පැසසිය යුතු බව කමිටුවට පෙනියන අතර (අ) අවශ්‍යතාවලට අනුව අරමුදල් වියදම් කිරීමට වඩා යෝජිත නීතිය මගින් කලින් තීරණය කරනු ලබන අනුපාත ප්‍රමාණයන් අනුව අරමුදල් වියදම් කිරීම සහ (ආ) අරමුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂාකර බැලීම් සහ වගකීම නොමැතිකම පිළිබඳව යළි සලකා බැලීමට අවශ්‍ය බව කමිටුවේ අදහසය. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, සංචාරක විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් සහ සංචාරක මණ්ඩලයේ සභාපති යන අයගෙන් සමන්විත විශේෂ කමිටුව මගින් තීරණය කරනු ලබන පරිදි සංචාරක මණ්ඩලය, හෝටල් පාසල පවත්වාගෙන යාමට නිර්දේශකර ඇති ආයතනය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය අතර වැයවීම් පියවීමට වාර්ෂිකව අරමුදල් සපයාදිය යුතු බව කමිටුව නිර්දේශ කරයි. විශේෂ කමිටුව විසින් ආයතන තුනට මුදල් ලබාදීමට තීරණය කිරීමේදී මුදල් ලබාගන්නා එම ආයතන විසින් ඉදිරිපත් කර ඇති අදාළ අයවැය ලේඛන පිළිබඳව සැලකිල්ල යොමු කළ යුතුය. ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සඳහා සංචාරක සංවර්ධන අරමුදලින් කිසිදු මුදල් ප්‍රමාණයක් ලබා නොදිය යුතු බව කමිටුවේ අදහසය.

ප්‍රධාන සංචාරක කටයුතු ඉටු කිරීමේදී එනම්, නිෂ්පාදිත සංවර්ධනය, අලෙවිකරණය හා ප්‍රවර්ධනය සහ සංචාරක සේවා නියාමනය පිළිබඳ කටයුතු කිරීමේදී සංචාරක සංවර්ධන අරමුදල නිර්මාණය වන රජයේ මුදල් සම්බන්ධයෙන් අවසාන පාලනය රජය භාරයේ තබාගත යුතු අතර රජයේ හා පෞද්ගලික

අංශයේ හවුලේ සහභාගිත්වය අත්‍යවශ්‍ය බව කමිටුව අදහස් කරයි. ප්‍රධාන වශයෙන් තීරණ ගැනීමේදී ආයතනයේ සහ එහි උපදේශක මණ්ඩලයේ කොටස්කරුවන්ගේ සංගම්වල ප්‍රමාණවත් ලෙස නියෝජනය තිබිය යුතු බවට කමිටුව නිර්දේශ කරයි. ඉහත සඳහන් කරුණු සලකා බැලීමේදී,

(අ) ශ්‍රී ලංකාවේ සංචාරක හෝටල් සංගමයේ (ශ්‍රී ලං.ස. හෝ. ස.) නියෝජිතයන්ගෙන් සාමාජිකයන් දෙදෙනෙකු බැගින් ද ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමයේ නියෝජිතයකු සහ ශ්‍රී ලංකා වේ කුඩා හා මධ්‍යම සංචාරක ව්‍යවසායක සංගමයේ නියෝජිතයෙකු බැගින් ද ඇතුලත් වන ලෙස ගරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නම දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය පාලනය කළ යුතු බවටද,

(ආ) අලුතින් පිහිටුවනු ලබන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයට උපදෙස්දීම සඳහා ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනෙකු බැගින්ද ශ්‍රී ලංකා ආගමික චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමයේ නියෝජිතයකු සහ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම සංචාරක ව්‍යවසායක සංගමයේ නියෝජිතයකු බැගින්ද ඇතුලත් වන ලෙස ගරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් එකොලොස් දෙනෙකුගෙන් සමන්විත සංචාරක උපදේශක කමිටුවක් පිහිටුවිය යුතු බවටද කමිටුව නිර්දේශ කරයි.

කමිටුවේ ඉහත නිර්දේශයන් ඇතුලත් කිරීමට 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා පහසුව පිණිස පනත් කෙටුම්පතක් මෙම වාර්තාවේ "ආ" අතිරේකයේ වෙනම ඉදිරිපත් කර ඇත. එයේ හෙයින් 2005 අංක 38 දරණ පනතේ 1 වැනි වගන්තිය ප්‍රකාර ගරු අමාත්‍යවරයා විසින් නියෝගයක් කිරීමෙන් එම පනත ක්‍රියාත්මක කිරීම උචිත නොවන බව, කමිටුව අදහස් කරන බැවින් එම පනත අවලංගු කළ යුතු බවට කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.

# 1 වැනි පරිච්ඡේදය

## පසුබිම් තොරතුරු

### 1.1 හැඳින්වීම.

සංචාරක කර්මාන්තයේ විවිධ කොටස්කරුවන්ගේ උපදෙස් ලබාගෙන සහ ලංකා සංචාරක ව්‍යාපාරයේ කළමනාකරණයට පෞද්ගලික අංශයේ සංචාරක යෙදවුම් ඇතුළත් කිරීමට 1990 ගණන්වල මුල් භාගයේ සිට දරන ලද විවිධ ප්‍රයත්නයන් පදනම් කරගෙන සංචාරක අමාතයාංශය විසින් සකස් කරන ලද නව සංචාරක නීතිය 2005 සැප්තැම්බර් මාසයේදී අතගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපති තුමියගේ රජයේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. 2005 ඔක්තෝබර් මාසයේ මුල් භාගයේදී මෙම නව නීතිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදුව 2005 ඔක්තෝබර් 18 දින පාර්ලිමේන්තුව මගින් එය සම්මත කරන ලදී.

බහු කාර්ය බද්ධ ජාතික සංචාරක සංවිධානයක් ලෙස එනම්, සංචාරක අලෙවිකරණය හා ප්‍රවර්ධනය සහ සංචාරක මානව සම්පත් සංවර්ධනය පිළිබඳ කටයුතු කරන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් දැනට ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් විමධ්‍යගත කිරීම සහ මූල්‍ය දායකත්වය සැපයීමෙන් ද සංචාරක කළමනාකරණ ක්‍රියාවලියට සහභාගිවීමෙන් ද සංචාරක කළමනාකරණයට පෞද්ගලික අංශයේ යෙදවුම් ඇතුළත්ව තිබීම නව සංචාරක නීතියේ මූලික පරමාර්ථ යයි. ඒ අනුව පහත සඳහන් ලෙස එක් එක් කළමනාකරණ මණ්ඩලය සඳහා පෞද්ගලික අංශයේ නියෝජනය ඇතිව වෙනම ව්‍යවස්ථාපිත මණ්ඩල තුනක් පිහිටුවීම සඳහා නීතියෙන් විධිවිධාන සලසනු ලබයි.

1. සංචාරක අලෙවිකරණය හා ප්‍රවර්ධනය සහ සංචාරක මානව සම්පත් සංවර්ධනය හැර ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් දැනට ඉටුකරනු ලබන සියලුම කාර්යයන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉටු කිරීම.

2. ගමනාන්ත ප්‍රවර්ධන ඇතුළුව සාමාන්‍ය සංචාරක ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ඉටු කිරීම.

3. සියලුම සංචාරක මානව සම්පත් සංවර්ධනය පිළිබඳ කාර්යයන් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් ඉටු කිරීම.

මේ හැරුණු විට පෞද්ගලික අංශයේ සහභාගිත්වය සහ මූල්‍ය දායකත්වය ඇතිව සමාගම් නීතිය යටතේ වගකීම් ඉටු කිරීමට බැඳී සිටින සීමාසහිත සමාගමක් වශයෙන් දැනට කටයුතු කරන ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත්කිරීම සඳහා ද නීතියෙන් විධිවිධාන සලසා ඇත. තවද, සංචාරක සංවර්ධන බද්ද සහ අපගමන බද්ද ඒකාබද්ධ කිරීමෙන් සංචාරක සංවර්ධන අරමුදලක් පිහිටුවීම සඳහාද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශය සඳහා 70% ක්ද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා 14% ක්ද ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සඳහා 12% ක්ද, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සඳහා 4% ක්ද වශයෙන් මෙහෙයුම් කටයුතු වෙනුවෙන් කළමනාකරණ මණ්ඩල හතර අතර ව්‍යවස්ථාපිත ලෙස නියමිත අනුපාත ප්‍රමාණයන් අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ විෂය පථය යටතේ තිබෙන මෙම අරමුදල් බෙදා හැරීම සඳහාද නීතියෙන් විධිවිධාන සලසා ඇත.

චාරිකා සහ සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් අදාලවන ඕනෑම කරුණක් පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියටත්, අමාත්‍යවරයාටත් උපදෙස්දීම සඳහා අදාල කොටස්කරුවන්ගේ නියෝජිතවරුන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබීම සඳහාද අදාලවන විධිවිධාන නීතියේ සලසා ඇත.

2005 ඔක්තෝබර් 18 දින නීතිය පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද නමුදු විවිධ හේතූන් නිසා ගරු අමාත්‍යවරයා විසින් එය ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා නියමිත පරිදි ගැසට් පත්‍රයේ පළකර නොමැත. එම හේතුවලට පහත සඳහන් කරුණුද ඇතුළත්ය.

1. මැතිවරණ ප්‍රකාශයේ දැක්වෙන මහින්ද චින්තනය පදනම් කරගෙන නව ජනාධිපති ලෙස මහින්ද රාජපක්ෂ මහතා තෝරා පත්කර ගැනීමෙන් 2005 නොවැම්බර් 17 දින පවත්වන ලද ජනාධිපති මැතිවරණයෙන් පසු රජය වෙනස්වීම.

2. ගරු අමාත්‍යවරයාට සහ පුවත්පත් ලිපිවලට විවිධ කරුණු දැක්වීම සහ නව සංචාරක නීතිය පිළිබඳ අදහස් දැක්වීම.

ප්‍රකාශ කරන ලද විවිධ අදහස් දැක්වීම් අනුව ද මහින්ද චින්තනයේ සඳහන් පරිදි රජයේ ප්‍රතිපත්ති වෙනස්වීම් අනුවද නව රජයේ සංචාරක අමාත්‍යවරයා වන (කලින් පැවති රජයේ සංචාරක, ආයෝජන ප්‍රවර්ධන හා කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන්ද සිටි) ගරු අනුර බණ්ඩාරනායක මහතා විසින් 2006 ජනවාරි 24 දින අමාත්‍ය මණ්ඩලය වෙත සටහන් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනාකර පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විශේෂ කමිටුවක් මගින් නව සංචාරක නීතිය පිළිබඳ සමාලෝචනයක් කර බැලීම සඳහා අනුමැතිය ලබාගන්නා ලදි.

1. එච්.එම්.එස්. සමරනායක මහතා
   (සංචාරක මණ්ඩලයේ කලින් සිටි සභාපති)
   කමිටුවේ සභාපති වශයෙන්.

2. රංජිත් පෙරේරා මහතා
   (සංචාරක මණ්ඩලයේ කලින් සිටි අධ්‍යක්ෂ ජනරාල්)
   සාමාජික වශයෙන්.

3. ආනන්ද කස්තුරි ආරච්චි මහතා (නීතිඥ)
   සාමාජික වශයෙන්.

මෙම කමිටුව පත්කළ පසු නව සංචාරක නීතිය ක්‍රියාත්මක කිරීම ඉදිරි ගමනක් සඳහා නිර්දේශය සමඟ කමිටු වාර්තාව ඉදිරිපත් කරන තුරු අත්හිටුවන ලදි.

1.2 නිර්ණේය විෂයය (නි.වි.)

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර කමිටුව වෙත ලබාදී ඇති නිර්දේශය විෂයයයන් පහත දැක්වේ.

1. 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත අනුව 1966 දී ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවන ලදි. (පිටපත අමුණා ඇත.)

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් වර්තමාන තත්වය අනුව සවිබලකම් සහ දුර්වලතාවයන් සමාලෝචනය කිරීම.

2. නව සංචාරක නීතිය 2005 ඔක්තෝබර් 18 දින පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද නමුදු තවමත් එය ගැසට් පත්‍රයේ පලකර නොමැත. පසුගිය මාස දෙක තුල නව සංචාරක නීතිය පිළිබඳ පුවත්පත්වල ලිපි කීපයක් පලවී ඇති අතර. මෙම සංචාරක කර්මාන්තය තවදුරටත් ඉදිරියට කරගෙනයාම සඳහා රජය නිවැරදි ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන බවට වගබලා ගැනීම සඳහා මෙම නීතිය සමාලෝචනය කර බැලීමට ගරු අමාත්‍යවරයාට අවශ්‍යවී ඇත. නව සංචාරක නීතිය පිළිබඳ ඔබගේ අදහස් ඉදිරිපත් කළ යුතුය.

3. 2003 අංක 25 දරන මුදල් පනත 2003 සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක විය. (පිටපත අමුණා ඇත.) මෙම පනත යටතේ එකතුකළ සංචාරක මුදල් ගුවන් තොටුපොළ බදු මුදලින් 1/3 ක මුදල් ප්‍රමාණයකින් ද (සංචාරක සංවර්ධන අරමුදල් ආදායමෙන් 70%) ගෙවීම් මාරුකිරීමෙන් පසු සංචාරක ආයතනවලින් ලබාගත් පිරිවැටුම 1% ප්‍රමාණයකින්ද (සංචාරක සංවර්ධන අරමුදල් ආදායමෙන් 30%) සමන්විත වේ. ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා උපරිම වශයෙන් වාසි ලබාගැනීම පිණිස මෙම රාජ්‍ය අරමුදල පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග නිර්දේශ කළ යුතුය.

4. 2005 නොවැම්බර් මාසයේදී පරිපාලනය වෙනස්වීමත් සමඟ ඡන්දදායකයන් විසින් නිසි පරිදි පිළිගෙන ඇති "මහින්ද චින්තනයේ" ඇතුලත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ චින්තනය මගින් රජය මෙහෙයවනු ලබයි.

1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත සහ නව සංචාරක නීතිය ඇගයීමකට ලක් කිරීමෙන් පසු සහ 2003 අංක 25 දරණ මුදල් පනත මගින් මුදල් සැපයුම අනුව සංචාරක ස්ථාන සංවර්ධන වැඩසටහනේ අලෙවිකරණය හා ප්‍රවර්ධනය. මානව

සම්පත් සංවර්ධනය ආදිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සඳහා විශිෂ්ට ඉදිරි ගමන වෙනුවෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.

අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කමිටුව විසින් කරුණු සලකා බැලීම අවසන්කර සතිහයකින් එකී වාර්තාව ඉදිරිපත් කළ යුතු විය. කෙසේ වුවද, දැනටමත් පාර්ලිමේන්තුව විසින් පනවා ඇති නව සංචාරක නීතිය සමාලෝචනයකර බලා නව රජයේ චින්තනය අනුව එය සකස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට වඩා ඉහත සඳහන් පරිදි කමිටුව වෙත පැවරී ඇති වැඩකටයුතු විෂය පථය අනුව ඉතාමත් පුළුල් බව සවිස්තර නිර්ණේය විෂයය අනුව පැහැදිලි වේ. කාල සීමාව පිළිබඳව තීරණය කිරීමේදී සලකා බැලිය යුතු තවදුරටත් අදාළ සාධකයක් වන්නේ, පූර්ණ කාලීන පදනමක් මත වැඩ කිරීම පිණිස මෙම පැවරුම සඳහා තෝරාගනු ලැබූ උපදේශකවරුන්ගේ සේවය ලබාගැනීමය.

2006 ජනවාරි 30 දින තම නිල නිවසේදී ගරු අමාත්‍යවරයා කමිටුව සමඟ පැවැත්වූ රැස්වීමේදී (සභාපති සමරනායක මහතා සහ සාමාජික රංජිත් පෙරේරා මහතා පමණක් රැස්වීමට සහභාගි විය.) මෙම කරුණු සාකච්ඡා කරන ලදී. හැකි ඉක්මනින් කටයුතු ආරම්භ කරන ලෙසත්, අදාල වැඩකටයුතු පිළිබඳ විෂය සීමාව, නිර්ණේය විෂයය පිළිබඳව සම්පූර්ණයෙන් විමසා බැලීම සඳහා යෝජිත කාර්ය සැලැස්ම සහ වැඩකටයුතු සාර්ථක ලෙස නිමකිරීම සඳහා අවශ්‍ය කාලසීමාව ඇතුළත් ආරම්භක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් ගරු අමාත්‍යවරයා සභාපති වෙත දන්වා සිටියේය. කමිටු ලේකම් කාර්යාලය මධ්‍යස්ථ ස්ථානයක පිහිටුවන ලෙස සභාපති විසින් කරන ලද ඉල්ලීම අනුව ලේකම් කාර්යාලය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කාර්යාල සංකීරණයේ පිහිටුවීමට තීරණය කරන ලදී.

## 1.3 කමිටු වැඩකටයුතු ආරම්භ කිරීම.

ඉහතකී තීරණය අනුව කමිටු ලේකම් කාර්යාලය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කාර්යාල සංකීර්ණයේ අංක 2 පී 26 සහ 2 පී 27 කාමරවල පිහිටුවන ලදී. සභාපති සහ එක් කමිටු සාමාජිකයකු වන රංජිත් පෙරේරා මහතා 2006 පෙබරවාරි 1 වැනි දින සිට වැඩකටයුතු ආරම්භ කළහ. අනෙකුත් කමිටු සාමාජිකයා වන නීතිඥ ආනන්ද කස්තුරිආරච්චි මහතාට

දිනපතා තිබූ අධිකරණ කටයුතු නිසා කාර්යාලයට පැමිණීමට නොහැකි විය. දින කිපයකට පසු ඔහුගේ අධිකරණ කටයුතු සහ අනෙකුත් වගකීම් නිසා ඔහුගේ සේවය ලබාදිය නොහැකි බව සභාපති වෙත දන්වන ලදී. තවද, පෞද්ගලික වැදගත් කරුණක් නිසා තමා දැනටමත් පිටරට යාම සඳහා සැලසුම් කර ඇති බැවින්, 2006 මාර්තු 10 දින තෙක් පමණක් තම සේවය ලබාදිය හැකි බව අනෙකුත් කමිටු සාමාජිකයා වන රංජිත් පෙරේරා මහතා ගරු අමාත්‍යවරයා වෙත ලිපියකින් දන්වා සිටියේය. එබැවින් ආරම්භක වාර්තාව ඉදිරිපත් කල පසු සුදුසු අනුප්‍රාප්තිකයෙක් පත් කරන ලෙස ගරු අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව සභාපති විසින් අනෙකුත් කමිටු සාමාජිකයා වන රංජිත් පෙරේරා මහතා සමඟ කාර්යාලයට සුදුසු කාර්ය මණ්ඩලය සහ උපකරණ සපයා ගැනීමට කටයුතු කර කමිටු වැඩකටයුතු සඳහා අවශ්‍යයයි සැලකෙන අදාල සියලුම ලිපි ලේඛන එක් රැස්කරගෙන කාර්ය සැලැස්ම සකස් කර ආරම්භක වාර්තාව සකස් කිරීමට කටයුතු යොදන ලදී.

නිර්ණේය විෂයය අනුව කමිටුව විසින් දැනට ඇති සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා (ලංකා) සංචාරක මණ්ඩලයේ සවිබලකම සහ දුර්වලතාවයන් තක්සේරු කිරීමටද විශේෂයෙන් තම රජයේ ප්‍රතිපත්තිය වන මහින්ද චින්තනය අනුව නව සංචාරක නීතිය පිලිබඳව කමිටුවේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා එම නීතියේ සියලුම අංශ පිලිබඳව සවිස්තර අධ්‍යයනයක් සිදු කිරීමටද, 2003 අංක 25 දරණ මුදල් පනත පරිදි සංචාරක සංවර්ධන බද්ද සහ අපගමන බද්ද වශයෙන් එකතු කරන ලද අරමුදල් පිලිබඳ මනා කලමනාකරණයක් ඇති කිරීම පිණිස ගතයුතු ක්‍රියා මාර්ග යෝජනා කිරීමටද ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ අනාගත සංවර්ධනය සහ ප්‍රවර්ධනය උදෙසා "විශිෂ්ට ඉදිරිගමන" සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට ද කටයුතු සිදු කල යුතු විය.

නිර්ණේය විෂයය සම්බන්ධයෙන් මෙහෙයුම් පාඨය වන්නේ "විශිෂ්ට ඉදිරිගමන" බව ඉහත සඳහන් කරුණු අනුව පැහැදිලි වේ. වෙනත් වචනවලින් සඳහන් කරන්නේ නම් සංචාරක ව්‍යාපාරයේ අනාගත ධරණීය සංවර්ධනය උදෙසා සංචාරක සංවර්ධන බද්ද සහ අපගමන බද්ද මගින් උපයන ලද අරමුදල් උපරිම ලෙස උපයෝගී කර ගැනීම වෙනුවට යෙදිය යුතු ඉතාමත් හිතකර ආයතනික වැඩ පිලිවෙල සම්බන්ධයෙන් කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කල යුතුවූ අතර, එමගින්

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනය උදෙසා සංචාරක ව්‍යාපාරයෙන් ප්‍රධාන වශයෙන් දායකත්වය ලැබෙනු ඇත.

ඒ අනුව සවිස්තරාත්මක සහ ඵලදායී අත්දමින් තිර්ණේය විෂයය පිළිබඳව විමසා බැලීම වෙනුවෙන් සකස් කරන ලද කාර්ය සැලැස්මට පහත සඳහන් ප්‍රධාන කරුණු ඇතුළත්විය.

* විමර්ශනයට භාජනයවී තිබෙන කරුණුවලට අදාළ අත්දැකීම් සහ දැනුම ඇති සංචාරක ව්‍යාපාර සංගම් සහ පුද්ගලයන් වැනි ප්‍රධාන කොටස්කරුවන්ගෙන් කරුණු දැක්වීම් ලබාගැනීම.

* ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ පුළුල් අත්දැකීම් සහ දැනුම වැනි ප්‍රධාන කොටස්කරුවන්ගෙන් කරුණු දැක්වීම් ලබාගැනීම.

* අප්‍රිකානු ආසියානු ප්‍රදේශයේ තෝරාගත් සාර්ථක සංචාරක ගමනාන්ත කිපයක් සම්බන්ධයෙන් ආදර්ශ අධ්‍යයනය කර අත්දැකීම්වලින් කරුණු ඉගෙන ගැනීම සඳහා එම ගමනාන්තවල අධ්‍යයන සංචාරවල නිරතවීම.

උපදේශක අනුප්‍රාප්තිකයන් අප්‍රමාදව සපයනු ලැබුවේනම්, ඉහත දැක්වූ කාර්ය සැලැස්ම සහ උපදේශකවරුන්ගේ සේවය ලබාගැනීමට තිබූ හැකියාව අනුව කමිටු වැඩකටයුතු අවසන් කිරීමට අවශ්‍යවන කාල සීමාව ලීත් මාස 12 ක් පමණ වන බව ඇස්තමේන්තු කරන ලදී.

## 1.4 ආරම්භක වාර්තාව.

ගරු අමාත්‍යවරයා විසින් කරන ලද ඉල්ලීම අනුව සවිස්තරාත්මක කාර්ය සැලැස්ම හා ක්‍රමවේදය ද කමිටුව යළි පිහිටුවීම සම්බන්ධයෙන් නිර්දේශයන් ද උපදේශකවරුන්ගේ සේවය ලබාගැනීමේ හැකියාව සහ වැඩකටයුතු අවසන් කිරීමට අවශ්‍යවන කාලසීමාවද ඇතුළත් ආරම්භක වාර්තාව 2006 පෙබරවාරි 13 දින ගරු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

ආරම්භක වාර්තාව ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී ගරු අමාත්‍යවරයා දිවයිනෙන් බැහැරව සිටියේය. කෙසේ වුවද ඔහු ආපසු දිවයිනට පැමිණි පසු ආරම්භක වාර්තාවේ ඇතුළත් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමටත්, පහත සඳහන් සාමාජිකයන් පත්කර ගැනීමෙන් කමිටුව යළි ස්ථාපිත කිරීමටත් යෝජනා කර සිටියේය.

* විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු රංජිත් ධීරරත්න මහතා කමිටුවේ නීති උපදේශක වශයෙන්ද,

* විශ්‍රාමලත් ශ්‍රී ලං.ප.සේ. නිලධාරියකු වන (පළාත් සභා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් විශ්‍රාම ලැබූ) සහ දැනට මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන ස්වයං සේවයේ නියුතු කළමනාකරණ උපදේශක වරයකු වන අශෝක ගුණරත්න මහතා කමිටුවේ සාමාජිකයකු වශයෙන්ද පත්කරන ලදී.

එච්.එම්.එස්. සමරනායක මහතා කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කරගෙන ගියේය. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්ය සැලැස්ම සහ ක්‍රමවේදය අනුව 2006 මාර්තු 7 දින සිට ක්‍රියාත්මක වන පරිදි කණ්ඩායමක් වශයෙන් යළි ස්ථාපිත කමිටුව වැඩකටයුතු ආරම්භ කරන ලදී. ඊළඟ උපවගන්තියේ ඒ පිළිබඳ විස්තර සංක්ෂේප වශයෙන් දැක්වේ.

කමිටුව විසින් අමාත්‍ය අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව තත් කාර්ය සඳහා නීති කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ දේශීය උපදේශකවරයකු සහ සංචාරක ආයතනික සැලසුම්කරණය පිළිබඳ ප්‍රසිද්ධ ජාත්‍යන්තර උපදේශකවරයකු පත්කර ගන්නා ලදී.

* නීති කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් කමිටුවට සහායවීම සඳහා විශ්‍රාමලත් නීති කෙටුම්පත් සම්පාදකයකු වන නලින් අබේසේකර මහතා පත් කරන ලදී.

* සංචාරක ව්‍යාපාරයේ විවිධ අංශ පිළිබඳව ශ්‍රී ලංකාව ඇතුළුව කැරිබියානු, දකුණු ශාන්තිකර, මැද පෙරදිග සහ දකුණු ආසියාව යන රටවල සේවය කිරීමෙන් පුළුල් අත්දැකීම් ලබාඇති

එක්සත් රාජධානියේ සරේ විශ්ව විද්‍යාලයේ බාහිර මහාචාර්යවරයකු වන සහ ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය පිළිබඳ උපදේශකයකු වන ජෝන් යාකුමිස් මහතා පත් කරන ලදී. පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය මගින් සැපයූ තාක්ෂණික සහාය ලබාදීමට සංචාරක මණ්ඩලයේ උපදේශකවරයකු වශයෙන් ඔහු පළමුවරට ශ්‍රී ලංකාවේ සේවය කර ඇති අතර, හැත්තෑවේ වසරවල අවසාන භාගයේදී වසර හතරක කාලසීමාවක් යූ එන් ඩී පී ආයතනයේ සේවය කර ඇත. යුරෝපා සංගමයේ ආධාර ලබන කලාපීය සංචාරක පුහුණු ව්‍යාපෘතියක ව්‍යාපෘති කළමනාකරු වශයෙන්ද ඔහු පසු අවස්ථාවක සේවය කර ඇති අතර, ඔහුගේ ලේකම් කාර්යාලය වසර තුනක කාලයක් කොළඹ පිහිටා තිබුණි.

යාකුමිස් මහතාගේ සේවය සපයනු ලැබුවේ ගරු සේවාවක් වශයෙන් පාරිශ්‍රමිකයකින් තොවේය. සංචාරය පිළිබඳ සවුදි අරාබියේ "සුපරිම කොමිසමේ" ජ්‍යෙෂ්ඨ සංචාරක සංවර්ධන උපදේශක වශයෙන් සේවය කරමින් සිටියදී ඔහු දැනට සේවයේ යෙදී සිටින සවුදි අරාබියේ සිට කමිටුව සමඟ විද්‍යුත් සහ අනෙකුත් සන්නිවේදන ක්‍රම මගින් සේවා සපයන ලදී.

## 1.5 කාර්ය සැලැස්ම සහ ක්‍රමවේදය.

ඉහත දැක්වෙන කොටසේ පැහැදිලි කරන ලද පරිදි අවසාන වාර්තාව සකස් කිරීම ඇතුළු ප්‍රධාන කොටස් හතරකින් කාර්ය සැලැස්ම සහ ක්‍රමවේදය සමන්විත වේ. කාර්ය සැලැස්මේ සංක්ෂේප විස්තරයක් "අ" පරිශිෂ්ටය වශයෙන් වාර්තාවට අමුණා ඇත. එම ප්‍රධාන කොටස් හතර පහත දැක්වෙන පරිදි වේ.

1. සියලු ලිපිලේඛන හඳුනාගැනීම (ප්‍රකාශන, වාර්තා, නීති ප්‍රඥප්ති, වාර සඟරා, තොරතුරු සටහන් පත්‍ර ආදිය) සහ එම ලිපිලේඛන අවශ්‍ය තොරතුරු විමසා බැලීම සඳහා යොදා ගන්නා ලද ලිපිලේඛන ලැයිස්තුව "ආ" පරිශිෂ්ටයේ දැක්වේ.

2. සංචාරක කර්මාන්තය පිළිබඳව පුළුල් අත්දැකීම් හා දැනුම ඇති පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ තෝරාගත් පුද්ගලයන්, සංචාරක

ව්‍යාපාර සංගම් හා රජයේ නියෝජිත ආයතන වැනි අදාල කොටස්කරුවන්ගෙන් කරුණු දැක්වීම ලබාගැනීම. උපදෙස් ලබාගත් අදාල කොටස්කරුවන්ගේ ලැයිස්තුව "ඇ" පරිශිෂ්ටයේ දැක්වේ.

3. සංචාරක කළමනාකරණය පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුල් ව්‍යාපාර පිළිබඳ විවිධ ආදර්ශ සම්බන්ධයෙන් තෝරාගත් රටවල් තුනක් වන තායිලන්තය, සිංගප්පූරුව සහ සිසිලියාව යන රටවල අත්දැකීම් ලබාගැනීම සඳහා එම රටවල අධ්‍යයන සංචාරවල නිරතවීම. මෙම රටවල අත්දැකීම් පිළිබඳ වෙනම වාර්තා "ඇ", "ඉ" සහ "ඊ" යන පරිශිෂ්ටවල දැක්වේ.

4. ඉහත කාර්යයන් අනුව ලබාගත් දැනුම සහ එක් රැස්කළ තොරතුරු පදනම් කරගෙන කමිටුව වෙත ලබාදී ඇති නිර්ණේය විෂයය සම්බන්ධයෙන් පිලිතුරු සැපයීම සඳහා අවසාන වාර්තාව සකස් කිරීම.

කෙසේ වුවද, සංචාරක කටයුතු සඳහා අවශ්‍ය වැඩපිළිවෙලවල් යෙදීමේ වගකීම පවරන ලද රජයේ නියෝජිත ආයතනය මගින් ප්‍රමාණවත් ලෙස තාක්ෂණ සහය ලබානොදීමේ හේතුවෙන් සැලසුම් කල අධ්‍යයන චාරිකාවල අවාසනාවකට මෙන් යෙදීමට නොහැකිවීම ගැන කමිටුව කණගාටුව පළ කරයිවී.

අනතුරුව උපදේශකවරුන් විසින් විවිධ මාර්ග සහ ක්‍රම මගින් අදාල රටවල්වලින් හැකි කවර හෝ තොරතුරු ලබාගැනීම උත්සාහයක් දරන ලද නමුදු අනුගමනය කල එම මාර්ග සහ ක්‍රම ඉතා සාර්ථක නොවීය. මෙම ක්‍රම සහ මාර්ග උපයෝගී කරගෙන උපදේශකවරුන්ට ලබාගත හැකිවූ තොරතුරු පදනම් කරගෙන කරන ලද විෂයානුබද්ධ අධ්‍යයන පිළිබඳව "ඇ" පරිශිෂ්ටය සකස් කරන ලදී.

## 1.6 වාර්තාවේ ව්‍යුහය.

නිර්ණේය විෂයය පිළිබඳව සංක්ෂේපව විමසා බැලීම සඳහා සකස් කරන ලද වාර්තාව පරිශිෂ්ට පහකින් සහ අතිරේක දෙකකින් යුක්තව පරිච්ජේද හතකින් ඉදිරිපත් කර ඇත. නිර්ණේය විෂයය විමසා බැලීම සඳහා පරිච්ජේද හතක් වෙන් කරන ලද අතර. අනුගමනය කළ කාර්ය සැලැස්ම හා ක්‍රමවේදය පිළිබඳ විස්තර. තෝරාගත් විෂයානුබද්ධ අධ්‍යයන සහ නව සංචාරක නීතියේ නීතිමය අඩුපාඩුකම් හා අනනුකූලතාවයන් පෙන්වා දෙමින් සැලකිල්ලට ගන්නා ලද නෛතික මතය පරිශිෂ්ටවල සඳහන් කර ඇත.

අතිරේක දෙක වෙනම වාර්තා වශයෙන් ඉදිරිපත් කර ඇත. "අ" අතිරේකය තොරතුරු ඇතුළත් ලේඛනයක් වන අතර. සංචාරක කළමනාකරනය සම්බන්ධයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය සඳහා යෝජනා ඇතුලත් විවිධ රජයන් යටතේ 1970 වර්ෂවල මුල් භාගයේ සිට ආරම්භ කර අතීතයේදී සකස් කරන ලද විවිධ ව්‍යවස්ථා සම්පාදන කෙටුම්පත් එම ලේඛනයේ දක්වා ඇත. වඩා යහපත් අනාගතයක් සඳහා සංචාරක කර්මාන්තය ඉදිරියට ගෙනයාම පිණිස අවශ්‍ය ආයතනනික සහ නෛතික පාදක ව්‍යුහය වෙනුවෙන් සැලසුම් කළ ව්‍යවස්ථා සම්පාදක කෙටුම්පත "ආ" අතිරේකයේ දැක්වේ.

ව්‍යවස්ථා සම්පාදන කෙටුම්පත අවසාන වශයෙන් සකස් කළ කෙටුම්පතක ස්වරූපයෙන් ඉදිරිපත් කර ඇති බව මෙහිලා සඳහන් කළ යුතුය. ඒ සම්බන්ධයෙන් එකඟතාවයක් ඇති වුවහොත් ඒ පිළිබඳව කලයුතු කටයුතු වශයෙන් ඇත්තේ නීති කෙටුම්පත් සම්පාදක සහ නීතිපතිවරයාගෙන් මෙම කෙටුම්පත් සඳහා විධිමත් පැහැදිලි කිරීම් ලබාගෙන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබාගෙන අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමය.

ප්‍රධාන වාර්තාවේ 1 වැනි පරිච්ජේදයේ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් පැවති බාධකය පිළිබඳ පසුබිම් තොරතුරු සඳහන්වන අතර වර්තමාන තත්වය අනුව සංචාරක මණ්ඩලයේ සවිමත්කම් සහ දුර්වලතාවයන් පිළිබඳව නිර්ණේය විෂයය 1 යටතේ කරුණු විමසා බැලීම 2 වැනි පරිච්ජේදයේ දැක්වේ. හෝටල් පාසල පිළිබඳව ඓතිහාසක සමාලෝචනය 3 වැනි පරිච්ජේදයේ දැක්වෙන අතර "ඉදිරි ගමන" පිළිබඳව 7 වැනි පරිච්ජේදයේ ඇතුලත් නිර්දේශයන් ඉදිරිපත් කිරීමට කම්වුව පෙළඹුනු හේතු පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීම සඳහා පසුබිම්

තොරතුරු සැපයීමට සැලසුම් කරන ලද සංචාරක කළමනාකරණය පිළිබඳව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුලේ සහභාගිත්වය සම්බන්ධයෙන් කලින් ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳ සමාලෝචනය 4 වැනි පරිච්ඡේදයේ දැක්වේ. 2003 අංක 25 දරණ මුදල් පනත පිළිබඳව විචාරාත්මක සමාලෝචනය 5 වැනි පරිච්ඡේදයේ සඳහන්වන අතර, නිර්ණේය විෂයය 4 යටතේ කරුණු විමසා බැලීම ද එයට ඇතුලත්වී ඇත. නව සංචාරක නීතිය පිළිබඳව නිර්ණේය විෂයය 4 යටතේ කරුණු විමසා බැලීම 6 වැනි පරිච්ඡේදයට ඇතුලත්ව ඇත.

## 1.7 ස්තුතිය.

කමිටුව හමුවට පැමිණ අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබාදීමෙන් කමිටුවේ වැඩකටයුතුවලට සහාය දැක්වූ සියලුම සංචාරක ව්‍යාපාර සංගම්වලටත්, රජයේ නියෝජිත ආයතනවලටත් , පුද්ගලයන්ටත් කෘතඥතා පූර්වකව කමිටුව ස්තුතිය පළකර සිටී.

ගරු අමාත්‍යවරයා විසින් කරන ලද නියමයන් අනුව කමිටුවට කාර්යක්ෂම ලෙස කටයුතු කිරීම සඳහා සියලු සැපයුම් සංවිධාන මෙහෙයවීමට කටයුතු කිරීම ගැන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයටද ස්තුතිය හිමිවිය යුතුය.

# 1 වැනි පරිච්ඡේදය

## 2.1 හැඳින්වීම.

1996 වර්ෂයේදී ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගත් ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණයක් මත ශ්‍රී ලංකා (ලංකා) සංචාරක මණ්ඩලය ඇති විය. එම වකවානුවේ පැවති ආර්ථික ප්‍රශ්නයන්ට මුහුණදීම සඳහාත්, විදේශ සංචරන කාර්යන් සංවිධානමය ආකාරයෙන් පවත්වාගෙන යාමටත් අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම මෙය ඇතිකරලීමේ අරමුණ විය. ඒ අනුව මෙම ව්‍යාපස්ථාපිත මණ්ඩලය 1996 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනත මගින් පිහිටුවන ලද අතර රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති ආයතනයක් විය. මෙහි නීතිමය රාමුව විදේශ සංචරනය අතින් වේගවත් සංවර්ධනයක් රට තුළ ඇති කිරීමයි. මීට පෙර සංචරන කාර්ය ශ්‍රිතයන් මෙහෙයවනු ලැබුවේ රජයේ දෙපාර්තමේන්තුවක් වන රාජ්‍ය සංචරන කාර්යාංශය මගින් වන අතර, එය ආරක්ෂක හා බාහිර ක්‍රියාකාරකම් අමාත්‍යාංශය යටතේ පවතින ලදී. එකල කාලසීමාවේ ශ්‍රී ලංකාව පමණක් ආර්ථික

ප්‍රශ්නවලට මුහුණදුන් නොමැති අතර, පොදුවේ ගත්කල ප්‍රායෝගිකව දෙවන ලෝක යුද්ද සමය අවසන් වනවාත් සමගම සැම සංවර්ධනය වන රාජ්‍යකටම ස්වාධීනව නැගී සිටීමේ අවශ්‍යතාවයත් මතු විය. එයට හේතුවූ කරුණු පහතින් දක්වමු.

* විනිමයෙහි පවත්නා හිඟය හේතුවෙන් ගෙවුම් ශේෂ දුෂ්කරතාවලට මුහුණදීම.

* දීර්ඝ කාලයක් තුළ පැවති මග, සේවා නියුක්තිය ඒ තුලින් මතුවන සමාජීය සහ දේශපාලන ප්‍රශ්ණ.

* ප්‍රාග්ධන ආයෝජනයන්හි ආකාර්යක්‍ෂමතාවය හෙමින් වර්ධනය වන ආර්ථික වර්ධනය.

* අසමතුලිත වූ ආර්ථිකයක් පැවතීම සහ එකම අපනයන ආදායම වැවිලි භෝග එනම්, තේ, රබර්, පොල් මත පමණක් ලැබෙන අපනයන ආදායම සියලු ආනයනයන් යන ප්‍රාග්ධන නංවාලීම සඳහා වැය කිරීම. භූවිද්‍යාත්මක පිහිටා තිබීම මත ආර්ථික ක්‍රියාකාරකම් බොහෝ විට රැඳී පවතින්නේ වැවිලි ආර්ථික ක්‍ෂේත්‍රයන් සහ නාගරික ස්ථාන අතරවීම.

ඒ අනුව සංචාරක ව්‍යාපාරය කර්මාන්තයක් ලෙස ඉහත ප්‍රශ්ණ සඳහා ඉක්මනින්ම විසඳුම් ලබාගැනීමේ අටියෙන් අපනයන ආදායමෙන් විදේශ විනිමය ඉහල ප්‍රමාණයක් ලබාගැනීමට සහ සේවා නියුක්තිය තුලින් ආදායම් ඉහල නංවාගැනීම අරමුණ ඇතිව ක්‍රියාත්මක වූ අතර මෙම කර්මාන්තය අත්‍යාවශ්‍යයෙන්ම සේවා අශ්‍රිතවර පැවතීමක් විය.

ඉහත රජයේ ආර්ථික අරමුණ නංවාලීම සඳහා ලංකා සංචාරක මණ්ඩලය විසින් විදේශ සංචාරක කාර්යයන් නංවාලීම තුලින් වේගවත් සංවර්ධණයකට මග පෑදිය. එයට ප්‍රධාන හේතුව වූයේ රජයේ දෙපාර්තමේන්තු ව්‍යාපාර සමග සංසන්දනය කරන විට, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සංස්ථාවලට ඇති තීරණ ගැනීමේ නිදහස සහ මූල්‍ය කළමනාකරනය සම්බන්ධව සලකා බලනවිට දෙපාර්තමේන්තුවල මෙවන් පරිපාලන නීතිරීති ඇති රාජ්‍ය මූල්‍ය රෙගුලාසි වලින් තරමක් නම්‍යශීලීවීමේ හැකියාවක් තිබෙන නිසාවෙනි.

## 2.2 මණ්ඩලයේ ආරම්භක පියවරවල්.

මණ්ඩලයට ලාබදී ඇති පැවරුම් බලය මණ්ඩලයේ පරමාර්ථ අනුව පහත දැක්වෙන පරිදි සරලව සාමාන්‍ය ලෙස නිර්වචනය කර දක්වා ඇත.

(අ) සංචාරක ගමන් දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ වැඩි දියුණු කිරීම.

(ආ) සංචාරක සේවා ප්‍රමාණවත් ලෙස, කාර්යක්ෂම සහ ආකර්ෂණීය ලෙස දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ වැඩි දියුණු කිරීම.

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍යවිය හැකි හෝ ඉවහල්වන සියලුම එකී කටයුතු හෝ කරුණු ඉටුකිරීම.

මෙලෙස නිර්වචනය කර ඇති මණ්ඩලයේ පරමාර්ථ අනුව සංචාරක ව්‍යාපාරය සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා ඉවහල්වන හෝ අවශ්‍යයයි සැලකෙන ඕනෑම කාර්යයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට මණ්ඩලයට අවසරය ලැබිණ.

වචනයේ නව අර්ථානුකූලව ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය එවකට ලංකාවේ නව ආර්ථික කටයුත්තක් වූ බැවින්, ක්‍රමානුකූල පදනමක් මත සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කර ප්‍රවර්ධනය කිරීම සඳහා මණ්ඩලය විසින් මූලික පියවරවල් ගණනාවක් අනුගමනය කරන ලදී. එම පියවරවල් සඳහා පහත සඳහන් කරුණු ඇතුලත් වේ.

(අ) යූ එන් ඩී පි ආයතනයේ මූල්‍ය සහාය ඇතිව වසර හතරක කාලසීමාවක් සඳහා සංචාරක ව්‍යාපාරයේ සියලුම අංශ පිළිබඳව උපදේශකයකු වශයෙන් ඉතාමත් අත්දැකීම් ඇති ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියක් උසුලන සංචාරක ව්‍යාපාරය පිළිබඳ විශේෂඥයකු වන සොම් තැන් විචේ මහතාගේ සේවය ලාබගැනීම.

(ආ) රටතුළ සහ රටේ පිටත සංචාරය සඳහා පහසුකම් සැලසීම පිණිස දේශසීමා විධි නියමයන් ප්‍රමිතිකරණය සහ ලිහිල් කිරීම.

(ඇ) යූ එන් ඩී පී ආයතනයේ මූල්‍ය සහාය ඇතිව 1967 වර්ෂයේ සිට දසවසරක සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්මක් සැකසීම සඳහා හවායිවල සේවයේ නියුතුව සිටින බහුවිධ විෂය දැනුම ඇති සංචාරක උපදේශක කණ්ඩායමක සේවය ලබාගැනීම.

(ඈ) සංචාරක සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉඩම් අත්පත්කර ගැනීමටත්, සියලු සංචාරක පහසුකම් සහ සේවා වර්ගීකරණයකර, ලියාපදිංචිකර ඒ සඳහා බලපත්‍ර ලබාදීමටත්, මිල ගණන් පාලන රෙගුලාසි ආදිය පැනවීමටත්, ලංකා සංචාරක මණ්ඩලය වෙත බලතල පැවරීම සඳහා හැකියාව ඇති කරන නීති සම්පාදනය කිරීම සඳහා රජයට උපදෙස් දීම. 1968 අප්‍රේල් මාසයේදී සම්මත කරගන්නා ලද අංක 14 දරන සංචාරක සංවර්ධන පනත මගින් මෙම කටයුත්ත සිදුකරන ලදී.

(ඉ) සියලු යටිතල පහසුකම් සේවා සැපයීමෙන් පෞද්ගලික අංශය මගින් හෝටල් කීපයක් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන සහිතව බෙන්තොට ප්‍රථම ජාතික නිවාඩු නිකේතනය පිහිටුවීම.

1. සභාපති වශයෙන් ජේ.සී.එම්. ද සොයිසා මහතා (හිටපු සිවිල් සේවකයකු වන ව්‍යාපාරිකයකු වන) ද රාජනීතිඥ එච්.ඩබ්ලිව්. ජයවර්ධන මහතාද, රූල්පා දැරනියගල මහතාද, (නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කලින් ලිපිකරු වශයෙන් සිටි) චන්ද්‍රා කුරේ මහතාද (හිටපු සිවිල් සේවකයකු වන) මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයා වශයෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ද, උපාලි සේනානායක මහතාද (වනජීවී විශේෂඥ) වෛද්‍ය පී.ආර්. ත්‍යාගරාජ මහතාද, පළාත් පාලන අමාත්‍යාංශයේ නියෝජිතයා වශයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාද පළමු මණ්ඩලයට ඇතුලත් විය.

(ඊ) මණ්ඩලය විසින් ඉහත සංක්ෂිප්ත වශයෙන් දක්වා ඇති එහි පරමාර්ථ අනුව ප්‍රධාන කාර්යබද්ධ ක්ෂෙත්‍ර හයක් හඳුනාගෙන සංවර්ධනය කරන ලදී.

1. අනෙකුත් සියලුම සංචාරක කටයුතුවලට මූලිකවන ලෙස සැලකෙන සංචාරක සංඛ්‍යා ලේඛන සහ පර්යේෂණ කටයුතු.

2. සංචාරක සැලසුම්කරණය සහ සංවර්ධනය.

3. සංචාරක අලෙවිකරණය සහ ප්‍රවර්ධනය.

4. සංචාරක සංවර්ධන පනත අනුව සියලු සංවර්ධන පහසුකම් සහ සේවා නියාමනය.

5. දේශීය සංචාර ව්‍යාපාරය සහ ප්‍රජා සම්බන්ධතා.

6. සංචාරක ව්‍යාපාරයේ මිනිස්බල සංවර්ධනය.

සංචාරක මණ්ඩලය ආරම්භයේ පටන්ම ඉටුකළ ප්‍රධාන සංචාරක කාර්යයන් මේවා වන අතර, විධායක අධ්‍යක්ෂවරයකු භාරයේ පවතින වෙනම අංශයකට මෙම එක් එක් කාර්යය පවරන ලදී. මේ හැරුණු විට ලේකම් කාර්යාලය සහ නීති අංශය, පරිපාලන හා සේවක පිරිස් අංශය, මුදල් ගිණුම් හා ගිණුම් අංශය සහ අභ්‍යන්තර විගණන අංශය යනුවෙන් සේවා අංශ හතරක් මණ්ඩලය විසින් පිහිටුවන ලදී. මෙම එක් එක් අංශය අධ්‍යක්ෂවරයකු භාරයේ පැවතින.

සංචාරක පර්යේෂණ හා සංඛ්‍යා ලේඛන, දේශීය සංචාරක ව්‍යාපාරය සහ ප්‍රජා සම්බන්ධතා සහ මිනිස්බල සංවර්ධනය යන අංශ පනතේ පරමාර්ථ ලෙස විශේෂයෙන් සඳහන් කර නොමැති වුවද, මෙම කාර්යයන් සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා සහ ප්‍රවර්ධනය සඳහා වඩාත් අදාළ වන හෙයින්, එහි විෂය සීමාව යටතට මණ්ඩලය විසින් මෙම කාර්යයන් ද ඇතුළත් කරන ලදී.

තවද ප්‍රධාන වශයෙන් රමණීය දර්ශනවලින් යුක්ත ස්ථානවල පිහිටා ඇති නාතායම් 18 ක් ඇතුළත්වූ රජයේ සංචාරක කාර්යාංශයේ සියලුම වත්කම් ද කලින් කොළඹ සමාජ ශාලාව තිබූ පසුව සමුද්‍රා ගොඩනැගිල්ල යනුවෙන් නම්කළ ස්ථානයේ පිහිටි ලංකා හෝටල් පාසල ද ලංකා සංචාරක කටයුතු පනත

මගින් සංචාරක මණ්ඩලය වෙත පැවරිනි. සංචාරක මණ්ඩලය කවර හෝ වාණිජ මෙහෙයුම්වල නිරතවීමට අපේක්ෂා නොකළ බැවින්, සියලුම නානායම් එහි කටයුතු කරගෙන යාම සඳහා පෞද්ගලික අංශය වෙත බදුදෙන ලදී.

කෙසේ වුවද, ඉදිරියේ ඇතිවිය හැකි හෝටල් කර්මාන්තය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු මිනිස්බලය යෙදවීම පිණිස හෝටල් පාසල සංචාරක මණ්ඩලය විසින් එය සතු වගකීම්වල කොටස් වශයෙන් එහි පාලනය යටතට පත් කරගන්නා ලදී.

## 2.3 මණ්ඩලයේ පහසුකම් සැලසීමේ කාර්යයන්.

සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා තිබෙන ප්‍රමුඛ අවශ්‍යතාවලින් එක් අවශ්‍යතාවක්වී තිබුනේ, දේශසීමා විධිවිධානයන් අඩුකිරීමෙන් හා ප්‍රමිතිකරණය කිරීමෙන් රටට පැමිණෙන සහ රටින් පිටව යන සංචාරකයන් වෙත පහසුකම් සැලසීමය. එක්සත් ජාතීන්ගේ උපදේශක විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුව එවකට සිටි සංචාරක අමාත්‍යවරයා විසින් සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, නිරෝධායන දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවලින් සහ සංචාරක මණ්ඩලයේ නියෝජිතයන්ගෙන් සමන්විත වන පරිදි ජාතික පහසුකම් සලසන කමිටුවක් (පි. ප. ක) පත් කරන ලදී.

ජාතික පහසුකම් සලසන කමිටුව විසින් වසර කිපයක් තුළ කරුණු සැලකිල්ලට ගෙන අත්හදා බැලීම සිදු කිරීමෙන් පසු එවකට පැවති ඉතා අපහසු දේශසීමා විධිවිධානයන් අඩුකිරීම, ලිහිල් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහා ක්ෂේත්‍ර කීපයක් සම්බන්ධයෙන් එකඟවීමට එයට හැකිවිය. ඒවා පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

- තොරතුරු අයිතම අඩුකිරීමෙන් විදේශ ගමන් බලපත්‍රයට ගැළපෙන පරිදි අපගමන සහ ආගමන කාඩ්පතේ ප්‍රමාණය අඩු කිරීම. (එවකට එම කාඩ්පතේ ප්‍රමාණය අඟල් 8 × 12 විය.)

- මගීන් විසින් තම සන්තකයේ තිබෙන වටිනා භාණ්ඩ සහ මුදල් ප්‍රමාණය පිළිබඳ ප්‍රකාශ කළයුතු වූ රේගු ප්‍රකාශ ආකෘතිය (විදේශිකයන් සඳහා පමණක්) අහෝසි කිරීම.

- ඒකපාක්ෂික පදනමක් මත පැමිණීමට පෙර වීසා ලබාගැනීමේ අවශ්‍යතාවෙන් තෝරාගනු ලැබූ ප්‍රධාන රටවල්වලින් පැමිණෙන සත්භාවයෙන් යුක්ත සංචාරකයන් නිදහස් කිරීම. මෙම අවශ්‍යතාවෙන් නිදහස් කිරීම දැන් රටවල් 40 කට පමණ අදාල වේ.

ඉහත කරුණුවලට අමතරව දේශසීමාව අදාල අංශවල සේවයේ නියුතු ආගමන හා විගමන. රේගු. පොලිස් සහ නිරෝධායන යන දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට සංචාරකයන් සම්බන්ධයෙන් ආචාරශීලීව හා විනීතව කටයුතු කරන අන්දම පිළිබඳව පුහුණුවක් ලබාදී ඒ පිළිබඳ හුරුකිරීමක් ඇති කරන ලදී. නිලධාරීන්ගේ ආකල්ප වෙනස් කිරීමෙහිලා මෙම පුහුණුව සහ හුරු කිරීම් ඉතා අගනා බව පෙනීගොස් ඇත.

දේශසීමා විධි නියමයන් ප්‍රමිතිකරණය සහ ලිහිල් කිරීම දැනට සංචාරක මණ්ඩලය විසින් සිදු කරන ලද කටයුත්තක් නොවේ. එය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන මෙහෙවරක් ලෙස සලකනු ලැබේ.

2.4 මණ්ඩලයේ නිෂ්පාදිත සංවර්ධන කාර්යයන්.

"හැරිස් කර් ෆෝස්ටර්" සැලැස්ම යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීමේ පළමු ප්‍රධාන සැලැස්ම අද දින දක්වා සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා ඇති නිශ්චිත සැලැස්මය. රටේ පවතින ප්‍රධාන ස්වභාවික. සමාජ සංස්කෘතික සහ මිනිසා විසින් නිර්මාණය කර ඇති ආකර්ෂණීය ස්ථානවලට අනුරූපීව පහත දැක්වෙන පරිදි සැලැස්ම අනුව ප්‍රධාන සංචාරක සංවර්ධන ප්‍රදේශ හයක් හඳුනාගෙන ඇත.

1. කොළඹ නගර ප්‍රදේශය.
2. මහ කොළඹ ප්‍රදේශය.
3. දකුණු සහ නිරිත දිග මුහුදු බඩ ප්‍රදේශය.
4. පුරාණ නගර ප්‍රදේශය.
6. උඩරට ප්‍රදේශය.

මෙම පුළුල් ප්‍රදේශවල සහ ඒවායේ මායිම් ප්‍රදේශවල රටේ මෙතෙක් ඇතිවී තිබෙන සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය අදටත් වලංගුය. මෙයට හේතුව වශයෙන් පෙනී යන්නේ රටේ තිබෙන සංචාරක ආකර්ෂණ ස්ථාන මෙම ප්‍රදේශ හය තුළ පිහිටා තිබීමය.

දසවසර සැලැස්මේ නිර්දේශ කිරීම් අනුව මණ්ඩලය විසින් අනුගමනය කළ සංවර්ධන ප්‍රතිපත්තිය එක් අතකින් සංචාරක ව්‍යාපාරයේ ආර්ථික ප්‍රතිලාභ උපරිම වශයෙන් ලබාගැනීමේ සහ අනික් අතට රටේ භෞතික හා සමාජ සංස්කෘතික පරිසරය කෙරෙහි සංචාරක ව්‍යාපාරය සංවර්ධනයෙන් ඇතිවිය හැකි අයහපත් බලපෑම් අවම කිරීමේ අභිලාෂය ඇතිව සැලසුම් සහගතව සහ පාලනය කර ඇති සංචාරක ව්‍යාපාර සංවර්ධන ප්‍රතිපත්තියක් විය. ප්‍රධාන සැලැස්ම මගින් සැලසුම් සහගත සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ ලැබුණු අතර 1968 සංචාරක සංවර්ධන පනත් මගින් පාලනය කර ඇති සංවර්ධනය සඳහා නෛතික පාදක ව්‍යුහය සම්පාදනය කර ඇත.

සංචාරක පහසුකම් සහ සේවා සංවර්ධනය කිරීමෙහිලා ආයෝජන යෙදවීමටත්, වාණිජ කටයුතු මෙහෙයවීමටත් දේශීය, පෞද්ගලික අංශය දිරිමත් කිරීම සංචාරක පහසුකම් සහ සේවා සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රමෝපාය විය. රාජ්‍ය අංශය විශාල මෙහෙයක් ඉටුකළ අන්තර්වාර්ති ආර්ථික ප්‍රතිපත්ති සමඟ එවකට (1977 ට පෙර) බලයේ සිටි අනුයාත රජයවල් විසින් අනුගමනය කරන ලද සංවර්ධන ප්‍රතිපත්තිවලට වඩා මෙය තරමක් විශේෂ ප්‍රතිපත්තියක් විය.

වැවිලි වතු කළමනාකරණය, අපනයන හා ආනයන වෙළදාම, මුද්‍රණය, රක්ෂණය, ඉදිකිරීම් ආදී ක්ෂේත්‍රවලට පෞද්ගලික අංශයේ පළපුරුද්ද සීමාවී ඇති බැවින්, සංචාරක ව්‍යාපෘති සඳහා ආයෝජන යෙදවීමටත් කටයුතු මෙහෙයවීමටත්, පෞද්ගලික අංශය ආකර්ෂණය කර ගැනීමට තරම් ප්‍රතිපත්ති ප්‍රකාශයට පත්කිරීමෙන් ප්‍රමාණවත් මෙහෙයක් ඉටු නොවිය. රජය මේ පිළිබඳව සැලකිලිමත් වීමෙන් පසු පෞද්ගලික අංශය සංචාරක ව්‍යාපාරය වෙත පොළඹවා ගැනීම සඳහා මූල්‍ය සහ අනෙකුත් දිරි දීමනා ඇතුළත් ආකර්ෂණීය යෝජනාවලියක් හඳුන්වාදී මෙම දිරි ගැන්වීම් පාලනය කිරීමේ කාර්යය සංචාරක මණ්ඩලය වෙත පවරන ලදී.

ආදායම් බදු සහන, ආයෝජන සහන, පහසු ගෙවීමේ ක්‍රම මත ලබාදෙන ණය මුදල් රේගු බදුවලින් නිදහස් කිරීම, නාමික බදු මුදල් මත දීර්ඝ කාලීන බදු මත හෝටල් සහ සංචාරක නිකේතන සංවර්ධනය කිරීම සඳහා ඉඩම් ලබාදීම ආදිය දිරි ගැන්වීමේ යෝජනාවලියට ඇතුළත් විය. එම අවස්ථාවේදීම සංචාරක මණ්ඩලය විසින් අඛණ්ඩ පදනමක් මත විදේශ රටවල ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා කටයුතු ආරම්භ කරන ලද අතර, සැලැස්මක් සංවර්ධනය කර ගැනීමේ දීර්ඝ කාලයක් සමඟ හෝටල් සහ සංචාරක නිකේතන ව්‍යාපෘති

සම්බන්ධයෙන් පෞද්ගලික අංශය විසින් වැඩි අවධානමක් සහිතව මුදල් ආයෝජනය කිරීම සඳහා එමගින් තවදුරටත් දිරි ගැන්වීමක් කරන ලදී.

පෞද්ගලික අංශය විසින් ක්‍රමයෙන් හෝටල් හා සංචාරක නිකේතන සහ අනෙකුත් සංචාරක පහසුකම් හා සේවා සංවර්ධනය කිරීමෙන් ඉතා යහපත් ලෙස ප්‍රතිචාර දක්වන ලදී. මෙම දිරි ගැන්වීම්වලින් විශාල සමාගම් පමණක් නොව, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර මෙහෙයවන්නන් ද පොළඹවා ගැනීමට හැකි විය. කෙසේ වුවද, හෝටල් සහ නිවාඩු නිකේතන සංවර්ධනය කිරීම ප්‍රධාන වශයෙන් මුහුදු වෙරළේ සහ සංචාරක ප්‍රදේශවල කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඒකකවලට (ආරම්භක අවස්ථාවලදී පනහට වඩා අඩු කාමර) විශාල වශයෙන් සීමාවිය. එබැවින් රජයට මැදිහත්වී විශේෂයෙන් කොළඹ නගරයේ විශාල සහ ඉහළ පංතියේ දේපළ වෙනුවෙන් ආයෝජන යෙදවීම ආරම්භ කිරීමට සිදුවිය. භාණ්ඩාගාරයෙ විසින් ඉන්ටර්කොන්ටිනෙන්ටල් හෝටලය සඳහා මුදල් ආයෝජනය කිරීම, ඔබෙරෝයි හෝටලය සඳහා ස.තො.ස මගින් මුදල් ආයෝජනය කිරීම සහ රාමදා හෝටලය සඳහා රක්‍ෂණ සංස්ථාව විසින් මුදල් ආයෝජනය කිරීම උදාහරණ ලෙස දැක්විය හැකිය. කෙසේ වුවද, රජය විසින් එහි පෞද්ගලීකරණ වැඩසටහන යටතේ පෞද්ගලික අංශයට කොටස් විකිණීමෙන් එහි අයිතිය පවරන ලදී.

සංචාරක මණ්ඩලය විසින් එහි සංවර්ධන ක්‍රමෝපායේ අත්‍යවශ්‍යඅංගයක් ලෙස පාලනය කළ දිරි ගැන්වීම් ක්‍රම හෝටල් සංවර්ධන කිරීම සඳහා පමණක් සීමා නොකළ අතර සංචාරක කර්මාන්තයේ අනෙකුත් අනු අංශ සඳහා ද ව්‍යාප්ත කරන ලදී. ප්‍රවාහන සහ අනෙකුත් උපකරණ සම්බන්ධයෙන් තීරුබදු රහිත ආනයනය කිරීම් සඳහා ඉඩකඩ ලබාදීමෙන් සංචාරක නියෝජිත ආයතනවලට සහ ආපන ශාලාවලට ප්‍රතිලාභ අත්විය. එසේම මත්පැන් බලපත්‍ර සඳහා අනුමැතිය, විදේශ මුදල් පිළිගැනීම සඳහා අවසර පත්‍ර, මණ්ඩලයේ ප්‍රවර්ධන ප්‍රකාශනවල ලැයිස්තුවලට ඇතුළත් කිරීම සංචාරක කර්මාන්තයේ සියලුම අංශවලට ලබාදෙන ලද දිරි ගැන්වීම්වලින් කිපයකි.

සංචාරක මණ්ඩලය විසින් නිෂ්පාදිත සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීනම් ක්ෂේත්‍රයේදී අනුගමනය කරන ලද මූලික පියවරවල් නිසා විශේෂයෙන් ජාත්‍යන්තර සංචාරක වෙළඳපොළවල්වල සියලුම අංශවලට සේවා සැලසිය හැකි සමතුලිත සංචාරක ව්‍යාපාරයක් අද ශ්‍රී ලංකාව සතුව පවතී. මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය බලපත්‍ර සහිත සංචාරක ව්‍යාපාර ආයතනවල පහත සඳහන් සංඛ්‍යා ලේඛන අනුව එය පෙනියයි.

**2005 වර්ෂය අවසාන වන විට බලපත්‍ර සහිත සංචාරක ව්‍යාපාර ආයතන**

| | වර්ගය | ඒකක සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සංචාරක හෝටල් | 248 |
| 2 | අතිරේක නවාතැන් පහසුකම් | 494 |
| 3 | ඇඳන් සහ උදේ ආහාර වේල සඳහා ඉඩ පහසුකම් | 22 |
| 4 | ස්වාධීන ආපන ශාලා (සාමාන්‍ය සහ විශේෂ) | 428 |
| 5 | සංචාරක හා ප්‍රවාහන නියෝජිත ආයතන | 502 |
| 6 | සංචාරක සාප්පු | 144 |
| 7 | කුළු බඩු සඳහා වගා උයන් | 29 |
| 8 | ජල ක්‍රීඩා මධ්‍යස්ථාන | 14 |
| | එකතුව | 1,881 |

මූලාශ්‍රය :- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය ඇසුරෙනි.

සංචාරක හෝටල්වල මුළු කාමර සංඛ්‍යාව 13,162 ක් වූ අතර, අතිරේක නවැතැන් පහසුකම් ඒකක සහිත තවත් කාමර 3,962 ක්ද විය. මෙ නිසා නවාතැන් පහසුකම් සහිත කාමර සංඛ්‍යාව 17,124 ක් විය.

## 2.5 මණ්ඩලයේ සංචාරක ප්‍රවර්ධන කාර්යයන්.

ශ්‍රී ලංකාවේ විදේශ සංචාරක චාරිකා කටයුතු සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම ලංකා සංචාරක මණ්ඩල පනතින් සංචාරක මණ්ඩලය වෙත පැවරුණු ප්‍රධාන කාර්යයක් විය. ඒ අනුව ප්‍රවර්ධන ක්‍රමෝපාය සහ දස අවුරුදු සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්මේ නිර්දේශිත සැලැස්ම අනුගමනය කිරීමෙන් රටේ ප්‍රවර්ධනය ඇතිකිරීමට සංචාරක මණ්ඩලය විසින් කටයුතු සලසන ලදී. මේ සම්බන්ධයෙන් අනුගමනය කරනු ලැබූ ක්‍රමෝපාය පහත දැක්වෙන පරිදි වේ.

* පළමුව ප්‍රධාන චාරිකා කටයුතු හා සංචාරක කටයුතු මෙහෙයවන්නන් (සංචාරක ව්‍යාපාරය) අතර ශ්‍රී ලංකාවේ සංචාරක නිෂ්පාදිතය පිළිබ දැනුවත් කිරීම සහ ඔවුන්ගේ

සංචාරක විස්තර සටහන්වලට ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ව්‍යාප්ත ප්‍රදේශය ඇතුළත් කිරීම සුහා විවිධ ක්‍රම මගින් ඔවුන් පෙලඹවීම.

* දෙවනුව ශ්‍රී ලංකාවේ සංචාරක නිෂ්පාදිතය හඳුන්වාදීම සඳහා සංචාරක ව්‍යාපාරය සහ චාරිකා මාධ්‍ය තුලින් පාරිභෝගියා වෙත ප්‍රවේශවී ශ්‍රී ලංකාවේ සංචාරක නිෂ්පාදිතය මිලදී ගැනීමට ඔහු තුල අභිලාශයක් ඇති කිරීම.

ඒ අනුව සංචාරක මණ්ඩලය විසින් ඉටු කරන ලද පළමු කටයුත්ත නම් ප්‍රධාන වෙළඳ පොළවල් නිර්මාණය කරන ප්‍රධාන නගරවල සංචාරක ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කරන අලෙවි සැල් ජාලාවක් පිහිටුවීමය. සංචාරක මණ්ඩලය සතු කාර්යාල ප්‍රධාන නගරවල පිහිටුවීම සහ අනෙකුත් නගරවල නියෝජ්‍ය කාර්යාල පිහිටුවීම මෙයට ඇතුළත්විය. 1970 වර්ෂවල ආරම්භ කරන ලද කාර්යාල කීපයක් 1980 වර්ෂවල ඇතිවූ චාර්ගික ගැටුම්වලින් පසු වසාදමන ලදී. දැනට ෆ්‍රෑන්ක්ෆට්, ලන්ඩනය, පැරිසිය, ටෝකියෝ සහ බෙයිජින් යන නගරවල සංචාරක මණ්ඩලය සතු කාර්යාල තිබෙන අතර දිල්ලිය සහ නිව්යෝක් යන නගරවල නියෝජන කාර්යාල සංචාරක මණ්ඩලය සතුව ඇත.

මෙම කාර්යාල මගින් සංචාරක මණ්ඩලය විසින් විදේශ සංචාරක ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී. නිත්‍ය පදනමක් මත සිදු කරන ලද ප්‍රවර්ධන කටයුතු හඳුනාගෙන පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

* පාරිභෝගිකයන්, සංචාරක ව්‍යාපාරය සහ මාධ්‍යය මගින් චාරිකා විමසීම් සේවා සැපයීම.

* පාරිභෝගිකයන් වෙතද සංචාරක ව්‍යාපාරයට සහ මාධ්‍යයට ද චාරිකා විස්තර ඇතුලත් පත්‍රිකා ආදිය බෙදාදීම.

* සංචාරක වෙළඳාම සහ චාරිකා කටයුතු මාධ්‍යය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ සහ අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම.

* පාරිභෝගික සහ වෙළඳ යන අංශ දෙකටම සම්බන්ධ සංචාරක පොළවල් සඳහා නිතිපති සහභාගිත්වය.

* සම්මන්ත්‍රණ, වැඩමුළු සහ වීථි ප්‍රදර්ශන තත්කාර්යය පදනම මත පැවැත්වීම.

සංචාරක ප්‍රවර්ධන කටයුතු අර්ථානුකූලව සිදු කිරීම සඳහා රජයෙන් සපයනු ලබන මුදල් ප්‍රමාණවත් නොවීම ආරම්භයේදීම පටන් සංචාරක මණ්ඩලයට ඇතිවූ නිරන්තර ගැටලුව බව, අවධාරණය කළ යුතුය. එබැවින් මණ්ඩලයේ සංචාරක ප්‍රවර්ධන කටයුතු ස්වභාවයෙන්ම විශාල වශයෙන් පසු බැමකට ලක්වූ අතර, එම කටයුතු වැඩි වශයෙන් සංචාරක ව්‍යාපාරය සඳහා යොමු විය. පාරිභෝගික ප්‍රවර්ධන කටයුතු පාරිභෝගික වෙළඳ පොළවල්වලට සීමාවූ අතර වීථි ප්‍රදර්ශන පැවැත්වීම සහ මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රතිඵලයක් වශයෙන් පිළිගැනීමක් ලැබුණි. අයවැය පිළිබඳව පැවති බාධක හේතු කොටගෙන පාරිභෝගිකයා අරමුණු කරගත් ප්‍රචාරක ව්‍යාපරයක් පවත්වාගෙන යාමට මණ්ඩලයට කිසිවිටෙකත් හැකි නොවීය.

මෙසේ අපේක්ෂිත පාරිභෝගිකයන්ට ශ්‍රී ලංකාවේ සංචාරක නිෂ්පාදිතය ප්‍රවර්ධනයකර අලෙවි කිරීම සඳහා සංචාරක කටයුතු මෙහෙයවන්නන් මත සංචාරක මණ්ඩලය යැපී ඇත. ශීත ඍතුවේ සහ ගිම්හාන ඍතුවේදී ලක්ෂ සංඛ්‍යාත පාරිභෝගිකයන් සඳහා විශාල ප්‍රමාණයේ සංචාරක පහසුකම් සලසා ඔවුන්ට ඒවා අලෙවි කරණ මහා පරිමාණයේ සංචාරක කටයුතු මෙහෙයවන්නන් විසින් පාලනය කරනු ලබන යුරෝපා වෙළඳ පොළවල් සම්බන්ධයෙන් විශේෂයෙන් මෙය සත්‍යයක් විය. ශ්‍රී ලංකාවේ සංචාරක වෙළඳාම විශේෂයෙන් විශාල වශයෙන් හෝටල් කාමර පහසුකම් සැලසීමේ ප්‍රධානත්වය ගෙන කටයුතු කළ මහා පරිමාණයේ ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවන නියෝජිතයන් කීපදෙනෙකු විසින් කෙටි කාලයක් තුළ වඩා ලාබදායික වූ වෙරළ ආශ්‍රිත විශාල සංචාරක වෙළඳපොළ අල්ලා ගන්නා ලදී.

සංචාරක වෙළඳපොළවල්වල අනෙකුත් ඛාණ්ඩවල ශ්‍රී ලංකා සංචාරක නිෂ්පාදිතය අලෙවි කිරීමට සම්පූර්ණයෙන්ම පාහේ නොහැකි වූ 1990 වර්ෂවල සහ 1980 වර්ෂවල හටගත් වාර්ගික සහ ත්‍රස්තවාදී ගැටළු ඔවුන්ට එසේ කටයුතු කිරීමට පොළඹවන ලද හේතුව විය. ශ්‍රී ලංකාවේ ඇතිවූ සිදුවීම් නිසා පැතිර ගිය අයහපත් ප්‍රචාරය මැඩ පැවැත්වීමට ප්‍රමාණවත් මූල්‍ය සම්පත් නොමැතිකම ජාත්‍යන්තර වෙළඳපොළේ ලංකාව අලෙවි කිරීම වඩාත් දුෂ්කරවීමට හේතු කාරක විය. කෙසේ වුවද, මෑත වර්ෂවල සිට මෙම තත්වය සැලකිය යුතු ලෙස වඩා යහපත් තත්වයට හැරී ඇත.

සංචාරක මණ්ඩලයේ ප්‍රධානත්වයෙන් සිදු කෙරෙන සංචාරක ව්‍යාපාරය මුහුදු වෙරළෙන් ඔබ්බට ශ්‍රී ලංකාවේ සංචාරක අලෙවි කටයුතු ව්‍යාප්ත කිරීමට පෙරමුණ ගෙන ක්‍රියා කරන අතර. ස්වභාවය සහ අවදානම පිළිබඳ අවධානය යොමු වෙමින් පවතී. තවද. දැනටමත් සැලකිය යුතු අරමුදලක් ලෙස පෙති ගොස් ඇති සංචාරක සංවර්ධන අරමුදලකට ගෙවනු ලබන අපගමන බද්ද සහ සංචාරක සංවර්ධන බද්ද මගින් ආදායම් ඉපැයීමට රජය නීති සම්පාදනය කර සම්මතකර ඇති අතර අරමුදලෙන් විශාල ප්‍රමාණයක් වෙන්කර ඇත්තේ. සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහාය.

එම නිසා සංචාරක සංවර්ධන අරමුදල මගින් ලැබී ඇති මුදල වඩා ප්‍රයෝජනවත් ලෙස සංචාරක ව්‍යාපාරයේ මතු ධරණීය සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා යොදාගැනීම පිණිස සකස් කළ යුතු වඩා උචිත ආයතනික ව්‍යුහය සම්බන්ධයෙන් දැන් මතභේදයක් හටගෙන ඇත.

## 2.6 මණ්ඩලයේ නියාමන කාර්යයන්.

ඉහත සඳහන් කළ පරිදි භෞතික හා සමාජ සංස්කෘතික පරිසරය කෙරෙහි සංචාරක ව්‍යාපාරය සංවර්ධන කිරීමෙන් ඇතිවිය හැකි අයහපත් බලපෑම් අවම කර ගැනීමෙන් ආර්ථික වාසි උපරිම ලෙස සළසා ගැනීමෙන් අභිලාෂය ඇතිව සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සැලසුම් සහගතව නියාමනය කිරීම මණ්ඩලය අනුගමනය කළ සංවර්ධන ප්‍රතිපත්තිය විය. එබැවින් නියාමනයේ අරමුණ වූයේ පෞද්ගලික අංශයේ සංචාරක කටයුතු මෙහෙයවන්නන් පාලනය කිරීම හෝ එම අයට දුෂ්කරතා ඇති කිරීම හෝ නොව. ජාත්‍යන්තර වෙළඳ පොළේ ශ්‍රී ලංකාවට කාර්යක්ෂම අන්දමින් තරග කිරීමට හැකිවන ලෙස සංචාරක නිෂ්පාදිතය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීමය. මෙසේ නියාමනයේ අරමුණ පහත සඳහන් පරිදි අර්ථනිරූපනය කර දැක්විය හැකිය.

* සංචාරක පහසුකම් සහ සේවා පාලනය කිරීමෙන් තොරව සහ නොසැලකිලිමත් ලෙස සංවර්ධනය කිරම වැළැක්වීම.

* සංචාරකයන් සඳහා සපයනු ලබන පහසුකම් සහ සේවාවන් ජාත්‍යන්තර පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලවන ලෙස සැලසීමට වගබලා ගැනීම.

* සපයනු ලබන පහසුකම් සහ සේවාවන් සඳහා විශිෂ්ටත්වයේ සංකේතයන් ලබාදීම.

ඉහත සඳහන් වචනාර්ථය අනුව සංචාරක මණ්ඩලයේ නියාමන කාර්යයන් තත්ව පාලන ක්‍රියාවක් ලෙස සලකා බැලිය හැකිය. ප්‍රධාන ජනත රටවල්වල පවතින පාරිභෝගිකයන් ආරක්‍ෂා කිරීමේ නීති සම්බන්ධයෙන් සංචාරක කටයුතු මෙහෙයවන්නන්ට ආරක්‍ෂාව සලසන යාන්ත්‍රණයක් ඉන් ඇති කරයි. වෙනත් අර්ථයක් ගෙනහැර දක්වන්නේ නම්, සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තරඟකාරී තත්වය තගාසිටුවීම සඳහා ඉවහල් වන්නක් ලෙස ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු නිෂ්පාදිතයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සලනකා බැලිය හැකිය. එසේ හෙයින් එය සමස්ත අලෙවිකරණ සංකල්පයේ අත්‍යවශ්‍ය අංගයකි.

විවිධ වර්ගයේ සංචාරක ව්‍යාපාර කටයුතු ලියාපදිංචි කිරීම සහ ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ විධිවිධාන සලසා ඇති පරිදි විවිධ සංචාරක නීති සංග්‍රහයන් ප්‍රකාශයට පත් කිරීමට පෙර හෝටල්, ආගන්තුක නිවාස, සංචාරක නියෝජිත ආයතන, ආපන ශාලා, සංචාරක වෙළඳසැල් ආදිය වැනි සංචාරක ව්‍යාපාර ආයතන සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රමයක් සංචාරක මණ්ඩලය විසින් පරිපාලනමය කටයුත්තක් වශයෙන් අනුගමනය කරන ලදී. මත්පැන් බලපත්‍ර සඳහා අනුමැතිය ලබාදීම, විදේශ මුදල් සඳහා අවසරපත් ලබාදීම මණ්ඩලයේ ප්‍රවර්ධන ද්‍රව්‍ය ලැයිස්තුගත කිරීම වැනි විවිධ දිරි ගැන්වීම් ක්‍රම පරිපාලනය කිරීම මගින් අනුමැතිය ලබාදීම සඳහා මණ්ඩලයේ නියමයන්ට අනුකූලව කටයුතු කරන ලදී.

කෙසේ වුවද, සංචාරක හෝටල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය, සංචාරක නියෝජිතයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය, සංචාරක නියමු කථිකාචාර්යවරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය සහ නිශ්චිත සංචාරක සේවා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය යන සංචාරක ව්‍යවස්ථා සංග්‍රහ හතර ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සංචාරකයන්ගේ ප්‍රයෝජනය සඳහා සලසන ලද පහසුකම් සහ සේවා නීතියේ සීමාව ඇතුලතට පත් කරන ලදී. ඒ අනුව සංචාරකයන්ගේ ප්‍රයෝජනය සඳහා සංවර්ධනය කරන ලද සියලුම සංචාරක පහසුකම් සහ සේවා අදාල ව්‍යවස්ථා සංග්‍රහයන් යටතේ ලියාපදිංචි කළ යුතු අතර ඒ සඳහා බලපත්‍ර ලබාගත යුතුය. මෙයින් අදහස් වන්නේ, ලියාපදිංචිය සහ වාර්ෂික බලපත්‍ර ලබාගැනීම ආහා සුදුසුකම් ලැබීමට නියමිත අවම ප්‍රමිතීන්ට අනුව ඒවා අනුකූල විය යුතු බවත්, පවත්වාගෙන යා යුතු බවත්ය. සියලුම ව්‍යවස්ථා සංග්‍රහයන් ක්‍රියාත්මක කිරීම සඳහා සංචාරක

මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා "තිසි බලධාරියා" ලෙස 1968 සංචාරක සංවර්ධන පනත මගින් නම්කර ඇති බව සඳහන් කිරීම වැදගත් වේ. මෙම තනතුරේ ඔහු ස්වාධීනව කටයුතු කරයි.

2.7 මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන සහ පර්යේෂණ කාර්යයන්.

අවදානම අභියෝගයකට ලක් නොකිරීමෙන් සංචාරක ව්‍යාපාරයේ සංඛ්‍යා ලේඛන ක්ෂේත්‍ර මණ්ඩලය සතුව විශිෂ්ට වාර්තාවක් ඇති බව පැවසිය හැකි අතර, එහි කාර්යයන් ඉටුකිරීම් සඳහා කීර්තියක් ලබා ඇතිබව ආඩම්බරයෙන් යුතුව පැවසිය හැකිය. එහි මූලික දත්ත වැඩසටහන ලෝකයේ කිසියම් රටක විශිෂ්ට ගනයේ වැඩසටහනක් බව ශාන්තිකර ආසියාතු සංචාරක සංගමය (ශා.ආ.ස.ස) සහ එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (එ.ජා.ලෝ.සං.ස) විසින් පිළිගෙන ඇත.

මූලික දත්ත වැඩසටහන ඉතා පුළුල් වැඩ සටහනක් වන අතර සවිස්තර හරස්කඩ තොරතුරු සහිත ආගන්තුකයන් පැමිණීම පිළිබඳ සංඛ්‍යා ලේඛනවලට අමතරව නවාතැන් මෙහෙයුම් කටයුතු, විදේශ විනිමය ඉපැයීම්, රජයේ ආදායම් එකතුව සංචාරක මිළ ගණන්, ගුවන් සේවා මෙහෙයුම් කටයුතු සහ මගී ගමන් බිමන් ආදී සංඛ්‍යා ලේඛන මෙම වැඩසටහනට ඇතුළත් වේ. මෙම තොරතුරු ආවරණය කිරීමට අමතරව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඉතා නිවැරදි මට්ටමක එය පවති. තවද සංඛ්‍යා ලේඛන කාලෝචිත ප්‍රකාශයට පත්කිරීම සැලකිය යුතු ලෙස මැනවින් පවත්වාගෙන යනු ලබයි.

මණ්ඩලය විසින් සම්පාදනය කර පවත්වාගෙන යනු ලබන මූලික දත්ත නිතිපතා පළ කරන ප්‍රකාශන දෙකක් මගින් ප්‍රසිද්ධියට පත් කරනු ලබයි. එම ප්‍රකාශන දෙක පහත දැක්වේ.

1. ඉදිරි මාසය අවසන්වීමට පෙර පළ කරනු ලබන මාසික සංඛ්‍යා ලේඛන ප්‍රකාශය.

2. අදාළ වර්ෂයේ අවසානයේ සිට මාස හයක් ඇතුළත පළ කරනු ලබන වාර්ෂික සංඛ්‍යා ලේඛන වාර්තාව.

මෙම ප්‍රකාශන සංචාරක කර්මාන්තයට පමණක් නොව, රජයේ නියෝජිත ආයතන, පර්යේෂකයන් සහ සාමාන්‍ය ජනතාව සඳහා ප්‍රයෝජනවත් වන බව පෙනී යොස් ඇත.

කෙසේ වුවද, ගුණාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයේදී මණ්ඩලයේ කටයුතු අපේක්ෂා කල තරමට ඉටුනොවී ඇති අතර මූල්‍ය හා මානව සම්පත් නොමැතිකම මෙයට බොහෝ සෙයින් හේතුවී ඇති බව දැක්විය හැකිය.

## 2.8 දේශීය සංචාරක ව්‍යාපාරය සහ ප්‍රජා සම්බන්ධතා කාර්යයන්.

දේශීය සංචාරක ව්‍යාපාරය ලංකා සංචාරක මණ්ඩල පනත අනුව සංචාරක මණ්ඩලය වෙත නිශ්චිත වශයෙන් පැවරී නොමැති කාර්යයන් වුවද දේශීය සංචාරකයන්ගේ ප්‍රයෝජනය සඳහා නවාතැන් පහසුකම් සැලසීම සඳහා සංචාරක මණ්ඩලය විසින් මූලික පියවරවල් කීපයක් ගෙන ඇත. 1970 වේ වර්ෂවලදී සංචාරක මණ්ඩලය විසින් පවත්වන ලද සමීක්ෂණයක් අනුව මෙරට ජනතාවගෙන් හතරෙන් තුනක් පමණ වන්දනා ගමන් සඳහා සංචාරයේ යෙදෙන බවත්, තවත් දහයෙන් එකක පමණ සංඛ්‍යාවක් නිවාඩු ගත කිරීම සඳහා සංචාරයේ යෙදෙන බවත් අනාවරණයවී ඇත. ඉතිරි සංඛ්‍යාව බොහෝ සෙයින් ව්‍යාපාර කටයුතු වෙනුවෙන් සංචාරය කරන අය වූහ. බොහෝ අවස්ථාවලදී වන්දනා ගමන් සඳහා සංචාරයේ යෙදෙන අය නිවාඩු ගත කිරීම සඳහා සංචාරයේ යෙදෙන අයද වෙති.

මේ අනුව සංචාරක මණ්ඩලය විසින් ප්‍රධාන ආගමික මධ්‍යස්ථානවල (උදාහරණ වශයෙන් කතරගම හා අනුරාධපුර) වන්දනා නිකේතන පිහිටුවා ඇති අතර නිවාඩු ගත කිරීම සඳහා යන ජනප්‍රිය ස්ථානවල (උදාහරණ වශයෙන් නුවරඑළිය, බණ්ඩාරවෙල, බෙන්තොට, පාසිකුඩා, ගිරිතලේ) නිවාඩු නිකේතන සහ සංචාරක බංගලා පිහිටුවා ඇත. මෙම ස්ථාන සියලුම පංතිවලට අයත් දේශීය සංචාරකයන් අතර ඉතා ජනප්‍රියවී ඇති බව පෙනී ගොස් ඇත. සාධාරණ මිල ගණන්වලට ඒ සමාන පහසුකම් සැපයීමට පෞද්ගලික අංශයේ සංවිධාන ද මෙයින් දිරිමත්වී ඇත.

විශාල වශයෙන් ප්‍රජා සම්බන්ධතා කටයුත්තකක් ලෙස සංචාරක මණ්ඩලය විසින් මෙම මූලික පියවරගෙන ඇති බව අවධාරණය කල යුතුය. සංචාරක ව්‍යාපාර සංවර්ධන වැඩ සටහන් මූලික අවස්ථාවලදී මධ්‍යම පංතිය විශේෂයෙන්

වෘත්තීය පංතිවලට අයත් පුද්ගලයන් විසින් රජය සහ සංචාරක මණ්ඩලය දේශීය සංචාරකයන්ගේ මූලික අවශ්‍යතාවන් සම්පූර්ණයෙන් නොසලකා හැර, විදේශ සංචාරකයන් සඳහා සුඛෝපභෝගී පහසුකම් සලසන බවට විවේචනය කරන ලදී.

ඇත්ත වශයෙන්ම දැරිය හැකි මිල ගණන්වලට වැදගත් දේශීය සංචාර මධ්‍යස්ථාන සඳහා මූලික නවාතැන් පහසුකම් සැපයීමටත්, ලංකාවේ විදේශ සංචාරක ව්‍යාපාරයේ ඇති ආර්ථික හා සමාජීය වැදගත්කම පිළිබඳව පාසල් සහ ප්‍රසිද්ධ ප්‍රදර්ශන මගින් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීමටත් සංචාරක මණ්ඩලය විසින් කාලෝචිතව කටයුතු නොකලේ නම්, විදේශ සංචාරක ව්‍යාපර සංවර්ධන වැඩසටහන සඳහා මහජන සහයෝගය නොලැබීමට ඉඩ තිබිණි.

## 2.9 මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධන කාර්යයන්.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ පැවති රජයේ සංචාරක කාර්යාංශය විසින් 1964 වර්ෂයේදී පිහිටුවනු ලැබූ ලංකා හෝටල් පාසල 1966 ජුනි මාසයේදී ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවීමෙන් පසු සෘජුවම එම මණ්ඩලයේ පාලනය යටතට පත්විය. මෙසේ හෝටල් සහ ආහාර සැපයීමේ කර්මාන්තය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවූ මානව සම්පත් සංවර්ධනය අලුතින් පිහිටුවන ලද සංචාරක මණ්ඩලයේප්‍රධාන කාර්යයක් බවට පත්විය. සංචාරක මණ්ඩලය විසින් මෙම කාර්ය මනාලෙස විශිෂ්ට අන්දමින් ඉටු කිරීමට භාරගන්නා ලදී. සංචාරක මණ්ඩලයේ පාලනය යටතේ හෝටල් පාසල පවත්වාගෙන යාම පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් මෙම වාර්තාවේ 3 වැනි පරිච්ඡේදය යටතේ වෙනම දක්වා ඇත.

විදේශ සමාගම්වලට අයත් සහ/හෝ එම සමාගම්වලින් පාලනය වූ විශේෂයෙන් කොළඹ නගරයේ පිහිටි හෝටල් කීපයක් හැර ශ්‍රී ලංකාවේ හෝටල් සහ ආපන ශාලා කර්මාන්තය සඳහා මිනිස්බල අවශ්‍යතා සියල්ලම පාහේ ලංකා හෝටල් පාසල මගින් සපයන ලද බව මෙහිලා සඳහන් කිරීම ප්‍රමාණවත් වේ. මෙය ඇත්ත වශයෙන්ම සංචාරක මණ්ඩලයේ පාලනය යටතේ ලංකා හෝටල් පාසල ලැබූ විශිෂ්ට ජයග්‍රහණයකි.

## 2.10 මණ්ඩලයේ සවිබලතාවයන් සහ දුර්වලකම්.

සංචාරක මණ්ඩලය ආරම්භයේ සිට එය පවත්වාගෙන යාම පිළිබඳව කලින් සඳහන් කල සංක්ෂේප විස්තරයෙන් පෙනන පරිදි රටේ සංචාරක කර්මාන්තය ධනාත්මකව සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සංචාරක මණ්ඩලය විසින් නිසැකවම විශාල දායකත්වයක් ලබාදී ඇත. මෙම පරිච්ඡේදයේ 3 වැනි කොටස යටතේ දැක්වෙන සංඛ්‍යා ලේඛන වගුව මගින් සංචාරක මණ්ඩලයේ මගපෙන්වීම යටතේ පසුගිය දශක හතර තුල සංචාරක පහසුකම් සහ සේවා පිළිබඳ ලබා ඇති විශාල සංවර්ධනය පෙන්නුම් කරයි.

එසේම 1960 වර්ෂවල ප්‍රථම භාගයේ වසරකට 20,000 ක් පමණ වූ සංචාරකයන්ගේ පැමිණීම 2004 වර්ෂයේ 550,000 ක් පමණ දක්වා වැඩිවී ඇත. විදේශ විනිමය උපයාගැනීමේදී සාම්ප්‍රදායික අපනයන නිෂ්පාදිත මත රබර්, පොල් සහ මැණික් අභිබවා යාමට සංචාරක ව්‍යාපාරයට හැකිවී ඇති අතර, එය සිව්වැනි විශාල විදේශ ආදායම් උපයන මාර්ගය බවට පත්වී ඇත. එම අවස්ථාවේදීම සංචාරක ව්‍යාපාරය මගින් ලක්ෂයකට අධික පුද්ගලයන් සංඛ්‍යාවකට සෘජුව සහ වක්‍රව රැකියා සහ ආදායම් මාර්ග සලසාදී ඇත.

සමස්තයක් වශයෙන් සංචාරක මණ්ඩලයටත්, සංචාරක කර්මාන්තයටත් අතිශයින් අයහපත් තත්වයන් යටතේ කටයුතු පවත්වාගෙන යාමට තිබියදසිත් විශිෂ්ට ප්‍රගතියක් ලබා ඇත. උතුරු නැගෙනහිර දශක දෙකකට ආසන්න කාලයක් තුල පැවති ත්‍රස්තවාදී ක්‍රියා නිසාද දශකයකින් අඩකට ආසන්න කාලයක් තුල බැරෑරුම් සහගත ලෙස ආරක්ෂාව පිළිබඳ ගැටලු පවතින බවට ප්‍රතිමූර්තියක් නිර්මාණය වූ බැවින්, සංචාරක ව්‍යාපාර සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ සංචාරක මණ්ඩලයේ වැඩසටහන කෙරෙහි දැඩි ලෙස බලපෑමක් ඇතිවූ බව වැඩිදුර අවධාරණය කල යුතු කරුණක් නොවේ. මෙම හැම කරුණකටම වඩා බෙහෙවින් බලපෑවේ 2004 දෙසැම්බර් මාසයේ සිදුවූ ශ්‍රී ලංකාවට අමතක නොවන ඉතාමත් අයහපත් ජාතික ආපදාවක් වන සුනාමි ව්‍යසනයයි.

අයහපත් තත්වයන් යටතේ සංචාරක මණ්ඩලය නිසැකව ලැබූ ජයග්‍රහණවලින් හැඟ යන්නේ එය සතුව ඇතැම් සවිබලකම් ඇති බවත්, ඒවා මැනවින් ප්‍රයෝජනයට ගෙන ඇති බවත්ය. සංචාරක කර්මාන්තය සංවර්ධනය සහ ප්‍රවර්ධනය, සඳහා සම්පූර්ණයෙන් රජයේ මැදිහත්වීම නිසා සංචාරක මණ්ඩලයට විශිෂ්ට අන්දමේ සවිබලකම් සතුව ඇති බව පෙනී යයි. අන්‍යාකාරයෙන්

විවිධත්වයක් සහිත කොටස්වලට බෙදී ඇති කර්මාන්තයක සියලුම අංශ සම්බන්ධීකරනය සහ නායකත්වය පැවරුණු තනි නියාමකයක් වශයෙන් එය සලකා ලදී. මේ සඳහා පාදකමූ කළමනාකරනය වූයේ සංචාරක කර්මාන්තය ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව පමණක් නොව, සංචාරක කර්මාන්තය තිරසාර ලෙස සැලසුම් කිරීම, සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම සඳහා අවශ්‍ය වූ කාර්යයන් සහ කටයුතු එක සමාන ලෙස ඒකාබද්ධකර පිරිවැය ඵලදායීතාවය ඇතිවන ලෙස ක්‍රියාත්මක කිරීමය.

නවාතැන් සහ අනෙකුත් පහසුකම් සපයා සේවා පවත්වාගෙන යාමට අති විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය ව්‍යාපෘති සඳහා අවදානම් ලෙස ආයෝජන යෙදවීමට සාපේක්ෂ ලෙස මහා පරිමාණයෙන් පෞද්ගලික අංශය යොදවා ගැනීමට සංචාරක මණ්ඩලයට හැකිවී තිබීම එය ලබා ඇති සැලකිය යුතු ජයග්‍රහණයක් ලෙසත්, එය සතු සවිබලකම් පිළිබිඹු කිරීමක් ලෙසත් හැඳින්විය හැකිය.

සංචාරක පහසුකම් සහ සේවා සැපයීම සඳහා යොදවනු ලැබන ආයෝජන සියල්ලමත්, එම කටයුතු පවත්වාගෙන යාමත් පෞද්ගලික අංශය සතුව පවතින බව පැවසිය හැකිය. සංචාරක මණ්ඩලය පෞද්ගලික අංශය සඳහා පහසුකම් සැලසීමට සහ එහි කටයුතු ප්‍රවර්ධනය කිරීමට ක්‍රියා කරන ආයතනයක් වශයෙන් සංවර්ධනය ඇති කිරීමෙහිලා හුදෙක් වගකිව යුතු ආයතනයක් බව පැවසීම ද සත්‍යයකි.

රට අභ්‍යන්තරයේ ආරක්ෂාව පිළිබඳ පැවති ගැටලු සහ ස්වභාවික ආපදාව නිසා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පස බැම්වලට ලක්නොවූයේ නම් සංචාරක මණ්ඩලය වෙත පැවරී තිබූ මෙහෙවර සම්බන්ධයෙන් එහි කාර්ය සාධනය ඉහත සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කළ තත්වයට වඩා සතුටුදායක වීමට ඉඩතිබූ බව පැවසිය හැකිය.

දුර්වලතාවයන්.

කරුණු දැක්වීම සඳහා කමිටුව හමුවට පැමිණි සංචාරක වෙළඳ කටයුතු මෙහෙයවන කොටස්කරුවන් වෙත විශේෂයෙන් මෙම ප්‍රශ්නය යොමු කරන ලදී.

සංචාරක මණ්ඩලය දැන් දශක හතරක කාලයක් පැරණි බවත්, කාලය අනුව එය වෙනස් කිරීම අවශ්‍ය බවත් පැවසීම හැර එහි පවතින දුර්වලකම් නිශ්චිත

වශයෙන් විස්තර කිරීමට සංචාරක ව්‍යාපාර සංගම් තුනකට නොහැකි විය. (නිර්ණේය විෂයයේ පිටපතක් ඔවුන් වෙත සපයා කියවා දෙන ලදී) සංචාරක මණ්ඩලයේ කටයුතු කලමනාකරනයේදී පෞද්ගලික අංශයේ නියෝජනයක් නොමැති බැවින් සංචාරක කර්මාන්තයේ කළමනාකරණය සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ සහභාගිත්වයක් නොමැති බව ඔවුහු වැඩිදුරටත් පැවසූහ. සියලු සංගම් විසින් සංචාරක මණ්ඩලයේ වර්තමාන සභාපති සම්බන්ධයෙන් පවතින ගැටලු පිළිබඳව කරුණු දක්වන ලදී. මෙය ඇත්ත වශයෙන්ම පුද්ගලයකු සම්බන්ධයෙන් පැවති ගැටලුවක් නොවන බව සටහන් කරන ලදී.

කෙසේ වුවද, සංචාරක වෙළඳ සංගමයෙන් කමිටුව හමුවට පැමිණි පුද්ගලයන් විවිධ මත දරන ලදී. සංචාරක කර්මාන්තයේ පවතින වර්තමාන ගැටලු ආයතනයක් වශයෙන් සංචාරක මණ්ඩලයේ දුර්වලතාවයන් නිසා ඇතිවී තිබෙන බව ඔවුන් සිතන බවක් නොපෙනෙන නමුදු රජයේ සේවකයන් වශයෙන් තමන් සතු මෙහෙවර පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට ප්‍රධාන වශයෙන් අපොහොසත්වීම නිසා අවාසනාවකට මෙන් සුහදව කටයුතු කිරීමට නොහැකිවී ඇති අමාත්‍යාංශයේ ලේකම්ගේ සහ සංචාරක මණ්ඩලයේ සභාපතිගේ හා සංචාරක කර්මාන්තයේ නායකත්වයේ ඇතැම් ආකල්ප මෙම වර්තමාන ගැටලුවලට හේතුවන බව ඔවුහු පෙන්වා දෙති. රටේ ගැටලු තිබියදී වුවද සංචාරක මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් එයට පැවරී ඇති මෙහෙවර සාර්ථක ලෙස ඉටුකර ඇති බව සියලුම දෙනා අදහස් කරති. සංචාරක මණ්ඩලය වැනි රජයේ ආයතනයක් මගින් සංචාරක කර්මාන්තය පාලනය කරනු ලබන්නේ නම්, එය ආරක්ෂා සහිත බව කුඩා සහ මධ්‍යම ව්‍යවසායකයන්ට විශේෂයෙන් හැඟී යයි.

කෙසේ වුවද, ලෝකයේ බොහෝ රටවල සංචාරක කර්මාන්ත කළමනාකරණයේදී වර්තමානයේ පවතින ප්‍රවණතාවයන් පිළිබඳව එ.ජා.ලෝ.ස.ස ඇතුළුව විවිධ සංවිධාන මගින් සිදු කරන ලද විවිධ අධ්‍යයන කටයුතු අනුව සංචාරක ව්‍යාපාරයේ වර්තමාන සංවර්ධනය පිළිබඳව සලකා බලන කල ආයතනයක් වශයෙන් සංචාරක මණ්ඩලයේ ඇතැම් දුර්වලතාවයන් පවතින බව කමිටුව අදහස් කරයි. මෙම දුර්වලතාවයන් පහත සඳහන් විවිධ මාතෘකා යටතේ දක්වා ඇත.

1. කලමනාකරන මණ්ඩලයට පත්කිරීමේ ක්‍රමය.

සාමාජිකයන් හත් දෙනෙකු අතරින් මුදල් අමාත්‍යාංශය සහ පළාත් පාලන

අමාත්‍යාංශය නියෝජනය වන පරිදි නිල බලයෙන් සාමාජිකයන් දෙදෙනෙකු පත්වන අතර, සභාපති ඇතුළුව අනෙකුත් සාමාජිකයන් පස්දෙනාව පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. නිතරම මෙම පත්වීම් දෙනු ලබන්නේ සංචාරක ව්‍යාපාරය පිළිබඳ පළපුරුද්දක් සහ/හෝ කිසියම් දැනුමක් නොමැති දේශපාලන ආධාරකරුවන්ටය. ඔවුන් නිතරම මෙම පත්වීම් භාරගනු ලබන්නේ සංචාරක කර්මාන්තයේ යහපත පිණිස නොව, තම පෞද්ගලික වාසි තකාය. කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ කිසිදු දායකත්වයක් නොමැතිව ආයතනය පවත්වාගෙන යාමේ කාර්යය නිතරම මෙහෙයවන්නේ සභාපති විසින්ය. එබඳු අවස්ථාවලදී මහජන සම්බන්ධතා පවත්වාගෙනයාම පිළිබඳව සභාපති, හැකියාවක් ඇති මනා විචක්ෂණ භාවයෙන් ක්‍රියා කරන පුද්ගලයකු වන්නේ නම්, කළමනාකරණ මණ්ඩලයට කාර්යක්ෂම ලෙස කටයුතු කළ හැකිය.

2. මණ්ඩලයේ කටයුතු මෙහෙයවීම සඳහා මුදල් සැපයීමේ වැඩපිළිවෙළ.

2003 වර්ෂයේ අවසානය දක්වා කළමනාකරණ මණ්ඩලය එහි සියලුම කාර්යයන් සඳහා මුදල් සැපයීම පිණිස පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන වාර්ෂික ප්‍රදානයක් මත තුදෙක් යැපුණි. රජයේ අයවැයෙන් වෙන් කරනු ලැබූ මුදල් අර්ථාන්විත ලෙස අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් නොවීය. නිවාඩු ගතකිරීමේ සංචාරය සඳහා අනාරක්ෂිත ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඍණාත්මක ප්‍රතිමූර්තියක් නිර්මාණය කිරීමට හේතුවූ වාර්ගික සහ ත්‍රස්ත ක්‍රියා පිළිබඳ ගැටලු ඇතිවූ පසු අලෙවිකරණ සම්පත් ප්‍රමාණවත් නොවන බව විශේෂයෙන් හැඟී ගියේය.

කෙසේ වුවද, 2003 වර්ෂයේ අංක 5 දරණ මුදල් පනත සම්මත කිරීමෙන් පසුව සහ සංචාරක සංවර්ධන බද්ද සහ අපගමන බද්ද පැනවීමෙන් පසුව මෙම තත්වය දැන් වෙනස්වී ඇත. මෙම බදුවලින් ලැබෙන මුදල් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම අද පවතින ගැටලුව වී ඇත.

3. සුදුසුකම් ලබා ඇති පළපුරුදු නිලධාරීන් ආකර්ෂණය කරගැනීමට නොහැකිවීම.

පර්යේෂණ කටයුතු හා සංඛ්‍යා ලේඛන, සැලසුම්කරණය හා සංවර්ධනය, අලෙවිකරණය හා ප්‍රවර්ධනය, නියාමනය, මිනිස්බල සංවර්ධනය ආදිය වැනි

මණ්ඩලය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සමඟ සුදුසුකම් ඇති පළපුරුදු නිලධාරීන් අවශ්‍යය. ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් සාමාන්‍ය කාර්ය පරිපාටිය මගින් නියමිත සුදුසුකම්වලට සරිලන පරිදි වැටුප් ව්‍යුහයක් ලබාගැනීමට මණ්ඩලයට නොහැකිවී ඇත. මණ්ඩලයේ වැඩ කටයුතුවල තත්වය පිරිහීයෑමට මෙය හේතුවී ඇත.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ වැටුප් පරිමාණයන් ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ වැටුප් පරිමාණයන්ට සමානවන පරිදි මෑතකදී ඉහළ නැංවීම නිසා දැන් මෙම තත්වය නිවැරදිකර ඇත.

## 4. මණ්ඩලයේ කටයුතු කළමනාකරණයේදී පෞද්ගලික අංශයේ යෙදවුම් නොමැතිකම.

සංචාරක ව්‍යාපාරය රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් කළමනාකරණය කිරීම දැනට ලෝකයේ බොහෝ ප්‍රදේශවල පවතින ප්‍රවණතාවය වී ඇත. මෙම සහභාගිත්වය සඳහා කරුණු දෙකක් ඉටුවිය යුතුය. සංචාරක කර්මාන්තයේ කළමනාකරණය සඳහා පෞද්ගලික අංශය සහභාගීවීමට එකඟවීම පළමුවැන්න වන අතර අරමුදල්වලට පෞද්ගලික අංශයද දායකවිය යුතු බව දෙවැනි කරුණය. සංචාරක සංවර්ධන බද්ද මගින් දැන් මෙම අරමුදල් ලබාගනී.

ලංකා සංචාරක මණ්ඩල පනතේ විධිවිධාන අනුව කළමනාකරණ මණ්ඩලය නියෝජනය කිරීමේ අවස්ථාව පෞද්ගලික අංශයට නොමැත. මෙය සංචාරක මණ්ඩලය දැනට පිහිටුවා ඇති පරිදි එහි පවතින පැහැදිලි දුර්වලතාවයකි.

ඉහත සඳහන් හෝ පෙනීගොස් ඇති වෙනත් යම් දුර්වලතාවයන් නිවැරදි කිරීම සඳහා දශක හතරකට ආසන්න කාලයක් ඉතා සාර්ථක ලෙස පවත්වාගෙන ගොස් ඇති ආයතනයක් සම්පූර්ණයෙන් කොටස්වලට වෙන් කිරීතම් අවශ්‍යතාවයක් හෝ තර්කානුකූල බවක් නොමැති බව පැවසිය යුතුය.

## 3 වැනි පරිච්ඡේදය.

### ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (කලින් පැවති ලංකා හෝටල් පාසල) අතීතයේ කටයුතු සමාලෝචනය සහ අනාගත අවශ්‍යතාවන් තක්සේරු කිරීම.

### 3.1 හැඳින්වීම.

කෙටි කාල පරිච්ඡේද දෙකක් හැර 1966 වර්ෂයේදී හෝටල් පාසල සංචාරක මණ්ඩලය වෙත පැවරීමෙන් පසු එහි අංශයක් ලෙස එය පාලනය කළ බැවින්, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය පිළිබඳව කලින් සඳහන් වූ පරිච්ඡේදයට අනුපූරකයක් ලෙස මෙම පරිච්ඡේදය ඉදිරිපත් කර ඇත. හෝටල් පාසල පැවති පසුගිය, දශක හතරක කාලය තුළ එය තැනින් තැනට ගෙනයාමෙන් ද, අතින් අතට එහි කළමාකරණය වෙනස්වීමෙන්ද, එහි විෂයමාලාව කලින් කලට වෙස් කිරීමෙන්ද බොහෝ වෙනස්කම්වලට එය ලක්වී ඇත. මෙම සියලුම වෙනස්කම් එහි සංවර්ධනය සහ ව්‍යාප්තිය යම් ප්‍රමාණයකින් මන්දගාමීවීමට හේතුවී ඇත.

එබැවින්, කටයුතු බාධාවකින් තොරව මෙයෙවීමටත්, කාර්යක්ෂම කළමනාකරණයක් පවත්වාගෙන යාමටත් වගබලා ගැනීම පිණිස ස්ථාවර ආයතනයක සහ නෛතික පාදක ව්‍යුහයක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාවයක් නිශ්චිත ලෙස පැහැදිලිව පවතින අතර, එමගින් රටේ අභිවෘද්ධිය සඳහා එහි මෙහෙවර ඉටු කිරීමට හැකිවන වඩාත් උචිත ආයතනික සැකසුම නිශ්චය කිරීමටත් වඩා හොඳ අවබෝධයක් ලබාගෙන, එහි අතීතයේ කාර්යසාධනය ඇගයීමටත්, මෙම අධ්‍යාපන හා පුහුණු ආයතනයේ වර්තමාන තත්වය සහ ඓතිහාසික සංවර්ධනය පිළිබඳව සවිස්තරව සඳහන් කිරීම අවශ්‍යවේ. අතීතයේ කටයුතු සමාලෝචනය කර බලා එහි විශිෂ්ට ඉදිරිගමන වෙනුවෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුව වෙත ලබාදී ඇති පැවරුම් බලය අනුව මෙම කටයුතු ඉටුකරනු ලැබේ.

### 3.2 එහි ආරම්භය.

මුලින්ම "ලංකා හෝටල් පාසල" යනුවෙන් හැඳින්වූ 2001 දක්වා එම නමින් පවත්වාගෙන ගිය ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය එවකට අග්‍රාමාත්‍ය ධුරය දැරූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් 1964 වර්ෂයේදී කොළඹ 03, ගාලුමුවදොර මැද පාරේ සමුද්‍රා ගොඩනැගිල්ලේ පිහිටි

ස්ථානයේ (කලින් කොළඹ සමාජ ශාලාව යනුවෙන් හැඳින්වූ) පිහිටුවන ලදී. එම අවස්ථාවේදී සංචාරක ව්‍යාපාර විෂයය සහ රජයේ සංචාරක කාර්යාංශය රාජ්‍ය ආරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ පැවති අතර මෙම විෂයයන් භාරව කටයුතු කළ අමාත්‍යවරයා වූයේ අග්‍රාමාත්‍යවරයාය.

හෝටල් පාසල් පවත්වාගෙන යාම සහ හෝටල් පාසල් සහ ආහාර පාන සැපයුම් සේවා පිළිබඳ වෘත්තීය පුහුණුවක් ලබාදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට (එවකට ලංකාව වශයෙන් හැඳින්වූ) විශේෂඥතාවය හෝ පළපුරුද්ද නොවූ බැවින්, බහු පාර්ශ්වික මාර්ගවලින් (එ.ජා.ස.ව්‍යා., ජා.ක.ස) විශේෂඥයන්, පුහුණුකරුවන් සහ උපකරණ වශයෙන් තාක්ෂණික ආධාර ලබාගැනීම සඳහා අග්‍රාමාත්‍යවරයා ඉල්ලා සිටියේය.

නවීන අර්ථානුකූලව සංවිධානාත්මක සංචාරක ව්‍යාපාරයන් නොතිබූ බැවින් එවකට තිබූ නවාතැන් පහසුකම් සැලසූ ක්‍රමය යල්පැනගිය අසංවර්ධිත ක්‍රමයක් විය. රමණීය දසුන් ඇති ඇතැම් ස්ථානවල රජයේ සංචාරක කාර්යාංශය විසින් පවත්වාගෙන ගිය තානායම් (තානායම් 18 ක් පමණ) හැර කොළඹ ගාලුමුවදොර හෝටලය, ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය සහ ගල්කිස්ස හෝටලය, ගාල්ලේ හෝටලය, මහනුවර ක්වීන්ස් හෝටලය සහ සුවිස් හෝටලය, නුවරඑළියේ ග්‍රෑන්ඩ් හෝටලය හා ශාන්ත ඇන්ඩෲ හෝටලය, බණ්ඩාරවෙල හෝටලය සහ ත්‍රිකුණාමලයේ වෙල්කම් හෝටලය වැනි යටත් විජිත යුගයේ මහත්වරුන්ගේ වාසස්ථාන වශයෙන් තිබී පසුව හෝටල් බවට පත් කරන ලද හෝටල්වල පමණක් නවාතැන් පහසුකම් තිබිණි.

එවකට මෙරට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව වසරකට දහදාහක් පමණවූ අතර එම සංඛ්‍යාවට නැව්වලින් පැමිණි මගීන් ඇතුලත් විය. එම මගීනැව් කොළඹ වරායේ නැංගුරන්ලා තිබියදී මෙම සංචාරක පිරිස් පැමිණියහ. ඔවුන් කොළඹ වරායේ එක් දිනකට වඩා නැවතී සිටියේ බොහෝ කලාතුරකිනි. වසරකට 20,000 ක් පමණ වූ එක් රාත්‍රියක් ගතකළ සංචාරකයන් ව්‍යාපාර කටයුතු සහ ජනවාර්ගික කටයුතු සඳහා පැමිණි අය වූහ. මගී නැව් පැමිණීම අනුව නැව්වලින් පැමිණි මගී සංඛ්‍යාව වසරින් වසර අඩු වැඩිවෙමින් පැවති අතර, එක් රැයක් ගතකිරීමට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 20,000 සිට 25,000 දක්වා අඩුවැඩි වෙමින් වසර කිපයක් නොවෙනස්ව පැවතිණි.

පුහුණු මිනිස්බලය සැපයීමෙන් පවතින නවාතැන් පහසුකම්වල සේවා තත්වයන් වහා ඉහළ නැංවීමේ පරමාර්තයට අමතරව සංවිධානාත්මක පදනමක් මත සංචාරක ව්‍යාපාර සංවර්ධන වැඩසටහන සම්පූර්ණයෙන් දියත් කිරීමට පෙර අවශ්‍ය මිනිස් බලය සංවර්ධනය කිරීම ආරම්භ කිරීම ප්‍රඥාගෝචරවන බව පෙනීගිය නිසා එවකට හෝටල් සහ ආහාර පාන සැපයීමේ සේවා සම්බන්ධයෙන් වෘත්තිය පුහුණුව ලබාදීමට අංග සම්පූර්ණ පාසලක් පිහිටුවීමේ පරමාර්තය ඉටුකර ගැනීමට ක්‍රියා කළ බව පෙනී යයි. 1960 වර්ෂයේ සංවිධානාත්මක සංචාරක ව්‍යාපාරය හඳුන්වාදීමෙන් පසු අලුතින් හෝටල් පිහිටුවූ විට පුහුණු මිනිස්බලය පහසුවෙන් ලබාගැනීමට හැකිව තිබූ බැවින්, මෙම දූරදර්ශී ක්‍රියා මාර්ගය අනුගමනය කිරීමට තරම් ශ්‍රී ලංකාව වාසනාවන්ත විය.

අලුතින් පිහිටුවන ලද හෝටල් පාසල ආහාර පාන සැපයීම පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලද අතර පසුව එම පාඨමාලාව හෝටල් සහ ආහාර පාන මෙහෙයුම් පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස වෙනස් කරන ලදී. කළමනාකරණ තනතුරු භාගැනීම සඳහා පුහුණු නිලධාරීන් සපයන තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමඟ මෙහෙයුම් මට්ටමින් මිනිස්බල අවශ්‍යතා සැපයීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍රවල හයමාසික ශිල්පීය පාඨමාලා හෝටල් පාසල විසින් ආරම්භ කරන ලදී.

- මූලික සූපශාස්ත්‍රය.
- ආපනශාලා සහ මත්පැන් හල් පවත්වාගෙන යාමේ සේවා.
- හෝටල්වල අමුත්තන් පිළිගැනීමේ සේවා.
- හෝටල් ගෘහ පාලනය.

හයමාසික පාඨමාලාවලට අමතරව පුහුණුව සඳහා වැඩිවෙමින් පැවති ඉල්ලුම සපුරාලීම පිණිස හයමාසික පාඨමාලා සමඟ දැනට පවතින හෝටල්වල සහ නව හෝටල්වල සේවකයන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා දෙමාසික කඩිනම් පාඨමාලා පැවැත්වීමට ද හෝටල් පාසල කටයුතු කළේය.

මුල් අවස්ථාවලදී විශේෂයෙන් පාසල අලුතින් පිහිටුවන ලද ලංකා සංචාරක මණ්ඩලය යටතට පත්වූ පසු බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් යටතේ ඉහත පාඨමාලා පැවැත්වූ දේශකයන් පැමිණියේ විදේශ රටවලිනි.

## 3.3 සංචාරක මණ්ඩලයේ කළමනාකරණය යටතේ පවතින හෝටල් පාසල.

ඉහත පළවැන් කොටසේ 1 වැනි පරිච්ඡේදයේ සඳහන් පරිදි 1966 ජුනි මාසයේ ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවීමෙන් අනතුරුව ලංකා හෝටල් පාසල ඇතුළුව රජයේ සංචාරක කාර්යාංශයේ සියලුම වත්කම් එම මණ්ඩලය වෙත පවරන ලදී. එතැන් සිට ලංකා හෝටල් පාසල ලංකා සංචාරක මණ්ඩලයේ කළමනාකරණය යටතට කෙළින්ම පත්විය. මිනිස්බල සංවර්ධනය සංචාරක මණ්ඩලයේ පරමාර්ථයක් ලෙස පනතේ නිශ්චිත වශයෙන් සඳහන් නොවන නමුදු සංචාරක මණ්ඩලය පැවරුම් බලය පැහැදිලි ලෙස ලබා ඇති සමස්ත සංචාරක ගමනාන්ත නිෂ්පාදනයේ ශ්‍රමබලකාය අත්‍යවශ්‍ය කොටසකි. එසේ හෙයින්, සංචාරක ව්‍යාපාරය කාර්යක්ෂම ලෙස සංවර්ධනය කිරීම සංචාරක මණ්ඩලය විසින් අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවක් ලෙස සලකා එය ආදර්ශමත් ලෙස කළමනාකරණය කිරීමට කටයුතු යොදන ලදී.

ඒ අනුව අවශ්‍ය මට්ටමට පුහුණුව සඳහා යොදාගනු ලබන මූළතැන් ගෙයට උපකරණ සැපයීම සඳහා සංචාරක මණ්ඩලය විසින් කටයුතු කර සමුද්‍රා ගොඩනැගිල්ලේ උඩ තට්ටුවේ ආගන්තුක කාමර දහයක් පිහිටුවා ශිෂ්‍යයන්ට ප්‍රායෝගික පුහුණුව ලබාගැනීම සඳහා පොදු මත්පැන් අලෙවි මධ්‍යස්ථානයක් සහ අවන්හලක් විවෘත කරන ලදී. පාසලෙන් පිටව යන පළමු ශිෂ්‍ය කණ්ඩායමට සහතික පිරිනැමීම සඳහා උපාධි පිරිනැමීමේ උත්සවයක් පවත්වන ලදී. පසුව සෑම වසරකම පාසලෙන් පිටවයන ශිෂ්‍යයන් වෙනුවෙන් එය වාර්ෂිකව පවත්වන උත්සවයක් බවට පත්විය.

වසරින් වසර අලුතින් පිහිටුවනු ලබන හෝටල් සහ පවත්නා හෝටල්වල පාසලින් පිටවයන ශිෂ්‍යයන්ට ඉතා ලාභදායක රැකියා ලබාගැනීමට හැකි වුවද, ප්‍රධාන වශයෙන්පවතින හේතු දෙකක් නිසා ඉදිරියේදී හෝටල් කර්මාන්තයේ ඇතිවන අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සපුරාලීමට පාසල මගින් ලබාදෙන පුහුණුව ප්‍රමාණවත් නොවන බව 1970 වර්ෂවල මුල් භාගයේදී හෝටල් අයිතිකරුවන් විසින් කනස්සල්ල ප්‍රකාශ කරන ලදී.

- පාසල විසින් පවත්වනු ලබන තුන් අවුරුදු පාඨමාලාව බොහෝ සෙයින් න්‍යායාත්මක කරුණු අන්තර්ගත පාඨමාලාවක් වන බැවින්, මෙහෙයුම් මට්ටමේ වැඩකටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් අභ්‍යාසලාභීන් සතුව ප්‍රායෝගික නිපුණතා නොමැත.

➢ මෙහෙයුම් මට්ටම්වලදී එනම් අමුත්තන් පිළිගැනීම, ගෘහ පාලනය, ආපන ශාලා සහ මත්පැන් අලෙවි සේවා සහ සූපශාස්ත්‍ර (පස් මාසේ පාඨමාලා සහ කඩිනම් පාඨමාලා) පිළිබඳ අභ්‍යාසලාභීන්ගේ යෙදවුම ප්‍රමාණවත් නොවීය.

පසුව හෝටල් පවත්වාගෙන යන අයගේ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් පාසල් විෂයමාලාව යළි සැලසුම් කිරීම සඳහා වසර දෙකක කාලසීමාවක් සඳහා ජා.ක. සංවිධානයේ විශේෂඥයකු වන ජේ. තැප්පර් මහතාගේ සේවය 1975 වර්ෂයේදී සංචාරක මණ්ඩලය විසින් ලබාගන්නා ලදී. ජා.ක. සංවිධානයේ විශේෂඥයා විසින් අදාළ කොටස්කරුවන් සමඟ සවිස්තරාත්මක සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සහ කඩිනම් පාඨමාලා අහෝසිකර "මොඩියුල ක්‍රමය" නිර්දේශ කරන ලදී. මොඩියුල ක්‍රමය මගින් ක්ෂෙත්‍ර හතරක පස්මාසික ශිල්පීය මට්ටමේ පාඨමාලා පවත්වාගෙන යන ලදී. මොඩියුල ක්‍රමයේ ප්‍රධාන මූලිකාංග පහත දැක්වේ.

* සූපශාස්ත්‍රය, (සිව් මාසික), ආපන ශාලා හා මත්පැන් අලෙවි සේවා (තුන් මාසික) හෝටල්වල ආගන්තුකයන් පිළිගැනීම (තුන් මාසික) සහ හෝටල් ගෘහ පාලනය (තුන් මාසික) පිළිබඳ මූලික මට්ටමේ පාඨමාලා.

* හෝටලයක හයමාසික කර්මාන්ත පුහුණුව.

* යටත් පිරිසෙයින් මූලික මට්ටමේ පාඨමාලා හැදෑරීමෙන් සහ අදාළ කර්මාන්ත පුහුණුව ලැබීමෙන් පසු සූපශාස්ත්‍රය, ආහාර පාන වර්ග සැපයීමේ සේවා සහ නවාතැන් පහසුකම් පවත්වාගෙන යාම පිළිබඳ අන්තර්මාධ්‍ය පාඨමාලා.

* ඩිප්ලෝමා හෝ සම්පූර්ණ උපාධි පාඨමාලාව. පිරමිඩ ක්‍රමය යනුවෙන් හැඳින්වෙන මෙම ක්‍රමය හේතූන් කිපයක් නිසා ඉතා ඉක්මනින් ජනප්‍රිය විය.

* පාසලට ඇතුළත්වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවකට පුහුණුවීමේ අවස්ථාව ලැබීම.

* හෝටල් හිමියන්ට තම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා මෙහෙයුම් මට්ටම්වල අභ්‍යාසලාභීන් විශාල පිරිසක් සපයාදීම.

* ඩිප්ලෝමාවක් ලබාගැනීමට හැකිවන පරිදි සූපශාස්ත්‍රය, ආහාර හා පානවර්ග සැපයුම් සේවා සහ නවාතැන් කටයුතු මෙයවීම් යන හෝටල් කළමනාකරණයේ ඇතැම් අංශ පිළිබඳ විශේෂඥතාවය ලබාගැනීමට අවස්ථාවක් සලසාදීම.

සංචාරක මණ්ඩලයේ කළමාකරණය ආරම්භයේ පටන් හෝටල් පාසල වෘත්තීය පුහුණුව ලබාදීමේ ඉතා ජනප්‍රිය ආයතනයක් බවට පත්විය. මෙහි කාමර හෝ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඇතුළත්වීමට සුදුසුකමක් වශයෙන් අවශ්‍යවූයේ යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත්වීමය. මුල් අවස්ථාවේදී මෙහි පාඨමාලා හැදෑරීමට පැමිණි අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවක් කොළඹ සහ කොළඹ අවට වෙසෙන ධනවත් පවුල්වල ඉංග්‍රිසි කථා කළහැකි අය වූහ. අනෙකුත් වෘත්තීය සේවාවල නියුතු අයට උපයොගන හැකි පාරිශ්‍රමිකය හා සසඳා බලන විට හෝටල් පාසලේ පුහුණුව ලැබූ සේවකයන් ලැබූ පාරිශ්‍රමිකය ඉතාමත් ආකර්ෂණීය විය. ලංකා හෝටල් පාසලේ පුහුණුව ලැබූ සියලුම මට්ටමේ සේවක පිරිස් සඳහා විදේශ මාර්ගවලින් සැලකිය යුතු ඉල්ලීමක් ද තිබුණි. මෙසේ පුහුණුව සඳහා හෝටල් පාසලට ඇතුළත්වීම සඳහා ඉතා විශාල තරඟයක් පැවතුන අතර ඒ සම්බන්ධයෙන් සාර්ථකව කටයුතු කිරීමට නොහැකි විය.

### 3.4 හෝටල් පාසල විවිධ පරිශ්‍රයන් වෙත ගෙනයාම.

1979 වර්ෂයේදී හෝටල් පාසලට එහි මුල් පරිශ්‍රය වන ගාලුමුවදොර මැද මාර්ගයේ පිහිටි සමුද්‍රා ගොඩනැගිල්ල අහිමිවිය. සුදුසු විකල්ප පරිශ්‍රයන් ලබාගැනීමට නොහැකිව තිබියදී හෝටල් පාසල සහ සංචාරක මණ්ඩලය පිහිටි පරිශ්‍රයන් ටාජ් සමුද්‍රා හෝටලයට බාරදීමට බලකරන ලදි. එබැවින් කොළඹ 2, උද්‍යාන වීදියේ අංක 2 දරන ස්ථානයේ පිහිටි පාක්වේ ගොඩනැගිල්ල වෙත හෝටල්

පාසල ගෙනයන ලදී. හෝටල් පාසලක් පවත්වාගෙන යාමට හැකිවන පරිදි එම ගොඩනැගිල්ල සකස්කර නොතිබූ බැවින්, ව්‍යුහාත්මක වෙනස්කම් සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කිරීමට සිදුවිය. විශේෂයෙන් පුහුණු කටයුතු සඳහා වන මුළුතැන්ගෙය නවීන උපකරණවලින් යුක්තව පිහිටුවීමටත් අවශ්‍ය පංති කාමර පිහිටුවීමටත් සිදුවිය.

නැවත 1986 වර්ෂයේදී සංචාරක මණ්ඩලය විසින් පාසල පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලේ අයිතිකරු වෙත අඩු කුලියක් ගෙවීම නිසා අයිතිකරුට ගොඩනැගිල්ල ආපසු ලබාගැනීමට අවශ්‍යවූයෙන් ඔහුට ආපසුදීමට සිදුවිය. වාසනාවකට මෙන්, සංචාරක කර්මාන්තයේ ඇතිවූ පසුබෑම නිසා පාඩුපිට පවත්වාගෙන ගිය ගල්කිස්සේ පිහිටි පාම් බීච් හෝටලය අඩු කුලියකට එහි අයිතිකරුවන් සංචාරක මණ්ඩලයට ලබාදෙන ලදී. එය වඩා යහපත් පරිසරයක පිහිටි වඩා හොඳ ස්ථානයක් වුවද හෝටලය අබලන් තත්වයක පැවති බැවින්, විශාල වශයෙන් අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය විය.

පාම් බීච් හෝටලයේ ආගන්තුක කාමර 48 ක් තිබූ අතර, පාසලේ අවශ්‍යතාවන් සඳහා එයින් 18 ක් පංති කාමර සහ කාර්යාල කාමර බවට පත් කරන ලද අතර ඉතිරි කාමර 30 හෝටලයේ ආගන්තුක කාමර ලෙස පවත්වාගෙන යන ලදී. මෙසේ හෝටලය පාසල සමඟ පවත්වාගෙන ගිය අතර ශිෂ්‍යයන් සඳහා ප්‍රායෝගික පුහුණුව සැපයීම සඳහා හෝටලයේ පහසුකම් ප්‍රයෝජනයට ගන්නා ලදී. හෝටලය පවත්වාගෙන යාමට පූර්ණ කාලීන නේවාසික කළමනාකරුවෙකු සිටිය අතර එවකට හෝටල් පාසලේ විදුහල්පතිවරයෙකු නොසිටි බැවින්, සංචාක උපදේශකයකු භාරයේ පාසල පවත්වාගෙන යන ලදී.

කෙසේ වුවද, හෝටලයේ පැවති මුළුතැන්ගෙය සූපශාස්ත්‍ර පිළිබඳ පුහුණුව ලබාදීමට අවශ්‍ය විශාල උපකරණ සවිකිරීමට තරම් විශාල නොවීය. එබැවින් පාම් බීච් හෝටලයේ පවත්වාගෙන ගිය පාසල මඟින් පුහුණුව ලබාදීමට හැකි වූයේ පිළිගැනීමේ කටයුතු, ගෘහ පාලනය සහ ආපන ශාලා හා මත්පැන් සැපයුම් සේවා සම්බන්ධයෙන් පමණි.

උතුරු නැගෙනහිර ත්‍රස්තවාදී ගැටලුව සහ දකුණේ ප්‍රචණ්ඩ ක්‍රියා හටගැනීම නිසා 1980 වර්ෂවල මුල්භාගයේ පටන් සංචාරක කර්මාන්තය සහ හෝටල් පාසල පසු බෑමකට ලක්විය. සේවා සැපයුම අඩුවීම නිසා සංචාරක හෝටල් කාර්ය

මණ්ඩලය අඩු කිරීමට පටන්ගත් අතර, පුහුණු කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු සංඛ්‍යාවක් රැකියා සොයා වෙනත් රටවලට සංක්‍රමණය විය. පාසලට පුහුණු හා ප්‍රවීණ දේශකයන් සොයා ගැනීමේ ගැටළු උද්ගතවීම නිසා පාසල මගින් ලබාදෙන පුහුණු මට්ටම පිරිහීයාමට එක හේතු විය.

### 3.5 හෝටල් පාසල පෞද්ගලීකරණය කිරීමේ ප්‍රයත්නය.

1986 අගභාගයේදී හෝටල් පාසල සංචාරක මණ්ඩලයේ කළමනාකරණයෙන් ඉවත් කර පවත්වාගෙන යාම පිණිස සංචාරක කටයුතු භාර අමාත්‍යවරයාගේ නියෝග මත අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් සංචාරක මණ්ඩලයේ සභාපති සමඟ එක්ව සංචාරක මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව සමාගම් පනත යටතේ සීමාසහිත පෞද්ගලික සමාගමක් පිහිටුවීමට කටයුතු කරන ලදී.

ඒ අනුව සාමාන්‍ය කොටස් 191,000 ක් නිකුත් කිරීමෙන් 1987 පෙබරවාරි 19 දින සීමාසහිත ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් ආයතනය (පෞද්ගලික) යන නාමයෙන් සමාගමක් සංස්ථාගත කරන ලදී. කොටස් 75,000 ක් සහිත විශාලම කොටස්කරු වූයේ ලංකා සංචාරක මණ්ඩලයයි. කොටස් 10,000 ක් හෝ ඊට වැඩි කොටස් ප්‍රමාණයක් ලබාගත් අනෙකුත් කොටස්කරුවන් වූයේ මරදානේ බුහාරි හෝටලය, ගෝල්ෆේස් හෝටලය, ආසියානු හෝටල් සංස්ථාව, රක්ෂණ සංස්ථාව, ටාජ් සමුද්‍රා හෝටලය සහ සීමාසහිත ලංකා හෝටල් සේවා යන ආයතනය.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සංචාරක මණ්ඩලයේ සභාපති ඇතුළුව සාමාජිකයන් නවදෙනෙකුගෙන් සමන්විත වූ අතර විශාලතම කොටස්කරු වශයෙන් සංචාරක මණ්ඩලයේ සභාපති අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධුරයට පත්විය. අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විධායක අධ්‍යක්ෂ ධුරයට පත්විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් වශයෙන් පත්වූයේ හෝටල් අයිතිකරුවන් (10,000 වැඩි කොටස් මිලදී ගත් අය) සහ රක්ෂණ සංස්ථාවය. සීමාසහිත ෆෝබ්ස් පිනෑන්ෂල් සර්විසස් (පෞද්ගලික) සමාගම සමාගමේ ලේකම්වරුන් වශයෙන් පත්විය. කලින් හෝටල් පාසල පාලනය කළ සංචාරක උපදේශකවරයාගේ සේවා අත්හිටුවන ලද අතර පාසලේ සිටි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා වැඩබලන විදුහල්පති ලෙස පත් කරන ලදී.

සමාගමට ඉතා ඉක්මනින් දුෂ්කරතා ඇති විය. යටත් පිරිසෙයින් පාසල පවත්වාගෙන යාමටවත් රජයෙන් මුදල් නොලැබුණි. හෝටලයේ කටයුතු මෙහෙයවීමෙන් ඉපයූ ආදායම සහ ශිෂ්‍යයන්ගෙන් අයකරගත් ගාස්තු හෝටලයේ සහ පාසලේ පැවති වියදම් දැරීමට ප්‍රමාණවත් නොවීය. පාසල පෞද්ගලීකරණය කිරීම නිසා පිළිගැනීම නොමැතිවීමත්, වෘත්තිය අපේක්ෂා නොමැතිවීමත් නිසා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු පාසල හැරයාමට පටන් ගත්හ. සූපශාස්ත්‍රය පිළිබඳ පාඨමාලාවද අනෙකුත් උසස් පාඨමාලාවද නොමැතිවීම නිසාත් පුහුණුවේ ගුණාත්මක බව පිරිහීයාම නිසාත් ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවිය. මේ නිසා පාසල වසාදමා හෝටලය එහි අයිතිකරුවන් වෙත ආපසු භාරදීමට අමාත්‍යාංශය සහ සමාගම කටයුතු කිරීමට සිතා සිටියේය.

මේ අතරතුරේදී පාසල පෞද්ගලීකරණය කිරීමට එරෙහිව සහ සංචාරක මණ්ඩලය විසින් පාසලේ කළමාකරණය ආපසු භාරගත යුතු බව ඉල්ලා සිටි පාසල් ශිෂ්‍යයන්ගේ මව්පියන් සහ හිතවතුන් විසින් උද්ඝෝෂණය කරන ලදි. මේ පිළිබඳව උනන්දුව දැක්වූ මන්ත්‍රීවරු කීපදෙනෙකු විසින් මෙම කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරන ලද අතර, පාසල වසා නොදමන බවට සහතිකවීමට අමාත්‍ය වරයාට බලකර සිටින ලදි. අවසාන ප්‍රතිඵලය වූයේ සංචාරක මණ්ඩලයට පාසල ආපසු භාරගෙන එහි කළමනාකරණය යටතේ එය පවත්වාගෙන යන ලෙස නියම කිරීමය.

## 3.6 සංචාරක මණ්ඩලයේ කළමනාකරණය යටතේ හෝටල් පාසල දෙවැනි වතාවට පවත්වාගෙන යාම.

සංචාරක මණ්ඩලය විසින් හෝටල් පාසලේ කළමනාකරණය දෙවැනි වාතවට භාර ගැනීමෙන් පසු තාවල පාරේ වඩා හොඳ ගොඩනැගිල්ලක් වෙත රැගෙන යාමෙන් පාසල පුනරුත්ථාපනය කිරීමට කටයුතු යොදනලදි. අංග සම්පූර්ණ මුළුතැන්ගෙයක් පිහිටුවන ලද අතර අලුතින් විදුහල්පතිවරයෙකු සහ උප විදුහල්පතිවරුන් දෙදෙනෙකු දේශීය වශයෙන් බඳවා ගන්නා ලදි. කථිකාචාර්යවරුන් වශයෙන් හෝටල් පාසලට බැඳෙන ලෙස සුදුසුකම්ලත් හෝටල් පාසල් උපාධිධාරීන් පොළඹවා ගැනීම සඳහා ඇතැම් දිරි දීමනා ක්‍රම හඳුන්වා දෙන ලද අතර සංචාරක මණ්ඩලයට අධ්‍යාපන ශ්‍රේණිවලට අයත් පුරප්පාඩු පිරවීමට හැකිවිය.

මෙම ක්‍රියා මාර්ග හඳුනාදීමෙන් අනතුරුව සෑම මට්ටමකම සියලු පුහුණු පාඨමාලා යළි ආරම්භ කිරීමට හැකිවිය. පාසල යළි ඉතා ජනප්‍රියවූ අතර වසරකට මූලික පාඨමාලා දෙවරක් පැවැත්වූවද. පාසලට ඇතුළත්වීමට පැවති තරඟයක් තියුණු විය. මේ හැරුණු විට ඒ වන තෙක් සංචාරක මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය සංචාරක නියමු කථිකාචාර්යවරුන් වූ පුහුණු කිරීමේ වැඩසටහන පාසල විසින් එහි කළමනාකරණය යටතට ගන්නා ලදී. තවද පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මූලික පුහුණුව පාසල් විෂය මාලාවට ඇතුළත් කරන ලදී.

1990-1991 වර්ෂවලදී සංචාරක මණ්ඩලය විසින් ඉටු කරන ලද කටයුතු යළි ඇගයීම සඳහා එ.ජා.ස.වැ. මගින් සපයනු ලබන මූල්‍යාධාර ඇතිව උපදේශක මණ්ඩලයක් පිහිටුවන ලදී. පාසල් විෂයමාලාවේ ඇතැම් වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් වඩා ලාභදායී රැකියා සොයා වෙනත් රටවලට සංක්‍රමණයවීම නිසා. වාර්ෂිකව ඇතිවන ඌණතාවය පිළිබඳව ගණන් බැලීමෙන් පසු රටේ අනාගත මිනිස්බල අවශ්‍යතා පිළිබඳව අධ්‍යයනයක්ද සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ රැකියා ලබාගැනීම සඳහා පමණක් නොව. විදේශ රටවල රැකියා ලබාගැනීම සඳහාද පුහුණුවීමට ඉල්ලුමක් පවතින බව පෙනී ගියේය. මෙම ඉල්ලුම සපුරාලීමට කොළඹ හෝටල් පාසලේ පැවති ඉඩකඩ ප්‍රමාණවත් නොවූ බව පෙනී ගියේය.

පුහුණුව සඳහා දැනට පවතින ඉල්ලුම සහ අනාගතයේදී ඇතිවන ඉල්ලුම සපුරාලීමටත්. පිට පළාත්වල සිටින තරුණ පිරිස් සඳහා පුහුණුව ලැබීමේ අවස්ථාව සලසා දීමටත් ප්‍රධාන පළාත් නගරවල පරිවාර පාසල් පිහිටුවීමට උපදේශකවරුන් විසින් නිර්දේශ කරන ලදී. ඒ අනුව 1991 සිට 1994 දක්වා කාලසීමාව තුළ මහනුවර (උඩරට ප්‍රදේශය සඳහා). අනුරාධපුර (උතුරුමැද ප්‍රදේශය සඳහා) සහ වැලිගම (දකුණු ප්‍රදේශය සඳහා) පරිවාර පාසල් තුනක් සංචාරක මණ්ඩලය විසින් පිහිටුවන ලදී. මෙම උප පාසල්වලින් මුල් අවස්ථාවේදී මූලික මට්ටමේ පුහුණුව පමණක් ලබාදෙන ලදී.

1995 සිට 200 දක්වා කාලසීමාව තුළ පවතින උප පාසල්වල පහසුකම් සහ පුහුණු ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමෙන් පළාත් සභාවල සහය ඇතිව කුරුණෑගල (වයඹ ප්‍රදේශය සඳහා). බණ්ඩාරවෙල කඳුරට ප්‍රදේශය සඳහා සහ කුරුවිට (සබරගමු ප්‍රදෙශය සඳහා) තවත් වැඩිපුර පරිවාර පාසල් පිහිටුවන ලදී. තවද.

2002 මුල් භාගයේදී දින සියයේ වැඩ සටහන යටතේ තම පරිවාර පාසල් දෙකක් ත්‍රිකුණාමලයේ සහ යාපනයේ විවෘත කරන ලදී.

කොළඹ ප්‍රධාන පාසලේ පහසුකම් වැඩි දියුණු කිරීමෙනි සහ පළාත්වල පරිවාර පාසල් පිහිටුවීමෙන් හෝටල් සහ ආහාර පාන සැපයීම පිළිබඳ පුහුණු වැඩසටහන ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රධාන වශයෙන් පරමාර්ථ දෙකක් තිබුණු අතර. බොහෝ දෙනෙකු විසින් එය ප්‍රමාණවත් ලෙස අවබෝධ කරගෙන නොමැත.

* මේ දක්වා කොළඹ තරුණ පිරිස්වලට පමණක් සීමාවී තිබුණු ඉතා ලාභාදයක ක්ෂේත්‍රයේ රැකියා ලබා ගැනීමට තිබූ අවස්ථා පිට පළාත්වල සිටින උගත් තරුණ පිරිස්වලට ද ලබාදීම.

* ආයතන සඳහා තරුණ පිරිස්වලට පමණක් සීමාවී තිබුණු ඉතා ලාභදායක ක්ෂේත්‍රයේ රැකියා විරහිත භාවය යන රටේ ප්‍රශ්න දෙක විසඳීමේ අරමුණ ඇතිව අනෙකුත් රටවලට යාවීම සඳහා මෙම ක්ෂේත්‍රයේ අභ්‍යාසලාභීන් අතිරික්තයක් ඇති කිරීම.

අද රට මුහුණපා සිටින ප්‍රධාන ආර්ථික ගැටලු දෙකක් විසඳීම සඳහා හෝටල් පාසලට හැකියාව තිබෙන බව. රටේ ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් විසින් අගය කළ යුතුය.

## 3.7 හෝටල් පාසල වෙනුවෙන් ස්ථිර වාසස්ථානයක්.

ස්ථිර වාසස්ථානයක් නොමැතිවීමෙන් පාසල තැනින් තැනට ගෙනයාමට සංචාරක මණ්ඩලයට සිදුවූ බව ඉහත දක්වන ලදී. මේ නිසා අභ්‍යාසලාභීන් බිහිකිරීම සහ පුහුණු මට්ටම්වල උච්චාවචනයවීමක් සිදුවිය. විවිධ හේතූන් නිසා 1990 වර්ෂවල මැද භාගයට පෙර පාසල සඳහා ස්ථිර පරිශ්‍රයක් සපයා ගැනීම සඳහා දරන ලද සියලුම උත්සාහයන් ව්‍යර්ථ විය. කෙසේ වුවද, 1995 වර්ෂයේ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවරයා සහ සංචාරක මණ්ඩලයේ සභාපතිවරයා ප්‍රධාන වශයෙන් පෞද්ගලිකව දක්වන ලද උනන්දුව නිසා එය සාර්ථක කර ගැනීමට හැකිවිය.

ඒ අනුව සංචාරක මණ්ඩලයට අයත් සංචාරක මණ්ඩලය පිහිටි ස්ථානයේ ඉදිරිපස පිහිටි හිස් ඉඩමේ පාසල පවත්වාගෙන යාම සඳහා ගැනුම්කරුගේ ඉල්ලීම අනුව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. හාගු හෝටල් පාසලේ උපදේශකවරුන්ගේ සහාය ඇතිව දේශීය ගෘහ නිර්මාණ ආයතනයක් මගින් ගොඩනැගිල්ල සැලසුම් කරන ලදී. දේශීය ඉදිකිරීම් සමාගමක් විසින් ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී. එය න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සඳහා පහසුකම්වලින් යුක්ත අතිනවීන හා මහල් කීපයකින් යුක්ත ගැනුම්කරුගේ ඉල්ලීම අනුව ඉදිකරන ලද ගොඩනැගිල්ලකි. සෑම මට්ටමක අභ්‍යාස ලාභීන් 1500 ක් පමණ වසරකට බිහි කිරීමේ හැකියාව මෙම පාසල සතුව පවතී. 2000 වර්ෂයේ ජනවාරි මාසයේදී නව ගොඩනැගිල්ල විවෘත කරන ලද අතර නාවල ගොඩනැගිල්ලේ සිට නව පරිශ්‍රය කරා පාසල ගෙනඑන ලදී.

### 3.8 හෝටල් පාසලේ කළමනාකරණය දෙවැනි වරටද වෙනස්වීම.

පාසල පවත්වාගෙන යාම සඳහා අතිනවීන ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙන් පසු පාසල් කළමනාකරණය සඳහා සහභාගිවීමට කණ්ඩායම් කීපයක් විසින් විශේෂයෙන් හෝටල් පාසල් උපාධිධාරී සංගමය විසින් උනන්දුවක් දක්වන ලදී. ගරු අමාත්‍යවරයා වෙත ඇතැම් කරුණු දැක්වීම්වල ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වූ කමිටුවක් සවිස්තරාත්ම නිර්ණය විෂයයන් ද සහිතව පත් කරන ලදී.

- අමාත්‍යාංශයේ අතිරේක ලේකම් කේ. මාරිමුත්තු මහතා. සභාපති.
- සීමාසහිත හොස්පිටලැටි මැනේජ්මන්ට් කොන්සල්ටන්ට් (පෞද්ගලික) ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂ මාලින් හපුගොඩ මහතා. සාමාජික
- සීමාසහිත සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂ සුමිත්‍රා ගුණසේකර මහතා. සාමාජික.
- සීමාසහිත කාර්සොන් මැනේජ්මන්ට් (පෞද්ගලික) ආයතනයේ අධ්‍යක්ෂ (මානව සම්පත්) සුනිල් දිසානායක මහතා. අධ්‍යක්ෂ.
- ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ (වෘත්තීය මට්ටම්) සුදත් කරුණානායක මහතා. කමිටුවේ ලේකම්.

කමිටුවේ පෞද්ගලික අංශයේ සියලුම සාමාජිකයන් තිදෙනාම හෝටල් පාසලේ උපාධිධාරීන් වූ බව මෙහිලා සඳහන් කිරීම වැදගත් වේ.

කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ජාතික ව්‍යාපාර කළමාකරණ ආයතනය (ජා.ව්‍යා.ක.ආ) මෙන් ඊට සමාන අන්දමට ලංකා හෝටල් පාසල සහ සංචාරක පාසල ලංකා සංචාරක මණ්ඩලයේ කළමනාකරණයෙන් ඉවත්කර ස්වතන්ත්‍ර පාලනයක්, එයට ලබාදිය යුතු බව කමිටුවේ ප්‍රධාන නිර්දේශය විය.

කමිටුව නිර්දේශය අනුව පාසලට ස්වතන්ත්‍ර පාලනය ලබාදීමට කටයුතු කරන ලෙස අමාත්‍යවරයා උපදෙස් ලබාදෙන ලද්දේද යන්න පැහැදිලි නැත. කෙසේ වුවද, මහ මැතිවරණයෙන් පසු 2000 වර්ෂයේ අවසාන භාගයේදී අලුත් රජයක් පත්වීමත් සමඟ හෝටල් පාසල කළමාකරණය කිරීම සංචාරක මණ්ඩලයෙන් ඉවත්කර පහත සඳහන් පරිදි සාමාජිකයන් නවදෙනෙකුගෙන් සමන්විත ස්වාධීන පාලක මණ්ඩලයකට එය පැවරීම සඳහා සංචාරක කටයුතු පිළිබඳ නව අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී.

- ✸ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්
  ආචාර්ය පී. රාමුනුජන් මහතා, සභාපති වශයෙන්.
- ✸ පලාත් සභා අමාත්‍යාංශයේ නියෝජිතයෙකු
- ✸ මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයකු
- ✸ වෘත්තීය පුහුණු ආයතනයේ නියෝජිතයකු
- ✸ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්
- ✸ ලංකා හෝටල් පාසලේ විදුහල්පති.
- ✸ හෝටල් පාසල් උපාධිධාරී සංගමයේ නියෝජිතයන් දෙදෙනෙකු
- ✸ සංචාරක හෝටල් සංගමයේ නියෝජිතයකු

හෝටල් පාසල් උපාධිධාරී සංගමයේ මාලිත් හපුගොඩමහතා සහ සුමිත්‍රා ගුණසේකර මහතා එම සංගමයේ නියෝජිතයන් දෙදෙනා වූ අතර හෝටල්

සංගමයේ තම්කළ තැනැත්තා වූයේ හිරාත් කුරේ මහතාය. සංචාරක අමාතයාංශයේ අතිරේක ලේකම් ජෝර්ජ් මයිකල් මහතා පාලක මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කළේය.

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වූ පාර්ශවයන් විසින් කරන ලද බලපෑම් නිසා කිසිදු නීතිමය ආධාරයක් නොමැතිව හෝටල් පාසල පාලනය කිරීම සඳහා ස්වාධීන ආයතනයක් පිහිටුවීමට අමාත්‍යවරයා විශේෂයෙන් ක්‍රියාකළ බව පෙනී යයි. ඉහත සඳහන් කමිටුවේ සේවය කළ සාමාජිකයන් දෙදෙනාම උපාධිධාරී සංගමයේ තම්කළ තැනැත්තන් දෙදෙනාම වීමද මෙහි සඳහන් කිරීම වැදගත්වේ.

අමාත්‍යවරයාගේ නියෝගයක් මත "සංචාරක හා හෝටල් කළමනාකරණ සිරිමාවෝ බණ්ඩාරනායක" ආයතනය යනුවෙන් අලුතින් ආයතනයක් පිහිටුවන ලද බැවින්, එයට නෛතික තත්වයක් නොතිබුණු නිසා එය පවත්වාගෙන යාමට භාණ්ඩාගාරයෙන් වෙනම අයවැයක් ලබාගැනීමට නොහැකිවූ බැවින්, මණ්ඩලයේ යාන්ත්‍රණය යොදා ගනිමින් හෝටල් පාසල පවත්වාගෙන යාම සඳහා සංචාරක මණ්ඩලයට වෙන්කර දෙන අයවැය ප්‍රතිපාදන මත එයට යැපීමට සිදුවිය. මෙසේ සංචාරක මණ්ඩලයේ මුදල් අංශය මගින් නව ආයතනයේ මූල්‍ය කටයුතු පිළිබඳව කටයුතු කරගෙන යනලදී. හෝටල් පාසලේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සංචාරක මණ්ඩලයේ සේවකයන් වශයෙන් කටයුතු කළ නිසා, (නව පාලක මණ්ඩලයක් යටතේ සෙව්ය කළද) ඔවුන්ගේ වැටුප් සහ අනෙකුත් සියලුම පාරිශ්‍රමිකයන් ගෙවීමට නීතිමය වශයෙන් මෙම ආයතනය බැඳී සිටියේය. මෙම ආයතනයේ ලේඛකාධිකාරී වශයෙන් කටයුතු කිරීමට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකු එම ආයතනයට ද්විතියකරණය කරන ලදී.

තවද, පාලක මණ්ඩලයේ ඇතැම් සාමාජිකයන් විසින් සිදු කර ඇතැයි කියන මැදිහත්වීම් සහ හිරිහැර කිරීම් නිසා, හෝටල් පාසලේ විදුහල්පති සරත් සෙනෙවිරත්න මහතාගේ ඉල්ලා අස්වීම නිසා ඇතිවූ පුරප්පාඩුව දීර්ඝ කාලයක් පිරවීමට කටයුතුකර තිබුණි. පසුව පෞද්ගලික අංශයේ සමාගමක් වන "ජෝන් කීල්ස් ග්‍රෑප්" ආයතනයේ ජ්‍යෙෂ්ඨ සේවකයකුගේ සේවය ලබාගෙන ආයතනයේ විදුහල්පති තනතුරේ පුරප්පාඩුව පුරවන ලද අතර, සංචාරක මණ්ඩලයෙන් අඩු වැටුපක් ගෙවනු ලබන බැවින් ඔහුට අහිමිවන පාරිශ්‍රමිකය වෙනුවෙන් හා නිපූරණය සඳහා දීමනාවක් ඔහුගේ සමාගම විසින් ලබාදෙන ලදී. නව විදුහල්පති ටික කාලයක් සේවය කළ අතර ප්‍රමාණය ඉක්මවා මැදිහත්වීම් සහ ඔහුගේ සමාගම

විසින් ගෙවනු ලැබූ දීමානව ඉවත්කර ගැනීම නිසා අවසානයේදී තනතුරෙන් ඉල්ලා අස්වීම් ලිපිය භාරදී ඇත.

කෙසේ වුවද, මූල්‍ය දුෂ්කරතා, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමය හඳුන්වාදීම, විදුහල්පතිගේ ඉල්ලා අස්වීම, ශිෂ්‍යයන් අඩු සංඛ්‍යාවක් ලියාපදිංචිවීම, විශේෂයෙන් පරිවාර පාසල්වල ශිෂ්‍යයන් සංඛ්‍යාව අඩුවීම වැනි බොහෝ දුෂ්කරතා තිබියදී ද පාලක මණ්ඩලය විසින් ආයතනය පාලනය කිරීමේ කටයුතු කරගෙන යන ලදී. මේ සම්බන්ධයෙන් ලබාදිය හැකි විසඳුමක් දැකීමට නොහැකිව ආයතනයේ තත්වය සීඝ්‍රයෙන් පිරිහීමට පටන්ගත් බැවින්, එය පාලනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ සංවිධානයකට භාරදීමට යන බවට අනුමාන කරන ලදී. කෙසේ වුවද, පාසලේ කටයුතු මෙහෙයවීම සහ කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් ක්ෂේත්‍ර දෙකක් සම්බන්ධයෙන් මූලික පියවරක් ගෙන තිබුණි.

1. මුල් අවස්ථාවේදීම "සංචාරක හා හෝටල් කළමනාකරණ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය" නමැති ආයතනය වෙත නීතිමය තත්වය ලබාදීමට පනතක් කෙටුම්පත්කර තිබූ නමුදු 2002 වර්ෂයේ පාලනය වෙනස් වූ බැවින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි විය. එම පාලක මණ්ඩලය විසින්ම ආයතනය පාලනය කිරීමට කටයුතු කරගෙන ගිය බැවින් පසුව එම පනත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු නොකලේ මන්ද යන්න පැහැදිලි නොමැත.

2. මහාචාර්ය චන්ද්‍රා පියවර්ධන නමැති විදේශයේ සේවයේ නියුතු ශ්‍රී ලාංකික උපදේශකවරයකුගේ සේවය විෂය මාලාව වැඩිදියුණු කිරීම පිණිස ලබාගන්නා ලද්දේ, යූ එස් ඒ අයි ඩී ආයතනය මගින් ආධාර ලබාදෙනු ලබන සංචාරක පර්ෂද සම්පත්වලින් ලබාදෙන අරමුදල් මගින් විදේශ රටවල ප්‍රසිද්ධියට පත් හෝටල් පාසල් සමඟ එම ආයතනය ඒකාබද්ධ කිරීමට හැකිවනු පිණිසය.

කෙසේ වුවද, ආයතනය ක්‍රියාත්මක කිරීමේ මුහුණ දුන් ගැටලු නිසා මෙම ක්‍රියා මාර්ග ක්‍රියාත්මක නොවී පැවතුණි.

## 3.9 තෙවැනි වරටත් සංචාරක මණ්ඩලයේ කළමනාකරණය යටතට යළි පත්වීම.

2004 වර්ෂයේ රජය වෙනස්වීම නිසා සංචාරක කටයුතු, ආයෝජන ප්‍රවර්ධන සහ කර්මාන්ත අමාත්‍යාංශය යනුවෙන් අලුතින් අමාත්‍යාංශයක් පිහිටුවීමෙන් පසු අමාත්‍යාංශයට පත්කළ නව ලේකම්වරයා වන ආචාර්ය යූ. විධානපතිරණ මහතා මෙම ආයතනය කවර හෝ නීතිමය අනුමැතියකින් තොරව පිහිටුවා ඇති බැවින්, එහි පාලක මණ්ඩලයේ සභාපති ධුරය භාරගැනීම ප්‍රතික්ෂේප කළේය. එබැවින් තුන්වැනි වරටත් හෝටල් පාසලේ කළමනාකරණය සංචාරක මණ්ඩලය යටතට යළි පත්කරගන්නා ලෙස නියම කරන ලදි.

2003 අංක 25 දරණ මුදල් පනත මගින් සංචාරක මණ්ඩලයට ලැබෙන මුදල් යොදාගෙන හෝටල් පාසල වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා මාර්ග කීපයක් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලයට හැකිවී ඇත. එම ක්‍රියාමාර්ග සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ඇතුළත් විය.

- මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලබන වැටුපට වඩා ඉහල විශේෂ වැටුපක් හෝටල් පාසලේ විදුහල්පතිවරයාට ලබාදීමටත්, සීමාවකට යටත්ව රාජකාරි කටයුතු වෙනුවෙන් සහ පෞද්ගලික පාවිච්චිය සඳහා කාර් රථයක් ලබාදීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම.
- විවධ ශ්‍රේණිවල කථිකාචාර්යවරුන් සඳහා ගෙවනු ලබන වැටුප් සැලකිය යුතු ලෙස වැඩිකිරීම. මෙම වැටුප් වැඩිකිරීම නිසා, සුදුසුකම් ලැබූ පළපුරුදු කථිකාචාර්යවරුන් ආකර්ෂණයකර ගැනීමට හැකිවීම.
- යාපනය, ත්‍රිකුණාමලය, කුරුණෑගල සහ කහවිට පිහිටි පරිවාරක පාසල් වසා දැමීම. මෙම වසා දැමීම නිසා, වියදම් අපතේ යාම ඉතිරිකර ගැනීමට හැකිවීම.
- මහනුවර, අනුරාධපුර, බණ්ඩාරවෙල සහ මාතර පිහිටි අනෙකුත් පරිවාර පාසල්වල මූලික මට්ටමේ සියලුම පාඨමාලා නතර හඳුන්වාදීමට පහසුකම් සැපයීම සහ උපකරණ සවිකිරීම. මෙම පාසල් මගින් ලබාදෙනු

ලබන පුහුණුව සඳහා ඇති ඉල්ලුම වැඩිවීමට එය හේතු විය.

- ❖ චන්ද්‍රා ජයවර්ධන වාර්තාවේ සඳහන් නිර්දේශය අනුව පස් මාසික මූලික මට්ටමේ පාඨමාලා හතර සමග තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා ප්‍රතිව්‍යුගත කිරීම.

- ❖ ශිෂ්‍යයන් බඳවා ගන්නා සංඛ්‍යාව වැඩි කිරීමටත්, වැඩිවන ඉල්ලුම සපුරාලීමටත් කොළඹ ප්‍රධාන පාසලේ සැසිවාර දෙකක් (උදය වරුව සහ සවස් වරුව) හඳුන්වාදීම.

- ❖ සියලුම මට්ටමේ පුහුණුව සඳහා අයකරනු ලබන ගාස්තු ප්‍රමාණය වැඩිකිරීම.

- ❖ ඔස්ට්‍රියාවේ පිහිටි සැල්ස්බර්ග් හෝටල් පාසලට මෙම හෝටල් පාසල අනුබද්ධ කිරීම.

- ❖ ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා ගොඩනැගිල්ලේ තිබෙන පහසුකම් උපයෝගී කරගෙන සමුද්‍රා හෝටලය නමින් පාසල් පරිශ්‍රය තුළ පුහුණු කිරීමේ හෝටලයක් ආරම්භ කිරීම.

ඉහත සඳහන් ක්‍රියා මාර්ගවලින් හෝටල් පාසලේ මෙහෙයුම් කටයුතුවල තත්වය විශාල වශයෙන් වැඩිදියුණු වූ අතර, කොළඹ ප්‍රධාන පාසලට මෙන්ම පරිවාර පාසල්වලට ඇතුළත්වීම සඳහා ඇති ඉල්ලුම වැඩිවීමට ද එය හේතු විය. කෙසේ වුවද අයකරනු ලබන ගාස්තු ප්‍රමාණය අධික බවත්, සමාජයේ වඩා දිළිඳු කොටස්වලට එම ගාස්තු දැරිය නොහැකි බවත් සඳහන් කරමින් ගාස්තු වැඩි කිරීම පිළිබඳව විවේචන එල්ල විය.

වැඩි කරන ලද ගාස්තු ගෙවීමට නොහැකිවන අයට ශිෂ්‍යත්ව ලබාදෙන බවට සංචාරක මණ්ඩලය විසින් එයට එරෙහිව කරුණු දක්වන ලද අතර ගාස්තු ප්‍රමාණයන් වැඩිකර තිබියදී ශිෂ්‍යයන් ලියාපදිංචි වීමේ අඩුවීමක් ඇති නොවිය.

## 3.10 තීරණ සහ නිගමන.

ඉහත උප ඡේදවල දක්වන ලද විශ්ලේෂණය සහ විස්තරය අනුව පහත සඳහන් නිගමනවලට එළඹිය හැකිය.

1. දශක තුන හමාරකට ආසන්න කාලයක් තිස්සේ හෝටල් පාසල පවත්වාගෙන යාම සඳහා සථිර ස්ථානයක් නොමැතිවීම. අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව එය සංවර්ධනය කිරීමට බාධාකයක්වී ඇත. කෙසේ වුවද. කොළඹ වැදගත් ස්ථානයක ගැනුම්කරුගේ ඉල්ලීම අනුව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමෙන් දැන් මෙම තත්වය නිවැරදිකර ඇත.

2. හෝටල් පාසල සංචාරක මණ්ඩලයේ කළමාකරණය ඉවත් කිරීම සඳහා අතීතයේදී කරන ලද සියලුම පරශ්‍රමයන් නිෂ්ඵලවී ඇත. ප්‍රධාන වශයෙන් අදාළ පුද්ගලයන් සහ කණ්ඩායම් විසින් සිදු කරන ලද මැදිහත්වීම් නිසා වරින් වර එහි මෙහෙයුම් කටයුතු අසාර්ථකවී ඇත.

3. සියලුම අයහපත් තත්වයන් තිබියදී වුවද ශ්‍රී ලංකාවේ හෝටල් කර්මාන්තය පුළුල් කිරීම සඳහා පුහුණු මිනිස් බල අවශ්‍යතාවන් සියල්ලම පාහේ සපයාදීමට හැකිවීම නිසා, එහි කාර්ය සාධන පිළිබඳව ආඩම්බර විය හැකිය.

4. මේ හැරුණු විට විශේෂයෙන් මැද පෙරදිග, නැගෙනහිර ආසියාව, ඔස්ට්‍රලසියාව සහ යුරෝපය යන බොහෝ විදේශ රටවල වඩා ලාභදායී රැකියා සොයා ගැනීමට හෝටල් පාසලෙන් බිහිවූ අයට හැකිවී තිබේ. රටේ ඉතා අවශ්‍යතාවක්වී ඇති විදේශ විනිමය උපයා ගැනීම්වලට හෝටල් පාසලෙන් බිහිවූ අයට දායකවීමට හැකිවී ඇත.

5. හෝටල් පාසලේ මෙහෙයුම් කටයුතුවලින් උපයා ගතහැකි මුදල්වලට අමතරව පාසලේ කටයුතු මෙහෙයවීම සඳහා ස්ථාවර

**මුදල් ලබාගැනීමේ මාර්ගයක් 2003 අංක 25 දරන මුදල් පනත මගින් ඇතිකර ඇත.**

6. (අ) විදේශ විනිමය ඉපයීම්වලට හිඟය සහ (ආ) උගත් තරුණයන්ගේ රැකියා විරහිතභාවය යන රට මුහුණපා තිබෙන ප්‍රධාන ආර්ථික ගැටලු දෙක විසඳීම සඳහා හෝටල් පාසලට සැලකිය යුතු ලෙස දායකවීමේ හැකියාව පවතී.

7. පාසල අනාගතයේ පුළුල් කිරීම සහ කළමනාකරනය සඳහා ස්ථිර ආයතනික සහ නෛතික පාදක ව්‍යුහයක අවශ්‍යතාව පවතී.

පාසලේ කටයුතු පවත්වාගෙන යාම සඳහා ස්ථිර ආයතනික සහ නෛතික පාදක ව්‍යුහයක් පිහිටුවීම සම්බන්ධයෙන් සංචාරක මණ්ඩලය සමඟ හෝටල් පාසලේ ඇති ඓතිහාසික සම්බන්ධතාවයත්, එහි ඇති භාරකාරත්වයත් අවශ්‍යවන බවත්, සමස්තයක් වශයෙන් පාසලේ සහ සංචාරක කර්මාන්තයේ මුල් අවස්ථාවලදී ප්‍රයෝජනවත බවත් පැහැදිලි වේ. හෝටල් පාසල දැන් මැනවින් ස්ථාපිතවී ඇති අතර, එහි වර්ධනයක් ද ඇතිවී කටයුතු ද පුළුල්වී එහි කටයුතු මෙහෙයවීමේදී ප්‍රමාණවත් ආයතනික හැකියාවද වර්ධනය වී ඇති බව පැවසිය හැකිය.

යෝජිත පරිදි සංචාරක හා හෝටල කළමනාකරණ ආයතනය වශයෙන් හෝටල් පාසල යළි නම් කිරීමෙන් ද ස්වාධීන ආයතනයක් මගින් එහි කළමනාකරණය පවත්වාගෙන යාමෙන් ද එය තිබූ තත්වයට පත්වන බව ස්ථිරවන අතර, සංචාරක හා හෝටල් කළමනාකරණ අධ්‍යාපනය සහ පුහුණුව ලබාදීමේ විශිෂ්ට ප්‍රාදේශීය ආයතනයක් වශයෙන් එය තවදුරටත් සංවර්ධනය වී, එහි කටයුතු පුළුල්වන බව පෙනී යයි. එයටම ආවේනික වූ ප්‍රඥප්තියක් මගින් ස්වාධීන ආයතනයක් ලෙස එහි කටයුතු කරගෙන යාමේ අවශ්‍යතාව ද එයින් පෙන්නුම් කෙරේ.

සංචාරක මණ්ඩලය හෝටල් පාසල සමඟ සෘජු සම්බන්ධතාවයක් පැවැත්වීම එහි සංවර්ධන කාර්ය භාරයේ කොටසක් විය. මෙම කාර්යය දැන් ඉටුවී ඇති අතර, එම පැවරුම් බලය දැන් අත්හැර දැමිය යුතුය. සංචාරක මණ්ඩලය තැනහොත් යෝජිත ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වැනි සංචාරක සහ

හෝටල් පුහුණු ආයතනයේ එදිනෙදා කළමනාකරණය හා පරිපාලනය සාමාන්‍යයෙන් ජාතික සංචාරක පරිපාලනයේ කොටසක් නොවේ.

එසේ හෙයින්, කලින් සකස් කරන ලද ව්‍යවස්ථා සම්පාදක කෙටුම්පතේ යෝජනා කර ඇති පරිදි සංචාරක හා හෝටල් කළමනාකරණ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය යනුවෙන් හැඳින්විය යුතු වෙනම, ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීම කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ. මෙම පරිච්ඡේදයේ 1 වැනි කොටසේ කරුණු පැහැදිලිකර ඇති පරිදි "සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය" යනුවෙන් එය හඳුන්වනු ලැබීමට හේතුවන මූල් කාරණය වන්නේ, එහි නිර්මාතෘවරයාට උපහාර දැක්වීමය. මෙම යෝජනාව සම්බන්ධයෙන් වැඩිවිස්තර 7 වැනි පරිච්ඡේදයේ දැක්වේ.

## 4 වැනි පරිච්ඡේදය.

### සංචාරක ව්‍යාපාරය කළමනාකරණය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය කලින් පැවති යෝජනා සම්බන්ධයෙන් සමාලෝචනය.

### 4.1 හැඳින්වීම.

අදාළ කොටස්කරුවන්ගෙන් අදහස් විමසීමෙන් පසු සහ සංචාරක ව්‍යාපාරය කළමනාකරණය සඳහා සංචාරක ව්‍යාපාරයේ නියුතු පෞද්ගලික අංශය සහභාගී කරවා ගැනීම සඳහා 1990 වර්ෂවල මුල් භාගයේ සිට කලින් දරන ලද ප්‍රයත්නයන් පදනම් කරගෙන වර්තමාන සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් නව සංචාරක නීතිය නැතහොත් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත සම්පාදනය කර ඇති බව 1 වැනි පරිච්ඡේදයේ 1 වැනි කොටසේ සඳහන් කරන ලදී. විවිධ තත්වයන් සහ විවිධ හේතු යටතේ වරින් වර ඉදිරිපත් කරන ලද ඇතැම් යෝජනා ඇතුළත් කිරීමට දරන ලද ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන නීතිය සම්පාදනය කර ඇති බව පැවසිය හැකිය.

එසේ හෙයින්, වරින් වර ඉදිරිපත් කරන ලද යෝජනා සහ යෝජනා ඉදිරිපත් කිරීමට හේතුවූ තත්වයන් ද වර්තමාන අධ්‍යයනයට එළඹීමට තුඩුදුන් යෝජනා ක්‍රියාත්මක නොකරන ලද්දේ මන්ද යන්නට හේතු ද පිළිබඳ සමාලෝචනය

කර බැලීම "මේ සම්බන්ධයෙන් අදාළ වියහැකි බව සලකනු ලැබේ. එබැවින් මෙම පරිච්ඡේදයේ අරමුණ වන්නේ" ඉදිරි ගමන පිළිබඳව 7 වැනි පරිච්ඡේදයේ කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශයන් මැනවින් අවබෝධ කරගෙන ඇගයීම සඳහා එම සමාලෝචනය ඉදිරිපත් කිරීමය.

සංචාරක ව්‍යාපාරයේ පෞද්ගලික අංශයේ අදාළ කොටස්කරුවන් සමග එක්ව නැතහොත් එම අයගෙන් අදහස් විමසා සංචාරක මණ්ඩලයේ විවිධ සභාපතිවරුන්ගේ අනුග්‍රහය යටතේ වරින් වර සකස් කරන ලද ව්‍යවස්ථා සම්පාදක ලිපිලේඛන පිළිබඳ කෙටුම්පත එකට එකතුකර, මෙම වාර්තාවේ අතිරේකයක් වශයෙන් ("අ" අතිරේකය) වෙනම ඉදිරිපත් කර ඇත. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුද්ගලයන් කිපදෙනෙකු මෙම යෝජනා මුලින්ම ඉදිරපත් කිරීමට සම්බන්ධවී ඇති බැවින්ද එම යෝජනාවලට පක්ෂව කරුණු ඉදිරිපත් කිරීමේදී ප්‍රමුඛත්වය ගෙන කටයුතු කර ඇති බැවින්ද මේ සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගැනීමට අනිවාර්යවන අවශ්‍යතාවක් වශයෙන් පහත දැක්වෙන විස්තරාත්මක විශ්ලේෂණයේදී එම අයගේ නම් සඳහන් කළ යුතුව ඇත.

## 4.2 ඓතිහාසික සම්බන්ධතාවය.

සංචාරක මණ්ඩල පනත මගින් සංචාරක මණ්ඩලය වෙත පැවරී ඇති මූලික කාර්යයන් වන්නේ සංචාරක චාරිකා සංවර්ධනය හා ප්‍රවර්ධනය සහ දිරිගැන්වීම, සංචාරක පහසුකම් හා සේවා සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමය. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා සෑම වසරකම පාර්ලිමේන්තුව මගින් සම්මත කරනු ලබන ජාතික අයවැය ලේඛනයෙන් සංචාරක මණ්ඩලය වෙත ආධාර මුදලක් ලැබී ඇත. සංචාරක ප්‍රවර්ධනය සඳහා වාර්ෂික ආධාර මුදලින් වෙන් කරනු ලබන මුදල් තරඟකාරී සංචාරක ගමනාන්ත ඇති රටවල්වලින් සංචාරක ප්‍රවර්ධනයට වෙන් කරනු ලබන අයවැයට සරිලන අන්දමින් නොතිබුණු නමුදු 1980 වර්ෂවල මුල් භාගය දක්වා ජාතික අයවැය මගින් සංචාරක මණ්ඩලය ලැබූ වාර්ෂික ආධාර මුදල් එහි කටයුතු සඳහා මුදල් යෙදවීමට ප්‍රමාණවත් නොවූ බව පෙනී ගියේය. සංචාරක ප්‍රවර්ධනය සඳහා මුදල් වෙන් කිරීමේදී අනෙකුත් තරඟකාරී රටවල්වලට වඩා විශේෂයෙන් අග්නිදිග ආසියානු කලාපය තුළ ඇති රටවල්වලට වඩා සංචාරක මණ්ඩලය සඳහා වෙන්කර ඇත්තේ බෙහෙවින් අඩු මුදලකි. උදාහරණ වශයෙන් යුරෝපායේ නිවාඩු ගත කිරීමේ සංචාරක වෙළඳපොළවල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ සෘජුවම තරඟවදින රටවල් වශයෙන් සලකනු ලබන්නේ තායිලන්තය,

කෙන්යාව සහ මාලදිවයින යන රටවල්ය. එම රටවල ප්‍රවර්ධන කටයුතු සඳහා වෙන් කරනු ලබන මුදල් වසරින් වසර වැඩිවී ඇති අතර. ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධනය සඳහා ඇති අයවැය ප්‍රතිපාදන සැබවින්ම වැඩි නොවී එලෙසින්ම පවතී. පහත දැක්වෙන 4.1 වගුවේ දැක්වෙන සංඛ්‍යා අනුව මෙය දැනගත හැකිය.

4.1 වගුව - සංචාරක මණ්ඩලයට රජයෙන් ලබාදෙන ආධාර මුදල සහ සංචාරක ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන (1990-1994)

| වර්ෂය | රජයේ ආධාර මුදල රු. මිලියන | මණ්ඩලයේ ආදායම රු. මිලියන | ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන රු. මිලියන | ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන ඇ. ඩො. මි. |
|---|---|---|---|---|
| 1990 | 60.0 | 5.2 | 36.8 | 0.91 |
| 1991 | 70.0 | 5.0 | 34.6 | 0.83 |
| 1992 | 81.5 | 6.8 | 47.2 | 1.08 |
| 1993 | 90.0 | 8.5 | 57.0 | 1.18 |
| 1994 | 93.2 | 10.0 | 57.9 | 1.17 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සංචාරක මණ්ඩලයේ කටයුතු මෙහෙයවීම සඳහා රජය ලබාදුන් ආධාර මුදල 1990 වර්ෂයේදී රුපියල් මිලියන 60 ක් වූ අතර. මෙය ආන්තික වශයෙන් සෑම වර්ෂයක් පාසා වැඩිකර 1994 වර්ෂයේ රුපියල් මිලියන 9.2 දක්වා වැඩිවිය. සංචාරක ප්‍රවර්ධනය සඳහා වෙන්කර ඇත්තේ ආධාර මුදලින් තුනෙන් දෙකක් පමණි. මෙම මුදල් ප්‍රමාණය ඇ. ඩො. ප්‍රමාණය අනුව ඩොලර් මිලියන එකක් පමණ වන අතර තරඟකාරී රටවල ප්‍රවර්ධනය සඳහා වන අයවැය ප්‍රමාණයට වඩා මෙය බෙහෙවින් අඩුය. තවද. සංචාරක ගමනාන්තය ඇති රටක් වශයෙන් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන අවස්ථාව වන විට වඩා අයහපත් අතට හැරෙමින් තිබූ ආරක්‍ෂක තත්වය නිසා, ශ්‍රී ලංකාවේ තත්වය අවාසනාවන්ත විය. 1980 වර්ෂවල අවසාන භාගයේදී ත්‍රස්තවාදී ක්‍රියා සහ ප්‍රචණ්ඩ ක්‍රියා වැඩිවීම නිසා සංචාරක කර්මාන්තය පහත් මට්ටමකට වැටී ඇති බව දක්නට ලැබිණ. 1982 වර්ෂයේ 407,000 ක් වූ සංචාරකයන්ගේ පැමිණීම 1989 වර්ෂයේ 185,000 දක්වා පහත වැටුණ අතර. 1982 ඇ. ඩො. මිලියන 147 ක් වූ විදේශ විනිමය උපයා ගැනීම 1989 වර්ෂයේදී ඇ.ඩො. මිලියන 76 දක්වා පහත වැටුණි.

කෙසේ වුවද, 1989 වර්ෂයේ දකුණේ ප්‍රචණ්ඩකාරීන්ගේ ව්‍යාපාරය පරාජයවීමෙන් සහ ජනාධිපති ප්‍රේමදාස මහතාගේ පාලනය විසින් 1990 වර්ෂවල මුල් භාගයේදී උතුරේ ත්‍රස්තවාදීන් සමඟ සාම සාකච්ජා ආරම්භ කිරීමෙන් පසුව රටේ ආරක්‍ෂක තත්වයේ පැහැදිලි වෙනසක් ඇති විය. සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉමහත් බලාපොරොත්තු ඇති කරමින් සංචාරක කර්මාන්තය ක්‍රමයෙන් යථා තත්වයට පත්වීමට මෙය හේතුවිය. පහත සඳහන් 4.2 වගුවේ දැක්වෙන සංඛ්‍යාවලින් මෙම වෙනස්කම් දැකගත හැකිය.

4.2 වගුව - ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවණතාවයන් (1982-1994)

| වර්ෂය | සංචාරකයින්ගේ පැමිණීම | විදේශ විනිමය උපයා ගැනීම් ඇ.ඩො. මි. | හෝටල් කාමර සංඛ්‍යාව | නවාතැන් ලබාගත් සංඛ්‍යාව % |
|---|---|---|---|---|
| 1982 | 407,230 | 146.60 | 7,579 | 47.8 |
| 1989 | 184,732 | 76.0 | 9,459 | 31.0 |
| 1990 | 297,888 | 132.0 | 9,556 | 47.2 |
| 1991 | 317,703 | 156.8 | 9,879 | 48.4 |
| 1992 | 393,669 | 201.4 | 10,214 | 55.3 |
| 1993 | 392,250 | 208.0 | 10,365 | 57.0 |
| 1994 | 407,511 | 230.7 | 10,742 | 56.6 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ වාර්ෂික සංඛ්‍යා ලේඛන වාර්තාව.

සංචාරකයන්ගේ පැමිණීම ක්‍රමයෙන් වැඩි දියුණුවීමත්, හෝටල් කාමර සංඛ්‍යාවේ වැඩිවීමත්, හෝටල් කාමරවල නවාතැන් ලබන අයගේ සංඛ්‍යාව වැඩිවීමත් නිසා ඉල්ලුම සම්බන්ධයෙන් දැඩි උනන්දුවක් දැක්වූ සංචාරක මණ්ඩලය සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් භාණ්ඩාගාරය වෙත නැවත නැවතත් කරුණු දැක්වීම් ඉදිරිපත් කර තිබියදීත් සංචාරක ප්‍රවර්ධනය සඳහා ප්‍රමාණවත් මුදල් වෙන්කරදීමට රජයට නොහැකිවීම සම්බන්ධයෙන් සංචාරක ව්‍යාපාරය තුළ ඇති වෙමින් තිබුණේ නොඉවසිලිවන්ත කමකි.

එබැවින්, 1990 වර්ෂවල මුල් භාගයේදී සංචාරක ව්‍යාපාරයේ ප්‍රධානත්වය ඉසුලූ එවකට සංචාරක හෝටල් සංගමයේ සභාපතිව සිටි ගිල්බට් ජයසූරිය මහතා

සහ සමූහ චාරිකා නියෝජිතයන්ගේ සංගමයේ එවකට සභාපතිව සිටි සුනිමල් සේනානායක මහතා විසින් එවකට භාණ්ඩාගාරයේ ලේකම්වරයාව සිටි පාස්කරලිංගම් මහතා වෙත යෝජනාවක් ඉදිරිපත් කරන ලද අතර. පෞද්ගලික අංශයේ ව්‍යාපාර කටයුතු මෙහෙයවන අයගේ ව්‍යාපාර පිරිවැටුම් බද්ද වශයෙන් සංචාරක ව්‍යාපාරයෙන් ස්වේච්ඡාවෙන් සපයනු ලබන දායක මුදල්වලින් සංචාරක ප්‍රවර්ධන සෙස්බදු අරමුදලක් පිහිටුවීමට එකී ව්‍යාපාර කටයුතු මෙහෙයවන අය සමඟ පාස්කරලිංගම් මහතා විසින් නිතිපතා උපදේශක රැස්වීම් පවත්වන ලදී. රජය විසින් සමාන මුදල් ප්‍රමාණයක් ලබාදීමෙන් ගැලපීම් මුදල් සපයාදීමට ක්‍රියා කළ යුතු අතර. එසේ ලබාදෙන මුදල් "ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය" යනුවෙන් හැඳින්විය යුතු වෙනව. ව්‍යවස්ථාපිත ආයතනයක් මගින් පාලනය කළ යුතුය යන කොන්දේසියට යටත්ව මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත. මේ සඳහා ව්‍යවස්ථා සම්පාදන කෙටුම්පතක් සකස් කිරීමට පෞද්ගලික නීති ආයතනයක් ද ඔවුන් විසින් යොදාගෙන ඇත.

භාණ්ඩාගාරයේ ලේකම් මූලික වශයෙන් මෙම යෝජනාවට එකඟවූ නමුදු යෝජනාව සලකා බලා. රජයේ අදාල නියෝජිත ආයතනවලින් සහ අනෙකුත් කොටස්කරුවන්ගේ අදහස් විමසා තිරණයකට එළඹීමට ඔහුට නව කාලය අවශ්‍ය විය.

## 4.3 1994 - 2000 කාල පරිච්ඡේදය තුළ ඉදිරිපත් කළ යෝජනා.

මේ අතරතුරේදී 1994 වර්ෂයේ රජයේ වෙනස්වීමක් සිදුවූ (ජනතා සංධාන රජය) අතර සංචාරක කටයුතු පිළිබඳ නව අමාත්‍යවරයකු වශයෙන් ගරු ධර්මසිරි සේනානායක මහතාද. ලංකා සංචාරක මණ්ඩලයේ නව සභාපතිවරයා වශයෙන් එච්.එම්.එස්. සේනානායක මහතාද පත් කරන ලදී. මෙම පත්කිරීම් සිදුකළ වහාම සංචාරක හෝටල් සංගමයේ සභාපති වන ගිල්බට් ජයසූරිය මහතාද. සමූහ චාරිකා නියෝජිතයන්ගේ සංගමයේ සභාපති සුනිමල් සේනානායක මහතාද. හෝටල් සංගමයේ කලින් සභාපති ධුරය දැරූ ටෝනි ෆර්කහාත් මහතා සහ අස්කර මුසානි මහතා යන අයගෙන් සහ තවත් කිපදෙනෙකුගෙන් සමන්විත සංචාරක ව්‍යාපාරයේ ඉතා බලවත් නියෝජිත පිරිසක් සංචාරක මණ්ඩලයේ නව සභාපතිවරයා බැහැදැකීමට ගොස් කරුණු දෙකක් සම්බන්ධයෙන් කලින් පැවති පරිපාලනය වෙත ඉදිරිපත් කරන ලද "ඉල්ලීම්" අලුතින් ඉදිරිපත් කරන ලදී.

- ඇහලුම් කර්මාන්තය වැනි අනෙකුත් කර්මාන්ත අලුතින් පිහිටුවන ලද ආකාරයටම සංචාරක කර්මාන්තය "අපනයන කර්මාන්තයක්" ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන්, විශාල වශයෙන් මූල්‍ය සහන ලබාගැනීමට සංචාරක කර්මාන්තයටද ඉබේම හිමිකම් ලැබෙනු ඇත.

- රජයේ සහ පෞද්ගලික අංශයේ දායක මුදල්වලින් සැදුම්ලත් සෙස් අරමුදලකින් මුදල් සපයනු ලබන සංචාරක ප්‍රවර්ධන වැඩකටයුතු මෙහෙයවීමට වෙනම ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීම සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම. ඔවුන් විසින් දැනටමත් සකස් කරන ලද ව්‍යවස්ථා සම්පාදන කෙටුම්පතක පිටපතක් සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

අවාසනාවකට මෙන් මෙම වාර්තාවේ "අ" අතිරේකයේ පළකිරීම සඳහා මෙම ව්‍යවස්ථා සම්පාදක කෙටුම්පතේ පිටපතක් කමිටුවට සොයා ගැනීමට නොහැකිවිය. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නියෝජිතවරුන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් සහිත ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන වෙනම ව්‍යවස්ථාපිත ආයතනයක් (සංචාරක මණ්ඩලයෙන්) පිහිටුවීම සඳහා යෝජිත ව්‍යවස්ථා සම්පාදනය මගින් විධිවිධාන සලසා ඇති බව ලබාගත හැකිවූ වාර්තාවලින් පෙනියයි. රජයෙන් (පාර්ලිමේන්තුවේ සම්මත කරනු ලබන වැය ශීර්ෂයක් මගින්) සහ පෞද්ගලික අංශයෙන් (පිරිවැටුම් බද්දක් මගින්) සපයනු ලබන දායක මුදල්වලින් සැදුම්ලත් "සංචාරක ප්‍රවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන වෙනම අරමුදලකින් එහි කටයුතු සඳහා මුදල් සැපයිය යුතුවිය.

පෞද්ගලික අංශයෙන් එකතු කළ මුදල 'වලට අඩු තරමින් රජයේ දායක මුදල සමානවිය යුතුය. මේ සඳහා වෙන්කර ඇති මුදල දළ වශයෙන් ඇ.ඩො. මිලියන පහක්වන අතර, එය දෙවැනි සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්මේ නිර්දේශිත මුදලය. සංචාරක මණ්ඩලයේ සභාපති සමග රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැඩි පිරිසකගෙන් සහ තිලබලයෙන් පත්වන සාමාජිකවරුන් වශයෙන් මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයකුගෙන් කළමනාකරණ මණ්ඩලය සමන්විත විය හැකිය. ආරම්භයේදී සංචාරක මණ්ඩලයේ සභාපති අධිකාරියේ සභාපති වශයෙන්ද පත් කරනු ඇත.

මෙම යෝජනාව පිළිබඳව ගරු අමාත්‍යවරයා සහ අතිගරු ජනාධිපතිවරයා සමඟ සාකච්ඡා කරන ලද නමුදු සංචාරක ප්‍රවර්ධන කටයුතු මෙහෙයවීම සඳහා වෙනම ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීමට එම දෙදෙනාම අනුග්‍රහයක් නොදක්වන ලද බැවින් ද, සංචාරක කර්මාන්තයට සහන ලබාගැනීම සඳහා සංචාරක ව්‍යාපාරය උනන්දුවක් දක්වන ලද නිසා, මෙම ඉල්ලීම සම්බන්ධයෙන් ඔවුන් විසින් බලපෑමක් නොකළ බැවින්ද මෙම යෝජනාව ටික කාලයක් ක්‍රියාත්මක නොවී ඇණහිට තිබුණි.

"අපනයන කර්මාන්ත තත්වය" සංචාරක කර්මාන්තයට ලබාදීමේ ඉල්ලීම ඉහළ පෙළේ සාකච්ඡාවලට බඳුන්වූ අතර සංචාරක මණ්ඩලය සහ අමාත්‍යාංශය එයට සහයෝගය දක්වන ලද නමුදු හේතු කීපයක් මත එයට විරෝධතා ඇති විය.ඉතා දැඩි විරෝධතාවයක් එල්ලවූයේ භාණ්ඩාගාරයෙන් වන අතර ඊට ලෝක බැංකුවේ උපදේශක වරුන්ගේද සහයෝගය ලැබී තිබුණි.

කෙසේ වුවද, වසර දෙකකට පසු අයවැය කථාවේදී සහන ලබාදීමට කරන ලද ඉල්ලීම ලබාදෙන ලදී. අනෙකුත් කර්මාන්ත කීපයක් සමඟ සංචාරක කර්මාන්තය "බලපෑමක් ඇති කරන කර්මාන්තයක්" වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද අතර, සහන කීපයක්ද ඒ සඳහා ලබාදෙන ලදී.

- ➢ සංචාරක හෝටල් අලුත්වැඩියා කිරීම සඳහා තීරුබදු රහිත ආයතන.
- ➢ සංචාරක වාහන ආනයනය සඳහා තීරුබදු රහිත සහන සැලසීම.
- ➢ පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම.
- ➢ සංයුක්ත බද්ද 30% සිට 15% දක්වා අඩු කිරීම.

සෙස් බදු අරමුදලින් මුදල් සපයනු ලබන සංචාරක ප්‍රවර්ධන කටයුතු මෙහෙයවීමට වෙනම ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීමේ යෝජනාව ප්‍රතික්ෂේප කිරීමෙන් පසු සංචාරක මණ්ඩලයේ සභාපති විසින් විකල්ප යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. වෙනම ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීමෙන් තොරව පෞද්ගලික අංශයේ නියෝජිතයන් සංචාරක මණ්ඩලයේ කළමනාකරණයට ඇතුළත්කර ගැනීමටත්, සංචාරක ව්‍යාපාරය යෝජනාකර ඇති පරිදි සංචාරක ප්‍රවර්ධන සෙස් බදු අරමුදලක් පිහිටුවීමටත් මෙම යෝජනාව ඉදිරිපත් විය. මෙම විකල්ප යෝජනාව බොහෝ දෙනෙකු විසින් පිළිගත හැකිවූ බැවින්, අනුමැතිය ලබාගැනීම

සඳහා එය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව සංක්ෂිප්ත කරුණු ඇතුලත් යෝජනාව නෛතික ලේඛනය සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරන ලදි. මෙම වාර්තාවේ "අ" අතිරේකයේ මෙම ලේඛනය ඇතුලත්වී ඇත.

ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කාර්යක්‍ෂම ලෙස සංවර්ධනය කර ප්‍රවර්ධන කිරීම සුහාත්. ශ්‍රී ලංකා සංචාරක අධිකාරය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවීම සඳහාත් එයට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහත් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පණතකි. පහත සඳහන් අයගෙන් සැදුම්ලත් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නවදෙනෙකු ඇතුලත් කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවීම සඳහා මෙම පනතින් විධිවිධාන සලසා ඇත.

(අ) මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයකු.
(ආ) පලාත් සභා අමාත්‍යාංශයේ නියෝජිතයෙකු.
(ඇ) සංචාරක හෝටල් සංගමයේ නියෝජිතයන් දෙදෙනෙකු.
(ඈ) සංචාරක නියෝජිතයන්ගේ සංගමයේ නියෝජිතයන් දෙදෙනෙකු.

(ඉ) සංචාරක ව්‍යාපාරය පිළිබඳ මනා පළපුරුද්දක් ඇති සංචාරක අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු.

(ඒ) සීමාසහිත එයා ලංකා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි.

ඉහත (ඇ). (ඈ) සහ (ඉ) පත් කරනු ලබන සාමාජිකයන් අතුරෙන් අමාත්‍යවරයා විසින් සභාපතිවරයා පත්කළ යුතු විය. සංචාරක ව්‍යාපාරය නියෝජනය කරන නියෝජිතයන් හතර දෙනෙකු සිටින අතර. ඔවුන්ගෙන් එක් අයකු සභාපති ලෙස පත්කර ගැනීමට විධිවිධාන සලසා ඇති බව පෙනේ. සංචාරක මණ්ඩල පනත අවලංගුකර මණ්ඩලයේ සියලුම කාර්යයන් අධිකාරිය විසින් ඉටුකළ යුතුවිය. පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද මුදල් සහ සියලුම සංචාරක ව්‍යාපාර ආයතනවලින් දායක බද්දක් වශයෙන් අයකරනු ලබන මුදල්වලින් සමන්විත වන අරමුදලක් පිහිටුවීමට ද විධිවිධාන සලසා ඇත.

මෙම පනත් කෙටුම්පතේ සලසා ඇති විධිවිධාන අතිශයින්ම සංචාරක ව්‍යාපාරයේ පෞද්ගලික අංශයට වාසිදායක වූ බව පෙනේ. කෙසේ වුවද, මේ අනුව කටයුතු කිරීමට ඔවුන්ගේ එකඟතාවයක් නොවීය. ඒ සඳහා පහත සඳහන් හේතු දක්වා ඇත.

- සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම, රෙගුලාසි සම්පාදනය, පර්යේෂණ හා සංඛ්‍යා ලේඛන, මානව සම්පත් සංවර්ධනය වැනි අනෙකුත් සංචාරක ව්‍යාපාරයේ කාර්යයන් මෙහෙයවීමට ඔවුන් තුළ සූදානමක් නොමැත.

- රජයේ නීති අධිකාරියට අදාල කිරීමට සලසා ඇති විධිවිධාන.

- විගණකාධිපති විසින් ගිණුම් විගණනය කළ යුතු බවට සලසා ඇති විධිවිධාන.

- සංචාරක මණ්ඩලයේ සියලුම කාර්ය මණ්ඩලය අධිකාරියට අන්තර්ග්‍රහණය කර ගත යුතු බවට සලසා ඇති විධිවිධාන.

ශ්‍රී ලංකා සංචාරක කටයුතු ප්‍රවර්ධන අධිකාරිය - වගකීමට බැඳී ඇති සමාගමකි.

සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා පමණක් මෙහෙයවීමට වෙනම සංවිධානයක් පිහිටුවිය යුතු බවට සංචාරක ව්‍යාපාරය මගින් බලපෑම් කළ බැවින්, සංචාරක මණ්ඩලයේ සභාපති විසින් වෙනත් යෝජනාවක් ඉදිරිපත් කරන ලදි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ පාර්ලිමේන්තු අනුමතිය ලබාගැනීම සඳහා වන කාර්ය පරිපාටි අනුගමනය කිරීමෙන් තොරව රු.ස.සා.දි.ස. හා (MICE) ප්‍රවර්ධන කටයුතු සඳහා පිහිටුවන ලද සමාගමට සමාන (ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය) සමාගම් පනත යටතේ වගකීම් සහිත සීමාසහිත සමාගමක් (වගකීමට බැඳී ඇති සමාගම) පිහිටුවීමට මෙම යෝජනාව මගින් නියමිතවිය.

සංචාරක වෙළඳ ප්‍රජාව විසින් මෙම යෝජනාව එක හෙළාම පිළිගත් බැවින්, සමාගමක් පිහිටුවීමට අමාත්‍යාංශ අනුමැතිය ලබා ගන්නා ලදි. සංචාරක මණ්ඩලයේ සභාපති විසින් "සංචාරක විශේෂඥ මණ්ඩලයක්" පිහිටුවන ලද අතර, වෙළඳ සමාගම් තුනක නියෝජිතයන් (එනම් සංචාරක හෝටල් සංගමය, සමූහ

සංචාරක නියෝජිතයන්ගේ සංගමය, සහ සංචාරක නියෝජිතයන්ගේ සංගමය) සහ ජාතික ගුවන් සමාගම වන ශ්‍රී ලංකා ගුවන් සමාගමේ නියෝජිතයන් එම මණ්ඩලයට ඇතුලත් විය. සංචාරක වෙළඳ ව්‍යාපාරයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු වන අස්කර් මුසාපි මහතා එහි සභාපති වූ අතර යෝජිත වගකීමට බැඳී ඇති සමාගම සඳහා සාංගමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය කෙටුම්පත් කිරීමේ කාර්යය ඔහු වෙත පවරන ලදී.

යෝජිත සමාගමේ කළමනාකරණ මණ්ඩලයට සමූහ චාරිකා නියෝජිතයන්ගේ සංගමයේ කිසියම් නියෝජනය කිරීමක් ඇතුලත් කළ යුතු බව චාරිකා නියෝජිතයන්ගේ සංගමය විසින් කරන ලද දැඩි විරෝධය පෑම නිසා ඉතා අවාසනාවන්ත ලෙස සති කීපයකදී අවසන් කළ හැකිව තිබූ සරල කාර්යයන් සඳහා මාස ගණනාවක් ගතවිය. සමූහ චාරිකා නියෝජිතයන්ගේ සංගමයේ සියලුම සාමාජිකයන් චාරිකා නියෝජිතයන්ගේ සංගමයේදී සාමාජිකයන් වූ බැවින් මෙම විරෝධතාවය ඇති විය. විදේශ සංචාර සමාගම්වල නේවාසික නියෝජිතවරුන් සමූහ චාරිකා නියෝජිතයන්ගේ සංගමයේ සාමාජිකයන් බවට ද පත්කළ බැවින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක නියෝජනයක් කිරීම සඳහා තම සංගමය පිළිගත නොහැකිවූ බවට ඔවුන් විසින් තවදුරටත් තර්ක ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ගෙන් ඉතා විශාල සංඛ්‍යාවක් ඇතුලත්වන කුලී චාරිකා ද ඇතුළුව සියලුම සමූහ චාරිකා කටයුතු තම සාමාජිකයන් විසින් මෙහෙයවනු ලබන නිසා, නව සමාගමේ කළමනාකරණ මණ්ඩලයේ තමන්ට ප්‍රමාණවත් ලෙස නියෝජනයක් තිබිය යුතු බවට සමූහ චාරිකා නියෝජිතයන්ගේ සංගමය විසින් අනෙක් අතට තර්ක කරන ලදී. වැඩි වශයෙන් ආගමික චාරිකා කටයුතු මෙහෙයවන චාරිකා නියෝජිතයන්ගේ සංගමයේ සාමාජිකයන් මෙන් නොව, ශ්‍රී ලංකාවට සංචාරකයින් විශාල සංඛ්‍යාවක් ගෙන ඒම සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ තම සාමාජිකයන් බවට ඔවුන් විසින් තවදුරටත් තර්ක ඉදිරිපත් කරන ලදී. එබැවින් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන් ඉතා වැදගත් මෙහෙයක් ඉටුකර ඇත.

සංගම් දෙක අතර පැවති මෙම කඹ ඇදීම ටික කාලයක් පැවති අතර, අවසානයේදී 1999 මහ මැතිවරණයට පෙර සංචාරක විශේෂඥ මණ්ඩලයේ සභාපති අස්කර් මුසාපි මහතා විසින් යෝජිත සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය සංචාරක මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

විමර්ශනය සහ දැනගැනීම සඳහා මෙම ලේඛනයද මෙම වාර්තාවේ "අ" අතිරේකයට ඇතුළත් කර ඇත.

සාංගමික සංස්ථා පත්‍රය අනුව සමාගම "ශ්‍රී ලංකා සංචාරක කටයුතු ප්‍රවර්ධන අධිකාරිය" යනුවෙන් හැඳින්විය යුතුවූ අතර, පහත දැක්වෙන පරිදි සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් මගින් එය පාලනය කළ යුතුය.

(අ) ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති.
(ආ) සංචාරක විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්.
(ඇ) භාණ්ඩාගාරයේ නියෝජිතයා.
(ඈ) ශ්‍රී ලංකා හෝටල් සංගමයේ සභාපති.
(ඉ) චාරිකා නියෝජිතයන්ගේ සංගමයේ සභාපති.
(ඊ) ආගමික චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමයේ සභාපති.
(උ) සංචාරක කර්මාන්තයට දායකවී ඇති සංචාරක කර්මාන්තය පිළිබඳ දැනුම සහ පළපුරුද්ද ඇති පෞද්ගලික අංශයේ පුද්ගලයන් තිදෙනෙකු.

(ඌ) ජාතික ගුවන් සමාගම වන සීමාසහිත ශ්‍රී ලංකා ගුවන් සමාගමේ නියෝජිතයකු.

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් අධ්‍යක්ෂවරුන් ලෙස හඳුන්වනු ලබන අතර, අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන් අතුරෙන් සභාපතිවරයා පත්කරගත යුතුය. අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාම සඳහා සියලු බලතල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා තිබූ අතර ඔවුන් සෘජුවම අමාත්‍යවරයා වෙත වගකිව යුතු විය. ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම අධිකාරියේ මූලික පරමාර්ථය විය.

ආධාර, ත්‍යාග, පරිත්‍යාග, සහනාධාර ආදී වශයෙන් ලැබෙන සියලුම මුදල් සහ සාමාජිකයන්ගෙන් සාමාජික ගාස්තු වශයෙන් ලැබෙන මුදල් හා සියලු දායක මුදල්වලින් සමන්විත වන අරමුදලක් අධිකාරිය සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රධාන විධායක නිලධාරියා විසින් මණ්ඩලයේ සියලුම කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

2000 ඔක්තෝබර් මාසයේ මහා මැතිවරණයෙන් පසුව, සංචාරක කටයුතු පිළිබඳ නව අමාත්‍යවරයා ලෙස ගරු ලක්ෂමන් කිරිඇල්ල මහතා පත් කිරීමෙන් පසුව සංචාරක මණ්ඩලයේ සභාපතිවරයා විසින් තමා සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීමට යන බැවින් සමාගම පිහිටුවීමට අමාත්‍යාංශය කටයුතු ආරම්භ කළ යුතු බවට යෝජනාකර නව අමාත්‍යවරයා වෙත සංදේශයක් ඉදිරිපත් කරන ලදී.

## 4.4 2001 සිට 2004 දක්වා කාලපරිච්ඡේදය තුළ දරන ලද ප්‍රයත්න.

2001 සිට 2004 දක්වා කාලපරිච්ඡේදය තුළ සංචාරක කටයුතු කළමනාකරණයේදී රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා යෝජනා දෙකක් ඉදිරිපත් කරනලදී. එක් යෝජනාවක් මණ්ඩලයේ සභාපති වශයෙන් සිටි රෙන්වත් ද අල්විස් මහතා සිටි කාලයේද, අනෙකුත් යෝජනාව එහි සභාපති වශයෙන් පැඩි විතාර මහතා සිටි කාලයේද ඉදිරිපත් කරන ලදී.

ද අල්විස් මහතා සිටි කාලයේද සකස් කළ පනත් කෙටුම්පත සඳහා විවිධ කොටස්කරුවන් සමග පුළුල් ලෙස සාකච්ඡා කිරීමෙන් පසුව පහත සඳහන් ලෙස මාතෘකාව යොදන ලදී.

> සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන රජයේ මණ්ඩලයක් පිහිටුවීම සඳහාත් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, දිරිගැන්වීම, පහසුකම් සැලසීම, පුහුණු කිරීම, සේවක පිරිස් සඳහා අධ්‍යාපනය ලබාදීම, සමස්ත කර්මාන්තය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත නියාමනය, අධීක්ෂණය සඳහා නීත්‍යානුකූල යටිතල පහසුකම් සැලසීම පිණිසත් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

පනත් කෙටුම්පත කොළඹ "චේම්බර්ස්" ආයතනය විසින් සකස් කරන ලද අතර, නීතිඥවරයකු වන මණ්ඩලයේ අලෙවිකරණ අතිරේක අධ්‍යක්ෂ දිලිප් මුදන්දෙනිය මහතාට මණ්ඩලය සහ චේම්බර්ස් ආයතනය අතර සම්බන්ධීකරන කටයුතු මෙහෙයවීමට පැවරී තිබුණි. පර්යේෂණ කටයුතු නිෂ්පාදිත සංවර්ධනය, නියාමනය සහ මිනිස්බල සංවර්ධනය ඇතුළුව සංචාරක මණ්ඩලය විසින් ඉටුකරනු ලැබූ සහ ඉටුකරගෙන එනු ලබන සියලුම කාර්යයන් යෝජිත මණ්ඩලය වෙත පැවරෙන බව පනතේ මාතෘකාව අනුවද පැහැදිලිය. සංචාරක කර්මාන්තයේ

පෞද්ගලික අංශයේ සහභාගීත්වය සහ එහි ප්‍රවර්ධන හා පුහුණු කටයුතු දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මණ්ඩලයේ එක් පරමාර්තයක් වශයෙන් සඳහන් විය.

මණ්ඩලයේ සංයුතිය සම්බන්ධයෙන් නම්, පනත සඳහන් පරිදි අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දාහතර දෙනෙකුගෙන් එය සමන්විත වේ.

(අ) ශ්‍රී ලංකා හෝටල් සංගමය සහ ශ්‍රී ලංකා චාරිකා හා සංචාරක කටයුතු පිළිබඳ සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් පස්දෙනකු.

(ආ) දැනට මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරන තැනැත්තා.

(ඇ) සංචාරක කර්මාන්තය සඳහා වෘත්තීමය දායකයන් ලෙස අමාත්‍යවරයා විසින් හඳුනාගනු ලබනව නවත් සාමාජිකයන් තිදෙනෙකු.

මේ හැරුණු විට,

(ඇ) පනතේ iii වැනි කොටස යටතේ පිහිටුවනු ලබන ප්‍රාදේශීය සංචාරක මණ්ඩලවල සභාපති ධූරය දරන තැනැත්තන්.

(ඉ) අමාත්‍යවරයා විසින් ඉහත (ඇ) ජේදයේ සඳහන් සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපති ලෙස පත්කල යුතුය.

(ඒ) අමාත්‍යවරයා විසින් සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ කාර්යාලයෙන් එක් පුද්ගලයකු නිරීක්ෂකයකු ලෙස පත්කරනු ලැබිය හැකිය.

පනතේ සලසා ඇති අනෙකුත් විධිවිධාන පහත දැක්වෙන පරිදි සංක්ෂිප්තව දැක්විය හැකිය.

1. මණ්ඩලයේ අංශ සහ කාර්ය මණ්ඩලය (ii වැනි කොටස)

- අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ උපදෙස් අනුව පත් කරනු ලබන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් එහි ප්‍රධාන විධායක නිලධාරියා විය යුත්තේය.

- ❖ අනෙකුත් නිලධාරීන් සහ සේවකයන් මණ්ඩලයට අවශ්‍ය විය හැකි පරිදි පත්කළ හැකිය.

- ❖ මණ්ඩලය විසින් අවශ්‍යවිය හැකි පරිදි කිසියම් අංශ කිපයක් පිහිටුවා පවත්වාගෙන යා යුතුය.

2. ප්‍රාදේශීය මණ්ඩල පිහිටුවීම (iii වැනි කොටස)

පහත සඳහන් අයගෙන් සමන්විත ප්‍රාදේශීය මණ්ඩල පහක් පිහිටුවීමට පනතින් විධිවිධාන සලසා ඇත.

(අ) සභාපති සහ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස්දෙනෙකු දක්වා.

(ආ) එක් එක් ප්‍රදේශය තුළ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයා.

(ඇ) පළාත් සභා සංචාරක අමාත්‍යාංශවල එක් නියෝජිතයකු.

3. සංචාරක කටයුතු පිළිබඳ ජාතික ආයතනය (iv වැනි කොටස)

- පහත සඳහන් අයගෙන් සමන්විත පාලක මණ්ඩලයෙක් මගින් පාලනය වන මිනිස්බල සංවර්ධනය සඳහා වන ව්‍යවස්ථාපිත ආයතනයකි.

(අ) මණ්ලඩයේ සභාපති.
(ආ) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී.
(ඇ) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ නිර්දේශය මත පත් කරනු ලබන පුද්ගලයන් දෙදෙනෙක්.

(ඈ) ශ්‍රී ලංකා සංචාරක අලෙවිකරණ කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරී.

(ඉ) සංචාරක හෝටල් සංගමය, ලංකා චාරිකා හා සංචාරක කටයුතු පිළිබඳ සංගමය සහ හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමය යන එක් එක් සංගමය විසින් නම් කරනු ලබන පස් දෙනෙකු අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පුද්ගලයන් අට දෙනෙකු.

i සංචාරක හෝටල් සංගමයේ නියෝජිතයන් තිදෙනෙකු

ii ශ්‍රී ලංකා චාරිකා හා සංචාරක කටයුතු පිළිබඳ සංගමය විසින් නම් කරනු ලබන පුද්ගලයන් තිදෙනෙකු.

iii හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමය විසින් නම් කරනු ලබන පුද්ගලයන් දෙදෙනෙකු.

(ඊ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සංචාරක හා සංචාරක කටයුතු පිළිබඳ වෘත්තීය සාමාජිකයන් දෙදෙනෙකු.

(උ) අමාත්‍යවරයා විසින් පාලක මණ්ඩලයේ නිර්දේශ මත පත් කරනු ලබන ආයතනයේ අධ්‍යක්ෂ.

- අමාත්‍යවරයා විසින් ඉහත (උ) ඡේදය යටතේ පත් කරනු ලබන පුද්ගලයා හැර සාමාජිකයන්ගෙන් එක් අයකු පාලක මණ්ඩලයේ සභාපති ලෙස පත් කළ යුතු.

4. සංචාරක ප්‍රවර්ධන කටයුතු භාරව නියෝජිතයකු පත් කිරීම (5 වැනි කොටස).

- අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ නියෝගයක් පළ කිරීමෙන් ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා 1982 අංක 17 දරන සංගම්

පහත යටතේ ලියාපදිංචිකර ඇති සමාගමක් වන මණ්ඩලයේ නියෝජිතයකු පත්කළ යුතුය.

5. සංචාරක කටයුතු පිළිබඳ උපදේශක කොමිෂන් සභාව (5 වැනි කොටස)

- අමාත්‍යවරයා විසින් සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් අදාල කරුණු පිළිබඳව තමන්ට සහ මණ්ඩලයට උපදෙස්දීම සඳහා පස්දෙනෙකුට නොඅඩු එහෙත්, එකොළොස් දෙනෙකුට නොවැඩි පුද්ගලයන් සංඛ්‍යාවකින් සමන්විත උපදේශක මණ්ඩලයක් පත්කළ යුතුය.

6. මුදල් සහ ගිණුම්.

- මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ උපදෙස් අනුව අරමුදලක් පත්වාගත යුතු අතර, එම අරමුදලට ලැබෙන සියලුම මුදල් බැරකළ යුතුය.

- මේ හැරුණු විට මණ්ඩලය විසින් පහත සඳහන් සේවා සඳහා සෙස් බද්දක් පැනවිය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ නතර කිරීමට එකඟවීමෙන් ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව සඳහා නිකුත් කරනු ලබන ගුවන් ප්‍රවේශපත්‍ර සඳහා නියමිත මුදලක්.

(ආ) ශ්‍රී ලංකාවේ නතර කිරීමට එකඟව තිබෙන මුහුදු මාර්ගයෙන් ශ්‍රී ලංකාව වෙත පැමිණෙන සහ ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගී යාත්‍රාවල සිටින මගීන් සඳහා නියමිත මුදලක්.

(ඇ) සංචාරක සේවා සැපයීමට බලපත්‍ර ලබාගත් අයකු විසින් මෙහෙයවනු ලබන බලපත්‍ර ලබා ඇති සංචාරක සේවා මෙහෙයවනු ලබන බලපත්‍ර ලබා ඇති සංචාරක සේවා සඳහා නියමිත මුදලක්.

(ඇ) සෙස් බදු අය කිරීම පහත සඳහන් පරිදි ප්‍රමාණානුකූලව සිදු කළ යුතුය.

i ශ්‍රී ලංකා සංචාරක අලෙවි කාර්යාංශය සඳහා 80%

ii සංචාරක කටයුතු පිළිබඳ ජාතික ආයතනය සඳහා 15%

iii මණ්ඩලය සඳහා 5%

ඉහත සඳහන් කරුණුවලට අමතරව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ දැනටමත් විධිවිධාන සලසා ඇති පහත සඳහන් නියාමන කාර්යයන් සඳහා ද විධිවිධාන සලසන ලදී.

7. අනිවාර්යයෙන් ඉඩම් අත්පත්කර ගැනීම, වෙරළ සහ නානායම් මණ්ඩලය වෙත පැවරීම සහ ඉඩම් අන්සතු කිරීම.

8. මහාමාර්ග හා දැකුම්කලු රමණීය ස්ථාන සහ පරිසරය සුරැකීම.

9. සංචාරක සේවා සම්බන්ධයෙන් වූ මිල, ගාස්තු, රේට් ප්‍රමාණයන් සහ අයකිරීම් විධිමත් කිරීම හා සංචාරක ව්‍යවසායන් ලියාපදිංචි කිරීම.

ඉහත සඳහන් යෝජනා ඉදිරිපත් කර ඇත්තේ කෙටුම්පත් ස්වරූපයෙන් පමණි. ඇත්ත වශයෙන්ම මෙම කෙටුම්පතේ අඩුපාඩු සහ නෛතික වශයෙන් අඩුපාඩු කීපයක් තිබෙන අතර කෙටුම්පත සම්බන්ධයෙන් අවසාන වශයෙන් කටයුතු කලේ නම්, මෙම අඩුපාඩු නිවැරදිකර ගැනීමට හැකිව තිබුණි. මෙම යෝජනා සම්බන්ධයෙන් අවසානයේ කුමක් සිදුවූයේද යන්න පැහැදිලි නොවේ.

2002 වර්ෂයේ මුල් භාගයේදී රජය වෙනස්වූ පසුව පෞද්ගලික අංශයේ උපදේශකයකු වන හැරි සෙල්වනාදන් මහතාගේ ප්‍රධානත්වයෙන් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් පත් කරන ලද කමිටුවක් මගින් මෙම යෝජනා සමාලෝචනය කර බලන ලද බව පෙනී යයි. සංචාරක මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළ රෙන්ටන් ද අල්විස් මහතාගෙන් පසු පත්වූ පැඩී විතාරණ

මහතා සිටි කාලයේදී මෙය සිදුවිය. විනාරණ මහතා සිටි කාලයේදී සකස් කරන ලද පනත් කෙටුම්පතට යොදා තිබුණේ, පහත දැක්වෙන මාතෘකාවය.

> ශ්‍රී ලංකා සංචාරක සභාව පිහිටුවීම සඳහා ද සංචාරක කටයුතු කර්මාන්තය සහ වෙනත් ආශ්‍රිත කර්මාන්ත සම්බන්ධයෙන් සහ වෙනත් ආශ්‍රිත කර්මාන්ත සම්බන්ධයෙන් අදාල ප්‍රතිපත්තිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම උදෙසා පහසුකම් සැලසීම පිණිස අවශ්‍ය වන පරිදි බලතල එම සභාව වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද ප්‍රාදේශීය සංචාරක කමිටු පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද කර්මාන්තය විධිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාද 1966 අංක 10 දරණ සංචාරක මණ්ඩල නීතිය ඉවත් කිරීම හා 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ ඇතැම් විධිවිධාන ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.

රෙන්ටන් ද අල්විස් මහතා සිටි කාලයේ කලින් සකස් කළ කෙටුම්පත වැඩිදියුණු කිරීම සඳහා දරන ලද පරිශ්‍රමයක් ලෙස මෙම පනත් කෙටුම්පත සකස් කර ඇති බව පෙනී යයි.

1. සංචාරක සංවර්ධන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රධාන ආයතනයක් පිහිටුවීම සඳහා මෙම පනත් දෙකේම විධිවිධාන සලසා ඇත.

2. දෙවන කෙටුම්පතේ මණ්ඩලයේ සංයුතිය පළමුවන කෙටුම්පතේ දැක්වෙන සංයුතියට වඩා ඉතා වෙනස් වේ. අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සියලුම සාමාජිකයන් පත් කරනු ලබන අතර එය පහත සඳහන් අයගෙන් සමන්විත වේ.

   (අ) මණ්ඩලයේ සභාපති
   (ආ) මණ්ඩලයේ කළමනාකරණ අධ්‍යක්ෂ
   (ඇ) ප්‍රාදේශීය සංචාරක කමිටුවල සභාපතිවරුන්.
   (ඈ) හෝටල් සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු.

(ඉ) චාරිකා හා සංචාරක සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු

(ඊ) චාරිකා සහ සංචාරක කර්මාන්තය පිළිබඳව පිළිගැනීමක් ලබා ඇති තැනැත්තන් අතුරෙන් සාමාජිකයන් තිදෙනෙකු.

3. පළමුවැනි කෙටුම්පතේ දැක්වෙන ප්‍රාදේශීය සංචාරක මණ්ඩල, ප්‍රාදේශීය සංචාරක කමිටු යනුවෙන් වෙනස් කර ඇති අතර පෞද්ගලික අංශයේ සංචාරක ව්‍යවසායකයන් දෙදෙනෙකු වශයෙන් එකී සංයුතියද වෙනස් කර ඇත.

4. පළමුවැනි කෙටුම්පතේ සඳහන් සංචාරක උපදේශක කමිටුව, සංචාරක කටයුතු පිළිබඳ ජාත්‍යන්තර උපදේශක කමිටුව වශයෙන් වෙනස් කර ඇත.

5. දෙවැනි කෙටුම්පතේ සංචාරක සංවර්ධන ප්‍රදේශ සම්බන්ධයෙන් අලුත් වගන්තියක් මගින් විධිවිධාන සලසා ඇත. 1968 අංක 14 දරන සංශෝධිත සංචාරක සංවර්ධන පනතේ ඒ හා සමාන විධිවිධානයක් දැනටමත් දැක්වේ.

6. පළමුවන කෙටුම්පතේ ව්‍යවස්ථාපිත ආයතනයක් වනශයෙන් පිහිටුවිය යුතුව තිබූ සංචාරක කටයුතු පිළිබඳ ජාතික ආයතනය "සංචාරක කටයුතු හා චාරිකා පිළිබඳ ජාතික ආයතනය" වශයෙන් නම වෙනස් කිරීමෙන් සමාගම් පනත යටතේ වගකීමට බැඳී ඇති සමාගමක් බවට පත්කර ඇත.

7. පළමුවන කෙටුම්පතේ මණ්ඩලයේ නියෝජිතයකු වශයෙන් පිහිටුවීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය දෙවැනි කෙටුම්පතේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන හා අලෙවිකරණ නියෝජිත ආයතනය වශයෙන් වෙනස්කර ඇත.

8. 2003 අංක 25 දරන මුදල් පනතින් පසුව මෙම කෙටුම්පත සකස්කර ඇති බැවින් "සංචාරක සංවර්ධන අරමුදල" යනුවෙන්

හඳුන්වනු ලබන පනත යටතේ පිහිටුවනු ලබන අරමුදලකට බදු දෙක මගින් ලැබෙන සියලුම මුදල් බැරවන අතර, අරමුදලේ තිබෙන මුදල් පහත සඳහන් ලෙස බෙදාදෙනු ලැබේ.

i ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන නියෝජිත ආයතනය සඳහා 80%

ii චාරිකා හා සංචාරක කටයුතු පිලිබඳ ජාතික ආයතනය සඳහා 15%

iii සංවර්ධන කාර්යයන් සඳහා මණ්ඩලය සඳහා 5%

9. පලමු පනතේ මෙන් නොව, සංචාරක සංවර්ධන අරමුදලේ ගිණුම් විගණනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

10. නියාමන කටයුතු සම්බන්ධයෙන් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතෙන් උපුටා ගෙන ඇති විධිවිධාන v වැනි කොටසින් viii පරිච්ඡේදයේ සඳහන් කර ඇත.

## 4.5 නිගමන.

අලෙවිකරණ කාර්යාංශයේ සහ ආයතනයේ කටයුතු පාලනය කිරීම සඳහා ප්‍රධාන ආයතනයක් වශයෙන් සලකනු ලැබූ සංචාරක සංවර්ධන මණ්ඩලය පිහිටුවීම පිණිස සකස් කල පනත් කෙටුම්පත් දෙකේම සලසා ඇති විධිවිධානවලින් කොටස් ලබාගෙන නව සංචාරක නීතිය (2003 අංක 38 දරන සංචාරක කටයුතු පනත) සකස්කර ඇති බව ඉහත සඳහන් කල කරුණුවලින් පැහැදිලිවේ.

නව සංචාරක නීතියේ ප්‍රධාන ආයතනයක් සඳහා විධිවිධාන නොමැත. සංචාරක මණ්ඩලය අවලංගුකර දැමීමක් වන සංචාරක සංවර්ධන අධිකාරිය හා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය පිහිටුවීමෙන් ද සංචාරක මණ්ඩලය දෙකඩකර සංචාරක හා හෝටල් කලමනාකරණ ආයතනය පිහිටුවීමෙන්ද සමාගම් නීතිය යටතේ දැන් වගකීමට බැඳී සිටින සමාගමක් වන සම්මේලන කාර්යාංශය ස්වාධීන ව්‍යවස්ථාපිත කාර්යාංශයක් බවට පත් කිරීමෙන්ද ස්වාධීන සංවිධාන හතරක් පිහිටුවීම නව සංචාරක නීතිය මගින් අපේක්ෂා කෙරේ.

අදාළ කොටස්කරුවන් සමඟ වසර පහකට ආසන්න කාලයක් සාකච්ඡා පවත්වා අදහස් විමසීමෙන් පසුව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්ත කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමට එකට ගැලපෙන යෝජනාවක් ඉදිරිපත් කිරීමට නොහැකිවීම අවාසනාවකි.

## 5 වැනි පරිච්ඡේදය
## 2003 අංක 5 දරන මුදල් පනත
## විචාරාත්මක සමාලෝචනයකි. (නි.වි. 2)

### 5.1 හැඳින්වීම.

මෙම පරිච්ජේදය යටතේ සඳහන්වන කරුණු යොමුවී ඇත්තේ, ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා ප්‍රශස්ත ප්‍රතිලාභ ලබාගැනීම පිණිස 2003 අංක 25 දරණ මුදල් පනත යටතේ පිහිටුවා ඇති විධිවිධාන සලසා ඇති රජයේ අරමුදල් කළමනාකරනය කිරීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් නිර්ණේය විෂයය 3 යටතේ කරුණු විමසා බැලීම සඳහාය. 2003 අංක 25 දරණ මුදල් පනත මගින් පිහිටුවා ඇති රජයේ අරමුදල් යෙදවීම සහ කළමනාකරණය සඳහා සුදුසු ආයතනික කටයුතු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීමකින් තොරවය. සංචාරක කටයුතු සංවර්ධනය වෙනුවෙන් පසුව අමතර අයවැය ලේඛන මගින් මුදල් සැපයීම කළමනාකරනය සඳහා 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනතේ සලසා ඇති විධිවිධාන පිළිබඳවත් නිශ්චිත කටයුතු සඳහා බදු මුදල් වෙන් කිරීමෙන් ඇතිවිය හැකි රජයේ වියදම් කළමනාකරණ ගැටලු පිළිබඳවත් පරීක්ෂාකර බැලීම මෙම පරිච්ජේදයේ අවධානයට යොමුවී ඇත. 2003 අංක 25 දරණ මුදල් පනත යටතේ ඇති කරනු ලබන අරමුදල් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් රජයේ වියදම් කළමනාකරණ ප්‍රවේශයක් යෝජනා කිරීම සඳහා මෙම පරිච්ජේදයේ කරුණු සඳහන් වනු ඇත.

### 5.2 2003 අංක 25 දරණ මුදල් පනත සහ බදු මුදල් නියම කිරීම.

2003 අංක 35 දරන මුදල් පනත යටතෙ බදු දෙවර්ගයක් පැනවීම සඳහා පහත සඳහන් පරිදි විධිවිධාන සලසන ලදි.

(අ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයකින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම්

ප්‍රමාණයක අපගමන බද්දක් ගුවනින් නැතහොත් නැවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැර යන සෑම මගියෙකුගෙන්. එම ගුවන් යානය නැතහොත් නැව සේවයේ යෙදවීම ක්‍රියාත්මවක කරනු ලබන තැනැත්තා විසින් අය කළ යුතුය. එම සේවය ක්‍රියාත්මක කරනු ලබන තැනැත්තා විසින් අය කරනු ලබන එකී මුදල නිසි බලධාරියා වෙත ගෙවිය යුතුය. අපගමන බද්දේ කාර්යයන් සඳහා ගුවන් යානයේ නැග ශ්‍රී ලංකාවෙන් බැහැර යන පුද්ගලයන් සම්බන්ධයෙන් නිසි බලධාරියා සිවිල් ගුවන් සේවයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන අතර නැවේ නැග ශ්‍රී ලංකාවෙන් බැහැරයන පුද්ගලයන් සඳහා නිසි බලධාරියා වන්නේ වෙළඳ නැව් අධ්‍යක්ෂ වරයාය.

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් වරින් වර නිකුත් කරනු ලබන උපදෙස් අනුව මෙම බද්ද මගින් අය කරනු ලබන මුදල් ගෙවනු ලැබේ. දැනට සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එසේ අය කරනු ලබන මුදල් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ උපදෙස් පරිදි පහත සඳහන් ලෙස ප්‍රේෂණය කරනු ලැබේ.

i තුනෙන් එකක් සීමාසහිත ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා ආයතනය සඳහා.

ii තුනෙන් එකක් ලංකා සංචාරක මණ්ඩලය සඳහා.

iii තුනෙන් එකක් ඒකාබද්ධ අරමුදල සඳහා.

(ආ) 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍ර ලබා ඇති සෑම ආයතනයක් කවර හෝ වර්ෂයක පිරිවැටුම මත සංචාරක සංවර්ධන බද්ද සියයට එකක් බැගින් අය කළ යුතුය. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ උපදෙස් ඇතුව අදාල අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයකින් බද්ද ගෙවනු ලබන අතර 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ලඩයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එම බද්ද අය කරගත යුතුය.

බදු මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු අදාළ බලධාරීන් විසින් 2003 අංක 25 දරන මුදල් පනත යටතේ සඳහන් කර ඇති පරිදි භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත වාරිකා සැපයිය යුතුය. අය කරනු ලබන මුදල් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් වෙනත් විධිවිධාන කිසිවක් සලසා නොමැත.

මෙසේ රජයේ බදු අය කිරීම වශයෙන් අය කරනු ලබන මුදල් 1968 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලය විසින් නිශ්චිත වශයෙන් ප්‍රයෝජනයට ගැනීම පිණිස වෙන් කිරීම සඳහා 2003 අංක 25 දරන මුදල් පනත මගින් විධිවිධාන සලසා ඇත. සංචාරක සංවර්ධන බද්ද සංචාරක කටයුතු සඳහා බලපත්‍ර ලබා ඇති ආයතනවල පිරිවැටුම මත අය කරනු ලබන බද්ද වන එය පාරිභෝජනය හා සම්බන්ධ නිශ්චිත බද්දකි. අපගමන බද්ද සාමාන්‍ය ස්වභාවයේ බද්දක්වන අතර බද්ද සහ එහි ප්‍රතිලාභ අතර ඇත්තේ වඩා වක්‍ර සම්බන්ධතාවයකි. මෙම මුදල් ඒකාබද්ධ අරමුදලේ කොටස් නොවේ. එබැවින් මෙම මුදල් අයවැය ලේඛනයේ ක්‍රියාවලියෙන් බැහැරව පවතින්නකි.

2003 සැප්තැම්බර් මාසයේ සිට 2003 අංක 25 දරන මුදල් පනත ක්‍රියාත්මක කරන ලදී. 2003 සිට 2005 දක්වා කාල පරිච්ඡේදය තුළ ලංකා සංචාරක මණ්ඩලයට බදු දෙවර්ගයෙන් පහත සඳහන් මුදල් ලැබී ඇත.

5.1 වගුව - (2003 - 2005) ප්‍රභවයන් තුළින්
ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලැබීම්.
(රුපියල් මිලියන)

| ප්‍රභවයන් | 2003 | 2004 | 2005 |
|---|---|---|---|
| සංචාරක අපගමන බද්ද | - | 780.4 | 674.2 |
| සංචාරක සංවර්ධන බද්ද | 0.1 | 300.6 | 172.2 |
| උප එකතුව | 0.1 | 1,081.0 | 846.7 |
| රජයේ ආධාර මුදල | 204.0 | - | - |
| මණ්ඩලයටම අයත් ප්‍රභවයන් වලින් ලැබූ මුදල් | 21.8 | 30.9 | 39.0 |
| මුළු එකතුව | 225.9 | 1,119.9 | 885.7 |

මූලාශ්‍රය :- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය.

2004 වර්ෂයේ සහ 2005 වර්ෂයේ බදු දෙවර්ගයෙන් ලැබුණු දායක මුදල් ප්‍රමාණය ලංකා සංචාරක මණ්ඩලය මගින් උපයාගත් සම්පූර්ණ අරමුදල් ප්‍රමාණයෙන් පිළිවෙලින් 96.5 ක් සහ 95.6 විය. මෙම බදු දෙවර්ගය හඳුනා දීමෙන් අනතුරුව භාණ්ඩාගාරය විසින් සංචාරක මණ්ඩලය වෙත වාර්ෂිකව ලබාදෙන ආධාර මුදල නවතා දමා ඇත. 2003 වර්ෂයේදී එනම්, සංචාරක මණ්ඩලයට භාණ්ඩාගාරයෙන් ආධාර මුදල් ලබාදුන් වර්ෂයේදී මණ්ඩලය වෙත ලැබුණු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 2004 කි.

## 5.3 සංචාරක සංවර්ධන අරමුදල සහ අමතර අයවැය මුදල් සැපයීම.

පනත යටතේ පිහිටුවනු ලබන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පාලනය හා කළමනාකරනය කරනු ලබන සංචාරක සංවර්ධන අරමුදලක් පිහිටුවීම සඳහා ද සංචාරක කටයුතු සංවර්ධනය කර ප්‍රවර්ධනය කිරීම සඳහා මුදල් යොදාගත යුතු ආකාරය සඳහා ද 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනත මගින් විධිවිධාන සලසා ඇත.

සංචාරක සංවර්ධන අරමුදලට පහත සඳහන් පරිදි මුදල් ලැබේ.

(අ) 2003 අංක 25 දරන මුදල් පනතේ 2 වගන්තිය අනුව අපගමන බද්ද වශයෙන් තිකුත් කරනු ලබන මුදල් ප්‍රමාණයෙන් තුනෙන් එකක මුදල් ප්‍රමාණයක්.

(ආ) 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනත යටතේ හෝ එම පනත මගින් අරමුදලට ගෙවිය යුතු එවැනි සියලුම මුදල්. ඉහත සඳහන් අරමුදලට ගෙවිය යුතු 2005 අංක 25 දරන මුදල් පනතේ 12 වැනි වගන්තිය අනුව සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අය කළයුතු, පැනවිය යුතු සහ එකතු කළ යුතු සංචාරක සංවර්ධන බද්දක් සඳහා 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත මගින් විධිවිධාන සලසා ඇත.

සංචාරක සංවර්ධන අරමුදලට එසේ ගෙවනු ලබන මුදල් පහත දැක්වෙන ආකාරයට වැය කළ යුතුය.

(අ) සංචාරක කටයුතු සංවර්ධනය කිරීම හෝ ප්‍රවර්ධනය සඳහා ලස නියෝග අනුව එම කටයුතු සංවර්ධනය හෝ ප්‍රවර්ධනයට යම් සංවිධානයක් හෝ තැනැත්තෙකු විසින් දරන ලද කවර හෝ වියදම් ගෙවීම.

(ආ) සංවර්ධන අරමුදලින් ගෙවීමට නියමකර ඇති පරිදි ගෙවීම.

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 24 (8) වගන්තිය ප්‍රකාරව අරමුදලේ බැරට ඇති සියලු මුදල් පහත දැක්වෙන ආකාරයට පනත යටතේ පිහිටුවා ඇති අදාළ නියෝජිත ආයතන වෙත ගෙවිය යුතුය.

(අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශයට සියයට හැත්තෑවක (70%) ප්‍රමාණයක් ගෙවිය යුතුය.

(ආ) ශ්‍රී ලංකා සංචාරක ආයතනයට සියයට දොළහක ප්‍රමාණයක් (12% ) ගෙවිය යුතුය.

(ඇ) සංචාරක අධිකාරියට සියයට දාහතරක (14%) ප්‍රමාණයක් ගෙවිය යුතුය.

(ඇ) ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට සියයට හතරක ප්‍රමාණයක් (4%) ගෙවිය යුතුය.

නියමිත බදු අය කිරීමෙන් මුදල් සපයනු ලබන පාර්ලිමේන්තුව මගින් මුදල් වෙන් කරන ක්‍රියාවලියට (එනම් අයවැය ලේඛනය) පරිබාහිරව සංචාරක සංවර්ධන අරමුදල පිහිටුවා ඇත. එය අතිවිශාල ආයතනික පද්ධතියක අත්‍යවශ්‍ය අංගයක් ලෙස පිහිටුවා ඇති අතර, සංචාරක කර්මාන්තය නියාමනය සහ විධිමත් කිරීම මෙන්ම, සංචාරක කර්මාන්තය සහ අනෙකුත් ආශ්‍රිත කර්මාන්ත සම්බන්ධයෙන් අදාළ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා මුදල් සපයන යාන්ත්‍රණය වශයෙන් ද එය නිර්මාණය වී ඇත. මේ සඳහා සංචාරක සංවර්ධන අධිකාරියකින් සහ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයකින්, සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයකින් සහ සම්මේලන කාර්යාංශයකින් යන ත්‍රිශ්විත සේවා නියෝජිත ආයතන තුනකින් සමන්විත ආයතනික ව්‍යූහයක් පිහිටුවීම සඳහා

2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනතින් විධිවිධාන සලසා ඇත. සංචාරක සංවර්ධන අරමුදලින් මෙම ආයතනික ව්‍යුහය සඳහා මුදල් සැපයීමේ යාන්ත්‍රණය නිර්මාණයවී ඇත. පාර්ලිමේන්තුවේ මුදල් වෙන් කිරීමේ ක්‍රියාවලියට පරිබාහිරව මෙම නියෝජිත ආයතනවල වැඩසටහන් මෙහෙයුම් සඳහා මෙම අරමුදල මගින් මුදල් සපයනු ලැබේ.

එසේ පිහිටුවා මුදල් සපයන ලද එක් එක් නියෝජිත ආයතන සංස්ථාපිත ආයතන වුවද යෝජිත ආයතනික ක්‍රමයේ රජයේ මුදල් කළමනාකරණය සම්බන්ධයෙන් අදාළවන මූලික ගැටලු පවතී. එක් අතකින් ඇත්තේ වගකීම පිළිබඳ ගැටලුවය. අධිකාරිය සඳහා එයටම අයත් අරමුදලක් තිබෙන අතර එහි ගිණුම් විගණනය කිරීමට ද යටත්වන නමුදු අනෙකුත් නියෝජිත ආයතන තුන සම්බන්ධයෙන් එවැනි පැහැදිලි විධිවිධාන සලසා නොමැති බව මෙහිලා සඳහන් කිරීම මේ සම්බන්ධයෙන් අදාළවන කරුණකි. කෙසේ වුවද, වගකීම පිළිබඳ ගැටලුව මෙම නියෝජිත ආයතන තුනේ ගිණුම් විගණනය කිරීම පමණක් නොවේ. මෙය නියෝජිත ආයතනවල නිලධාරින් මුදල් පරිහරණය කිරීම පිළිබඳව ද සැකයක් මතුවේ. රාජ්‍ය නියෝජිත ආයතනයක් එහි කටයුතු පිළිබඳව කාට කෙසේ වගකිව යුතුවිය යුතුද යන ගැටලුව පවතී.

අරමුදලින් මුදල් වියදම් කරනු ලබන කාර්යය නිර්වචනය කර ඇත්තේද "ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සහ අලෙවිකරණය සම්බන්ධයෙන් ගෙවීම් කිරීම" යනුවෙනි. නියෝජිත ආයතන මට්ටමින් සම්පත් වෙන් කිරීමට වගබලා ගැනීමට මුදල් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව සඳහන් කිරීම ප්‍රමාණවත් ද යන්න සාකච්ඡාවට බඳුන් කළ යුතු කරුණකි. නියෝජිත ආයතන අදාළ පරමාර්ථ ප්‍රකාශ මගින් මෙහෙයවනු ලැබීම යුක්ති සහගත වේ. එහෙත් විධිමත් පරමාර්ථ ප්‍රකාශවලින් නියෝජිත ආයතනයක් විසින් ඇත්ත වශයෙන්ම සිදු කරන්නේ කුමක්ද යන්න අවශ්‍යයෙන්ම නොදැක්වේ.

ඇත්ත වශයෙන්ම නියෝජිත ආයතන තුන සඳහා මුදල් ලබාදෙනු ලබන කාර්යය නිශ්චිතව සඳහන් වන්නේ ප්‍රවර්ධන කාර්යාංශය සම්බන්ධයෙන් පමණි. "එයට පැවරී ඇති බලතල, කටයුතු සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා" යනුවෙන් සඳහන්ව ඇත. වෙන් කරනු ලබන මුදල් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම කාර්යාංශයේ වගකීමය. මෙය පුළුල් ලෙස සාකච්ඡා කළ යුතු කරුණකි. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ කාර්ය භාරය පිළිබඳවද පැහැදිලි නැත.

කාර්යාංශය සම්බන්ධයෙන් බලන කල සංචාරක කර්මාන්තයේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් අදාල බලතල කටයුතු සහ කාර්යයන් පවරාදෙනු ලබයි. කෙසේ වුවද, නියෝජිත ආයතන සම්බන්ධයෙන් සලකා බලන විට ප්‍රධාන නියෝජිත ආයතනයක් විසින් අත්‍යවශ්‍යයෙන් ඉටු කලයුතු කාර්යයන් පිළිබඳ පැහැදිලි නැත. රජයේ මුදල් ප්‍රයෝජනයට ගන්නා රජයේ නියෝජිත ආයතන වශයෙන් එම ආයතන අමාත්‍යාංශය මගින් පාර්ලිමේන්තුව මූලික වශයෙන් වගකීමකට බැඳී සිටී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව සංචාරක සංවර්ධන අරමුදලේ ගිණුම් විගණනය කිරීම සඳහා විධිවිධාන සලසා තිබෙන අතර, කිසියම් නියෝජිත ආයතනයක් විසින් මහජන සුභසිද්ධිය සඳහා කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් ප්‍රතිකර්ම යෙදීමේ ක්‍රියා මාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් ආරක්ෂාව සලසන විධිවිධාන නොදැක්වේ. ශ්‍රී ලංකාව තුල සංචාරක කටයුතු සංවර්ධනය කිරීම සඳහා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිව් අවුරුදු සැලැස්මක් සකස් කර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කල යුතු අතර එම සැලැස්ම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය. බදු වශයෙන් එකතු කරනු ලබන මුදල් "ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් අලෙවිකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් හුදෙක් ගෙවීම් සිදු කිරීම සඳහා වියදම් කල යුතු බවට විධිවිධාන සලස්වා ඇත.

ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් අලෙවිකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් නියෝජිත ආයතනයක් මෙහෙයුම් කටයුතු සඳහා ඇත්ත වශයෙන්ම එවැනි සැලැස්මකින් පාදක ව්‍යුහයක් ඇති කිරීම සඳහා සහතිකවීමක් නොමැත. මෙම පරිච්ඡේදයේ නිර්ණේය විෂයයට අයත්ව ඇත්තේ, "ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා ප්‍රශස්ත ප්‍රතිලාභ ලබාගැනීම" පිළිබඳව පරීක්ෂාකර බැලීම බව මෙහිලා සඳහන් කලයුතු කරුණකි. නිර්ණේය විෂයයේ සැලකිල්ලට යොමු කල යුතු කරුණ සම්පත් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව වන බැවින් නියෝජිත ආයතනය සඳහා පදනම්වී ඇති පටු වැඩසටහන නොව, සම්පත් මුළුල් වශයෙන් ප්‍රයෝජනයට ගතයුතු ආකාරය පිළිබඳව විමසා බැලිය යුතුය.

සංචාරක සංවර්ධන අරමුදලින් ගෙවනු ලබන මුදල් යොදා ගතයුතු අවශ්‍යතාවන් සම්බන්ධයෙන් පවතින විධිවිධාන සහ එම අවශ්‍යතාවන් සඳහා අදාළ

නියෝජිත ආයතන විසින් ඇත්ත වශයෙන් මුදල් යොදවන බවට ඇති වගකීම පිළිබඳව වගබලා ගැනීම සඳහා ඇති නෛතික විධිවිධාන අතර මූලික වශයෙන් සම්බන්ධතාවයක් නොමැත. ඇත්ත වශයෙන්ම 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ දීර්ඝ නාමයෙහි අරමුණ වශයෙන් සඳහන්වී ඇත්තේ, සංචාරක කර්මාන්තයට අදාළ ප්‍රතිපත්තිය සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය යම් බලතල අධිකාරිය වෙත පැවරීමය. කෙසේ වුවද, නියෝජිත ආයතනවල වගකීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස නෛතික අභිප්‍රාය ඉටුනොවී ඇති බව පෙනී යයි.

නියෝජිත ආයතන ක්‍රියා කළයුතු ආයතනික පාදක ව්‍යුහය නිර්මාණය වන මනා ලෙස ඇතිවූ ප්‍රධාන නියෝජිත ආයතන සම්බන්ධතාවය තුළින් මැනවින් නිර්වචනය කරනු ලැබූ පාදක ව්‍යුහයක් සලසා ගැනීම මේ සඳහා අවශ්‍ය වේ. නියෝජිත ආයතන වැයවීම් ලබා ගන්නා අධිකාරියට එම ආයතන වගකිව යුතු නොවේ. අරමුදලින් වැය පියවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ කාර්යභාරයක් නොමැත. විධිවිධාන සලසා ඇති පරිදි අරමුදලින් ගෙවනු ලබන රජයේ මුදල් නියෝජිත ආයතනවලට අඛණ්ඩව ලැබෙමින් පවතී. ඇත්ත වශයෙන්ම අරමුදලේ බැරට ඇති සියලුම මුදල් නිශ්චිතව දක්වා ඇති නියමිත මුදල් ප්‍රමාණයන් අනුව වියදම් කළ යුතුය. අරමුදල කළමනාකරණය කිරීම සඳහා යොදා ඇති ආයතනික කටයුතුවලින් ව්‍යවස්ථා සම්බාදනය සම්බන්ධයෙන් ඇති සමස්ත අරමුණ මැනවින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

## 5.4 සංචාරක කටයුතු ප්‍රවර්ධනය හා සංවර්ධනය සම්බන්ධයෙන් රාජ්‍ය වැය කළමනාකරනය පාලනය කිරීම.

සංචාරක සංවර්ධන අරමුදල සම්බන්ධයෙන් ඇති මූලික ගැටලුව වන්නේ නියමිත බදු අය කිරීම මගින් මුදල් සපයනු ලබන අමතර අයවැය ලේඛනයේ ස්වභාවය පිළිබඳවය. අමතර අයවැය ලේඛන අරමුදල් සහ මුදල් සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය වැය කළමාකරණ ගැටලු රාශියක් පැන නැගිය හැකිය.

(අ) රජයේ ආදායම් වෙන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රජයේ අරමුදල් අයවැය පිරික්සුම සහ වෙන් කිරීම් ක්‍රියාවලියෙන් පරිබාහිරව යෙදවීමට ඉඩකඩ සැලසෙන අතර, ඒ සම්බන්ධයෙන් ගනු ලබන තීරණ විධායකය විසින් ගනු ලබයි.

(ආ) ආදායම් වෙන් කිරීම නිසා වැඩසටහන්වලට ප්‍රමුඛතාවය දැක්වීම කෙරෙහි බලපෑම් ඇති කරමින් සම්පත් වෙන් කිරීමේ නම්‍යතාවය අඩුවේ. අරමුදල් තිබෙන නිසා ඇතැම් ක්ෂේත්‍රවල අධික වියදම් කිරීම පිණිස සම්පත් සාවද්‍ය ලෙස වෙන් කිරීම සඳහා මෙය හේතු විය හැකිය.

(ඇ) ආදායම් වෙන් කිරීමෙන් වියදම් වැඩසටහන සමස්තයක් වශයෙන් පරීක්ෂාකර බැලීමට ඉඩ නොලැබෙන බැවින්, විවිධ වියදම් අතර අවශ්‍ය හුවමාරු කර ගැනීමද එමගින් වැලකී යයි. රජයේ වැය පිළිබඳව ඇති මිණුම් දඬුවලට එකී වියදම් පිළිබඳ තීරණ ගැනීම යටත් නොවීමට ඉඩකඩ පවතින අතර වාසි සලසනු ලබන වැඩ සටහන්වලට මුදල් ලබාගැනීමට බලපෑම් කරන කණ්ඩායම්වලට හැකියාව ඇතිවනු ඇත.

කෙසේ වුවද, ආදායම් වෙනස් කිරීම සම්බන්ධයෙන් උදාහරණ දක්වා ඇත. සෙස් බදු අරමුදල්වලින් නිශ්චිත මෙහෙයුම් කටයුතු සඳහා මුදල් සපයනු ලබයි. ආදායම් වෙන් කිරීම අපේක්ෂිත සේවාවක් වෙනුවෙන් මුදල් ගෙවීමට බදු ගෙවන්නන්ගේ කැමැත්ත මත රඳා පවතී. අපගමන බද්ද සංචාරක සංවර්ධන බද්ද තරමටම මෙම මිණුම් දණ්ඩට යටත්වන බැවින්, මෙම පරිච්ඡේදයේ ඒ පිළිබඳව සාකච්ඡා කිරීම අදාල නොවේ. විශේෂ අයවැය පිළිවෙත් සහ කාර්ය පරිපාටි සංචාරක අංශයට අවශ්‍යවන බවට තර්ක ඉදිරිපත් කිරීම දුෂ්කර කරුණකි. 2003 අංක 25 දරන මුදල් පනත මගින් විධිවිධාන සලසා ඇති පරිදි මුදල් වෙන් කිරීම පිළිබඳව ඇති ගැටලුව පවතින්නේ ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා සංචාරක කර්මාන්තයේ සහයෝගය ලබන වැඩසටහනන් පවත්වාගෙන යාම පිණිස ප්‍රමාණවත් තරම් මුදල් ලබාගැනීමට හැකිවේද යන කරුණ පිළිබඳවය. එය සංචාරක සංවර්ධන අරමුදලින් ගෙවනු ලබන මුදල් මහා රාජ්‍ය වැය කළමනාකරණ පිළිවෙත්වලට අනුකූලව තිබිය යුතුවන්නේ කුමක් නිසාද යන්නට දැක්විය හැකි කරුණු සියල්ලටම වඩා දැක්විය හැකි හේතුවකි. කෙසේ වුවත් මහා රජයේ අයවැය කළමනාකරණය පවත්වා ගැනීමට වගබලා ගත යුතුය.

ආදායම් වෙන් කිරීම සහ රාජ්‍ය වියදම් සඳහා අමතර අයවැය ලේඛන මුදල් සැපයීම පිළිබඳව ඇති මූලික ගැටලුව වන්නේ එම සම්පත් වෙන් කිරීම සහ ප්‍රයෝජනයට ගැනීම වැරදි ලෙස නිරූපය කළ හැකිවීමය. එකතු කරනු ලබන ආදායම ප්‍රතිචාර ඇතිවන ලෙස, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස වෙන්කර

ප්‍රයෝජනයට ගත යුතුය. රජය සම්පත් ප්‍රයෝජනයට ගැනීම කළමනාකරණය සඳහා යොදාගනු ලබන ආයතනික කටයුතු වලින් මූල්‍ය පාලනය (වියදම් පාලනය) පවත්වා ගැනීමටත්, ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්ට අනුකූලවන පරිදි සම්පත් වෙන් කිරීමට වෙන්ම, මනා මෙහෙයුම් කළමනාකරනයක් ආර්ථිකය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය පවත්වා ගැනීමටත් වගබලා ගත යුතුය. එබැවින් වෙන්කර ඇති ආදායම සහ අමතර අයවැය ලේඛනයෙන් මුදල් සැපයීම මනා රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ මෙම අනිවාර්ය කරුණුවලට අනුකූලවන බවට වගබලා ගත යුතුය.

මෙ සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ වැඩසටහන්වලට අමතර අයවැය ලේඛනයෙන් මුදල් සැපයීම සහ වෙන්කර ඇති ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් වර්තමානයේ අනුගමනය කරනු ලබන පිළිවෙත් සමාලෝචනය කර බැලීම අදාල වේ. ඉහත සඳහන් කළ පරිදි ප්‍රවර්ධන සහ සංවර්ධන වැඩසටහන් සඳහා දැනට මුදල් සපයනු ලබන සෙස් බදු අරමුදල් බොහෝ ගණනක් ඇත. තේ මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මෙම අරමුදල් සම්බන්ධයෙන් සැලකිය යුතු ආයතන වේ. භාණ්ඩාගාරයේ ලේකම් විසින් සෙස් බදු අරමුදල් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මෑතකදී නිකුත් කරන ලද චක්‍රලේඛය (පීඑෆ් 2006.04.06) පිළිබඳව සඳහන් කිරීම වැදගත්ය. ඇතැම් සෙස් බදු අරමුදල් සහ සංවර්ධන අරමුදල් භාණ්ඩාගාරය විසින් එකතුකර අදාල නියෝජිත ආයතනවලට යොමු කරන බව එහි සඳහන්ව ඇත. නියෝජිත ආයතනවනලට කෙලින්ම එම අරමුදල් යොමු කරන විට පහත සඳහන් අඩුපාඩුකම් පවතින බව එහි දැක්වේ.

(අ) ගිණුම් තැබීමේ සහ විගණන නියමයන් උල්ලංඝනය කිරීම.

(ආ) ඇතැම් වියදම් නිශ්චිත සංවර්ධන කටයුතුවලට අදාල නොවීම සහ අදාල ප්‍රඥප්තිවලට බලපෑමක් ඇතිවීම.

මෙ සම්බන්ධයෙන් 2006 දෙසැම්බර් 8 දින ගරු ජනාධිපතිතුමා අයවැය කථාවේදී රජයේ අරමුදල් කළමනාකරණය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව පිළිබඳව චක්‍රලේඛයේ සඳහන් කර ඇත.

> "එම අරමුදල් යටතේ අවසරදී ඇති නිශ්චිත සංවර්ධන කටයුතු වෙනුවෙන් එම අරමුදල් කාර්යක්ෂම ලෙස යොදවන බවට වගබලා ගැනීම සඳහාත්, ඵලදායක ලෙස අධීක්ෂණය කිරීම සඳහාත් විශේෂ කළමනාකරණ කමිටු පත් කරනු ලැබේ."

මෙම යෝජනාව අනුව වෘත්තිමය ආකාරයෙන් සෙස් බදු අරමුදල් කළමනාකරණය කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් පත් කිරීමට ඉහත සඳහන් චක්‍රලේඛනයේ යෝජනාකර ඇත.

(අ) භාණ්ඩාගාරයේ ලේකම්. සභාපති.

(ආ) අදාල රේඛීය අමාතයාංශයේ ලේකම්.

(ඇ) අදාල සංවිධානවල සභාපති.

එම චක්‍රලේඛය අනුව එම සියලුම බදු වහාම භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කල යුතුය. සංවර්ධන සහ අනෙකුත් කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් ඉහත සඳහන් කමිටුව මගින් වෙන් කරනු ලබන අතර මාසිකව අදාල ආයතන වෙත එම මුදල් මුදා හරිනු ලබයි.

තේ සෙස් බදු අරමුදලින් වියදම් පියවීමට යොදා ඇති සංවිධාන කටයුතු පිළිබඳව සංක්ෂිප්ත සමාලෝචනයක් කර බැලීම අදාළ වේ. තේ සෙස් බද්ද 1975 අංක 14 දරන තේ මණ්ඩල නීතිය යටතට පත්කර තිබෙන අතර, අපනයන ස්ථානයේදී අපනයනකරුවන් වෙතින් එම බද්ද අය කරගෙන තේ මණ්ඩලය වෙත එවිය යුතුය. වර්තමාන වැඩ පිළිවෙල වන්නේ, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් සෙස් බදු මුදල අයකරගෙන භාණ්ඩාගාරය වෙත එම මුදල් ප්‍රේෂණය කිරීමය. තේ මණ්ඩලයේ අංශ තුනක නියෝජිත ආයතන තුනක් අතරේ එනම්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය සහ කුඩා තේවතු හිමියන්ගේ අධිකාරිය අතරේ තේ සෙස් බදු අරමුදලේ ලාභ බෙදා දෙනු ලැබේ. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කරනු ලැබූ ආයතන තුනේ ප්‍රධානීන්ගෙන් සැළුමලත් තේ සෙස් බදු කමිටුවක් මගින් සෙස් බදු මුදල් බෙදා හැරීම සිදු කරනු ලබයි.

සෙස් බදු මුදල් බෙදා හැරීමේ ක්‍රියා මාර්ගය සඳහා වරින් වර කමිටු රැස්වීම් පැවැත්වීම ඇතුලත්වේ. භාණ්ඩාගාරය විසින් එවනු ලබන සෙස් බදු මුදල් එකතුකිරීම් පිළිබඳ ප්‍රකාශයක් සහ ආයතනවල සැලසුම් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශ ලබාගෙන කමිටුව රැස්වෙයි. ආයතන තුනේ සාපේක්ෂ අවශ්‍යතා අනුව සෙස් බදු මුදල බෙදා දෙනු ලැබේ. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉදිරිපත් කරනු ලබන මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව භාණ්ඩාගාරය විසින් මුදල් මුදා හරිනු ලබයි. තේ මණ්ඩලය වෙත මුදල් මුදා හරිනු ලබන්නේ භාණ්ඩාගාරය විසින්ය.

සම්පූර්ණ බදු එකතුව නොවිය හැකි භාණ්ඩාගාරය විසින් මුදා හරින සෙස් බදු මුදල් ප්‍රමාණය තේ සෙස් බදු පිළිබඳ කමිටු රැස්වීමේ එකඟවූ කොටස් අනුව ආයතන තුන අතරේ බෙදා හරිනු ලබයි.

ආදායම වෙන් කරනු ලබන නියෝජිත ආයතනයේ බැරට ඇති තැන්පතු ගිණුමක භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලබන මුදල් සාමාන්‍යයෙන් තැන්පත් කර තබනු ලබයි. එබැවින් භාණ්ඩාගාරය එම මුදල්වල භාරකරු ලෙස කටයුතු කරයි. වෙන් කර ඇති ආදායම් කළමනාකරණය සඳහා භාණ්ඩාගාරය විසින් නියමකර ඇති කාර්ය පරිපාටි විධිවිධාන ආදායම වෙන් කරන අදාළ නීතිවල දැක්වෙන විධිවිධානවලට අනුකූලව නොවන බව මෙහිලා සඳහන් කිරීම අවශ්‍යය. මෙසේ අපගමන බද්ද සම්බන්ධයෙන් 2003 අංක 25 දරණ මුදල් පනත අනුව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් වරින් වර නිකුත් කරනු ලබන උපදෙස් පරිදි එකතු කරනු ලැබූ මුදල් නිසි බලධාරියා විසින් වියදම් කළ යුතුය.

සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පවසන අන්දමට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් නිකුත් කරනු ලබන වර්තමාන උපදෙස් අනුව සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ආයතනය, ලංකා සංචාරක මණ්ඩලය සහ භාණ්ඩාගාරය (ඒකාබද්ධ අරමුදල) වෙත එක සමාන මුදල් ප්‍රමණයකින් ඔහු විසින් එකතු කරනු ලබන අපගමන බද්ද ප්‍රේෂණය කරනු ලබයි.

වෙන්කර ඇති ආදායම නිශ්චිත කාර්යයක් සඳහා වියදම් කිරීම පිණිස අදාළ නියෝජිත ආයතන වෙත කෙලින් පැවරීම සිදුකළ යුතු වන්නේ නම් සහ නිශ්චිත ප්‍රයෝජනයකට යොදා ගත යුත්තේ නම් එම මුදල් ඒකාබද්ධ අරමුදලට නොගෙවා, තැනපතු ගිණුමක තබාගැනීම අනිවාර්ය වේ. ඇත්ත වශයෙන් සෙස් බදු අරමුදල් භාණ්ඩාගාරයේ තැන්පත් කර ඇති නිසා නියෝජිත ආයතනයට එම මුදල සම්පූර්ණයෙන් ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳ අවදානමක් ඇති නොවේ.

ඉහත සඳහන් ගැටලු පිළිබඳ පාදක ව්‍යුහය තුළ සංචාරක කටයුතු ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා රාජ්‍ය වියදම් වෙනුවෙන් 2003 අංක 25 දරන මුදල් පනත මගින් වෙන්කර ඇති ආදායම් පාලනය සහ කළමනාකරනය ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා ප්‍රශස්ත ප්‍රතිලාභ ලබාගැනීම සඳහා නිර්වචනය කළ යුතුය. මෙම ආදායම්වලින් දරනු ලබන වියදම් කළමනාකරණය සඳහා ඇති ක්‍රියා මාර්ග සහ පාලනය, වගකීම පිළිබඳ අනුල්ලංඝනීය තත්වයන්, විනිවිදභාවය,

අපේක්ෂා කළ හැකි බව. සහ කොටස්කරුවන්ගේ සහභාගීත්වය යන කරුණුවලට අනුකූලව විය යුතුය. වෙන්කර ඇති ආදායම්වලින් ප්‍රශස්ත ප්‍රතිලාභ ලබාගැනීම යනු ප්‍රතිඵල ලබාගැනීමට ආදායම් යොදවනු ලබන ක්‍රියාවලිය පිළිබඳව දැන ගැනීමය.

වෙන්කර ඇති ආදායම්වලින් රාජ්‍ය අංශයේ සම්පූර්ණ සංචාරක වැඩසටහන සඳහා මුදල් සපයනු ලැබේ. මුදල් යොදවනු ලබන්නේ. කෙසේද යන්න පිළිබඳව රජයට සොයා බැලීමට හැකිවීමෙන් ද මුදල් උපයෝගී කරගැනීම සඳහා ඇති නිසි ක්‍රියා මාර්ග පැහැදිලිව කලින් දැනගෙන ඵලදායි ලෙස ක්‍රියාවේ යෙදවීමට හැකිවීමෙන්ද නියෝජිත ආයතනයේ ක්‍රියා මාර්ග පිළිබඳ යථාර්ථවාදී ලෙස සොයා බැලීම සඳහා ඉඩකඩ සලසමින් සංචාරක කොටස්කරුවන්ට අදාළ ක්‍රියාවලියට සහභාගිවිය හැකිවීමෙන්ද අදාල රජයේ සේවකයන්ගෙන් ඔවුන්ගේ ක්‍රියා මාර්ග පිළිබඳව නිදහසට කරුණු විමසීමට හැකිවීම අනිවාර්ය විය යුතුය. එවැනි ආයතනික පාදක ව්‍යුහයක් තුළ ප්‍රශස්ත ප්‍රතිලාභ ලබාගත හැකිය. සංචාරක කටයුතු ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම පිළිබඳව පැහැදිලි ලෙස අවධානයක් තිබීම අවශ්‍යවන අතර. ක්‍රියාවලිය පිළිබඳව නිසි සැලකිල්ලක් නොමැතිව ප්‍රතිඵල පිළිබඳව විශේෂ අවධානයක් තිබීමෙන් කාර්යවලිය විනාශවී අවසානයේදී අනපේක්ෂිත ප්‍රතිඵල ඇතිවිය හැකිය.

## 5.5 සංචාරක වියදම් කළමනාකරණය පිළිබඳව විශිෂ්ඨ පිළිවෙත් සඳහා පාදක ව්‍යුහය.

එක් අතකින් සංචාරක අංශය සඳහා වෙන්කළ ආදායම් වලින් ප්‍රශස්ත ප්‍රතිලාභ ලබාගැනීමට ඇති ක්‍රියා මාර්ග සංචාරක කටයුතු ප්‍රවර්ධන හා සංවර්ධන වැඩසටහන පිළිබඳ පාදක ව්‍යුහය තුළ නිර්වචන කළ යුතු අතර. අනිත් අතට එවැනි වැඩ සටහනක් සඳහා මුදල් සැපයීමේ නිසි ක්‍රියාවලියත් තිබිය යුතුය.

කලින් පෙන්වාදුන් පරිදි නිර්ණෝය විෂයය මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික පාදක ව්‍යුහය තුළ සංචාරක කටයුතු සංවර්ධනය කිරීම එනම්. ආර්ථිකය සඳහා ප්‍රශස්ත ප්‍රතිලාභ ලබා ගැනීම පිළිබගනු ලබයි. ජාතික සංවර්ධන පරමාර්ථ කෙරෙහි අවධානය යොමු කර ඒවා සැලකිල්ලට ගැනීම මෙය අර්ථනිරූපනය කිරීමෙන් අදහස් කෙරේ. මෙම අංශය පිළිබඳව ඊළඟ පරිච්ඡේදයේ සවිස්තරව පරීක්ෂාකර බලන අතර. විශේෂ අංශයක ආකාරයෙන් නොව. සියල්ල ඇතුලත්වන ආකාරයෙන්

අරමුදල් යෙදවීම කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව මෙම අවස්ථාවේදී සඳහන් කිරීම ප්‍රමාණවත් වේ. සංචාරක සංවර්ධන කටයුතු වැඩසටහනේ සම්පූර්ණ මුදල් ප්‍රමාණය ජාතික සංවර්ධන පරමාර්ථ සඳහා යොදා ගත යුතුය. අරමුදල් කළමනාකරනය සඳහා ඇති ක්‍රියා මාර්ගවලට මෙය ඇතුළත් කිරීමට වගබලා ගත යුතුය.

සංචාරක ප්‍රවර්ධන සහ සංවර්ධන වැඩසටහනක් සඳහා මුදල් සැපයීම සඳහා ඇති නිසි ක්‍රියාවලි පාලනය කිරීමේ අත්‍යවශ්‍ය කරුණු භාණ්ඩාගාරයේ සාමාන්‍ය පාලනය ඉක්මවා යයි. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ආදායම් වලින් ප්‍රශස්ථ පතිලාභ ලබාදෙන බවට හුදෙක් භාණ්ඩාගාරයේ පාලනයට වගබලා ගැනීම කළ නොහැකිය. අවශ්‍යවන්නේ වගකීම, විනිවිදභාවය, අපේක්ෂා කළ හැකි බව සහ සහභාගිත්වය වටා ගොඩනැගූ පුළුලු පාලන පාදක ව්‍යුහයක් ඇති කිරීමය.

සංචාරක කටයුතු සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා වෙන් කර ඇති ආදායම් කළමාකරණය සඳහා පහත සඳහන් පාලන පාදක ව්‍යුහය යෝජනා කරනු ලැබේ.

(අ) ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් වගකීම සඳහා ඉඩකඩ සලසමින් ද නිමැවුම් සඳහා මුදල් සැපයීමෙන්ද ප්‍රතිඵල ලබාගැනීම සඳහා පදනම වශයෙන් පුළුල් සංචාරක කටයුත ප්‍රවර්ධන හා සංවර්ධන ප්‍රතිපත්තියක් සහ වැඩසටහන් පාදක ව්‍යුහයකි. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අයවැය වර්ෂය වෙනුවෙන් සංචාරක අංශයේ වැඩසටහන වාර්ෂිකව යථාවත් කිරීමෙන් මුදල් වෙන් කිරීම් කාර්යයේදී කටයුතු පිරික්සීම සඳහා අවස්ථාව සැලසෙනු ඇත.

(ආ) අරමුදලේ පරමාර්ථ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක්.

2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනතේ 23(1) වගන්තිය අරමුදලේ පරමාර්ථ ප්‍රකාශයක් වශයෙන් ප්‍රමාණවත් නොවේ. අරමුදලින් මුදල් සපයනු ලබන මෙහෙයුම් කටයුතු ඇති නියෝජිත ආයතන සඳහා විධිවිධාන සැලසෙන අදාළ පරිච්ඡේද සමඟ සංයෝජිතව 23(1) වගන්තිය කියවිය යුතු බවට තර්ක ඉදිරිපත් කරනු ලැබිය හැකිය. කෙසේ වුවද,

මෙම කටයුතුවලින් ආදායම් යොදා ගැනීම සම්බන්ධයෙන් කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා පදනමක් ඇති නොවේ.

(ඇ) අරමුදලින් වියදම් දැරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම පිළිබඳ වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීම.

8 වැනි වගන්තියේ සඳහන් පරිදි අදාල කොටස් වෙන් කිරීම අනුව අරමුදලින් වියදම් දැරීම ඉබේ සිදු වන්නකි. විවිධ නියෝජිත ආයතන සහ විවිධ වැඩසටහන් කොටස් අතර මුදල් වෙන්කරදීම සම්බන්ධයෙන් වගකීමක් නොමැත. භාරකාර මණ්ඩලයක් හෝ අරමුදල් කළමනාකරණ කමිටුවක් හෝ අවශ්‍ය වේ. අමාත්‍යාංශයේ ලේකම්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සහ සංචාරක මණ්ඩලයේ සභාපති යන අයගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීමට යෝජනා කරනු ලැබේ. මීට අමතර වශයෙන් අරමුදල් කළමනාකරණ කමිටුවට තාක්ෂණික උපදේශක කමිටුවක් මගින් සහයෝගය ලබාදිය හැකිය.

(ඈ) අරමුදලේ ප්‍රතිලාභීන් හඳුනාගැනීම.

අරමුදල් කළමාකරණ කමිටුව විසින් සංචාරක අංශයේ නව අවශ්‍යතාවන් පිළිබඳව තීරණය කළ යුතුවන බැවින්, අරමුදලේ ප්‍රතිලාභීන් නියම කළ යුතුද (2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත පරිදි) නැතහොත් තීරණය කිරීමට විවෘතව තැබිය යුතුය ද යන්න පිළිබඳ ප්‍රශ්නය පවතී.

(ඉ) තීරණ ගැනීමේ රීති නැතහොත් මාර්ගෝපදේශ.

මෙම රීති නැතහොත් මාර්ගෝපදේශ අනුව අරමුදලට එකතුවන මුදල් වියදම් කරනු ලැබේ.

(ඊ) මුදල් ප්‍රයෝජනයට ගැනීමේදී සහ වියදම් කිරීමේදී මූල්‍ය විනය පවත්වා ගැනීමට වගබාල ගැනීම සඳහා ඇති කාර්ය පරිපාටියේ රීති.

බැංකු ගිණුම්, වාර්තා, මූල්‍ය හා තාක්ෂණික විගණන පවත්වා ගැනීම, අරමුදල් මෙහෙයුම් සමාලෝචනය කිරීම් ආදිය මෙයට ඇතුළත් වේ.

(උ) සංචාරක කර්මාන්තයේ කොටස්කරුවන් වෙත අනාවරණය කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම.

සංචාරක අංශයේ වැඩ සටහන පිළිබඳව අයවැයට පෙර සහ පසුව කොටස්කරුවන්ගෙන් අදහස් විමසීම සඳහා එක් එක් වර්ෂයේ ජූලි සහ මාර්තු මාසයවලදී අර්ධ වාර්ෂිකව සංචාරක ව්‍යාපාරයේ කොටස්කරුවන් පිළිබඳ සමාලෝචනය කිරීම.

## 6 වැනි පරිච්ඡේදය

### 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනත (නව සංචාරක නීතිය)

### විචාරාත්මක සමාලෝචනයකි. (නිර්ණේය විෂයය 3)

6.1 හැඳින්වීම.

2005 ඔක්තෝබර් 18 දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත කථානායකවරයා විසින් 2005 නොවැම්බර් 30 දින සහතික කරන ලද නමුදු ගරු අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ නියෝගයක් පළකිරීමෙන් එය ක්‍රියාත්මක කර නොතිබුණි. කෙටුම්පත් කිරීමේදී වැරදි හා නෛතික අඩුපාඩුකම් සහ අනුකූලතාවයක් (ඈ) පරිශිෂ්ටයේ පෙන්වාදී ඇති බැවින්, අත්‍යවශ්‍ය වන්නේ නම් මිස මෙහි ඒ සම්බන්ධයෙන් සඳහන් කිරීමක් කරනු නොලැබේ. සංචාරක කටයුතු පනත මගින් පිහිටුවීමට අපේක්ෂා කළ ආයතනික පාදක ව්‍යුහය අනුව එම පනතේ වැදගත් කරුණු පිළිබඳව විචාරාත්මක සමාලෝචනයක් සිදු කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණවී ඇත.

## 6.2 සංචාරක කටයුතු පනතින් ලබාගැනීමට අපේක්ෂා කරන්නේ කුමක්ද ?

පූර්විකාවේ සඳහන් කළ පරිදි (අ) සංචාරක සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සඳහාද (ආ) සංචාරක කටයුතු කර්මාන්තය හා වෙනත් ආශ්‍රිත කර්මාන්තවලට අදාළ ප්‍රතිපත්තිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය යම් බලතල එකී අධිකාරිය වෙත පැවරීම සඳහා ද (ඇ) සංචාරක කර්මාන්තය විධිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා ද (ඈ) 1966 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනත ඉවත් කිරීම සඳහා ද (ඉ) 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ ඇතැම් විධිවිධාන ඉවත් කිරීම සඳහා සහ (ඊ) ඒ හා සම්බන්ධ හෝ ඒට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද සංචාරක සංවර්ධන පනතින් අපේක්ෂා කෙරේ.

සංචාරක කටයුතු පනත ක්‍රියාත්මක කිරීමේ දිනය නියමකර ගරු අමාත්‍යවරයා විසින් ගැසට් නිවේදනයක් මගින් නියෝගයක් කිරීමෙන් පසුව සංචාරක මණ්ඩල පනත ඉවත් කිරීම සඳහා දිනයක් නියමකර ඔහු විසින් නවදුරටත් ගැසට් නිවේදනයක් මගින් නියෝගයක් කළ යුතුය.

(1) සංචාරක සංවර්ධන අධිකාරිය (2) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (3) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය සහ (4) ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය යනුවෙන් වෙනම නිත්‍යානුකූල ආයතන හතරක් පිහිටුවීම සංචාරක කටයුතු පනතින් අපේක්ෂා කරයි. සංචාරක උපදේශක කමිටුවක් පිහිටුවීමට ද අපේක්ෂා කරනු ලැබේ.

තවද 2003 අංක 25 දරන මුදල් පනත මගින් පනවා ඇති සම්පූර්ණ සංචාරක සංවර්ධන බද්දෙන් සහ අපගමන බද්දෙන් තුනෙන් එකක ප්‍රමාණයකින් සංචාරක සංවර්ධන අරමුදලක් පිහිටුවීමට සංචාරක කටයුතු පනත මගින් අපේක්ෂා කරන අතර සංචාරක කර්මාන්තයට සේවා සපයන එම පනත යටතේ පිහිටුවා ඇති නිත්‍යානුකූල ආයතන අතරේ අරමුදල බෙදිය යුතු ආකාරය නියම කිරීමට ද මෙම පනතින් අපේක්ෂා කෙරේ.

## 6.3 කළමනාකරණ මණ්ඩලවල සහ උපදේශක මණ්ඩලයේ සංයුතිය.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (2 වගන්තිය) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් තැනැත්තන් නමදෙනෙකුගෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමන්විත වේ.

(අ) මණ්ඩලයේ සභාපති

(ආ) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්

(ඇ) අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයකු

(ඈ) භාණ්ඩාගාරයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයකු

(ඉ) ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය විසින් නම් කරනුලබන සාමාජිකයකු

(ඊ) ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයකු

(උ) ශ්‍රී ලංකා චාරිකා නියෝජිත සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයකු

(ඌ) චාරිකා සහ සංචාරක ක්ෂෙත්‍රයෙහි පළපුරුද්දක් සහ දැනුමක් ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන එක් සාමාජිකයකු සහ

(එ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු.

ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබාදීම සහ සංචාරක ව්‍යවසායකයන් හා සේවාවන් පිළිබඳව කාර්යයන් අධිකාරිය වෙත පැවරී ඇත. අධිකාරියට පත් කරනු ලබන සාමාජිකයන් නමදෙනා අතුරින් ඉහත (අ) සහ (ආ) හි සඳහන් තැනැත්තන් දෙදෙනෙකු පමණක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර, අනෙකුත් සාමාජිකයන් හත්දෙනාම නිල බලයෙන් පත්වන සාමාජිකයෝ වෙති. මෙය සාමාන්‍යයෙන් සිදු නොවන කාර්යයක් වන අතර, එය අසතුටුදායක ද වන්නේය. අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් වැඩි සංඛ්‍යාවක් තබාගැනීම සඳහා අදාළ සංගම් විසින් ඉදිරිපත් කරනු ලබන නාම ලේඛනයක් අනුව අමාත්‍යවරයා විසින් (ඉ), (ඊ) සහ (උ) කාණ්ඩ යටතේ සිටින සාමාජිකයන් පත් කිරීම වඩාත් සුදුසු වේ. තවත් අසතුටුදායක ලක්ෂණයක් වන්නේ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් (හෝ ඔහුගේ නියෝජිතයා) අධිකාරියේ සේවය කිරීමය. ලේකම් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් සැපයීමේ නිලධාරියා වන විට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සියලුම කාර්යයන් එමගින් අධීක්ෂණය වේ.

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය.

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පුද්ගලයන්

දහතුන් දෙනෙකුගෙන් යුක්ත කළමනාකරණ මණ්ඩලයක් මගින් කළමනාකරණය සහ පරිපාලනය කළ යුතුය.

(අ) මණ්ඩලයේ සභාපති

(ආ) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්

(ඇ) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්

(ඈ) සංචාරක කර්මාන්තය, චාරිකා සහ හෝටල් කළමනාකරණය පුහුණු කිරීම යන ක්ෂේත්‍රවල දැනුමක් ඇති අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙකු

(ඉ) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂ

(ඊ) අදාළ සංගම්වල අදහස් විමසා අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන ආකාරයට පත් කරනු ලබන තැනැත්තන් හය දෙනෙකු

* ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයෙන් නියෝජිතයන් දෙදෙනෙකු

* ශ්‍රී ලංකා චාරිකා නියෝජිත සංගමයෙන් නම් කරනු ලබන එක් තැනැත්තෙකු

* ශ්‍රී ලංකා ආගමික චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමයෙන් නම් කරනු ලබන එක් තැනැත්තෙකු

* හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමයෙන් නාමිකයන් දෙදෙනෙකු

(උ) සංචාරක කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු.

සංචාරක කටයුතු පනතින් පිහිටුවීමට අපේක්ෂා කළ අනෙකුත් නෛතික ආයතන මෙන් නොව, රජය වෙනුවෙන් මූල්‍ය ආරක්ෂකයා වශයෙන් කටයුතු කරන මුදල් අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ නියෝජිතයකු ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට පත් කරනු ලැබීම සඳහා විධිවිධාන සලසා නොමැත. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ කළමාකරණ අධ්‍යක්ෂ කළමනාකරණ මණ්ඩලයේ

සේවය කිරීමට හේතුවන මූලික හේතුවක් නොපෙනේ. තවද වාරිකා නියෝජිත සංගමයේ නාමිකයන් සහ ආගාමික වාරිකා මෙහෙයවන්නන්ගේ සංගමයේ නාමිකයන් කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් කර තිබෙන නමුදු ජාතික සංචාරක නියමු කථිකාචාර්යවරුන්ගේ සංගමය සම්පූර්ණයෙන්ම නොසලකා හැර ඇත. විවිධ මාර්ගයේ සංචාරක නියමුවන් පුහුණු කිරීම සඳහා ආයතනය විසින් දැනට පාඨමාලා පවත්වනු ලැබුවද, වාරිකා නියෝජිත ආයතන අංශය වෙත මිනිස්බල සපයාදීමට පුද්ගලයන් පුහුණු කිරීම සඳහා සැලසුම් කළ ඊහා සමාන පාඨමාලා නොමැත.

පළාත් සභාවල සහයෝගය ඇතිව පළාත් නගරවල පරිචාර හෝටල් පාසල් කිපයක් පිහිටුවා තිබෙන නමුදු ආයතනයේ කළමාකරණ මණ්ඩල සංයුතියට පළාත් සභා අමාතයාංශයේ නියෝජිතයකු ඇතුළත් නොවීම තවත් අඩුපාඩුවක් වශයෙන් මෙහිලා සඳහන් කළ හැකිය.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (40 වගන්තිය)

කාර්යාංශය පහත සඳහන් තැනැත්තන්ගෙන් යුක්ත වන සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත වේ.

(අ) කාර්යාංශයේ සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තකු

(ආ) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

(ඇ) කාර්යාංශයේ කළමාකරණ අධ්‍යක්ෂ

(ඈ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු.

(ඉ) ශ්‍රී ලංකා ආගාමික වාරිකා මෙහෙයවන්නන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයයේ ඒකාබද්ධ සභාවේ නාමිකයන් වන හය දෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක්

සහ

## (ඡ) සංචාරක කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු

**සංචාරක කටයුතු සම්බන්ධයෙන්** ඇති නෛතික ආයතනයක සාමාජිකයකු වශයෙන් සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා (ඔහුගේ නියෝජිතයා) කටයුතු කිරීම සම්බන්ධයෙන් මෙහි කලින් දක්වන ලද නිරීක්ෂණ මෙහිදී ද ඇතුලත් වේ.

ස්වාධීන ආපන ශාලා. අතිරේක නවාතැන් පහසුකම් සලසන්නන්. විශාල මධ්‍යම හෝ කුඩා වුවද සංචාරක වෙළඳ සැල් ආදිය ඇතුලත් සංචාරක ව්‍යාපාරයේ සියලුම අංශ සංචාරක සංවර්ධන බද්දට දායක මුදල් සපයන නමුදු (6 වැනි පරිච්ජේදය බලන්න) විශාල මෙහෙයුම්කරුවන් විසින් දැනට පාලනය කරනු ලබන හෝටල් සංගමය සහ ආගාමික චාරිකා මෙහෙයුම් කරුවන්ගේ සංගමය යන ප්‍රධාන චාරිකා වෘත්තිය සංගම් දෙකේ ඒකාබද්ධ සභාව විසින් පුද්ගලයන් නම් කරනු ලැබීම ඉහත (ඉ) හි දැක්වෙන පත්කිරීම් සම්බන්ධයෙන් සටහන් කරගත යුතු කරුණකි. මෙම නම් කිරීම් නිසා සමාගම් දෙකට (චාරිකා නියෝජිත සංගමය හැර) තීරණ ගැනීමේදී වැඩි පිරිසකගේ බලයක් ලැබේ. ඒකාබද්ධ සභාවට

හයදෙනෙක් ඇතුලත් වන අතර අනෙකුත් සියලුම අය පස්දෙනෙකි. සංචාරක සංවර්ධන අරමුදලින් විශාලතම කොටසක් ලබන්නේ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයයි. එය 70 % කි.

හයදෙනෙක් ඇතුලත් වන අතර අනෙකුත් සියලුම අය පස්දෙනෙකි. සංචාරක සංවර්ධන අරමුදලින් විශාලතම කොටසක් ලබන්නේ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයයි. එය 70 % කි.

සංචාරක ව්‍යාපාරයේ සියලුම අංශවල කුඩා සහ මධ්‍යම ව්‍යවසායකයන්ගෙන් සමන්විත වන සංචාරක කටයුතු පිළිබඳ කුඩා සහ මද්‍යම ව්‍යවසායක සංගමය යනුවෙන් හඳුන්වනු ලබන තවත් චාරිකා වෘත්තිය සංගමයක් මෑතකදී පිහිටුවීම පිළිබඳව සැලකිල්ලට ගැනීමේදී ඒකාබද්ධ සභාව සම්පූර්ණ සංචාරක ව්‍යාපාරය නියෝජනය කරන ආයතනයක් වන්නේ දැයි සැකසහිතය.

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය (43 වගන්තිය) පනතේ වෙනත් තැනක සඳහන්වන කාර්යාංශයට පත්වීම් කරනු ලබන තැනැත්තාසහ එහි සංයුතිය සම්බන්ධයෙන් 43 වගන්තියේ වචන යොදා තිබීම පිළිබඳ යම් අවුල් සහගත තත්වයක් පවතී. එහෙත් අඩුම තරමින් කාර්යාංශය දොළොස් දෙනෙකුගෙන් සමන්විත වන බව පෙනී යයි.

(අ) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නියෝජිතයකු

(ආ) ශ්‍රී ලංකා හෝටල් සංගමයේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයකු

(ඇ) ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම් කරුවන්ගේ සංගමයේ සභාපතිවරයා හෝ එම සංගමයේ උප සභාපතිවරයා.

(ඈ) කොළඹ නගරයේ සංචාරක හෝටල් සංගමයේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයකු

(ඉ) ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ප්‍රධාන සභාපතිවරයා හෝ එම සංගමයේ උප සභාපතිවරයා.

(ඊ) ශ්‍රී ලංකා වෘත්තියවේදි සංගම් සංවිධානයේ සභාපතිවරයා හෝ උපසභාපතිවරයා.

(උ) ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලයෙ සභාපතිවරයා.

(ඌ) සංචාරක සංවර්ධන අධිකාරියෙහි මණ්ඩලයේ මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන තැනැත්තා.

(එ) සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(ඒ) සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ පාලක මණ්ඩලය විසින් නම් කරන ලද සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ විධායක නිලධාරියෙක් හෝ ජ්‍යෙෂ්ඨ විධායක නිලයට අඩු නොවන නිලයක් දරන නිලධාරියෙකු

(ඔ) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන තැනැත්තන් දෙදෙනෙකු. එක් තැනැත්තෙකු එම අමාත්‍යාංශයේ නිලධරයකු විය යුතුය.

දැනට යෝජිත කාර්යාංශයේ වැඩකටයුතු මෙහෙයවනු ලබන්නේ සීමාසහිත ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය (ඇපකාර) යනුවෙන් හඳුන්වනු ලබන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් විසින්ය.

සංචාරක උපදේශක කමිටුව (33 වගන්තිය)

මෙම කමිටුවට නෛතික පුද්ගලභාවයක් නොමැති අතර සංචාරක කටයුතු පනත අනුව චාරිකා සහ සංචාරක කර්මාන්තයට සම්බන්ධ යම් කරුණක් පිළිබඳව අමාත්‍යවරයාට සහ අධිකාරියට උපදෙස්දීම මෙහි කාර්යයන් වේ. සංචාරක උපදේශක කමිටුව අවම වශයෙන් සාමාජිකයන් නමදෙනෙකුගෙන්ද, පහත සඳහන් පරිදි උපරිම වශයෙන් සාමාජිකයන් පහළොස් දෙනෙකු ගෙන්ද සමන්විත විය හැකිය.

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්

(i) අධිකාරියේ සභාපතිවරයා

(ii) ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සභාපතිවරයා.

(iii) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපතිවරයා

(iv) ශ්‍රී ලංකා ජාතික ගුවන් සේවයේ විධායක නිලධරයා.

(ආ) අමාත්‍යවරයා විසින් කරනු ලබන පත්වීම්.

ලෝක චාරිකා, සංචාරක කර්මාන්තය සහ අදාළ කර්මාන්ත හා සම්බන්ධ පුළුල් පළපුරුද්දක් හා සුදුසුකම් ඇති තැනැත්තන් පස් දෙනෙකුට නොඅඩු හා එකොළොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්.

උපදේශක කමිටුවේ කාර්යය වන්නේ අමාත්‍යවරයාට පමණක් නොව අධිකාරියට ද උපදෙස්දීමය. කෙසේ වුවද අධිකාරියේ සභාපතිවරයා මෙම කමිටුවේ ද සාමාජිකයා වේ. උපදෙස් ලබාගැනීමට අපේක්ෂා කරන අය උපදෙස් දෙන තැනැත්තන්වීම නිසා එකිනෙකට ගැලපීමෙක් නොමැත.

සංචාරක කටයුතු පනත මගින් පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතන දෙකක් වන සංචාරක අධිකාරිය සහ ආයතනය යන දෙක සඳහා පමණක් උපදේශක කමිටු සපයා තිබීම පනතේ තවදුරටත් දැක්වෙන අනනුකූලතාවයකි. සංචාරක ඒකාබද්ධ සභාවේ නාමිකයන් විසින් පාලනය කරනු ලබන සහ සංචාරක සංවර්ධන අරමුදලෙන් 70% ක මුදල් ප්‍රමාණයක් ලබන සංචාරක අලෙවිකරණ කාර්යාංශය සඳහා ඒ හා සමාන උපදේශක කමිටුවක් සපයා නොමැත්තේ කුමක් නිසාද යන්න අවබෝධ නොවේ.

තම මිතැ එපාකම් අනුව ප්‍රවර්ධන කටයුතු සඳහා මුදල් වියදම් කිරීමට මවුන් වෙත හිස් චෙක්පතක් ලබාදී ඇති බවට හැඟීමක් ඇතිවේ. ඒකාබද්ධ සභාවේ සිටින නාමිකයන් හයදෙනා සංචාරක අලෙවිකරණ හා ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන පුද්ගලයන් වන බවට සහතිකවීමක් නොමැති අතර, අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් වැදගත් තීරණ ගැනීමේදී සංචාරක කර්මාන්තය කෙරෙහි ඇති උනන්දුව තම ව්‍යාපාර සංවිධාන කෙරෙහි ඇති උනන්දුව අභිබවා යන්නේද යන්න පිළිබඳ සහතිකවීමක් ද නොමැත.

## 6.4 සම්බන්ධීකරණ ගැටලු.

පර්යේෂණ කටයුතු, නිෂ්පාදිත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය සංචාරක කර්මාන්තයේ සාමාන්‍යයෙන් පිළිගත් ප්‍රධාන කාර්යන්ය. සමතුලිත නොවූ සංවර්ධන කටයුතු මගහැරීමටත් උපරිම ආර්ථික හා අනෙකුත් ප්‍රතිලාභ රටේ ඇති කරන මැනවින් ගැලපෙන සංචාරක කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීමටත් මෙම කාර්යයන් අතර ඉතා ඉහළ මට්ටමේ සම්බන්ධීකරණයක් තිබිය යුතුය. සංචාරක කර්මාන්තයේ කොටස් වශයෙන් වෙන්වී ඇති ස්වභාවය නිසා, සම්බන්ධීකරණය පවත්වා ගැනීම වඩාත් අවශ්‍ය වේ.

සංචාරක කටයුතු පනතින් අපේක්ෂා කරන්නේ සංචාරක කර්මාන්තය පිළිබඳ මෙම ප්‍රධාන කාර්යයන් කොටස් දෙකකට බෙදා ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතන

දෙකකට පැවරීමය. මෙම එක් එක් ආයතන ස්වාධීනව කටයුතු කරයි. මෙම ආයතන දෙක පර්යේෂණ, නිෂ්පාදිත සංවර්ධන හා නියාමනය පිළිබඳ අධිකාරිය සහ ප්‍රවර්ධන, අලෙවිකරණ කාර්යාංශය යනුවෙන් හඳුන්වා ඇත. සම්බන්ධීකරණය සඳහා සලසා ඇත්තේ එක් විධිවිධානයක් පමණක් වන අතර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ රජයේ මුදල් සම්බන්ධයෙන් ප්‍රධාන අධීක්ෂණ නිලධාරියා සහ ප්‍රධාන ගණන් දෙන නිලධාරියා වශයෙන් සලකනු ලබන සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා ව්‍යවස්ථාපිත ආයතන දෙකේ කළමනාකරණ මණ්ඩලවල සාමාජිකයන් බවට පත් කිරීම සඳහා සලසා ඇති විධිවිධානයයි.

ලේකම්වරයා සියලුම කළමනාකරණ මණ්ඩල හතරේම සාමාජිකයකු බවට පත්කර නිර්මාණය කර ඇති අපහසු සහ අවුල් සහගත තත්වය මෙම වාර්තාවේ වෙනත් තැනක පෙන්වාදී ඇත. අලෙවිකරණ කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සිටින අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට සම්බන්ධීකරණ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය බලය තිබේද යන්න වාද විවාදයට තුඩුදෙන ප්‍රශ්නයකි. එකම තැනැත්තා අධිකාරියේ සභාපති මෙන්ම අලෙවිකරණ කාර්යාංශයේ සභාපති වශයෙන් පත් කරන ලද්දේ නම්, මෙම තත්වය වෙනස්වීමට තිබුණි.

දැනට එය පවතින අන්දමට ආයතන දෙක දෙපැත්තට ඇදීමින් කටයුතු කිරීමත් ආධිපත්‍යය සහ සංචාරක සංවර්ධන අරමුදලේ වැඩි කොටසක් ලබාගැනීමට සටන්වැදීමත් වැළැක්විය නොහැකිය. දැනට ශ්‍රී ලංකාවේ මැනවින් සැකසූ පොදුවේ පිළිගත් සමස්ත සංචාරක සංවර්ධන සහ ප්‍රවර්ධන ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් නොමැතිකම නිසා මෙය සිදුවීමට තිබෙන ඉඩකඩ බොහෝ සෙයින් වැඩිය. කමිටුවට ලැබී ඇති තොරතුරු අනුව ඇතැම් රටවල කවර හෝ ස්ථානයක මෙය සිදුවී ඇත. සංචාරක කටයුතු පනත ක්‍රියාත්මක කළහොත් ශ්‍රී ලංකාවේ එය සිදු නොවන බවට සහතිකයක් නොමැත. එවිට සංචාරක කටයුතු පනත ඉතා මිල අධික අත්හදා බැලීමක් බවට පත්වනු ඇත.

## 6.5 සංචාරක සංවර්ධන අරමුදල සහ 2003 අංක 25 දරන මුදල් පනත (23 වගන්තිය.)

මුදල් පනතේ දිනය සංචාරක කටයුතු පනත සහතික කළ දිනයට ඉදිරිපත් වූ දිනයක් බව දැකිය හැකිය. මෙය පහත සඳහන් විෂමතා ඇතිවීමට හේතුවී ඇත.

* මුදල් පනත අනුව ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සංචාරක සංවර්ධන බද්ද එකතු කළ යුතු අතර, සංචාරක කටයුතු පනත ක්‍රියාත්මක වන විට ඔහු එම තනතුරේ නොසිටිනු ඇත.

* මුදල් පනත අනුව 1968 අංක 14 සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍ර ලබා ඇති සෑම ආයතනයක පිරිවැටුම මත සංචාරක සංවර්ධන බද්ද එකතු කළ යුතුය.

සංචාරක කටයුතු පනතේ දක්වා ඇති සංචාරක සංවර්ධන අරමුදලේ වියදම් ප්‍රමාණයන් සමාලෝචනය කර බැලීමට අවශ්‍යද? "යම් සියයට ගණනක මුදල් ප්‍රමාණයක්" යනුවෙන් සඳහන් කිරීම හේතුවට සඳහන් කර ඇති නීත්‍යානුකූල ආයතනය සඳහා උපරිම වශයෙන් යම් සියයට ප්‍රමාණයක් අරමුදලින් වියදම් කිරීම සඳහා විධිවිධාන සැලසීම වඩා උචිත නොවන්නේද ? මුදල් ලබා ගන්නා නීත්‍යානුකූල ආයතනයේ අවශ්‍යතාවන් අනුව සහ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පිළිගනු ලැබූ සැලසුම් නැතහොත් සැලැස්ම අනුව වියදම් දැරිය යුතුද?

6.6 ලංකා සංචාරක මණ්ඩලයේ සාමාජිකයන්, නිලධාරීන් සහ සේවකයන්.

"පනත (සංචාරක මණ්ඩල පනත) ඉවත් කරන ලද දිනයට ඉහතින්ම වූ දිනයේදී ලංකා සංචාරක මණ්ඩලයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් වූ සියලු තැනැත්තන් ඉවත් කිරීම සඳහා නියමිත දිනයේ සිට අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය." යනුවෙන් සංචාරක කටයුතු පනතේ 07 (2) (ඇ) උප වගන්තියේ දැක්වේ.

සංචාරක මණ්ඩලයේ සේවකයන්ගේ බිය පහ කිරීම සඳහා ඔවුන්ගේ රැකියා නියුක්තියේ සුරක්ෂිත බව පිළිබඳව සැලකිලිමත්වී ඇත. "අධිකාරිය" යන වචනයට පසු පහත සඳහන් වචන එක් කිරීම උචිතය. " සංචාරක මණ්ඩලය යටතේ ඔවුන්ගේ සේවා නියුක්තියට අදාළ නියමයන් සහ කොන්දේසිවලට වඩා අඩු වාසිදායක තත්වයක් ඇති නොවන නියමයන් හා කොන්දේසිවලට යටත්ව" යනුවෙන් සඳහන් විය යුතුය. (2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩල පනතේ 33(1) උප වගන්තිය බලන්න.)

### 6.7 නිගමන.

දැනට සංචාරක මණ්ඩලය විසින් ඉටුකරනු ලබන කාර්යයන් නිත්‍යානුකූල ආයතන තුනක් අතරේ බෙදා හැරීමට අපේක්ෂා කරන බව පෙනී යයි. මෙම නිත්‍යානුකූල ආයතන තුන පිහිටුවීමේ පරමාර්ථය වන්නේ සංචාරක කර්මාන්තයේ කොටස්කරුවන් වන පෞද්ගලික අංශයේ සංචාරක කටයුතු මෙහෙයවන්නන් සංචාරක කටයුතු කළමනාකරණය සඳහා සහභාගී කරවා ගැනීමට ඉඩකඩ සැලසීමට නම්, නිත්‍යානුකූල ආයතන කීපයක් පිහිටුවීමට කටයුතු නොකර වෙනත් යම් අඩුවියදම් සහිත විකල්ප ක්‍රමයක් අනුගමනය කිරීමෙන් ඔවුන්ගේ සහභාගිත්වය සාර්ථක ලෙස ලබාගත නොහැකිදැයි විමසිය හැකිය.

දැනට පවතින ලංකා සංචාරක මණ්ඩල පනත සංශෝධනය කිරීමෙන් එම කාර්යය ඉටු කරගත නොහැකිද? පෞද්ගලික අංශයට ඉඩ ප්‍රස්ථාව සැලසීම සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ සංයුතිය පුළුල් කිරීම විකල්ප ක්‍රියා මාරග්යක් විය නොහැකිද ? උපදේශක මණ්ඩලය සඳහා පෞද්ගලික අංශය නියෝජිතය වීමට ඉඩකඩ සලසාදීමෙන් එහි සහභාගිත්වය තවදුරටත් ශක්තිමත් කළ හැකිය.

## 7 වැනි පරිච්ඡේදය.

## ඉදිරි ගමන (නිර්ණේය විෂයය 4)

### 7.1 හැඳින්වීම.

නිර්ණේය විෂයය 1,2 සහ 3 යටතේ මීට ඉහත පරිච්ඡේදවල ඉදිරිපත් කළ විශ්ලේෂණ, තිරණ සහ නිගමන එකට ගොනුකර සංචාරක ව්‍යාපාරයේ ධරණීය සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ඉදිරි ගමනකට නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණවී ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා සංචාරක කර්මාන්තයට සැලකිය යුතු දායකත්වයක් ලබාදීමට හැකිවනු ඇත.

මීට ඉහත පරිච්ඡේදවල ඉදිරිපත් කළ විශ්ලේෂණ, තිරණ, නිගමන හා නිර්දේශ කිරීම 1 වැනි පරිච්ඡේදයේ විස්තර කර ඇති කාර්ය සැලැස්ම සහ අධ්‍යයන ක්‍රමවේදය මත පදනම් වූ බව යළිත් වරක් සඳහන් කළ යුතුය. අධ්‍යයන ක්‍රමවේදයේ කොටසක් වශයෙන් නීති ප්‍රඥප්ති, වාර්තා සහ ප්‍රකාශන ඇතුළත් වන

ලිපි ලේඛන විසිපහකට අධික ප්‍රමාණයක් පරීක්ෂාකර බලා අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා විමර්ශන ද්‍රව්‍ය ලෙස භාවිතා කරන ලදී.

අනතුරුව, අදාල චාරිකා වෘත්තීය සංගම්, රාජ්‍ය අංශයේ නියෝජිත ආයතන සහ පුද්ගලයන්ගෙන් කරුණු දැක්වීම් ඉදිරිපත් කරන ලෙස කැඳවීමක් කරන ලදී. එවැනි සංගම් නියෝජිත ආයතන සහ පුද්ගලයන් 25 කට වැඩි සංඛ්‍යාවක් විසින් වාචිකව කමිටුවට කරුණු දක්වන ලදී. චාරිකා කර්මාන්තයේ විවිධ කොටස්කරුවන්ගේ සතුටුදායක හරස් කඩකින් අදහස් සහ මත පිළිබඳ විමසා දැනගැනීමේදී මෙම අදහස් දැක්වීම් බොහෝ සෙයින් වටිනා බව පෙනී ගියේය.

කෙසේ වුවද, සංචාරය සඳහා නියමිත නියෝජිත ආයතනය විසින් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට අපොහොසත් වූ බැවින්, සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඇති සහභාගිත්වය පිළිබඳව අනෙකුත් රටවල් ලබා ඇති පළපුරුද්ද පිළිබඳව දැනුම ලබාගැනීම සඳහා ආරම්භක වාර්තාවේ යෝජිත පරිදි අධ්‍යයන ක්‍රමවේදයේ අත්‍යවශ්‍ය කොටසක් වශයෙන් සිංගප්පූරුව, තායිලන්තය සහ සීෂෙල්ස් යන රටවල අධ්‍යයන සංචාරවල නිරත වීමට නොහැකිවිය. කමිටුව විවිධ ක්‍රම සහ මාර්ග භාවිතා කරමින් අවශ්‍ය තොරතුරු ලබාගැනීමට පරිශ්‍රමයක් දරන ලද අතර එය සාර්ථක නොවීය. කරුණු මෙසේ හෙයින් කමිටුවට වෙනත් විකල්පයක් නොවූයෙන් අධ්‍යයනය සඳහා අදාළ විෂයය පිළිබඳ ප්‍රකාශන මූලාශ්‍ර මගින් ලබාගත හැකි වන කවර හෝ තොරතුරු පිළිබඳ විශ්වාසය තැබීමට සිදුවිය.

2 වැනි පරිච්ජේදයේ අරමුණවී ඇත්තේ සංචාරක මණ්ඩලයේ සවිබලතාවයන් සහ දුර්වලකම් පිළිබඳව නිර්ණෝය විෂයය 2 යටතේ කරුණු විමසා බැලීමය. පසුගිය දශක හතර තුළ සංචාරක මණ්ඩලයේ කාර්ය සාධනය පිළිබඳ විමසා බලන විට විශ්ලේෂණවලින් පෙනී යන්නේ එහි සවිබලතාවයන් හඳුනාගෙන ඇති සහ දැක ඇති දුර්වලතාවයන් අභිබවා යන බැවින් මෙම දුර්වලතාවයන් නිවැරදිකර ගැනීම පිණිස එය සම්පූර්ණයෙන් අහෝසිකර දැමීම සඳහා තර්කානුකූල හේතු දැක්විය නොහැකි බවය. දැනට සංචාරක මණ්ඩලයේ වෙනම අංශයක් ලෙස පාලනය කරනු ලබන ලංකා හෝටල් පාසලේ අනාගත කළමනාකරණය සම්බන්ධයෙන් අදාළ වන ප්‍රශ්නය පිළිබඳව සොයා බැලීමට වාර්තාවේ 3 වැනි පරිච්ජේදය යොදා ගෙන ඇත. පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව සංචාරක කටයුතු කළමනාකරනය සඳහා ආයතනික

වෙනස්කම් සිදු කිරීමට කලින් ගන්නා ලද ප්‍රයත්නයන් පිළිබඳ විස්තර කිරීමක් 4 වැනි පරිච්ඡේදයේ සඳහන් වේ.

රජයේ අරමුදල් කළමනාකරණය සහ එම අරමුදල් සම්බන්ධයෙන් ඇති වගකීම පිළිබඳ ක්ෂෙත්‍රවල ආවේණික දුර්වලතාවයන් පෙන්වා දෙමින් නිර්ණේය විෂයය 3 පිළිබඳව විමසා බැලීම සඳහා 2003 අංක 25 දරන මුදල් පනත පිළිබඳ විචාරාත්මක සමාලෝචනයක් 5 වැනි පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇත. නිර්ණේය විෂයය 2 පිළිබඳව විමසා බැලීම සඳහා නව සංචාරක නීතිය යනුවෙන් හඳුන්වනු ලබන 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත පිළිබඳව විචාරාත්මක සමාලෝචනයක් 6 වැනි පරිච්ඡේදයේ දැක්වේ. පාර්ලිමේන්තුවේ සම්මත කළ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගැසට් පත්‍රයේ පළ කරන ලද්දේ නම් අවුල්සහගත තත්වයක් ඇතිවීමට ඉඩ තිබූ අතර. එම නීතියේ තිබෙන ("ඉ" පරිශිෂ්ටයේ විස්තර දක්වා ඇත.) නෛතික සාවද්‍යතාවයන් සහ අනනුකූලතාවයන් පෙන්වාදීම හැරුණු විට සංචාරක කටයුතු අනාගතයේදී සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය සඳහා යොදාගනු ලබන ආයතනික පාදක ව්‍යුහයේ ආවේණික දුර්වලතාවයන් සමාලෝචනය මගින් හෙළිදරව් කරනු ලබයි.

## 7.2 මහින්ද චින්තනය.

"නව ශ්‍රී ලංකාවක් කරා" ප්‍රවේශවීමේ ඉදිරිගමන වශයෙන් ඡන්ද දායකයන් විසින් නිසි ලෙස පිළිගෙන ඇති මහින්ද චතින්තනය මගින් රජය මෙහෙයවන බව. නිර්ණේය විෂයයේ නිශ්චිත වශයෙන් අවධාරණය කෙරේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සඳහා ඉදිරි ගමනද මහින්ද චින්තනයේ දැක්වෙන ක්‍රමෝපා සංවර්ධන පාදක ව්‍යුහය මගින් මෙහෙයවිය යුතුය. අදාල විෂයය සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රියාමාර්ග සහ අපේක්ෂිත ජයග්‍රහණයන් පමණක් නොව ප්‍රධාන ආංශික ප්‍රතිඵල සහිත පාදක ව්‍යුහය සැකසීම සඳහා පදනම සපයන ක්‍රමෝපා සංවර්ධන අරමුණු රාශියක් ද එහි සඳහන් වන අතර. එම පාදක ව්‍යුහය තුළ නිශ්චිත ක්‍රියාමාර්ග පිළිගත යුතු අතර ජයග්‍රහණයන් අත්පත් කරගත යුතුය. ඒ අනුව සංචාරක කටයුතු පිළිබඳ නිශ්චිත ක්‍රියාමාර්ග සහ ජයග්‍රහණයන් සැලකිල්ලට ගනිමින් ක්‍රමෝපා සංවර්ධන අරමුණුවලින් සංචාරක අංශයේ සංවර්ධන ක්‍රියාමාර්ග සහ ජයග්‍රහණයන් මෙහෙයවිය යුතුය. මහින්ද චින්තනය මගින් බිහිවන ක්‍රමෝපා සංවර්ධන අරමුණු පහත දැක්වේ.

(අ) ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ සදාචාර අවදානම් වලින් පවුල ආරක්‍ෂාකර ගැනීම.

(ආ) සංවර්ධන ඒකක බවට පත් කිරීම සඳහා ගම්මාන වැඩිදියුණු කිරීම.

(ඇ) දේශීය ආර්ථික ශක්‍යතාව ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රදේශ සංවර්ධනය කරීම.

(ඈ) ජනතාවට සංවර්ධන ප්‍රතිලාභ ලැබෙන ආර්ථික වර්ධනය ඇති කිරීම.

(ඉ) පුරවැසියන් සවිබල ගැන්වීමෙන් ජනතාවගේ අධිෂ්ඨානය සවිමත් කිරීම.

මහින්ද චින්තනයේ ඇතුළත් සංචාරක කටයුතු පිළිබඳ නිශ්චිත න්‍යාය පත්‍රය, ක්‍රියා මාර්ග සහ අපේක්‍ෂිත ජයග්‍රහණයන් පහත දැක්වෙන පරිදි වේ.

සංචාරක කර්මාන්තයෙන් රටේ ආර්ථික සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබාදිය හැකිය. කෙසේ වුවද, අපගේ ස්වාභාවික සහ මානව සම්පත් මෙම කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා විද්‍යාත්මක ලෙස ප්‍රයෝජනයට ගෙන නොමැත. ජනප්‍රිය සංචාරක ව්‍යාපාරයන් බිහිවීම අපේක්‍ෂාවෙන් පසුවීම ගැන විශ්වාසය තබා කටයුතු කිරීම වෙනුවට පරිසර හිතකාමී කල්පවත්නා සංචාරක කර්මාන්තයක් බිහි කිරීම මගේ අභිප්‍රාය වී ඇත.

දැනටමත් මෙම කාර්යය සඳහා සකස් කර ඇති සැලසුම් වැඩිදියුණු කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් ද පාරිසරික සහ සංස්කෘතික වශයෙන් ඇති අපගේ ආකර්ෂණීය ස්ථාන ප්‍රයෝජනයට ගැනීමෙන්ද ඉදිරි වසර පහ තුළ සංචාරක කර්මාන්තය උපරිම වශයෙන් සංවර්ධනය කිරීමට මා විසින් සැලසුම් කර ඇත.

- 2010 වසර වන විට 1,500,000 ක සංචාරකයන්ගේ පැමිණීමේ ඉලක්කගත සංඛ්‍යාව සපුරා ගැනීමට ව්‍යාපාර සැලැස්මක් සකස් කරමි.

- සාම්ප්‍රදායක රටවල්වලට අමතරව ඉන්දියාව, චීනය, මැද පෙරදිග සහ රුසියාව යන රටවල සංචාරකයන් කෙරෙහිද අවධානය යොමු කිරීමට සැලසුම් කරමි.

- අමතරව පැමිණෙන සංචාරකයන් සඳහා නවාතැන් පහසුකම් සැලසීම පිණිස හෝටල් කර්මාන්තය සහ සංචාරක කර්මාන්තයට අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍යාධාර සහ දිරි ගැන්වීම් ලබාදෙමි.

- සංචාරක නියමුවන් වෘත්තිමය ලෙස පුහුණුකර ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය යටතේ එම අය ලියාපදිංචි කිරීම පිණිස කටයුතු සලස්වමි.

- සංචාරක කලාපය ලෙස හම්බන්තොට, කල්පිටිය සහ ආරුගම්බේ වැනි නව ප්‍රදේශ කෙරෙහි මගේ සංචාරක සංවර්ධන සැලැස්මෙන් අවධානය යොමු කරමි.

- බේරේ වැව සහ මිලන්ද ඇල අවට ප්‍රදේශ යළි සංවර්ධනය කරනු ලබන අතර එමගින් මෙම ප්‍රදේශ සංචාරක ආකර්ෂණීය කලාප බවට පත් කරනු ලැබිය හැකිය.

ඉහත සඳහන් මහින්ද චින්තනයේ ක්‍රමෝපා සංවර්ධන අරමුණු මෙන්ම සංචාරක කටයුතු පිළිබඳ නිශ්චිත න්‍යාය පත්‍රයද, ක්‍රියා මාර්ග සහ අපේක්ෂිත ජයග්‍රහණයන් ද සංචාරක අංශයේ ප්‍රතිඵල ඇති කරන පාදක ව්‍යුහය මෙන්ම, සංචාරක කර්මාන්තයේ කොටස්කරුවන්ගේ කාර්ය භාරය, වගකීම් සහ සබඳතා පිළිබඳව සම්බන්ධතාවයන් ඇති කරයි.

## 7.3 ප්‍රධාන සංචාරක කාර්යයන්.

ඓතිහාසික වශයෙන් කරුණු ගෙනහැර දක්වන්නේ නම්, සංචාරක කර්මාන්තය රජයේ අනුග්‍රහය යටතේ ආර්ථිකයේ අත්‍යවශ්‍ය අංශයක් වශයෙන් හිතාමතා සිහිබුද්ධියෙන් රටට හඳුන්වාදී ඇති කටයුත්තකි. විවිධ දිරිගැන්වීම්වලින් පෞද්ගලික අංශය සංචාරක කර්මාන්තයට ඇත්ත වශයෙන්ම පොළඹවා ගන්නා

ලදී. පෞද්ගලික අංශයේ මූලිකත්වයෙන් සහ පෞද්ගලික අංශයේ කටයුත්තක් ලෙස සංචාරක කර්මාන්තය ආරම්භ වූ සිංගප්පූරුව, තායිලනත්ය, මැලේසියාව, හොංකොං, දකුණු කොරියාව, ජපානය ආදී සංවර්ධනය වන අනෙකුත් රටවල් කීපයක සංචාරක කර්මාන්තයේ ආරම්භය සමඟ මෙය සමාන කළ නොහැක. එබැවින් සංවර්ධනය සහ ප්‍රවර්ධනය වැනි ප්‍රධාන සංචාරක කාර්යයන් තම වාසිය සහ පෞද්ගලික ලාභ තකා පෞද්ගලික අංශය විසින් එහි මූලිකත්වයෙන් මෙහෙයවන ලදී. ජාතික ආර්ථිකයට සංචාරක කර්මාන්තයෙන් ඇතිවන ප්‍රතිලාභ ප්‍රකටව පෙනී ගිය බැවින් එම රටවල රජය සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් මැදිහත් වූයේ වඩාත් පසු කාලයකදීය. විශේෂයෙන් රජය මැදිහත් වූයේ සංචාරක සංවර්ධනය නියාමනය සහ කඩිනම් කිරීම සම්බන්ධයෙනි.

ශ්‍රී ලංකාවේ රජයේ අනුග්‍රහය යටතේ සංචාරක කර්මාන්තය හඳුන්වා දෙන ලද අවස්ථාවේ සිට මානව සම්පත් සංවර්ධනය ඇතුළුව සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සහ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් අදාළ සියලුම කාර්යයන් ප්‍රධාන මෙහෙය ඉටු කිරීම සඳහා පිහිටුවන ලද රජයේ ආයතනය වන සංචාරක මණ්ඩලය විසින් මෙහෙයවීමට සිදුවිය. මෙසේ සංචාරරක මණ්ඩලය බහුකාර්යය හා ඒකීය ජාතික සංචාරක පරිපාලනයක් වශයෙන් වර්ධනය වූ අතර ශ්‍රී ලංකාවේ සංචාරක කර්මානත්ය සංවර්ධනය සහ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් අදාළ වන සියලුම කටයුතු ආරම්භ කිරීමත්, ප්‍රවර්ධනය කිරීමත්, දිරි ගැන්වීමත් ඒ සඳහා පහසුකම් සැලසීමත් සිදු කරන ලද්දේ සංචාරක මණ්ඩලය විසිනි.

සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය හැමවිටම අනුග්‍රමය දක්වන අමාත්‍යාංශය වශයෙන් කටයුතු කරමින් සිටින නමුදු සංචාරක ගමනාන්තය සංවර්ධනය, කළමනාකරනය හා නියාමනය සහ තත්ව සහතිකය ඇති කිරීමට ප්‍රයත්න දැරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික වශයෙන් වගකීම දරා මූලිකත්වය ගෙන කටයුතු කර ඇත්තේ සංචාරක මණ්ඩලයයි.

නව සංචාරක නීතියෙන් (නැතහොත් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතින්) යෝජනා කර ඇත්තේ මෙම කාර්යයන් (හෝ කටයුතු) පුළුල් වශයෙන් කොටස් හතරකට බෙදා එක් එක් කාර්යය ඉටු කිරීම සඳහා ව්‍යවස්ථාපිත වෙනම ආයතනයක් පිහිටුවීමය. මෙම එක් එක් ව්‍යවස්ථාපිත ආයතනය සඳහා පෞද්ගලික අංශයේ නියෝජනයක් ඇති කිරීමට වගබලා ගැනීම මෙහි මූලික පරමාර්ථය වී ඇති අතර, මේ සඳහා පහත දැක්වෙන පරිදි කටයුතු සලසා ඇත.

| ව්‍යස්ථාපිත ආයතනය | මූළ | තිලබලයෙන් | වෘත්තිය | |
|---|---|---|---|---|

| | සාමාජික සංඛ්‍යාව | පත්වන සාමාජිකයන් | නියෝජිතයන් | අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන අය |
|---|---|---|---|---|
| සංචාරක අධිකාරිය | 9 | 4 | 3 | 2 |
| ප්‍රවර්ධන කාර්යාංශය | 11 | 4 | 6 | 1 |
| සම්මේලන කාර්යාංශය | 13 | 4 | 7 | 2 |
| ආයතනය | 13 | 4 | 6 | 3 |
| එකතුව | 46 | 16 | 22 | 8 |

ලෝකයේ බොහෝ ප්‍රදේශවල සංචාරක කර්මාන්ත කළමනාකරණයේදී වර්තමානයේ ඇතිවී තිබෙන ප්‍රවණතාවය වන සංචාරක ගමනාන්තය සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ප්‍රයත්න දැරීමේදී සංචාරක කර්මාන්තයේ පෞද්ගලික අංශය විසින් ප්‍රධාන මෙහෙයන් ඉටුකළ යුතු බැවින් ඒ සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීමට මෙසේ කටයුතු කර ඇති බව පැහැදිලිවේ. සංචාරක කර්මාන්තයේ පෞද්ගලික අංශයේ ධාරිතාවයේ සහ ප්‍රමාණයේ සිදුවී ඇති වර්ධනයත්, ආර්ථිකයත් සම්බන්ධයෙන් පවත්නා සීමා ඉවත් කිරීම සහ ලිහිල් කිරීමත් පසුගිය වසර දහයක විස්සක කාලය තුළ රාජ්‍ය අංශයේ වත්කම් පෞද්ගලීකරණය කිරීම සහ එහි අයිතිය අත්හැර දැමීමත් නිසා සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල මෙම ඉල්ලුම සඳහා මූලිකත්වය ලැබී ඇත.

කෙසේ වුවද, සංචාරක කර්මාන්තයේ පෞද්ගලික අංශයේ ඉල්ලුමට ඉඩකඩ ලබාදීමට සහ ජාත්‍යන්තර තලයේ වර්තමානයේ ඇතිවී තිබෙන ප්‍රවණතාවය අනුව කටයුතු කිරීමට ප්‍රධාන සංචාරක කාර්යයන් කොටස්වලට බෙදීමට අවශ්‍ය වන බව, මෙයින් ගම්‍ය නොවේ. ඉතා අයහපත් ප්‍රතිඵල ඇති කිරීමට තුඩුදිය හැකි ප්‍රධාන සංචාරක කාර්යයන් කොටස්වලට බෙදීම සිදු කිරීමෙන් තොරව රාජ්‍ය හා පෞද්ගලික අංශ අතරේ යහපත් හවුල් සහභාගිත්වයක් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ඉල්ලුම් සපුරාලිය හැකිය. තවද ප්‍රධාන සංචාරක කාර්යයන් කොටස්වලට බෙදීමට එරෙහිව ඉතා ප්‍රබල න්‍යායාත්මක සහ ප්‍රායෝගික තර්ක ඉදිරිපත් කළ හැකිය.

න්‍යායාත්මක තර්කය පහත දැක්වේ.

නව සංචාරක නීතියෙන් (2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතින්) යෝජනා කර ඇත්තේ නිෂ්පාදිත සංවර්ධනය, පර්යේෂණ හා තත්ව පාලන කටයුතු

ප්‍රවර්ධන කටයුතුවලින් වෙන් කිරීමය. සංචාරක අධිකාරියක් සහ ප්‍රවර්ධන කාර්යාංශයක් පිහිටුවීමට පනතින් විධිවිධාන සලසා ඇත්තේ ඒ නිසාය. කෙසේ වුවද, අලෙවිකරණය පිළිබඳ සමස්ත සංකල්පය අනුව මේවා වෙන් කළ නොහැකි කාර්යයන් වේ. සංචාරක සංවර්ධනයේදී මෙම අවස්ථාවේදී ශ්‍රී ලංකාවට අවශ්‍යව ඇත්තේ සංචාරක කර්මාන්තය ඇලෙවිකරණය මිස, සංචාරක කර්මාන්තය එතරම් ප්‍රවර්ධනය කිරීම නොවේ.

අලෙවිකරණය ආරම්භවන්නේ පාරිභෝගිකයාගේ අවශ්‍යතා සහ ගති ලක්‍ෂණ සොයා බැලීමට පර්යේෂණ කිරීමෙනි. දැනට මෙය සංචාරක මණ්ඩලය විසින් ඉටු කරන ලබයි. පාරිභෝගිකයාගේ අවශ්‍යතා සහ ගති ලක්‍ෂණ සොයා දැනගැනීමෙන් පසු පාරිභෝගිකයාගේ අවශ්‍යතාවන් ඉටුවන නිෂ්පාදිතයක් නිර්මාණය කිරීමට අවශ්‍යවේ. මෙම කටයුතුද දැනට සංචාරක මණ්ඩලය විසින් ඉටු කරනු ලබයි. වෙළඳ පොලේ අලෙවිකරන නිෂ්පාදිතයේ ගුණාත්මක බව පිළිබඳව වගබලා ගැනීමේ අවශ්‍යතාව තිබේ. සංචාරක මණ්ඩලය යටතට පැවරී ඇති නියාමන කාර්යය මෙය වේ. එසේ නම්, නිෂ්පාදිතය පිළිබඳ පණිවුඩය වෙළඳපොළ කරා ගෙනයාමට අවශ්‍ය වන අතර එය අලෙවිකරණයේ සන්නිවේදන (නැතහොත් ප්‍රවර්ධන) කාර්යයයි.

එසේ එහෙයින් මෙම අන්තර් සබඳතා ඇති එකිනෙක කෙරෙහි රඳාපවතින සියලුම කාර්යයන් ඒකීය ආයතනයක් මගින් ඒකාබද්ධ ආකාරයකින් ඉටු කිරීමට සිදුවනු ඇත. එසේම සංචාරක අලෙවිකරණයේදී රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පවතින නව ප්‍රවණතාවය අනුව පෞද්ගලික අංශය අලෙවිකරණ කළමනාකරණ ක්‍රියාවලියට ඇතුළත් කර ගැනීමේ අවශ්‍යතාව ඇත.

ප්‍රධාන සංචාරක කාර්යයන් කොටස්වලට බෙදීමට එරෙහිව ඉදිරිපත් කළ හැකි ප්‍රායෝගික තර්කය පහත දැක්වේ.

සමස්ත අලෙවිකරණ සංකල්පයේ විවිධ සංචාරක ලෙස ඇති ප්‍රධාන කාර්යයන් අතර සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට වගබලා ගැනීම පිණිස ඇති අවශ්‍යතාව ප්‍රායෝගික තර්කය වශයෙන් දැක්විය හැකිය. ප්‍රධාන සංචාරක කාර්යයන් කළමනාකරණය සඳහා ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතන දෙකක් අතරේ බෙදා හරින්නේ නම් මෙම කාර්යය ඉටුකළ නොහැකිවනු ඇත. අධිකාරියේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා ප්‍රවර්ධන කාර්යාංශයේ කළමනාකරණ

මණ්ඩලයට ඇතුලත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීමෙන් පමණක් ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් ඇති නොවේ.

විවිධ මිණුම්දඬු යොදා ගෙන පත් කරනු ලබන විවිධ පුද්ගලයන් දෙදෙනෙකු විසින් ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනය දෙකක ප්‍රධානත්වය දරන විට සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම තවදුරටත් දුෂ්කර වේ. තවද සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ පෞද්ගලික අංශයේ වැඩි පිරිසක් සිටීමත් සංචාරක සංවර්ධන අධිකාරියේ රාජ්‍ය අංශයේ වැඩි පිරිසක් සිටීමත් නිසා, මෙම ආයතන දෙක එකිනෙකට වෙනස් පැතිකරා ඇදියාමත් ආධිපත්‍යය සඳහා සහ සංචාරක සංවර්ධන අරමුදලෙන් විශාල කොටසක් ලබාගැනීමට ආයතන අතර ඇතිවන තරඟකාරිත්වයත් වැළැක්වීමට කිසිවක් කල නොහැකිය. නව සංචාරක නීතියෙන් නිර්මාණය කර ඇති ආයතනික පාදක ව්‍යුහය තුළ ඉහත සඳහන් අනනුකූලතාවයන් සහ අනතුරුදායක තත්වයන් දක්නට ලැබේ.

## 7.4 යෝජිත ආයතනික සැකැස්ම.

ඉහත සඳහන් කළ හේතු අනුව කළමනාකරණය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ඇති තනි ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ප්‍රධාන සංචාරක කාර්යයන් පවරාදිය යුතු බවට කමිටුව තරයේ අදහස් කරයි. එම ආයතනය කාර්යාංශය, මණ්ඩලය, අධිකාරිය, කොමිෂම හෝ සභාව යනුවෙන් හඳුන්වනු ලැබුවද නෛසර්ගි වශයෙන් ඇතිවන වාසියක් නොමැත. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ "ලංකා (ශ්‍රී ලංකා) සංචාරක මණ්ඩලය නමැති ආයතනය දශක හතරක ආසන්න කාලයක් තිස්සේ පැවත එන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල විශේෂයෙන් එම රටවල සංචාරක ව්‍යාපාරයේ හොඳ නමක් සහ ප්‍රතිමූර්තියක් ගොඩ නගාගෙන ඇත.

පසුගිය දශක හතර තුළ ශ්‍රී ලංකා (ලංකා) සංචාරක මණ්ඩලය සංචාරක රැස්වීම්වලට සහ සම්මේලනවලට ද සහභාගිවීමත් ප්‍රධාන චාරිකා හා සංචාරක ප්‍රවර්ධන අවස්ථාවලට සහභාගිවීමත් නිසා මෙම තත්වය ඇති වීමට වඩාත් හේතුවී ඇත. එසේ හෙයින්, 4 වැනි පරිච්ඡේදයේ මීට ඉහතදී සඳහන් කළ කටයුතුවලදී වෙනස්කම් සිදු කල පරිදි වෙනස් කිරීමේ නාමයෙන් පමණක් එහි නම වෙනස් කිරීම ප්‍රඥාගෝචර නොවේ.

තවද 2 වැනි පරිච්ඡේදයේ පෙන්වාදී ඇති පරිදි ශ්‍රී ලංකා (ලංකා) සංචාරක මණ්ඩලයේ සවිබලතාවයන් සහ දුර්වලකම් පවතී. එහෙත් හඳුනාගත් සහ

දැකගැනීමට හැකිවූ දුර්වලකම් එහි ඇති සව්බලතාවයන් අභිබවා යයි. එබැවින් කලින් තිබූ පරිදිම ආයතනය සහ එහි නම වෙනස් නොකර පවත්වා ගැනීමටත්, හඳුනාගත් දුර්වලතාවයන් නිවැරදිකර ගැනීම සඳහා විශේෂයෙන් ප්‍රධාන සංචාරක කාර්යයන් කළමනාකරණය සඳහා පෞද්ගලික අංශය සහභාගි කරවා ගැනීමට සංශෝධන හඳුන්වාදීමටත් කටයුතු කළ යුතු බව කමිටුවේ අදහසවේ.

එසේ හෙයින්, සංචාරක මණ්ඩලයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව හයේ සිට නමය දක්වා වැඩි කිරීමෙන්ද, පෞද්ගලික අංශයේ සංචාරක සංගම්වලට මණ්ඩලයේ නියෝජනයක් ලබාගැනීමට ඉඩ ප්‍රස්ථාව සලසාදීමෙන් ද එහි කළමාකරණ මණ්ඩලය යළි පිහිටුවිය යුතු බවට කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ. කළමනාකරණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් පහත දැක්වෙන පරිදි අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

(අ) චාරිකා හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ කැපී පෙනෙන පුද්ගලයකු. ඔහු මණ්ඩලයේ සභාපතිවරයා විය යුතුය.

(ආ) මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයකු.

(ඇ) පළාත් සභා අමාත්‍යාංශයේ නියෝජිතයකු.

(ඈ) ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයේ නියෝජිතයන් දෙදෙනෙකු.

(ඉ) ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම් කරුවන්ගේ සංගමයේ නියෝජිතයකු

(ඊ) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ කුඩා සහ මධ්‍යම ව්‍යවසායක සංගමයේ නියෝජිතයකු

(උ) අලෙවිකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහ දක්ෂතාවය ඇති තැනැත්තෙකු

(ඌ) නීති ක්ෂේත්‍රයේ හෝ ඉංජිනේරු හෝ ගණකාධිකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහ දක්ෂතාවය පෙන්වා ඇති තැනැත්තෙකු.

පහත සඳහන් වගුවේ දැක්වෙන සංඛ්‍යාවලින් පෙන්වාදී ඇති පරිදි සාමාජිකයන් නමදෙනෙකු අතරින් සංචාරක සංවර්ධන බද්ද සඳහා ලබාදෙන දායකත්වය අනුව විවිධ අංශ නියෝජනය කරන සංචාරක කර්මාන්තයේ පෞද්ගලික අංශයේ සිව්දෙනෙකු පත් වන බව පෙනී යයි.

මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයා රජයේ මුදල් පළිබඳ ආරක්‍ෂකයා වශයෙන් කටයුතු කරන අතර. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වැනි සංශෝධනය අනුව පළාත් සභා විසින් ඉටු කරනු ලබන සංචාරක සංවර්ධන සහ ප්‍රවර්ධන කාර්යයන් සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරනු ලබනනේ පළාත් සභා අමාත්‍යාංශයේ නියෝජිතයාය.

සංචාරක හෝටල්වලින් සංචාරක සංවර්ධන බද්ද වෙනුවෙන් ලබාදී ඇති දායකත්වය 2003 වර්ෂයේ මුළු ප්‍රමාණයෙන් 69.3% ක් වූ අතර 2005 වර්ෂයේදී එය 74.6% දක්වා වැඩිවී ඇති බව වගුව අනුව පෙනී යයි. එම කාලය තුළදීම කුඩා සහ මධ්‍යම ව්‍යවසායකවල දායකත්වයද 15.2% සිට 18.9% දක්වා වැඩිවී ඇත. අනෙක් අතට මෙම කාලය තුළදී චාරිකා නියෝජිත ආයතන අංශයේ දායකත්වය 15.5 % සිට 6.5% දක්වා සැලකිය යුතු ලෙස පහත වැටී ඇත. මහින්ද චින්තනයේ දැක්වෙන ප්‍රතිපත්ති අනුව කළමනාකරණ මණ්ඩලයට චාරිකා නියෝජිත අංශයෙන් එක් අයෙකු පත්කරගෙන අලුතින් පිහිටුවා ඇති කුඩා සහ මධ්‍යම ව්‍යවසායක සංගමය නියෝජනය කිරීමට එක් අයෙකු පත්කර ගැනීමට මෙයට හේතුව වේ.

වගුව - සංචාරක සංවර්ධන බද්ද සඳහා දායකමුදල්
2003-2005 (රු. )

| වර්ෂය | 2003 - 4 වැනි කාර්තුව | | 2004 - 4 වැනි කාර්තුව | | 2005 - 4 වැනි කාර්තුව | |
|---|---|---|---|---|---|---|
| | එකතුව | % | එකතුව | % | එකතුව | % |
| සංචාරක හෝටල් | 63,736 | 69.3 | 200,816 | 71.0 | 135,750 | 74.6 |
| චාරිකා නියෝජිත ආයතන | 14,264 | 15.5 | 40,161 | 13.8 | 11,832 | 6.5 |
| කුඩා සහ මධ්‍ය එකතුව ප්‍රමාණයේ ව්‍යවසාය | 13,997 | 15.2 | 44,446 | 15.2 | 34,401 | 18.9 |
| ආගන්තුක නිවාස | 2,149 | - | 8,102 | - | 7,784 | - |
| බි/බි ඒකක | 3 | - | 7 | - | 25 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ආපන ශාලා | 6,291 | - | 18,480 | - | 18,776 | - |
| සංචාරක වෙළඳ සැල් | 5,403 | - | 17,195 | - | 7,486 | - |
| කුළුබඩු ද්‍රව්‍ය වගා උයන් | 105 | - | 535 | - | 259 | - |
| ජල ක්‍රීඩා | 46 | - | 127 | - | 71 | - |
| මුළු එකතුව | 91,997 | 100.0 | 291,423 | 100.0 | 181,983 | 100.0 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය.

4 වැනි පරිච්ඡේදයේ සහ මෙම වාර්තාවේ "අ" අතිරේකයේ දැක්වෙන පරිදි මෙම සංශෝධනයේ සඳහන් කළමනාකරණ මණ්ඩලයේ සංයුතය කලින් ව්‍යවස්ථා සම්පාදන කෙටුම්පතේ සංයුතයට වඩා වැඩි වෙනසක් නොමැත.

## 7.5 සංචාරක උපදේශක කමිටුව.

යෝජිත සංශෝධනවලින් ද පෞද්ගලික අංශයේ වෘත්තීය සමාගම්වල නියෝජිතයන් සහ රාජ්‍ය අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වන වැඩි බලතල ඇති උපදේශක කමිටුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලසෙන අතර සියලු දෙනාම අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. එම අය අතරට පහත සඳහන් අය ඇතුළත් වෙති.

(අ) ශ්‍රී ලංකාවේ සංචාරක හෝටල් සංගමයේ නියෝජිතයන් තිදෙනෙකු

(ආ) ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමයේ එක් නියෝජිතයෙකු.

(ඇ) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ කුඩා සහ මධ්‍ය ව්‍යවසායකයන්ගේ සංගමයේ එක් නියෝජිතයකු

(ඇ) ශ්‍රී ලංකා චාරිකා නියෝජිතවරුන්ගේ සංගමයේ එක් නියෝජිතයකු

(ඊ) ජාතික ගුවන් සමාගමේ එක් නියෝජිතයකු

(උ) සංචාරක ක්ෂේත්‍රයේ කැපී පෙනෙන පුද්ගලයන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු.

අමාත්‍යවරයා විසින් (උ) හි දැක්වෙන පුද්ගලයන් අතුරෙන් එක් සාමාජිකයකු කමිටුවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබේ. කමිටුව අවශ්‍ය සෑම විටකම රැස්විය යුතු අතර මුදල් අමාත්‍යවරයාගේ උපදෙස් ඇතිව අමාත්‍යවරයා විසින් තිරණය කරනු ලැබිය හැකි පරිදි මණ්ඩලයේ අරමුදලින් කමිටු සාමාජිකයන්ට පාරිශ්‍රමිකය ගෙවිය හැකිය.

කමිටුව විසින් මණ්ඩලයට ස්වාගිමතය පරිදි හෝ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරිමස සහ ප්‍රවර්ධනය සඳහා පනතින් මණ්ඩලයට පැවරි ඇති කාර්යයන් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කමිටුව වෙත යොමු කරවනු ලබන කරුණු හෝ පිළිබඳව උපදෙස් දිය හැකිය.

## 7.6 මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සහ අංශ

අලෙවිකරණ හා ප්‍රවර්ධන අංශය, සැලසුම් හා සංවර්ධන අංශය සහ නියාමන හා තත්ව සහතික අංශය යන අංශ භාරව කටයුතු කිරීමට පිළිවෙලින් සංචාරක කටයුතු පිළිබඳ අධ්‍යක්‍ෂ ජනරාල්වරයකු සහ සංචාරක කටයුතු පිළිබඳ අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල්වරු තුන් දෙනෙකු ද මණ්ඩලය අවශ්‍යයයි අදහස් කරන පරිදි අනෙකුත් කාර්ය මණ්ඩලය ද පත් කිරීම සඳහා යෝජිත සංශෝධන වලින්ද විධිවිධාන සැලසේ.

ඉහත සඳහන් අංශවලට අමතරව මණ්ඩලය විසින් අවශ්‍යයයි අදහස් කරන පරිදි වෙනත් එවැනි අංශ පිහිටුවා ගත හැකිය.

## 7.7 සංචාරක සංවර්ධන අරමුදල.

මණ්ඩලය සතුව තිබෙන අරමුදලට (දැනට පවතින පනතින් පිහිටුවා ඇති) අමතරව සංචාරක සංවර්ධන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන වෙනම අරමුදලක් පිහිටුවීමට යෝජිත සංශෝධනවලින් විධිවිධාන සැලසෙන අතර 2003 අංක 25

දරන මුදල් පනත යටතේ එකතු කරනු ලබන අපගමන බද්ද සහ සංචාරක සංවර්ධන බද්ද එම අරමුදලට බැර කළ යුතුය.

මණ්ඩලයට සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සඳහාත් මෙම අරමුදලින් සම්පූර්ණ මුදල් ප්‍රමාණය ආයතන තුන වෙනුවෙන් වියදම් කිරීම සඳහා සංශෝධනය මගින් විධිවිධාන සැලසේ. එම ආයතන තුන පහත දැක්වේ.

1. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය

2. සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය.

3. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

පහත සඳහන් අයගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් මෙම ආයතන තුන වෙනුවෙන් වාර්ෂිකව වියදම් කළ යුතු මුදල් ප්‍රමාණය තීරණය කළ යුතුය.

1. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

2. සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

3. අලුතින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති.

සංචාරක කටයුතු සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය සඳහාද මානව සම්පත් සංවර්ධනය සඳහාදඑක් එක් ආයතනය විසින් ඉදිරිපත් කරනු ලබන අයවැය වැඩසටහන අනුව ආයතන තුන වෙනුවෙන් වියදම් කළ යුතු මුදල් ප්‍රමාණයන් තීරණය කරනු ලැබේ. සංචාරක යටිතල පහසුකම් ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රාග්ධන ආයෝජනය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ මුදල් යෙදවීම සංශෝධනය අනුව නතතම් වේ.

සංචාරක සංවර්ධන අරමුදලින් සපයනු ලබන සියලුම මුදල් විගණනය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාව අදාළ කරගැනීම සඳහාද සංශෝධනය මගින් විධිවිධාන සැලසේ.

7.8 සංචාරක සංවර්ධන ප්‍රදේශ.

අමාත්‍යවරයා විසින් අධිකාරියේ නිර්දේශය මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් යම් ප්‍රදේශයක් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබීම සඳහා 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 11 වැනි කොටසේ iv වැනි පරිච්ඡේදයේ විධිවිධාන සලසා ඇත.

1966 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ සංශෝධනයෙහි දැනටමත් මෙම විධිවිධානය ඇතුලත්ව තිබෙන බැවින් යෝජිත සංශෝධනයේ එවැනි විධිවිධානයක් සැලසීමේ අවශ්‍යතාවක් නොමැති බවට කමිටුව අදහස් කරයි. අවශ්‍යනම් එය පුළුල් කළ හැකිය.

තවද අධිකාරිය විසින් ජාතික පාරිසරික පනත සහ පුරාවස්තු ආඥාපනත යටතේ බලතල ක්‍රියාවේ යෙදවීමට පනතේ 29 වගන්තියේ සළසා ඇති විධිවධාන කවරදාක නමුත් ක්‍රියාත්මක කළ හැකිද යන්න පිළිබඳව කමිටුවට සැකයක් ඇති වේ.

7.9 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ iv කොටස, ix වැනි පරිච්ඡේදය.

1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ ඇතැම් විධිවිධාන ඉවත් කිරීමෙත් සංචාරක සේවා සම්බන්ධයෙන් මිල, ගාස්තු රේට් ප්‍රමාණ සහ අයකිරීම් විධිමත් කිරීම සහ සංචාරක ව්‍යවසායන් සහ සංචාරක සේවා ලියාපදිංචි කිරීම සඳහා 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනතේ iv වන කොටසේ 100 වන පරිච්ඡේදයේ විධිවිධාන සලසා ඇත.

අවලංගුකර තිබෙන 1998 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ iv වන කොටසේ දැනටමත් එවැනි විධිවිධාන සලසා තිබෙන විට නව පනතේ එබඳු විධිවිධානයක් සලසා ඇත්තේ කුමක් නිසාද යන්න අවබෝධ නොවේ. විවිධ නීති සංග්‍රහ යටතේ දැන් පවතින රෙගුලාසි සම්බන්ධයෙන් කිසියම් විරෝධතාවයක් තිබේද යන්න පිළිබඳව කමිටුව හමුවේ අදහස් දැක්වීම් ඉදිරිපත් කළ වාරික වෘත්තීය සංගම්වලින් විමසා සිටිවිට ඔවුන් කියා සිටියේ ඒ පිළිබඳව විරෝධතාවක් නොමැති බවය. දැනට පවතින රෙගුලාසි පද්ධතිය දශක දෙකක් තිස්සේ

ක්‍රියාත්මක වෙමින් පවතින අතර චාරිකා වෘත්තීය සමාගම්වලින් ඒ සම්බන්ධයෙන් මෙතෙක් දක්වා ඇති ප්‍රතිචාර ධනාත්මක වේ.

අනෙක් අතට දැනට පවත්නා රෙගුලාසි දැඩි කිරීම නව විධිවිධානයේ අරමුණ වූයේ නම්, සංචාරක කර්මාන්තයේ සීමා ඉවත් කිරීමට සහ ලිහිල් කිරීමට දැන් පවතින ප්‍රවනතාවයන්ට එරෙහිවීමකි. එසේ හෙයින්, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ ඇතුලත් දැනට පවතින නියමන පාඨක ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍යවන බව කමිටුව අදහස් නොකරයි.

## 7.10 ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය.

දැනට වගකීමට බැඳී සිටින සීමාසහිත සමාගමක් වන ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත්කිරීම සඳහා සංචාරක පනතේ විධිවිධාන සලසා ඇත. දැනට පවතින සමාගම මෙතෙක් යහපත් අත්දමින් ක්‍රියාත්මක වන අතර රැස්වීම්, දිරි ගැන්වීම්, සම්මේලන සහ ප්‍රදර්ශන වෙළඳපොළ විශාල ප්‍රමාණයකින් සංවර්ධනය කිරීම සාර්ථකව ඉටුකර ඇති බැවින්, එම කාර්යාංශය ස්වාධීන ආයතනයක් බවට පත් කිරීමට ඇති හේතුව කොතනක හෝ පැහැදිලි කර නොමැත. බොහෝ විට අනෙකුත් ව්‍යස්ථාපිත ආයතන සමග සම තත්වයට ගෙනඒමටත් සංචාරක සංවර්ධන අරමුදලේ ප්‍රතිලාභියකු බවට මෙම ආයතනය පත් කිරීමටත් මෙය සිදුකර තිබිය හැකිය.

සම්මේලන කාර්යාංශය ජාත්‍යන්තර සංචාරක වෙළඳපොලේ නිශ්චිත බණ්ඩයන් ප්‍රවර්ධනය කිරීම එනම්, ජාත්‍යන්තර රැස්වීම් සම්මේලන සහ ප්‍රදර්ශන වෙනුවෙන් සහභාගීවීම පිණිස සංචාරය කරන අය සහ ආරම්භක පැකේජ මත සංචාර කරන අය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පිහිටුවා ඇති විශේෂඥ ආයතනයකි. එබැවින්, සාමාන්‍යයෙන් නිවාඩු ගත කිරීම පිණිස යන අයගේ සහ විනෝද සංචාර සඳහා යන අයගේ අවශ්‍යතාවන්වලට වඩා එම අයගේ අවශ්‍යතාවන් බෙහෙවින් වෙනස්වේ. තවද මෙම වර්ගයේ සංචාර මෙහෙයවීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ක්‍රමද බෙහෙවින් වෙනස්වේ. ඔවුන්ට විශේෂ පහසුකම් සහ ඔවුන් සම්බන්ධයෙන් කටයුතු මෙහෙයවීමට විශේෂ පුහුණු නිලධාරීන් අවශ්‍ය වේ. එබැවින් මෙම විශේෂ පහසුකම් සහ විශේෂඥ සේවා සැපයිය හැකි හෝටල් අයිතිකරුවන්ට සහ චාරිකා නියෝජිතවරුන්ට පමණක් මෙම චාරිකාවලින් ප්‍රතිලාභ ලබාගත හැකිය.

එසේ හෙයින් සම්මේලන කාර්යාංශය සාමාජික සංවිධානයකි. අවශ්‍ය පහසුකම් සහ සේවා සැපයිය හැකි හෝටල් අයිතිකරුවන්ට, චාරිකා නියෝජිතවරුන්ට සහ පහසුකම් මෙහෙයවන අයට පමණක් එහි සාමාජිකයන් විය හැකිවන අතර, එබඳු චාරිකා සංවර්ධනය කිරීමෙන් ප්‍රතිලාභ ලැබිය හැක්කේද එම අයට පමණි.

ඉහත පැහැදිලි කළ හේතු අනුව සම්මේලන කාර්යාංශය තිබෙන ආකාරයටම එය පවත්වාගෙන යාමට ඉඩ සැලසිය යුතු බවත්, සංචාරක සංවර්ධන අරමුදලේ මුදල් කොටසක් කාර්යාංශයටද ලබා ගැනීමට අවශ්‍ය විධිවිධාන සැලැස්විය යුතු බවත් කමිටුව අදහස් කරයි.

**7.11 ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය.**

මෙම ආයතනයේ ඓතිහාසික සංවර්ධනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ද සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයක් මගින් එය කළමනාකරණය කළ යුතු වන්නේ කුමක් නිසාද යන්න පිළිබඳ හේතුද මෙම වාර්තාවේ 4 වැනි පරිච්ඡේදයේ දැක්වේ.

එසේ හෙයින්, පාලක මණ්ඩලයක් විසින් එය කළමනාකරණය කිරීම සඳහා වෙනම ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවිය යුතු බවට කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ. මේ සඳහා අවශ්‍යවන ව්‍යවස්ථා සම්පාදන කෙටුම්පත "ආ" අතිරේකයේ දැක්වේ.

මෙම අයාතනය රටේ ප්‍රධාන අධ්‍යාපනික හා පුහුණු ආයතනයක් බවට පත් කළ යුතු බැවින්, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වැඩි බලතල ඇති පාලක මණ්ඩලයක් විසින් එය කළමනාකරණය කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වැඩි බලතල සහිත උපදේශක සභාවක් විසින් එයට සහය ලබාදිය යුතුය. ඒ අනුව පාලක මණ්ඩලයේ සහ උපදේශක සභාවේ නිර්දේශ කරන ලද සංයුතය පහත සඳහන් පරිදිවේ.

පාලක මණ්ඩලය :-

1. සංචාරක කටයුතු පිළිබඳ අමාතයාංශයේ ලේකම්, සභාපතිවරයා වශයෙන් පත් කළ යුතුය.

2. වෘත්තිය පුහුණු අමාත්‍යාංශයේ ලේකම්.

3. පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්

4. මුදල් අමාත්‍යාංශයේ ලේකම්

5. අලුතින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ සභාපතිවරයා.

6. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා.

7. ආගන්තුක සත්කාර සහ සංචාරක කළමනාකරණ ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්ද ලබා ඇති තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන එක් සාමාජිකයකු.

උපදේශක සභාව :-

1. සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සභාපතිවරයා වශයෙන් පත් කළ යුතුය.

2. හෝටල් පාසල් උපාධිධාරි සංගමයේ නියෝජිතයන් දෙදෙනෙකු

3. ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයේ නියෝජිතයන් දෙදෙනෙකු

4. ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමයේ එක් නියෝජිතයකු

5. ශ්‍රී ලංකා චාරිකා නියෝජිතවරුන්ගේ සංගමයේ එක් නියෝජිතයකු

6. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ කුඩා හා මධ්‍යම ව්‍යවසාය සංගමයේ එක් නියෝජිතයකු

7. ජාතික තියමු කථිකාචාර්යවරුන්ගේ සංගමයේ එක් නියෝජිතයකු.

සංචාරක නියමුවන් රට වෙනුවෙන් නිල තොලත් තානාපතිවරුන් වශයෙන් කටයුතු කළ යුතු බැවින් ඔවුන්ට වෘත්තීය පුහුණුවක් ලබාදීම පිළිබඳව මහින්ද වින්නනයේ නිශ්චිතව සඳහන් වන බව මෙහිලා සඳහන් කළ යුතුය.

ඉහත සඳහන් කළ ආකාරයට යළි පිහිටුවනු ලබන කළමනාකරණ ආයතනය ආසියාතු කලාපයේ විශිෂ්ට මධ්‍යස්ථානය ලෙසට පත්වන බවට අපේක්ෂා කෙරේ. එහි මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමාණවත් මූල්‍ය සම්පත් සහිතව පහසුකම් ඇති ගොඩනැගිල්ලක දැනට පිහිටා ඇති බැවින්, සියලුම පූර්ව අවශ්‍යතා එය සතුව පවතී.

එම ආයතනයේ නිර්මාතෘවරයාට උපහාර දැක්වීම පිණිස සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය යනුවෙන් එය නම්කළ යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

# පරිශිෂ්ට

## (අ) පරිශිෂ්ටය.

### කාර්ය සැලැස්මේ සාරාංශය

(1) පෙබරවාරි 1 - 7 (වැඩ කරන දින 05)

- ➢ කාර්යාලය පිහිටුවීම
- ➢ අදාල ලිපි ලේඛන එක්රැස් කිරීම.

(2) පෙබරවාරි 8 - 15 (වැඩ කරන දින 06)

(අ) කාර්ය සැලැස්ම සැකසීම
(ආ) ආරම්භක වාර්තාව සැකසීම
(ඇ) ගරු අමාත්‍යවරයා වෙත ආරම්භක වාර්තාව ඉදිරිපත් කිරීම

(3) පෙබරවාරි 16 - මාර්තු 07 (වැඩ කරන දින 14)

(අ) අදාල ලිපි ලේඛන අධ්‍යයනය කිරීම.
(ආ) පරිශිෂ්ටයේ දැක්වෙන තොරතුරු ලබාගැනීමට භාවිතා කළ ලිපිලේඛන පිළිබඳ ලැයිස්තුව

(4) මාර්තු 08 - මාර්තු 23 (වැඩ කරන දින 11)

(අ) කොටස්කරුවන් විසින් කරුණු දැක්වීම් ඉදිරිපත් කිරීම.
(ඇ) පරිශිෂ්ටයේ දැක්වෙන කොටස්කරුවන්ගේ ලැයිස්තුව.

(5) මාර්තු 24 සිට අප්‍රේල් 02 දක්වා (සතිඅන්ත ඇතුළුව දින 10-

(ඇ) අධ්‍යයන චාරිකා - ජාතික සංචාරක සංවිධානවල ව්‍යුහය අධ්‍යයනය කිරීම සඳහා තෝරාගත් රටවල් කීපයක සංචාරය කිරීම.

යෝජිත රටවල්

1. සිංගප්පූරුව
2. තායිලන්තය
3. සීෂෙල්ස්

සටහන : කාර්ය සැලැස්ම ඇතුළත් ආරම්භක වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබුවද, සිංගප්පූරුව, තායිලන්තය සහ සීෂෙල්ස් යන රටවල යෝජිත අධ්‍යයන සංචාර සඳහා අවශ්‍ය අනුමැතිය සංචාරක මණ්ඩලයට ලබා ගැනීමට නොහැකිවූ බැවින් එම සංචාරවල යෙදීමට නොහැකි විය.

(6) අප්‍රේල් 03 - අප්‍රේල් 28 (වැඩ කරන දින 18)

- තොරතුරු සැකසීම සහ අවසාන වාර්තා කෙටුම්පත සකස් කිරීම.
- අවසාන වාර්තා කෙටුම්පත පිළිබඳ අවයුතු අවසන් කිරීම.
- ගරු අමාත්‍යවරයා වෙත අවසාන වාර්තාව ඉදිරිපත් කිරීම.
- කාලසීමාව - සතිඅන්ත සහ ප්‍රසිද්ධ නිවාඩු දින ඇතුළුව සති 12, වැඩ කරන දින 58

සටහන : කාර්ය සැලැස්ම සඳහා අනුමැතිය ලබාදෙන ලෙසටත්, රංජිත් පෙරේරා මහතා සහ ආනන්ද කස්තුරිආරච්චි මහතා (නීතිඥ) නොසිටි බැවින් ඇතිවූ පුරප්පාඩු පිරවීම සඳහා අලුතින් සාමාජිකවරුන් දෙදෙනෙකු පත් කරන ලෙසත් ඉල්ලීමක් කරමින් 2006 පෙබරවාරි 73 දින ගරු අමාත්‍යවරයා වෙත ආරම්භක වාර්තාව ඉදිරිපත් කරන ලදි. කෙසේ වුවද 2006 මාර්තු 6 වැනි දින දක්වා පත්වීම් සිදු කිරීමේ ප්‍රමාදයක් ඇතිවූ බැවින් සතිතුනක පමණ කාලයක් කමිටුවට කාර්යක්ෂම ලෙස කටයුතු කිරීමට නොහැකි විය. මේ නිසා 2006 මැයි මාසයේ සිව්වැනි සතිය දක්වා කමිටු වාර්තාව පිළිබඳ කටයුතු අවසන් කිරීමටත්, එය ඉදිරිපත් කිරීමටත් ප්‍රමාද විය.

## (ආ) පරිශිෂ්ටය

තොරතුරු ලබාගැනීමට භාවිතා කළ ලිපි ලේඛන පිළිබඳ ලැයිස්තුව.

1. මැතිවරණ පකාශය - මහින්ද චින්තනය

2. 2005 ඔක්තෝබර් මාසයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නව සංචාරක නීතිය

3. ලංකා සංචාරක මණ්ඩලය පතිව්‍යුහගත කිරීම පිළිබඳ හැරි සෙල්වනාදන් කමිටු වාර්තාව - 2004

4. සංචාරක කටයුතු අලෙවිකරණය සහ ප්‍රවර්ධනය සඳහා වගකීමට බැඳී ඇති සීමාසහිත සමාගමක් පිහිටුවීම පිණිස අස්කර් මූසාජි මහතාගේ ප්‍රධානත්වයෙන් පත්කළ සංචාරක කටයුතු පිළිබඳ විශේෂඥ මණ්ඩලය විසින් සකස් කරන ලස සාංගමික සංස්ථා පත්‍රය සහ ව්‍යවස්ථාවලිය පිළිබඳ කෙටුම්පත - 2000

5. සංචාරක මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා එම්.වයි.එම්. තහීර් මහතාගේ ප්‍රධානත්වයෙන් පත් කළ සංචාරක කටයුතු පිළිබඳ විශේෂඥ මණ්ඩලයේ නිර්දේශය මත සකස් කළ ව්‍යවස්ථා සම්පාදක කෙටුම්පත - 1999

6. සංචාරක කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකායේ වාර්තාව - 1998

7 ශ්‍රී ලංකා සංචාරක සභාවක් පත් කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස ව්‍යවස්ථා සම්පාදක කෙටුම්පත.

8. ශ්‍රී ලංකා සංචාරක සභාවක් පත් කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස වෙනස් කිරීම් සිදු කරන ලද ව්‍යවස්ථා සම්පාදන කෙටුම්පත.

9. සීමාසහිත පෝස්ටර් ඇන්ඩ් රිඩ් (පෞ) ආයතනය විසින් ලංකා සංචාරක මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිස්ථානගත කිරීම සඳහා සකස් කරන ලද වාර්තාව - 2003

10 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත.

11. 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත

12. 1966 අංක 14 දරන ලංකා හෝටල් සංස්ථා පනත

13. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - සාංගමික සංස්ථා පත්‍රය සහ ව්‍යවස්ථාවලිය.

14. 1971 අංක 38 දරණ මුදල් පනත

15 අපගමන බද්ද සහ සංචාරක සංවර්ධන බද්ද පැනවීම සඳහා විධිවිධාන සලසා ඇති 2003 අංක 25 දරණ මුදල් පනත.

16. "පීටොම්ස්" (පීටීඑඑම්එස්) පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

17. සිංගප්පූරුව, තායිලන්තය, හොංකොං සහ සීෂෙල්ස් යන අනෙකුත් රටවල්වල ජාතික සංචාරක සංවිධාන පිළිබඳ සංසන්දනාත්මක ව්‍යවස්ථා සම්පාදනය.

18. 2002, 2003, 2004 සහ 2005 යන වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ආදායම් ගිණුම.

19. පත්වීම් කළ අවස්ථාවේ සිට "බීටෝ" ගේ අලෙවිකරණ වැඩසටහන.

20. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය - සංචාරක සංවර්ධන බද්ද.

21. ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකාවේ සංචාරක හෝටල් සංගමයේ ව්‍යවස්ථා.

22. ඒකාබද්ධ සංචාරක සභාවේ ව්‍යවස්ථාව.

23. ජාතික හා සංචාරක සංවිධානයේ ව්‍යුහය පිළිබඳ එ.ජා./ලෝ.ස.ස. අධ්‍යයනය.

24. ජාතික හා ප්‍රාදේශිය සංචාරක සැලසුම්කරණය - ක්‍රමවේද සහ විෂයානුබද්ධ අධ්‍යයනය.

25. 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ සාධන ලද නියෝග.

(මෙය සවිස්තර ලැයිස්තුවක් නොවේ.)

## (ඇ) පරිශිෂ්ටය

කමිටුව වෙත අදහස් දැක්වීම් ඉදිරිපත් කළ කොටස්කරුවන්ගේ ලැයිස්තුව.

(අ) පෞද්ගලික අංශයේ වෘත්තිය සංගම්.

1. ශ්‍රී ලංකාවේ සංචාරක හෝටල් සංගමය
2. ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමය
3. ශ්‍රී ලංකා චාරිකා නියෝජිත සංගමය
4. හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමය
5. ශ්‍රී ලංකා ජාතික සංචාරක තියමු කථිකාචාර්යවරුන්ගේ සංගමය
6. ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍යම සංචාරක ව්‍යවසාය සංගමය
7. ශ්‍රී ලංකා පිජ්ටිජ් ශාඛා සමිතියේ සභාපති

(ආ) රාජ්‍ය අංශයේ නියෝජිත ආයතන.

1. සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය - ලේකම් සහ අතිරේක ලේකම්.
2. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - සභාපති සහ සාමාන්‍යාධිකාරී

3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ විදුහල්පති

4. කාර්ය මණ්ඩල සඳහා සාධක සංගමය. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය

(ඇ) පුද්ගලයන්

1. චන්ද්‍රා වික්‍රමසිංහ මහතා - සභාපති, කනයිසන්ස් හෝල්ඩින්ස් ආයතනය (Connaissance Holdings)

2. රංජිත් ද සිල්වා මහතා - කළමනාකරු - ඊ.ස.දි.ස සහ ප්‍ර. ප්‍රවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ගුවන් සේවය.

3. වෝල්ටර් රූපසිංහ මහතා - කලින් පැවති ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්.

4. අශෝක ප්‍රනාන්දු මහතා - හෝටල් පාසලේ උපාධිධාරී සහ ලංකා හෝටල් සංස්ථාවේ හිටපු සභාපති.

5. මහාචාර්ය චන්දන ජයවර්ධන - සේවය සේවයේ නියුතු උපදේශක

6. සුනිල් සේනානායක මහතා - සඹුහ චාරිකා නියෝජිතයන්ගේ සංගමයේ හිටපු සභාපති.

7. කුමාර් මල්ලිමාරච්චි මහතා - ලංකා හෝටල් සංස්ථාවේ සහ හෝටල් සංගමයේ හිටපු සභාපති.

8. පැඩී විතාන - හිටපු සභාපති, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩයල

9. උදය නානායක්කාර මහතා - සභාපති, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය

10. එස්. කලෙසෙල්වම් - අධ්‍යක්ෂ ජනරාල්. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය

11. සනත් උක්වත්ත මහතා - සභාපති. ගල්කිස්ස හෝටලය

12. තිලක් වීරසිංහ මහතා - සභාපති. ස්පෝට්ස් රිසාන් (Spports Rizen)

13. සරත් සෙනෙවිරත්න මහතා - හෝටල් පාසලේ හිටපු විදුහල්පති.

(ඇ) පරිශිෂ්ටය

2005 අංඛ 38 දරන සංචාරක කටයුතු පනත පිළිබඳ නෛතික මතය.

1. හැඳින්වීම.

2005 නොවැම්බර් 30 දින 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත සහතික කරන ලද නමුදු එම පනතේ 1 වන වගන්තිය අනුව එය ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් තවමත් දිනයක් නියම කළ යුතුව ඇති බැවින් එය තවමත් ක්‍රියාත්මක නොවී පවතී. මේ හැරුණුවිට එම පනතේ 67(1) වන වගන්තිය අනුව සංචාරක කටයුතු පනත ක්‍රියාත්මක වූ විට 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩලය අහෝසි වන නමුදු එම අහෝසිවීම ක්‍රියාත්මක විය යුතු දිනයක් ගරු අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් නියම කළ යුතුය. මෙම පනතේ කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් වැරදි කිසිවක් තිබේ නම්, එම වැරදි නිවැරදි කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව මගෙන් අදහස් විමසන ලදී. මෙම පනතේ කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් වැරදි කීපයක්ම තිබෙන අතර, පනත ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අමාත්‍යවරයා විසින් දිනයක් නියම කිරීමට පෙර වහා ව්‍යවස්ථා සම්පාදක කටයුතු කළයුතු ඇතැම් බරපතල වැරදි කීපයක්ද ඇත. සුළු වැරදි කීපයක්ද තිබෙන අතර බරපතල වැරදි සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවේදී එය වැරදි ද නිවැරදි කළ හැකිය.

එම වැරදි සුළු හෝ බරපතල වැරදි වුවද ඒවා නිවැරදි කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරමින් මාතෘකා කිපයක් යටතේ පහසුව සඳහා එම සියලු වැරදි සඳහන් කර ඇත.

2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

සංචාරක කටයුතු පනතේ 4 වන වගන්තිය අනුව සංචාරක සංවර්ධන අධිකාරිය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පුද්ගලයන් කිපදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. 5(2), 5(7), 5(8) සහ 5(9) උප වගන්තිවල "පත් කරන ලද" යනුවෙන් යොදා ඇති වචන අතිරික්ත වන අතර නොමඟ යවනු සුළුය. යෝජිත නිර්දේශය - 5(2), 5(7), 5(8) සහ 5(9) උප වගන්තිවල "පත් කරන ලදි" යන වචනය ඉවත් කළ යුතුය.

3. අධිකාරියේ රැස්වීම්වල මුලසුන ගැනීම.

අධිකාරියේ සභාපති එහි සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතු බව පනතේ 7(1) උප වගන්තියේ දැක්වේ. එවැනි යම් රැස්වීමක සභාපති නොමැති අවස්ථාවකදී සාමාජිකයන් විසින් තෝරාපත් කරනු ලබන යම් සාමාජිකයකු විසින් එම රැස්වීමක මුසලසුන දැරිය යුතුය. 11(2) වගන්තියේ මෙය නැවත අනවශ්‍ය ලෙස සඳහන් කර ඇත.
යෝජිත නිර්දේශය - 11(2) වගන්තිය ඉවත් කළ යුතුය.

4. විගණකාධිපති විසින් විගණනය කිරීම

අධිකාරියේ ගිණුම් සංචාරක කටයුතු පනතේ 20(2) උප වගන්තියෙන් අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු බව දැක්වේ. මෙය සඳහන්කර නොතිබුණත් 154(1) ව්‍යවසථාවේ විගණකාධිපති විසින් රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කළ යුතුය යනුවෙන් සඳහන්වන බැවින් කවර හෝ අවස්ථාවකදී 154 වැනි ව්‍යවස්ථාව අදාළවේ. "රාජ්‍ය සංස්ථාව" යන්නෙන් රජය විසින් ණය ප්‍රදානය වශයෙන් හෝ අන්‍යාකාරයකින් අර්ධ වශයෙන් නැතහොත් සම්පූර්ණයෙන් ප්‍රාග්ධනය හෝ මුදල් සපයනු ලබන සමාගම් ආඥා පනත හැර අනෙකුත් ඕනෑම ලිඛිත නීතියකින් හෝ එවැනි නීතියක්

යටතේ හෝ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලබන ඕනෑම සංස්ථාවක්, මණ්ඩලයක් හෝ ආයතනයක් අදහස් වේ යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ සඳහන්ව ඇත.

වැඩි ප්‍රවේසම් වශයෙන් 20(2) වන උප වගන්තියෙන් විධිවිධාන සලසා ඇති වුවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) අ ව්‍යවස්ථාවෙන් පහත සඳහන් වන පරිදි විධිවිධාන සලසා ඇති බැවින් විගණකාධිපතිවරයා අවශ්‍යවන අවස්ථාවකද සුදුසුකම් ලත් විගණකවරුන්ගේ සේවය ලබාගැනීමට බලය පවරමින් 20(5) උප වගන්තියේ විධිවිධාන සලසා තිබීම යුක්ති සහගත නොවේ. "විගණකාධිපතිවරයා විසින් තම කටයුතු සහ කාර්යයන් කිරීම හා ඉටු කිරීම සඳහා තම විධානය සහ පාලනය යටතේ ක්‍රියා කරන සුදුසුකම් ලත් විගණකවරයකුගේ විගණකවරුන්ගේ සේවය ලබාගැනීමට හැකිය." යනුවෙන් එම විධිවිධාන සලසා ඇත.

යෝජිත නිර්දේශය - 20(5) වන උප වගන්තිය ඉවත් කළ යුතුය.

5. සංචාරක සංවර්ධන අරමුදලේ ගිණුම් විගණනය කිරීම.

23(1) උප වගන්තිය සංචාරක සංවර්ධන අරමුදලක් පිහිටුවීම සම්බන්ධයෙන් අදාළ වේ. "අරමුදලේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ (8) වන ඡේදයට අනුකූලව විගණනය කරනු ලැබිය යුතුය" යනුවෙන් 23(4) වන උප වගන්තියේ දැක්වේ. 154 ව්‍යවස්ථාවේ (8) වන ඡේදයේ "සුදුසුකම්ලත් විගණනවරයකු" සම්බන්ධයෙන් අර්ථ නිරූපනය දැක්වෙන බැවින් මෙහි තේරුමක් නැති අතර, එය ප්‍රකටව පෙනෙන වරදකි.

යෝජිත නිර්දේශ - 23(4) වන උප වගන්තියේ "(8) වන ඡේදය" යනුවෙන් සඳහන් වචන ඉවත් කළ යුතුය. පැහැදිලි කිරීමේ හේතු දැක්වීම සඳහා විගණකාධිපතිවරයා විසින් විගණනය කිරීම සම්බන්ධයෙන් 23(4) වන උප වගන්තියේ අන්තර්ගතව ඇති විධිවිධාන 23 වන වගන්තියේ අන්තිම උප වගන්තිය ලෙස දැක්විය යුතුය.

6. මුදල් පනත - ව්‍යවස්ථානුකූල විධිවිධාන සහ සංචාරක කටයුතු පනත.

"1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍රලත් සෑම ආයතනයකම පිරිවැටුම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2003 අංක 25 දරන මුදල් පනතේ 12 වන වගන්තිය ප්‍රකාර සංචාරක සංවර්ධන බද්දක් පනවා, අය කොට, එකතු කළ යුතුය." යනුවෙන් සංචාරක කටයුතු පනතේ 24(1) වන උප වගන්තියේ දැක්වේ. මෙම උප වගන්තියේ සඳහන්වන අධ්‍යක්ෂ ජනරාල්වරයා පැහැදිලිවම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

24(1) වන වගන්තියේ වචන යොදා තිබීම සහ කෙටුම්පත් කිරීමේ අඩුපාඩුකම් වටහා ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 වන ව්‍යවස්ථාව සහ 2003 අංක 25 දරණ මුදල් පනත සම්බන්ධයෙන් සඳහන් කළ යුතුව ඇත. "කිසියම් බද්දක් පැනවීමට බලය පැවරීමේ ව්‍යවස්ථා කෙටුම්පතක් හෝ යෝජනාවක් අමාත්‍ය මණ්ඩලය විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් බලය පැවරිය හැකි ආකාරයකින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, අමාත්‍යවරයකු විසින් හැර එවැනි කිසිදු ව්‍යවස්ථා කෙටුම්පතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් නොකළ යුත්තේය." යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 වන ව්‍යවස්ථාවේ සඳහන් වේ. බද්ද යන වචනය අර්ථ නිරූපනය කර දක්වා නොමැත. අය බද්ද යන වචනයට "බද්දක්" යන්න ඇතුලත් වන බවට කිසිදු සැකයක් නොමැත. 2003 අංක 25 දරන මුදල් පනතින් පහත දැක්වෙන බදු දෙවර්ගයක් පැනවීම සඳහා විධිවිධාන සලසා ඇත.

(1) අපගමන බද්ද - මෙම බද්ද මෙහෙයුම්කරු විසින් එකතුකර "නිසි බලධාරියා"ට ගෙවිය යුතුය. නිසි බලධාරියා යනුවෙන් අදහස් වන්නේ සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ (ගුවන් යාත්‍රා පිළිබඳ) අධ්‍යක්ෂවරයා හෝ වෙළඳ නැව් ගමනා ගමනය පිළිබඳ අධ්‍යක්ෂවරයාය. (වෙළඳ නැව් පිළිබඳ) නිසි බලධාරියා විසින්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා නිකුත් කරන උපදෙස් අනුව එකතු කරනු ලබන මුදල් ගෙවිය යුතුය. මුදල් පනතේ 5(1) වන උප වගන්තියේ ("නිසි බලධාරියා විසින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය."

යනුවෙන් සඳහන් නොවුවද, එම උප වගන්තියේ තිර සටහනේ එසේ සඳහන්ව ඇත.)

(2) සංචාරක සංවර්ධන බද්ද - 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍ර ලබා ඇති සෑම ආයතනයකින් මෙම බද්ද අයකරනු ලැබේ. කවර හෝ වර්ෂයක එවැනි ආයතනයක පිරිවැටුම මත සියයට එකක් බැගින් මෙම බද්ද අයකරනු ලැබේ. මුදල් පනතේ 13 වන වගන්තියේ "පිරිවැටුම" යන යෙදීම "සංචාරක හෝටලයක්" "චාරිකා නියෝජිතවරයකු" සහ සංචාරක වෙළඳ සැලක් සම්බන්ධයෙන් පමණක් නිර්වචනය කර දැක්වේ. මුදල් පනත අනුව මෙම බද්ද එකතු කරනු ලබන්නේ ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්ය. ඔහු විසින් අයකරනු ලබන මුදල් රඳවා තබාගෙන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයා වෙත වාර්තා ඉදිරිපත් කළ යුතුය.

යෝජිත නිර්දේශ - 2003 අංක 25දරන මුදල් පනත පහත සඳහන් ලෙස සංශෝධනය කළ යුතුය. (1) 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍ර ලබා ඇති සෑම ආයතනයක් "යන පාඨවලට පසුව පහත සඳහන් පාඨය එනම්" සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත යටතේ" යන්න එකතු කළ යුතුය. (2) 12 වන සහ 13 වන වගන්තිවල "සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්" යන්න වෙනුවට "ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් ආදේශ කළ යුතුය.

7. සංචාරක සංවර්ධන අරමුදලින් සිදු කරනු ලබන ගෙවීම්.

සංචාරක සංවර්ධන අරමුදලින් සිදු කිරීමට නියමිත ගෙවීම් සම්බන්ධයෙන් 23(3), 24(8) සහ 24(9) යන උපවගන්ති අතර සංචාරක කටයුතු පනතේ විධිවිධානවල යම් අතිරික්තයක් සහ පරස්පර විරෝධී කරුණු ඇත. 23 (2) උපවගන්තිය යටතේ අපගමන බද්ද වශයෙන් එකතු

කරනු ලබන මුදල් ප්‍රමාණයෙන් තුනෙන් එකක මුදල් ප්‍රමාණයක් ද 24(1) වන උපවගන්තිය අනුව එකතු කරනු ලබන සහ 24 (8) වන උපවගන්තිය අනුව අරමුදලට ගෙවනු ලබන සංචාරක සංවර්ධන බද්දෙන් ද සංචාරක සංවර්ධන අරමුදල සමන්විත වේ.

(අ) සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ සංවර්ධනය උදෙසා සාදනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ සංවර්ධනය කිරීමේදී යම් සංවිධානයක් හෝ යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලුමුදල් සහ

(ආ) ඒ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල් ගෙවනු ලැබිය යුතුය" යනුවෙන් 23 (3) වන උපවගන්තියේ දැක්වේ.

"අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බදු ආකාරයෙන් රැස් කරන ලද මුදල් 23 වන වගන්තයේ (1) වන උප වගන්තිය යටතේ පිහිටුවන ලද සංචාරක සංවර්ධන අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර අරමුදලේ බැරට ඇති සියලු මුදල් පහත දැක්වෙන ආකාරයට වැය කරනු ලැබිය යුතුය" යනුවෙන් 24(8) වන උප වගන්තියේ දැක්වේ.

(අ) සියයට හැත්තෑවක (70%) ප්‍රමාණයකින් යුත් මුදලක් 40 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට ගෙවනු ලැබිය යුතුය.

(ආ) සියයට දොළහක (12%) ප්‍රමාණයකින් යුත් මුදලක් 33 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට ගෙවනු ලැබිය යුතුය.

(ඇ) සියයට දාහතරක (14%) ප්‍රමාණයකින් යුත් මුදලක් අධිකාරියට ගෙවනු ලැබිය යුතුය.

සහ

(ඇ) සියයට හතරක (4%) ප්‍රමාණයකින් යුත් මුදලක් 42 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට ගෙවනු ලැබිය යුතුය."

"බදු ආකාරයෙන් රැස් කරනු ලැබ (8) වන උප වගන්තියේ දක්වා ඇති ආකාරයෙන් වැය කරනු ලැබ ඇති මුදල් ශ්‍රී ලංකා සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා ඊට අදාළ අලෙවි කටයුතු කිරීම සම්බන්ධව ගෙවීම් කිරීමේ කාර්ය සඳහා හුදෙක්ම භාවිත කරනු ලැබිය යුතුය." යනුවෙන් 24(9)වන උප වගන්තියේ දැක්වේ.

පළමුව, සංචාරක සංවර්ධන අරමුදලේ ඇති සියලුම මුදල් (100%) කොපමණ ප්‍රමාණයකින් වියදම් කළ යුතුද යන්න පිළිබඳව 24 (8) වන උපවගන්තියේ අවසාන කොටසේ සඳහන්ව තිබීම සැලකිල්ලට ගැනීමේදී 23(3) සහ 24(9) වන උපවගන්තිවල එම මුදල් වියදම් කළයුතු ආකාරය නිශ්චිතව දක්වා තිබීම අතිරික්තයක් ලෙස සඳහන් කිරීමක් බව පෙනී යයි. දෙවනුව ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා ඊට අදාළ අලෙවි කටයුතු කිරීම සම්බන්ධව ගෙවීම් කිරීමේ කාර්ය සඳහා අරමුදල හුදෙක් භාවිතා කරනු ලැබිය යුතුය යන්න 24(9) වන උප වගන්ති සඳහන්වන බැවින් 24(8) වන උප වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි අරමුදලෙන් 12% ප්‍රමාණයකින් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට ගෙවීම සම්බන්ධයෙන් අදාළව තිබෙන විධිවිධානය සමඟ ගැටීමක් ඇතිවේ. තුන්වනුව 24(9) වගන්තියේ බද්ද ගැන සඳහන් වන අතර 24 වන වගන්තියේ සංචාරක සංවර්ධන බද්ද ගැන පමණක් සඳහන්වී ඇත. සිව්වනුව, (8) වන උපවගන්තිය ප්‍රකාරව වැය කරනු ලබන මුදල් අරමුදලට ඇතුළත්ව තිබෙන බදු දෙවර්ගය යටතේ එකතු කරන ලද මුදල් වන බැවින් බදු ආකාරයෙන් එකතු කරනු ලබන මුදල් (8) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයෙන් වැය කළ යුතු බව 24(9) වන වගන්තියේ සඳහන්වන විට එය කරුණුමය වශයෙන් වැරදි සහගත වේ.

යෝජිත නිර්දේශ :

(1) 23(3) වන උප වගන්ති ඉවත් කළ යුතුය.

(2) 24(9) වන උප වගන්තිය ඉවත් කළ යුතුය.

(3) 24(8) වන උප වගන්තියේ "සියයට සියයකින්" යනුවෙන් සඳහන් කිරීම උචිතය.

## 8. සංචාරක සංවර්ධන ප්‍රදේශ.

ප්‍රකාශිත සංචාරක සංවර්ධන ප්‍රදේශ ඇතුළත ඒ ප්‍රදේශයේ ඇති පහසුකම් පුද්ගලයන් විසින් භුක්ති විඳීමට එම පුද්ගලයන් සතුවන පෞද්ගලිකත්වය 28(1) වන උප වගන්තියෙන් ආරම්භවී ඇති අතර. ඒ වෙනුවෙන් සාදන ලද නියෝග කඩකිරීම දඬුවම් ලැබිය යුතු වරදක් ලෙස දක්වා ඇත. "වෙනත් යම් තැනැත්තකුගේ පුද්ගලිකත්වයට මැදිහත් වෙමින් යම් ක්‍රියාවක් කරන. නැතහොත් 27 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) සහ (ආ) ජේද යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරුවන බව උප වගන්තියේ දැක්වේ. ඇත්ත වශයෙන්ම නියෝග සාදනු ලබන්නේ 27 වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) සහ (ආ) ජේද යටතේය.

සංචාරක සංවර්ධන ප්‍රදේශයට ප්‍රවේශවීම සඳහා අදාළ කොන්දේසි නියම කරමින් නියෝග සෑදීමටත් එම ප්‍රදේශය ඇතුළත වාණිජ ක්‍රියාකාරකම් මාර්ග තහනම් කිරීමටත් අධිකාරියට විධිවිධාන සලසා ඇත්තේ 27(4) වන උපවගන්තිය මගිනි. කෙසේ වුවද 69(1) වන උපවගන්තිය ප්‍රකාරව නියෝග සෑදීමට බලය ඇත්තේ අමාත්‍යවරයාටය.

අධිකාරිය මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දෙශයට එකඟ නොවන අවස්ථාවකදී අධිකාරිය විසින් එම කරුණ පරිසර විෂයය භාර අමාත්‍යවරයා වෙත යොමුකළ යුතුය. එවැනි යම් කරුණක් සලකා බලනු ලබන සියලු අවස්ථාවන්හිදී අදාළ එක් එක් කමිටුවේ සාමාජිකයකු පෙනී සිටිය යුතුය. යනුවෙන් 29(3) (ආ) වගන්තියේ දැක්වේ. "කොමිෂන් සභාව" යන වචනය වෙනුවට "කමිටුව" යන වචනය යෙදීම පැහැදිලිවම දක්නට ලැබෙන වරදකි.

යෝජිත නිර්දේශ :

(1) 27 වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) සහ (ආ) ජේද යටතේ සාදන ලද යම් නියෝගයක් යනුවෙන් 28(1) වන උපවගන්තියේ සඳහන් විය යුතුය.

නව සංචාරක නීතිය
සමාලෝචනය කර බැලීම සඳහාත්,
සංචාරක ව්‍යාපාරයේ
ධරණීය සංවර්ධනය කරා
ඉදිරි ගමනක් සඳහා නිර්දේශ
ඉදිරිපත් කිරීම පිණිසත්
පත් කරන ලද
විශේෂ කමිටුවේ වාර්තාව.

# "අ" අතිරේකය

2006 මැයි

(2) 27(4) වන උපවගන්තියේ "අධිකාරිය" යනුවෙන් සඳහන් වන වචනය වෙනුවට "අමාත්‍යවරයා" යන වචනය ආදේශ කළ යුතුය.

(3) 29(3) (ආ) උපවගන්තියේ "අදාළ කමිටුව" යනුවෙන් සඳහන්වන වචන වෙනුවට "අදාළ කොමිෂන් සභාව" යන වචන ආදේශ කළ යුතුය.

9. සංචාරක උපදේශක කමිටුව.

චාරිකා සහ සංචාරක කර්මාන්තයට සම්බන්ධ කාරණා පිළිබඳව අමාත්‍යවරයාට සහ අධිකාරියට උපදෙස්දීමේ කාර්යය සහා සංචාරක උපදේශක කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන පුද්ගල මණ්ඩලයක් පිහිටුවිය යුතුය යනුවෙන් 32(1) උප වගන්තියේ සඳහන් වේ. 32(2) උපවගන්තිය අනුව අධිකාරියේ සභාපති, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපතිවරයා උපදේශක කමිටුවේ සාමාජිකයන් අතර සිටිති.

අධිකාරියේ සභාපතිවරයා උපදෙස් දෙන තැනැත්තා මෙන්ම, උපදෙස් ලබන තැනැත්තා ද වේ. ඉහත සඳහන් අනෙකුත් සභාපතිවරුන් දෙදෙනා සිටින ශ්‍රී ලංකා සංචාරක හා හොටල් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 3 (ඉ) සහ (ඈ) උපවගන්ති අනුව අධිකාරිය විසින් මාර්ගෝපදෙශ ලබාදිය යුතු නිත්‍යානුකූල ආයතන දෙකවේ. නැවත මෙම සභාපතිවරු දෙදෙනා උපදෙස් දෙන තැනැත්තන් මෙන්ම, උපදෙස් ලබන තැනැත්තන් බවට පත්වෙති. මෙය විෂමතාවයකි.

උපදේශක කමිටුවේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කමිටුවට විශේෂ හෝ පොදු විධාන ලිඛිතව නිකුත් කරනු ලැබීම සඳහා 32(6) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇත. මෙය විෂමතාවයක් ලෙස පෙනේ.

පනතේ 1අ වගන්තිය ලෙස අලුත් වගන්තියක් ඇතුළත් කිරීමෙන් සංචාරක කටයුතු පනතේ 68 වන වගන්තියෙන් 1968 අංක 14 දරන

සංචාරක සංවර්ධනපනත සංශෝධනය කර ඇත. එම අලුත් වගන්තියේ දැක්වෙන පරිදි මණ්ඩලය යන යෙදුම ඇති කවර හෝ තැනකදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතුය. මණ්ඩලය යන යෙදුම දැන් සංචාරක සංවර්ධන අධිකාරිය වශයෙන් තේරුම් ගත යුතු ලෙස සංචාරක සංවර්ධන පනතේ 96(2)(ඇ) වගන්තියේ විධිවිධාන සලසා ඇත. මණ්ඩලයට (දැන් සංචාරක සංවර්ධන අධිකාරිය වශයෙන් කියවෙන) සහ එම මණ්ඩලයේ සභාපති වරයාට මෙම පනත හෝ යම් නීති සංග්‍රහයක් යටතේ තම බලතල හෝ මණ්ඩලයේ බලතල ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස්දීමේ කාර්ය සඳහා පොදු උපදෙක්ශක ආයතනයක් පත් කිරීම. පිහිටුවීම සහ එහි කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදීම සඳහා ද එකී වගන්තියෙන් විධිවිධාන සලසා ඇත.

එබැවින් අධිකාරිය සඳහා උපදේශක ආයතනයක් පිහිටුවීම සඳහා දැනටමත් නෛතික විධිවිධාන පවතී. උපදේශක කමිටු දෙකක්ම තිබිය හැකිවේ.

අවශ්‍ය අවස්ථාවලදී උපදේශක කමිටුවේ සාමාජිකයන්ට සහ වෙනත් නිලධරයන්ට හා සේවකයන්ට අධිකාරිය විසින් නිශ්චිය කරනු ලැබිය හැකි පරිශ්‍රමයක් අරමුදලින් ගෙවිය හැකිය යනුවෙන් 32(12) වන උපවගන්තියේ දැක්වේ. කලින් මඳල් වැය කල යුතු ආකාරය නිශ්චිත වශයෙන් දැක්වෙන සංචාරක සංවර්ධන අරමුදල පිළිබඳව සඳහන් කර තිබියදී මෙහි අරමුදල යනුවෙන් යෙදීම ව්‍යාකූලය.

යෝජිත නිර්දේශ :

(1) උපදේශක ආයතනය පිහිටුවීම සහ එහි කියාකාරිත්වය පිළිබඳ විධිවිධාන ගැන නැවත සලකා බැලිය යුතුය.

(2) 19(1) වගන්තියේ සඳහන් අරමුදල යන වචනයට පසුව අලුතින් එකතු කිරීමෙන් 32(12) වන උපවගන්තිය සංශෝධනය කල යුතුය.

## 10. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය.

"ආයතනයට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින්මතු මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් තිබිය යුතු අතර ආයතනයේ කළමනාකරණය සහ පරිපාලනය එම මණ්ඩලයට භාරවිය යුතුය" යනුවෙන් 35(1) වගන්තියේ සඳහන් වේ. අනතුරුව මණ්ඩලයේ සංයුතිය සම්බන්ධයෙන් මණ්ඩලය ආයතනයේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලබන තැනැත්තාගෙන් සමන්විත විය යුතුය යනුවෙන් 35(2)(අ) උප වගන්තියේ සඳහන් වේ.

ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ අනුමතය ඇතිව ආයතනය විසින් පත් කරනු ලබන අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය පත්කළ යුතු බව 36(1)(ආ) වන උප වගන්තියේ දැක්වේ. ආයතනයේ කළමනාකරණය මණ්ඩලය වෙත පැවරී ඇති බැවින් පත්වීම් බලධාරියා විය යුත්තේ මණ්ඩලයයි.

"1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද හෝටල් පාසල මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට ආයතනය සතු වන්නේය" යනුවෙන් 38(1) උපවගන්තියේ දැක්වේ. ඉහත සඳහන් වචනවලින් අදහස් වන අර්ථය කරුණුමය වශයෙන් සාවද්‍යවේ. හෝටල් පාසලට නෛතික ආස්ථිත්‍යය නොමැති බැවින් සංචාරක මණ්ඩලයෙන් බැහැරව එයට ස්වාධීන පැවැත්මක් නොමැත.

"හෝටල් පාසල ආයතනය වෙත සතුවන දිනදී හෝටල් පාසලට අයත් සියලු චංචල හා නිශ්චල දේපළ ආයතනය වෙත පැවරෙන්නේය" යනුවෙන් 38(2) උපවගන්තියේ සඳහන්වීම ව්‍යාකූල සහගතය.

කෙසේ වුවද හෝටල් පාසල එහි බඳු බාහිරාදිය සමඟ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය වෙත පැවරීම සංචාරක කටයුතු පනතේ 67(2)(ඊ) උප වගන්තිය මගින් ඉටුවී ඇති අතර 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත ඉවත් කිරීමෙන් පසුව ලංකා සංචාරක මණ්ඩලය විසින් පාලනය සහ කළමනාකරණය කරමින් පැවති

සියලු පුහුණු කිරීමේ පාසල් සහ ආයතන නියමිත දිනයේ සිට 33 වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමානකරණ ආයතනය වෙත පැවරුණු ලෙස සැලකිය යුතුය යනුවෙන් එම උපවගන්තියේ දැක්වේ. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය යනුවෙන් හැඳින්වෙන සංස්ථාගත ආයතනයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කිරීම සහ මුදල් කළමනාකරනය සඳහා සංචාරක කටයුතු පනතින් විධිවිධාන සැලසීමට අපොහොසත්වී ඇත.

යෝජිත නිර්දේශ :

(1) 35(2) (අ) උපවගන්තියේ සඳහන් "ආයතනයේ පාලක මණ්ඩලයේ" යන වචන ඉවත් කළ යුතුය. 35(1) උපවගන්තිය අනුව සලකා බලන විට "මණ්ඩලයේ සභාපතිවරයා" යන යෙදීම ප්‍රමාණවත් වේ.

(2) 36(1)(අ) උප වගන්තියේ "මණ්ඩලයේ අනුමැතිය" යනුවෙන් සඳහන් වන වචන ඉවත් කළ යුතුය.

(3) 38(1). (2) සහ (4) වන උපවගන්ති ඉවත් කළ යුතුය.

(4) 20(2) උපවගන්තියේ සහ 19 වගන්තියේ සළසා ඇති විධිවිධානවලට සමානවන ලෙස ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමාකරණ ආයතනයේ මූල්‍ය කටයුතු කළමනාකරණය සඳහා සහ විගණකාධිපතිවරයා විසින් එහි ගිණුම් විගණනය සඳහා විධිවිධාන සැළැස්විය යුතුය.

## 11. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය.

කාර්යාංශයේ මූල්‍ය කටයුතු කළමනාකරනය සඳහා සහ එහි ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය සඳහා විධිවිධාන සළසා නොමැත.

**යෝජිත නිර්දේශ :**

**20(2) උපවගන්තියේ සහ 19 වගන්තියේ සලසා ඇති විධිවිධානවලට සමානවන ලෙස කාර්යාංශයේ මූල්‍ය කලමනාකරණය සඳහා විගණකාධිපතිවරයා විසින් විගණනය සඳහා විධිවිධාන සැලැස්විය යුතුය.**

12. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය.

සම්මේලන කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය පත්කළ යුත්තේ කවුරුන් විසින්ද යන්න 43(1) උපවගන්තියේ සඳහන් කිරීමට අපොහොසත්වී ඇත. 43(2) වශයෙන් උපවගන්ති දෙකක් සඳහන්ව ඇත. එම උපවගන්ති 43(2) 1 වන සහ 43(2) 2 වන උපවගන්ති යනුවෙන් සඳහන් කරනු ලැබේ.

43(1) උපවගන්තියේ, 43(2) 1 වන උපවගන්තියේ සහ 43(2) 2 වන උපවගන්තියේ අන්තර්ගත කරුණු පරස්පර විරෝධීවේ. "සාමාජිකයන් පස් දෙනෙකුට නොඅඩු හා දහතුන් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සංයුක්ත කලමනාකරණ මණ්ඩලයක් තිබිය යුතුය" යනුවෙන් 43(1) උපවගන්තියේ සඳහන්වී ඇත. පහත සඳහන් තැනැත්තන් නම් කල සාමාජිකයන් විය යුතුය යනුවෙන් සඳහන් කර තැනැත්තන් 12 දෙනෙකු ගැන සඳහන් වන බැවින් 43(2)1 වන වගන්තියේ දැක්වෙන තැනැත්තන් සංඛ්‍යාව පිළිබඳ පරස්පර විරෝධීතාවයක් ඇතිවේ. (1) වැනි උපවගන්තිය යටතේ පත්කරනු ලබන මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් අමාත්‍යවරයා විසින් සභාපතිවරයා නම් කරනු ලැබිය යුතුය යනුවෙන් 42(2)2 උප වගන්තියේ සඳහන් කිරීම නිසා මෙය තවදුරටත් ව්‍යාකූලවේ. (1) වැනි උප වගන්තියේ සඳහන් වන්නේ සමස්ත මණ්ඩලය පිළිබඳවය.

44 වගන්තියේ (2) උප වගන්තිය අනුව විකල්ප සාමාජිකයන් නම් කරනු ලැබීම ගැන 46(3) වගන්තියේ සඳහන්ව ඇත. මෙය වැරැද්දකි. විකල්ප සාමාජකයන් නම් කරනු ලබන්නේ 46 වගන්තියේ (2) උප වගන්තිය යටතේය.

**සම්මේලන කාර්යාංශයට, සංචාරක සංවර්ධන බදු වශයෙන් එකතු කරන ලද මුළු මුදලෙන් සියයට හතරක් (4%) සහ සම්මේලන කාර්යාංශයේ කර්තව්‍ය කාර්යක්ෂමව කරගෙන යාම සඳහා ආණ්ඩුවෙන් වෙන්කර දෙන**

වෙනත් යම් මුදල් ලැබිය යුතුය යනුවෙන් 47 වගන්තියේ සඳහන්ව ඇති අතර. මෙය එම වගන්තියේ ඇති බරපතල වරදකි. 24(8) වැනි උපවගන්තිය යටතේ සංචාරක සංවර්ධන බද්දේ මුළු මුදල් ප්‍රමාණය සහ අපගමන බද්දෙන් 1/3 ක මුදල් ප්‍රමාණය ඇතුළත් සංචාරක සංවර්ධන අරමුදලෙන් (4%) ක මුදල් ප්‍රමාණයක් ලැබීමට කාර්ය අංශයට හිමිකම් ඇත. සම්මේලන කාර්යාංශය සම්බන්ධයෙන්ද විගණනකාධිපතිවරයා විසින් එහි ගිණුම් විගණනය කිරීම සඳහා විධිවිධාන සැලැස්විය යුතුය.

යෝජිත නිර්දේශ :

(1) මණ්ඩලයට පත් කිරීම් කරනු ලබන්නේ කවුරුන් විසින්ද යන්න නිශ්චිතව සඳහන් කළ යුතුය.

(2) මණ්ඩලය කොපමණ සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විතවේද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

(3) 43 වගන්තියෙ 'උපවගන්තිවල අංක යෙදීමේදී සිදුවී ඇති වරද නිවැරදි කළ යුතුය.

(4) 46(3) උපවගන්තියේ 44 වගන්තියේ (2) උපවගන්තිය වෙනුවට 46 වගන්තියේ (2) උපවගන්තිය ආදේශ කළ යුතුය.

(5) 47 වගන්තියේ සියයට හතර වෙනුවට සියයට හතර ආදේශ කළ යුතුය. "සංචාරක සංවර්ධන අරමුදලේ" යන වචන වෙනුවට සංචාරක සංවර්ධන බද්ද වශයෙන් එකතු කරනු ලබන මුළු මුදල යන වචන ආදේශ කළ යුතුය. 24(8) වන වගන්තිය පිළිබඳ සලකා බලන විට 47 වගන්තිය අවශ්‍යවේදැයි සලකා බැලිය යුතුය.

(6) විගණකාධිපති විසින් කාර්යාංශයේ ගිණුම් විගණනය කිරීමට හැකිවන පරිදි 20(2) වන උපවගන්තියේ දැක්වෙන විධිවිධානවලට සමාන වන විධිවිධාන සැලැස් විය යුතුය.

## 13. සංචාරක ව්‍යවසායන් ලියාපදිංචි කිරීම.

43 වන වගන්තියේ (2) වන උපවගන්තිය අනුව බලපත්‍රයක් දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවාවූ හෝ 45 වන වගන්තියේ නියම අනුව සහතිකය අවලංගු කරනු ලැබුවාවූ යම් තැනැත්තකු විසින් තත් කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරන ලද අභියාචනා විනිශ්චයාධිකාරයක් වෙත අභියාචනය කරනු ලැබිය හැකිය. යනුවෙන් 51 වගන්තියේ දැක්වේ. බලපත්‍රයක් නිකුත් කිරීම (හෝ ප්‍රතික්ෂේප කිරීම) කරනු ලබන්නේ 48 වන වගන්තියේ 3 වන උපවගන්තිය යටතේ වන අතර 50 වගන්තියේ 3 වන උපවගන්තිය යටතේ සහතිකයක් අවලංගු කිරීම කරනු ලැබේ.

මිල නියෝග නියමයන් නියම කරන බලධාරියා සම්බන්ධයෙන් 53 වගන්තියේ කිසියම් ව්‍යාකූලතාවයක් තිබෙන බව පෙනේ. අධිකාරියේ සභාපතිවරයා විසින් සාමාජිකයන්ගේ නිර්දේශ මත මිල නියෝග නියමයක් මගින් මිල නියම කිරීම විධිමත් කරනු ලැබිය හැකිය. යනුවෙන් 53(1) වගන්තියේ දැක්වේ. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්යම් මිල නියෝග නියමක් කිරීම සලකා බැලිය හැකි බව 53(3) වන වගන්තියේ සඳහන්ව ඇත. සෑම මිල නියෝග නියමයක්ම අධිකාරියේ සභාපතිවරයා විසින් සාදනු ලැබ අත්සන් කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතුය යනුවෙන් 54(4) වැනි උප වගන්තියේ නැවත වරක් සඳහන් කර ඇත.

**යෝජිත නිර්දේශ :**

(1) 45 වන වගන්තිය වෙනුවට 50(3) වන උපවගන්තිය ආදේශ කිරීමෙන් ද 43(2) උපවගන්තිය වෙනුවට 48(3) උප වගන්තිය ආදේශ කිරීමෙන්ද 51 වන වගන්තිය සංශෝධනය කළ යුතුය.

(2) "අධ්‍යක්ෂ ජනරාල්" යන වචනය වෙනුවට "සභාපති" යන වචනය ආදේශ කිරීමෙන් 53(3) අ වගන්තිය සංශෝධනය කළ යුතුය.

## 14. සංචාරක සංවර්ධන පනත යටතේ සාදනු ලබන රීති.

1966 අංක 10 දරණ සංචාරක මණ්ඩල පනත ඉවත් කිරීමට පෙර එකී පනතේ විධිවිධාන ප්‍රකාර නිකුත් කරන ලද අවසර පත්‍ර සහ බලපත්‍ර

නිකුත් කරන ලද අවසර පත්‍ර සහ බලපත්‍ර මේ පනත යටතේ අවසර පත්‍ර සහ බලපත්‍ර නිකුත් කරනු ලැබ ඇත්තම් මිස, සහ නිකුත් කරනු ලබන තෙක්, මේ පනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර සහ පලපත්‍ර ලෙස දිගටම බලාත්මකව සහ ක්‍රියාත්මකව පැවතිය යුතුය යනුවෙන් 67(3) වන වගන්තියේ දැක්වේ.

මෙහි යටින් ඉරිඇඳි වචන අතිරික්තයක් වශයෙන් සඳහන්කර ඇති අතර එය වැරැද්දකි. කෙසේ වුවද 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ 77, 78, 79, 80, 81 සහ 82 දරන වගන්ති සංචාරක කටයුතු පනතේ 68(2) උප වගන්තියෙන් ඉවත් කිරීමට අපේක්ෂා කර තිබියදීත් එම වගන්ති යටතේ නිකුත් කර ඇති බලපත්‍ර සංචාරක කටයුතු පනත යටතේ බලපත්‍ර නිකුත් කරනු ලබන තෙක් බලාත්මකව සහ ක්‍රියාත්මකව පැවතිය යුතු බවට කිසිදු විධිවිධානයක් සලසා නොමැත.

යෝජිත නිර්දේශ :

(1) එකී පනතේ "විධිවිධන" වෙනුවට එකී පනතට "විධිවිධාන" යනුවෙන් ආදේශ කළ යුතුය. "බලපත්‍රය" වෙනුවට "බලපත්‍ර" යනුවෙන් ආදේශ කළ යුතුය. යටින් ඉරිඇඳ ඇති වචන ඉවත් කළ යුතුය.

(2) "එකී පනත" යන වචනවලට පසුව "සහ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ නිකුත් කරනු ලැබූ සියලු අවසර පත්‍ර සහ බලපත්‍ර යන වචන අලුතින් ඇතුලත් කළ යුතුය.

15. පනතේ තිබෙන විධිවිධාන කිසිවකින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවී තිබේද ?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතිකවී ඇති මූලික අයිතිවාසිකම් කිපයක් සංචාරක කටයුතු පනතේ 61 වන වගන්තයේ සහ 67 (2) (ඇ) උපවගන්තියේ දැක්වෙන විධිවිධානවලින් උල්ලංඝනය වී ඇති බව අංශ කිපයකින්ම ප්‍රකාශ වී ඇත.

(1) 61 වන වගන්තිය එහි ඇතුලත් වැරදි නිවැරදි කිරීමෙන් පසුව පහත සඳහන් පරිදි කියවේ.

61(1) යම් චාරිකා හෝ සංචාරක සේවයක සේවා නියුක්තිය ලැබීමට කැමති යම් තැනැත්තකු විසින්, තත් කාර්යය සඳහා සලසනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව ඒ සඳහා සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු ලෙස අධිකාරිය වෙත ලියාපදිංචි විය යුතුය.

(2) අධිකාරිය වෙත ලියාපදිංචි නොවී චාරිකා හෝ සංචාරක සේවයක සේවා නියුක්තියෙහි නිරත යම් තැනැත්තකු වරදකට වරදකරු වන්නේය.

කිසියම් නීත්‍යානුකූල හෝ ව්‍යාපාරයක නිරතවීමට පුද්ගලයකුට ඇති මූලික අයිතිවාසිකම මෙම තහනම මගින් උල්ලංඝනය වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අවසරදී ඇත සීමා කිරීම් ඇතුළත එම තහනම නොමැති බව පෙනේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ විධිවිධාන වෙත ක්ෂණිකව අවධානය යොමු කිරීමෙන් මෙම කරුණ පැහැදිලිකර ගත හැකිය.

(14) (1) සෑම පුරවැසියකුටම,

(උ) එකලාම හෝ අන්අය හා සමඟ යම් නීත්‍යනුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්තවීමේ නිදහසට, හිමිකම ඇත්තේය.

15(5)14වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (2) ජේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා හෝ,

(අ) යම් වෘත්තියක යෙදී සිටීමට හෝ යම් රැකියාවක්, කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යවසායක් පවත්වාගෙන යාමට අවශ්‍ය වෘත්තීය, කාර්මික, අධ්‍යාපනික, මූල්‍ය සහ වෙනත් සුදුසුකම් සම්බන්ධයෙන් සහ එම මූලික අයිතිවාසිකමට හිමිකම් ලබන

**තැනැත්තන්ට බලපත්‍රදීම සහ ඒ තැනැත්තන් විෂයයෙහි විනය පාලනය සම්බන්ධයෙන් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්වය.**

මතභේදයට තුඩුදී ඇති කරුණු සම්බන්ධයෙන් කිසිදු වටිනාකමක් නොමැති බව අදහස් කරමි. මූලික අයිතිවාසිකම් කිසිවක් උල්ලංඝනය වී ඇති බවක් නොපෙනේ. පහත සඳහන් වන පරිදි කියවෙන 67(2)(ඇ) උප වගන්තිය දැන් මා විසින් සැලකිල්ලට ගනු ලැබේ.

1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත ඉවත් කරනු ලැබුවේ වුවද - පනත ඉවත් කරන ලද දිනයට ඉහතින්ම වූ දිනයේදී ලංකා සංචාරක මණ්ඩලයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් වූ සියලු තැනැත්තන් ඉවත් කිරීම සඳහා තියමිත දිනයේ සිට අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

මෙහි මත භේදයට තුඩු දෙන කරුණ වන්නේ මෙම විධිවිධානය ක්‍රියාත්මක කිරීමෙන් ලංකා සංචාරක මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් අධිකාරියේ සේවය කළ යුතුවන බවට බලකිරීමකි. මෙයින් කිසියම් බලකිරීමක් සිදුකර ඇති බව නොපෙනේ. සංචාරක මණ්ඩල පනත ඉවත් කිරීමෙන් මණ්ඩලය තවදුරටත් ක්‍රියාත්මක නොවන විට ඇත්ත වශයෙන්ම කිසිදු නිලධරයකුට හෝ සේවකයකුට මණ්ඩලයේ තවදුරටත් සේවයේ සිටිය නොහැකිය. කවර හෝ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීම හැරුණු විට 67(2)(ඇ) උපවගන්තිය පැනවීමෙන් දිවයිනේ පවත්නා කවර හෝ කම්කරු නීතියක් උල්ලංඝනය වී ඇති බවට කිසිදු යෝජනාවක්ද නොපෙනේ.

(විනිසුරු) රන්ජිත් එන්.එම්. ධීරරත්න
2006 අප්‍රේල් 10 දින.

# පටුන

1. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කර්යක්‍ෂම ලෙස සංවර්ධනය කර ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක කටයුතු අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවීම සඳහාද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගිත කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

2. එගකිමට බැඳී ඇති යෝජිත සීමාසහිත සමාගම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය.

3. සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන රජයේ මණ්ඩලයක් පිහිටුවීම සඳහාත් සැලයුම් කිරීම. ක්‍රියාත්මක කිරීම. දිරි ගැන්වීම. පහසුකම් සැලසීම. පුහුණු කිරීම. සේවක පිරිස් සඳහා අධ්‍යාපනය ලබාදීම. සමස්ත කර්මාන්තය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත නියාමනය. අධීක්‍ෂණය සඳහා නිත්‍යානුකූල යටිතල පහසුකම් සැලසීම පිණිසත් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

4. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව පිහිටුවීම සඳහාද සංචාරක කටයුතු කර්මාන්තය හා වෙනත් ආශ්‍රිත කර්මාන්තවලට අදාළ ප්‍රතිපත්තිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය යම් බලතල එකී සභාව වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද ප්‍රාදේශීය සංචාරක කමිටු පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද සංචාරක කර්මාන්තය නියාමනය සහ අධීක්‍ෂණය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩ ල පනත ඉවත් කිරීම හා 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ ඇතැම් විධිවිධාන ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකාවේ

සංචාරක කර්මාන්තය

කාර්යක්ෂම ලෙස සංවර්ධනය කර,

ප්‍රවර්ධනය කිරීම සඳහා

ශ්‍රී ලංකා සංචාරක කටයුතු අධිකාරිය

යනුවෙන් හඳුන්වනු ලබන

අධිකාරියක් පිහිටුවීම සඳහාද,

ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික

කරුණු සම්බන්ධයෙන් විධිවිධාන

සැලැස්වීම පිණිසද වූ

පනතකි.

1999 පෙබරවාරි

## සංචාරක කටයුතු සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

මගේ අංකය : 51-316-500(1)
ඔබේ අංකය :

ලංකා සංචාරක මණ්ඩලය
සභාපති කාර්යාලය
දිනය : 27.04.99

ඉතා හදිසියි.

එච්.එම්.එස්. සමරනායක මහතා,
සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය
කොළඹ 03.

ශ්‍රී ලංකා සංචාරක කටයුතු අධිකාරිය සඳහා
ව්‍යවස්ථාපිත කෙටුම්පත.

ඉහත සඳහන් කරුණට අදාලව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති ව්‍යවස්ථා කෙටුම්පතේ පිටපතක් මේ සමඟ එවමි.

කරුණාකර මෙම කෙටුම්පත පිළිබඳව පරීක්ෂාකර බලා අමාත්‍යාංශය වෙත වහාම වාර්තා කරන ලෙස දන්වමි.

කේ. මාරිමුත්තු
අතිරේක ලේකම් (සංචාරක)
ලේකම් වෙනුවට.

27.04.99

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කාර්යක්ෂම ලෙස සංවර්ධනය කර ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක කටයුතු අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවීම සඳහාද ඒ හා සම්බන්ධයෙන් සහ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිසද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1 මෙම පනත 1999 අංක .... දරණ ශ්‍රී ලංකා සංචාරක කටයුතු අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතුය. — *ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය*

## I වන කොටස

### ශ්‍රී ලංකා සංචාරක කටයුතු අධිකාරිය පිහිටුවීම.

2 (1) (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක කටයුතු අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුය. — *ශ්‍රී ලංකා සංචාරක කටයුතු අධිකාරිය*

(2) අධිකාරිය (1) වන උපවගන්තිය මගින් ඊට පවරාදී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර එය විසින් සහ එයට එරෙහිව ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකිය.

3 අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන (මෙහි මින්මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයකට අධිකාරියේ කටයුතු — *අධිකාරියේ සංස්ථාපනය*

පරිපාලනය කළමනාකරණය සහ පාලනය පැවරිය යුත්තේය.

(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිර්දේශ කරනු ලබන ඔහුගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු.

(ආ) පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් නිර්දේශ කරනු ලබන ඔහුගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු.

(ඇ) සංචාරක හෝටල් සංගමය විසින් නිර්දේශ කරනු ලබන එම සංගමයේ නියෝජිතයන් දෙදෙනෙකු.

(ඈ) චාරිකා නියෝජිතවරුන්ගේ සංගමය විසින් නිර්දේශ කරනු ලබන එම සංගමයේ නියෝජිතයන් දෙදෙනෙකු.

(ඉ) සංචාරක කටයුතු පිළිබඳව පළපුරුද්දක් ලබා ඇති බව තහවුරුකර ඇති පුද්ගලයන් අතරින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු සහ යටත් පිරිසෙයින් එම සාමාජිකයන් දෙදෙනාගෙන් එක් සාමාජිකයකු සංචාරක කටයුතු පිළිබඳ සංස්කෘතික සහ සමාජීය අංශ පිළිබඳ පළපුරුද්ද ලබා ඇති තැනැත්තෙකු විය යුතුය.

(ඊ) සීමාසහිත එයා ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා.

(උ) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක

සභිකයකු බවට පත්වේ නම් ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් නොකඩවා සිටීමට නුසුදුස්සකු වන්නේය.

(3) (1) වන උපවගන්තියේ (ඒ) ජේදය යටතේ පත්කරනු ලබන සාමාජිකයකු හැර මණ්ඩලයේ සාමාජිකයකුට අමාත්‍යවරයා අමතා තත් කාර්යය පිණිස යවනු ලබන ලිපියක් මගින් ධූරයෙන් ඉල්ලා අස්විය හැකි වන අතර. අමාත්‍යවරයා විසින් එම ලිපිය ලිඛිත වශයෙන් භාරගනු ලබන දිනයේ සිට එම ඉල්ලා අස්වීම බලපැවැත්විය යුත්තේය.

(4) අමාත්‍යවරයා විසින් හේතු දක්වා (1) වන උප වගන්තියේ (ඒ) ජේදය යටතේ පත්කරනු ලබන සාමාජිකයා හැර මණ්ඩලයේ සාමාජිකයකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

එසේ වුවද, 1 වන උප වගන්තියේ (අ) ජේදය හෝ (ආ) ජේදය හෝ (ඇ) ජේදය හෝ (ඈ) ජේදය යටතේ පත් කරනු ලබන මණ්ඩලයේ සාමාජිකයකු එම සාමාජිකයාගේ පත්කිරීම නිර්දේශ කරන අමාත්‍යවරයාගේ හෝ සංගමයේ නිර්දේශය නොමැතිව අමාත්‍යවරයා විසින් ඉවත් නොකළ යුතුය.

(5) (3)වන සහ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව (1) වන උපවගන්තියේ (ඒ) ජේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයා හැර මණ්ඩලයේ සාමාජිකයකුගේ ධූර කාලය අවුරුදු තුනක් විය යුතුය.

එසේ වුවද මියගිය. ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කර ඇති සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුර කාලය ඔහු අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය විය යුත්තේය.

(6) රෝගාතුරවීම. ශ්‍රී ලංකාවෙන් බැහැර සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ධුරයේ කාර්යය සාමාජිකයකුට තාවකාලික ඉටුකිරීමට නොහැකිවන අවස්ථාවක ඔහු වෙනුවට ක්‍රියාකිරීම පිණිස අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන වෙනත් යම් තැනැත්තකු පත්කළ හැකිය.

4 (1) අමාත්‍යවරයා විසින් (3) වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ), (ඈ) සහ (ඊ) ජේද යටතේ පත්කරනු ලබන මණ්ඩලයේ සාමාජිකයන් අතරින් අධිකාරියේ සභාපතිවරයා පත්කළ යුත්තේය. අධිකාරියේ සභාපතිවරයා

(2) අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාපතිවරයා ඔහුගේ ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(3) සභාපතිවරයාට අමාත්‍යවරයා අමතා තත් කාර්යය සඳහා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකිවන අතර, අමාත්‍යවරයා විසින් එම ලිපිය ලිඛිත වශයෙන් භාරගනු ලබන දිනයේ සිට එම ඉල්ලා අස්වීම බලපැවැත්විය යුත්තේය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුරකාලය මණ්ඩලයේ ඔහු සාමාජිකත්වය දරන කාලය විය යුත්තේය.

5 මුදල් විෂය භාර අමාත්‍යවරයාගෙන් උපදෙස් විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි දීමනාවක් මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවිය හැකිය. සාමාජිකයන් හෝ ප්‍රාරිශ්‍රමිකය

6 (1) සභාපතිවරයා මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකදී සභාපතිවරයා නොපැමිණි විටෙක එවැනි යම් රැස්වීමකදී පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරෙන් වෙනත් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරීමට තෝරාගත යුතුය. සභාපති සහ කටයුතු පවත්වාගෙන යාම

(2) අධිකාරිය විසින් ඇතුලත්වී ඇත්තෙවූ හෝ ඇතුලත්වීමට යෝජනා කරනු ලැබ ඇත්තාවූ කොන්ත්‍රාත්තුවකට යම් ලෙසකින් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධවූ මණ්ඩලයේ සාමාජිකයකු විසින් මණ්ඩලයේ යම් රැස්වීමකදී ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, මණ්ඩලයේ වාර්තාවල එම හෙළිදරව් කිරීම සටහන් කළ යුතුය. ඒ කොන්තාත්තුව සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගී නොවිය යුතුය.

(3) මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් රැස්වීම් සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකිය.

7 මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ නීති කෘත්‍යයක් මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීම හේතු කොටගෙන නිර්බලවූ ලෙස නොසැලකිය යුතුය. පුරප්පාඩුවක් හේතුවෙන් ක්‍රියාවන් නිර්බල නොවීම.

8 මණ්ඩලය විසින් මෙම පනතින් හෝ මෙම පනත යටතේ එය වෙත පිරිනමා හෝ නියමකර ඇති හෝ පවරා ඇති බලතල, කාර්යය හෝ කර්තව්‍යය කිසිවක් සභාපතිවරයා වෙත හෝ මණ්ඩලයේ සාමාජිකයකු වෙත පවරනු ලැබිය හැකිය. සාමාජිකයන් වෙත බලතල පැවරීම.

9 (1) අධිකාරියේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටුවනු ලැබිය යුතුය. අධිකාරියේ ප්‍රධාන කාර්යාලය. ශාඛා

(2) මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව තුළ හෝ විදේශ රටවල අධිකාරියේ ශාඛා හෝ නියෝජිත ආයතන පිහිටුවා පවත්වා ගෙන යා හැකිය.

10 (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කර සැලසුම් කළ යුතු අතර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය. අධිකාරියේ මුද්‍රාව.

(2) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් වරින් වර තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් පුද්ගලයකු භාරයේ තැබිය යුතුය.

(3) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලයේ අනුමැතිය තොමැතිව සභාපතිවරයා සහ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරියේදී යම් සාධන පත්‍රයකට හෝ ලිපි ලේඛනයකට තැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයට හෝ ලිපි ලේඛනයට අත්සන් තැබිය යුතුය.

(4) මණ්ඩලය විසින් අධිකාරියේ මුද්‍රාව තබා ඇති සාධන පත්‍ර සහ ලිපිලේඛන පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

## ii වන කොටස

### අධිකාරියේ බලතල හා කර්තව්‍ය.

11 අධිකාරියේ පරමාර්ථ හා කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතුය. අධිකාරියේ පරමාර්ථ හා කර්තව්‍ය

(අ) ශ්‍රී ලංකාව තුළ විදේශ සංචාරක චාරිකා ප්‍රවර්ධනය සහ දිරිගැන්වීම

(ආ) කාර්යක්ෂම හා ආකර්ෂණීය සංචාරක සේවා සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය සහ විදේශීය සහ දේශීය සංචාරකයන් සඳහා පහසුකම් සැලසීම.

(ඇ) ශ්‍රී ලංකාවේ සමාජීය, සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ප්‍රවර්ධනය සුරැකීම සහ ආරක්ෂා කර ගැනීම.

12 (1) මණ්ඩලය විසින් බලතල ඇතුළුව අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍යවිය හැකි සියලුම බලතල

(අ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, කුලියට දීම, උගසට තැබීම, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(ආ) අධිකාරිය වෙත අයිතිය පවරා ඇති හෝ අධිකාරිය විසින් අත්පත් කරගනු ලැබූ කිසියම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම.

(ඈ) කෙලින්ම හෝ තත් කාර්යය සඳහා බලයදී ඇති යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒවා ඉටුකිරීම.

(ඈ) කිසියම් බැංකුවක හෝ බැංකුවල ජංගම ඉතිරි කිරීම් හෝ තැන්පතු ගිණුම් ආරම්භක පවත්වාගෙන යාම.

(ඉ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි කිසියම් මුදල් ප්‍රමාණයක් ණයට ලබාගැනීම.

(ඊ) ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මාර්ගවලින් චංචල සහ නිශ්චල ප්‍රදාන, ත්‍යාග සහ පරිත්‍යාග භාරගැනීම සහ පිළිගැනීම හා ඒවා අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා යොදා ගැනීම.

(උ) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සැදීම.

(ඌ) අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ නිපුණතා හෝ අධිකාරියේ උපකරණවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ඕනෑම කටයුත්තක් ඉටු කිරීම.

(එ) අධිකාරියේ කර්තව්‍යයන් තිසි පරිදි ඉටුකිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය විය හැකි අනෙකුත් සියලුම කාර්යයන් සහ කටයුතු සාමාන්‍යයෙන් ඉටු කිරීම.

13 12 වන වගන්තිය මගින් මණ්ඩලය වෙත ප්‍රදානය කර ඇති බලතලවලට අගතියක් ඇති නොවන ලෙස එයට පහත සඳහන් බලතල ඇත්තේය. මණ්ඩලය සතු විශේෂ බලතල

(අ) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂය ඇතිව ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල විවිධ අලෙවිකරණ ක්‍රමෝපායන් ආරම්භ කිරීම.

(ආ) සංචාරක කර්මාන්තයට අදාළව පර්යේෂණ වැඩසටහන් සහ සැලසුම් හා සංවර්ධන වැඩසටහන් සහ යෝජනාක්‍රම පැවැත්වීම.

(ඇ) කාර්යක්ෂම හා ආකර්ෂණීය සංචාරක සේවා ආරම්භ කර පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සහ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ හෝ ප්‍රවර්ධනය කිරීමේ නිරතව සිටින අනෙකුත් තැනැත්තන් වෙත එම සේවා ලබාදීම.

(ඈ) අධිකාරියේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හිතකර හෝ අවශ්‍ය වන යම් ක්‍රියාවන් හෝ කටයුත්තක් ඉටුකිරීම සඳහා යම් සංචාරක සේවාවක් ක්‍රියාත්මක කරන හෝ පවත්වාගෙන යන යම් පුද්ගලයකුට හෝ පුද්ගල මණ්ඩලයකට (සංස්ථාගත හෝ සංස්ථාගත නොකරන ලද) ණය මුදල් වශයෙන් ද කිසියම් පළාත් පාලන ආයතනයකට, පළාත් සභාවකට, රාජ්‍ය සංස්ථාවකට සහ රජයේ දෙපාර්තමේන්තුවකට අන්‍යාකාරයෙන් හෝ මූල්‍යමය වශයෙන්ද සහාය ලබාදීම.

(ඒ) ශ්‍රී ලංකාවේ සිත්ගන්නා සුළු ස්ථාන සහ ආකර්ෂණීය ස්ථාන කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා සැලසුම් කළ ද දෘශ්‍යමය ද්‍රව්‍ය සහ ප්‍රදර්ශන භාණ්ඩ බෙදා හැරීමේ හා ප්‍රදර්ශනය කිරීමේ සහ සිත්ගන්නා සුළු ස්ථාන, ගමන් මාර්ග, ප්‍රවාහන පහසුකම්, සංචාරක සේවා හා අධිකාරිය විසින් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍යවේයැයි සලකන අනෙකුත් සියලුම කටයුතු සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීමේ නිරතවී සංචාරක, චාරිකා නියෝජිත ආයතන සහ අනෙකුත් නියෝජිත ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

(ඓ) සංචාරක සේවා සම්බන්ධ කටයුතු ඉටු කිරීම පිණිස පුද්ගලයන් පුහුණු කිරීම හෝ පුද්ගලයන් පුහුණු කිරීම සඳහා මූල්‍යමය වශයෙන් සහාය ලබාදීම.

(ඔ) අධිකාරිය විසින් සපයනු ලබන සේවා, පහසුකම් හෝ උපකරණ සඳහා බදු හෝ වෙනත් ගාස්තු අයකිරීම.

(ඖ) අධිකාරියේ කිසියම් පරමාර්ථයක් හෝ පරමාර්ථ සියල්ල මුදුන්පත්කර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වෙනත් සියලුම ක්‍රියා හෝ දේ කිරීම.

14 (1) පහත දැක්වෙන දේ කිරීම අධිකාරියේ කාර්යය වන්නේය. — අධිකාරියේ විශේෂ කාර්ය

(අ) අධිකාරියේ මෙහෙයවීමෙන් හෝ අමාත්‍ය වරයාගේ ඉල්ලීම මත සංචාරක කර්මාන්තයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස්දීම.

(ආ) සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සංචාරක, චාරිකා නියෝජිත ආයතන සහ වෙනත් නියෝජිත ආයතන වෙත උපදෙස්දීම.

(ඇ) විශේෂයෙන් පහත සඳහන් යම් කරුණක් හෝ සියලු කරුණු සම්බන්ධයෙන් මෙම ඡේදයේ මීට ඉහතින්වූ විධිවිධානවල සාමාන්‍යත්වයට අගතියක් ඇති නොවන පරිදි අධිකාරියේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍යවිය හැකි හෝ හිතකර විය හැකි සියලුම සාමාන්‍ය හෝ විශේෂ යෝජනා ක්‍රම, අමාත්‍යවරයා විසින් ප්‍රඥප්තිය මගින් ක්‍රියාත්මක කිරීම (වෙනස්කම් සහිතව හෝ රහිතව) සහ අමාත්‍යවරයාට මග පෙන්වීම සඳහා සකස් කර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

i සංචාරක ස්ථාන පිහිටුවීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම සහ පාලනය කිරීම.

ii සංචාරක සේවා විධිමත් කිරීම, අධීක්ෂණය, සංවර්ධනය සහ පාලනය කිරීම

සහ

iii සංචාරක සේවා ව්‍යාපාර කටයුතුවල හෝ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පුද්ගලයන් සේවයේ යෙදවීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම.

(ඇ) සංචාරක කර්මාන්තය විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම සහ

පාලනය කිරීම සඳහා අමාත්‍යවරයාට සහ සංචාරක චාරිකා නියෝජිත ආයතනවලට සහ අනෙකුත් නියෝජිත ආයතනවලට මග පෙන්වීම පිණිස සංක්ෂෙප සාමාන්‍ය යෝජනාවල සඳහන් ජාතික සැලැස්මක් හෝ ප්‍රතිපත්තියක් සකස් කිරීම.

(2) එම යෝජනා ක්‍රම අදාළවන කරුණු සම්බන්ධයෙන් අධිකාරියේ පරමාර්ථ මුදුන්පත්කර ගැනීමට අවශ්‍යවිය හැකි හෝ හිතකර විය හැකි එකී සියලුම විධිවිධාන මෙම පනත යටතේ සකස් කර ඇති සංචාරක යෝජනා ක්‍රමයක අන්තර්ගතව තිබිය හැකිය.

(3) අධිකාරිය අන්‍යාකාරයෙන් යටත්වන යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක හමුවේ ඇති නඩු විභාගය මාර්ගයෙන් බලපැවැත්විය හැකි කාර්ය හෝ වගකීමක ස්වරූපයෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් අධිකාරිය වෙත නියම කිරීමක් ලෙස මෙම වගන්තියේ කිසිවක් තේරුම් නොගත යුතුය.

15 (1) මණ්ඩලය විසින් පහත සඳහන් සියලු කරුණු හෝ වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් නියෝග කරනු ලැබිය හැකිය. නියෝග කිරීම සඳහා අධිකාරිය සතු බලතල

(අ) කවර හෝ පන්තියකට හෝ විස්තරයකට අයත් සංචාරක සේවා හෝ පොදුවේ ඇති සංචාරක සේවා සම්බන්ධයෙන් අයකළ හැකි සහ ආපසු අයකර ගතහැකි ගාස්තු ප්‍රමාණයන් හෝ අයකිරීම් විධිමත් කිරීම සහ පාලනය කිරීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වාදීම, මෙහෙයවීම සහ ක්‍රියාත්මක කිරීම

සඳහා අවශ්‍යවන හෝ ඊට ආනුෂංගික හෝ ඊහා සම්බන්ධ සියලුම කරුණු.

(ආ) කවර හෝ පන්තියකට හෝ විස්තරයකට අයත් සංචාරක සේවා හෝ පොදුවේ ඇති සංචාරක සේවා කිසිවක් ප්‍රමාණවත් වන බවට, කාර්යක්ෂම හා ආකර්ෂණීය වන බවට වගබලා ගැනීමේ කාර්ය සඳහා නියෝගයේ නිශ්චිතව දැක්වෙන හෝ අන්තර්ගත ඇති විධිවිධාන හෝ අවම ප්‍රමිතීන්වලට අනුකූලවන ලෙස හෝ එකඟවන ලෙස එකී සේවා පවත්වාගෙන යන සහ ක්‍රියාත්මක කරනතාක් කල් එකී සේවා ලියාපදිංචි කිරීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වාදීම, මෙහෙයවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන හෝ ඊට ආනුෂංගික හෝ ඒ හා සම්බන්ධ සියලු කරුණු සහ විශේෂයෙන් මෙම ඡේදයේ මීට ඉහතින් වූ විධිවිධානවල සාමාන්‍යත්වයට අගතියක් ඇති නොවන අවස්ථාවන්හිදී ලියාපදිංචිය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ කළ හැකිය, තැනහොත්

(ඇ) කවර හෝ පංතියකට හෝ විස්තරයකට අයත් සංචාරක සේවාවල හෝ පොදුවේ ඇති සංචාරක සේවාවල සේවයේ නියුතු පුද්ගලයන් එසේ සේවයේ නිතරවීම සඳහා යෝග්‍ය සහ සුදුසු බවට වගබලා ගැනීමේ අභිප්‍රායෙන් නියෝගයේ නිශ්චිතව දැක්වෙන කිසියම් නොහැකියාවන්වලට හෝ නුසුදුසුකම්වලට එම පුද්ගලයන් යටත් නොවීමේ හෝ එම සුදුසුකම් ලබාතිබීම හේතුවෙන් එවැනි සේවාවල සේවයේ

නිරතවීම සඳහා යෝග්‍ය සහ සුදුසු පුද්ගලයන් මණ්ඩලය විසින් ලියාපදිංචි කිරීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වාදීම, මෙහෙයවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන හෝ ඊට ආනුෂංගික හෝ ඒ හා සම්බන්ධ සියලු කරුණු සහ විශේෂයෙන් මෙම ඡේදයේ මීට ඉහතින් වූ විධිවිධානවල සාමාන්‍යත්වයට අගතියක් ඇති නොවන අවස්ථාවන්හි ලියාපදිංචිය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ කළ හැකිය.

(2) යම් සංචාරක සේවාවක් මණ්ඩලය විසින් ලියාපදිංචි කර ඇත්නම්, මිස එවැනි සේවාවක් ආරම්භ කිරීම, පවත්වා ගැනීම හෝ මෙහෙයවීම තහනම් කිරීම සඳහා මෙම වගන්තිය යටතේ කරනු ලබන නියෝගයකින් විධිවිධාන සැලකිය හැකි අතර, එවැනි නියෝගයක් කිරීම නිසා පීඩාවට පත්ව ඇති යම් තැනැත්තකුට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන විනිශ්චයාධිකාරියකට අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය ඇත්තේය.

(3) මෙම වගන්තිය යටතේ කරනු ලබන කිසිදු නියෝගයක් අමාත්‍යවරයා විසින් අනුමත කර පාර්ලිමේන්තුව මගින් ස්ථිරකර ගැසට් පත්‍රයේ පළ කරන තෙක් ක්‍රියාත්මක නොවිය යුතුය.

## iii වන කොටස

### අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම.

16 (1) මණ්ඩලය විසින් අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වියයුතු (මෙහි මින්මතු විධායක

අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම.

නිලධරයා යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තෙකු පත්කරනු ලැබිය හැකිවන අතර, එම තැනැත්තා අධිකාරියේ ප්‍රධාන පරිපාලන නිලධරයා සහ පූර්ණ කාලීන නිලධරයකු ද විය යුතුය. මණ්ඩලය විසින් නිශ්චය කළයුතු යම් නියමයන් සහ කොන්දේසි මත විධායක නිලධරයා සේවයේ යෙදවිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ විධායක නිලධරයාගේ ධූරයේ යම් පුරප්පාඩුවක් ඇතිවූ විට හෝ රෝගාතුරවීම, නිවාඩු ගැනීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධූරයේ කාර්ය ඉටුකිරීමට විධායක නිලධරයාට තාවකාලික නොහැකිවන අවස්ථාවක එම ධූරයේ කාර්ය ඉටුකිරීම සඳහා මණ්ඩලය විසින් සුදුසුයයි අදහස් කරන පරිදි යම් වැඩපිළිවෙලක් යෙදිය යුතුය.

(3) මණ්ඩලයේ විධානයට යටත්ව අධිකාරියේ කටයුතු පරිපාලනය සහ කාර්ය මණ්ඩලය පාලනය කිරීම විධායක නිලධරයා වෙත පැවරිය යුත්තේය. මණ්ඩලයේ සියලුම තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුත්තේය.

(4) මණ්ඩලයේ කිසියම් රැස්වීමකට හෝ කිසියම් කමිටුවකට පැමිණ ඇමතීමට විධායක නිලධරයා හිමිකම් ලැබිය යුතු අතර ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය නොතිබිය යුතුය.

(5) මණ්ඩලය විසින්, විධායක නිලධරයා,

(අ) නිත්‍ය ලෙස තම කාර්යයන් ඉටු කිරීමට අපොහොසත් වූවහොත් හෝ

(ආ) මණ්ඩලය අදහස් කරන පරිදි එංවා සහගත හෝ නීති විරෝධී හෝ මණ්ඩලයේ යහපතට

අගතියක් වන යම් ක්‍රියාවක් හෝ යම් දෙයක් සිදුකර ඇත්තම් හෝ

(ඇ) මණ්ඩලයේ විධානයන්ට පටහැනි ලෙස ක්‍රියා කරයි නම් හෝ ධූරයෙන් ඉවත් කළ හැකිය.

(6) විධායක නිලධරයා මියගිය විට (5) උපවගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කළ විට හෝ එම ධූරය දරන තැනැත්තා මණ්ඩලය අමතා තත් කාර්යය සඳහා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වූ විට ඔහුගේ ධූරය හිස්වන්නේය.

17 (1) මෙම පනතේ විධිවිධානවලට සහ එම පනත යටතේ සාදනු ලබන යම් රීතිවලට යටත්ව, අධිකාරියේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීමේ බලය මණ්ඩලය සතු වන්නේය.

අධිකාරියේ නිලධරයන් සහ සේවකයන්

(2) අධිකාරියේ නිලධරයන් සහ සේවකයන්ගේ සෑම පත්වීමක්ම රීතිවලින් නියමකර ඇති පත්කිරීම සඳහා ඇති කාර්ය පටිපාටි සහ බඳවා ගැනීමේ කාර්ය පටිපාටිවලට අනුකූලව මණ්ඩලය විසින් සිදුකළ යුත්තේය.

(3) මෙම පනතේ විධිවිධානවලට සහ එම පනත යටතේ සාදනු ලබන යම් රීතිවලට යටත්ව මණ්ඩලය විසින් අධිකාරියේ නිලධරයන් සහ සේවකයන්ගේ වේතන, වැටුප් සහ අනෙකුත් පාරිශ්‍රමික ඇතුළුව ඔවුන්ගේ සේවා කොන්දේසි සහ නියමයන් නිශ්චය කළ යුත්තේය.

(4) අධිකාරියේ නිලධරයන් සහ සේවකයන් සේවයෙන් පහ කිරීමේ බලය ඇතුළුව මණ්ඩලයේ විනය පාලනයට යටත් විය යුත්තේය. මණ්ඩලය විසින් විනය කටයුතු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකිය.

(5) මණ්ඩලය විසින් අධිකාරියේ නිලධරයන් සහ සේවකයන්ගේ අභිවෘද්ධිය සඳහා අර්ථ සාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා නියාමනය කළහැකි වන අතර එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් සපයනු ලැබිය හැකිය.

18 යම් නිශ්චිත කාලයක් රජයට සේවය කිරීමට ගිවිසගෙන සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවකදී, ඒ තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරන යම් කාලයක් එකී ගිවුසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට සේවය කළ කාලයක් ලෙස සලකනු ලැබිය යුතුය.

ඇතැම් ගිවිසුම්වල අවශ්‍යතාව සඳහා අධිකාරියේ සේවය රජයට කරන සේවයක් ලෙස සැලකිය යුතු බව.

19 (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේද, ඒ නිලධරයා සේවයේ නියුක්තව සිටින යම් ආයතනයක් හෝ දෙපාර්තමේන්තුවක් අයත්වන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ, අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබිය හැකිය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

(2) මණ්ඩලයේ ඉල්ලීම පිට (1) වන උපවගන්තියේ සඳහන් නිලධරයකු හැර රජයේ සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ, අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු

ලබන කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලික පත්කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත්කරනු ලැබිය හැකිය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු, අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14(2) වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු, අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවල 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14(3) වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

## iv කොටස

## මුදල්

20 (1) මෙම පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබුවා සේ සලකනු ලබන සංචාරක සේවාවක් මෙහෙයවන සෑම තැනැත්තකු මත එම සේවාව මෙහෙයවීමෙන් වර්ෂයකට එම තැනැත්තාට ලැබෙන පිරිවැටුම මත අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියෝගයක් මගින් නියම කළහැකි යම් ප්‍රමාණයක් අනුව ගණන් බලනු ලැබූ දායක බද්දක් සෑම වර්ෂයකම පනවා ඔහුගෙන් අය කරගත යුත්තේය. විවිධ පන්තිවලට හෝ විස්තරවලට අයත් සංචාරක සේවා වෙනුවෙන් විවිධ බදු ප්‍රමාණයන් නියම කළහැකිය.

සංචාරක සේවා මෙහෙයුම් කරුවන්ගේ වාර්ෂික පිරිවැටුම පිළිබඳ දායක බද්ද

(2) (1) වන උප වගන්තිය යටතේ කවර හෝ වර්ෂයක් සඳහා දායක බද්දක් ගෙවිය යුතු සෑම තැනැත්තකු විසින් ඊළඟ වර්ෂයේ මාර්තු තිස්වන දින හෝ එදිනට පෙර අධිකාරිය වෙත එම බද්ද ගෙවිය යුතුය.

(3) යම් තැනැත්තකු විසින් කිසියම් වර්ෂයක් සඳහා ගෙවිය යුතු දායක බද්දක් ඊළඟ වර්ෂයේ මාර්තු තිස්වන දින හෝ එදිනට පෙර එම තැනැත්තා විසින් නොගෙවන අවස්ථාවකදී බදු ගෙවීම පැහැර හරිනු ලැබුයේ සලකනු ලබන අතර එම තැනැත්තා බදු ගෙවීම පැහැර හැරිය තැනැත්තෙකු සේ සලකනු ලැබිය යුතුය.

(4) (3) වන උපවගන්තිය ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් දායක බද්දක් ගෙවීම පැහැර හරනු ලැබුවා සේ සලකනු ලබන අවස්ථාවක බදු ගෙවීම පැහැර හරින තැනැත්තා විසින් දායක බද්දට අමතරව දායක බද්දෙන් සියයට දහයකට සමාන මුදල් ප්‍රමාණයකින් දඩ මුදලක් ගෙවිය යුතුය.

(5) මෙම වගන්තිය යටතේ ගෙවිය යුතු දායක බද්ද ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක අධිකාරිය විසින් 21 වන වගන්තියේ සලසා ඇති විධිවිධාන ප්‍රකාරව එම බද්ද අයකර ගැනීමට කටයුතු කිරීමට පෙර ගෙවීමට පැහැර හැර ඇති එම බද්ද සහ එම බද්ද සඳහා ගෙවිය යුතු දඩ මුදල නියමිත කාලසීමාවක් තුළ ගෙවිය යුතු ලෙස දන්වා යවන ලියවිල්ලකින් ගෙවීම් පැහැර හරින තැනැත්තාට නියම කළ යුතුය.

(6) (5) වන උපවගන්තිය යටතේ දැනුම්දීමේ ලියවිල්ලක් සංචාරක සේවය මෙහෙයවනු ලබන

තැනැත්තා විසින් එය ලියාපදිංචි කිරීම සඳහා අධිකාරියට සපයා ඇති ලිපිනය වෙත ඔහුට ලියාපදිංචි තැපෑලෙන් යවන ලද්දේ නම් හෝ ඔහු වෙත පෞද්ගලිකව භාර දෙන්නේ නම් එම ලියවිල්ල ගෙවීම පැහැර හරින තැනැත්තා වෙත නිසි පරිදි භාරදෙනු ලැබුවා සේ සැලකිය යුත්තේය. එම ලිපිය සාමාන්‍ය තැපෑලෙන් ඔහුට භාරදීමට තිබූ දිනයේදී ඔහු ලැබී ඇති සේ සැලකිය යුත්තේය.

21 (1) (21) වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ යවන ලද ලියවිල්ලක සඳහන් දිනය අවසන්වීමට පෙර දායක බදු මුදල් ප්‍රමාණය ගෙවා නොමැති අවස්ථාවකදී විධායක නිලධරයා විසින් දායක බදු මුදල් ප්‍රමාණය සහ එම බදු මුදල ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාගේ නම හා ඔහු අවසාන වරට පදිංචිව සිටි ස්ථානය ලෙස හඳුනාගත් ස්ථානය හෝ ඔහුගේ ව්‍යාපාරය පිළිබඳ සඳහන් කළ සහතිකයක් ඔහු පදිංචි ස්ථානය පිහිටා ඇති කොට්ඨාශයේ අධිකරණ බලය තිබෙන මහේස්ත්‍රාත්වරයකු වෙත නිකුත් කරනු ලැබිය හැකිය. අනතුරුව මහේස්ත්‍රාත්වරයා විසින් ගෙවීම් පැහැර හැරිය තැනැත්තා තමා හමුවට පමුණුවා ඔහුට එරෙහිව තවදුරටත් නඩු පැවරීමක් නොකළ යුතු වන්නේ මන්ද යන්න පිළිබඳව හේතු දක්වන ලෙස නියම කළ යුතු අතර, එයට ප්‍රමාණවත් හේතු දැක්වීමට ඔහු අපොහොසත් වුවහොත් ගෙවීමට පැහැර හැර ඇති බද්ද සිර අඩුවමකින්, අඩුවම් කළ නොහැකි දඩයකින් පමණක් අඩුවම් කළ හැකි වරදකට ඔහුට මහේස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩමුදලක් වශයෙන් සලකනු ලැබිය යුතුය. වරදක් සම්බන්ධයෙන් නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීමට අදාළ වන 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 291

දායක බද්ද අයකර ගැනීම

වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එම පනතේ (අ) , (ඇ) සහ (1) ජේ හැර) ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු වන අතර මහේස්ත්‍රාත්වරයා විසින් එම උපවගන්තියේ විධිවිධාන අනුව කිසියම් අඩුවමක් නියම කරනු ලබන අවස්ථාවේදී කල හැකි හැකිවී තිබූ යම් විධානයක් කරනු ලැබිය හැකිය.

(2) (1) උප වගන්තිය යටතේ සෑම නඩු පැවරීමකදී විධායක නිලධරයා විසින් අත්සන් කරන ලද සහතිකය අත්සන පිළිබඳව තහවුරු කිරීමකින් තොරව සාක්ෂි වශයෙන් පිළිගත යුතු අතර, එම සහතිකයේ එහි සඳහන් මුදල එහි නිශ්චිතව දැක්වෙන තැනැත්තාගෙන් දායක බද්ද වශයෙන් අයකර ගත යුතු මුදලක් බවටත්, එම මුදල ගෙවීම පැහැර හැර ඇති බවටත් තහවුරු කරගෙන ප්‍රමාණවත් සාක්ෂියක් විය යුත්තේය.

(3) මහේස්ත්‍රාත්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ඇති ක්‍රියා මාර්ගයකින් අයකරගනු ලැබූ මුදල් අධිකාරිය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු සැලැස්විය යුතුය.

22 (1) අධිකාරියට, අධිකාරියේම (මෙහි මින්මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් තිබිය යුතුය.

(2) අධිකාරියේ අරමුදලට පහත දැක්වෙන මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබිය යුතුය.

(අ) පාර්ලිමේන්තුව විසින් අධිකාරියේ ප්‍රයෝජනය සඳහා කලින් කල සම්මත කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන්.

(ආ) දායක බද්ද වශයෙන් අධිකාරිය වෙත ලැබිය හැකි මුදල් ප්‍රමාණයන්.

(ඇ) ඉඩම හා ගොඩනැගිලි සඳහා කුලී. ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ගාස්තු. සැකසුම් ගාස්තු. අධිකාරියේ කිසියම් චංචල හෝ නිශ්චල දේපලක් විකිණීමෙන් සහ ප්‍රකාශන විකිණීමෙන් ලැබෙන මුදල් වශයෙන් අධිකාරිය වෙත ලැබිය හැකි මුදල් ප්‍රමාණයන්

(ඈ) දේශීය සහ විදේශීය මාර්ගවලින් පරිත්‍යාග වශයෙන් ලැබිය හැකි මුදල් ප්‍රමාණයන්.

(3) අරමුදලින් -

(අ) මෙම පනත යටතේ අධිකාරියේ බලතල. කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී අධිකාරිය විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් ද

(ආ) මෙම පනතින් හෝ මෙම පනත යටතේ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල් ද ගෙවනු ලැබිය යුතුය.

23 (1) අධිකාරියේ කවර හෝ කාර්යයක් සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයන් හෝ යම් මුදලක් රජයෙන් හෝ කිසියම් පුද්ගලයකු හෝ පුද්ගලයන් ගෙන් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව මණ්ඩලය විසින් ණයට ගැනීම නිත්‍යානුකූල විය යුතුය.

ණය ගැනීම සඳහා ඇති බලතල

(2) මණ්ඩලය විසින් ණයට ගන්නා ලද යම් මුදලක් හෝ මුදල් ප්‍රමාණයක් සහ ඒ වෙනුවෙන් එකතුවන

පොලිය ආපසු ගෙවීම සඳහා ණයට දිය හැකි එම මුදල හෝ මුදල් ප්‍රමාණයන් හෝ එම මුදල් ප්‍රමාණයෙන් යම් කොටසක් වෙනුවෙන් අධිකාරියේ යම් දේපලක් හෝ අධිකාරියට ලැබෙන වෙනත් යම් මුදල් ප්‍රමාණයක් ණය දෙන්නාට හෝ ණය දෙන්නන්ට මණ්ඩලය විසින් උකසට තැබීමට හෝ පැවරීම හෝ කළ හැකිය.

ගිණුම් විගණනය

24 (1) අධිකාරියේ ආදායම හා වියදම සම්බන්ධයෙන් සහ වත්කම් හා බැරකම් හා අධිකාරියේ වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි ගිණුම් පොත්පත් තබාගැනීමට සැලැස්විය යුතුය.

(2) ලිත් වර්ෂය අධිකාරියේ මුදල් වර්ෂය විය යුතුය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(4) 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අධිකාරියට අදාළවන බව, සැකදුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

අධිකාරියේ මුදල් ආයෝජනය කිරීම.

25 මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි අධිකාරියට අයත් කවර හෝ මුදල් ආයෝජනය කරනු ලැබිය හැකිය.

## v කොටස

## සාමාන්‍ය කරුණු

26 (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් එම නියෝගයේ නිශ්චිතව සඳහන්වන කවර හෝ පන්තියකට හෝ විස්තරයකට අයත් යම් සේවාවක් සංචාරක චාරිකා හෝ නවාතැන් පහසුකම් හෝ ආහාර පාන

හෝ විනෝද ක්‍රීඩා හෝ ක්‍රීඩා හෝ අනෙකුත් පහසුකම් හෝ සංචාරකයන් ආකර්ෂණය කරගන්නා සේවා සපයන, හෝ සේවා සැපයීමට අපේක්ෂා කරන හෝ සේවා සැපයිය හැකි මෙම පනතේ කාර්යය සඳහා සංචාරක සේවාවක් විය යුතු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් එම නියෝගයේ නිශ්චිතව සඳහන්වන යම් තැනැත්තකු වෙත කවර හෝ නානායමක් පාලනය කිරීම පවරනු ලැබිය හැකිය.

(3) මෙම වගන්තිය යටතේ කරනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ එම නියෝගය පළකරනු ලබන දිනයේ හෝ එහි නිශ්චිත වශයෙන් සඳහන් කරනු ලැබිය හැකි පසු යම් දිනයක ක්‍රියාත්මක විය යුතුය.

(4) කවර හෝ ලිඛිත නීතියක මීට පටහැනිව කුමක් සඳහන් වුවද (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියෝගයක් ක්‍රියාත්මක විය යුතුය.

27 (1) මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි යම් පොදු විධානවලට හෝ විශේෂ විධානවලට මණ්ඩලය යටත් විය යුතු අතර එම විධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයා සතු බලතල.

28 (1) නියෝග සෑදීමට මෙම පනතින් බලයදී ඇති හෝ නියමකර ඇති නියෝග හෝ මෙම පනතින් නියමිත යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කිරීමේ දිනයේදී හෝ නියෝගයෙහි නිශ්චිත ලෙස දක්වා ඇති පසු දිනයකදී ඒවා ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියට පමුණුවනු ලැබිය යුතුය. එලෙස අනුමත නොකරනු ලැබූ සෑම නියෝගයක්ම ඒ අනුමතයේ දින සිට පරිච්ජින්න කරන ලද සේ සැලකිය යුතු නමුත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතුය.

(4) යම් නියෝගයක් එලෙස පරිච්ජින්න කරන ලදැයි සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

(5) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තය යටතේ විධාන නිකුත් කිරීමේදී වෙනත් කවර හෝඅමාත්‍යවරයකුගේ කර්තව්‍යයන්ට බලපාන කිසියම් කරුණක් සම්බන්ධයෙන් එම අමාත්‍යවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුත්තේය.

29 (1) රීති සෑදිය යුතුයයි මෙම පනත මගින් බලයදී ඇති හෝ නියමකර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය කියාත්මක කිරීමට හා ඉටු කිරීමට බලපාන හෝ ඒ හා සම්බන්ධව හෝ ඊට ආනුෂංගික යම් කරුණකට අදාළව මණ්ඩලය විසින් අවශ්‍යයයි සලකනු ලබන කිසියම් රීති සෑදනු ලැබිය හැකිය. රීති සෑදීම සඳහා අධිකාරිය සතු බලතල

(2) මණ්ඩලය විසින් සාදනු ලැබූ සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු අතර එම අනුමැතිය සහිත නිවේදනය ගැසට් පත්‍රයේ පළකළ යුතුය.

30 වෙනත් කවර හෝ ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිකාරියේ කිසියම් ප්‍රයෝජනයක් සඳහා අධිකාරිය විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා රේගු බද්ද මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරායගේ අනුමැතිය ඇතිව අහෝසි කල හැකිය. රේගු බද්දෙන් නිදහස් කිරීම

31 වෙනත් කවර හෝ ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද අධිකාරිය එහි ලාභ සහ ආදායම වෙනුවෙන් ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කළ යුතුය. ආදායම් බද්දෙන් නිදහස් කිරීම

32 මණ්ඩලය විසින් බලය පවරා ඇති (මෙහි මින්මතු බලයලත් නිලධරයකු වශයෙන් සඳහන් කරනු ලබන) කවර හෝ නිලධරයකු විසින්. පරීක්ෂාකර බැලීමට සහ සෝදිසි කර බැලීමට අධිකාරිය සතු බලතල

(අ) කවර හෝ සංචාරක සේවාවක් සැපයීම සඳහා හෝ සැපයීම සම්බන්ධයෙන් යොදා ගනු ලබන යම් පරිශ්‍රයකම ඇතුළුවී එය පරීක්ෂාකර බැලීමද.

(ආ) එම සේවා සම්බන්ධයෙන් එම පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලබන කවර හෝ පොත්පත්, ලේඛන හෝ චාර්තා පරීක්ෂාකර බලා ඒවායේ උද්ධෘත හෝ පිටපත් ලබාගැනීම ද.

(ඇ) පනතේ විධිවිධානවලට හෝ එම පනත යටතේ සාදනු ලැබූ යම් නියෝගයකට

**අනුකූලව කටයුතු කරන්නේදැයි සොයා දැනගැනීම පිණිස එම පරිශ්‍රයේ සිටින යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමද කළ හැකිය.**

33 අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතුය. අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

34 (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයකුට, නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරවිය යුතුය. මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ ගනු ලැබූ ක්‍රියා මාර්ගයක් සම්බන්ධයෙන් අධිකාරියේ නිලධාරීන් සහ මණ්ඩලයේ සාමාජිකයන් ආරක්ෂා කිරීම.

(2) අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියට ගෙනඑනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් නඩුවකදී හෝ අපරාධ නඩුවකදී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු අධිකාරියේ අරමුදලට බැරකළ යුතුය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින්, මෙම පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ හෝ කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව වූ යම් සිවිල් නඩුවකදී හෝ අපරාධ නඩුවකදී දරන ලද යම් වියදමක්, ඔහු විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බව අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් ඒ වියදම්, ඒ සිවිල්

තඩුවේදී හෝ අපරාධ නඩුවේදී ඔහු විසින් අය කරගෙන නොමැති නම්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

35 මණ්ඩලයේ සෑම සාමාජිකයකු සහ අධිකාරියේ සෑම නිලධරයකු සහ සේවකයකු දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්යයන් සඳහා, රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය. මණ්ඩලයේ සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

36 මෙම පනත යටතේ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම පිණිස යම් කාරණා සම්බන්ධයෙන් යම් වාර්තා හෝ තොරතුරු මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි කිසියම් ස්වරූපයකින් මණ්ඩලය වෙත සපයන ලෙස නියම කරනු ලැබිය හැකිය. වාර්තා

37 කවර හෝ තැනැත්තකු - වැරදි

(අ) මෙම පනත යටතේ තමා වෙත නියමකර ඇති යම් නියමයකට අනුකූලව යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීමට අපොහොසත් වුවහොත්,

(ආ) මෙම පනත යටතේ තමා විසින් යම් වාර්තාවක හෝ තොරතුරක දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරනු ලැබුවහොත්,

(ඇ) මෙම පනත යටතේ තමා විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක යම් කරුණක් සැපයීම හිතාමතාම පැහැර හරනු ලැබුවහොත්,

(ඈ) මෙම පනතින් හෝ මෙම පනත යටතේ තමන් වෙත පවරා ඇති බලතල කිසිවක් යම්

බලයලත් නිලධාරියකු විසින් ක්‍රියාත්මක කිරීමේදී ඒ නිලධාරියාට විරුද්ධ වුවහොත් හෝ බාධා කළහොත්.

(ඉ) මෙම පනතේ විධිවිධාන හෝ මෙම පනත යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් හෝ රීතියක් උල්ලංඝනය කරනු ලැබුවහොත්, එම තැනැත්තා මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ එක් වසරකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම හෝ යටත් විය යුතුය.

38 පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම් ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු සහ නිලධාරියකු ඒ වරද සඳහා වරදකරුවකු ලෙස සැලකිය යුතුය.

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරකි ආයතනයක් නම් ඒ ව්‍යාපාරක ආයතනයේ සෑම හවුල්කරුවකුම ඒ වරද සඳහා වරදකරුවකු ලෙස සැලකිය යුතුවය.

එසේ වුවද, එවැනි යම් තැනැත්තකු ඒ වරද ඔහුගේ දැනුමෙන් තොරව කර ඇති බව හෝ ඒ වරද කිරීමට වැලැක්වීම පිණිස නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව

ඔහු විසින් ඔප්පු කරන්නේ නම් ඒ වරද සඳහා ඔහු වරදකරු ලෙස සලකනු නොලැබිය යුතුය.

39 (1) 1960 අංක 10 දරන ලංකා සංචාරක පනත මෙයින් ඉවත් කරනු ලැබේ. පනත ඉවත් කිරීම සහ ඉතිරි කිරීම

(2) නියමිත දිනයට ඉහතින්ම වූ දිනයකදී ලංකා සංචාරක මණ්ඩලය වෙත පැවරී තිබුණු සියලුම චංචල හා නිශ්චල දේපළ නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය වෙත පැවරිය යුතුය.

(3) ලංකා සංචාරක මණ්ඩලය හෝ ඒ සමඟ ඇතුළත්වී ඇත්තාවූද නියමිත දිනයට ඉහතින්ම වූ දිනයේදී වලංගුව පැවතිය වූද සියලුම කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් අධිකාරිය විසින් සහ අධිකාරිය සමඟ නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතුය.

(4) ලංකා සංචාරක මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ නියමිත සිනයට ඉහතින්ම වූ දිනයේදී නිම නොවී පැවති සියලුම නඩු සහ නඩු කටයුතු නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබූ නඩු සහ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඉදිරියට පවත්වා ගෙන යා යුතුය.

(5) ලංකා සංචාරක මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ. නියමිත දිනයට ඉහතින් වූ දිනයේදී සම්පූර්ණ කර නැති යම් නඩුවක හෝ නඩු කටයුත්තකදී යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් දෙනු ලැබූ සියලු නඩු තීන්දු හෝ එළඹුනු ලැබූ තීරණ නියමිත දිනයේ

සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත වන පරිදි අධිකාරියේ වාසියට හෝ අධිකාරියට එරෙහිව දෙන ලද තීන්දු හෝ එළඹුනු ලැබූ තීරණ ලෙස සැලකිය යුතු අතර ඒ අනුව බලාත්මක කරනු ලැබිය යුතුය.

(6) නියමිත දින සිට ඉහතින්ම වූ දිනයේ බලංගුව පවතින ලංකා සංචාරක මණ්ඩලයේ සියලුම බැරකම් නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරියේ බැරකම් ලෙස සැලකිය යුතුය.

(7) නියමිත දිනයට ඉහතින්ම වූ දිනයේ ලංකා සංචාරක මණ්ඩලයේ සියලුම නිලධාරීන් සහ සේවකයන් නියමිත දිනයට ඉහතින්ම වූ දිනයේ ලංකා සංචාරක මණ්ඩලය විසින් සේවයේ යොදවනු ලැබූ කොන්දේසි සහ නියමයන්ම අඩු වාසිදායක නොවන කොන්දේසි සහ නියමයන් මත මාසයක් ඇතුළත අධිකාරියේ සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු අතර නියමිත දිනයේ සිට මාස දෙකක කාලසීමාවක් ඇතුළත එම සේවා නියුක්තිය භාරගනු නොලබන එවැනි යම් නිලධාරියකු හෝ සේවකයකු අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ගෙවනු ලබන යම් වන්දි මුදලක් ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතුය.

(8) 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත-ඉවත් කරනු ලැබුවේ වුවද, ඒ පනත යටතේ සාදනු ලැබ, නියමිත දිනයට ඉහතින්ම වූ දිනයේදී බලපැවැත්වෙන සෑම රීතියක්, නියෝගයක් හෝ නියමයක් මෙම පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක්කල් අවස්ථාවෝචිත පරිදි මෙම පනත යටතේ සෑදනු ලැබූ රීතියක්, නියෝගයක් හෝ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු අතර,

අවස්ථාවෝචිත පරිදි මෙම පනත යටතේ සාදනු ලබන රීතියකින්, නියෝගයකින් හෝ නියමයකින් ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කරනු ලැබිය හැකිය.

40 මේ පනත යටතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

41 මෙම පනතේ පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස - "ලංකා සංචාරක මණ්ඩලය" යන්නෙන් 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතින් පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලය අදහස් වේ.

අර්ථ නිරූපණය

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි යම් සභාවක් හෝ ප්‍රදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු සහ ඉටු කරනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූපව හෝ සමානව බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා කවර හෝ නීතියකින් හෝ එම නීතිය යටතේ පිහිටුවනු ලැබූ හෝ ස්ථාපිත කරනු ලැබූ යම් ආයතනයක් ඊට ඇතුළත් වේ.

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒ පරිච්ඡේදය අනුව පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ. සංචාරක සේවාවකට සහ යම් වර්ෂයකට අදාළ "පිරිවැටුම" යන්නෙන් එම වර්ෂයේ එම සේවාව සම්බන්ධයෙන් ඉටු කළ කටයුතුවලින් ලැබිය යුතු හෝ ලැබුණු සම්පූර්ණ මුදල අදහස් වේ.

# යෝජිත වගකීමට බැඳීඇති සීමාසහිත සමාගම

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය.

2000 ඔක්තෝබර්.

2000 ඔක්තෝබර් 13.

එච්.එම්.එස්. සමරනායක මහතා,
සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය
80, ගාලු පාර,
කොළඹ 03.

ප්‍රිය මහත්මයාණෙනි,

යෝජිත වගකීමට බැඳීඇති සීමාසහිත සමාගම
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය.

ලංකා සංචාරක මණ්ඩලයේ ප්‍රවර්ධන කටයුතු පවරාගෙන ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් ප්‍රවර්ධන කටයුතුවලදී සංචාරක කටයුතු සඳහා යොමුවූ ව්‍යාපාර කටයුතුවලින් අරමුදල් ලබාගන්නා යෝජිත වගකීමට බැඳී ඇති සීමාසහිත සමාගමේ කෙටුම්පතක් මේ සමඟ ඉදිරිපත් කරමි.

සංචාරක කටයුතු පිළිබඳ විශේෂඥ මණ්ඩලය විසින් සැලකිය යුතු තරම් සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව සමාගමේ පාදක ව්‍යුහය පිළිබඳ දැන් කටයුතු අවසන් කර ඇති අතර, එම අය වෙනුවෙන් මෙම කෙටුම්පත ඉදිරිපත් කරමි.

සංචාරක කටයුතු පිළිබඳ අලුතින් පත්වන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා සංදේශයක් සකස් කර පරමාර්ථ පිළිබඳ ඔහුට කරුණු පැහැදිලිකර දී රජයේ අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කිරීමට ඔහුගේ සහාය ලබාගැනීමට යෝජනා කරමි.

මේ සම්බන්ධයෙන් මගේ සහයෝගය ඉදිරියට ලබාදීමට පොරොන්දු වෙමි.

මෙයට - විශ්වාසී

අස්කර් මූසාජි

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ සාංගමික සංස්ථා පත්‍රය.

1 සමාගමේ නම (මෙහි මින්මතු අධිකාරිය යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය යනුවෙන් විය යුතුය.

2 අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටවනු ලැබේ.

3 අධිකාරිය පිහිටුවනු ලබන පරමාර්ථයන් පහත දැක්වෙන පරිදි වේ.

මූලික පරමාර්ථ :

(1) සංචාරකයන් සඳහා ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම

අනෙකුත් පරමාර්ථ -

(අ) සංචාරක සිත්ගන්නා සුළු ස්ථාන සහ කාර්යක්ෂම සේවා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ සමාජීය, සංස්කෘතික හා ස්වාභාවික උරුමය ආරක්ෂා කිරීම සහ රුකගැනීම ප්‍රවර්ධනය කිරීම.

(ඇ) සංචාරක සේවා හා සම්බන්ධ කටයුතු කිරීම සඳහා පුද්ගලයන් පුහුණු කිරීම හෝ පුද්ගලයන් පුහුණු කිරීම සඳහා මූල්‍යමය වශයෙන් සහායවීම.

(2) අනුයාත බලතල :

(අ) අධිකාරිය ලියාපදිංචි කරනු ලැබීමට, සංස්ථාගත කරනු ලැබීම හෝ අන්‍යාකාරයෙන් බලය පවරනු ලැබීමට හෝ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයෙන් පිටත යම් රටක හෝ ස්ථානයකදී නියෝජනය කරනු ලැබීමට කටයුතු සැලසීම.

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක සාමාජිකයන් හෝ පරිත්‍යාගශීලීන් වෙතින් ගාස්තු, ආධාර, ත්‍යාග, පරිත්‍යාග, සහනාධාර, ප්‍රදාන, මුදල් වශයෙන් හෝ ද්‍රව්‍ය වශයෙන් ලබාගැනීම හෝ එකතු කිරීම.

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක ඒ හා සමාන කටයුතුවල යෙදී සිටින අනෙකුත් සංවිධානවල සහාය ලබාගැනීම සහ ප්‍රවර්ධනය කිරීම සහ එම සංවිධානවලට සහායදීම හා ඒවා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක කිසියම් පුද්ගලයකු, රජය, සමාගමක් හෝ ආයතනයක් සමඟ කවර හෝ කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක් හෝ යම් වැඩපිළිවෙලක් සඳහා එළඹීම සහ අධිකාරියේ පරමාර්ථ හෝ කිසියම් පරමාර්ථයකට හිතකර බව පෙනී යාහැකි සියලු අයිතීන් අනුග්‍රහ සහ වරප්‍රසාද කවර හෝ රජයකින් හෝ අධිකාරියකින් ලබාගැනීම.

(ඉ) කවර හෝ බැංකුවක හෝ වෙනත් ඒ සමාන ආයතනයක ජංගම, ඉතිරි කිරීමේ තැන්පතු ගිණුම් ආරම්භකර පවත්වාගෙන යාම.

(ඊ) නිශ්චය කරනු ලබන ඇප මත නියමයන් සහ කොන්දේසි අනුව අධිකාරියේ අවශ්‍යතාව සඳහා කවර හෝ මුදල් ණයට ගැනීම.

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අධිකාරියේ කළමනාකරණ ආකාරය නිර්වචනය කිරීම් දක්වන තීති රෙගුලාසි හා අධිකාරියේ කටයුතු විධිමත්ව බාධාවකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු අතුරු ව්‍යවස්ථා හෝ අදාළ පනත් සම්පාදනය කිරීම, අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම.

(ඌ) පොදුවේ කලින් කල ආනුෂංගික වන හෝ හිතකර වන සහ අධිකාරියේ අදහස් හා පරමාර්ථය ප්‍රවර්ධනය සඳහා අවශ්‍යයයි සැලකෙන අනෙකුත් නිත්‍යානුකූල දේවල් පිළිබඳ කටයුතු ආරම්භ කිරීම.

(එ) නීතියෙන් දැනට නියම කරනු ලැබිය හැකි හෝ පැනවිය හැකි යම් කොන්දේසිවලට කෙසේ වෙතත් යටත්වීමට සුදුසුයයි අදාළ කළ හැකි පරිදි යම් ආයෝජන, සුරැකුම්පත් හෝ දේපළ හෝ වෙනුවෙන් අධිකාරියේ කාර්යය සඳහා ඉක්මනින්ම අවශ්‍ය නොවන මුදල් ආයෝජනය කිරීම.

එසේ වුවද :

i කවර හෝ භාරවලට යටත්විය හැකි යම් දේපළක් අධිකාරිය විසින් ලබාගන්නේ නම් හෝ දරන්නේ නම් එකී භාර පිළිබඳව සැලකිලිමත්වී නීතියෙන් අවසරය ලබාදී ඇති යම් ආකාරයකින් අධිකාරිය විසින් කටයුතු කිරීම හෝ එම දේපළ වෙනුවෙන් මුදල් ආයෝජනය කරීම කළ යුත්තේය.

ii වෘත්තිය සමිතියක් පිහිටුවීමට අධිකාරියේ පරමාර්ථයක් ඇත්නම්, යම් නියෝගයක්, සීමා කිරීමක් හෝ කොන්දේසියක් අධිකාරියේ සාමාජිකයන් හෝ අනෙකුත් තැනැත්තන් සම්බන්ධයෙන් පැනවීමට හෝ එම අය ලවා ඒවා පිළිපැදවීමට කටයුතු සැලැස්වීමට ගනු ලබන යම් උත්සාහයක් හෝ ඒ සඳහා ඇති යම් පරමාර්ථයක් වෙනුවෙන් අධිකාරිය විසින් එහි අරමුදල් යොදවා ආධාර නොකළ යුතුය.

අධිකාරිය විසින් යම් දේපළක් ලබාගන්නේ නම් හෝ දරන්නේ නම් සමාගම් ලේකම්වරයාගේ පූර්ව ලිඛිත බලය, අනුමැතිය හෝ කැමැත්ත නොමැතිව සහ නීතියකින් අන්‍යාකාරයෙන් අවශ්‍ය විය හැකි එවැනි බලය, අනුමැතිය හෝ කැමැත්ත නොමැතිව එම දේපළ විකිණීම, අගයට තැබීම, පැවරීම හෝ බද්දට දීම හෝ නොකළ යුතු අතර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අතට පත්විය හැකි එවැනි යම් දේපළක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අයකර ගත

යුතු අතර සංස්ථාගත කිරීමට බලපෑමක් ඇති නොවූයේ නම්, අධ්‍යක්ෂ මණ්ඩලය හෝ පාලක මණ්ඩලය පැවතිය යුතුව තිබුණු ආකාරයෙන් සහ ඒතාක් දුරට දේපළ නිසිලෙස පාලනය කිරීම සහ ඔවුන් විසින්ම සිදු කරනු ලබන ක්‍රියා, ලැබීම්, පැහැර හැරීම් සහ ගෙවීම් පැහැර හැරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

(ඒ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු පත්‍ර සහ අනෙකුත් ගණුදෙනු කළ හැකි හෝ පැවරිය හැකි නිත්‍යානුකූල ලේඛන හෝ සුරැකුම්පත් කස් කිරීම, ලිවීම, භාරගැනීම, වට්ටම් කිරීම, ගණුදෙනු කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම.

(ඔ) දැනට පවතින හෝ කලින් කල නීතියෙන් පනවනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් සහ අධිකාරිය විසින් එහි පරමාර්ථ ඉටු කිරීම සඳහා පහසුවිය හැකි හෝ අවශ්‍ය විය හැකි ලෙස අදහස් කරන කිසියම් අයිතිවාසිකම් හෝ වරප්‍රසාද සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ එවැනි දේපළක් මිලදී ගැනීම, බද්දට ගැනීම හෝ හුවමාරුවකට කුලියටදීම හෝ අන්‍යාකාරයෙන් අත්කර ගැනීම සහ විකිණීම හා අන්‍යාකාරයෙන් බැහැර කිරීම.

(ඕ) විධායක කාර්ය මණ්ඩලය, නීතිඥයන්, නියෝජිතවරුන්, කළමනාකරුවන්, කාර්මික ශිල්පීන්, ලිපිකරුවන්, කම්කරුවන්, සේවකයන් සහ අනෙකුත් සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, නඩත්තු කිරීම, එම තැනැත්තන් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සහ සේවයෙන් පහ කිරීම සහ සුදුසුයයි අදහස් කරන ආකාරයෙන් යම් ප්‍රමාණයකින් එම අය සඳහා පාරිශ්‍රමය ගෙවීම.

(ක) පරිත්‍යාග අරමුදලක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම, එම අරමුදල සඳහා ලැබෙන දායක මුදල් සහ පරිත්‍යාග මුදල් භාරගැනීම හා පරිත්‍යාග ශීලීන්ගේ අභිප්‍රායන් හෝ 'උපදෙස්වලට

හැකිතාක් ගෞරව කිරීම සහ අරමුදල කළමනාකරණය සහ පරිපාලනය සම්බන්ධයෙන් නීති රෙගුලාසි සම්පාදනය කිරීම.

(ග) නිලධාරීන්ට, සේවකයන්ට හා කලින් සිටි සේවකයන්ට හෝ යැපෙන්නන්ට හෝ එවැනි කිසියම් තැනැත්තන්ට සම්බන්ධ අයට විශ්‍රාම වැටුප්, දීමනා, පාරිතෝෂික ප්‍රසාද මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලබාදීම ඉහත සඳහන් පරිදි එවැනි යම් තැනැත්තන්, ඔවුන්ගේ යැපෙන්නන් හෝ සම්බන්ධ තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප්, අර්ථසාධක ප්‍රතිලාභ, අසනීප හෝ යානුකම්පිත දීමනා, ජීවිත රක්‍ෂණය හෝ වෙනත් ප්‍රතිලාභ ලබාදීමේ අභිලාෂය ඇතිව අරමුදල් හෝ යෝජනා ක්‍රම (දායක හෝ දායක නොවන වුවද) පිහිටුවීම, ඒවාට දායක මුදල් සැපයීම සහ පවත්වාගෙන යාම සහ අධිකාරියේ හෝ එහි නිලධාරීන්ට හෝ සේවකයන්ට සෘජුව හෝ වක්‍රව ප්‍රතිලාභ ලබාදීම පිණිස යොදාගත හැකි පුත්‍යාධාර අරමුදල් හෝ අයාතන සඳහා ආධාර කිරීම හෝ දායක මුදල් සැපයීම.

(ච) ගිවිසුම් නිදහස ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රතිවිරුද්ධ ක්‍රියාවකට එරෙහිවීම, ආරක්‍ෂාව ඇති කිරීම හා ඒහා සම්බන්ධ මැදිහත්වීම් වැළැක්වීම සහ එවැනි කිසියම් අවශ්‍යතා වෙනුවෙන් යම් සංගමයකට හෝ අරමුදලකට දායකවීම.

(ජ) අධිකාරිය විසින් සපයනු ලබන සේවා පහසුකම් හෝ උපකරණ සඳහා ගාස්තු හෝ අනකුත් අයකිරීම් අයකර ගැනීම.

(ත) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ සහ විදේශීය රටවල විවිධ අලෙවිකරණ ක්‍රමෝපායන් ආරම්භ කිරීම.

(ද) සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් පර්යේෂණ වැඩසටහන් සහ සැලසුම් කිරීමේ හා සංවර්ධනය වැඩසටහන් සහ යෝජනා ක්‍රම පවත්වාගෙන යාම.

(ත) කිසියම් පළාත් පාලන ආයතනයකට, පළාත් සභාවකට, රාජ්‍ය සංස්ථාවකට, රජයේ දෙපාර්තමේන්තුවකට, මූල්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයෙකින්ද අධිකාරියේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍යවිය හැකි හෝ හිතකර විය හැකි ඕනෑම ක්‍රියාවක් හෝ ඕනෑම දෙයක් සිදු කිරීම සඳහා යම් සංචාරක සේවාවක් මෙහෙයවන හෝ පවත්වාගෙන යන යම් පුද්ගලයකුට හෝ පුද්ගල මණ්ඩලයකට (සංස්ථාගත හෝ සංස්ථාපිත නොවූවද) ණය මුදල් සැපයීමෙන්ද සහායවීම.

(ට) ශ්‍රී ලංකාවේ සිත්ගන්නා සුළු සහ ආකර්ෂණීය ස්ථාන කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා සැලසුම්කළ ප්‍රදර්ශන භාණ්ඩ සහ දෘශ්‍යමය ද්‍රව්‍ය ප්‍රදර්ශනය කිරීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් ද සිත්ගන්නා සුළු ස්ථාන, ගමන් මාර්ග, ප්‍රවාහන පහසුකම්, සංචාරක සේවා සහ අධිකාරිය විසින් පරමාර්ථ මුදුන් පමුණුවාගැනීම සඳහා අවශ්‍යයයි සලකනු ලබන අනෙකුත් කරුණු පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම, පළ කිරීම සහ ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන්ද සංචාරක, චාරිකා සහ අනෙකුත් නියෝජිත ආයතන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම සහ එම කටයුතුවල නිරතවීම.

(ඩ) අධිකාරියේ පරමාර්ථය ඉටුකර ගැනීමට ආනුෂංගිකවන හෝ හිතකරවන සියලූ ක්‍රියා සහ දේවල් ශ්‍රී ලංකාවේදී හෝ වෙනත් ස්ථානයකදී ඉටු කිරීම.

(ණ) ඉහතින් සඳහන් අනුඡේදයේ සඳහන් ඕනෑම කරුණක් සියලූ කරුණු සහ දේවල් ප්‍රධාන නියෝජිතයන්, නියෝජිතයන්, භාරකරුවන්, කොන්ත්‍රාත්කරුවන් වශයෙන් හෝ අන්‍යාකාරයෙන් ද තනිව හෝ අනෙකුත් අය සමග එක්වද නියෝජිවරුන්, උපකොන්ත්‍රාත්කරුවන්, භාරකරුවන් විසින් නැතහොත් ඔවුන් මගින් හෝ අන්‍යාකාරයෙන්ද ඉටු කිරීම.

(4) කවර හෝ ආකාරයකින් ලබාගනු ලබන අධිකාරියේ ලාභ, ආදායම සහ දේපළ සාංගමික සංස්ථා පත්‍රයේ සඳහන් වන පරිදි අධිකාරියේ පරමාර්ථ

හුදෙක් ප්‍රවර්ධනය කිරීම සඳහාම යොදාගත යුතු අතර ඒවායේ කිසිදු කොටසක් ලාභාංශ, ප්‍රසාද මුදල් වශයෙන් නැතහොත් කවර හෝ අන්‍යාකාරයකින් ලාභ වශයෙන් අධිකාරියේ සාමාජිකයන් වෙත සෘජුවම හෝ වක්‍රව ගෙවීම හෝ පැවරීම නොකළ යුතුය.

එසේ වුවද අධිකාරිය වෙනුවෙන් ඇත්ත වශයෙන්ම ඉටුකළ යම් සේවාවන් වෙනුවෙන් අධිකාරියේ යම් නිලධාරියකුට හෝ සේවකයකුට හෝ යම් සාමාජිකයකුට සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් සත්භාවයෙන් ගෙවීම හෝ අධිකාරියට ණයට දුන් මුදල් වෙනුවෙන් දැනට ශ්‍රී ලංකා මහා බැංකුව විසින් බලයදී ඇති ප්‍රමාණය නොඉක්මවන පොළී ප්‍රමාණයක් ගෙවීම හෝ යම් සාමාජිකයකු විසින් අධිකාරියට පවරාදී ඇති හෝ කුලියට දී ඇති පරිශ්‍රයක් සඳහා සාධාරණ හා නිසි කුලියක් ගෙවීම හෝ මෙහි සඳහන් විධිවිධාන කිසිවකින් නොවැළැක්විය යුතු අතර. එහෙත් අධිකාරියේ වැටුප් සහිත යම් නිලයකට හෝ අධිකාරියේ ගාස්තු ගෙවනු ලබන යම් නිලයකට එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක මණ්ඩලයේ කිසිදු සාමාජිකයකු පත් නොකළ යුත්තේය. එසේම අධිකාරියට පවරා දී ඇති හෝ කුලියට දී ඇති පරිශ්‍රයක් සඳහා සාධාරණ හා නිසි කුලියක් ගෙවීම හෝ ණයටදී ඇති මුදල් වෙනුවෙන් ඉහත සඳහන් පරිදි පොළිය ගෙවීම සහ සුළු වියදම් සඳහා දරන ලද මුදල් ආපසු ගෙවීම හැර අධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක මණ්ඩලයේ කවර හෝ සාමාජිකයකුට කිසිදු පාරිශ්‍රමිකයක් හෝ වෙනත් ප්‍රතිලාභ මුදලින් හො 'මුදලේ වටිනාකමින් නොගෙවිය යුත්තේය. එසේ වුවද අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයකු. සාමාජිකයකුව සිටිය හැකි කිසියම් සමාගමකට යම් මුදලක් ගෙවීම සම්බන්ධයෙන් ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු අතර. එම සාමාජිකයා විසින් එම සමාගමේ ප්‍රාග්ධනයෙන් සියයෙන් එක් කොටසකට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණයක් නොදැරිය යුත්තේය. එසේම එවැනි යම් ගෙවීමක් සම්බන්ධයෙන් එම සාමාජිකයා තමන් වෙත ලැබිය හැකි කිසියම් කොටසක් හෝ ලාභයක් සම්බන්ධයෙන් වගකීමට බැඳී නොසිටිය යුත්තේය.

(5) සංගමික සංස්ථා පත්‍රය හෝ ව්‍යවස්ථාවලිය කලින් කලින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර අනුමත කර ඇත්නම්, දැනට බලපවත්නා එකී සංස්ථා පත්‍රයේ හෝ ව්‍යවස්ථාවලියේ විධිවිධානවලට අලුතින් එකතු කිරීම, එම විධිවිධාන වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම

කළ හැකිවේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාංගමික සංස්ථා පත්‍රය හෝ සංගමයේ ව්‍යවස්ථාවලිය කලින් අනුමත කර ඇත්නම්, මිස එම සංස්ථා පත්‍රය හෝ ව්‍යවස්ථාවලියට අලුතින් යම් එකතු කිරීමක්, එය වෙනස් කිරීමක් හෝ සංශෝධනය කිරීමක් සිදු කිරීම සඳහා ඇති කිසියම් යෝජනාවක් අධිකාරියේ මහ සභා රැස්වීමකට ඉදිරිපත් නොකළ යුත්තේය.

(6) 1982 අංක 17 දරන සමාගම් පනතේ 21(1) වගන්තිය ප්‍රකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍රයක් ලබාදී ඇති කොන්දේසි මෙම සාගමික සංස්ථා පත්‍රයේ සිව්වැනි සහ පස්වැනි ජේදවල සඳහන්වේ.

(7) සාමාජිකයන්ගේ වගකීම සීමා සහිතය.

(8) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු තමන් සාමාජිකයකුව සිටියදී හෝ ඉන්පසු වසරක් ඇතුළතදී අධිකාරිය විසුරුවා හරිනු ලබන අවස්ථාවකදී තමන්ගේ සාමාජිකත්වය අවසන්වීමට පෙර පැවති අධිකාරියේ ණය සහ බැරකම් ද විසුරුවා හැරීමේ ගාස්තු, අයකිරීම් සහ වියදම් ද දායකයන් අතරේ එම අයගේ අයිතීන් ගැලපීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි රුපියල් සියයක් (රු. 100/-) පමණක් නොඉක්මවන මුදලක් ද ගෙවීම සඳහා අධිකාරියේ වත්කම්වලට දායකවීමට බැඳී සිටී.

(9) අධිකාරිය විසුරුවා හැරීමේදී හෝ අහෝසි කිරීමේදී කවර හෝ එහි සියලු ණය සහ බැරකම් සහ දේපළ ගෙවා දැමීමෙන් අනතුරුව ඉතිරිවන කිසියම් දේපළක් අධිකාරියේ සාමාජිකයන්ට ගෙවීම හෝ සාමාජිකයන් අතරේ බෙදාදීම හෝ නොකළ යුතු අතර අධිකාරියේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති රජයේ වෙනත් යම් ආයතනයකට හෝ කළ යුත්තේය. එසේම මෙහි 4 වන වගන්තිය යටතේ හෝ එම වගන්තිය ප්‍රකාරව අධිකාරිය වෙත අඩු තරමින් පැවරෙන ප්‍රමාණයකින් එහි ආදායම හෝ ඒවායේ ආදායම සහ දේපළ එහි සාමාජිකයන් හෝ අනෙකුත් සාමාජිකයන් අතරේ බෙදා හැරීම තහනම් කළ යුතුවන අතර අධිකාරිය අහෝසි කිරීමේදී හෝ ඊට පෙර අධිකාරියේ සාමාජිකයන් විසින් එකී දේපළ පවරනු ලබන ආයතනය හෝ ආයතන පිළිබඳව තීරණය කළ යුතුවන අතර එසේ තීරණය කිරීම පැහැර හරනු ලැබූ අවස්ථාවකදී පුත්‍රයාධාර අරමුදල් පිළිබඳ අධිකරණ බලය ඇති විනිසුරුවරයකු විසින් එම ආයතන පිළිබඳව තීරණය

කළ යුතුය. ඉහතකී විධිවිධානය ක්‍රියාත්මක කළ නොහැකි නම් වෙනත් යම් ප්‍රත්‍යාධාර පරමාර්ථයක් සඳහා එකී දේපළ පවරාදීමට ක්‍රියා කළ යුතුය.

10 අධිකාරිය වෙත ලැබුණු හෝ අධිකාරිය විසින් වියදම් කරනු ලබන මුදල් පිළිබඳවද එම මුදල් ලැබෙන හා වියදම් කරන ආකාරය පිළිබඳවද අධිකාරියේ දේපළ, ණය සහ බරකම් පිළිබඳවද සත්‍ය ලෙස ගිණුම් තැබීමක් සිදු කළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම ගිණුම් පරීක්ෂාකර බැලීමට ඉඩදිය යුතුය. යටත් පිරිසෙයින් වසරකට එක්වරක් හෝ එම ගිණුම් තිසි සුදුසුකම් ලබා ඇති එක් විගණකවරයකු විසින් හෝ විගණකවරුන් වැඩි දෙනෙකු විසින් හෝ පරීක්ෂා කර බැලිය යුතුය.

මෙම සාංගමික සංස්ථාපත්‍රය අනුව මෙහි පහත නම් සහ ලිපිනයන් සඳහන් වන කිපදෙනෙකු වන අපි ඇතුළත්ව සමාගමක් පිහිටුවීමට කැමැත්ත ප්‍රකාශ කර සිටිමු.

මෙයට අත්න් තබන අයගේ නම්, ලිපිනයන් සහ විස්තර

අත්සන්

හේවා මල්වත්තගේ සුගතපාල සමරනායක
සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය,
අංක 80, ගාලු පාර,
කොළඹ 3.
සංචාක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
64, ගාලු පාර,
කොළඹ 3.

දිනය :- දෙදහස් ... වර්ෂයේ .................... මාසයේ ........... දින

සාක්ෂිකරුවන් :-

## සංගමයේ ව්‍යවස්ථාවලිය.

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය.

1 1982 අංක 17 දරන සමාගම් පනතේ පළමු වැනි උප ලේඛනයේ "ඇ" වගුවේ දැක්වෙන රීති සමාගම සම්බන්ධයෙන් අදාල නොවිය යුතු අතර මෙහි ඇතුළත් රෙගුලාසිවලින් සමාගම පාලනය විය යුතුය.

### අර්ථනිරූපණය

මෙම ව්‍යවස්ථාවල

"පනත" යනුවෙන් 1982 අංක 17 දරන සමාගම් පනත අදහස් වේ. "අධිකාරිය" යනුවෙන් මෙමලියවිල්ල යටතේ පිහිටුවනු ලබන "ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය" අදහස් වේ. "මණ්ඩලය" යනුවෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වේ.

"ලංකා සංචාරක මණ්ඩලය" යනුවෙන් 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලය අදහස් වේ.

"කාර්යාලය" යනුවෙන් අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය අදහස්වේ. "රෙජිස්ට්‍රාර්" යනුවෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ. "මුද්‍රාව" යනුවෙන් අධිකාරියේ පොදු මුද්‍රාව අදහස් වේ. ලියවිල්ල යන සඳහා ඇති යෙදුමෙන් ඊට පටහැණි අදහසක් පෙනී යන්නේ නම්, මිස එම යෙදුම මුද්‍රණය, මුද්‍රණ ශිල්පය, ඡායාරූප ශිල්පය සහ දැකිය හැකි ස්වරූපයකින් වචන ඉදිපත් කිරීමේ හෝ පිටපත් කිරීමේ ක්‍රම සම්බන්ධයෙන් සඳහන් කිරීම්වලට ඇතුළත් වන ලෙස කියවා තේරුම්ගත යුතුය. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස මෙම ව්‍යවස්ථාවල දැක්වෙන වචන හෝ යෙදුම්වල අධිකාරිය මෙම ව්‍යවස්ථාවලින් බැඳෙන දිනයේදී බලපැවැත්වූ පනතේ හෝ එහි කිසියම් ව්‍යවස්ථාපිත වෙනස් කිරීමක ඇති අර්ථයම ඇත්තේය.

ඒක වචනය හැඟවෙන වචනවලට බහුවචනද, බහු වචන හැඟවෙන වචනවලට ඒක වචනද ඇතුළත් විය යුතු අතර, පුරුෂ ලිංග පදය ඇතුළත්වන වචනවලට ස්ත්‍රී ලිංග පදය සහ නපුංසක ලිංග පදය

ඇතුලත්විය යුතුය. පුද්ගලයන් පිළිබඳ හැඟවෙන වචනවලට සංස්ථා සහ සමාගම් ඇතුලත්විය යුතුය.

තිරු සටහන් පහසුව පිණිස මෙහි ඇතුලත් කර ඇති අතර, මෙම ව්‍යවස්ථාවල වදන් පෙළට හෝ අර්ථ නිරූපණයට එයින් බලපෑමක් ඇති නොවිය යුත්තේය.

2 අධිකාරිය විසින් ලියාපදිංචි කරනු ලැබීමට යෝජනා කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව සීමාරහිත වන නමුදු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර සාමාජිකයන් සංඛ්‍යාව ලියාපදිංචි කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනුලැබිය හැකිය.

3 (අ) සංචාරක සේවා හෝ ඒ ආශ්‍රිත සේවා සපයන සහ ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචිවී ඇති සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ කිසියම් පුද්ගල මණ්ඩලයක් හෝ ස්වාභාවික පුද්ගලයන්පාලක මණ්ඩලයේ තුදෙක් අභිමතය පරිදි ඇතුලත්වීමේ ගාස්තුවකට සහ සාමාජිකයකු ලෙස ඇතුලත් කරගනු ලබන පුද්ගලයාගේ පිරිවැටුම මත ගණනය කරනු ලබන වාර්ෂිකදායක ගාස්තුවකට යටත්ව අධිකාරියේ සාමාජිකත්වයට ඇතුලත් කර ගනු ලැබිය හැකිය.

(ආ) කිසියම් සාමාජිකයකු විසන් දායක ගාස්තු හෝ අයවිය යුතු අනෙකුත් මුදල් කිසිවක් මාස තුනකට වැඩි කාලයක් නොගෙවා හිඟව තිබෙන විට අධිකාරියේ යම් රැස්වීමකදී ඡන්දය පාවිච්චි කිරීමට ඔහුට ඉඩ නොදිය යුතු අතර ඔහු විසින් සියලු හිඟ මුදල් සම්පූර්ණයෙන් ගෙවන තුරු මහුගේ සියලු වරප්‍රසාද අත්හිටුවිය යුතුය. එම සාමාජිකයා විසින් ගෙවිය යුතු සියලු හිඟ මුදල් සම්පූර්ණයෙන් ගෙවා ඇත්නම් මිස ඔහුගේ ලියාපදිංචි කාර්යාලය වෙත එක් මසක කාලයක් කල් ලබාදීමේ ලිපියක් භාරදීමෙන් අනතුරුව සාමාජිකයාග් ලේඛනයෙන් මණ්ඩලය විසින් ඔහුගේ නම ඉවත් කරනු ලැබිය හැකිය.

(ඇ) පහත සඳහන් අවස්ථාවලින් එක් අවස්ථාවකදී එම අවස්ථාවට අදාලවන කරුණ අනුව සාමාජිකත්වය අහෝසි වනිය යුතුය.

i යම් සාමාජිකයකු විසින් තමා සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට කැමැති බව ලිඛිතව කරන ලද දැනුම්දීමක් මණ්ඩලය වෙත ලැබුණු විට.

ii සාමාජිකයා වස්තුභංගත්වයට හෝ බංකොලොත් භාවයට පත්ව ඇති ලෙස තිසි බලධරයකු විසින් විනිශ්චය කරනු ලැබ ගෙවීම් අත්හිටුවන විට හෝ ණය හිමියන් සමඟ සමථයකට හෝ පත්වන විට නැතහොත් බලය ලත් සංස්ථාවක් සම්බන්ධයෙන් එයට එරෙහිව එය අහෝසි කිරීමේ නියෝගයක් ඇතුලත් කර ඇති විට.

iii මණ්ඩලය විසින් පත්කර ඇති විනය කමිටුවක් මගින් සාමාජිකයා අධිකාරියේ පරමාර්ථ උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හෝ සංගමයේ කීර්ති නාමයට, කීර්තියට සහ යහපතට හානිකර විෂමාචාරයකට වරදකරු වී ඇති විට.

iv ඉහත 3(අ) වගන්තිය අනුව සාමාජිකත්වය ඉවත් කර ඇති විට.

(ඇ) අධිකාරිය පිහිටුවනු ලබන්නේ සාංගමික සංස්ථා පත්‍රයේ ප්‍රකාශිත අරමුණු සඳහාය. මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රජයේ කිසියම් ප්‍රතිපත්ති නියමයන්ට අනුකූලවන ලෙස කලින් කල සාමාජිකත්වය සම්බනධයෙන් පවතින මිණුම්දඬුවලට අදාළ වන රීති පනවනුලැබිය යුත්තේය.

### මහ සභා රැස්වීම්.

4 අධිකාරිය විසින්, 4 (අ) වගන්තිය ප්‍රකාරව පවත්වනු ලබන "වැඩසටහන් සමාලෝචනය කිරීමේ මහ සභා රැස්වීම" යනුවෙන් හඳුන්වනු ලන මහා සභා රැස්වීමට අමතරව සෑම වර්ෂයකම වාර්ෂික මහා සභා රැස්වීමක් ලෙස මහ සභා රැස්වීමක් පැවැත්විය යුතු අතර රැස්වීම මහ සභා රැස්වීමක් ලෙස රැස්වීම කැඳවන නිවේදනවල නිශ්චිත වශයෙන් සඳහන් කළ යුත්තේය. අධිකාරියේ එක් වාර්ෂික මහ සභා රැස්වීමක් පැවැත්වෙන දිනය සහ ඊළඟ මහ සභා රැස්වීම පැවැත්වෙන දිනය අතරතුර කාලය මාස පහළොවකට වඩා නොඉක්මවිය යුතුය.

එසේ වුවද, අධිකාරිය සංස්ථාගත කළ පසු මාස දහඅට ඇතුළත එහි පළමු වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන තාක්කල් එය සංස්ථාගත කළ වර්ෂය තුළ හෝ ඊළඟ වර්ෂය තුළ හෝ එය පැවැත්වීම අවශ්‍ය නොවේ. අධ්‍යක්ෂවරුන් විසින් නියම කරනු ලබන පරිදි යම් ස්ථානයක වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්විය යුත්තේය.

5 (අ) එක් එක් මුදල් වර්ෂය ආරම්භවීමට පෙර රැස්වීම කැඳවීමේ නිවේදනය සමඟ කලින් සාමාජිකයන් වෙත බෙදාහැර ඇති අයවැය ඇස්තමේන්තුවල පිටපත් සමඟ වැඩකටයුතු පිළිබඳ වැඩසටහනක් සාමාජිකයන්ගේ දැන ගැනීම සහ ඔවුන් විසින් සාකච්ජා කිරීම සඳහා වැඩසටහන් සමාලෝචනය කිරීමේ මහ සභා රැස්වීම යනුවෙන් හඳුන්වනු ලබන මහ සභා රැස්වීම යනුවෙන් හඳුන්වනු ලබන මහ සභා රැස්වීමකදී ඉදිරිපත් කළ යුතු අතර මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා ඔවුන් හමුවේ ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් සාමාජිකයන්ගේ අදහස් දැනගැනීම රැස්වීමේ අරමුණය.

6 අධ්‍යක්ෂවරුන් විසින් සුදුසුයයි අදහස් කරන කවර හෝ අවස්ථාවක අතිවිශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය හැකි වන අතර එවැනි කැඳවීමක් මත අතිවිශේෂ රැස්වීම් ද කැඳවනු ලැබිය යුතුය. එසේ නැතහොත් පනතේ 128 වන වගන්තියේ සලසා ඇති විධිවිධාන පරිදි මහ සභාව රැස්වීමක් එසේ කැඳවන අය විසින් කැඳවිය හැකිය. කවර හෝ අවස්ථාවකදී සනපූරණයක් ඇති කිරීමට හැකි තරම් ප්‍රමාණවත් අධ්‍යක්ෂවරුන් ශ්‍රී ලංකාව තුළ නොසිටින විට අධිකාරියේ කවර හෝ අද්‍යක්ෂවරයකු හෝ කිසියම් සාමාජිකයන් දෙදෙනෙකු විසින්, අධ්‍යක්ෂවරුන් විසින් රැස්වීම කැඳවනු ලැබිය හැකි ආකාරයට හැකිතාක් දුරට සමානවන ආකාරයෙන් අතිවිශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය හැකිය.

## මහ සභා රැස්වීම් කැඳවීමේ නිවේදනය.

7 වාර්ෂික මහා සභා රැස්වීමක් සහ විශේෂ යෝජනාවක් සම්මත කිරීමට කැඳවනු ලබන රැස්වීමක් යටත් පිරිසෙයින් දින 21 කට කලින් ලිඛිතව

කරනු ලබන දැනුම්දීමකින් කැඳවිය යුතුය. වාර්ෂික මහ සභා රැස්වීමක් හෝ විශේෂ යෝජනාවක් සම්මත කිරීමට කැඳවනු ලබන රැස්වීමක් හැර යම් රැස්වීමක් යටත් පිරිසෙයින් දින 21 කට කලින් ලිඛිතවම කරනු ලබන දැනුම්දීමකින් ද කැඳවිය යුතුය. රැස්වීම කැඳවන නිවේදනයේ එය භාරදෙන හෝ භාරදෙනු ලැබේයයි සලකනු ලබන දිනය සහ එය දැනුම් දෙනු ලබන දිනය ඇතුලත් නොවිය යුතු අතර රැස්වීම පැවැත්වෙන ස්ථානය . දිනාය සහ වේලාව එහි නිශ්චිතව සඳහන් කළ යුතු අතර. විශේෂ කටයුත්තක් නම් එය කටයුත්තේ සාමාන්‍ය ස්වභාවය මෙහි මින්මතු සඳහන් කරනු ලබන ආකාරයට හෝ මහ සභා රැස්වීමකදී අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ආකාරයක් ඇත්නම් ඒ ආකාරයට සඳහන් කර අධිකාරියේ ව්‍යවස්ථා යටතේ එවැනි නිවේදන අධිකාරිය වෙතින් ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් වෙත දන්වා යැවිය යුත්තේය.

එසේ වුවද අධිකාරියේදී පැවැත්වෙන රැස්වීමක් මෙම ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් කාලයට වඩා කෙටි දැනුම් දීමකින් කැඳවනු ලැබුවද. ඒ සඳහා එකඟ වුවහොත් එම රැස්වීම නියි පරිදි කැඳවනු ලැබුවා සේ සලකනු ලැබිය යුත්තේය.

(අ) වාර්ෂික මහා සභා රැස්වීමක් ලෙස රැස්වීමක් කැඳවනු ලබන අවස්ථාවකදී සියලුම සාමාජිකයන් රැස්වීමට පැමිණ එහිදී ජන්දය දීමට හිමිකම් ලබති.

(ආ) වෙනත් යම් රැස්වීමක් කැඳවනු ලබන අවස්ථාවකදී රැස්වීමට පැමිණ ජන්දය දීමට අයිතියක් ඇති සාමාජික සංඛ්‍යාවෙන් බහුතරයක් සියලුම සාමාජිකයන් සහභාගිවන රැස්වීමකදී ජන්දය දීමේ සම්පූර්ණ අයිතිය ඇති සාමාජික සංඛ්‍යාවෙන් සියයට අනූපහකට නොඅඩු සංඛ්‍යාවක් නියෝජනය කරන බහුතරයක් වශයෙන් සිටිය යුතුය.

8 රැස්වීම කැඳවීමේ නිවේදනය ලැබීමට හිමිකම් ඇති යම් තැනැත්තෙකුට එය දැනුම්දීම අහම්බෙන් අතපසුවීම හෝ එම නිවේදනය ඔහුට නොලැබීම හෝ නිසා එම රැස්වීමේ කටයුතු එම හේතුවෙන් නිර්බල නොවිය යුත්තේය.

## මහ සභා රැස්වීමකදී කටයුතු

9 ගිණුම් හා ශේෂ පත්‍ර ද, අධ්‍යක්ෂවරුන් හා විගණකවරුන් ගේ වාර්තාද විගණනවරුන් පත්කිරීම සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකය නියම කිරීමද කලින් මුදල් වර්ෂයේදී අධිකාරිය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ වාර්තාව ද සලකා බැලීමකදී හැර, අති විශේෂ රැස්වීමකදී සිදු කරනු ලබන සියලු කටයුතු සහ වාර්ෂික මහ සභා රැස්වීමකදී සිදු කරනු ලබන සියලු කටයුතුද විශේෂ කටයුතු ලෙස සැලකිය යුත්තේය.

10 සනපූරණය පෞද්ගලිකව හෝ බලය පැවරීමෙන් පැමිණ සිටින සාමාජිකයන් හත්දෙනෙක් විය යුතු බවට මෙහි අන්‍යාකාරයකින් විධිවිධාන සලසා තිබිය දී හැර, රැස්වීමේ කටයුතු ආරම්භ කරන අවස්ථාවේදී සාමාජික සන පූරණය නොමැති නම් එවැනි කවර හෝ මහ සභා රැස්වීමකදී කටයුතු කිසිවක් නොකළ යුත්තේය.

11 රැස්වීම සඳහා නියමිත වේලාවේ සිට පැය භාගයක් ඇතුළත සනපූරණය නොසිටී නම් සාමාජිකයන්ගේ ඉල්ලීම අනුව රැස්වීම කැඳවනු ලැබුවේ නම්, රැස්වීම විසුරුවා හැරිය යුත්තේය. වෙනත් කවර හෝ අවස්ථාවකදී ඊළඟ සතියේ එම දිනම එම ස්ථානයේ එම වේලාවට හෝ අධ්‍යක්ෂවරුන් විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් දවසක වෙනත් වේලාවක කිසියම් ස්ථානයකදී රැස්වීම පැවැත්වීමට කල්තබනු ලැබිය යුත්තේය. කල් තබන ලද රැස්වීමකදී රැස්වීම සඳහා නියමිත වේලාවේ සිට පැය භාගයක් ඇතුළත සනපූරණය නොසිටී නම් පැමිණ සිටින සාමාජිකයන් සංඛ්‍යාව සනපූරණය විය යුතුය.

12 අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කිසිවෙකු සිටී නම් ඔහු අධිකාරියේ සෑම මහසභා රැස්වීමකදී සභාපති වශයෙන් මුලසුන දැරිය යුතුය. නැතහොත් එවැනි සභාපතිවරයකු නොමැති අවස්ථාවක හෝ රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පසු විනාඩි පහළොවක් ඇතුළත ඔහු පැමිණ නොසිටී නම් හෝ සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට අකමැති නම් අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන්ගෙන් එක් අයෙකු රැස්වීමේ සභාපතිවරයා ලෙස තෝරා පත්කර ගත යුත්තේය.

13 කිසියම් රැස්වීමකදී සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට කිසිදු අධ්‍යක්ෂවරයකු අකමැති වන අවස්ථාවකදී හෝ රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට විනාඩි පහළොවක් ඇතුළත කිසිදු අධ්‍යක්ෂවරයකු පැමිණ නොමැති අවස්ථාවකදී සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් එක් අයෙකු රැස්වීමේ සභාපතිවරයා ලෙස තෝරාගත යුත්තේය.

14 සභාපති විසින්, සතපුරණය සිටින (සතපුරණය සිටින බව රැස්වීම විසින් නියම කරනු ලබන්නේ නම්) කිසියම් රැස්වීමක කැමැත්ත ඇතිව වරින් වර ස්ථානයෙන් ස්ථානයට රැස්වීම කල්තැබීම කරනු ලැබිය හැකිවන අතර, කල්තබන ලද රැස්වීමේදී අවසන් නොකළ කටයුතු හැර වෙනත් කිසිදු කටයුත්තක් එම රැස්වීමේදී නොකළ යුත්තේය. රැස්වීමක් දින තිහකට හෝ ඊට වැඩි කාලයක් සඳහා කල්තබනු ලැබුවහොත් මුල් රැස්වීම පිළිබඳව දැනුම් දෙන ලද ආකාරයට කල්තබන ලද රැස්වීම පිළිබඳවද දැනුම් දිය යුතුය. ඉහත සඳහන් කළ පරිදි හැර රැස්වීම කල් තැබීම ගැන හෝ කල් තබන ලද කිසියම් රැස්වීමක සිදු කරනු ලබන කටයුතු ගැන හෝ දැනුම්දීමක් කිරීම අවශ්‍ය නොවන්නේය.

15 කවර හෝ මහ සභා රැස්වීමකදී යෝජනාවක් පිළිබඳ ඡන්ද විමසන අවස්ථාවකදී අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කිරීම මගින් ඒ පිළිබඳව තීරණය කළ යුතුය. අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කිරීම මත යෝජනාවකට පක්ෂව ඡන්දය ලැබී ඇති බව හෝ ඒකමතිකව ඡන්දයෙන් හෝ කිසියම් වැඩි ඡන්ද සංඛ්‍යාවකින් එය සම්මතවී ඇති බව හෝ ඡන්දයෙන් පරාජයවී ඇති බව හෝ සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත් කිරීමක් පිළිබඳව අධිකාරියේ රැස්වීම් වාර්තා ඇතුළත් පොත්පත්වල සටහන්වී ඇත්නම්, එම යෝජනවට පක්ෂව හෝ විපක්ෂව වාර්තාගතව ඇති ඡන්ද ප්‍රමාණය හෝ සංඛ්‍යාව තහවුරු කිරීමකින් තොරව එය තීරණාත්මක සාක්ෂියක් විය යුතුය.

16 අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කිරීම මගින් ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව එක සමාන වන විට අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කළ රැස්වීමේ සභාපතිවරයාට දෙවැනි ඡන්දයක් හෝ තීරක ඡන්දයක් හිමිවිය යුත්තේය.

17 පතතේ විධිවිධානවලට යටත්ව රැස්වීම කැඳවීමේ නිවේදනය ලැබී මහ සභා රැස්වීම්වලට පැමිණ ඡන්දය ප්‍රකාශ කිරීමට දැනට හිමිකම් ලබා ඇති සාමාජිකයන් (හෝ සංස්ථා වශයෙන් එම සංස්ථාවල නිසි ලෙස බලයලත් නියෝජිතවරුන්) විසින් ලිඛිතව අත්සන් කර ඇති යෝජනාවක් අධිකාරිය විසින් නිසි පරිදි කැඳවා පවත්වන ලද මහ සභා රැස්වීමකදී සම්මත කරන ලද යෝජනාවක් ලෙස වලංගුව ක්‍රියාත්මක විය යුත්තේය.

## සාමාජිකයන්ගේ ඡන්ද

18 සෑම සාමාජිකයකුට එක් ඡන්දයක් තිබිය යුත්තේය.

19 සිහි විකල්ව හෝ මානසික ඌනතාවයක් ඇති සාමාජිකයකු සම්බන්ධයෙන් සිහිවිකල්ව හෝ මානසික ඌනතාවයක් ඇති පුද්ගයන්ට අදාල නඩුවලදී අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින් නියෝගයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවකදී ඔහුගේ කළමනාකරු හෝ භාරකරු හෝ කළමනාකරු හෝ භාරකරු වශයෙන් අධිකරණය විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තකු විසින් ඡන්දය ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

20 අධිකාරියට දැනට ගෙවිය යුතු සියලුම මුදල් ගෙවා ඇත්නම් මිස කිසිදු සාමාජිකයකුට කවර හෝ මහ සභා රැස්වීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලැබිය යුත්තේය.

21 බලකාරයකු පත් කිරීමේ සාධන පත්‍රය ලිඛිතව බලකායේ පත්කරන තැනැත්තාගේ අත්සන හෝ ලිඛිතව නිසි පරිදි බලයදී ඇති ඔහුගේ නීතිඥයාගේ අත්සන සහිතව ඉදිරිපත් කළ යුතුය. එසේ නැතහොත් පත් කරන තැනැත්තා සංස්ථාවක් වන්නේ නම් එම සාධන පත්‍රය මුද්‍රාව හෝ නිලධාරියකුගේ අත්සන නිසි පරිදි බලයදී ඇති නීතිඥයාගේ අත්සන සහිතව ඉදිරිපත් කළ යුත්තේය. බලකාරයකු අධිකාරියේ සාමාජිකයකුවීම අවශ්‍ය නොවේ.

22 බලකාරයකු පත්කරන සාධන පත්‍රය ද ඇටෝර්නි බලපත්‍රය හෝ වෙනත් බලයදීමක් වෙතොත් ඒ යටතේ එය අත්සන් කරනු ලබයි නම් හෝ එම ඇටෝර්නි බලපත්‍රයේ හෝ බලය දීමක නොතාරිස්වරයකු විසින් සහතික කළ පිටපතක් ද තම සඳහන්ව ඇති සාධන පත්‍රය මගින් යෝජනා කරන තැනැත්තා ඡන්දය ප්‍රකාශ කරන රැස්වීම හෝ කල් තබන ලද රැස්වීම පැවැත්වීමට නියමිත කාලයට පැය හතලිස් අටකට පෙර ඒ සඳහා නිශ්චිතව සඳහන් කර ඇති පරිදි අධිකාරියේ ලියාපදිංචි කාර්යාලයේ හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටි වෙනත් යම් ස්ථානයක තැන්පත් කළ යුතුය.

23 බලකාරයකු පත්කරන සාධන පත්‍රයක් පහත දැක්වෙන ආකෘති පත්‍රය මගින් හෝ කරුණුමය වශයෙන් පිළිගන්නා, එයට සමීපව ඇති ආකෘති පත්‍රයක් මගින් ඉදිපත් කළ යුතුය.

.............. අධිකාරිය

ඉහත නම සඳහන් අධිකාරියේ සාමාජිකයකු/සාමාජිකයන් වී සිටින .................. ...................................................... යන ලිපිනයේ පදිංචි ........................................................ වන මා/අප විසින් .......................... දින පවත්වනු ලබන අධිකාරියේ මහ සභා රැස්වීමේදී (අවස්ථාවෝචිතව වාර්ෂික හෝ අති විශේෂ රැස්වීම) සහ ඒ වෙනුවෙන් කල්තබන ලද කිසියම් රැස්වීමකදී මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට මගේ/අපගේ බලකරු ලෙස ........................................................................................ යන ලිපිනයේ පදිංචි ........................................................................ හෝ ඔහු පැමිණීමට අපොහොසත්වූ විටක ........................................................................................ යන ලිපිනයේ පදිංචි ........................................................... මෙයින් පත්කරනු ලැබේ.

200 .................. මස ...... දින වන මෙදින අත්සන් කරන ලදී.

24 යෝජනාවකට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම සහ/හෝ රැස්වීම ඇමතීමට අවස්ථාවක් සාමාජිකයන්ට ලබාදීමට අපේක්ෂා කරන

අවස්ථාවකදී බලකාරයකු පත් කරන සාධන පත්‍රය පහත සඳහන් ආකෘති පත්‍රය මගින් හෝ කරුණුමය වශයෙන් පිළිගන්නා, එයට සමීපව ඇති ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කළ යුතුය.

"........................ අධිකාරිය

ඉහත නම සඳහන් අධිකාරියේ සාමාජිකයකු/සාමාජිකයන් වී සිටින .................. ........................................................ යන ලිපිනයේ පදිංචි ........................................................................................ වන මා/අප විසින් 200 .......................... දින පවත්වනු ලබන අධිකාරියේ මහ සභා රැස්වීමේදී (අවස්ථාවෝචිතව වාර්ෂික හෝ අති විශේෂ රැස්වීමේදී) සහ ඒ වෙනුවෙන් කල්තබන ලද කිසියම් රැස්වීමකදී මා/අප වෙනුවෙන් යෝජනාවකට පක්‍ෂව හෝ විපක්‍ෂව ඡන්දය ප්‍රකාශ කිරීමට සහ/හෝ රැස්වීම ඇමතීමට මගේ/අපගේ බලකරු ලෙස ........................................................................................................................ යන ලිපිනයේ පදිංචි ..................................................................................... හෝ ඔහු පැමිණීමට අපොහොසත් වුවහොත් ...................................................................................................................................... යන ලිපිනයේ පදිංචි ....................................................................... මෙයින් පත්කරනු ලැබේ.

200 .................... මස ...... දින වන මෙදින අත්සන් කරන ලදී.

25 බලකාරයකු සම්බන්ධයෙන් ඇති සාධන පත්‍රයක සඳහන් නියමයන් අනුව ප්‍රකාශ කරන ලද ඡන්දයක්, එම බලකරු සහභාගීවන රැස්වීම හෝ කල්තබන ලද රැස්වීම පැවැත්වීම ආරම්භ කිරීමට පෙර ප්‍රධාන සාමාජිකයා කලින් මියගිය බවට හෝ සිහිවිකල්ව සිටින බවට හෝ පෙර කලාසිය අවලංගු කල බවට හෝ කලාසිය අත්සන් කරනු ලැබූ බලයදීමක් අවලංගු කල බවට හෝ ලිඛිතව දැනුම්දීමක් අධිකාරියේ කාර්යාලය වෙත තොලැබී තිබියදී එම ප්‍රධාන සාමාජිකයා කලින් මියගොස් හෝ සිහිවිකල්ව සිටියදී හෝ ඉහත සඳහන් කල පරිදි පෙර කලාසිය හෝ බලය දීමක් අවලංගු කර තිබියදී වුවද වලංගු විය යුත්තේය.

**26 රැස්වීමකදී නියෝජිතයන් මගින් කටයුතු කරන සංස්ථා.**

අධිකාරියේ සාමාජිකයකු වන කිසියම් සංස්ථාවක් හෝ වෙනත් ආයතනයක් විසින් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් පාලක මණ්ඩලයක හෝ යෝජනාවක් මගින් සුදුසු යයි අදහස් කරන තැනැත්තෙකුට අධිකාරියේ කවර හෝ රැස්වීමකදී නියෝජිතයකු ලෙස කටයුතු කිරීමට බලය පවරනු ලැබිය හැකිවන අතර එකී සංස්ථාව අධිකාරියේ පෞද්ගලික සාමාජිකයෙකුව සිටී නම් එම සංස්ථාවට බලතල පාවිච්චි කළ හැකි ලෙසට තමන් නියෝජනය කරන සංස්ථාව වෙනුවෙන් එම බලතල පාවිච්චි කිරීමට එසේ බලයදී ඇති තැනැත්තා හිමිකම් ලැබිය යුත්තේය.

අධ්‍යක්ෂවරුන්

27 (අ) උපරිම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව දහයකි (10) සාංගමික සංස්ථා පත්‍රයට අත්සන් තබන තැනැත්තන් විසින් 24(ආ) වගන්තියට අගතියක් ඇති නොවන පරිදි පළමු අධ්‍යක්ෂවරුන්ගේ නම් නිශ්චය කරනු ලැබිය යුත්තේය.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය.

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් ආකාරයෙන් සමන්විත විය යුත්තේය.

i (අ) ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති හෝ එහි අනුප්‍රාප්තකයා

සහ

(ආ) සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සංචාරක විෂය භාර ලේකම්වරයා.

**(ඇ) ශ්‍රී ලංකා රජයේ මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාරයේ නියෝජිතයා.**

ii ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයේ සභාපති

iii චාරිකා නියෝජිතවරුන්ගේ සංගමයේ සභාපති

iv ශ්‍රී ලංකා ආගාමික චාරිකා මෙහෙයුම්කරුවන්ගේ සංගමයේ සභාපති

v සංචාරක කර්මාන්තය පිළිබඳ පලපුරුද්ද සහ දැනුම ඇති සංචාරක කර්මාන්තය සඳහා දායකවී ඇති පෞද්ගලික අංශයේ පුද්ගලයන් තිදෙනෙකු.

vi ජාතික ගුවන් සමාගම - සීමාසහිත ශ්‍රී ලංකා ගුවන් සමාගමේ නියෝජිතයකු

27 (ඇ) අධ්‍යක්ෂ ධුරය.

i 27(ආ) වගන්තියේ (i)(අ). (ආ.). (ii), (iii), (iv) යන උප වගන්තිවලට අනුව අධ්‍යක්ෂවරුන් වශයෙන් පත් කරනු ලබන අදාළ තැනැත්තන් නිල බලයෙන්ම අධ්‍යක්ෂවරුන් විය යුත්තේය.

ii 27(ආ) වගන්තියේ (i)(ඇ) සහ (iv) යන උප වගන්තිවලට අනුව ශ්‍රී ලංකා රජයේ මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාරය සහ සීමාසහිත ශ්‍රී ලංකා ගුවන් සමාගම විසින් පිළිවෙළින් නියෝජිතයන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලබන්නේය. පත් කිරීමේ කිසියම් බලධාරියකු විසින් එසේ නම් කරනු ලබන අධ්‍යක්ෂවරයකු අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය වෙත ලිඛිතව කරනු ලබන දැනුම්දීමකින් මණ්ඩලයෙන් ඉවත් කර, ඔහු වෙනුවට වෙනත් තැනැත්තෙකු පත්කරනු ලැබිය හැකිය.

iii 27(ආ) වගන්තියේ (i)(අ). (ආ.). (ඇ) (ii), (iii), (iv) සහ (vi) උප වගන්තිවලට අනුවපත් කරනු ලබන අධ්‍යක්ෂවරුන් විසින් 27(ආ)(v) වගන්තියේ සඳහන් සංචාරක කර්මාන්තය පිළිබඳ

පලපුරුද්ද සහ දැනුම ඇති සංචාරක කර්මාන්තය සඳහා දායකවී ඇති පෞද්ගලික අංශයේ සිටින පුද්ගලයන් තුන්දෙනෙකු පත්කරනු ලබන්නේය. එසේ පත් කරනු ලබන අධ්‍යක්ෂවරුන් වසර දෙකක කාලයක් ධූරය දැරිය යුතු අතර, එම ධූර කාලය අවසානයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යළි පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන අතර ඒ සඳහා ඉදිරිපත් විය හැකිය.

27 (ඇ) විකල්ප අධ්‍යක්ෂවරුන්

i අධ්‍යක්ෂවරයකු විසින් තමන්ට කිසියම් මණ්ඩල රැස්වීමකදට පෞද්ගලිකව පැමිණ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වන අවස්ථාවකදී තමා නියෝජනය කර, තමා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයකු අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ඇතිව පත් කරනු ලැබිය හැකිය.

ii විකල්ප අධ්‍යක්ෂවරයකු විසින් තමන්ට නිවේදන භාරදීම සඳහා ලිපිනයක් සපයාදීමෙන් පසු මණ්ඩලයේ සියලුම රැස්වීම් පිළිබඳ නිවේදන ලැබීමටත්, අධ්‍යක්ෂවරයකු පෞද්ගලිකව නොපැමිණ සිටින එවැනි රැස්වීමකට තමා විකල්ප අධ්‍යක්ෂවරයකු ලෙස සහභාගීවී අධ්‍යක්ෂවරයකු වශයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමටත් පත් කරන තැනැත්තා නොමැතිවිට අධ්‍යක්ෂවරයකු වශයෙන් ඔහුගේ සියලු කාර්යයන් ඉටු කිරීමටත් හිමිකම් ලැබිය යුත්තේය.

iii නිශ්චිත කාලසීමාවක් සඳහා හෝ නිශ්චිත සිදුවීමක් සිදුවන තුරු හෝ විකල්ප අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය හැකිය. එහෙත්, පහත සඳහන් කවර හෝ අවස්ථාවක එම හේතුව නිසාම ඔහු විකල්ප අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කිරීම අහෝසි වන්නේය.

(අ) තමා පත්කළ තැනැත්තා නැවත ශ්‍රී ලංකාවට පැමිණීම.

(ආ) පත් කරන්නා යම් හේතුවක් නිසා අධ්‍යක්ෂවරයකුව සිටීම අහෝසිවන විට.

(ඇ) විකල්ප අධ්‍යක්ෂවරයාට එරෙහි භාරගැනීමේ නිවේදනයක් නිකුත් කර තිබෙන විට හෝ තමා ණය හිමියන් සමඟ සමතයකට පත්ව සිටීනම් හෝ බංකොලොත් භාවයට පැමිණ ඇති ලෙස තීරණය කර තිබෙන විට.

(ඈ) විකල්ප අධ්‍යක්ෂවරයා උම්මතකයකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම් හෝ සිහිවිකල් බවට පත්ව සිටින විට.

(ඉ) විකල්ප අධ්‍යක්ෂවරයා පත් කරන්නා විසින් අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය වෙත ලිඛිතව දැනුම්දීමකින් ඔහුගේ පත්වීම අවලංගු කර තිබෙන විට.

28 අධ්‍යක්ෂවරු කිසිදු පාරිශ්‍රමිකයක් ලබාගැනීමට හිමිකම් නොලබති. කෙසේ වුවද නිසි ලෙස දරන ලද අතට පාඩු වියදම් ප්‍රතිපූරණය කරනු ලැබීමට හිමිකම් ලබන අතර අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වලට හෝ කමිටු රැස්වීම්වලට හෝ අධිකාරියේ මහා සභා රැස්වීම්වලට හෝ සහභාගීවී ආපසු පැමිණෙන විට හෝ අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් නිසි ලෙස දරනු ලබන ගමන් වියදම් හෝටල් සහ අනෙකුත් වියදම් අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලැබිය හැකිය.

ණයට ගැනීමේ බලතල.

**29 අධ්‍යක්ෂවරුන් විසින් මුදල් ණයට ගැනීමට, දේපළ හෝ එහි කොටසක් උගස්කිරීමට හෝ අධිකාරියේ වගකීම් පැවරීමට හෝ ණයකර, සෘණ ස්කන්ධ සහ අනෙකුත් සුරැකුම්පත් සම්පූර්ණයෙන් හෝ අධිකාරියේ හෝ**

යම් තෙවන පාර්ශ්වයක යම් ණයක්, බැරකමක් හෝ බැඳීමක් වෙනුවෙන් අපයක් ලෙස තිකුත් කිරීමට අධිකාරියේ සියලු බලතල පාවිච්චි කරනු ලැබිය හැකිය.

අධ්‍යක්ෂවරුන්ගේ බලතල හා කාර්යයන්.

30 අධ්‍යක්ෂවරුන් විසින් අධිකාරියේ කටයුතු කළමනාකරණය කරනු ලැබිය යුතු අතර,අධිකාරිය ප්‍රවර්ධනය කිරීම සහ ලියාපදිංචි කිරීම සඳහා දරන ලද සියලුම වියදම් එම අධ්‍යක්ෂවරුන් විසින් ගෙවනු ලැබිය හැකිය. අධ්‍යක්ෂවරුන් විසින්, මෙම පනතේ විධිවිධාන හෝ මෙම ව්‍යවස්ථාවලියට සහ මහ සභා රැස්වීමකදී නියම කරනු ලැබිය හැකි ඉහත සඳහන් විධිවිධානවලට අනනුකූල නොවන යම් රීතියකට යටත්ව මහ සභා රැස්වීමකදී පනතින් හෝ මෙම ව්‍යවස්ථාවලින් අධිකාරිය විසින් ක්‍රියාත්මක නොකළ යුතු ආකාරයෙන් අධිකාරියේ සියලු බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය. එසේ වුවත් නියෝගය සාදනු ලැබීමට පෙර වලංගු විය යුතුව තිබූ අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් පූර්ව ක්‍රියාවක් මහ සභා රැස්වීමකදී අධිකාරිය විසින් සාදනු ලබන නියෝගයකින් නිර්බල නොවිය යුත්තේය.

31 අධ්‍යක්ෂවරුන් විසින් ඇටෝර්නි බලපත්‍රයක් මගින් කලින් කල මිනැම අවස්ථාවක කිසියම් කාර්යයන් සඳහා (මෙම ව්‍යවස්ථාවලිය යටතේ අධ්‍යක්ෂවරුන් විසින් ක්‍රියාත්මක කළ යුතු හෝ ඔවුන් වෙත පැවරී ඇති බලතල නොඉක්මවන) යම් බලතල අධිකාරී බලයන් සහ විධාන සහිතව කිසියම් කාලපරිච්ජේදයක් සඳහා සුදුසුයයි අදහස් කරන යම් කොන්දේසිවලට යටත්ව, සෘජුව හො 'වක්‍රව, නම් කරනු ලබන යම් අධිකාරියක්, ව්‍යාපාර ආයතනයක් හෝ පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් අධිකාරියේ ඇටෝර්නි බලකරු හෝ ඇටෝර්නි බලකරුවන් ලෙස පත් කරනු ලැබිය හැකිය. අධ්‍යක්ෂවරුන් විසින් සුදුසුයයි අදහස් කරන පරිදි යම් ඇටෝර්නි බලකරුවකු සමඟ කටයුතු කරන පුද්ගලයන්ගේ ආරක්ෂාව සහ පහසුව සඳහා කිසියම් ඇටෝර්නි බලපත්‍රයක යම් විධිවිධාන ඇතුළත්ව තිබිය හැකිවන අතර, තමන් වෙත පැවරී ඇති බලතල, අධිකාරී බලයන් සහ විධාන කිසිවක් හෝ සියල්ලම පැවරීමට යම් ඇටෝර්නි බලකරුවකු වෙත බලය දෙනු ලැබිය හැකිය.

32 අධ්‍යක්ෂවරුන් විසින් කලින් කල යෝජනාවක් මගින් තීරණය කරනු ලැබිය හැකි පරිදි කිසියම් ආකාරයකින් සියලුම චෙක්පත්, පොරොන්දු පත්‍ර, අනකර, විනිමය බිල්පත් සහ ගනුදෙනු කල හැකි අනෙකුත් නිත්‍යානුකූල ලේඛන සහ අධිකාරිය වෙත ගෙවනු ලබන මුදල් සඳහා වන සියලුම ලදුපත් අත්සන් කරනු ලැබීම පිටසන් කරනු ලැබීම හෝ අන්‍යාකාරයකින් ලියා අත්සන් කරනු ලැබීම කල යුතුය.

33 අධ්‍යක්ෂවරුන් විසින්, සටහන් තැබීම සඳහා සපයා ඇති සියලුම පොත්පත්වල පහත සඳහන් සටහන් තැබීමට සැලැස්විය යුතුය.

(අ) අධ්‍යක්ෂවරුන් විසින් පත් කරනු ලබන සියලුම නිලධාරීන්ගේ පත්වීම්.

(ආ) අධ්‍යක්ෂවරුන්ගේ එක් එක් රැස්වීමක් සහ ඔවුන්ගේ යම් කමිටු රැස්වීමක් සඳහා පැමිණ සිටින අධ්‍යක්ෂවරුන්ගේ නම්.

(ඇ) අධිකාරියේ හා අධ්‍යක්ෂවරුන්ගේ සියලුම රැස්වීම්වල සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටු රැස්වීම්වල සියලු යෝජනා සහ කටයුතු.

අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් රැස්වීමක් හෝ අධ්‍යක්ෂවරුන්ගේ කමිටු රැස්වීමක් සඳහා පැමිණ සිටින සෑම අධ්‍යක්ෂවරයකු විසින් නම අත්සන් කිරීම සඳහා තබා ඇති පොතක තමාගේ නම අත්සන් කල යුතුය.

34 මණ්ඩලය අවසානයේදී සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාට වගකිව යුතු වන්නේය. ඒ අනුව මණ්ඩලය විසින්,

(අ) එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස 6 ඇතුළත අධිකාරියේ අරමුදල් ඇතුළුව එහි කටයුතු පිළිබඳ විගණනය කල මූල්‍ය ප්‍රකාශයන් සමඟ අධිකාරිය විසින් ඉටු කරනු ලැබූ කටයුතු පිළිබඳ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කල යුතු අතර අමාත්‍යවරයා විසින් එම වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතුය.

(ආ) එක් එක් මුදල් වර්ෂය ආරම්භවීමට පෙර අයවැය ඇස්තමේන්තු සමඟ කටයුතු පිළිබඳ වැඩසටහනක් අමාත්‍යවරයා විසින් සලකා බැලීම සහ අදහස් දැක්වීම සඳහා ඉදිරිපත් කල යුතුය.

අධ්‍යක්ෂවරුන්ගේ නුසුදුසුකම්.

35 අධ්‍යක්ෂවරයකු විසින්,

(අ) මහ සභා රැස්වීමක අධිකාරියේ කැමැත්ත නොමැතිව අධිකාරිය යටතේ වෙනත් කිසියම් ලාභ ලැබෙන ධූරයක් දරන විට හෝ,

(ආ) වස්තු භංගත්වයට හෝ බංකොලොත් භාවයට පත්වූ විට හෝ තම ණය හිමියන් සමඟ යම් වැඩපිළිවෙලක් හෝ ණය සමථයක් ඇතිකර ගනු ලබන විට හෝ,

(ඇ) පනතේ 186(1) වගන්තියේ විධිවිධාන යටතේ කරනු ලැබූ යම් නියෝගයක් හේතුවෙන් අධ්‍යක්ෂවරයකුවීම තහනම් වන විට හෝ,

(ඈ) සිහිවිකල වූ විට හෝ,

(ඉ) අධිකාරිය වෙත ලිඛිතව දැනුම්දීමකින් සිය ධූරයෙන් ඉල්ලා අස්වූ විට හෝ,

(ඊ) පනතේ 181 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරයකුවීම අහෝසිවන විට හෝ,

(උ) අධිකාරිය සමඟ කිසියම් කොන්ත්‍රාත්තුවකට සෘජුවම හෝ වක්‍රව සම්බන්ධවී පනතේ 203 වන වගන්තියේ විධිවිධාන වලින් නියමකර ඇති ආකාරයට තමාගේ සම්බන්ධතාවයේ ස්වභාවය ප්‍රකාශ කිරීමට අපොහොසත්වූ විට හෝ අධ්‍යක්ෂවරුන්ගේ ධූරය හිස්විය යුත්තේය.

අධ්‍යක්ෂවරයකු විසින් තමන් සම්බන්ධවී සිටින කිසියම් කොන්ත්‍රාත්තුවක් හෝ එයින් උද්ගතවන යම් කරුණක් සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ නොකළ යුතු අතර ඔහු විසින් ඡන්දය ප්‍රකාශ කරනු ලැබුවහොත් එම ඡන්දය ගණන් ගනු නොලැබිය යුතුය.

## අධ්‍යක්ෂවරුන්ගේ කටයුතු.

36 අධ්‍යක්ෂවරුන් විසින් සුදුසුයයි අදහස් කරන පරිදි රැස්වීම් කටයුතු ඉටු කිරීම, රැස්වීම් කල්තැබීම සහ අන්‍යාකාරයෙන් රැස්වීම් විධිමත් කිරීම සඳහා එකට හමුවිය හැකිය. කිසියම් රැස්වීමක දී උද්ගතවන ප්‍රශ්න වැඩි ඡන්දයෙන් තීරණය කළ යුතුය. එක සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබී තිබෙන අවස්ථාවක සභාපතිවරයාට තීරක ඡන්දයක් තිබිය යුත්තේය. අධ්‍යක්ෂවරයකු විසින් සහ අධ්‍යක්ෂවරයකුගේ ඉල්ලීම පරිදි ලේකම්වරයකු විසින් ඕනෑම අවස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවනු ලැබිය හැකිය. දැනට ශ්‍රී ලංකාවේ නොමැති කිසිදු අධ්‍යක්ෂවරයකු වෙත අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමක් සම්බන්ධයෙන් දැනුම්දීමක් සිදු කිරීම අවශ්‍ය නොවන්නේය.

37 අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමක කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය සනපූරණය හතරකි.

38 යෙදී සිටින අධ්‍යක්ෂවරුන් විසින් තම මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබියදී වුවද කටයුතු කරනු ලැබිය හැකි නමුදු අධ්‍යක්ෂවරුන්ගේ අවශ්‍ය සනපූරණය ලෙස අධිකාරියේ ව්‍යවස්ථාවලියෙන් හෝ ව්‍යවස්ථාවලිය අනුව නියම කර ඇති සංඛ්‍යාවට වඩා අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව අඩුවී ඇත්නම් සහ අඩුවී සිටින තාක්කල් 27(ආ) වගන්තියට යටත්ව යෙදී සිටින අධ්‍යක්ෂවරුන් හෝ අධ්‍යක්ෂවරයා විසින් එකී සංඛ්‍යාවට තම සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා හෝ අධිකාරියේ මහ සභා රැස්වීමක් කැඳවීම සඳහා කටයුතු කරනු ලැබිය හැකිය. එහෙත් වෙනත් කටයුත්තක් සඳහා එසේ මහසභා රැස්වීමක් කැඳවිය නොහැකිය.

**39 සභාපතිවරයා තෝරා පත්කර ගැනීම.**

අධ්‍යක්ෂවරුන් විසින් තමන් අතුරෙන් නව රැස්වීම්වල සභාපතිවරයකු තෝරාපත්කර ගනු ලැබිය හැකිය.

සභාපතිවරයා මෙම ව්‍යවස්ථාවලිය අනුව අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරගෙන යාමට තවදුරටත් සුදුසුකම් නොලබන අවස්ථාවක සභාපති ධූරය කලින් අවසන් කිරීමට හැම විටම යටත්ව වසර 3 ක කාලපරිච්ඡේදයක් සඳහා ධූරය දැරිය යුතුය. කිසියම් සභාපතිවරයකු තෝරාපත්කර ගනු නොලැබුවහොත් හෝ යම් රැස්වීමකදී රැස්වීම සඳහා නියමිත කාලයෙන් පසු විනාඩි පහක් තුළ සභාපතිවරයා නොපැමිණ ඇත්නම් අධ්‍යක්ෂවරුන් විසින් තමන්ගේ සංඛ්‍යාවෙන් එක් අයෙකු රැස්වීමේ සභාපතිවරයා ලෙස තෝරාගනු ලැබිය හැකිය.

40 අධ්‍යක්ෂවරුන්ගේ කමිටු.

අධ්‍යක්ෂවරුන් විසින් තමන් සතු බලතල කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවලට තමන් සුදුසු ලෙස අදහස් කරන පරිදි පවරනු ලැබිය හැකිය. එසේ පිහිටුවනු ලැබූ යම් කමිටුවක් විසින් එයට පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් එයට පැනවිය හැකි කවර හෝ නියෝගවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතුය.

41 සභාපතිවරයෙකු තෝරා පත්කරගෙන නොමැති අවස්ථාවක කමිටුව විසින් සභාපතිවරයකු තෝරා පත්කරගනු ලැබිය හැකිය. එසේ නැතහොත් රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පසු විනාඩි පහක් ඇතුළත සභාපතිවරයා කිසියම් රැස්වීමක් සඳහා නොපැමිණ සිටින අවස්ථාවකදී පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් එක් අයෙකු රැස්වීමේ සභාපතිවරයා ලෙස තෝරා පත්කරගනු ලැබිය හැකිය.

42 කමිටුවක් විසින් සුදුසුයයි අදහස් කරන පරිදි රැස්වීමටත්, එය කල් තැබීමටත් කටයුතු කරනු ලැබිය හැකිය. යම් රැස්වීමකදී උද්ගතවන ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු අතර සමාන ඡන්ද සංඛ්‍යාව ලැබී ඇති අවස්ථාවකදී සභාපතිවරයාට දෙවැනි ඡන්දයක් හෝ තීරක ඡන්දයක් තිබිය යුත්තේය.

43 අධ්‍යක්ෂවරුන්ගේ යම් රැස්වීමකදී හෝ යම් කමිටු රැස්වීමකදී හෝ අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරන තැනැත්තකු විසින් කරනු ලබන සියලුම ක්‍රියා, යම් අධ්‍යක්ෂවරයකුගේ හෝ අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරන තැනැත්තකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබූ බව පසුව සොයාගනු ලැබීමේ හේතුව මත එම තැනැත්තන් හෝ යම් තැනැත්තකු නුසුදුසු බවට පත් වුවද එවැනි සෑම තැනැත්තකු නිසි ලෙස පත්කරන ලද සුදුසුකම් ඇති අධ්‍යක්ෂවරයකු විසින් සිදු කරනු ලැබූ ක්‍රියා ලෙස බලපැවැත්විය යුතුය.

## ලිඛිතව ඉදිරිපත් කරන යෝජනා.

44 ලිඛිතව ඉදිරිපත් කරන යෝජනාවක් දැනට සිටින සියලුම අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් කිරීමෙන් පසු එය වලංගුවිය යුතු අතර නිසි පරිදි කැඳවා පවත්වන ලද අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමකදී එම යෝජනාව සම්මතකර ඇති ලෙස ක්‍රියාත්මක විය යුතුය.

45 සියලුම අධ්‍යක්ෂවරුන් දුරකථන මාර්ගයෙන් හෝ අනෙකුත් දෘශ්‍ය හෝ වාචික සන්නිවේදන මාර්ගයෙන් සම්බන්ධකර ගැනීමෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සමකාලීනව පවත්වනු ලැබිය හැකිය.

## ලේකම්වරයා

46 අධ්‍යක්ෂවරුන් විසින් සුදුසුයයි අදහස් කරනු ලැබිය හැකි පරිදි කිසියම් කාලසීමාවක් සඳහා යම් පාරිශ්‍රමිකයක් සහ කොන්දේසි මත ලේකම්වරයකු පත්කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලැබූ කවරහෝ ලේකම්වරයකු අධ්‍යක්ෂවරුන් විසින් ඉවත් කරනු ලැබිය හැකිය.

47 පනතේ විධිවිධානයකින් හෝ මෙම ව්‍යවස්ථාවලින් අධ්‍යක්ෂවරයකු විසින් ඉටු කළයුතු ලෙස හෝ අධ්‍යක්ෂවරයකුට නියම කරනු ලබන හෝ බලය දෙනු ලබන දෙයක් අධ්‍යක්ෂවරයා සහ ලේකම්වරයා වශයෙන් හෝ ලේකම්වරයා වෙනුවට ක්‍රියා කරන තැනැත්තකු විසින් ඉටු කරනු ලැබීමෙන් හෝ එම තැනැත්තාට එය ඉටු කරන ලෙස නියම කරනු ලැබීමෙන් හෝ බලය දීමෙන් ලේකම්වරයා සෑහීමකට පත් නොවිය යුත්තේය.

## මුද්‍රාව

48 අධ්‍යක්ෂවරුන් විසන් මුද්‍රාව ආරක්ෂාකර භාරයේ තැබීම සඳහා කටයුතු සැලැස්විය යුතු අතර අධිකාරියේ අධ්‍යක්ෂවරුන් හෝ අධ්‍යක්ෂවරුන් විසින් ඒ සඳහා බලය පවරනු ලැබන අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවක අධ්‍යක්ෂවරයකු විසින් පමණක් එය පාවිච්චි කළයුතු අතර මුද්‍රාව තැබිය යුතු සෑම සාධන පත්‍රයක් අධ්‍යක්ෂවරයකු විසින් අත්සන් කිරීමෙන් අනතුරුව ලේකම්වරයා හෝ දෙවැනි අධ්‍යක්ෂවරයකු විසින් හෝ ඒ සඳහා අධ්‍යක්ෂවරුන් විසින් පත් කරනු ලබන වෙනත් යම් තැනැත්තකු විසින් අනු අත්සන් කළ යුතුය.

## ගිණුම්.

49 අධිකාරියේ අරමුදල් සහ පහත සඳහන් කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් විසින් නිසි ලෙස ගිණුම් පොත් තැබීමට කටයුතු සැලැස්විය යුතුය.

(අ) අධිකාරිය වෙත ලැබෙන සහ අධිකාරිය විසින් වියදම් කරනු ලබන සියලුම මුදල් ප්‍රමාණයන් සහ ලැබීම හා වියදම් කිරීම සම්බන්ධයෙන් කටයුතු.

(ආ) අධිකාරිය විසින් සියලු භාණ්ඩ විකිණීම සහ මිලදී ගැනීම සහ

(ඇ) අධිකාරියේ වත්කම් හා බැරකම්.

අධිකාරියේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ මතයක් ඇති කිරීමට සහ එහි ගනුදෙනු පිළිබඳ කරුණු පැහැදිලි කිරීමට අවශ්‍ය වන පරිදි ගිණුම්

පොතක් පවත්වා ගනු නොලැබුවහොත් එම ගිණුම් පොත් නිසි පරිදි පවත්වා ගෙන යනු ලැබුවාසේ සලකනු නොලැබිය යුතුය.

50 ගිණුම් පොත් අධිකාරියේ ලියාපදිංචි කාර්යාලයේ පොත් පනතේ 143 වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව අධ්‍යක්ෂවරුන් විසින් සුදුසුයයි අදහස් කරන පරිදි පොත් යම් ස්ථානයක හෝ ස්ථානවල තැබිය යුතු අතර ඒවා අධ්‍යක්ෂවරුන්ගේ පරීක්ෂාවට හැමවිටම ලක්විය යුතුය.

51 අධ්‍යක්ෂවරුන් නොවන සාමාජිකයන් විසින් ගිණුම් සහ පොත්පත් හො 'ලිපිලේඛනහො 'එවැනි කිසිවක් පරීක්ෂාකර බැලිය යුතුද යන්න පිළිබඳවද කවර ප්‍රමාණයකින් කවර වේලාවන්හිදී කවර ස්ථානවලදී කුමන කොන්දේසි හෝ රීති යටතේ ඒවා පරීක්ෂාකර බැලිය යුතුය යන්න පිළිබඳවද අධ්‍යක්ෂවරුන් විසින් කලින් කල තීරණය කරනු ලැබිය යුතු අතර ව්‍යවස්ථාවකින් බලය පැවරී ඇති විට හෝ අධ්‍යක්ෂවරුන් හෝ අධිකාරිය විසින් මහ සභා රැස්වීමකදී බලය පවරනු ලබන විට හෝ හැර කිසිදු සාමාජිකයකුට (අධ්‍යක්ෂවරයකු නොවන) අධිකාරියේ කිසියම් ගිණුමක් හෝ පොතපතක් හෝ ලිපිලේඛනයක් පරීක්ෂාකර බැලීමේ කවර හෝ අයිතියක් නොතිබිය යුතුය.

52 අධ්‍යක්ෂවරුන් විසින් පනතේ 144. 146 සහ 152 වන වගන්තිවල විධිවිධාන අනුව කලින් කල ලාභාලාභ ගිණුම්. ශේෂ පත්‍ර. සමූහ ගිණුම් (කිසිවක් ඇත්නම්) සහ මෙම වගන්තිවල සඳහන් කර ඇති පරිදි වර්තා සකස් කර අධිකාරියේ මහ සභා රැස්වීම හමුවේ තැබීමට කටයුතු සැලැස්විය යුතුය.

53 අධිකාරියේ මහ සභා රැස්වීම හමුවේ ඉදිරිපත් කළ යුතු සෑම ශේෂ පත්‍රයක පිටපත් විගණක වාර්තාවේ පිටපතක් ද සහිතව රැස්වීම පැවැත්වෙන දිනට දින විසි එකකට නොඅඩු කාලසීමාවකට පෙර අධිකාරියේ සෑම සාමාජිකයකු සහ සෑම ණයවර හිමියකු වෙත යැවිය යුතුය.

54 පනතේ 156 සිට 159 දක්වා වගන්තිවල දැක්වෙන විධිවිධාන අනුව විගණකවරුන් පත් කරනු ලැබිය යුතු අතර ඔවුන්ගේ කාර්යයන් විධිමත් කරනු ලැබිය යුතුය.

## නිවේදන

55 අධිකාරිය විසින් යම් සාමාජිකයකුට පෞද්ගලිකව හෝ ඔහුගේ ලියාපදිංචි ලිපිනයට (ශ්‍රී ලංකාව තුල ඔහුට ලියාපදිංචි ලිපිනයක් නොමැති නම්) එම සාමාජිකයා විසින් තමාට දැනුම් දීමක් කිරීම සඳහා අධිකාරිය වෙත සපයා ඇති ශ්‍රී ලංකාව තුළ කිසියම් ලිපිනයක් ඇත්නම්, එම ලිපිනයට නිවේදනයක් තැපැලෙන් යැවීමෙන් භාරදෙනු ලැබිය හැකිය. නිවේදනයක් තැපැලෙන් යවනු ලබන විට නිවේදනය සහිත ලිපියක් නිසි ලෙස ලිපිනය සඳහන් කර සකස් කර තැපැල් කිරීමෙන් එය භාරදෙනු ලැබුවාසේ සලකනු ලබන අතර රැස්වීමක් පිළිබඳ දැනුම්දීමකදී නිවේදනය ඇතුලත් ලිපිය තැපැල් කිරීමෙන් පසු පැය විසිහතරක් ගතවූ විට එම නිවේදනය භාරදෙනු ලැබුවා සේ සැලකිය යුතු අතර වෙනත් කවර හෝ අවස්ථාවක එය සාමාන්‍ය තැපැලෙන් යවනු ලබන විට එය භාරදෙනු ලැබුවා සේ සලකනු ලැබිය යුතුය.

56 මෙහි මීට ඉහතදී සඳහන් කළ කවර හෝ ආකාරයකින් සෑම මහ සභා රැස්වීමක් පිළිබඳව.

(අ) තමන් වෙත දැනුම්දීමක් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ලිපිනයක් අධිකාරිය වෙත සපයා නොමැති (ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි ලිපිනයක් නොමැති) සාමාජිකයන් හැර සෑම සාමාජිකයකුට.

(ආ) වස්තුභංගත්වයක් සම්බන්ධයෙන් නිත්‍යානුකූල පෞද්ගලික නියෝජිතයකු හෝ භාරකාරයකු වශයෙන් සිටින සෑම තැනැත්තකුට හෝ සාමාජිකයකු මියයාම හෝ වස්තුභංගත්වයට පැමිණ ඇති අවස්ථාවකදී හැර රැස්වීම කැඳවීමේ නිවේදනයක් ලැබීමට හිමිකම් ඇති සාමාජිකයකුට

(ඇ) දැනට අධිකාරියේ සිටින විගණකවරයාට.

(ඇ) රෙජිස්ට්‍රාර්වරයාට. දැනුම්දිය යුතුය. මහ සභා රැස්වීම් පිළිබඳ නිවේදන ලැබීමට වෙනත් කිසිදු තැනැත්තකුට හිමිකම් නොලැබිය යුතුය.

57 අධිකාරියේ අරමුදල

(අ) අධිකාරිය සතුව අරමුදලක් තිබිය යුත්තේය.

(ආ) අරමුදලට.

i සාමාජිකයන්ගෙන් ලැබෙන සියලුම දායක මුදල් සහ සාමාජික ගාස්තුද.

ii ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් කිසියම් ස්ථානයක සිටින පරිත්‍යාග ශීලීන්ගෙන් හෝ අධිකාරියේ කටයුතු ඉටු කිරීමේදී හෝ මෙම ව්‍යවස්ථාවලිය යටතේ හෝ දැනට අදාළ වන කවර හෝ නීතියක් යටතේ බලතල කාර්යයන් සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී කවර හෝ ආකාරයකින් ආධාර. ත්‍යාග. පරිත්‍යාග. සහනාධාර. ප්‍රදාන වශයෙන් හෝ අධිකාරිය වෙත ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන් ද ගෙවනු ලැබිය යුතුය.

(ඇ) අධිකාරියේ කටයුතු ඉටු කිරීමේදී හෝ මෙම ව්‍යවස්ථාවලිය යටතේ හෝ දැනට අදාළවන කවර හෝ නීතියක් යටතේ බලතල. කාර්යයන් සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී අධිකාරිය විසින් දරනු ලබන කවර හෝ වියදම් පියවිය යුතු සියලුම මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවිය යුතුය.

(ඈ) අරමුදල ප්‍රධාන විධායක නිලධරයාගේ පරිපාලනයට හා පාලනයට යටත් විය යුත්තේය.

## ප්‍රධාන විධායක නිලධරයා.

58 (අ) අධ්‍යක්ෂවරුන් විසින් අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිවන අතර ඔහු අධිකාරියේ ප්‍රධාන පරිපාලන නිලධාරියා ද අධිකාරියේ පූර්ණ කාලීන නිලධරයකු ද විය යුතු වන්නේය. මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු නියමයන් සහ කොන්දේසි මත ප්‍රධාන විධායක නිලධරයා සේවයේ යෙදවිය යුතුය.

(ආ) මීට ඉහත දැක්වෙන ජේදය යටතේ පත් කරනු ලබන ප්‍රධාන විධායක නිලධරයාගේ ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ විට හෝ රෝගාතුරවීම, නිවාඩු යාම හෝ වෙනත් හේතුවක් නිසා ප්‍රධාන විධායක නිලධරයාට තම ධුරයේ තාවකාලිකව රාජකාරි කටයුතු ඉටු කිරීමට නොහැකිවූ විට හෝ ඔහුගේ ධුරයේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා මණ්ඩලය විසින් සුදුසුයයි අදහස් කරන පරිදි කිසියම් වැඩපිළිවෙලක් යෙදියයුතුය.

(ඇ) මණ්ඩලයේ විධානයට යටත්ව අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කාර්ය මණ්ඩලය පාලනය කිරීම ප්‍රධාන විධායක නිලධාරියා වෙතෙ පැවරිය යුත්තේය. මණ්ඩලයේ සියලුම තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද ඔහු වගකීව යුතු වන්නේය.

(ඈ) අධ්‍යක්ෂවරුන් විසින් ප්‍රධාන විධායක නිලධරයන්ට මණ්ඩලයේ යම් රැස්වීමකට හෝ කිසියම් කමිටුවකට පැමිණ එය ඇමතීමට අවසරලබා දිය හැකි වන අතර එහෙත් ඡන්දය ප්‍රකාශ කිරීමේ කිසිදු අයිතියක් ඔහුත්ට නොතිබිය යුත්තේය.

(ඉ) මණ්ඩලය විසින්.

i ප්‍රධාන විධායක නිලධරයා විසින් තම කාර්යයන් සදා කාලිකව ඉටු කිරීමට නොහැකිවූ විට හෝ.

ii මණ්ඩලය අදහස් කරන පරිදි ඔහු විසින් යම් වංචනික ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් කරනු ලැබ ඇති විට හෝ එම ක්‍රියාවට අධිකාරියේ යහපතට හානි කරවන විට හෝ,

iii ඔහු මණ්ඩලයේ විධානයන්ට පටහැනි ලෙස ක්‍රියා කරන විට හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

59 ප්‍රධාන විධායක නිලධරයාගේ ධුරය ඔහු මියගිය විට, 58(ඉ) උප වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කළ විට හෝ ඒ වෙනුවට එම ධුරයත් දරන තැනැත්තත් විසින් ඉල්ලා අස්වීමේ ලිපියක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යවා ඇති විට හිස්විය යුත්තේය.

60 අධ්‍යක්ෂවරුන් විසින් අධිකාරියේ කාර්ය මණ්ඩලය සහ කටයුතු කළමනාකරණය සඳහා පරිපාලන සහ විනය රීති සම්පාදනය කරනු ලැබිය හැකිය.

61 සාංගමික සංස්ථාපත්‍රයේ විධිවිධානවලට සහ මෙම ව්‍යවස්ථාවලියට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ අරමුදල පරිපාලනය කිරීම සඳහාද ගාස්තු ලැබීම සහ වෙනත් කිසියම් කරුණක් සම්බන්ධයෙන්ද නීති රෙගුලාසි සම්පාදනය කරනු ලැබිය හැකිය. එසේ සම්පාදනය කරනු ලබන නීති සහ රෙගුලාසි සාමාජිකයන්ගේ දැනගැනීම පිණිස ඔවුන් වෙත බෙදා හැරිය යුතු වන්නේය.

62 අධිකාරිය අහෝසි කරනු ලබන විට හෝ විසුරුවා හරිනු ලබන විට සියලු ණය හා බැරකම් සහ කවර හෝ දේපලක් බේරුම් කිරීමෙන් පසු ඉතිරිවන කිසිවක් ඇත්නම්, අධිකාරියේ සාමාජිකයන් අතර එය ගෙවනු ලැබීම හෝ බෙදා හරිනු ලැබීම නොකළ යුතු අතර, අධිකාරියේ පරමාර්ථයට සමාන පරමාර්ථ ඇති රජයේ කිසියම් ආයතනයක් හෝ අයතන වෙතදීමට හෝ පැවරීමට ක්‍රියා කළ යුතු අතර මෙම සාංගමික සංස්ථා පත්‍රයේ 4 වන වගන්තිය යටතේ හෝ එම වගන්තියෙන් අධිකාරිය වෙත පවරනු ලබන යටත් පිරිසෙයින් කිසියම් විශාල ප්‍රමාණයකින් ආදායම සහ දේපල

අධිකාරියේ සාමාජිකයන් හෝ වෙනත් සාමාජකියන් අතරේ බෙදාදීම තහනම් කළ යුතුය. අධිකාරිය විසුරුවා හරිනු ලබන අවස්ථාවේදී හෝ ඊට පෙර අධිකාරියේ සාමාජිකයන් විසින් මෙකී ආයතනය හෝ ආයතන පිළිබඳව තීරණය කරනු ලැබිය යුතු අතර, තොඑසේ නම් එය පැහැර හැර ඇති විට පුන්‍යාධාර අරමුදල් සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති විනිසුරුවරයෙකු විසින් ඒ පිළිබඳව තීරණය කරනු ලැබිය යුතුය. ඉහත සඳහන් විධිවිධානය ක්‍රියාත්මක කළ නොහැකි වන කල්හි වෙනත් කිසියම් පුන්‍යාධාර පරමාර්ථයක් වෙනුවෙන් ලබාදිය යුතුය.

63 ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම.

පහතේ විධිවිධානවලට යටත්ව දැනට බලපැවැත්වෙන සංගමයේ ව්‍යවස්ථාවලිය සම්බන්ධයෙන් සංශෝධන අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත්නම් මහ සභා රැස්වීමකදී සම්මත කර ගනු ලබන විශේෂ යෝජනාවක් මගින් සංගමයේ එම ව්‍යවස්ථාවලිය සංශෝධනය කරනු ලැබිය හැකිය.

මෙයට සාක්‍ෂි වශයෙන් සාංගමික සංස්ථා පත්‍රයට අත්සන් තබන්නන් විසින් සංගමයේ ඉහත සඳහන් ව්‍යවසන්ථාවලියට මෙයින් එකඟත්වය ප්‍රකාශ කර මෙහි පහත සඳහන් දින සහ ස්ථානයේදී මෙයට තම තම සඳහන් කර අත්සන් තබන ලදී.

අත්සන් තබන්නන්ගේ නම, ලිපිනයන් සහ විස්තර අත්සන

හේවා මල්වත්තගේ සුගතපාල සමරනායක
සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය,
80, ගාලු පාර,
කොළඹ 3.

දිනය : දෙදහස් ... වර්ෂයේ .................. මස ...... දින

ඉහත දැක්වෙන අත්සන් සඳහා සාක්ෂි කරුවෝ.

ප්‍රසිද්ධ නොතාරිස්
ඩී.එල්. ඇන්ඩි එන් ද සේරම් නීතිඥ
47. ඇලෙක්සැන්ඩර් පෙදෙස.
කොළඹ 7

සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව යනුවෙන් හඳුන්වනු ලබන රජයේ සභාවක් පිහිටුවීම සඳහාත් සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම දිරිගැන්වීම, පහසුකම් සැලසීම, පුහුණු කිරීම, සේවක පිරිස් සඳහා අධ්‍යාපනය ලබාදීම, සමස්ත කර්මාන්තය නියාමනය, අධීක්ෂණය සඳහා නීත්‍යනුකූල යටිතල පහසුකම් සැලසීම පිණිසත් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

කෙටුම්පත් පනත

2002 සැප්තැම්බර් 9 දින.

**සංචාරක කාර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා** සංචාරක සංවර්ධන සභාව යනුවෙන් හඳුන්වනු ලබන රජයේ සභාවක් පිහිටුවීම සඳහාත්, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, දිරුගැන්වීම, පහසුකම් සැලසීම, පුහුණු කිරීම, සේවක පිරිස් සඳහා අධ්‍යාපනය ලබාදීම සමස්ත කර්මාන්තය නියාමනය, අධීක්ෂණය සඳහා නිත්‍යානුකූල යටිතල පහසුකම් සැලසීම පිණිසත් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

1 මේ පනත 2002 අංක ..... දරන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන මෙම පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතුය. — *ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය*

## 1 වන කොටස

### ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව

2 මෙම පනතේ 6)1) වන වගන්තිය යටතේ දැනට සභාවේ සාමාජිකයන්ව සිටින තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු රජයේ සභාවක් පිහිටුවනු ලැබිය යුතුය. — *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව*

3 සභාව 2 වන වගන්තිය මගින් ඒට පවරා දී ඇති නාමයෙන් සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර එයට පොදු මුද්‍රාවක් තිබිය යුතුය. එය විසින් සහ එයට එරෙහිව ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකිය. — *සභාව සංස්ථාගත මණ්ඩලයක් විය යුතු බව.*

4 සභාවේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) සංචාරක කර්මාන්තයට අදාළ දැනට පවතින සංඛ්‍යාත්මක දත්ත ලබාගැනීම සඳහා පර්යේෂණ වැඩසටහන් සහ සමීක්ෂණ පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ක්‍ර සහ උපක්‍රම යොසා බැලීම.

(ආ) සංචාරක කර්මාන්තය සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන ක්‍රමෝපායන්ට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් රජයට උපදෙස්දීම.

(ඇ) සංචාරක කර්මාන්තය සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රවර්ධනය සහ දිරි ගැන්වීම සහ එහි ප්‍රවර්ධනය හා පුහුණු කටයුතු.

(ඈ) ලෝක සංචාරක වෙළඳපොළේ ශ්‍රී ලංකාවට ස්ථානයක් ලබාදිය හැකි සුදුසු තේමා සංවර්ධනය කිරීම.

(ඉ) සියලු සේවා සපයන ව්‍යවසායන් සහ පුහුණු ආයතන විසින් පවත්වාගත යුතු ප්‍රමිතීන් නියම කිරීම සහ එම ප්‍රමිතීන් දැඩි ලෙස පිළිපදින බවට මැනවින් අධීක්ෂණය කරීම.

(ඊ) සංචාරක කර්මාන්තයට අදාළ කරුණු සම්බන්ධයෙන් රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය සහ අන්තර් ක්‍රියා කාරිත්වය.

(උ) ශ්‍රී ලංකාව සංචාරක හා චාරික ගමනාන්තයක් වශයෙන් සංවර්ධනය කිරීම.

(ඌ) සංචාරක හා චාරිකා අංශයෙන් ජාතික ආර්ථිකයට ලැබෙන දායකත්වය වැඩි දියුණු කිරීම.

(එ) (අ) සිට (ඌ) දක්වා ඇති ඡේදවල නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි සියලු ක්‍රියා හෝ දේ කිරීම.

5 (1) සභාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකරවිය හැකි එවැනි සියලු ක්‍රියා සහ දේ කිරීම. සභාවට බලය ඇත්තේය. සභාව සතු බලතල.

(2) සභාවේ මෙම වගන්තියේ (1) වන උප වගන්තියේ සාමාන්‍යත්වයට අගතියක් ඇති නොවන පරිදි සභාවටම පහත සඳහන් බලතල කිසිවක් හෝ සියල්ලම තිබිය යුත්තේය.

(අ) සංචාරක කර්මාන්තය හා සම්බන්ධ කවර හෝ සේවා ආරම්භ කිරීම, පවත්වා ගැනීම සහ මෙහෙයවීම හා සංචාරක කර්මාන්තයේ හෝ කවර හෝ ආශ්‍රිත කර්මාන්තවල නියුතු අනෙකුත් තැනැත්තන් සඳහා එම සේවා සැපයීම.

(ආ) සභාවේ පරමාර්ථ, මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය

හැකි කිසියම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම සඳහා යම් තැනැත්තකුට මූල්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයකින් සහායවීම.

(ඇ) අන්තර් ජාලයේ වෙබ් අඩවිය හිමි කරගෙන මෙහෙයවීම සහ පවත්වාගෙන යාම සහ සංචාරක කර්මාන්තය මගින් සපයනු ලබන ප්‍රවර්ධන සේවා සම්බන්ධයෙන් දායකවන සංචාරක කර්මාන්තයේ සේවා සපයන්නන් වෙතින් ගාස්තු අයකර ගැනීම.

(ඈ) සිත්ගන්නා සුළු ගමන් මාර්ග සහිත ස්ථාන, ප්‍රවාහන පහසුකම්, සංචාරක සේවා සම්බන්ධයෙන් තොරතුරු රැස්කිරීම, පළ කිරීම සහ ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් ද සභාව විසින් එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සුදුසුයයි සැලකෙන අනෙකුත් සියලුම කටයුතු සම්බන්ධයෙන්ද සහභාගිවීම.

(ඉ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම, කුලියටදීම, ඔඩපනය කිරීම හෝ අන්‍යාගාරයකින් බැහැර කිරීම, එසේ වුවද කිසිදු නිශ්චල දේපලක් අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව බැහැර කිරීම නොකළ යුතුය.

(ඊ) සංචාරක කර්මාන්තයට අදාළ ඒට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් එක් එක් ප්‍රාදේශීය සභාවල භූගෝලීය ප්‍රදේශවල

පළාත් සභාවලට උපදෙස්දීම සහ පළාත් සභා සමඟ සම්බන්ධීකරණය.

(ඩ) සංචාරක කර්මාන්තයේ පහසුකම් හා සේවාවල කාර්යක්ෂමතාවය සහ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සහ සංචාරක කර්මාන්තයට අදාළ විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය පුද්ගලයන් පුහුණු කිරීම සඳහා අනෙකුත් අය විසින් පහසුකම් සැපයීම, සහායවීමට සහ සභාව විසින් පහසුකම් සැපයීම ඇතුළුව එවැනි සේවා සහ පහසුකම් සැපයීම සඳහා සේවයේ යොදවා ඇති පුද්ගලයන්ගේ නිපුණතා ඉහළ නැංවීම.

(ඪ) සභාවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් නියමිත කාර්ය පරිපාටි සහ රීති සෑදීම.

(ණ) සභාව විසින් කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා බලය පැවරීමට අවශ්‍යයයි සැලකිය හැකි කවර හෝ කාර්යයන් සභාවේ කිසියම් නිලධරයකුට හෝ සාමාජිකයකුට පැවරීම.

(ඵ) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලූ ගිවිසුම් වලට තත්කාර්ය සඳහා සභාව විසින් බලයදී ඇති යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් හෝ කෙළින්ම හෝ ඇතුළත්වීම සහ එම ගිවිසුම් ඉටු කිරීම.

(ක) සභාවට අයත් චංචල සහ නිශ්චල දේපළ රක්ෂණය කිරීම සඳහා කටයුතු යෙදීම.

(ඛ) මෙම පනතට යටත් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත කිසියම් පුද්ගල සංවිධානයකින් හෝ ආයතනයකින් හෝ ශ්‍රී ලංකා රජයෙන් ණය මුදල් ලබාගැනීම සභාව විසින් සේවයේ යොදවනු ලබන තැනැත්තන් සහ සභාවේ සේවයේ නිරතවීමට සිදුවිය හැකි රජයේ, පළාත් සභාවල හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින තැනැත්තන් සඳහා අර්ථසාධක අරමුදලක් හා රක්ෂණ යෝජනා ක්‍රයක් සුබසාධන අරමුදලක් පිහිටුවීම සහ විනෝද ක්‍රීඩා පහසුකම් හා නවාතැන් පහසුකම් සලසාදීම.

(ග) සභාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, මාරු කිරීම, උස්ස කිරීම ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් විෂයෙයහි විනය පාලනය, ඔවුන්ගේ හැසිරීම, නිවාඩු වැඩකරණ වේලාවන්, නිවාඩු දින සහ ඔවුන්ට ණය මුදල් සහ වැටුප් අත්තිකාරම් ලබාදීම ඇතුළුව ඒ නිලධරයන් හා සේවකයන් සම්බන්ධයෙන් රීති සෑදීම.

(ඝ) සංචාරක කර්මාන්තයේ සේවා සපයන්නන්ගේ කාර්යයන්, බලපත්‍ර සහ අනෙකුත් අවසරපත් නිකුත් කිරීම් විධිමත් කිරීම. සංචාරක කර්මාන්තයේ බලය පැවරීමේ සභාව ලෙස කටයුතු කිරීම සහ

එම සේවාවල ප්‍රමිතීන් සහ ගුණාත්මක බව පාලනය කිරීම හා මැනවින් අධීක්ෂණය කරීම.

(ජ) මෙම පනතට යටත්ව, සංචාරක කර්මාන්තයෙන් සේවා ලබාගන්නා තැනැත්තන්ගෙන් සහ සංචාරක කර්මාන්තයේ සේවා සපයන තැනැත්තන්ගෙන් අයවිය යුතු මුදල්, ගාස්තු, අධිභාරයන් සහ අනෙකුත් අය කිරීම් අයකර ගැනීම.

(ට) සංචාරක සංවර්ධන අරමුදලක් පිහිටුවීම සහ එම අරමුදල කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම.

(ඩ) සභාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍යවන හෝ හිතකර වන හෝ ආනුෂංගික වන කවර හෝ දේ කිරීම.

(ණ) සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය බව, එහි මතය වන වෙනත් සියලු දේ කිරීම.

6 (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දාහතර දෙනෙකුගෙන් සභාව සමන්විත විය යුත්තේය. සභාවේ සංයුතිය.

(අ) ශ්‍රී ලංකා හෝටල් සංගමය සහ ශ්‍රී ලංකා චාරිකා හා සංචාරක සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් පස් (5) දෙනෙකු.

(ආ) දැනට සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරන තැනැත්තා.

(ඇ) චාරිකා කර්මාන්තයට වෘත්තීය දායකයන් වශයෙන් අමාත්‍යවරයා විසින් හඳුනාගනු ලබන තවත් සාමාජිකයන් තිදෙනෙකු (3)

(2) මෙම පනතේ iii වන කොටස යටතේ පිහිටුවනු ලැබූ ප්‍රාදේශිය සංචාරක සභාවල සභාපති තනතුරු දරන තැනැත්තන් සභාවේ නිල බලයෙන් පත්වන සාමාජිකයන් විය යුතුය.

(3) (අ) මෙම වගන්තියේ 6.1 ජේදයේ සහ (1) වන උප වගන්තියේ 6.2 (ඇ) හි සඳහන් සභාවේ සාමාජිකයන් ගෙන් එක් සාමාජිකයකු සභාවේ සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේය.

(ආ) අමාත්‍යවරයා විසින් සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් ධූරයේ තනතුරක සිටින තැනැත්තකු පත්කරනු ලැබිය හැකිය.

(4) යම් තැනැත්තු ඔහු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වේ නම්.

(ආ) රථවාහන පනත අනුව තිබෙන වරදක් හැර කවර හෝ වරදකට වරදකරුවේ නම්

(ඇ) වස්තු භංගත්වයට පත්වී හෝ ණය හිමියන් සමඟ වැඩපිළිවෙළක් යොදාගෙන තිබේ නම්.

(ඇ) කායික හෝ මානසික අසනීපයක් නිසා බෙලහීනව ඇත්නම්,

ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් නොකඩවා සිටීමට නුසුදුස්සකු වන්නේය.

(5) සභාවේ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(6) සභාවේ සෑම සාමාජිකයකු මියයාම හෝ ඉල්ලා අස්වීම හේතුවෙන් කලින් ධුරය හිස්කරනු ලබන්නේ නම් මිස වසර තුනක (3) කාල පරිච්ඡේදයක් ධුරය දැරිය යුත්තේය. ධුරය හිස්කරන සභාවේ කවර හෝ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතුය.

(7) සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු එහි පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන්ම පමණක් සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල වන්නාසේ නොසැලකිය යුතුය.

7 (1) සභාව විසින් ඇතුලත්වී ඇත්තාවූ හෝ ඇතුලත්වීමට යෝජනා කරනු ලැබ ඇත්තාවූ කොන්ත්‍රාත්තුවකට යම් ලෙසකින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධ වූ සභාවේ සාමාජිකයකු විසින් සභාවේ රැස්වීමකදී ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, ඒ හෙළිදරව් කිරීම සභාවේ වාර්තාවල සටහන් කළයුතුය. සාමාජිකයන්ගේ සම්බන්ධතා හෙළිදරව් කළ යුතු බව.

(2) හෙළිදරව් කිරීම පිළිබ අනිවාර්ය නියමයට පත්ව එකී කොන්ත්‍රාත්තුවට සම්බන්ධව් ඇති එකී සාමාජිකයාට සාකච්ඡාවලට සහභාගී විය හැකි අතර එකී කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් තීරණයක් ගනු ලබන අවස්ථාවේදී ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිය යුතුය.

8 මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් ඇතිව. අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ප්‍රමාණයේ පාරිශ්‍රමික සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය.

9 (1) සභාවේ සභාපතිවරයා තමන් පැමිණ සිටින සභාවේ සෑම රැස්වීමකදී මූලසුන දැරිය යුතුය. සභාවේ යම් රැස්වීමකදී සභාපතිවරයා නොපැමිණි විටෙක පැමිණි සාමාජිකයන් විසින් තෝරාපත්කර ගනු ලබනයම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතුය. සභාවේ කටයුතු

(2) සභාවේ රැස්වීම්වල මූලසුන දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

(3) සභාවේ යම් රැස්වීමක ගණපූරණය සභාව විසින් අන්‍යාකාරයකින් එකඟවන්නේ නම් මිස සාමාජිකයන් පස් දෙනෙකු විය යුතුය.

(4) සභාව විසින් එහි රැස්වීම්වල කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා සහ ඒ රැස්වීම්වලදී කටයුතු කරගෙනයාම සඳහා මෙම පනතේ විධිවිධානවලට අනනුකූල නොවන පරිදි රීති සාදනු ලැබිය හැකිය.

## ii වන කොටස

### සභාවේ දෙපාර්තමේන්තු සහ කාර්ය මණ්ඩලය

10 (1) සභාවේ කාර්ය මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය. සභාවේ කාර්ය මණ්ඩලය.

(අ) සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු සංචාරක අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ

(ආ) සභාවේ කටයුතු නිසි ලෙස සහ කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට සභාව විසින් අවශ්‍යයයි සලකනු ලැබිය හැකි වෙනත් යම් නිලධරයන් සහ සේවකයන්.

(2) අමාත්‍යවරයා විසින් සභාවේ උපදෙස් ඇතිව එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලැබිය යුතුය.

(3) මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව සභාව විසින් -

(අ) සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය කිරීම.

(ආ) දැන් පවත්නා වෙළඳපොළ මිල ගණන් සැලකිල්ලට ගෙන වැටුප්, වේතන සහ අනෙකුත් පාරිශ්‍රමික නිශ්චය කරනු ලැබිය හැකිය.

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් සහ කොන්දේසි නිශ්චය කරනු ලැබිය හැකිය.

11 (1) සභාවේ කටයුතු නිසි ලෙස සහ කාර්යක්ෂම ලෙස සභාවේ දෙපාර්තමේන්තු

පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය හැකි යම් දෙපාර්තමේන්තු සභාව විසින් පිහිටුවා පවත්වා ගෙන යා හැකිය.

(2) සභාව විසින් එක් එක් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ ඒ දෙපාර්තමේන්තුවල අනෙකුත් සාමාජිකයන්ගේ කාර්ය කර්තව්‍ය හා බලතල නිශ්චය කරනු ලැබිය හැකිය.

12 (1) සභාව විසින් කිසියම් කමිටු පිහිටුවීමට සුදුසුයයි අදහස් කරන කාර්යය සඳහා අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව එහි සාමාජිකයන් අතුරෙන් හෝ සාමාජිකයන් නොවන අනෙකුත් සාමාජිකයන් පත් කරනු ලැබිය හැකිය. කමිටු පත් කිරීම

(2) සභාවේ සාමාජිකයකු එම කමිටුවල ප්‍රධානියා විය යුතුය.

(3) සභාව විසින් යම් කොන්දේසි සහ සීමාවන්ට යටත්ව, මෙමෙ පනත හෝ වෙනත් යම් නීතියක් අනුව සභාවට පැවරී ඇති කවර හෝ කර්තව්‍ය, කාර්යයන් හෝ බලතල එම කමිටුවලට පවරනු ලැබිය හැකි වන අතර කමිටුව විසින් සභාව වෙනුවෙන් එකී කර්තව්‍ය, කාර්යයන් හෝ බලතල ක්‍රියාත්මක කළ යුතුය.

## iii වන කොටස

ප්‍රාදේශීය සභා පිහිටුවීම.

13 සභාවේ උපදෙස් ඇතිව අමාත්‍යවරයා විසින් නියම කළ යුතු එක් එක් ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සංචාරක සභා පහක් පිහිටුවිය යුත්තේය. ප්‍රදේශීය සංචාරක සභා.

14 ප්‍රාදේශීය සංචාරක සභා පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය. ප්‍රාදේශීය සභාවල සංයුතිය

(අ) සභාපති සහ සභාවේ නිර්දෙශය මත අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් සිව්දෙනෙකු දක්වා.

(ආ) සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් එක් එක් ප්‍රදේශය සඳහා පත්කරනු ලබන සංචාරක අධ්‍යක්‍ෂවරයා.

(ඇ) ප්‍රදේශය තුළ තිබෙන පළාත්වල පළාත් සභා සංචාරක අමාත්‍යාංශවල එක් නියෝජිතයකු.

15 එක් එක් ප්‍රාදේශීය සංචාරක සභාව විසින්.

(අ) ප්‍රදේශයේ සංචාරක කටයුතු සංවර්ධනය කිරීම සඳහා සභාවට උපදෙස්දීම. ප්‍රාදේශීය සංචාරක සභාවල කර්තව්‍ය

(ආ) සභාව විසින් පවරනු ලබන සහ නිශ්චය කරනු ලබන පරිදි සංචාරක සංවර්ධන කටයුතු ඉටු කිරීම.

(ඇ) එක් එක් ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමට අදාළ නිශ්චිත කරුණු පිළිබඳව සභාවට සහ අනෙකුත් සංචාරක ප්‍රවර්ධන ආයතනවලට උපදෙස්දීම.

(ඈ) ප්‍රදෙශයේ සංචාරක ව්‍යවසායන්ට සහාය ලබාදීම හෝ කිසියම් සහායක් ලබාදීමට කටයුතු සැලැස්වීම.

(ඉ) සංචාරක සංවර්ධන කලාප. සංචාරක නිකේතන. සංචාරක උද්‍යාන සහ සංචාරකයන්ට සපයන

අනෙකුත් යම් පහසුකම් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.

(ඒ) සංචාරක කර්මාන්තයට අදාල සහ ඊට ආනුෂංගික කරුණු පිළිබඳව එක් එක් ප්‍රාදේශීය සභාවේ භූගෝලීය ප්‍රදේශය තුළ පිහිටි පළාත් සභාවලට උපදෙස්දීම සහ එම පළාත් සභා සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

(ඔ) ඇතැම් ප්‍රදේශ සංචාරක සංවර්ධන කලාප. සංචාරක උද්‍යාන සහ සංචාරක නිකේතන ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා සභාවට සහ අමාත්‍යවරයාට උපදෙස්දීම සහ එම ප්‍රදෙශ ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එම ප්‍රදේශවල භූගෝලීය සීමා ලකුණු කිරීම.

(ඕ) සභාව විසින් නිශ්චිත වශයෙන් පවරා ඇති කවර හෝ අනෙකුත් කාර්යයන් ඉටු කිරීම.

16 (1) එක් එක් ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය.

(අ) ප්‍රධාන විධායක නිලධරයා විය යුතු සංචාරක කටයුතු පිළිබඳ ප්‍රාදේශීය අධ්‍යක්ෂ.

(ආ). ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයා විසින් සභාවේ උපදෙස් ඇතිව පත් කරනු ලැබිය හැකි අනෙකුත් නිලධරයන් සහ සේවකයන්.

(2) සභාව විසින් සියුලම පත් කිරීම් සිදු කළ යුතු අතර ප්‍රාදේශීය සභාවල සිටින නිලධරයන් සහ

සේවකයන් කෙළින්ම ප්‍රාදේශීය අධ්‍යක්ෂගේ පාලනය යටතට පත්විය යුතුය.

## iv වන කොටස

**ජාතික සංචාරක ආයතනය.**

17 සංචාරක කර්මාන්තයේ සියලුම ක්ෂේත්‍රවල සේවක පිරිස් හුදෙක් පුහුණු කිරීමේ අවශ්‍යතාව සඳහා සංස්ථාගත මණ්ඩලයක් පිහිටුවිය යුතු අතර 21 වන වගන්තිය අනුව දැනට ආයතනයේ පාලක මණ්ඩලයේ සිටින සාමාජිකයන්ව සිටින තැනැත්තන්ගෙන් එය සමන්විත විය යුත්තේය. ජාතික සංචාරක ආයතනය.

18 ජාතික සංචාරක ආයතනය 17 වන වගන්තියෙන් එයට දී ඇති නාමයෙන් සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතුය. එය විසින් සහ එයට එරෙහිව ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකිය. ආයතනය සංස්ථාගත මණ්ඩලයක් විය යුතු බව.

19 ආයතනයේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුය. ආයතනයේ පරමාර්ථ

(අ) සේවක පිරිස් පුහුණු කිරීමට අවශ්‍යවන සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම.

(ආ) එසේ හඳුනාගනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රවල විෂයමාලා සංවර්ධනය කිරීම.

(ඇ) විශිෂ්ටතම අධ්‍යයන හා වෘත්තීය පුහුණුකරුවන් ගේ සේවා ලබාගැනීම.

(ඈ) සංචාරක කටයුතුවලට සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් සම්බන්ධ වැඩ කටයුතු කිරීමට පුද්ගලයන් හෝ පුද්ගලයන් පුහුණු කරන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

(ඉ) ආයතනයෙන් ලබාගත් සුදුසුකම් වර්ගය සඳහන් කරමින් එක් එක් තැනැත්තා විසින් හදාරන ලද පාඨමාලාව පිළිගැනීම සඳහා සහතික පත් ප්‍රදානය කරීම.

(ඊ) සංචාරක කටයුතුවලට සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් සම්බන්ධ පාසල් සහ පුහුණු මධ්‍යස්ථාන කළමනාකරනය කිරීම සහ අයිතිය ලබාගැනීම. කළමනාකරනය හා අයිතිය සඳහා සහභාගීවීම.

20 ආයතනය විසින් එහි පරමාර්ථ මුදුන්පත්කර ගැනීම සඳහා මෙම පනතින් හෝ ඒ යටතේ හෝ දැනට බලපවත්වන වෙනත් කවර හෝ නීතියක් යටතේ ආයතනය වෙත ප්‍රදානය කර හෝ පවරා ඇති බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය හැකිය.

පරමාර්ථ මුදුන්පත්කර ගතයුතු ආකාරය

21 ආයතනයේ පාලක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන් ගෙන් සමන්විත විය යුතුය.

ආයතනයේ පාලක මණ්ඩලය

(අ) සභාවේ සභාපති

(ආ) සභාවේ ප්‍රධාන විධායක නිලධරයා.

(ඇ) සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පුද්ගලයන් දෙදෙනෙකු

(ඇ) ශ්‍රී ලංකා සංචාරක අලෙවි කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධරයා.

(ඉ) සංචාරක හෝටල් සංගමය. ශ්‍රී ලංකා චාරිකා හා සංචාරක සංගමය සහ හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමය විසින් එක් සංගමයකින් පස් දෙනා බැගින් ඉදිරිපත් කරන ලද නම් කළ තැනැත්තන් අතරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පුද්ගලයන් අටදෙනකු.

i සංචාරක හෝටල් සංගමයෙන් නියෝජිතයන් තිදෙනෙකු.

ii ශ්‍රී ලංකා චාරිකා හා සංචාරක සංගමයෙන් නියෝජිතයන් තිදෙනෙකු.

iii හෝටල් පාසල් උපාධිධාරී සංගමයෙන් නම් කළ තැනැත්තන් දෙදෙනෙකු.

(ඊ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන චාරිකා හා සංචාරක කටයුතු පිළිබඳ වෘත්තිකයන් වන සාමාජිකයන් දෙදෙනෙකු.

(උ) අමාත්‍යවරයා විසින් ඉහත සඳහන් සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු ආයතනයේ සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතුය.

(ඌ) 22(1) අ වගන්ති ප්‍රකාර පත් කරනු ලබන ආයතනයේ අධ්‍යක්‍ෂවරයා.

22 (1) ආයතනයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය. ආයතනයේ කාර්ය මණ්ඩලය සහ කළමනාකරණය

(අ) ආයතනයේ පාලක මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ආයතනයේ අධ්‍යක්ෂවරයා.

(ආ) පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව ආයතනය විසින් පත් කරනු ලැබිය යුතු අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍යවන අධ්‍යයන කාර්ය මණ්ඩලය.

(ඇ) ආයතනයේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා ආයතනයේ පාලක මණ්ඩලය විසින් අවශ්‍යයයි සලකනු ලබන පරිදි අනෙකුත් නිලධරයන් සහ සේවකයන්.

(2) ආයතනයේ අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුත්තේය.

(3) මෙම පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, ආයතනයේ පාලක මණ්ඩලය විසින් -

(අ) ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, සේවය අවසන් කිරීම සහ කාර්ය මණ්ඩලයේ විනය පාලනය කිරීම.

(ආ) දැනට පවත්නා වෙළඳපොළ මිල ගණන් නිසි සැලකිල්ලට ගෙන එම කාර්ය මණ්ඩලයේ වේතන සහ වැටුප් හෝ අනෙකුත් පාරිශ්‍රමික නියම කිරීම.

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ නියමයන් සහ කොන්දේසි නියම කිරීම.

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ අභිවෘද්ධිය සඳහා අර්ථසාධක අරමුදල් සහ එවැනි යෝජනා

ක්‍රම පිහිටුවා පාලනය කිරීම කරනු ලැබිය හැකිය.

23 (1) ආයතනය විසින් එහි කටයුතු නිසිලෙස සහ කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීමට අවශ්‍යයයි සැලකෙන දෙපාර්තමේන්තු සංඛ්‍යාවක් පිහිටුවා පවත්වාගෙන යාම කරනු ලැබිය හැකිය. ආයතනයේ දෙපාර්තමේන්තුව

(2) ආයතනයේ පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි ආයතනයේ යම් කොටසක කටයුතු පරිපාලනය සහ පවත්වා ගැනීම සම්බන්ධයෙන් ආයතනයේ එක් එක් දෙපාර්තමේන්තු වගකිව යුත්තේය.

(3) ආයතනයේ එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානිය සහ එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත ආයතනයේ කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් විසින්, ආයතනයේ පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි ඒ බලතල කර්තව්‍ය හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතුය.

## V වන කොටස

### සංචාරක ප්‍රවර්ධන කටයුතු භාරව සිටින නියෝජිතවරයකු පත්කිරීම.

24 (1) අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්යයන් සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් 1982 අංක 17 දරන සමාගම් පනත යටතෙ ලියාපදිංචි ඇති සමාගමක් සභාවේ නියෝජිතයකු ලෙස පත් කරනු ලැබිය හැකිය. සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ නියෝජිත ආයතනයක් පිහිටුවීම.

(අ) ශ්‍රී ලංකාව ගුණාත්මක සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.

(ආ) දකුණු ආසියාතු කලාපයට සහ දකුණු හා දකුණු ආසියාතු කලාපවල සංචාරය කරන සංචාරකයන් සඳහා වැඩි කැමැත්තක් ඇති අතරමැද ස්ථානයට පිවිසුම් දොරටුවක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම.

(ඇ) කලාපයේ සංචාරක කළමනාකරණය සහ සංවර්ධනය සම්බන්ධයෙන් විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රසිද්ධියට පත් කිරීම.

(2) සභාවේ ලිඛිත අනුමැතියක් නොමැතිව එම නියෝජිත ආයතනයේ, සාංගමික සංස්ථා පත්‍රය සහ සංගමයේ ව්‍යවස්ථාවලිය සංශෝධනය නොකළ යුතුය.

(3) අමාත්‍යවරයා විසින්, නියෝජිතයාට තම කර්තව්‍ය ඉටු කිරීමට හැකිවන ලෙස සභාවේ උපදෙස් අනුව තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් නියමයන් සහ කොන්දේසි මත සභාව වෙත පවරා ඇති කිසියම් චංචල හා නිශ්චල දේපළ පරිහරණය සහ පාලනය කිරීම එම නියෝජිත ආයතනය වෙත ලබාදීම කරනු ලැබිය හැකිය.

(4) නියෝජිතයා විසින් (5) වන උපවගන්තිය යටතේ ඒ නියෝජිතයා වෙත ලබාදෙනු ලැබූ සියලූ චංචල හා නිශ්චල දේපළ යහපත් පිළිවෙලින් පවත්වාගෙන යුතු අතර අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය නොලබා එම දේපළ කිසිවක්

වෙනස් කිරීම හෝ එහි යම් අයිතියක් බැහැර කිරීම හෝ නොකළ යුතුමය.

25 සභාව විසින් නියෝජිතයාගේ ප්‍රයෝජනය සඳහා වාර්ෂිකව අරමුදල් වෙන්කර දිය යුතු අතර නියෝජිතයා විසින් එම මුදල් ඉක්මන් ඵලදායී ආකාරයෙන් උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. ක ප්‍රවර්ධන කාර්යාංශයේ මුදල්.

26 නියෝජිතයා විසින් එක් එක් ලිත් පරිකෂණ අවසානයේදී සභාව වෙත පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය. නියෝජිතයා විසින් අනිවාර්ය ලිපි ලේඛන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බව.

(අ) එම වර්ෂයේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක්

(ආ) ඉකුත් මුදල් වර්ෂය සඳහා විගණනය කළ වාර්ෂික ගිණුම්වල පිටපතක්.

(ඇ) මණ්ඩලය විසින් නියම කරනු ලබන පරිදි ඊළඟ මුදල් වර්ෂය වෙනුවෙන් ආදායම් හා වියදම් ඇස්තමේන්තුවක් ලෙස විස්තර ඇතුළත් ප්‍රකාශයක්.

(ඈ) ඉදිරි වර්ෂ තුනක කාල පරිච්ඡේදයක් සඳහා අපේක්ෂිත ඉදිරි සැලැස්මක්.

(ඉ) නියෝජිතයා විසින් ඉකුත් වර්ෂ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ඉදිරි සැලැස්ම සම්බන්ධයෙන් කටයුතු ඉටු කිරීම සහ කාර්ය සාධනය ඇතුළත් ප්‍රකාශයක්.

## vi කොටස

සංචාරක උපදේශක කමිටුව.

27 (1) සංචාරක කර්මාන්තයට අදාල කිසියම් කරුණු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස්දීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින්. — සංචාරක උපදේශක කමිටුව

(අ) සංචාරක කර්මාන්තය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳව සුදුසුකම් සහ පුළුල් අත්දැකීම් ඇති එකොළොස් දෙනෙකුට නොවැඩි පස් දෙනෙකුට නොඅඩු තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වන (මෙහි මින් මතු උපදේශක කොමිෂන් සභාව වෙනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් පිහිටුවීම. සහ

(ආ) එකී උපදේශක කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස එම තැනැත්තන්ගෙන් එක් අයෙකු පත්කිරීම කරනු ලැබිය හැකිය.

(2) උපදේශක කොමිෂන් සභාවේ කාර්යය පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) අමාත්‍යවරයා විසින් කලින් කල කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි හෝ යොමු කරනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂාකර. අමාත්‍යවරයා වෙත වාර්තා කිරීම.

(ආ) කලින් කල සංචාරක කර්මාන්තයට අදාළ වන නීති සහ නියාමන පාදකව්‍යුහය සහ වෙනස් කිරීම සිදු කිරීම සඳහා වන යෝජනා සමාලෝචනය කර බැලීම.

(ඇ) (අ) සහ/හෝ (ආ) ඡේදයේ සඳහන් කරුණු ඉටු කිරීමේදී උපදේශක කොමිෂන් සභාව විසින් අවශ්‍යයයි සලකන අවස්ථාවක රජයේ බලධාරීන්ගේ, පළාත් පාලන ආයතනවල, පළාත් සභාවල, කර්මාන්ත මණ්ඩලවල සහ ජනතාවගේ අදහස් සලකා බලනු ලැබිය හැකිය.

(3) සභාව ප්‍රධාන විධායක බලධරයා උපදේශක කොමිෂන් සභාවේ නිලබලයෙන් සාමාජිකයකු විය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් උපදේශක කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම සහ එහි බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ හෝ පොදු විධාන ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි අතර, උපදේශක කොමිෂන් සභාව විසින් එම විධාන බලාත්මක කළ යුතුය.

(5) සභාව විසින් උපදේශක කොමිෂන් සභාවට උපදෙස්දීම සඳහා යම් කරුණක් කෙළින්ම හෝ අමාත්‍යවරයා මගින් යොමු කළ හැකි අතර, උපදේශක කොමිෂන් සභාව හැකි කෙටිම කාලය ඇතුළත එම උපදෙස් කෙළින්ම හෝ අමාත්‍යවරයා මගින් ඉදිරිපත් කළ යුතුය.

(6) උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතුය. එසේ වුවද

ඉල්ලා අස්වන හෝ අත්‍යාකාරයකින් ධූරය හිස්කරන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවටද, ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරි කාලය සඳහා ධූරය දැරිය යුතුය.

(7) කාලය ඉකුත්වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේය.

(8) (අ) උපදේශක කොමිෂන් සභාවේ කවර සාමාජිකයකු විසින් වුවද අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(ආ) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධූරයේ කාර්ය ඉටු කිරීමට සාමාජිකයකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක ඔහු එසේ නොපැමිණ සිටින කාලසීමාව සඳහා ඔහු වෙනුවට සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීම පිණිස අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකිය.

(9) මෙම කොටස යටතේ ස්වකීය කාර්ය කරගෙන යාමේදී උපදේශක කොමිෂන් සභාවට සහායවීම පිණිස අවශ්‍ය නිලධරයන්ව හො 'සේවකයන් උපදේශක කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පත්කරගත හැකිය.

(10) සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයන්ට සහ අනෙකුත් නිලධරයන්ට හා සේවකයන්ට අරමුදලින් යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකිය.

28 (1) මෙම පනතේ කාර්යයන් සඳහා අමාත්‍යවරයාගේ උපදෙස් ඇතිව සභාව විසින් පවත්වාගෙන යායුතු යම් ආකාරයකින් අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය. සභාවේ අරමුදල

(2) සභාවේ අරමුදලට -

(අ) සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලුම මුදල් ප්‍රමාණයන්.

(ආ) මෙම පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සභාවේ සෙස් බදු අරමුදලට විවිධ වර්ග කිරීම යටතේ ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන්.

(ඇ) මෙම පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සභාවේ බලතල, කර්තව්‍ය හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමේදී හෝ එහි කටයුතු ඉටුකිරීමේදී සභාව වෙත ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන්.

(ඈ) පරිත්‍යාග, ප්‍රදාන වශයෙන් හෝ ඒ හා සමාන ආකාරයකින් ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන්.

(ඉ) මෙම පනතින් හෝ ඒ යටතේ ඒ අරමුදලට ගෙවීමට නියමිත සියලු මුදල් ගෙවනු ලැබිය යුතුය.

(3) සභාව විසින්,

(අ) ත්‍යාග හා පරිත්‍යාග ලබාගැනීමට සහ සභාව විසින් නීත්‍යානුකූලව භාරගත හැකි හා එහි කර්තව්‍යයන්ට හිතකරවිය හැකි අතර කිසිවක් භාරගෙන ක්‍රියාත්මක කිරීමට ද,

(ආ) බලය ලත් නියෝජිතයකු විසින් සභාව වෙනුවෙන් හෝ සභාව විසින් සපයනු ලබන සේවා සඳහා ද මෙම පනතේ සඳහන් කාර්යයන් සඳහා සභාව විසින් ලබාදෙනු ලබන යම් සහතිකයක්, බලපත්‍රයක් හෝ අනුමැතිය සඳහා ගාස්තු ගෙවීමට ද එයට බලය ඇත්තේය.

(4) මෙම පනත යටතේ සභාව විසින් එහි කර්තව්‍ය, බලතල හා කාර්යයන් ඉටු කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලුම මුදල් සහ මෙම පනතින් හෝ ඒ යටතේ හෝ පනත යටතේ සාදනු ලබන යම් නියෝගයක් යටතේ අරමුදලින් ගෙවීමට නියමිත සියලුම මුදල් (1) වන උපවගන්තියේ සඳහන් වන අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

(5) සභාව විසින් එහි ආරම්භක මහ සභා රැස්වීමේදී පත් කරනු ලබන විගණකවරයකු විසින් සභාවේ

මෙහෙයුම් පිළිබඳ පළමු වර්ෂයේ සියලුම ගිණුම් විගණනය කළයුතු අතර සභාවේ සෑම වාර්ෂික මහ සභා රැස්වීමකදී මෙම කාර්යය සඳහා විගණකවරයකු පත් කළ යුතුය.

(6) මෙම වගන්තියේ (5) වන උපවගන්තිය ප්‍රකාර විගණනය කළ ගිණුම් සහ වෙනත් යම් පොත්පත් හෝ ගිණුම් ඉදිරිපත් කළ යුතු අවස්ථාවක එම විගණනය කළ ගිණුම් සහ /හෝ පොත්පත් හා ලිපිලේඛන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

29 (1) සභාව විසින් පහත සඳහන් සේවා සම්බන්ධයෙන් සෙස් බද්දක් අයකළ යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ නතර කිරීමට එකඟත්වය ඇති ශ්‍රී ලංකාවට සහ ශ්‍රී ලංකාව වෙතින් නිකුත් කරනු ලබන ගුවන් ටිකට්පත සඳහා නියමිත මුදලක්.

(ආ) ශ්‍රී ලංකාවේ නතර කිරීමට එකඟත්වය ඇති මුහුදු ගමනක යෙදෙන ශ්‍රී ලංකාවට පැමිණෙන සහ ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මුහුදු ගමන් යාත්‍රා සහ මගී යාත්‍රාවල සිටින මගීන් සඳහා නියමිත මුදලක්.

(ඇ) සංචාරක සේවා සපයන බලයලත් තැනැත්තකු විසින් මෙහෙයවන බලපත්‍ර ලත් සංචාරක සේවා සඳහා නියමිත මුදලක්.

(ඈ) සෙස් බදු එකතුව බෙදා හැරීම පහත සඳහන් ප්‍රමාණය අනුව විය යුතුය.

i ශ්‍රී ලංකා සංචාරක අලෙවි කාර්යාංශය සඳහා 80%

ii ජාතික සංචාරක ආයතනය සඳහා 15%

iii සභාව සඳහා 5%

(3) ඉහත සඳහන් එක් එක් සේවා වෙනුවෙන් අයකරනු ලබන සෙස් බද්ද එම සේවා සපයන්නන් විසින් නිසි ලෙස ගිණුම්වල සටහන් කර පවත්වාගෙන යා යුතුය.

(4) එම සේවා සපයන්නන් විසින් ඔවුන්ගේ සියලුම ලදුපත්වල සහ ගිණුම්වල සෙස් බදු ප්‍රමාණය වෙනම සටහන් කර ගිණුම්වලට ඇතුලත් කළ යුතුය.

(5) එක් එක් සේවා සපයන්නන් විසින් සෙස් බදු වශයෙන් අයකරනු ලබන මුදල් ප්‍රමාණයන් පිළිබඳ විස්තර ඇතුලත් නියමිත ආකාරයෙන් සකස් කළ මාසික ප්‍රකාශයක් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(6) සභාව විසින් අය කරනු ලැබූ සෙස් බද්ද වශයෙන් එකතු කරන ලද සියලුම මුදල් මෙම වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් පරිදි මාසික ප්‍රකාශයක් ඉදිරිපත් කර දින 15 ක් ඇතුලත සභාවට ගෙවිය යුතුය.

(7) මෙම වගන්තියේ (4) සහ /හෝ (5) වන උපවගන්තිය උල්ලංඝනය කරන හෝ එම උප වගන්තිවලට අනුකූලව කටයුතු කිරීමට

අපොහොසත්වන සෑම තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

## vii වන කොටස

### ඉඩම් අනිවාර්යයෙන් අත්පත්කර ගැනීම, වෙරළබඩ හා තානායම් සභාව වෙත පවරීම සහ ඉඩම් අන්සතු කිරීම.

30 (1) කිසියම් සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් සභාව වෙත ලබාදීම සඳහා යම් ඉඩමක් අත්පත්කර ගැනීමට අවශ්‍යවී ඇති අවස්ථාවක එම ව්‍යාපෘතිය සභාව විසින් හෝ සභාවේ පොදු විධානය හා පාලනය යටතේ වෙනත් යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කළයුතු වූවද අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් එම ඉඩම සපයා ගැනීමට හැකිවන ලෙස යෝජිත අත්පත් කරගැනීම අනුමත කරනු ලැබේ.

ඉඩම් අනිවාර්යයෙන් අත්පත් කර ගැනීම

(අ) එම ව්‍යාපෘතියේ කාර්යය මහජන කටයුත්තක් ලෙස සැලකිය යුතු අතර එම ව්‍යාපෘතියේ කාර්යය සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ එම ඉඩම අත්පත් කරගනු ලැබිය හැකිය. අනතුරුව (2) වන උපවගන්තියෙන් සලසා ඇති ආකාරයෙන් එම ඉඩම සභාව වෙත පවරනු ලැබිය හැකිය.

(ආ) ඒ අනුව මෙම පනතේ ඇති විධිවිධාන යටතේ සහ එම විධිවිධාන අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සභාව

විසින් පසුව එම ඉඩම වෙනත් කිසියම් තැනැත්තකු සතු කිරීමේ හේතුවෙන් පමණක් කිසිදු නියෝගයක්, අත්පත්කර ගැනීමක් සහ පසුව පැවරීමක් නිර්බල ලෙස සහ නිර්බලවී ඇති ලෙස නොසැලකිය යුතුය.

(2) යම් සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් සභාව වෙත ලබාදීම සඳහා (1) වන උප වගන්තිය අනුව ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ කිසියම් ඉඩමක් අත්පත්කර ගනු ලබන අවස්ථාවකදී එම ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ අත්පත්කර ගැනීමේ නිලධාරියා විසින් රජය සඳහා සහ රජය වෙනුවෙන් එම ඉඩමේ අයිතිය ලබාගැනීමෙන් අනතුරුව තම අත්සනින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එකී සහතිකයේ නිශ්චිත වශයෙන් සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසි හෝ සීමාවන් කිසිවක් ඇත්නම් ඒවාට යටත්ව සභාව වෙත එම ඉඩම පවරනු ලැබිය යුතුය.

(3) ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 49(අ) වන වගන්තියේ "රාජ්‍ය සංස්ථාව" යන යෙදුමට සභාවද ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර එම යෙදුම එම පනතේ කාර්යයන් සඳහා ඒ අනුව කියවා තේරුම්ගත යුතුය.

(4) යම් සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් සභාව වෙත ලබාදීමේ අවශ්‍යතාව සඳහා මෙම කොටසේ විධිවිධාන අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යම් ප්‍රදේශයක තිබෙන කවර හෝ ඉඩමක් අත්පත්කර

ගනු ලබන අවස්ථාවකදී ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද එම ඉඩම සඳහා ගෙවිය යුතු වන්දි මුදල නිශ්චය කිරීම සඳහා ඉඩමේ වෙළඳපොළ වටිනාකම සොයා දැනගැනීමේදී යම් ප්‍රතිලාභයක් හෝ උපචිතවී ඇති වටිනාකම වැඩිවීමක් හෝ මෙම පනතේ විධිවිධාන අනුව සංචාරක සංවර්ධන කටයුත්තක් සඳහා සභාව රජය හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන කිසියම් සංවර්ධන කටයුත්තක් හෝ වෙනත් යම් මෙහෙයවීමක් නිසා. සෘජුව හෝ අන්‍යාකාරයකින් උපචිතවිය හැකි වටිනාකම වැඩිවීමක් හෝ කිසියම් ප්‍රතිලාභයක් අපේක්‍ෂා කිරීමක් සැලකිල්ලට නොගත යුතුය.

31 යම් සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා කිසියම් රජයේ ඉඩමක් සභාව වෙත ලබාදීමට අවශ්‍ය බව අමාත්‍යවරයා සහතික කරන අවස්ථාවකදී එම ව්‍යාපෘතිය සභාව විසින් හෝ සභාවේ පොදු විධානය සහ එහි විෂය පථය යටතේ වෙනත් කිසියම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කළ යුතු වුවද.

විශේෂ ආධාර මුදලක් හෝ රජයේ ඉඩමක් සභාවට බදුදීම.

(අ) එම ව්‍යාපෘතියේ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ සභාව වෙත එම ඉඩම බදුදිය හැකි හෝ විශේෂ ආධාර මුදලක් ලබාදිය හැකි කටයුත්තක් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව එම ව්‍යාපෘතියේ කාර්යය සඳහා සභාවට එම ඉඩම බදුදීම හෝ ලබාදෙන විශේෂ ආධාර මුදල සම්බන්ධයෙන් එකී ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතුවන අතර.

(ආ) ඒ අනුව මෙම පනතේ විධිවිධාන යටතේ හෝ එම විධිවිධාන අනුව එම ව්‍යාපෘතියේ කාර්යය සඳහා එම ඉඩම පසුව වෙනත් කිසියම් තැනැත්තකු සතුකිරීමේ හේතුවෙන් පමණක් එම විශේෂ ආධාර මුදල හෝ බදුදීම නිර්බල ලෙස සහ නිර්බලවී ඇති ලෙස නොසැලකිය යුතුය.

32 (1) රජයේ ඉඩම් ආඥාපනතේ හෝ කවර හෝ වෙනත් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද කිසියම් සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා සභාව වෙත ලබාදීම පිණිස යම් රජයේ ඉඩමක් අත්පත් කර ගැනීමට අවශ්‍යවී ඇති බව අමාත්‍යවරයා සහතිකකර සිටින අවස්ථාවක එම ව්‍යාපෘතිය සභාව විසින් හෝ සභාවේ පොදු විධානය හා පාලනය යටතේ වෙනත් යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කළ වුතු වුවද අමාත්‍යවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් රජයේ ඉඩම් පිළිබඳ විෂයය හෝ කාර්යය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන (මෙම පනතේ මින්මතු පැවරීමේ නියෝගයක් වශයෙන් සඳහන් කරනු ලබන) නියෝගයක් මගින් නිශ්චිත වශයෙන් සඳහන් කරනු ලැබිය හැකි යම් සීමාවන් හෝ කොන්දේසි කිසිවක් ඇත්තම් ඒවාට යටත්ව එම නියෝගයේ නියම කරනු ලබන කිසියම් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි එම ඉඩම සභාව වෙත පවරනු ලැබිය හැකිය.

රජයේ ඉඩම් සභාව වෙත පැවරීම.

(2) නියෝගයේ නියමිත දින සිට ක්‍රියාත්මවක වන පරිදි එම නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති

**කිසියම් ඉඩමකට සභාවට සම්පූර්ණ අයිතිය පැවරීමේ බලයක් පැවරීමේ නියෝගයක් තිබිය යුතු අතර. සියලුම බැඳීම්වලින් නිදහස් විය යුතුය.**

(3) පැවරීමේ සාධන පත්‍රයේ අන්‍යාකාරයකින් පැහැදිලිව විධිවිධාන සලසා ඇත්නම් මිස සහ එසේ අන්‍යාකාරයකින් පැහැදිලිව විධිවිධාන සලසා තිබීම හැර සභාව වෙත යම් රජයේ ඉඩමක් පැවරීම, එම ඉඩමේ එම ඉඩම මත හෝ යටතේ තිබෙන කිසියම් ඛනිජ ද්‍රව්‍යයක්, ඛනිජ ද්‍රව්‍ය නිෂ්පාදිතයක් හෝ ඛනිජ තෙල් වර්ගයක් සම්බන්ධයෙන් කිසියම් අයිතියක් පවරනු ලැබූසේ නොසැලකිය යුතු අතර, එසේ කිසියම් පැවරීමක් තිබියදී වුවද යම් ඛනිජ වර්ගයක්, ඛනිජ නිෂ්පාදිතයක් සහ ඛනිජ තෙල් වර්ගයක් රජයේ ඉඩමේ පවතින සම්පූර්ණ දේපලක් ලෙස සැලකිය යුතු අතර එම ඉඩමේ සම්පූර්ණ දේපලක් ලෙස පැවතිය යුත්තේය.

33 3 වන වගන්තිය හෝ 4 වන වගන්තිය අනුව රජයේ යම් ඉඩමක් සභාව වෙත පැවරිය යුතු අවස්ථාවක මිනුම්පති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද එම ඉඩමේ සැලැස්මක් නොමැති නම් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විසින්, මිනුම්පති දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති බලයලත් මිනුම්දෝරුවකු ලවා එම ඉඩම මැන්නවීමට හෝ එම ඉඩමේ සැලැස්මක් සකස් කරවා ගැනීමට හෝ කටයුතු සලස්වනු ලැබිය හැකිය.

ප්‍රධාන විධායක නිලධරයා විසින් යම් රජයේ ඉඩමක් සම්බන්ධයෙන් මැනීමක් සිදු කිරීමට සහ සැලැස්මක් සැකසීමට කටයුතු සැලැස්විය හැකි බව.

34 29 වන වගන්තිය අනුව සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් සභාවට ලබාදීම පිණිස ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ යම් ඉඩමක් අනිවාර්යයෙන්ම අත්පත්කර ගනු ලබන අවස්ථාවක සහ මෙම පනත යටතේ සභාව වෙත පසුව එම ඉඩම පවරනු ලබන විට, අනිවාර්යයෙන්ම ඉඩම අත්පත්කර ගැනීමේ සහ පසුව පැවරීමේ හේතුව නිසාම පමණක් සෘජුව හෝ වක්‍රව හෝ ව්‍යාපාර කටයුත්තක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් කිසියම් පුද්ගලයකුට සිදුවන යම් පාඩුවක් වෙනුවෙන් සභාව විසින් ඔහුට කිසිදු වන්දියක් හෝ අලාභයක් නොවිය යුතු අතර ඒ අනුව කවර හෝ වෙනත් තැනැත්තකුට සභාවෙන් යම් වන්දියක් හෝ අලාභයක් ඉල්ලා සිටීමට හෝ ලබාගැනීමට හිමිකම නොලැබිය යුත්තේය.

ඇතැම් ඉඩම් සම්බන්ධයෙන් සභාව විසින් වන්දි නොගෙවිය යුතු බව.

එසේ වුවද, එම ඉඩම අනිවාර්යයෙන්ම අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් මෙම පනතේ විධිවිධාන යටතේ රජයෙන් හෝ කවර හෝ වෙනත් තැනැත්තකුගෙන් එම පනතේ අර්ථානුකූලව එම ඉඩමට සම්බන්ධතාවයක් ඇති කවර හෝ තැනැත්තකු විසින් හිමිකම් ලබා ඇති හෝ හිමිකම් ලැබූ වන්දියක් ලබාගැනීමේ අයිතියට මෙම වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධානවල සඳහන් වන කිසිවකින් අගතියක් හෝ බලපෑමක් ඇති නොවන බව සැලකිය යුතුය. නැතහොත් කියවා තේරුම් ගත යුතුය.

වරලබඩ තීරය

35 (1) අමාත්‍යවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් රජයේ ඉඩම් පිළිබඳ විෂයය හෝ කාර්යය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ගැසට්

වෙරලබඩ තීරයේ යම් කොටසක් සහ එහි පරිපාලනය සභාව වෙත පැවරිය යුතු බව.

පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් එම නියෝගයේ නිශ්චිතව සඳහන් කළ යුතු පරිදි වෙරළබඩ තීරයේ යම් කොටසක පරිපාලනය, පාලනය, භාරකාරත්වය සහ කළමනාකරණය සභාව වෙත පවරනු ලැබිය හැකිය. එම නියෝගය ගැසට් පත්‍රයේ පළ කරන දිනයක හෝ එම නියෝගයේ නියම කළ හැකි වෙනත් දිනයක ක්‍රියාත්මක විය යුතුය.

(2) වෙරළබඩ තීරයේ යම් කොටසක් සම්බන්ධයෙන් උපවගන්තිය යටතේ ඇති යම් නියෝගයක් දැනට බලපැවැත්වෙන පරිදි බලපැවැත්වෙන තාක් කල් හෝ එසේ බලපැවැත්වෙනතාක් පමණක් වෙරළබඩ තීරයේ එම කොටසේ පරිපාලනය, පාලනය, භාරකාරත්වය සහ කළමානකරණය රජය වෙනුවට සභාව වෙත පැවරිය යුතු අතර ඒ අනුව පහත සඳහන් වෙනස් කිරීමට එනම්, රජයේ ඉඩම් ආඥාපනතේ 58 වගන්තියේ රජය සම්බන්ධයෙන් දැක්වෙන සඳහනක් සභාව සම්බන්ධයෙන් වන සඳහනක් ලෙස වෙනස් කිරීමකට යටත්ව එම ආඥාපනතේ එකී වගන්තිය වෙරළබඩ තීරයේ එම කොටස සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුත්තේය.

36 (1) වෙරළබඩ තීරයේ යම් කොටසක් සම්බන්ධයෙන් දැනට 35වන වගන්තිය යටතේ ලබපැවැත්වෙන කිසියම් නියෝගයක් බලපැවැවෙන තාක් කල් සහ බලපැවැත්වෙන තාක් පමණක් සභාව විසින්, 7 වන වගන්තිය යටතේ දැනට බලාත්මක වන නියෝගයක් බලපැවැත්වෙන වෙරළබඩ තීරයේ යම් කොටසකට අදාළවන විශේෂ බලතල

(අ) වෙරළබඩ තීරයේ එම කොටස වෙනුවෙන් කවර හෝ වෙනත් ප්‍රඥප්තියක් යටතේ යම් අතිරේක ලිඛිත නීතියක් සම්පාදනය කිරීම හෝ නිකුත් කිරීම සහ

(ආ) කවර හෝ එවැනි ප්‍රඥප්තියක් මගින් යම් සභාවකට හෝ නිලධරයකුට හෝ පුද්ගලයකුට ප්‍රදානය කරන ලද හෝ පවරන ලද බලතල, කර්තව්‍ය හෝ කාර්යයන් සියල්ල හෝ කිවක් වෙරළබඩ තීරයේ එම කොටස ක්‍රියාත්මක කිරීම, ඉවු කිරම හෝ කිරීම නිතයානුකුල විය යුතුය යන වෙනස් කිරීමකට යටත්ව කවර හෝ එකී ප්‍රඥප්තියක් වෙරළබඩ තීරයේ එම කොටස සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුත්තේය.

එසේම, එවැනි බලතල, කර්තව්‍ය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට හෝ කිරීමට හෝ එවැනි අතිරේක ලිඛිත නීතියක් සම්පාදනය කිරීමට හෝ නිකුත් කිරීමට හෝ බලය පවරන ලද සභාව, නිලධරයා හෝ තැනැත්තා සම්බන්ධයෙන් එවැනි කවර හෝ වෙනත් ප්‍රඥප්තියක දැක්වෙන සඳහනක් සභාව සම්බන්ධයෙන් කරනු ලබන සඳහනක් ලෙස ඇතුළත් වේ.

(2) වෙරළබඩ තීරයේ යම් කොටසක් සම්බන්ධයෙන් 35 වන වගන්තිය යටතේ පවතින කවර හෝ නියෝගයක් දැනට බලපැවැත්වෙන පරිදි

බලපැවැත්වෙන තාක් කල් හෝ බලපැවැත්වෙන තාක් පමණක් සභාවේ එකඟත්වයක් නොමැතිව කවර හෝ වෙනත් ප්‍රඥප්තියකින් යම් බලතල, කර්තව්‍ය හෝ කාර්යයන් ප්‍රදානය කර හෝ පවරා ඇති කිසිදු සභාවක් හෝ නිලධරයකු හෝ තැනැත්තකු විසින් වෙරළබඩ තීරයේ එම කොටස තුළ එකී බලතල, කර්තව්‍ය හෝ කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම නොකළ යුත්තේය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් ධීවර සහ පලාත් පාල න විෂයයන් හෝ කාර්යයන් පවරා ඇති අමාත්‍යවරුන්ගේ එකඟත්වය ඇතිව 35(1) වගන්තිය යටතේ දැනට බලපැවැත්වෙන නියෝගයක් බලාත්මක වන වෙරළබඩ තීරයේ යම් කොටසක් භාවිතා කරන ධීවරයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස මෙම පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකිය.

## viii කොටස

### සභාව විසින් ඉඩම් අත්සතු කිරීම

37 (1) පනතින් සභාව වෙත ප්‍රදානය කර ඇති බලතල සාමාන්‍යත්වයට අගතියක් ඇති නොවන පරිදි සභාව විසින් එහි අයිතියට ඇති යම් ඉඩමක් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව යම් සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන්, සභාව විසින් අයිතිය දරනු ලබන ඉඩම් අත්සතු කිරීමේ අයිතිය.

(අ) මෙම පරිච්ඡේදයේ පසුව සඳහන් වන විධිවිධානවල නිශ්චිතව දැක්වෙන යම් කොන්දේසිවලට සහ,

(ආ) සභාව විසින් එහි පරම අභිමතය පරිදි අන්සතු කිරීමේ සාධන පත්‍රයේ නියම කිරීමට අවශ්‍යයයි සලකනු ලබන තවදුරටත් ඇති යම් කොන්දේසිවලට ද විශේෂයෙන් මෙම ඡේදයේ ඉහත සඳහන් විධිවිධානවල සාමාන්‍යත්වයට අගතියක් ඇති නොවන පරිදි එකී සාධන පත්‍රයේ නියම කර ඇති කවර හෝ වෙනත් කොන්දේසියක් ඉටු කිරීමට අපොහොසත්වන අවස්ථාවකදී හෝ එකී සාධන පත්‍රයේ නියම කර ඇති යම් කාලපරිච්ඡේදයක් සඳහා එම සාධන පත්‍රය යටතේ සභාවට ගෙවිය යුතු යම් මුදලක් නොගෙවා ඇති අවස්ථාවකදී හෝ එම සාධන පත්‍රයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ අන්සතු කිරීම අවලංගු කරනු ලැබීම හෝ අවසන් කරනු ලැබීම කළහැකි වන බවට ඇති කොන්දේසියට ද යටත්ව අන්සතු කරනු ලැබිය හැකිය.

(2) රජයේ ඉඩම් ආඥාපනතේ කිසිවකින් යම් සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් සභාව විසින් අයිතිය දරන යම් රජයේ ඉඩමක් අන්සතු කිරීම කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතුය. නැතහොත් බලපෑමක් ඇතිවන බවට සලකනු ලැබීම හෝ බලපෑමක් ඇතිවන බවට කියවා තේරුම් ගැනීම හෝ නොකළ යුත්තේය.

(3) මෙම පනතේ විධිවිධාන යටතේ හෝ කවර හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ සභාව වෙත පවරා ඇති කිසිදු ඉඩමක් ත්‍යාගයක් වශයෙන් සභාව විසින් අන්සතු නොකළ යුත්තේය.

38 (1) මෙම ඡේදය යටතේ සභාව විසින් යම් ඉඩමක් විකිණීමෙන් අන්සතු කිරීමකදී සෑම අන්සතු කිරීමක් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කොන්දේසියක් පනවා තිබිය යුත්තේය.

සභාව විසින් ඉඩම් අන්සතු කිරීම පිළිබඳ කොන්දේසි.

(අ) ගැනුම්කරු විසින් තමාගේ වියදමින් එම ඉඩම සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන සංචාරක සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු සිදු කල යුතු අතර අන්සතු කිරීමේ සාධන පත්‍රයේ සභාව විසින් නියම කර ඇති කාලපරිච්ඡේදය ඇතුලත හෝ සභාව විසින් අනතුරුව කලින් කල තවදුරටත් නියම කරනු ලැබිය හැකි කාල පරිච්ඡේදයක් තුළ එම ඉඩම හෝ එහි ඇති යම් ව්‍යුහයක් සම්බන්ධයෙන් හෝ අවශ්‍ය සියලු පියවරවල් ගැනීම ද එම ඉඩමේ හෝ ව්‍යුහයේ සියලුම වැඩ දටයුතු ඉටු කිරීම ද කළ යුතුය.

(ආ ගැනුම්කරුවන් විසින් එසේ නියමිත කාලපරිච්ඡේදය හෝ තවදුරටත් නියමිත කාල පරිච්ඡේදය ඇතුලත එසේ කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවකදී විකිණීම ක්‍රියාත්මක කරනු ලැබූ එම සාධන පත්‍රය සභාව විසින් අවලංගු කිරීම හෝ අවසන් කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(ඇ) සභාවේ පූර්ව ලිඛිත අවසරයක් නොමැතිව සභාව විසින් අන්සතු කර ඇති ඉඩමක් ඇපයක් වශයෙන් උගසට තැබීම

මත අනුමත ණය දෙන නියෝජිත ආයතනයක් විසින් කිසිදු ණය මුදලක් හෝ කවර හෝ වෙනත් පහසුකමක් ලබා නොදිය යුතු අතර, එවැනි සෑම උගසට තැබීමක් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි යම් ආකාරයට සාධාරානුකූලව තිබිය යුත්තේය.

(ඈ) මෙම පනතේ 41 වන වගන්තිය යටතේ ඉඩමක් සභාව වෙත ආපසු පවරනු ලබන අවස්ථාවකදී උගසකට හෝ අනුමත ණය දෙන නියෝජිත ආයතනයකට ඇති යම් බැඳීමකට යටත්ව එම ආයතනය විසින් ලබාදී තිබිය හැකි යම් පහසුකමක් සම්බන්ධයෙන් එම ආයතනය වෙත යම් ගෙවීමක් මෙම පනතේ 38 වන වගන්තිය අනුව කළ යුතුය.

(ඉ) එම ඉඩමේ හෝ ඒ තුළ තිබෙන කවර හෝ දැවවලට ගැනුම්කරුට අයිතියක් නොතිබිය යුතු අතර ඒ අනුව විකිණීමෙන් ඉඩම අන්සතු කර තිබියදී වුවද එම දැව සභාවේ දේපළක් වශයෙන් පවතින සේ සැලකිය යුත්තේය.

(2) මෙම ජේදය යටතේ සභාව විසින් යම් ඉඩමක් විකිණීමෙන් තොරව අන්‍යාකාරයකින් අන්සතු කිරීමකදී සෑම අන්සතු කිරීමක් සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි කොන්දේසියක් පනවා තිබිය යුත්තේය.

(අ) අන්සතුව ලබන්නා විසින් තමාගේ වියදමින් එම ඉඩම සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන සංචාරක සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු සිදු කළ යුතු අතර අන්සතු කිරීමේ සාධන පත්‍රයේ සභාව විසින් නියමකර ඇති කාලපරිච්ජේදය ඇතුළත හෝ සභාව විසින් අනතුරුව කලින් කල තවදුරටත් නියම කරනු ලැබිය හැකි කාලපරිච්ජේදයක් තුළ එම ඉඩම හෝ එහි ඇති යම් ව්‍යුහයක් සම්බන්ධයෙන් හෝ අවශ්‍ය සියලු පියවරවල් ගැනීම ද එම ඉඩමේ හෝ ඉදිකිරීමේ වැඩකටයුතු ඉටු කිරීම ද කළ යුතුය.

(ආ) අන්සතුව ලබන්නා විසින් එසේ නියමිත කාලපරිච්ජේදය හෝ තවදුරටත් නියමිත කාලපරිච්ජේදය ඇතුළත එසේ කටයුතු කිරීමට අපොහොසත්වන අවස්ථාවකදී විකිණීම ක්‍රියාත්මක කරනු ලැබූ එම සාධන පත්‍රය සභාව විසින් අවලංගු කිරීම හෝ අවසන් කිරීම හෝ කරනු ලැබිය හැකිය. සහ

(ඇ) සභාවේ පූර්ණ ලිඛිත අවසරයක් නොමැතිව සභාව විසින් අන්සතුකර ඇති ඉඩමක් ඇපයක් වශයෙන් අගසට තැබීම මත අනුමත ණය දෙන නියෝජිත ආයතනයක් විසින් කිසිදු ණය මුදලක් හෝ කවර හෝ වෙනත් පහසුකමක් ලබා නොදිය යුතු අතර, එවැනි සෑම උගසට

තැබීමක් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි යම් ආකාරයකට සාරානුකූලව තිබිය යුත්තේය.

(ඇ) මෙම පනතේ 41 වන වගන්තිය යටතේ ඉඩමක් සභාව වෙත ආපසු පවරනු ලබන අවස්ථාවේදී අගයකට හෝ අනුමත ණයදෙන නියෝජිත ආයතනයකට ඇති යම් බැඳීමකට යටත්ව එම ආයතනය විසින් ලබාදී තිබිය හැකි යම් පහසුකමක් සම්බන්ධයෙන් එම ආයතනය වෙත යම් ගෙවීමක් මෙම පනතේ 40 වන වගන්තිය අනුව කළ යුතුය.

(ඉ) මෙම ඉඩමේ හෝ ඒ තුළ කවර හෝ දැවවලට අන්සතුව ලබන්නාට අයිතියක් නොතිබිය යුතු අතර ඒ අනුව අන්සතු කර තිබියදී වුවද එම දැව සභාවේ දේපලක් වශයෙන් පැවතිය යුත්තේය.

39 (1) මෙම පරිච්ඡේදය යටතේ විකිණීමකින් සභාව විසින් අන්සතු කරනු ලැබූ යම් ඉඩමක් 41 වන වගන්තිය යටතේ සභාව වෙත ආපසු පවරන අවස්ථාවකදී.

සභාව වෙත නැවත ඉඩම් පැවරීමේදී අන්සතුව ලබන්නාට කිසිදු වන්දියක් නොගෙවිය යුතු බව.

(අ) සභාව විසින් ඉඩම විකුණූ මිළ ගණන හෝ,

(ආ) නැවත ඉඩම පවරනු ලබන අවස්ථාවේ ඉඩමේ වටිනාකම හෝ,

(ඈ) ඉඩම සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් වුවත් ඒ වෙනුවෙන් නොවුවත් ගැනුම්කරු විසින් එම ඉඩමේ සිදු කරන ලද යම් වැඩිදියුණු කිරීම්වල වටිනාකම හෝ,

(ඇ) එම ඉඩමේ හෝ ඉඩම තුළ ක්‍රියාත්මක කරනු ලැබූ යම් කර්මාන්තයක, ව්‍යාපාර කටයුත්තක හෝ ව්‍යාපාරයක කීර්ති නාමයේ වටිනාකම හෝ,

(ඉ) එවැනි යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාර කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් සාර්ථක ව්‍යාපාරයක් ලෙස ඇති වටිනාකම හෝ,

සභාව විසින් ගැනුම්කරු වෙත නොගෙවයි යුතු අතර, ගැනුම්කරු විසින් සභාවෙන් එය ඉල්ලා සිටීමට හෝ සභාව විසින් ඔහුට ගෙවනු ලැබීමට හෝ හිමිකම් නොලැබිය යුතුය.

(2) මෙම පරිච්ඡේදය යටතේ සභාව විසින් විකිණීමෙන් තොරව අත්‍යාගාරයකින් යම් ඉඩමක් අත්යතු කිරීම යටතේ පවතින යම් අයිතිවාසිකමක්, අයිතියක් හෝ ප්‍රතිලාභයක් 41 වන වගන්තිය යටතෙ සභාව වෙත ආපසු පවරන අවස්ථාවදී,

(අ) එම අයිතිවාසිකමේ, අයිතියේ හෝ ප්‍රතිලාභයේ ඇති වටිනාකම හෝ,

(ආ) ඉඩම සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් වුවත් ඒ වෙනුවෙන් නොවුවත් අන්සතුව ලබන්නා විසින් එම ඉඩමේ සිදු කරන ලද යම් වැඩිදියුණු කිරීම්වල වටිනාකම හෝ,

(ඇ) ඒ ඉඩමේ හෝ ඉඩම තුළ ක්‍රියාත්මක කරනු ලැබූ යම් කර්මාන්තයක, ව්‍යාපාර කටයුත්තක හෝ ව්‍යාපාරයක කීර්ති නාමයේ වටිනාකම හෝ,

(ඇ) එවැනි යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාර කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් සාර්ථක ව්‍යාපාරයක් ලෙස ඇති වටිනාකම හෝ,

සභාව විසින් අන්සතුව ලබන්නා වෙත නොගෙවිය යුතු අතර අන්සතුව ලබන්නා විසින් සභාවෙන් එය ඉල්ලා සිටීමට හෝ සභාව විසින් ඔහුට ගෙවනු ලැබීමට හෝ හිමිකම් නොලැබිය යුතුය.

40 (1) 40 වන වගන්තියේ දෙවැනි අතුරු විධානය යටතේ දැනුම්දීමක් කිරීමට හිමිකම් ලබා ඇති අනුමත ණය දෙන නියෝජිත ආයතනයේ නමින් ඇති උගසකට හෝ බැඳීමකට යටත්ව මෙම පරිච්ඡේදය යටතේ සභාව විසින් විකිණීමකින් අන්සතු කරනු ලැබූ කවර හෝ ඉඩමක් 41 වන වගන්තිය යටතේ සභාව වෙත ආපසු පවරන අවස්ථාවකදී සභාව විසින් එකී අනුමත ණය දෙන නියෝජිත ආයතනයට.

ඉඩම් ආපසු පැවරීමේදී සභාව විසින් අනුමත ණය දෙන නියෝජිත ආයතනවලට කරනු ලබන ගෙවීම්.

(අ) සභාව විසින් ඉඩම විකුණනු ලැබූ මිල ගණන හෝ ඉඩම ආපසු පවරනු ලබන අවස්ථාවේ ඉඩමේ වටිනාකම යන වටිනාකම්වලින් වඩා අඩු වටිනාකම සමඟ ඉඩම සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ගැනුම්කරු විසින් එම ඉඩමේ සිදු කරන ලද යම් වැඩිදියුණු කිරීම්වල වටිනාකම හෝ,

(ආ) එකී අනුමත ණය දෙන නියෝජිත ආයතනයේ නමින් ඇති උගස හෝ බැඳීම මත ගෙවිය යුතු මුදල යන වටිනාකම් වලින් වඩා අඩු වටිනාකම හෝ ගෙවනු ලැබිය යුතුය.

(2) 17 වන වගන්තියේ දෙවැනි අතුරු විධානය යටතේ දැනුම්දීමක් කිරීමට හිමිකම ලබා ඇති යම් අනුමත ණය දෙනනියෝජිත ආයතනයක් නමින් ඇති යම් උගසකට හෝ බැඳීමකට යටත්ව මෙම පරිච්ඡේදය යටතේ සභාව විසින් විකිණීමකින් නොරව අන්‍යාකාරයකින් යම් ඉඩමක් අන්සතු කිරීම යටතේ ඇති යම් අයිතිවාසිකමක්, අයිතියක් හෝ ප්‍රතිලාභයක් 41 වන වගන්තිය යටතේ සභාව වෙත ආපසු පවරන අවස්ථාවකදී සභාව විසින් එකී ණය දෙන නියෝජිත ආයතනයට එකී අයිතිවාසිකම, අයිතිය හෝ ප්‍රතිලාභය සමඟ ඉඩම සම්බන්ධයෙන් දැනම ක්‍රියාත්මක වන සංචාරක සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම සඳහා අන්සතුව ලබන්නා විසින් එම ඉඩමේ සිදු කරන ලද වැඩි දියුණු කිරීම්වල වටිනාකම හෝ එම අන්සතු

කිරීම අවලංගු කිරීම හෝ අවසන් කිරීම කරනු ලබන අවස්ථාවේදී ගෙවිය යුතු මුදල හෝ යන වටිනාකම්වලින් වඩා අඩු වටිනාකම ගෙවිය යුතුය.

(3) ඉහත සඳහන් උපවගන්තිවල අවශ්‍යතාවන් සඳහා යම් ඉඩමක් සම්බන්ධයෙන් හෝ එම ඉඩමේ වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් "වටිනාකම" යන්නෙන් අදහස් වන්නේ රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලබන වටිනාකමය.

එකී වටිනාකම තක්සේරු කිරීමේදී ප්‍රධාන තක්සේරුකරු විසින් පහත සඳහන් කරුණු සැලකිල්ලට නොගත යුතුය.

(අ) එම ඉඩමේ හෝ ඉඩම තුළ යම් කර්මාන්තයක්, ව්‍යාපාර කටයුත්තක් හෝ ව්‍යාපාරයක් කීර්ති නාමය සහ

(ආ) එකී කර්මාන්තයක්, ව්‍යාපාර කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සාර්ථකව කරගෙන යන ව්‍යාපාරයක් යන කරුණ.

(4) ඉඩම සම්බන්ධයෙන් ඒ වන විට ක්‍රියාත්මකව පැවති සංචාරක සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතුවලට අනුකූලව වැඩිදියුණු කිරීම් සිදුකර ඇත්නම් මිස (1) වන උප වගන්තිය හෝ (2) වන උප වගන්තිය යටතේ සභාව විසින් එකී වැඩිදියුණු කිරීම් වෙනුවෙන් කිසිදු ගෙවීමක් සිදු නොකළ යුත්තේය.

(5) කවර හෝ අනුමත ණය දෙන නියෝජිත ආයතනයක් විසින් යම් ගෙවීමේ ප්‍රමාණයකට ඇති උගස හෝ බැඳීම නිසා ඇතිවන ණය ගැති භාවයෙන් අවස්ථාවෝචිතව උගස හෝ බැඳීම නිදහස් කරනු ලබන්නේ නම් මිස එම නියෝජිත ආයතනයේ නමින් ඇති යම් උගසකට හෝ බැඳීමකට යටත්ව ඇති කවර හෝ ඉඩමක් වෙනුවෙන් සභාව විසින් එකී නියෝජිත ආයතනය වෙත කිසිදු ගෙවීමක් සිදු නොකළ යුත්තේය.

41 මෙම පරිච්ඡේදය යටතේ සභාව විසින් අත්සතු කරනු ලැබූ යම් ඉඩමක් සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක යම් සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක කටයුතු එම ඉඩමේ සිදු කෙරෙමින් පවතින්නේ ද නැතහොත් සිදු කර තිබේද යන්න පිළිබඳව සොයා දැන ගැනීම සඳහා සභාව හෝ සභාවේ යම් සාමාජිකයකු හෝ සභාව යටතේ කටයුතු කරන යම් තැනැත්තකු හෝ ප්‍රධාන විධායක නිලධරයා හෝ විසින් එකී ඉඩමට ඇතුළුවී එම ඉඩම හෝ එහි ඇති යම් ඉදිකිරීමක් හෝ ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් ගෙන ඇති යම් පියවරවල් පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේය.

යම් ඉඩම්වලට ඇතුළුවී පරීක්ෂාකර බැලීම සඳහා සභාව සතු බලතල

එසේ වුවද, එකී ඉඩමේ අත්සතුව ලබන්නාට හෝ පදිංචිකරුට එම ඉඩම පරීක්ෂාකර බැලීමට අදහස් කරන බව දින හතකට නොඅඩු කාලසීමාවකට කලින් දැනුම්දීමෙන් පසුව එකී අත්සතුව බලන්නාගේ හෝ පදිංචිකරුගේ කැමැත්තක් නොමැතිව මෙම වගන්තියේ කලින් සඳහන් කළ විධිවිධානවලින් ප්‍රදානය කර ඇති බලය අනුව කිසිදු තැනැත්තකු විසින් එම ඉඩමට ඇතුළුවීම හෝ පරීක්ෂාකර බැලීම හෝ නොකළ යුත්තේය.

42 මෙම පරිච්ඡේදය යටතේ සභාව විසින් කිසියම් ඉඩමක් අන්සතු කිරීම

ඉඩම් අන්සතු කිරීමේ සාධන පත්‍ර අවලංගු කිරීම හෝ අවසන් කිරීම.

(අ) 36 වගන්තියේ විධිවිධාන හෝ

(ආ) අන්සතු කිරීමේ සාධන පත්‍රයේ ඇති කවර හෝ වෙනත් කොන්දේසියක් පිළිපැදීමට අපොහොසත්වන අවස්ථාවකදී හෝ එම සාධන පත්‍රය යටතේ සභාවට ගෙවිය යුතු යම් මුදලක් සාධන පත්‍රයේ නියමිත යම් කාලපරිච්ඡේදයක් සඳහා නොගෙවා තිබෙන අවස්ථාවකදී හෝ සාධන පත්‍රය අවලංගු කළ යුතු බවට හෝ අවසන් කළ යුතු බවට නියම කර ඇති යම් කොන්දේසියක් අනුව හෝ එම විධිවිධාන හෝ අදාළ කොන්දේසිය ක්‍රියාත්මක කිරීමෙන් අවලංගු කළ යුතු හෝ අවසන් කළ යුතු අවස්ථාවකදී එම සාධන පත්‍රය මත සටහනක් යෙදීමෙන් අන්සතු කිරීම අවලංගු කිරීම කරනු ලැබිය හැකිවන අතර. ඒ අනුව එකී අන්සතු කිරීම අවසන් කරනු ලැබිය යුත්තේය.

එසේ වුවද. යෝජිත අවලංගු කිරීමට හෝ අවසන් කිරීමට එරෙහිව හේතු දක්වන ලෙස එම ඉඩමේ අන්සතුව ලබන්නාට අවස්ථාවක් ලබාදෙනතුරු එම සාධන පත්‍රයේ කිසිදු සටහනක් නොකළ යුත්තේය.

එසේ වුවද. එම ඉඩම කවර හෝ අනුමත ණය දෙන නියෝජිත ආයතනයක නමින් යම් උගසකට හෝ බැඳීමකට යටත්ව

ඇති අවස්ථාවක එම නියෝජිත ආයතනය විසින් එවැනි උගසක් හෝ බැඳීමක් ඇති බවට සභාව වෙත ලිඛිතව දැනුම්දී යම් දැනුම්දීමක් කළ හැකි එම නියෝජිත ආයතනයේ නම සහ ලිපිනය සභාව වෙත සපයා ඇත්නම් එම යෝජිත අවලංගු කිරීම පිළිබඳව එම නියෝජිත ආයතනයට ලිඛිතව දැනුම්දීමක් කරන තුරු එම සාධන පත්‍රයේ කිසිදු සටහනක් නොකළ යුතු වන්නේය.

43 මෙම පරිච්ඡේදය යටතේ සභාව විසින් යම් අත්සතු කිරීමේ සාධන පත්‍රය අවලංගු කරනු හෝ අවසන් කරනු ලබන අවස්ථාවක එම ඉඩම සභාව වෙත ආපසු පැවරිය යුතු අතර රජයේ ඉඩම් (අයිතිය ආපසු ලබාගැනීම) පනතේ විධිවිධාන සමඟ කිය වියයුතු 43 සහ 44 වන වගන්තිවල විධිවිධාන එම ඉඩමේ පදිංචිකරුවන් නෙරපා හැරීම සම්බන්ධයෙන් අදාළ විය යුත්තේය.

අත්සතු කිරීමේ සාධන පත්‍රය අවලංගු කිරීම හෝ අවසන් කිරීම සහ පදිංචිකරුවන් නෙරපා හැරීම.

44 මෙම පරිච්ඡේදය යටතේ සභාව විසින් යම් ඉඩමක් අත්සතු කිරීමේ සාධන පත්‍රය අවලංගු කිරීමේ හෝ අවසන් කිරීමේ හේතුවෙන් පමණක් සෘජුව හෝ වක්‍රව හෝ ව්‍යාපාර කටයුත්තක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් යම් ඉඩමක අත්සතුව ලබන්නාට හෝ වෙනත් තැනැත්තකුට සිදුවන යම් පාඩුවක් වෙනුවෙන් එම අත්සතුව ලබන්නා හෝ තැනැත්තා කිසිදු වන්දියක් හෝ අලාභයක් සඳහා වන්දියක් හෝ අලාභයක් සඳහා හිමිකම් නොලැබිය යුත්තේය.

යම් ඉඩමක් අත්සතු කිරීමේ කවර හෝ සාධන පත්‍රයක් අවලංගු කිරීමේ හෝ අවසන් කිරීමේ හේතුවෙන් දරන ලද පාඩුවක් සඳහා කිසිදු වන්දියක් හෝ අලාභ නොගෙවිය යුතු බව.

45 (1) 2 වන වගන්තිය හෝ 9 වන වගන්තිය යටතේ සභාව වෙත පවරනු ලබන හෝ මෙම පනතේ 3

සභාව විසින් අයිතිය දරන ඉඩමක පදිංචිකරුවන්

නෙරපා හැරීම සඳහා කාර්ය පරිපාටිය

වන වගන්තිය සමඟ කියවෙන රජයේ ඉඩම් ආඥාපනත යටතේ විශේෂ දීමනා පත්‍රයකින් හෝ බද්දකින් සභාව වෙත පවරනු ලබන හෝ සභාව වෙත ආපසු පවරන හෝ අවස්ථාවකදී සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විසින් එම ඉඩමේ අයිතිය ලබාසිටින හෝ පදිංචිවී සිටින කවර හෝ තැනැත්තකුට නියෝගයේ සඳහන් නිශ්චිත කාලසීමාවක් තුළ ඉඩමෙන් ඉවත් වන ලෙස ලිඛිතව නියෝග කරනු ලැබිය හැකිය.

(2) මෙම පනතේ කවර හෝ විධානයක් යටතේ යම් ඉඩමක් සභාවට පැවරී තිබෙන අවස්ථාවකදී සභාව හෝ සභාවේ සභාපති විසින් ගනු ලබන හෝ ගැනීමට යෝජිත යම් ක්‍රියා මාර්ගයක් හේතුවෙන් කවර හෝ තැනැත්තකුට හෝ තැනැත්තන්ට දුෂ්කරතාවයක් සිදුවිය හැකි ආකාරයෙන් එම තැනැත්තාට හෝ තැනැත්තන්ට උන්හිටිතැන් අහිමිවනු ලබන බවට විශ්වාස කිරීමට අමාත්‍යවරයාට හේතු ඇති විටෙක එම තැනැත්තාට හෝ තැනැත්තන්ට විකල්ප වාසස්ථාන සපයාදීමට අමාත්‍යවරයා විසින් අවශ්‍යයයි අදහස් කරන පියවරවල් ගැනීම හෝ මෙම කාර්යය සඳහා සභාව වෙත පාර්ලිමේන්තුවෙන් විශේෂයෙන් සපයා ඇති මුදල්වලින් එම තැනැත්තාට හෝ තැනැත්තන්ට ප්‍රමාණවත් වන්දියක් වශයෙන් යම් මුදලක් හෝ මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස සභාවට නියෝග කිරීම හෝ කරනු ලැබිය හැකිය.

46 47 වන වගන්තිය යටතේ කවර හෝ තැනැත්තකුට යම් නියෝගයක් නිකුත් කරනු ලැබූ විට එම නියෝගයේ නියමිත කාලසීමාව තුළ එම නියෝගයට අදාළ ඉඩමෙන් ඉවත්වීමට අපොහොසත්වන අවස්ථාවකදී රජයේ ඉඩම් (අයිතිය ආපසු ලබාගැනීම) පනතේ විධිවිධාන යටතේ ඔහු නෙරපා හරනු ලැබිය හැකිය. පදිංචිකරුවන් නෙරපා හැරීම සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනතේ 120 සිට 127 දක්වා වගන්ති අදාළ විය යුතු බව.

## ix කොටස

## ස්වභාවික දර්ශන ඇති ස්ථාන හා මහාමාර්ග සහ පරිසරය ආරක්ෂා කිරීම

47 (1) අමාත්‍යවරයා විසින් මෙම පනත යටතේ පොදු චාරිකා සම්බන්ධයෙන් විනෝදාත්මක වටිනාකම සහ ආරක්ෂාව ප්‍රවර්ධනය සහ ස්වාභාවික සෞන්දර්ය ආරක්ෂාකර ගැනීම සඳහා අවශ්‍ය තිසි නියෝග සභාවට සෑදීමට ප්‍රමාණවත් ලෙස පෙනී යන යම් විධිවිධාන ඇතුළත් ව්‍යවස්ථා සංග්‍රයක් තියම කරමින් නියෝග සාදනු ලැබිය හැකිය. මහා මහාර්ග ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථා සංග්‍රහය.

(2) (1) වන උප වගන්තියෙන් ප්‍රදානය කර ඇති බලතලවලට සාමාන්‍යත්වයට අගතියක් සිදු නොනවන පරිදි අමාත්‍යවරයා විසින් මෙම පනතේ මෙම කොටස යටතේ දැනට නිශ්චිතව දැක්වෙන සියලු කරුණු හෝ කිසියම් කරුණක් සම්බනධයෙන් සහ එම කරුණුවලට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වන අනෙකුත් සියලුම කරුණු සම්බන්ධයෙන් මෙම පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකිය.

(3) (1) වන උපවගන්තියෙන් ප්‍රදානය කර ඇති බලතලවල සාමාන්‍යත්වයට අගතියක් සිදු නොවන

පරිදි අමාත්‍යවරයා විසින්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් පරිසරය පිළිබඳ විෂයය හෝ කාර්යය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා ගේ එකඟත්වය ඇතිව මෙම පනත යටත්ත පරිසරය සුරැකීමට සහ සංචාරක කර්මාන්තය කෙරෙහි අයහපත් බලපෑමක් ඇතිවන යම් ආකාරයකින් පරිසර දූෂණය වැළැක්වීමට අදාළවන කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

48 (1) 45 වගන්තියේ සඳහන් නියෝග යටතේ ස්වාභාවික දර්ශන ඇති ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත්කළ යම් ප්‍රදේශයක් තුළ පිහිටි රජයෙ 'කිසිදු ඉඩමක් අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව යම් ලිඛිත නීතියක් විධිවිධාන යටතේ අත්සතු නොකොළ යුතුය.

ස්වාභාවික දර්ශන ඇති ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත් කළ යම් ප්‍රදේශයක් තුළ පිහිටි රජයේ ඉඩම් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියක් නොමැතිව අත්සතු කළ නොහැකි වන බව.

(2) (1) උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන ලෙස රජයේ ඉඩමක් කවර හෝ ලෙසකින් අත්සතු කිරිම සියලුම කාර්යයන් සඳහා නිෂ්ප්‍රභ විය යුතුය.

49 කාලසීමා ආඥාපනතේ විධිවිධාන හෝ අයිතිය සන්තකය පරිහරණය කරන්නා වශයෙන් අයිතිවාසිකම් අත්පත්කර ගැනීම සම්බන්ධයෙන් අදාළ වන වෙනත් යම් නීතියක විධිවිධාන 45(1) වගන්තියේ සඳහන් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය වන ලෙස ඉදි කරනු ලබන. ප්‍රදර්ශනය කරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන අදාළ නොවන ප්‍රචාකර දැන්වීම්. ගොඩනැගිලි. ඉදිකිරීම්. වෙනස් කිරීම් බව හෝ සුන්බුන් අංගත

ඇතැම් අවස්ථාවල කාලසීමාව පිළිබඳ විධිවිධාන අදාළ නොවන බව

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු අතර කිසිදු තැනැත්තකු විසින් එම විධිවිධාන උල්ලංඝනය වන ලෙස යම් මාර්ගයක හෝ වෙන්කළ ස්ථානයක හෝ වෙනත් ස්ථානයක ඉදිකරනු ලබන, ප්‍රදර්ශනය කරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් ප්‍රචාරක දැන්වීමක්, ගොඩනැගිල්ලක්, ඉදිකිරීමක්, වෙනස් කිරීමක් හෝ සුත්බුත් අංගනයක් සම්බන්ධයෙන් අයිතිය, සන්තකය හෝ පරිහරණය කරන්නා පිළිබඳව ඇති යම් අයිතිවාසිකම්වලට නියමිත දින හෝ ඊට පෙර හෝ පසුව හිමිකම් නොලැබිය යුතුය.

සංචාරක සේවා සම්බන්ධයෙන් වූ මිල, ගාස්තු රේට් ප්‍රමාණ සහ අයකිරීම් විධිමත් කිරීම සහ සංචාරක ව්‍යවසායන් ලියාපදිංචි කිරීම.

50 (1) සභාවේ සභාපතිවරයා විසින්, එසේ කිරීම උචිතයයි ඔහුට පෙනියන අවස්ථාවක කවර හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ පිහිටුවා ඇති වෙනත් යම් මිල විධිමත් කිරීමේ සභාවකින් විමීම කිරීමෙන් අනතුරුව කවර හෝ සංචාරක සේවාවක් මගින් පනවනු ලැබිය හැකි, නියම කරනු ලැබිය හැකි, ඉල්ලා සිටිනු ලැබිය හැකි හෝ අය කරගනු ලැබිය හැකි මිල, රේට් ප්‍රමාණ, ගාස්තු හෝ අයකිරීම් නියෝගයකින් විධිමත් කරනු ලැබිය හැකිය. එම නියෝග මෙම පනතේ "මිල නියෝග නියම" ලෙස සඳහන් කරනු ලැබේ.

සංචාරක සේවා සම්බන්ධයෙන් උපරිම මිල නියම කරමින් සභාපතිවරයා විසින් නියෝග කළ හැකි බව.

(2) යම් මිල නියෝග නියමයක් -

(අ) ශ්‍රී ලංකාව පුරාම ඇති සංචාරක සේවා විසින් ක්‍රියාත්මක කරනු ලැබීමට සැලැස්විය

යුතුය. නැතහොත් එය ක්‍රියාත්මකවීම නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි ශ්‍රී ලංකාවෙහි යම් ස්ථානයක හෝ ප්‍රදේශයක සංචාරක සේවාවලට සීමා කරනු ලැබිය හැකිය.

(ආ) එය අදාළ කිරීම නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් සංචාරක සේවා විස්තරයකට සීමා කරනු ලැබිය හැකිය.

(ඇ) එමගින් වෙනස් වූ විස්තරවල සංචාරක සේවා සම්බන්ධයෙන් වූ හෝ එකම විස්තරයක සංචාරක සේවාවල වෙනස් වූ සංචාරක සේවා වර්ග සම්බන්ධයෙන් වූ මිල, රේට් ප්‍රමාණ, ගාස්තු හෝ අයකිරීම් විධිමත් කරනු ලැබිය හැකිය. සහ.

(ඈ) එමගින් සපයනු ලබන සේවයෙහි හෝ පහසුකම්වල තත්වය සහ ප්‍රමිතිය සම්බන්ධ කොන්දේසි ද ඇතුලත්ව එවැනි යම් සේවා විසින් පනවනු, අයකරනු හෝ ඉල්ලා සිටින ලැබිය හැකි හෝ අයකරනු ලැබිය හැකි මිල, රේට් ප්‍රමාණ, ගාස්තු හෝ අයකිරීම් යටත් විය යුතු කොන්දේසි නියම කරනු ලැබිය හැකිය.

(3) (අ) මෙම වගන්තියේ මීට ඉහතින්ම වූ විධිවිධාන මගින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විසින් යම් මිල නියෝග නියමයක් කිරීමේදී එම විස්තරයේම වෙනත් යම් පංතියක සංචාරක සේවයකට වඩා

වැඩි උපරිම මිල රේට ගණන්, ගාස්තු හෝ අයකිරීම් පැනවීමට, ලබාගැනීමට, ඉල්ලා සිටීමට හෝ අයකිරීමට යම් එක් පංතියක සංචාරක සේවයක යම් විස්තරයකට හැකි බවට තහවුරු කිරීමේ අවශ්‍යතාවට මූලික වශයෙන් සැලකිල්ල දැක්විය යුතුය.

(ආ) මෙම පරිච්ඡේදයේ කාර්ය සඳහා යම් විස්තරයක යම් චාරිකා හෝ සංචාරක සේවයකට අදාළව "පංතිය" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ යම් සංචාරක සේවාවක් සම්බන්ධයෙන් අදාළවන දැනට ඇති යම් ව්‍යවස්ථා සංග්‍රහයක විධිවිධාන යටතේ තත් කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන රෙජිස්ටරයෙහි එම සේවයට වෙන්කර ඇති හෝ දී ඇති වර්ගීකරණය වේ.

(4) සෑම මිල නියෝග නියමයක්ම සභාවේ සභාපතිවරයා විසින් සාදනු ලැබ අත්සන් කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතුය.

(5) යම් මිල නියෝග නියමයක් සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබීමෙන් පසු,

(අ) ගැසට් පත්‍රයේ ඒ නියමය ප්‍රසිද්ධ කිරීමෙන්,

(ආ) මෙම පනත යටතේ තත් කාර්යය සඳහා සාදන ලද නියෝග මගින් නියමිත වෙනත් යම් ආකාරයකින්,

වහාම ඒ පිළිබඳව මහජන දැනුම්දීම කරනු ලැබිය යුතුය.

(6) සෑම පාලන නියෝග නියමයක් එය ක්‍රියාත්මක වන දිනයට පසු හැකි විගත අමාත්‍යවරයා සලකා බැලීම සඳහා ඔහු වෙත ඉදිරිපත් කළ යුතු අතර ඉන්පසු අමාත්‍යවරයා විසින් ඒ නියමය අනුමත කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

(7) (6) වන උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් යම් මිල නියෝග නියමයක් පරිච්ඡින්න කරනු ලැබූ අවස්ථාවක, ඒ පරිච්ඡින්න කිරීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එලෙස ප්‍රසිද්ධ කරන ලද දිනයේ සිට එය පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කරන ලද හෝ දරන ලද කිසිවකට හෝ අත්කරගත්, උපචිත වූ හෝ ලබන ලද යම් අයිතියකට, බැඳීමකට හෝ වගකීමකට අගතියක් නොවිය යුතුය.

(8) යම් මිල නියෝග නියමයක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

51 (1) යම් සංචාරක සේවාවක් සම්බන්ධයෙන් මිල නියෝග නියමයක් අමාත්‍යවරයා විසින් අනුමත කර තිබියදී වුවද, එම නියමය, මිල නියෝග නියමය අවලංගු කිරීම.

(අ) එම සංචාරක සේවාව සම්බන්ධයෙන් නව මිල නියෝග නියමයක් මගින් හෝ,

(ආ) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් හෝ,

සභාවේ සභාපතිවරයා විසින් කවර හෝ අවස්ථාවකදී අවලංගු කරනු ලැබිය හැකිය.

මෙම උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කරනු ලබන සෑම නියමයක් එම නියමය ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ හෝ එහි නිශ්චිත වශයෙන් සඳහන් කරනු ලැබිය හැකි පසු යම් දිනක ක්‍රියාත්මක විය යුතු අතර 48 වන වගන්තියේ (6), (7) සහ (8) වන උපවගන්තිවල සඳහන් කිසිවක් එවැනි යම් නියමයක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුත්තේය.

(2) යම් සංචාරක සේවාවක් සම්බන්ධයෙන් කිසියම් මිල නියෝග නියමයක් අමාත්‍යවරයා විසින් පරිච්ඡින්න කිරීම හෝ සභාවේ සභාපතිවරයා විසින් අවලංගු කිරීම එම සංචාරක සේවාව සම්බන්ධයෙන් යම් මිල පාලන නියමයක් කිරීමට සභාපතිවරයා සතු බලය සම්බන්ධයෙන් අගතියක් හෝ බලපෑමක් ඇතිවන සේ සැලකිය යුතු නොවන්නේය.

52 (1) යම් මිල නියෝග නියමයක් තත් කාලයෙහි ක්‍රියාත්මකව පවතින අවස්ථාවක ඒ නියමය අදාළ වන්නාවූ සෑම සංචාරක සේවයක අයිතිකරු හෝ කළමනාකරු හෝ විසින් - මිල ලේඛන පවත්වා ගැනීමට සංචාරක සේවා කළමනාකරුගේ හෝ අයිතිකරුගේ කාර්යය

(අ) ඒ අයිතිකරු හෝ කළමනාකරු විසින් සලස්වනු ලබන සහ නියමයේ සඳහන් වන එක් එක් සේවාව සම්බන්ධයෙන් අයකරනු ලබන මිල, රේට් ප්‍රමාණ, ගාස්තු හෝ අයකිරීම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාම හෝ පවත්වාගෙන යාමට සැලැස්වීම හෝ කළ යුතුය.

(ආ) ඒ ලේඛනය සභාවේ ප්‍රධාන විධායක නිලධරයා හෝ තත් කාර්යය සඳහා ප්‍රධාන විධායක නිලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද වෙනත් තැනැත්තකු විසින් පරීක්ෂාකර බලනු පිණිස තැබිය යුතුය, නැතහොත් එසේ තැබීමට සැලැස්විය යුතුය, සහ

(ඇ) ඒ නියමයේ සඳහන් වන මිල, රේට් ප්‍රමාණ, ගාස්තු හෝ අයකිරීම් පිළිබඳ ලැයිස්තුවක් ප්‍රධාන විධායක නිලධරයා විසින් විධාන කරනු ලබන පරිදි වූ ආකාරයට හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය.

53 (1) සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඇතැම් ව්‍යාපාර සංචාරක ව්‍යවසායන් වශයෙන්ද සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් සපයනු ලබන ඇතැම් සේවා සංචාරක සේවා වශයෙන්ද ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

සංචාරක ව්‍යවසාය සහ නිශ්චිත සංචාරක සේවා සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ඒවා ලියාපදිංචි කිරීම.

(2) සභාව විසින් එම සංචාරක ව්‍යවසායන් සහ සංචාරක සේවාවන් සඳහා බලපත්‍ර නිකුත් කරනු ලැබිය යුතු අතර වෙනස්වූ වර්ගීකරණයන් යටතේ ඒවා ලියාපදිංචි කරනු ලැබිය යුතුය.

(3) එම බලපත්‍ර ලබාදීම සහ/හෝ ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයේ නිශ්චිත වශයෙන් සඳහන් කරනු ලැබිය යුතුය.

(4) සභාව විසින් වර්ගීකරණය, අවම ප්‍රමිතීන් පවත්වාගෙනයාම, බලපත්‍ර නිකුත් කිරීමට පෙර සහ/හෝ ලියාපදිංචි කිරීමට පෙරාතුව සංචාරක ව්‍යවසායක් හෝ නියමිත සංචාරක සේවාවක් විසින් එම ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ ශක්‍යතාව පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් අදාළ වන කාර්ය පරිපාටිය පිළිබඳ රීති ස්ථාපිත කළ යුත්තේය.

(5) සභාව වෙත ලියා පදිංචිවී සහ/හෝ බලපත්‍ර ලබා ඇත්තම් මිස කිසිදු සංචාරක ව්‍යවසායක් හෝ නියමිත සංචාරක සේවයක් ව්‍යාපාර කරගෙන නොයා යුතුය.

(6) එසේ නිකුත් කරනු ලැබූ බලපත්‍ර සහ/හෝ සංචාරක ව්‍යවසායන් සහ සංචාරක සේවාවන් ලියාපදිංචි කිරීම එක් වසරක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර එම ලියාපදංචිය අලුත් කිරීම සහ බපලත්‍ර නිකුත් කිරීම මෙම පනතේ 4 වන වගන්තිය යටතේ ස්ථාපිත කළ රීති අනුව සිදු කළ යුතුය.

(7) කිසිදු වෙළඳ ව්‍යාපාරයක් හෝ තැනැත්තකු විසින් එම වෙළඳ ව්‍යාපාරය හෝ ඒ තැනැත්තා යටතේ අවස්ථාවෝචිත ලියාපදිංචි කර ඇති සහ/හෝ වර්ගීකරණය කර ඇති සහ/හෝ බලපත්‍ර ලබා ඇති යම් සේවාවක් සැපයීම සඳහා ඒ වෙළඳ

ව්‍යාපාරය හෝ ඒ තැනැත්තා ලියාපදිංචි කරනු ලැබ ඇති සහ/හෝ කිසියම් නාමයක් හෝ එකතු කිරීමක් යොදාගනු නොලැබිය යුතුය.

(අ) (1) මෙම පනතේ ඇති උපලේඛනයේ සඳහන් ආකාරයට දැක්වෙන ජාතික පුෂ්පය වන මානෙල් මල සභාවේ ලාංඡනය විය යුතුය.

(2) කිසිදු තැනැත්තකු සභාවේ අවසරය නොමැතිව සභාවේ ලාංඡනය භාවිතා කිරීම නොකළ යුතුය.

(3) සභාවේ අවසරය නොමැතිව සභාවේ ලාංඡනය භාවිත කරන තැනහොත් තුන්වන පාර්ශවයක් නොමඟ යවනු ලැබීමට හෝ ව්‍යාකුලත්වයට පත් කරනු ලැබීමට හැකිවන ලෙස සභාවේ

ලාංඡනයට බෙහෙවින් සම්පස්ථව නියෝජනය කෙරෙන ලාංඡනයක් හෝ ලකුණක් භාවිතා කරන යම් තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

X වන කොටස

සාමාන්‍ය කරුණු

54 (1) (අ) සභාව විසින් මෙම පනත යටත්‍ත හෝ ඒ යටතේ නිකුත් කරනු ලබන යම් නියමයක් යටතේ ස්ද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එයට විරුද්ධව හෝ, සභාව වෙනුවෙන් සද්භාවයෙන් කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව

(ආ) සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනු යෝජිතයකු මෙම පනත යටතේ හෝ ඒ යටතේ නිකුත් කරනු ලබන යම් නියමයක් යටතේ හෝ සභාවේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට, හෝ අනුයෝජිකයකුට විරුද්ධව හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුත්තේය.

(2) සභාව විසත් හෝ ඊට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියට ගෙන එනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී දරන ලද යම් වියදමක් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර යම් සිවිල් නඩුවකදී හෝ අපරාධ නඩුවකදී සභාවට ගෙවන ලද හෝ සභාව විසින් අය කරනු ලබන යම් ගාස්තු සභාවේ අරමුදලට බැරකළ යුතුය.

55 සභාවට විරුද්ධව ගෙනනු ලබන යම් නඩුවකදී සභාවේ යම් සාමාජිකයකුට එරෙහිව ශරියට හෝ දේපළවලට එරෙහිව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතුය.

56 සභාව විසින් නිකුත් කරන ලද්දේයයි උද්දේශිතවූද, මෙම පනතින් නියම කර ඇති පරිදි මුද්‍රා තබනු ලැබිය යුතු හෝ සභාව විසින් හෝ සභාව වෙනුවෙන් අත්සන් කරනු ලැබිය යුතු වූද සෑම සාධන පත්‍රයක්ම සාක්ෂි වශයෙන් භාරගත යුතු අතර ඊට පටහැනිව යමක් ඉදිරිපත් කරන තුරු තවදුරටත් සාක්ෂියක් නොමැති සාධන පත්‍රයක් ලෙස සැලකිය යුතුය.

57 සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උප ලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතුය.

58 සභාව විසින් හෝ සභාව විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ සංචාරක හෝ වෙනත් යෝජනා ක්‍රම එම තැනැත්තාගේ දැනුම අනුව සකස් කිරීමට සභාවට හැකිවනු පිණිස අවශ්‍ය විය හැකි සියලු කාරණාවලට අදාළ සියලු වාර්තා හෝ තොරතුරු දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් තුළදී සභාව වෙත හෝ තත් කාර්යය සඳහා බලය දෙන ලද තැනැත්තා වෙත සපයන ලෙස යම් තැනැත්තකුට දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකිය.

59 මෙම පනත යටතේ සභාව වෙත පැවරී ඇති හෝ පනවූ ලැබ ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්ය ඉටු කිරීමේ කාර්යය සඳහා සභාව විසින් හෝ සභාව විසින් බලය දෙනලද යම් තැනැත්තකු විසින් ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමකට හෝ ඉදිකිරීමක් තුළට ඇතුල් විය හැකි අතර යම් එවැනි කාර්යයක් සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ පරීක්ෂාකර බැලීම්, සමීක්ෂණ, විභාග කර බැලීම් හෝ පරීක්ෂණ කරනු ලැබිය හැකිය.

60 (1) මෙම පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක් යටත්ත යම් තැනැත්තකු වෙත භාරදිය යුතු බවට නියම කෙරෙන යම් දැන්වීමක්, නියමයක්, සාධන පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක්,

(අ) ඒ තැනැත්තා වෙත ගොස් භාරදීමෙන්, හෝ

(ආ) ඒ තැනැත්තා සාමාන්‍යයෙන් සිටින හෝ ඒතැනැත්තා අන්තිමට පදිංචිව සිටි ස්ථානය ලෙස දන්නා ස්ථානයක් නැතහොත් සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක ඒ සංස්ථාපිත මණ්ඩලයේ ලියාපදිංචි කළ කාර්යාලයෙහි තැබීමෙන්, හෝ

(ඇ) ඒ තැනැත්තා සාමාන්‍යයෙන් සිටින හෝ ඔහු අන්තිමට පදිංචිව සිටි ස්ථානය ලෙස දන්නා ස්ථානයෙහි සිටින තැනැත්තාට නැතහොත් සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක ඒ සංස්ථාපිත මණ්ඩලයේ ලියාපදිංචි කළ කාර්යාලයට හෝ භාරදෙනු ලැබිය හැකිය.

(2) (1) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව භාරදෙන ලද යම් ලේඛනයක් එහි ලිපිනය ලියා ඇත්තේ කවරෙකු වෙතද ඒ තැනැත්තා වෙත නිසි ලෙස භාරදුන් ලෙස සැලකිය යුතුය.

61 යම් පළාත් පාලන සභාවක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් (සංස්ථාගත හෝ සංසථාගත නොකළ) විසින්, යම් ලිඛිත නීතියක හෝ එහි කාර්යයන් වලට අදාළ සාධන පත්‍රයක හෝ පටහැනිව කුමක් සඳහන් වුවද සභාවේ බලතල, කර්තව්‍ය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා අවශ්‍ය

ගිවිසුම්වලට එළඹීම සඳහා පුද්ගල මණ්ඩල සතු බලතල

විය හැකි සියලුම ගිවිසුම්වලට එළඹීම හෝ සභාව සමඟ එම ගිවිසුම් ඉටු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

සභාව විසින් හෝ සභාව වෙනුවෙන් ඇති කරගනු ලබන ගිවිසුම්.

62 (1) සභාව වෙනුවෙන් ඇති කරගනු ලබන ගිවිසුම් පහත සඳහන් පරිදි ඇති කරගනු ලැබිය හැකිය.

(අ) පෞද්ගලික තැන්පතු සමඟ ඇති කරගනු ලබන ගිවිසුමක් ලියවිල්ලකින් තිබිය යුතු බව නීතියෙන් නියම කර ඇත්තම් එම ගිවිසුම සභාව වෙනුවෙන් ලියවිල්ලකින් ඇති කරගත යුතුය.

(ආ) පෞද්ගලික තැනැත්තන් සමඟ ඇති කරගනු ලබන ගිවිසුම් ලියවිල්ලකින් තිබිය යුතු බව හා එහි වගකීම දැරිය යුතු තෙවන පාර්ශවයක් විසින් අත්සන් කළ යුතු බව නීතියෙන් නියම කර ඇත්තම් එම ගිවිසුම සභාව වෙනුවෙන් ලියවිල්ලකින් ඇති කරගනු ලැබිය හැකි අතර. මෙහි මින්මතු විධිවිධාන සලසනු ලබන පරිදි ඒ සඳහා නිසි ලෙස බලයදී ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් එයට අත්සන් තැබිය යුතුය.

(2) මෙම වගන්තිය අනුව ඇති කරගනු ලබන ගිවිසුමක් මෙම වගන්තිය මගින් එම ගිවිසුම ඇති කරගැනීමට බලය දී ඇති ආකාරයෙන්ම අත්හැර දැමීම හෝ අහෝසි කිරීම හෝ කරනු ලැබිය හැකිය.

ඇතැම් ක්‍රියා හෝ ඇතැම් වචන භාවිතා කිරීම තහනම් කිරීම.

63 (1) යම් සංචාරක සේවාවක සේවයේ යෙදවීම සඳහා යෝග්‍ය සහ සුදුසු බවට මෙම පනත යටතේ සභාව විසින් ලියාපදිංචි කර නොමැති යම් තැනැත්තකු විසින්.

(අ) යම් නාමයක්, අභිධානයක්, එකතුවක් හෝ විස්තරයක් භාවිතා කිරීම හෝ,

(ආ) අවස්ථාවෝචිතව යම් සේවාවක් සභාව විසින් ලියාපදිංචි කර හෝ අනුමත කර ඇත්නම් මිස සභාව විසින් එම සේවාව ලියාපදිංචි කර හෝ අනුමත කර ඇති බව හඟවන හෝ හැඟවීමට අපේක්ෂා කරනු ලබන හෝ එසේ හැඟීමක් ඇති කරන හෝ හැඟීමක් ඇති කිරීමට අපේක්ෂා කරනු ලබන යම් ක්‍රියාවක හෝ යම් කිසිවක් සිදු කිරීම හෝ නොකළ යුතුය.

(2) අමාත්‍යවරයා විසින් සභාවේ උපදෙස් ඇතිව කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් පනතේ යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග සෑදීමට ඇති බලතල

(3) මෙම පනතින් හෝ ඒ යටතේ සාදන යම් නියෝගයකින් රීති සාදනු ලැබිය යුතු බවට බලයදී ඇති හෝ නියම කර ඇති සියලුම කරුණු හෝ කිසියම් කරුණක් සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකිය.

(4) සභාව විසින් මෙම පනත යටතේ සාදනු ලබන කිසිදු රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු ක්‍රියාත්මක නොවිය යුතුය.

64 (1) මෙම පනතින් රීති සාදනු ලැබිය යුතු බවට බලයදී ඇති හෝ නියම කර ඇති සියලුම කරුණු හෝ කිසියම් කරුණක් සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකිය. රීති සෑදීමට ඇති බලතල

(2) සභාව විසින් මෙම පනත යටතේ සාදනු ලබන කිසිදු රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු ක්‍රියාත්මක නොවිය යුතුය.

65 (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින්, සංචාරකයන් වෙනුවෙන් සංචාරක චාරිකා හෝ නවාතැන් පහසුකම් හෝ ආහාර පාන හෝ විනෝද ක්‍රීඩා හෝ ක්‍රීඩා හෝ අනෙකුත් පහසුකම් සළසන හෝ සැලසීමට අදහස් කර ඇති හෝ සැලකිය හැකි සේවාවක් වශයෙන් නියෝගයෙන් නිශ්චිතව සඳහන් වන යම් පංතියකට හෝ විස්තරයකට අයත් යම් සේවාවක් මෙම පනතේ කාර්යයන් සඳහා සංචාරක සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් නියෝගයෙහි නිශ්චිතව සඳහන් වන යම් තැනැත්තකුට යම් තානායමක පාලනය පැවරීම සහ පවරාදීම හෝ කරනු ලැබිය හැකිය.

(3) මෙම වගන්තියේ මීට ඉහතින් දැක්වෙන විධිවිධාන යටත්ත කරනු ලබන සෑම නියමයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරන දිනයේදී හෝ එහි නිශ්චිත ලෙස දක්වා ඇති පසු දිනකදී ක්‍රියාත්මක විය යුතුය.

(4) මෙම වගන්තියේ මීට ඉහතින් දැක්වෙන විධිවිධාන යටතේ කරනු ලබන සෑම නියමයක්ම මෙහි කලින් විධිවිධාන සලස්වා ඇති පරිදි එය ක්‍රියාත්මකවීම වලංගු විය යුතු අතර මෙහි පනවනු ලැබූ නියමයක් වශයෙන් එය ක්‍රියාත්මක විය යුතුය.

(5) (2) උපවගන්තිය යටතේ සාදනු ලබන කවර හෝ නියමයක්, තානායම් පනතේ හෝ ඒ පනත යටතේ සාදනු ලබන යම් නියෝගයකට පටහැනිව කුමක් සඳහන් වුවද ක්‍රියාත්මක විය යුතුය.

66 (1) (අ) මේ පනත යටතේ හෝ මේ පනතේ කාර්යයන් සඳහා හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියමයක් යටතේ සාදන ලද හෝ සපයනු ලබන යම් ඉල්ලීමක වාර්තාවක හෝ වෙනත් ලේඛනයක දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන්නාවූ, හෝ — වැරදි

(ආ) මෙම පනතින් හෝ මෙම පනත යටතේ සාදන ලද යම් නියමයක් යටතේ ඔහු විසින් සැපයිය යුතු යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නාවූ ප්‍රතික්ෂේප කරන්නාවූ හෝ

(ඇ) මේ පනතින් හෝ ඒ යටතේ නැතහොත් ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ එමගින් යම් තැනැත්තකු වෙත පැවරී ඇති හෝ පනවනු ලැබ ඇති යම් බලතල කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉටු කිරීමේදී ඒ තැනැත්තාට අවහිර හෝ බාධා කරන්නාවූ සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන්නේය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් යම් කරුණක් හෝ කිසියම් දෙයකට අදාල වන යම් විධිවිධානයක් හැර මෙම පනත යටතේ සාදනු — වැරදි සඳහා දඬුවම්

ලබන යම් නියමයක යම් විධිවිධානයක් උල්ලංඝනය කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන්නේය.

67 මේ පනත යටතේ වරදක්, වැරදි කරන්නාවූ සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට නොවැඩි කාලයක් බන්ධනාගාර ගත කිරීමට හෝ රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

68 සභාගමේ ලිඛිත අවසරය ඇතිව හැර මේ පනත යටතේ වූ වරදක් සඳහා කිසිදු අධිකරණයක නඩු පවරනු නොලැබිය යුතුය.

සභාවේ අනුමැතියකින් තොරව නඩු පැවරීම නොකළ යුතු බව

69 පුද්ගල මණ්ඩලයක් විසින මේ පනත යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක -

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි

(අ) ඒ පුද්ගල මණ්ඩලයට සංස්ථාගත මණ්ඩලයක් නම් ඒ සංස්ථාගත මණ්ඩ ලයේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකුම, හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකුම, ඒ වරද සඳහා ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා නැතහොත් ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරු විසින්, ඒ වරද ඔහුගේ දැනුමෙන් තොරව කර ඇති බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු

කරන්නේ නම් ඒ වරද සඳහා ඔහු වරදකරු ලෙස සලකනු නොලැබිය යුතුය.

70 (1) මේ පනත යටතේ වූ යම් වරදක් සඳහා අවසන් නොවූ නඩු කටයුත්තක් නොපවතින්නේ නම්, සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලක් චූදිතයා විසින් ගෙවීම මත සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විසින් ඒ වරද සමථයකට පත් කරනු ලැබිය හැකිය. නැතහොත් ඒ වරද සඳහා වූ නඩු කටයුත්තක් සත්‍ය වශයෙන්ම අවසන් නොවී පවතින්නේ නම් මහේස්ත්‍රාත්වරයා ගේ එකඟත්වය ඇතිව එසේ සමථයට පත් කිරීම සඳහා හේතු වාර්තාගත කිරීමෙන් පසු සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එලෙස සමථයට පත් කළ හැකිය.

(2) මෙම වගන්තිය යටතේ වරදක් සමථයට පත් කිරීමෙහි නිදොස් කිරීමක පතිඵලය ඇත්තේය.

(3) වරදක් සමථයකට පත් කිරීමේ කාර්යය සඳහා චූදිත තැනැත්තකු විසින් ගෙවනු ලබන මුදල් සභාවේ අරමුදලට බැර කළ යුතුය.

71 අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි යම් දිනක සිට ක්‍රියාත්මක වන පරිදි 1966 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනත සංශෝධිත පරිදි සහ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත සංශෝධිත පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ.

72 (1) පනතේ විධිවිධාන අනුව නිශ්චිත නියෝග සාදනු ලබන තෙක් සංශෝධිත 1968 අංක 14 දරන

අන්තර් කාලීන විධිවිධාන.

සංචාරක සංවර්ධන පනතේ තෙවැනි උප ලේඛනයේ, සිව්වැනි උප ලේඛනයේ, පස්වැනි උප ලේඛනයේ, හයවැනි උප ලේඛනයේ සහ හත්වැනි උප ලේඛනයේ විධිවිධාන සහ ඒ පනත යටතේ සාදනු ලැබ ඇති කිසියම් ව්‍යවස්ථා සංග්‍රහවල විධිවිධාන මෙම පනත යටතේ සළසා ඇති විධිවිධාන ලෙස ක්‍රියාත්මක විය යුතුය.

(2) සංශෝධන 1966 අංක 10 දරන සංචාරක මණ්ඩල පනතින් සහ සංශෝධිත 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ විධිවිධාන අනුව නිකුත් කර ඇති අවසර පත්‍ර සහ බලපත්‍ර මෙම පනත අනුව අලුතින් බලපත්‍ර නිකුත් කරන තුරු එහි සඳහන් කොන්දේසි, සීමාකිරීම් සහ සීමාවන්ට යටත්ව ක්‍රියාත්මක විය යුතුය.

72 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම පනතෙහි - අර්ථ නිරූපණය

"අරමුදල" යන්නෙන් සභාවේ අරමුදල අදහස් වේ. "පළාත් පාලන සභාව" යන්නට කවර හෝ මහනගර සභා, නගර සභා හෝ ප්‍රාදේශිය සභා ඇතුළත් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් ජනාධිපතිවරයා විසින් සංචාරක කටයුතු විෂයය හෝ කාර්යය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ.

"සංචාරකයා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින හෝ පදිංචිව නොසිටින තැනැත්තකු වුවද ශ්‍රී ලංකාවට, ශ්‍රී ලංකාවෙන් පිටත හෝ ශ්‍රී ලංකාව තුළ සංචාරයක යෙදෙන තැනැත්තකු අදහස් වේ.

"සංචාරක යෝජනා ක්‍රමය" යන්නෙන් මෙම පනතේ යටතේ මණ්ඩලය විසින් සකස් කරනු ලබන සංචාරක යෝජනා ක්‍රමයක් අදහස් වේ.

"සංචාරක සේවාව" යන්නෙන් මෙම පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියමයක් මගින් මෙම පනතේ කාර්යය සඳහා සංචාරක සේවාවක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ යම් පංතියකට හෝ විස්තරයකට අයත් සේවාවක් අදහස් වන අතර, සංචාරක සේවා යන යෙදුම ඒ අනුව කියවා තේරුම් ගත යුතුය. "සංචාරක චාරිකාව" යන්නෙන් ශ්‍රී ලංකාවට, ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකාවෙන් පිටත යෙදෙන සංචාරක චාරිකාව අදහස් වේ.

"ආයතනය" යන්නෙන් මෙම පනත අනුව පිහිටුවනු ලැබූ පුහුණු ආයතනය අදහස් වේ. "ප්‍රාදේශීය සභාව" යන්නෙන් මෙම පනතේ 12 වන වගන්තිය අනුව පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ.

"අන්සතු කිරීම" යන්නෙන් එහි ඇති ව්‍යාකරණානුකූල වෙනස සහ ඊට සම්බන්ධ වූ යෙදුම් සහිතව ඉඩමක් හෝ එහි අයිතිය කෙරෙහි බලපෑමක් ඇති කරන කවර හෝ ස්වභාවයක යම් ගනුදෙනුවක් අදහස් වන අතර එම ඉඩමට සම්බන්ධ හෝ අයත් වන සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාද ඊට ඇතුළත් වේ.

"වෙරළබඩ තීරය" යන්නෙන් වඩදිය සහ බාදිය ගලන වෙරළේ බෑවුම අතර ශ්‍රී ලංකා ද්වීපයේ වෙරළ අදහස් වේ.

"අන්සතු කිරීමේ සාධන පත්‍රය" යන්නෙන් ඉඩමක් අන්සතු කරනු ලබන යම් සාධන පත්‍රයක හෝ ලිපි ලේඛනයක්

අදහස් වන අතර ඊට දිමනා පත්‍රයක්, බැදුම්කර, ඉඩමට අදාළ වන අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් ඇතුළත් වේ.

"උප ලේඛනය" යන්නෙන් මෙම පනතේ උප ලේඛනය අදහස් වේ. "අනුමත ණය දෙන නියෝජිත ආයතනය" යන්නෙන් මුදල් නීති පනතේ විධිවිධානයේ අර්ථානුකූලව ඇති කිසියම් වාණිජ බැංකුවක් අදහස් වේ.

"තානායම" යන්නෙන් පොදු තානායමක් අදහස් වන අතර යම් තානායමකට අයත් යම් පරිශ්‍රයක් සහ කිසියම් අම්බලමක්, මඩමක් හෝ සංචාරකයක් සඳහා නවාතැන් පහසුකම් සලසන වෙනත් පොදු ගොඩනැගිලි එයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව පිහිටුවීම සඳහා ද, සංචාරක කටයුතු කර්මාන්තය හා වෙනත් ආශ්‍රිත කර්මාන්තවලට අදාළ ප්‍රතිපත්තිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය යම් බලතල එකී අධිකාරිය වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ප්‍රාදේශීය සංචාරක කමිටු පිහිටුවීම සඳහාද, කර්මාන්තය විධිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ජාතික රාජ්‍ය සභාවේ 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල නීතිය ඉවත් කිරීම හා 1968 අංක 14 දරන ලංකා සංචාරක පනතේ ඇතැම් විධිවිධාන ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

2004 දෙසැම්බර් මස

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව පිහිටුවීම සඳහා ද, සංචාරක කටයුතු කර්මාන්තය හා වෙනත් ආශ්‍රිත කර්මාන්තවලට අදාළ ප්‍රතිපත්තිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය යම් බලතල එකී අධිකාරිය වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ප්‍රාදේශීය සංචාරක කමිටු පිහිටුවීම සඳහාද, කර්මාන්තය විධිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ජාතික රාජ්‍ය සභාවේ 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල නීතිය ඉවත් කිරීම හා 1968 අංක 14 දරන ලංකා සංචාරක පනතේ ඇතැම් විධිවිධාන ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1 මෙම පනත 2003 අංක ... දරන සංචාරක කටයුතු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින්මතුවට "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතුය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

## 1 වන කොටස

### 1 වන පරිච්ඡේදය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව.

2 (1) මෙම පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතුය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව පිහිටුවීම

(2) සභාව (1) වන උපවගන්තිය මගින් ඊට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එය විසින් සහ එයට එරෙහිව ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකිය.

(3) සභාවේ මුද්‍රාව සභාව භාරයේ තැබිය යුතු අතර, සභාව විසින් නිශ්චිත කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය.

(4) සභාවේ මුද්‍රාව, සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් දෙදෙනකු ඉදිරියේදී, සභාව විසින් හෝ ඒ වෙනුවෙන් අත්සන් තබන ලද සියලු සාධන පත්‍රවල තැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් ඒ ලේඛනවලට අත්සන් තැබිය යුතුය.

3 සභාවේ පරමාර්ථ විය යුත්තේ සභාවේ පරමාර්ථ

(අ) ශ්‍රී ලංකාව, සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන්

(ආ) චාරිකා හා සංචාරක කර්මාන්තයට අදාළ කරුණු සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම.

(ඇ) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සහ ව්‍යාප්තිය සඳහා ද ශ්‍රී ලංකාවේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් තිරසාර ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා ද සමාජ සංවර්ධනය උදෙසා දායකත්වය ලබාදීම සඳහා ද චාරිකා හා සංචාරක අංශය වැඩිදියුණු කිරීම.

(ඈ) සත්කාරක සේවා පිළිබඳ කර්මාන්තය ද ඇතුළුව ප්‍රමාණවත්. ආකර්ශණීය සහ කාර්යක්ෂම සංචාරක සේවා සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම.

(ඉ) ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ සැලසුම් අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

(ඊ) සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්තවලට අදාළ ප්‍රමිති වැඩිදියුණු කිරීම, බලාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා සංචාරක ව්‍යවසායවලට බලපත්‍ර ලබාදීම හා කාලය ලබාදීම යි.

සභාවේ සංයුතිය.

4 සභාව. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) සභාවේ සභාපතිවරයා.

(ආ) 10 වන වගන්තිය යටතේ පත් කරනු ලබන (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා.

(ඇ) 23 වන වගන්තිය යටතේ ස්ථාපනය කරනු ලබන (මෙහි මින්මතු "කමිටු" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සංචාරක කටයුතු කමිටුවේ සභාපතිවරයා.

(ඈ) සංචාරක හෝටල් නියෝජනය කරනු ලබන සංගමයේ නිර්දේශය මත නම් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු

(ඉ) චාරිකා හා සංචාරක කටයුතු නියෝජනය කරනු ලබන සංගමයේ නිර්දේශ මත නම් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු

(ඊ) චාරිකා හා සංචාරක කටයුතු කර්මාන්තය සම්බන්ධයෙන් පිළිගැනීමක් ලබා ඇති පුද්ගලයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකු

5 (1) යම් තැනැත්තකු ඔහු - සභාවේ සාමාජිකත්වයට නුසුදුස්සකුවීම ආදිය.

(අ) යම් පත්තියක හෝ විස්තරයක සංචාරක සේවා මෙහෙයවන්නා වූ හෝ සපයන්නා වූ යම් ව්‍යාපාරයක අයිතිකරු, හවුල්කරු, අධ්‍යක්ෂ, බහුතර කොටස්කරු හෝ සේවා නියුක්තිකයෙකු වේ නම්.

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතන සභිකයෙකු වේ නම්.

(ඇ) චරිත දූෂණය හා සම්බන්ධ වරදකට වැරදිකරු වේ නම්.

(ඈ) සිහිවිකල් බව හෝ ශාරීරික අශක්තුතාවකට පාත්‍ර වී ඇත්නම්.

(ඉ) බංකොලොත් භාවයට හෝ වස්තු භංගත්වයට පත්වී, එම තත්වයෙන් නිදහස් වී නොමැති නම් හෝ.

(ඊ) පූර්ණ දැනුම් දීමකින් තොරව සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණ සිට ඇත්නම්.

ඒ තැනැත්තා සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ සාමාජිකයෙකු වශයෙන් නොකඩවා සිටීමට නුසුදුස්සෙකු වන්නේය. එසේ වුවද 4 වැනි වගන්තියේ (ඈ), (ඉ) හා (ඊ) ජේද ප්‍රකාර පත් කරන ලද සාමාජිකයෙකු සම්බන්ධයෙන් (අ) ජේදයේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(2) සභාවේ පත් කරන ලද සැම සාමාජිකයෙකුම මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, එම ධුරයට ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක

කාලපරිච්ඡේදයක් සඳහා ධූරය දැරිය යුතු අතර නැවත පත්කිරීම සඳහා සුදුස්සෙකු විය යුතුය.

(3) සභාවේ සාමාජිකයෙකුට අමාත්‍යවරයා අමතා තත් කාර්යය සඳහා යවනු ලබන ලිපියක් මගින් කවර විටෙක වුවද ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(4) සභාවේ පත්කරන ලද සෑම සාමාජිකයෙකුම මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධූරය අත්හරනු ලැබුවහොත් මිස, එම ධූරයට ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් සඳහා ධූරය දැරිය යුතු අතර නැවත පත්කිරීම සඳහා සුදුස්සෙකු විය යුතුය.

එසේ වුවද 4 වැනි වගන්තියේ (ඇ) සහ (ඈ) පරිජ්ඡේද ප්‍රකාර පත් කරන ලද සාමාජිකයෙකු නැවත පත්කිරීම සඳහා සුදුස්සෙකු නොවිය යුතුය.

(5) 4 වන වගන්තියේ (ඈ) සහ (ඉ) පරිච්ඡේද යටතේ පත් කරනු ලැබූ සාමාජිකයෙකුට යම් පත්තියක හෝ විස්තරයක සංචාරක සේවා මෙහෙයවන්නා වූ හෝ සපයන්නා වූ යම් ව්‍යාපාරයක අයිතිකරු, හවුල්කරු, අධ්‍යක්ෂ, බහුතර කොටස්කරු හෝ සේවා නියුක්තිකයෙකු වේ නම්, ඔහු එම සම්බන්ධතාවය හෙළිදරව් කළ යුතු අතර ඒ සම්බන්ධතාවට අදාල යම් කරුණක් පිළිබඳ සභාවේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට එම සාමාජිකයා සහභාගී නොවිය යුතුය.

එසේ වුවද, අමාත්‍යවරයා විසින් සභාවට පත් කරන ලද යම් සාමාජිකයෙකුට තමා වෙත මෙම කොටසේ සඳහන් කාරණා සම්බන්ධයෙන් තොරතුරු ලබාදෙන ලෙස නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(6) සභාව විසින් ඇතුළත් වී ඇත්තාවූ හෝ ඇතුළත්වීමට යෝජනා කරනු ලැබ ඇත්තාවූ කොන්ත්‍රාත්තුවකට යම් ලෙසකින් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධ වූ සභාවේ සාමාජිකයෙකු විසින්, සභාවේ යම් රැස්වීමක දී ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, ඒ හෙළිදරව් කිරීම සභාවේ වාර්තාවල සටහන් කළයුතු ය. ඒ සම්බන්ධතාවට අදාළ යම් කරුණක් පිළිබඳ සභාවේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගී නොවිය යුතුය.

(7) සභාවේ කිසිම ක්‍රියාවක් හෝ තීති කෘත්‍යයක් එහි සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයෙකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීම හේතුකොට ගෙන පමණක් නිර්බල වූ ලෙස නොසැලකිය යුතුය.

(8) සභාවේ කළමනාකරණ අධ්‍යක්ෂ හැර කිසියම් සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කිරීම යෝග්‍ය වන්නේ නම් අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු දැක්වීමක් නොකර එසේ ඉවත් කරනු ලැබිය හැකිය.

(9) සභාපතිවරයා, කළමනාකාර අධ්‍යක්ෂවරයා හෝ පත් කරන ලද සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය. ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ දින පටන්, එය බලාත්මක විය යුතුය.

(10) සභාපතිවරයා හෝ යම් පත් කරන ලද සාමාජිකයෙකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම සිදුවූ විටෙක, අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා අනුප්‍රාප්තවීම සඳහා අමාත්‍යවරයා විසින් වෙන තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලැබූ තැනැත්තා විසින්, තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවූ කොටස සඳහා දැරිය යුතුය.

(11) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හෝ වෙනත් යම් හේතුවක් නිසා, ස්වකීය ධූරයේ කාර්ය කරගෙන යාමට සභාපතිවරයාට හෝ යම් පත් කරන ලද සාමාජිකයෙකුට තාවකාලිකව නොහැකි හා අවස්ථාවක, සභාපතිවරයා හෝ සාමාජිකයා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා, අමාත්‍යවරයා විසින් යම් තැනැත්තෙකු පත්කරනු ලැබිය හැකිය.

6 (1) සභාව විසින්, — දිගු කාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්ම පිළියෙල කිරීම සහ අනුමත කිරීම.

(අ) ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු සංවර්ධනය කිරීම සඳහා යෝජිත දිගුකාලීන ඉලක්ක.

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත සංචාරක කටයුතු සංවර්ධනය කිරීම සඳහා යෝජිත සිව් අවුරුදු සැලැස්ම.

ක්‍රමවත්ව සකස් කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

(2) පළමුවන උප වගන්තිය යටතේ වූ දඅගුකාලීන ඉලක්කහා සිව් අවුරුදු සැලැස්ම ලැබුනු විට, අමාත්‍යවරයා විසින් එය අනුමතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. අමාත්‍ය මණ්ඩලය විසින් දිගු කාලීන ඉලක්ක හා සිව් අවුරුදු සැලැස්ම සංශෝධන සහිතව හෝ රහිතව අනුමත කරනු ලැබිය හැකිය. දිගුකාලීන ඉලක්ක හා සිව් අවුරුදු සැලැස්ම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු අමාත්‍යවරයා විසින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා කටයුතු සැලැස්විය යුතුය.

7 (1) සභාවේ සභාපතිවරයා විසින් සභාවේ සියලු රැස්වීම්වල මූලසුන දැරිය යුතුය. රවැනි යම් රැස්වීමක දී සභාපතිවරයා නොපැමිණි විටෙක පැමිණි සාමාජිකයින් විසින් තෝරාගනු ලැබූ යම් සාමාජිකයෙකු විසින් එම රැස්වීමේ මූලසුන දැරිය යුතුය. රැස්වීම් ආදිය

(2) සභාපතිවරයාට හෝ යම් රැස්වීමක මූලසුන දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතුය.

(3) සභාවේ යම් රැස්වීමක සතපූර්ණය, සභාව විසින් අන්‍යාකාරයකින් එකඟවන්නේ නම් මිස, සාමාජිකයින් පස් දෙනෙක් විය යුතුය.

(4) සභාවේ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා සහ ඒ රැස්වීම්වලදී කටයුතු කරගෙන යාම සඳහා අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකිය.

8 සභාවේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ පිහිටුවනු ලැබිය යුතුය. කෙසේ වුවද, මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත ශාඛා කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා හැකිය. සභාවේ ප්‍රධාන කාර්යාලය.

9 (1) සභාව විසින්, මෙම පනතින් හෝ වෙන යම් ලිඛිතනීතියක් මගින් එය වෙත පිරිනමා ඇති හෝ පවරා ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ලම හෝ ඒ අතුරෙන් කිසිවක් සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකිය. එවැනි පැවරීමක් කර ඇත්තේ වුවද, එසේ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම, සභාව විසින් නොකඩවා කරනු ලැබිය හැකිය. සභාවේ බලතල පැවරීම.

(2) (1) වන උප වගන්තිය ප්‍රකාර, තමා වෙත පිරිනමන ලද හෝ භාර කරන ලද බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී, ඉටු කිරීමේදී හා කිරීමේ දී, සභාවේ සාමාන්‍ය හා විශේෂ විධානවලට සභාපතිවරයා යටත් විය යුතුය.

10 (1) සභාවේ උපදේශය මත, සභාවේ ප්‍රධාන විධායක නිලධාරයා විය යුතු තැනැත්තෙක් කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය. කළමනාකාර අධ්‍යක්ෂවරයා පත් කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, නියම කරනු ලැබ ඇති පරිදි විය යුතුය.

කළමනාකාර අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු බව.

(2) සභාව විසින් ලියවිල්ලකින් ප්‍රකාශිත කරුණු සම්බනධයෙන් කරන ලද ඉල්ලීමක් මත, අවශ්‍ය පරිදි කරන ලද පරීක්ෂණයකින් පසුව දක්වනු ලබන හේතු මත අමාත්‍යවරයා විසින් කළමනාකාර අද්‍යක්ෂවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. එවිට, කළමනාකරණ අධ්‍යක්ෂවරයා ධූරය අත්හැර ගිය ලෙසින් සලකනු ලැබිය යුතුය.

(3) සභාපතිවරයාගේ යෝජනාවක් මත අවශ්‍යයැයි සලකනු ලබන යම් බලයක් හෝ කර්තව්‍යයක් සභාව විසින් කළමනාකාර අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකිය. කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින්, ඒ සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකි සභාවේ රීතිවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතුය.

(4) කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් තමා කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් එම ධූරයට පත් කරනු ලැබූ දින පටන් අවුරුදු පහක කාලයක් සඳහා ධූරය දැරිය යුතු ය.

11 (1) ප්‍රාදේශීය සංචාරක කමිටුවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම වගබලා ගැනීම පිණිස සභාපතිවරයා වගකිව යුතුය.

සභාපතිවරයාගේ බලතල

(2) සභාපතිවරයා සභාවේ සියලු රැස්වීම්වල මූලසුන දැරිය යුතු අතර, ඔහු නොපැමිණි විටදී පැමිණි සාමාජිකයින් විසින් තෝරාගනු ලබන යම් සාමාජිකයෙකු රැස්වීමේ මූලසුන දැරිය යුතුය.

12 අධිකාරිය විසින්, පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය සියල්ලම හෝ ඒ අතුරෙන් යමක් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය හැකිය. සභාවේ බලතල හා කර්තව්‍ය.

(අ) අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව සංචාරක හෝ චාරිකා කර්මාන්තයට සම්බන්ධ ව්‍යාපාර කටයුතු කිරීම සඳහා ආණ්ඩුවේ නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම.

(ආ) ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් සැලසීමෙහි නිරතවීම, ඊට සහය වීම හෝ එය ප්‍රවර්ධනය කිරීම හා ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් සංවර්ධනය කිරීම.

(ඇ) සංචාරකයින් සඳහා එවැනි සේවා සපයනු ලබන ව්‍යවසායන්හි කටයුතු සම්බන්ධීකරණය කිරීම.

(ඈ) සංචාරක කටයුතු හා චාරිකා කර්මාන්තයේ යෙදෙන විවිධ ව්‍යවසායන් විසින් පවත්වාගෙන යා යුතු ප්‍රමිති නියම කිරීම, විධිමත් කිරීම, පවත්වාගෙන යාම හා බලාත්මක කිරීම.

(ඉ) සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු නිර්ණායක මත විවිධ ව්‍යවසායවලට බලපත්‍ර දීම හා ඊට අදාළවන නියමයන් හා කොන්දේසි නියම කිරීම.

(ඊ) යම් වංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම, කුලියට ගැනීම, ඔඩපනය කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම, එසේ වුවද, නිශ්චල දේපළ බැහැර කිරීම අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව පමණක් කරන ලැබිය හැකිය.

(උ) එහි කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීමේ අවශ්‍යතාවය උද්ගතවන කවර විටක දී වුවද, දේශීය හා විදේශීය උපදේශකයින් ඒ සඳහා යෙදවීම.

(ඌ) උපකාරක කර්මාන්ත හා සේවා සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ඒට සහය දීම.

(එ) පනතේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා සමාගම් හෝ වෙනත් මණ්ඩල පිහිටුවීම.

(ඒ) පනතේ නිශ්චිතව සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම.

(ඔ) අමාත්‍යවරයාගේ අනුමතයයි ඇතිව, අයිරා මගින්, ණය වශයෙන් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලයේ කාර්යන් සඳහා මුදල් ණයට ගැනීම.

(ඕ) සභාව විසින් සපයනු ලබන සේවා, පහසුකම් හෝ උපකරණ සඳහා බදු සහ වෙනත් ගාස්තු අය කිරීම.

(ක) මෙම පනත යටතේ හෝ මේ පනත මගින් සභාව සතුකර ඇති, සභාව වෙත පවරා ඇති හෝ අභිනියෝජනය කර ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම,

සහ

(ග) මෙම පනත යටතේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ කිරීමට අවශ්‍යවන හෝ හිතකරවන වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

13 පහත දැක්වෙන දේ කිරීම සභාවේ කාර්යය වන්නේය. සභාවේ විශේෂ කාර්ය

(අ) අමාත්‍යවරයාගේ ඉල්ලීමක් මත හෝ සභාවේ මෙහෙයවීමෙන් සංචාරක හා චාරිකා කර්මාන්තයට අදාල සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම.

(ආ) ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු පිළිබඳව සංචාරක හා චාරිකා කර්මාන්තය සහ වෙනත් ආශ්‍රිත ව්‍යවසායවලට උපදෙස් දීම.

(ඇ) සංචාරක නිකේතන හා සංචාරක සේවා පිහිටුවීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම හා පාලනය කිරීම සහ ඒවායේ හෝ ඒවා හා සම්බන්ධ සේවයේ නියුක්ත තැනැත්තන් පිළිබඳව වූ යෝජනා ක්‍රම පිළියෙල කර, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

(ඈ) අමාත්‍යවරයාගේ මගපෙන්වීම සඳහා ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වූ යෝජනා ක්‍රමවත් ලෙස සකස් කිරීම.

14 අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් අනුපාතවලට අනුව හා යම් ආකාරයකට සහ යම් සේවා නියමයන් හා කොන්දේසිවලට යටත්ව, සභාවේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතුය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමික සහ සේවා නියම හා කොන්දේසි

15 (1) පනත යටතේ සභාව හා කමිටු වෙත පවරනු ලැබ ඇති බලතල, කර්තව්‍ය හා කාර්ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සභාව සලකනු ලබන යම් නිලධරයන් හා සේවකයින් සභාවේ සහ 23 වැනි වගන්තිය යටතේ ස්ථාපනය කරනු ලබන කමිටුවල කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකිය. සභාවේ කාර්ය මණ්ඩලය

(2) ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වූ අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානවලට යටත්ව, සභාව විසින්, -

(අ) සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම, සේවයෙන් පහ කිරීම හා ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය කිරීම,

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නිශ්චය කිරීම,

(ඇ) ඒකාර්ය මණ්ඩලයේ සේවා නියමයන් හා කොන්දේසි නිශ්චය කරීම,

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත පිණිස සේවක අර්ථසාධක අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ විධිමත් කිරීම සහ එම අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායකත්වය ලබාදීම.

(ඉ) කමිටු විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත සභාව විසින්, කමිටුවල කාර්ය මණ්ඩලය සඳහා සභාව අවශ්‍යයැයි සලකනු ලබන යම් නිලධරයන් හා සේවකයින් පත් කරනු ලැබිය හැකිය.

16 (1) සභාවේ සහ කමිටුවල කටයුතු නිසි ලෙස හා කාර්යක්‍ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් දෙපාර්තමේන්තු සභාව විසින් පිහිටුවා පවත්වාගෙන යා හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහටුවන ලද එක් එක් දෙපාර්තමේන්තුවට පැවරිය යුතු කාර්ය හා කර්තව්‍ය සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතුය.

(3) සභාවේ කටයුතු ඉටු කිරීමේදී එයට සහයවීම සඳහා එහි සාමාජිකයන්ගෙන් හෝ වෙනත් යම් තානැත්තන්ගෙන් සමන්විත කමිටු සංඛ්‍යාවක් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සභාව විසින් පත් කරනු ලැබිය හැකිය. එම කමිටු සියලු අවස්ථාවන්හිදීම සභාවේ සාමාජිකයෙකුගේ ප්‍රධානත්වයෙන් විය යුතුය.

(4) සභාව විසින්, ඒ කමිටුවල කර්තව්‍ය දක්වමින් රීති සාදනු ලැබිය හැකිය.

17 (1) රීති සෑදිය යුතු යැයි බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් සභාව වෙත සතු කරනු ලැබ ඇත්තාවූ හෝ පවරනු ලැබ ඇත්තාවූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හා ඉටු කිරීමට අදාළ රීති සභාව විසින් සාදනු ලැබිය හැකිය. රීති සෑදීම සඳහා සභාව සතු බලතල.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතුය.

18 (1) අමාත්‍යවරයා විසින් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීමට අදාළව පනතේ විධිවිධානවලට අනනුකූල නොවන පොදු ප්‍රතිපත්තිමය විධාන සභාව විමසා, සභාව වෙත නිකුත් කරනු ලැබිය හැකිය.

සභාව, අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු බව.

(2) අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන එවැනි යම් විධාන, සභාව විසින් බලාත්මක කරනු ලැබිය යුතුය.

(3) සභාවේ කටයුතු හා දේපළවලට අදාළව, අමාත්‍යවරයාට කලින් කල අවශ්‍ය විය හැකි යම් තොරතුරු ද සභාව විසින් අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය යුතුය.

19 (1) සභාවේ සාමාන්‍ය මූල්‍ය කටයුතු සඳහා අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය. අරමුදලට

සභාවේ අරමුදල

(අ) සභාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් කරනු ලබන ප්‍රදාන,

(ආ) මෙම පනතේ විධිවිධාන යටතේ හෝ මේ පනත මගින් හෝ ඒ යටතේ සභාව වෙත පවරන ලද යම් බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේදී හෝ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන අතුරු ව්‍යවස්ථා හෝ රීති

යටතේ සභාව විසින් අයකරනු ලබන සියලු බදු, ගාස්තු, අයකිරීම් සහ අඩ මුදල්.

(ඇ) සභාව වෙත පැවරුනු හෝ එය විසින් පරිපාලනය කරනු ලබන යම් දේපළකින් සභාවට ලැබෙන සියලු ආදායම්.

(ඇ) සභාව විසින් සහ කමිටු විසින් සපයනු ලබන සේවාවන්ගෙන් සභාවට ලැබෙන සියලු ආදායම් සහ.

(ඉ) සභාව විසින් හෝ සභාව වෙනුවෙන් යම් බලයලත් අනුයෝජිතයෙකු විසින් සපයනු ලබන සේවාවක් සඳහා සහ පනතෙහි ප්‍රකාශිත කාර්ය සඳහා සභාව විසින් දෙනු ලබන යම් සහතිකයක්, බලපත්‍රයක් හෝ අනුමතයක් සඳහා අයකිරීම් වශයෙන් ලැබෙන සියලු මුදල්.

(ඊ) සභාවේ බැරට අන්‍යාකාරයෙන් උපචිත වන වෙනත් සියලු මුදල් ප්‍රමාණ.

(2) අරමුදලින් යම් මුදල් ප්‍රමාණයක් ආපසු ගැනීම සඳහා, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සභාව විසින් රීති සාදනු ලැබිය යුතු අතර එම රීතිවලට අනුකූලව හැර, කිසිම මුදලක් අරමුදලින් ආපසු නොගත යුතුය.

20 (1) සභාව විසින්, එහි වත්කම් හා බැරකම්, ආදායම හා වියදම සහ ආයතනයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමට කටයුතු සැලැස්විය යුතුය. ගිණුම් විගණනය

(2) ආයතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන අදාල විය යුතුය.

(3) (අ) යම් වර්ෂයක් සම්බන්ධයෙන් විගණකාධිපති වරයාගේ වාර්තාව ලැබුණු විට. සභාව විසින්. පනතේ පරමාර්ථ වැඩි දියුණු කිරීම සඳහා ගනු ලැබූ පියවර පිළිබඳ සවිස්තර වාර්තාවක් ඇතුලත් ආයතනයේ පරිපාලන කටයුතු පිළිබඳව වූ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාර්තාව. පහත දැක්වෙන ලේඛන සමඟ අමාත්‍යවරයා වෙත යැවීමට කටයුතු සැලැස්විය යුතුය.

i විගණකාධිපතිවරයාගේ වාර්තාව.

ii ශේෂ පත්‍රය. සහ

iii ලාභ හා අලාභ ගිණුම

(ආ) (අ) ජේදය යටතේ තමා වෙත එවන ලද වාර්තාවේ හා ලේඛනවල පිටපත් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට අමාත්‍යවරයා විසින් කටයුතු සැලැස්විය යුතුය.

(4) සභාවේ මුදල් වර්ෂය ලිත් වරෂය විය යුතුය.

(5) අවශ්‍ය යැයි විගණකාධිපතිවරයා විසින් සලකනු ලබන අවස්ථාවක. මේ වගන්තිය මගින් නියමිත වාර්තා හා ගිණුම් පිළියෙල කිරීමේ දී සහාය වීම සඳහා සුදුසුකම් ලත් ගණකාධිකාරිවරුන්ගේ සේවය ලබාගැනීමට සභාවට බලය ඇත්තේය.

මෙම වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම් ලත් ගණකාධිකාරිවරයා" යන්නට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ දී ඇති අර්ථයම ඇත්තේය.

21 සභාවේ සෑම සාමාජිකයෙකුම, නිලධරයෙකුම හා සේවකයෙකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එකී කාර්ය සඳහා රාජ්‍ය සේවකයෙකු වශයෙන් සලකනු ලැබිය යුතුය. සභාවේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

22 අල්ලස් පනතේ අර්ථානුකූලව සභාව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, ඒ අනුව තේරුම් ගත යුතුය. අල්ලස් පනතේ අර්ථානුකූලව සභාව උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු බව.

## ii වන පරිච්ඡේදය

ප්‍රාදේශීය සංචාරක කමිටු පිහිටුවීම.

23 සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථික වර්ධනය ඇති කිරීම පිණිස 2003 අංක .... දරන ආයෝජන මණ්ඩල පනතේ 27 වැනි වගන්තිය මගින් ස්ථාපිත සෑම ප්‍රදේශයක් සඳහා (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සංචාරක කමිටුවක් පිහිටුවනු ලැබිය යුතුය. ප්‍රාදේශීය සංචාරක කමිටු පිහිටුවීම.

24 (1) සෑම කමිටුවක්ම, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය. කමිටු ව්‍යවස්ථාව

(අ) සභාපතිවරයා,

(ආ) (මෙහි මින්මතු "අධ්‍යක්‍ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රදේශය සඳහා සංචාරක කටයුතු අධ්‍යක්‍ෂවරයෙකු

(ඇ) ප්‍රදේශයේ පිහිටි පළාත් සභාවේ සංචාරක කටයුතු පිළිබඳ විෂය භාර පළාත් සභා අමාත්‍යවරයාගේ නියෝජිතයෙකු

(ඇ) ප්‍රදේශය තුළ සංචාරක හෝ චාරිකා කර්මාන්තය හා සම්බන්ධ කටයුතුවල නියැලී සිටින එම ප්‍රදේශයේ ව්‍යවසායකයින් අතුරින් සාමජිකයන් දෙදෙනෙකු

(ඉ) ප්‍රදේශය තුළ චාරිකා හා සංචාරක කර්මාන්තය පිළිබඳව පිළිගැනීමක් ලබා ඇති තැනැත්තන් අතුරින් සාමාජිකයන් දෙදෙනෙකු

(2) 1 වන වගන්තියේ (ඇ) සහ (ඉ) පරිච්ඡේද යටතේ පත් කරනු ලැබූ සාමාජිකයෙකු යම් පන්තියක හෝ විස්තරයක සංචාරක සේවා මෙහෙයවන්නා වූ හෝ සපයන්නාවූ යම් ව්‍යාපාරයක අයිතිකරු, හවුල්කරු, අධ්‍යක්‍ෂ, බහුතර කොටස්කරු හෝ සේවා නියුක්තිකයෙකු වේ නම්, ඔහු එම සම්බන්ධතාවය හෙළිදරව් කළ යුතු අතර, ඒ සම්බන්ධතාවයට අදාළ යම් කරුණක් පිළිබඳ කමිටුවේ යම් සාකච්ජාවකට හෝ තීරණයකට සාමාජිකයා සහභාගී නොවිය යුතුය.

එසේ වුවද, අමාත්‍යවරයා විසින් කමිටුවට පත්

කරන ලද සාමාජිකයෙකුට තමාවෙත මෙම කොටසේ සඳහන් කාරණා සම්බන්ධයෙන් තොරතුරු ලබාදෙන ලෙස නියම කිරීම, නිත්‍යානුකූල විය යුතුය.

(3) කමිටුව විසින් ඇතුලත් වී ඇත්තා වූ හෝ ඇතුලත් වීමට යෝජනා කරනු ලැබ ඇත්තා වූ කොන්ත්‍රාත්තුවකට යම්ලෙසකින් කෙලින්ම හෝ අත්‍යාකාරයකින් සම්බන්ධ වූ සභාවේ සාමාජිකයෙකු විසින්, කමිටුවේ යම් රැස්වීමක දී ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, ඒ හෙළිදරව් කිරීම කමිටුවේ වාර්තාවල සටහන් කළ යුතුය. ඒ සම්බන්ධතාවට අදාළ යම් කරුණක් පිළිබඳ කමිටුවේ යම් සාකච්ඡාවකට ඒ සාමාජිකයා සහභාගී නොවිය යුතුය.

(4) 15 වැනි වගන්තිය යටතේ සභාව විසින්, අධ්‍යක්ෂ කාර්යාලයේ අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලය පත් කරනු ලැබිය යුතු ය.

(5) සෑම කමිටුවකම අධ්‍යක්ෂවරයා ඒ කමිටුවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු අතර කමිටුවේ විධානයට හා පාලනයට යටත්ව ඔහු විසින් ස්වකීය කාර්යයන් ඉටු කළ යුතුය.

(6) පනතේ විධිවිධාන කාර්යක්ෂම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන සභාව සතු යම් බලතල හෝ කර්තව්‍යන් සභාව විසින් කමිටුව වෙත පවරනු ලැබිය හැකිය. එවැනි පැවරීමක් කර ඇත්තේ වුවද, එසේ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හා

ඉටු කිරීම සභාව විසින් තොකඩවා කරනු ලැබිය හැකිය.

(7) සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම, කමිටුව විසින් ඒ අධ්‍යක්ෂවරයා වෙත පවරා දෙනු ලබන යම් බලතල ක්‍රියාත්මක කළ යුතුය. එසේ පැවරීමක් කර ඇත්තේ වුවද, එසේ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යක් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කමිටුව විසින් තොකඩවා කරනු ලැබිය හැකිය.

(8) 2003 අංක ... දරන ආයෝජන මණ්ඩල පනතේ 27 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන කොමිෂන් සභාව විසින්, චාරිකා හා සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ එහි කර්තව්‍යයන් ඉටු කිරීමේදී කමිටුව සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කිරීම හා ඉන් උපදෙස් ලබාගැනීම කළ යුතුය.

(9) කොමිෂන් සභාව විසින්, ප්‍රදේශයේ සංචාරක සංවර්ධනය සඳහා වන සිව් වසර සැලැස්ම සහ සංචාරක සංවර්ධනයට අදාළ යෝජනා ක්‍රමවල අනුකූලව කටයුතු කරනු ලැබිය යුතුය. සංචාරක සංවර්ධනය හා සම්බනධ කරුණු සාකච්ඡා කරන විට කොමිෂන් සභාවේ රැස්වීම්වලට සහභාගිවීම සඳහා අදාල ප්‍රදේශයේ කමිටුවේ සභාපතිවරයාට අයිතියක් තිබිය යුතුය. සභාපතිවරයාට ස්වකීය අදහස් ප්‍රකාශ කළ හැකි නමුත් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අයිතියක් නොතිබිය යුතුය.

(10) ප්‍රදේශයේ සංචාරක සංවර්ධනයට අදාළව කොමිෂන් සභාව සහ කමිටු අතර සම්බන්ධීකරණය ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස, අමාත්‍යවරයාගේ ද අනුමතිය ඇතිව, ආයෝජන මණ්ඩලයේ කර්තව්‍ය පවරා ඇති අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය යුතුය.

කමිටුවල කර්තව්‍ය විය යුත්තේ — කමිටුවල කර්තව්‍ය

25 (අ) සංචාරක සංවර්ධනය සඳහා වන සිව් වසර සැලැස්මට අනුකූලව අදාළ ප්‍රදේශය තුළ සංචාරක සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

(ආ) සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා, ප්‍රදේශයේ අලෙවිකරණය සහ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සංචාරක ප්‍රවර්ධන හා අලෙවිකරණ නියෝජිත ආයතනවලට උපදෙස් දීම.

(ඇ) සංචාරක සංවර්ධන කලාප, ජාතික නිවාඩු නිකේතන, සංචාරක ස්ථාන සහ සංචාරක කටයුතු සඳහා වන වෙනත් ප්‍රදේශ සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීමට

(ඈ) මෙම පනතේ විධිවිධානවලට අනුකූලව සංචාරක කටයුතු, ප්‍රවර්ධනය කිරීමේ හෝ යම් සංචාරක සේවාවක් මෙහෙයවීමේ හෝ පවත්වාගෙන යාමේ නිරත වී සිටින පළාත් සභා, පළාත් පාලන ආයතන, රජයේ දෙපාර්තමේන්තු සහ වෙනත් මණ්ඩලවලට සහාය ලබාදීම.

26 සෑම කමිටුවක් විසින්ම, එයට අයත් ප්‍රදේශය තුළ මෙම පනත ප්‍රකාර එයට ප්‍රදානය කර හෝ පවරනු ලැබ ඇති බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී හා ඉටුකිරීමේදී අදාල කමිටුව පිහිටා ඇති ප්‍රදේශය ඇතුලත්වන පලාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් විමසා කටයුතු කරනු ලැබිය යුතුය. මෙම වගන්තිය ප්‍රකාර සිදු කරනු ලබන ඒ සෑම උපදෙස් විමසීමක්ම එවැනි උපදෙස් විමසීමක් ආරම්භ කරන ලද දින සිට තුන් මසක කාල පරිච්ඡේදයක් ඇතුලත අවසන් කරනු ලැබිය යුතුය.

පලාත් සභාවෙන් කරුණු විමසා කමිටුව විසින් බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

27 කමිටුවේ අධ්‍යක්ෂ හැර සෙසු සාමාජිකයන් වර්ෂ තුනක කාල පරිච්ඡේදයක් සඳහා පත් කරනු ලැබිය යුතුය. සභාපතිවරයා ඔහු එම තනතුරට පත් වූ දා සිට වසර තුනක කාලපරිච්ඡේදයක් සඳහා එම ධූරය දැරිය යුතුය.

කමිටුවේ ධූර කාලය.

අමාත්‍යවරයා විසින් :-

(අ) යම් කමිටු සාමාජිකයෙකු (25 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඇ) පරිච්ඡේදය යටතේ පත් කරන ලද වෙනත් සාමාජිකයෙකු) හේතු දක්වා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඉවත් කරනු ලැබිය හැකි අතර, එවැනි ඉවත් කිරීමක් පිළිබඳව යම් උසාවියක දී ප්‍රශ්ණ නොකළ යුතුය.

(ආ) 25 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ඇ) පරිච්ඡේදය යටතේ පත්කර ඇති යම් සාමාජිකයෙකු, සංචාරක කටයුතු විෂය භාර පලාත් සභා අමාත්‍යවරයාගේ ඉල්ලීම මත ඉවත් කරනු ලැබිය යුතුය.

(3) උපවගන්ති (2) යටතේ අමාත්‍යවරයා විසින් නියමයක්කරනු ලැබ ඇති කමිටු සාමාජිකයෙකු ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිය ධූරය අත්හළ යුතුය.

(4) කමිටුවේ යම් සාමාජිකයෙකුට අමාත්‍යවරයා අමතා තත්කාර්ය සඳහා යවනු ලබන ලිපියක් මගින් කවර විටක වුවද ඉල්ලා අස්විය හැකි අතර, එවැනි ඉල්ලා අස්වීමක් අමාත්‍යවරයා විසින් භාරගත් පසු බලපැවැත් වේ.

(5) පුද්ගලයෙකු, තමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු වේ නම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුස්සෙකු වන්නේය.

(6) යම් කමිටු සාමාජිකයෙකු, මියයාම, ඉල්ලා අස්වීම හෝ මෙම පනතේ විධිවිධාන පිළිබඳව සලකාබලා අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබීම සිදුවූ විටෙක, එසේ මියගිය, ඉල්ලා අස්වූ හෝ ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට වෙන යම් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් සාමාජිකයෙකු හැටියට පත්කරනු ලැබිය හැකිය. එවැනි සාමාජිකයෙකු වෙනුවට පත් කරනු ලැබූ තැනැත්තා විසින්, තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවූ කොටස සඳහා ධූරය දැරිය යුතුය.

28 කමිටුවේ කිසිම ක්‍රියාවක් හෝ නීති කෘත්‍යයක් එහි සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි

පුරප්පාඩුවක් පැවතීම හේතු කොටගෙන ක්‍රියාවක් නිර්බල

සාමාජිකයෙකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීම හේතු කොටගෙන පමණක් නිර්බල වූ ලෙස නොසැලකිය යුතුය. නොවන බව.

29 (1) කමිටුවේ රැස්වීම් අවම වශයෙන් සෑම දෙමසකට වරක්වත් පැවැත්විය යුතුය. කමිටු රැස්වීම

(2) යම් කමිටු රැස්වීමක සතපුරණය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(3) කමිටුවේ යම් රැස්වීමක දී තිරණ ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම ප්‍රශ්ණ පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කල යුතුය. ඡන්ද සමානව ලැබුණ අවස්ථාවකදී මූලසුන දරන සාමාජිකයා විසින් තීරක ඡන්දය පාවිච්චි කරනු ලැබිය යුතුය.

(4) කමිටුවේ රැස්වීම්වලදී අනුගමනය කල යුතු කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා සහ ඒ රැස්වීම්වලදී කටයුතු කරගෙන යාම සඳහා, මෙම ව්‍යවස්ථාවේ පූර්වෝක්ත විධිවිධානවලට යටත්ව සභාව විසින් රීති සාදනු ලැබිය හැකිය.

30 අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව කමිටු සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කරනු ලැබිය යුතුය. කමිටු සාමාජිකයින්ගේ පාරිශ්‍රමික.

## iii පරිච්ඡේදය

සංචාරක කටයුතු පිළිබඳ ජාත්‍යන්තර උපදේශක කමිටුව.

31 (1) චාරිකා හා සංචාරක කර්මාන්තයට සම්බන්ධ කාරණා පිළිබඳව අමාත්‍යවරයාට සහ සභාවට උපදෙස් දීමේ කාර්ය සඳහා (මෙහි මින් මතු "උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංචාරක කටයුතු පිළිබඳ ජාත්‍යන්තර උපදේශක කමිටුව යනුවෙන් හැඳින්වෙන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතුය.

සංචාරක කටයුතු පිළිබඳ ජාත්‍යන්තර උපදේශක කමිටුව පිහිටුවීම.

(2) උපදේශක කමිටුව අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලෝක චාරිකා, සංචාරක කර්මාන්තය සහ වෙනත් අදාළ කර්මාන්ත හා සම්බනධ ජාත්‍යන්තර මට්ටමේ පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තන් පස් දෙනෙකුට නොඅඩු හා එකොළොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

(3) එම තැනැත්තන් අතරින් එක් තැනැත්තෙකු උපදේශකකමිටුවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතුය.

(4) චාරිකා හා සංචාරක කර්මාන්තයේ අනාගත ගමන් මාර්ග පිළිබඳ උපදෙස් දීම සහ ඒ පිළිබඳ සහ අමාත්‍යවරයා විසින් එයට යොමු කරනු ලබන යම් කාරණාවක් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම උපදේශක කමිටුවේ කාර්යය විය යුතුය.

(5) උපදේශක කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතුය. එසේ වුවද ඉල්ලා අස්වන හෝ අත්‍යාකාරයකින් ධුරය හිස්කරන සාමාජිකයෙකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයෙකු, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරි කාලය සඳහා ධුරය දැරිය යුතුය.

(6) උපදේශක කමිටුවේ කවර සාමාජිකයෙකු විසින් වුවද අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

## ii වන කොටස

## iv වන පරිච්ඡේදය

සංචාරක සංවර්ධන ප්‍රදේශ

32 33 වන වගන්තිය ප්‍රකාර ප්‍රකාශයට පත් කරන ලද යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් තුළ හා ඒ හා සම්බන්ධයෙන් සභාවට බලසීමාවක් තිබිය යුතුය. ප්‍රකාශිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් සභාවට බලසීමාවක් තිබිය යුතු බව.

33 (1) අමාත්‍යවරයා විසින්, සභාවේ නිර්දේශය මත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් (මෙහි මින්මතු "ප්‍රදේශයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ප්‍රදේශයක් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය. සංචාරක සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

(2) (1) වන වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුලත කරගෙන යා හැකි සංචාරක කටයුතු, වාණිජ හා වෙනත් කටයුතු

නියම කරමින් නියෝග සාදනු ලබිය හැකිය. ඒ කලාප ඇතුලත වූ පහසුකම් පිළිබඳ ලැයිස්තු හා සංචාරකයින්ගේ සිත් ඇදගන්නා ස්ථාන ලෙස හැඳින්විය හැකි ඓතිහාසික හෝ පාරිසරික රුචිය දනවන ස්ථාන ද එකී නියෝගවලට ඇතුලත් කල හැකිය.

34 (1) 33 වැනි වගන්තිය ප්‍රකාර පළ කරනු ලබන සෑම නියමයක්ම එසේ ප්‍රකාශිත ප්‍රදේශයේ හෝ ප්‍රදේශවල මායිම් සඳහන් විය යුතුය. සංචාරක සංවර්ධන ප්‍රදේශයකට ජාතික සංචාරක නිවාඩු නිකේතනයක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ සභාව විසින් පරිපාලනය කරනු ලබන වෙනත් යම් ප්‍රදේශයක් ඇතුලත් විය හැකිය. සංචාරක සංවර්ධන ප්‍රදේශවලට අදාලළ නියම.

(2) 33 වැනි වගන්තිය ප(කාර වූ සෑම නියමයක්ම අවුරුදු 10 ක කාලපරිච්ඡේදයක් සඳහා වලංගු විය යුතුය.

(3) සභාව විසින්, නියෝග මගින් -

(අ) 33 වැනි වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත ප්‍රදේශයක් ඇතුලත වූ යම් ප්‍රදේශයකට ප්‍රවේශවීම සඳහා අදාළ වූ කොන්දේසි සඳහන් කරනු ලැබිය හැකිය. කෙසේ වුවද ඒ නිගෙය්ග ප්‍රකාශයට පත් කරන අවස්ථාවේදී පැවැති පොදු පාරවල්, ප්‍රසිද්ධ ස්මාරක, වන්දනීය ස්ථාන, මහජන උද්‍යාන, රජයේ කාර්යාල, පාසල්, බෙහෙත් ශාලා සහ වෙනත් පොදු ස්ථාන හා ආණ්ඩුව පලාත් සභාවක් හෝ පලාත් පාලන ආයතනයක්

විසින් සපයනු ලබන පහසුකම් ද සම්බන්ධයෙන් ඒ නියෝග අදාළ නොවිය යුතුය.

(ආ) එකී පාලනය හෝ නිකේතනය තුළ තහනම් කිරීමට අවශ්‍ය වන්නාවූ වානිජ ක්‍රියාකාරකම් වර්ග සඳහන් කරනු ලැබිය හැකිය.

(ඇ) සිත් ඇදගන්නා භූමි දර්ශන හා විනෝදාශ්වාදය ලැබිය හැකි ස්ථානද ඇතුළුව, සංචාරකයින්ගේ භාවිතය සඳහා ප්‍රදේශයක් තුළ ඇති පහසුකම් හා භූමි දර්ශන පිළිබඳව සඳහන් කරනු ලැබිය හැකිය.

(4) සෑම කමිටුවක්ම 33 වැනි වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත ප්‍රදේශයේ හා ඊට අයත් ප්‍රදේශයේ පරිපාලනය හා කළමනාකරණය පිළිබඳව වග කිව යුතුය.

33 වැනි වගන්තිය යටතේ ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුළත රහස්‍ය භාවය රැකීම.

35 (1) 33 වැනි වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත ප්‍රදේශයක් ඇතුළත ඒ ප්‍රදේශයේ ඇති පහසුකම් වෙනත් යම් තැනැත්තෙකු භුක්ති විඳීමෙන් වලක්වන හෝ එසේ භුක්තිවිඳීම වැළකෙන යම් ආකාරයකින් ක්‍රියා කරන හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ පෞද්ගලිකත්වයට මැදිහත් වෙමින් යම් ක්‍රියාවක් කරන, නැතහොත් 34 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ සාදන ලද යම් නියෝගයක් කඩකරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, නඩු විභාගයකින්

පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(2) මේ කොටසේ කාර්ය සඳහා "පුද්ගලිකත්වය" යන්නට 33 වැනි වගන්තිය ප්‍රකාර සංචාරක සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුළත ඇත්තා වූ පරිසරය සහ පහසුකම් හා සේවා, සාධාරණ තැනැත්තෙකු විසින් වරදක් යැයි සලකනු ලැබිය හැකි අන්දමට ස්වකීය පුද්ගලික ජීවිතයට කෙරෙන බාහිර මැදිහත්වීම්වලින් තොරව තනිව භුක්ති විඳීමට ඔහුට ඉඩහැරීම සඳහා ඇති අයිතිය ඇතුලත් වේ.

(3) 33 වන වගන්තිය ප්‍රකාර ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විට සභාව විසින් කමිටුවෙන් උපදෙස් විමසා ග්‍රාමීය හා නගර නිර්මාණ ආඥාපනතේ (269 අධිකාරිය) 2, 4, 4(අ) හා 5(ආ) යන වගන්තිවල සඳහන් හා එකී පනත මගින් පිළිවෙලින් ජාතික භෞතික සැලසුම් සභාවට සහ ජාතික භෞතික සැලසුම් පිළිබඳව පිහිටුවා ඇති අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවට දැනට පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම නිත්‍යානුකූල වන්නේය. පූර්වෝක්ත වගන්තිය ප්‍රකාර බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමට පෙර මෙම වගන්තිය ප්‍රකාර සභාව විසින් ගනු ලැබ ඇති යම් තීරණ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතුය.

36 (1) 33 වැනි වගන්තිය ප්‍රකාර ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විටක, 1981 අංක 47 දරන

පාරිසරික පනත හා (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත යටතේ පාරිසරික සැලසුම් සහ පුරාවස්තු සුරැකීම සඳහා අවශ්‍ය සියලු බලතල, ප්‍රකාශිත ප්‍රදේශ ඇතුළත සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන තාක් ප්‍රමාණයට, අවුරුදු දහයක කාල පරිච්ඡේදයක් සඳහා සභාව වෙත පැවරිය යුතුය.

(2) පළමුවන උපවගන්තිය ප්‍රකාර සභාව වෙත බලය පවරනු ලැබ ඇත්තා වූ කාරණයක් සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් එහි නිර්දේශ නියමිත කාලයක් ඇතුළත සභාවට ඉදිරිපත් කළ යුතුය.

(3) (අ) 33 වැනි වගන්තිය ප්‍රකාර යම් ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විට 1981 අංක 37 දරන පාරිසරික පනතේ පටහැනිව කුමක් සඳහන් වූවද, ඒ ප්‍රදේශ ඇතුළත පාරිසරික සැලසුම් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නිර්ණායක නියම කිරීම සඳහා අමාත්‍යවරයා විසින් පරිසර විෂය භාර අමාත්‍යවරයා විමසා නියෝග සෑදීම නිත්‍යානුකූල වන්නේය. මේ සම්බන්ධයෙන්, මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා යම් නිර්දේශ ඉදිරිපත් කළ යුතු කාලය නියම කරන ලද පරිදි විය යුතුය.

(ආ) සභාව, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය සමඟ එකඟ නොවන්නේ නම්,

කාරණය පරිසර විෂය භාර අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳ අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය විය යුතුය. එවැනි යම් කරුණක් සළකා බලනු ලබන අවස්ථාවන්හිදී අදාළ කමිටුවේ සාමාජිකයෙකු එයට පෙනී සිටිය යුතුය.

(ඇ) අමාත්‍යවරයා විසින්, පරිසර විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිර්දේශ ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා එවැනි යම් නිර්දේශයක් ඉදිරිපත් කළ යුතු කාලය නියම කරමින්, අවශ්‍ය විය හැකි පරිදි යම් නියෝග සාදනු ලැබිය යුතුය.

(ඈ) පාරිසරික විෂය භාර අමාත්‍යවරයා විසින්, එසේ ප්‍රකාශිත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත පාරිසරික සැලසුම් සකස් කිරීමේදී අනුගමනය කළ යුතු නිර්ණායක නියම කරමින් නියෝග සාදනු ලැබිය යුතුය.

(4) (අ) 33 වැනි වගන්තිය ප්‍රකාර ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විට, පුරාවස්තු ආඥාපනත (188 වන අධිකාරය) ප්‍රකාර, ඒ ප්‍රදේශය ඇතුළත එවැනි පුරාවස්තු ඇති ස්ථාන නැරඹීමට පැමිණෙන්නන්ට පහසුකම් ලබාදීම සම්බන්ධයෙන්, සභාව විසින් බලතල ක්‍රියාත්මක කරනු ලැබීම නිත්‍යානුකූල වන්නේය. මේ බලතල ක්‍රියාත්මක කිරීමේදී

සභාව විසින් පුරාවිද්‍යා කොමසාරිස් වරයාගේ අනුමතිය ලබාගත යුතුය. එවැනි අනුමැතියක් ලබාගැනීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරන ලද පරිදි විය යුතුය.

(ආ) අමාත්‍යවරයා විසින් පුරාවස්තු විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ප්‍රකාශිත පරිදි වූ යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත පුරාවස්තු සංරක්ෂණය කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි යම් නියෝග සාදනු ලැබිය යුතුය.

(5) ඒ පිළිබඳ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අදාළ කළ යුතු ප්‍රමාණය හා ආකාරය සහ ඒවා අදාළ කළ යුත්තේ කවුරු විසින් ද යන්න සඳහන් කරමින් නියෝග සාදනු ලැබිය හැකිය. එවැනි යම් නියෝගයක් අදාළ විෂය භාර අමාත්‍යවරයා විසමා සාදනු ලැබිය යුතුය.

37 33 වන වගන්තිය ප්‍රකාර ප්‍රකාශිත ප්‍රදේශයක් ඇතුළත භාවිතය සඳහා දිගු ගමන් ප්‍රදේශ හා ස්වභාවික දඩයම් පාරවල් ප්‍රකාශයට පත් කළ යුතු අතර හඳුනාගැනීම ද කළ යුතුය. නියෝග මගින් නියමිත ගාස්තු, දිගු ගමන් ප්‍රදේශ සහ දඩයම් පාරවල් භාවිත කරන තැනැත්තන්ගෙන් අය කරනු ලැබිය යුතුය. එවැනි ප්‍රදේශ භාවිත කළ යුතු ආකාරය ද නියම කරනු ලැබිය යුතුය.

දිගු ගමන් ප්‍රදේශ ස්වභාවය හා ස්වභාවික පාරවල් ප්‍රකාශයට පත් කිරීම.

38 අමාත්‍යවරයා විසින්, ධීවර කටයුතු විෂය භාර අමාත්‍යවරයා විමසා 33 වැනි වගන්තිය යටතේ ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුලත පවත්නා සහ ඒ ප්‍රදේශය ඇතුලත අඛණ්ඩව පවත්වාගෙන යා හැකි සාම්ප්‍රදායික මසුන් මැරීමේ ක්‍රම ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය. මසුන් මැරීමේ අයිතිය ප්‍රකාශයට පත් කිරීම.

39 (1) සභාව විසින්, ප්‍රකාශිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් 1964 අංක 18 දරන සංචාරක සංවර්ධන පනත යටතේ සියලු බලතල අවශ්‍ය වෙනස්කම් සහිතව ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය. සභාව විසින් බලතල ක්‍රියාත්මක කිරීම.

(2) කමිටුව විසින්, ප්‍රකාශිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් -

(අ) එකී පනතේ 54, 55, 57, 59 සහ 60 යන වගන්තිවල දැක්වෙන බලතල හා කර්තව්‍යන් අවශ්‍ය වෙනස්කම් සහිතව ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

(ආ) 1964 අංක 18 දරන සංචාරක සංවර්ධන පනතේ 65 වන වගන්තිය ප්‍රකාර, සභාවේ නියමයන් මත නිශ්චිත සංවර්ධන සැලසුම් කෙටුම්පත සකස් කිරීම.

## V වන කොටස

### මුදල් සහ ගිණුම්

40 (1) මෙම පනතේ කාර්ය සඳහා, සංචාරක සංවර්ධනය හා ප්‍රවර්ධනය පිණිස සාදා ඇති නියමයන් අනුව පාලක සභාව විසින් පාලනය කල යුතු සංචාරක සංවර්ධන අරමුදල නමින් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය. අරමුදලක් පිහිටුවීම

(2) (1) වන උප වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලට.

(අ) සංචාරක කටයුතු සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ,

(ආ) 41 වැනි වගන්තිය ප්‍රකාර සෙස් බදු මගින් ලැබෙන සියලු මුදල් ප්‍රමාණ,

(ඇ) සංචාරක කටයුතු සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ත්‍යාග, පරිත්‍යාග, ප්‍රදාන හෝ භාර හෝ ඒ සමාන වෙනත් ආකාරයෙන් ලැබෙන සියලු මුදල් ප්‍රමාණ,

(ඈ) මෙම පනත විසින් හෝ මෙම පනත යටතේ ඒ අරමුදලට ගෙවිය යුතු සියලු මුදල් ප්‍රමාණ, ගෙවනු ලැබිය යුතුය.

(3) අරමුදලින් -

(අ) සංචාරක කටයුතු සංවර්ධනය හෝ ප්‍රවර්ධනය සඳහා යාදනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ සංවර්ධනය කිරීමේදී යම් පුද්ගලයෙකු හෝ යම් සංවිධානයක් විසින් සිදු කරන ලද යම් වියදමක් පියවීම, සඳහා අවශ්‍ය සියලුම මුදල් ප්‍රමාණය, සහ

(ආ) 39 වන වගන්තියේ (3) උප වගන්තිය ප්‍රකාර අරමුදලින් ගෙවීමට නියමිත සියලුම මුදල් ප්‍රමාණ ගෙවනු ලැබිය යුතුය.

(4) අරමුදලේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාවට අනුකූලව විගණනය කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින්, සභාවේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

41 (1) 1969 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍ර ලත් සෑම ආයතනයකම පිරිවැටුම මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2003 අංක 25 දරන මූල්‍ය පනතේ ii වන වගන්තිය ප්‍රකාර සංචාරක සංවර්ධන බද්දක් පනවා, අයකොට එකතු කළ යුතුය. සංචාරක සංවර්ධන බද්දක් අයකිරීම.

(2) බද්ද පැනවීම, බද්ද ගෙවීමේ ක්‍රමය හා ඒ බද්ද එකතු කිරීමට අදාළ වාර්තා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත සැපයිය යුතු ආකාරය සම්බන්ධයෙන් 2003 අංක 25 දරන මුදල් පනතේ ii වන කොටසේ විධිවිධාන අදාළ විය යුතුය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බදු ආකාරයෙන් එකතු කරන ලද මුදල් 40 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සංචාරක සංවර්ධන අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, පහත දැක්වෙන ආකාරයට වියදම් දැරිය යුතුය.

(ඇ) සියයට පහළොවක (15%) මුදල් ප්‍රමාණයක් 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක හා චාරිකා ආයතනයට ගෙවනු ලැබිය යුතුය.

(ආ) සියයට අටක (8%) මුදල් ප්‍රමාණයක්, ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා ඊට අදාළව අලෙවිකරණ කටයුතු කිරීම සම්බන්ධයෙන් සහ සංචාරක හා චාරිකා කර්මාන්තයන්හි පුද්ගලයින් පුහුණු කිරීම සම්බන්ධයෙන් ගෙවීම් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන නියෝජිත ආයතනයට ගෙවනු ලැබිය යුතු අතර,

(ඇ) සියයට පහක (5%) මුදල් ප්‍රමාණයක්, සංවර්ධන කාර්යයන් සඳහා සභාවට ගෙවනු ලැබිය යුතුය.

## iv වන කොටස

### සංචාරක කටයුතු සහ චාරිකා පිළිබඳ ජාතික ආයතනය.

42 (1) 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන අනුව (මෙහි මින් මතු "ආයතනය" වශයෙන් හඳුන්වනු ලබන) "සංචාරක කටයුතු සහ චාරිකා පිළිබඳ ජාතික ආයතනය" නමින් සංස්ථාපිත පොදු සමාගම, මෙම පනතේ විධිවිධාන ප්‍රකාර පිළියෙළ කරන ලද සංචාරක සංවර්ධන සැලසුමට අනුව ශ්‍රී

සංචාරක කටයුතු සහ චාරිකා පිළිබඳ ජාතික ආයතනය.

ලංකාවේ විවිධ සංචාරක කටයුතු පිළිබඳ අංශයන් සහ චාරිකා කර්මාන්තය සම්බන්ධයෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනයක් දීමෙන් සංචාරක කටයුතු සහ චාරිකා කර්මාන්තය සඳහා මානව සම්පත් සංවර්ධනය පිණිස විධිවිධාන සැලැස්වීම සම්බන්ධයෙන් වගකීම් දරා ඇති සභාවේ නියෝජිත ආයතනයක් විය යුත්තේය. ආයතනය සෑම අවස්ථාවකදීම සභාවෙන් උපදෙස් විමසා ක්‍රියා කළ යුතු වන්නේය.

(2) සංස්ථාපිත සංගමයේ සාංගමික සංස්ථා පත්‍රයේ සහ ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති බලතලවලට අමතරව, ආයතනයට විශ්ව විද්‍යාල හා මෙම කර්මාන්තයේ විවිධ අංශ හා සම්බන්ධ පාඨමාලා හා වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් උපාධි පිරිනමන අනෙකුත් ආයතන සමඟ ගිවිසුම් ඇති කර ගැනීමට බලය ඇත්තේය.

(3) සංචාරක කටයුතු සහ චාරිකා වෙළඳ ව්‍යාපාරයේ විවිධ ක්ෂේත්‍ර හා සම්බන්ධ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ 25(අ) වගන්තිය ප්‍රකාර වූ ආයතනයක් උපාධි පිරිනැමීමේ ආයතනයක් වශයෙන් හඳුන්වනු ලැබිය යුතු අතර ආයතනය මගින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සඳහා එකී පනතේ විධිවිධාන අදාළ වන්නේය. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් මේ හා සම්බන්ධ පැන නගින්නා වූ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් තිසි බලධාරියා වන්නේය.

ශ්‍රී ලංකා සංචාරක කටයුතු ප්‍රවර්ධන සහ කළමනාකරණ නියෝජිත ආයතනය

43 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන අනුව (මෙහි මින්මතු "නියෝජිත ආයතනය" වශයෙන් හඳුන්වනු ලබන) "ශ්‍රී ලංකා සංචාරක කටයුතු ප්‍රවර්ධන සහ කළමනාකරණ නියෝජිත ආයතනය" නමින් සංස්ථාපිත පොදු සමාගම. මෙම පනතේ විධිවිධාන ප්‍රකාර පිළියෙල කරන ලද සංචාරක සංවර්ධන සැලසුමට අනුව ශ්‍රී ලංකාව සංචාරක සහ

ශ්‍රී ලංකා සංචාරක කටයුතු ප්‍රවර්ධනය සහ කළමනාකරණ නියෝජිත ආයතන.

(1) එක් එක් ලිත් වර්ෂයේ අවසානයේ සිට මාස තුනක කාල සීමාවක් ඉකුත්වීමට පෙර නියෝජිත ආයතනය විසින් -

(අ) ඒ වර්ෂය තුළ නියෝජිත ආයතනය පිළිබඳ වාර්තාවක්.

(ආ) ප්‍රවර්තන වර්ෂයේ තුන් මසක් ඇතුළත ඊට පූර්ව ලිත් වර්ෂය සඳහා වූ විගණනය කළ ගිණුම් වාර්තාවේ පිටපත් සහ ලිත් වර්ෂයේ හත්වන මාසය අවසානයට පෙර අර්ධ වාර්ෂික ගිණුම්.

(ඇ) සභාව විසින් නියම කර ඇති පරිදි එවැනි විස්තර අඩංගු ප්‍රකාශනයක් සහ ඊළඟ ලිත් වර්ෂය සඳහා නියෝජිත ආයතනයෙහි ආදායම් සහ වියදම් පිළිබඳ ඇස්තමේන්තුවක්.

(ඈ) නියෝජිත ආයතනය විසින් සපුරා ගැනීමට නියමිත කාර්යය විදහාපාමින් වසර තුනක පරිච්ඡේදයක් සඳහා සැලැස්මක්.

(ඉ) පූර්ව වර්ෂය වෙනුවෙන් ඉදිපත් කරන ලද සැලැස්මට අදාළ කාර්ය සිද්ධීන් සහ කාර්ය සාධනය අඩංගු ප්‍රකාශනයක්.

සභාවට ඉදිරිපත් කළ යුත්තේය.

(2) චාරිකා ගමනාන්තයක් වශයෙන් අලෙවිකරණ කටයුතු සඳහා යොදවා, වගකීම දරු ඇති සභාවේ විධායක නියෝජිත ආයතනයක් විය යුත්තේය. නියෝජිත ආයතනය සෑම අවස්ථාවකදීම සභාවෙන් උපදෙස් විමසා ක්‍රියා කළ යුත්තේය.

(3) සංස්ථාපිත සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය සහ ව්‍යවස්ථාවලියේ සඳහන්ව ඇති පරමාර්ථවලට අමතරව නියෝජිත ආයතනයට පහත සඳහන් පරමාර්ථ තිබිය යුත්තේය.

(අ) සභාවෙන් උපදෙස් විමසා සංචාරක සංවර්ධන සැලැස්මට අනුව ශ්‍රී ලංකාව උසස් තත්වයේ සංචාරක සහ චාරිකා ගමනාන්තයක් වශයෙන් අලෙවිකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ආ) ශ්‍රී ලංකාව දකුණු ආසියා කලාපයට පිවිසෙන මං පෙතක් බවට ප්‍රවර්ධනය කිරීම.

(4) විදේශයන්හි දී ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සහ අලෙවිකරණය කිරීම හා සම්බන්ධ නියෝජිත ආයතනයේ කාර්යයන් කාර්යක්ෂම ලෙස කරගෙන යාමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශයන්හිදී ද කාර්යාල පවත්වාගෙන යා යුතු වන්නේය.

## V වන කොටස

## viii වන පරිච්ඡේදය

සංචාරක ව්‍යාපාර ලියාපදිංචි කිරීම සහ සංචාරක සේවා සම්බන්ධයෙන් මිල ගණන, ගාස්තු, ප්‍රමාණ සහ අයකිරීම් විධිමත් කිරීම.

44 (1) සභාවේ නිර්දේශය මත නියමයක් මගින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සංචාරක සහ චාරිකා කර්මාන්තයේ ක්‍රියාත්මක වන ඇතැම් ව්‍යාපාර සහ සේවා අමාත්‍යවරයා විසින් පිළිවෙළින් සංචාරක ව්‍යාපාර සහ සංචාරක සේවා ලෙස වර්ග කරනු ලැබිය හැකිය. සංචාරක ව්‍යාපාර ලියාපදිංචි කිරීම

(2) පළමු වන උපවගන්තිය ප්‍රකාර සිදු කරන ලද වර්ගීකරණයට ඇතුළත් වන්නා වූ සෑම සංචාරක ව්‍යාපාරයක් සහ සංචාරක සේවාවක් ම සභාව වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, සභාව විසින් වෙනස්වූ, වර්ගීකරණයට අනුව ඒ ව්‍යාපාරයේ හෝ සේවාවේ නමින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය. සභාව විසින් බලපත්‍රලත් සංචාරක ව්‍යවසාය සහ සංචාරක සේවා පිළිබඳ නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය

සහ බලපත්‍ර නිකුත් කිරීමේ ආකාරය නියම කරනු ලබන පරිදි විය යුතුය.

(3) එවැනි බලපත්‍ර නිකුත් කිරීම සහ ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු කලින් කල ගැසට් පත්‍රයේ පළ කරන ලබන නියමයක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතුය.

(4) දෙවන වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද බලපත්‍රයක් නියෝග මගින් නියම කරනු ලැබූ කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර බලපත්‍ර අලුත් කිරීම සඳහා නියම කරනු ලැබ ඇති කාර්ය පටිපාටිය අනුව බලපත්‍ර නිකුත් කරනු ලැබිය යුතුය.

(5) මෙම වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් 46 වන වගන්තිය ප්‍රකාර කිසියම් බලපත්‍රයක් සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවාවක් විසින් සපයනු ලබන සේවාවල අවම ප්‍රමිතිය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයට යටත් විය යුතුය.

(6) සභාව විසින් -

(අ) බලපත්‍රයෙන් අපේක්ෂා කරනු ලබන සිදු කරන්නාවූ සේවයේ ප්‍රමාණය සහ එහි හැකියාව සඳහන් කරමින් වාර්තාවක් සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවයක් විසින් බලපත්‍ර නිකුත් කිරීමට පෙර සභාවට ඉදිරිපත් කිරීමට අදාළව

සහ.

(ආ) බලපත්‍ර ලත් සංචාරක ව්‍යවසායක් විසින් හෝ සංචාරක සේවයක් විසින් ඊට නිකුත් කර ඇති බලපත්‍රය යටතේ සලස්වනු ලබනසේවාව පරීක්ෂා කිරීම කරගෙන යනු ලබන ආකාරය සහ එම අවස්ථාවේදීම අධීක්ෂණය කිරීමට අදාළව.

රීති සෑදිය යුතුය.

(7) සභාව වෙත ලියාපදිංචි වී නොමැතිව හෝ ඉටු කරනු ලබන සේවාවට බලපත්‍රයක් නොමැතිව මෙම වගන්තිය ප්‍රකාර ව්‍යාපර කරගෙන යාම සඳහා ඕනෑම සංචාරක ව්‍යවසායකට හෝ සංචාරක සේවයකට නොහැකි වන්නේය. ලියා පදිංචිවී නොමැතිව හෝ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබ ව්‍යාපාර කරගෙන යනු ලබන ඕනෑම සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවයක් මෙම පනත යටල්තෙ වරදකට වරදකරුවකු වන අතර, එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍රයක් අවලංගු කිරීමකට ද යටත් වන්නේය.

(8) මෙම වගන්ති ප්‍රකාර බලපත්‍රලත් සෑම සංචාරක ව්‍යාපාරයක් සහ සංචාරක සේවයක් විසින් එමගින් ඉටු කරනු ලබන සේවා හා සම්බන්ධයෙන් පළ කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමකට, සංදේශයකට හෝ වෙනත් නිවේදනයකට, මෙම පනත ප්‍රකාර බලපත්‍ර නිකුත් කරනු ලැබ ඇති ලියාපදිංචි කරන ලද සංචාරක ව්‍යාපාරයක් හෝ සංචාරක සේවයක් බවට ප්‍රකාශයක් ඇතුළත් කළ යුතුය.

(9) ලියාපදිංචි නොකළයම් සංචාරක ව්‍යාපාරයක් හෝ සංචාරක සේවයක් විසින් එය ලියාපදිංචි කළ සංචාරක ව්‍යාපාරයක් හෝ සංචාරක සේවයක් බවට පෙනී සිටීම වරදක් වන්නේය.

45 (1) අමාත්‍යවරයා සභාවේ උපදෙස් මත පහත සඳහන් සියල්ල හෝ ඉන් ඕනෑම එකක් සම්බන්ධයෙන් නීති සංග්‍රය නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකිය.

සංචාරක සංවර්ධන පනත සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.

(අ) සංචාරක හෝටල්

(ආ) චාරිකා නියෝජිතයන්

(ඇ) සංචාරක නියමු කථිකාචාරවරු

(ඈ) නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා (සංචාරක හෝටල්, චාරිකා නියෝජිතයන් හෝ සංචාරක නියමු කථිකාචාරවරුන්ගේ සේවාවලට අයත් නොවන සංචාරක සේවා)

(2) පළමු උපවගන්තියේ සඳහන්ව ඇති ව්‍යවස්ථා සංග්‍රහයට පනතේ පළමු, දෙවැනි, තුන්වැනි සහ හතර වැනි උපලේඛනවල අඩංගු කරුණු ඇතුළත් කළ යුතුය. -

(3) අමාත්‍යවරයා විසින් සභාවේ උපදෙස් මත මෙම පනතේ පළමු, දෙවැනි, තුන්වැනි සහ හතරවැනි උපලේඛනවල අඩංගු කරුණු සංශෝධනය කිරීමට, එකතු කිරීමට, හෝ ඉවත් කිරීමට යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකිය.

46 (1) සභාවේ උපදෙස් මත අමාත්‍යවරයා විසින් සංචාරක ව්‍යවසාය සහ සංචාරක සේවා පන්තින් වර්ග කල හැකි අතර එවැනි යම් ව්‍යවසායතනයක් හෝ සේවයක් විසින් පවත්වාගෙන යා යුතු ප්‍රමිති කලින් කල නියම කරනු ලැබිය හැකිය. ප්‍රමිති සහතිකයක් නිකුත් කිරීම.

(2) අමාත්‍යවරයා විසින් සංචාරක ව්‍යවසායක සහසංචාරක සේවයක පන්ති. වර්ග කරන අවස්ථාවේදී සභාව විසින් පළමු උපවගන්ති යටතේ වර්ග කරන ලද යම් සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවයක පන්තියකට ප්‍රමිතිය පිළිබඳ සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකිය.

(3) ඕනෑම සංචාරක ව්‍යවසායක හෝ සංචාරක සේවයක ප්‍රමිතිය පිළිබඳ ව්‍යාජ සහතික යටතේ ඕනෑම සේවයක් සපයන බවට සොයා ගනු ලබන විටදී මෙමපනත යටතේ වරදකට වරදකරුවකු වන්නේය.

(4) ඕනෑම සංචාරක ව්‍යවසායක හෝ සංචාරක සේවාවක් විසින් සපයනු ලබන සේවය එයට නිකුත් කරන ලද ප්‍රමිතිය පිළිබඳ සහතිකයේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමිතියට වඩා අඩු තත්වයක පවතින අවස්ථාවක, එකී ව්‍යවසාය හෝ සේවාව මගින් එහි ප්‍රමිතිය වැඩි දියුණු කිරීම සඳහා සහ සහතිකයේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමිතිය ලබාගැනීම සඳහා ගත යුතු පියවර සභාවට හඳුනා ගැනීමට හැකිය. සභාව හඳුනාගත් පරිදි සංචාරක ව්‍යවසායක හෝ සංචාරක සේවය විසින් එකී පියවර සපුරාලීමට අපොහොසත් අවස්ථාවක, සභාව විසින් සංචාරක ව්‍යවසාය හෝ සංචාරක සේවා පිරිනමන ලද සහතිකය වහාම අවලංගු කරනු ලැබේ.

47 (1) 44 වගන්තියේ 2 වන උපවගන්තිය ප්‍රකාර ඕනෑම පුද්ගලයකුට බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ ඇති විට හෝ 46 වන වගන්තිය ප්‍රකාර ඔහුගේ සහතිකය අවලංගු කර ඇති විට මෙම කරුණ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් පත් කරන ලද අභියාචනා පරිෂදයට ඔහුට අභියාචනයක් ඉදිපත් කළ හැකිය. පරිෂදයේ සංයුතිය සහ අනුගමනය කළයුතු ක්‍රියා පරිපාටිය නිශ්චිතව සඳහන් කළ යුතුය.

**බලපත්‍රයක් නිකුත් කිරීම** ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම වෙනුවෙන් අභියාචන කිරීම.

48 (1) සභාව සංකේතයක් හඳුනාගත යුතු අතර එය සභාවේ සංකේතය විය යුතු අතර ඒ හා සම්බන්ධයෙන් 5 වන උපලේඛනයේ සඳහන් කර තිබේ. සභාව විසින් නියම කර ඇති පරිදි මෙම සංකේතය භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට නිසි පරිදි ලියාපදිංචි කරන ලද චාරිකා සහ සංචාරක ව්‍යවසායකයන්ට බලය පවරනු ලැබේ.

සභාවට සංකේතය සඳහා ගැනීම.

(2) සභාවේ අවසරයකින් තොරව ඕනෑම පුද්ගලයකු සභාවේ සංකේතය භාවිත කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

(3) සභාවේ අනුමතියකින් තොරව ඕනෑම පුද්ගලයකු සභාවේ සංකේතය භාවිත හෝ ප්‍රදර්ශනය කරන්නේ නම්, හෝ තුන්වැනි පාර්ශ්වයන් නොමග යන ආකාරයෙන් සභාවේ ලාංඡනය නියෝජනය වන පරිදි ඊට සමාන සංකේතයක් භාවිත කරන්නෙ නම් නියෝජනයක් කරන්නේ නම්, මෙම පනත යටතේ වරදකට වරදකරුවකු වන්නේය.

49 (1) සභාවේ සභාපතිවරයාගේ නිර්දේශය මත. එසේ කිරීම උචිත යැයි ඔහුට පෙනී යන අවස්ථාවක. අවශ්‍ය යිය පෙනෙන්නා වූ විමසීම් කිරීමෙන් පසු නියමයක් මගින්. යම් සංචාරක සේවයක් සැපයීම සඳහා පනවනු ලබන නියම කරනු ලබන ඉල්ලා සිටිනු ලබන හෝ අයකරගනු ලබන මිල ගාස්තු රේට් ප්‍රමාණ හෝ අයකිරීම් විධිමත් කරනු ලැබිය හැකිය. එම නියෝගය මේ පනතේ "මිල නියෝග නියමය" ලෙස සඳහන් කරනු ලැබේ.

(2) යම් මිල නියෝග නියමයක් -

(අ) ශ්‍රී ලංකාව පුරාම ඇති සංචාරක සේවා විසින් ක්‍රියාත්මක කරනු ලැබීමට සැලැස්විය යුතුය. නැතහොත් එය ක්‍රියාත්මකවීම නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි ශ්‍රී ලංකාවෙහි යම් ස්ථානයක හෝ ප්‍රදේශයක සංචාරක සේවාවලට සීමා කරනු ලැබිය හැකිය.

(ආ) එය අදාල කිරීම නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් සංචාරක සේවා විස්තරයකට සීමා කරනු ලැබිය හැකිය.

(ඇ) එමගින් වෙනස්වූ විස්තරවල සංචාරක සේවා සම්බන්ධයෙන් වූ හෝ එකම විස්තරයක සංචාරක සේවාවල වෙනස් වූ සංචාරක සේවා වර්ග සම්බන්ධයෙන් වූ මිල ගාස්තු රේට් ප්‍රමාණ හෝ අයකිරීම් විධිමත් කරනු ලැබිය හැකිය. සහ

(ඇ) එමගින් සපයනු ලබන සේවයෙහි හෝ පහසුකම්වල තත්වය සහ ප්‍රමිතිය සම්බන්ධ කොන්දේසි ද ඇතුලත්ව එවැනි යම් සේවා විසින් පතවනු, අයකරනහෝ ඉල්ලා සිටිනු ලැබිය හැකි හෝ අයකරනු ලැබිය හැකි මිල ගාස්තු රේට් ප්‍රමාණ හෝ අයකිරීම යටත් විය යුතු කොන්දේසි නියම කරනු ලැබිය හැකිය.

(3) (අ) මෙම වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධාන මගින් පවරන ලද බලතලවල වගන්තියට අගතියක් නොමැතිව, සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් මිල නියෝග නියමයක් කිරීමේදී එම විස්තරයේම වෙනත් යම් පංතියක සංචාරක සේවයකට වඩා වැඩි උපරිම මිල, රේට් ගණන්, ගාස්තු හෝ අයකිරීමට, පැනවීමට ලබා ගැනීමට ඉල්ලා සිටීමට හෝ අයකිරීමට යම් එක් පංතියක සංචාරක සේවයක යම් විස්තරයකට නැති බවට තහවුරු කිරීමේ අවශ්‍යතාවයට මූලික වශයෙන් සැලකිල්ල දැක්විය යුතුය.

(ආ) මේ පරිච්ජේදයේ කාර්ය සඳහා යම් විස්තරයක යම් වර්ගයක හෝ සංචාරක සේවයකට අදාළව "පංතිය" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ නීතියෙන් නියම කර ඇති පරිදි පත් කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයෙහි එම සේවයට වෙන්කර ඇති හෝ දී ඇති වර්ගීකරණය වේ.

(4) සෑම මිල නියෝග නියමයක්ම සභාවේ සභාපතිවරයා විසින් සාදනු ලැබ අත්සන් කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතුය.

(5) යම් මිල නියෝග නියමයක් සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබීමෙන් පසු -

(අ) ගැසට් පත්‍රයේ ඒ නියෝග ප්‍රසිද්ධ කිරීමෙන් හෝ,

(ආ) මේ පනත යටතේ පත් කාර්ය සඳහා වෙනත් යම් ආකාරයකින්,

වහාම ඒ පිළිබඳ මහජන දැනුම්දීම් කරනු ලැබිය යුතුය.

(6) සෑම මිල නියෝග නියමයක්ම එය ක්‍රියාත්මක වන දිනයට පසු හෝ වහාම අමාත්‍යවරයා විසින් සලකා බැලීම සඳහා ඔහු වෙත ඉදිරිපත් කළ යුතු අතර ඉන්පසු අමාත්‍යවරයා විසින් නියමය අනුමත කිරීම හෝ පරිච්ඡින්න කිරීම් කරනු ලැබිය හැකිය.

(7) හයවන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් යම් මිල නියෝග නියමයක් පරිච්ඡින්න කරනු ලැබූ අවස්ථාවක ඒ පරිච්ඡින්න කිරීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එලෙස ප්‍රසිද්ධ කරන ලද දිනයේ සිට එය පරිච්ඡින්න කරන ලද ලෙස සලකණු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කරන ලද හෝ දරන ලද කිසිවකට හෝ අත්කරගත් උපරිම වූ හෝ ලබන ලද යම් අයිතියකට බැදීමකට හෝ වගකීමකට අගතියක් නොවිය යුතුය.

(8) යම් මිල නියෝග නියමයක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක ඒ අනුමතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

(9) ඉහත දැක්වෙන විධිවිධාන අනුව සාදන ලද යම් මිල නියෝග නියමයක් කලින් කල සංචාරක සහ චාරිකා කර්මාන්තයෙහි යහපත සඳහා අවශ්‍ය සංශෝධනය කළ හැකිය. නැතහොත් වෙනස් කළහැකිය.

50 (1) යම් මිල නියෝගයක් හෝ කාලයෙහි ක්‍රියාත්මකව පවතින අවස්ථාවක ඒ නියමය අදාළ වන්නාවූ සෑම සංචාර සේවයක අයිතිකරු හෝ කළමනාකරු විසින්,

(අ) ඒ අයිතිකරු විසින් සලස්වනු ලබන සහ නියමයේ සඳහන් වන එක් එක් සේවාව සම්බන්ධයෙන් අය කරනු ලබන මිල රේට්, ප්‍රමාණ, ගාස්තු හෝ අයකිරීම් පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යාම හෝ පවත්වාගෙන යාමට සැලැස්වීම හෝ කළ යුතුය.

(ආ) ඒ රෙජිස්ටරයේ සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ පත් කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියකියවිල්ලකින් බලය දෙන ලද වෙනත් තැනැත්තකු විසින් පරීක්ෂාකර බලනු පිණිස තැබිය යුතුය. නැතහොත් එසේ තැබීමට සැලැස්විය යුතුය.

සහ

(ඇ) ඒ නියමයේ සඳහන් වන මිල රේට් ප්‍රමාණ, ගාස්තු හෝ අයකිරීම් පිළිබඳ ලැයිස්තුවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විධාන කරනු ලබන පරිදි වූ ආකාරයට හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය.

## xi වන කොටස

### සාමාන්‍ය කරුණු

51 යම් අධිකරණයක් ඉදිරියේ සභාව විසින් හෝ සභාවට විරුද්ධව හෝ ගෙනෙනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී සභාව විසින් දරන ලද යම් වියදමක් සභාවේ අරමුදලෙන් ගෙවිය යුතු අතර ඒ සිවිල් හෝ අපරාධ නඩුවේදී සභාවට ගෙවන ලද හෝ සභාව විසින අයකර ගන්නා ලද යම් වියදමක් සභාවේ අරමුදලට බැර කළ යුතුය.

සිවිල් හෝ අපරාධ නඩුවකදී දරන ලද වියදම් ගෙවීම.

52 සභාවට විරුද්ධව ගෙනෙනු ලබන යම් නඩුවකදී සභාවේ සාමාජිකයෙකුට එරෙහිව ශරීරයට හෝ දේපලවලට එරෙහිව ඊට ආඥාවක් නිකුත් නොකළ යුතුය.

සභාවේ යම් සාමාජිකයෙකුට විරුද්ධව ඊට ආඥාවක් නොපැවතිය යුතු බව.

53 සභාව විසින් නිකුත් කරන ලද්දේ යැයි උද්දේශික වූ ද මේ පනතින් නියම කර ඇති පරිදි මුද්‍රා තබනු ලැබිය යුතු හෝ සභාව විසින් හෝ සභාව වෙනුවෙන් අත්සන් කරනු ලැබිය යුතු වූ ද සැම සාධන පත්‍රයක්ම සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එය එම කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස සැලකිය යුතුය.

සාධන පත්‍ර බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු බව.

54 සභාව විසින් හෝ සභාව විසින් පත් කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් මේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සංචාරක හෝ වෙනත් යෝජිත ක්‍රම සකස් කිරීමට සභාවට හැකිවනු පිණිස අවශ්‍ය විය හැකි සියලු කාරණාවලට අදාළ සියලු වාර්තා හෝ තොරතුරු දැන්වීම් නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් තුළදී සභාව වෙත හෝ පත් කාර්ය සඳහා බලය දෙන ලද නිලධාරියා වෙත සපයන ලෙස යම් තැනැත්තකුට දැන්වීමක් මගින් සියම කරනු ලැබිය හැකිය.

සභාව විසින් තොතුරු ඉල්ලා සිටිය හැකි බව.

55 මෙම පනත යටතේ සභාව වෙත පැවරි ඇති හෝ පනවනු ලැබ ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්ය ඉටු කිරීමේ කාර්යය සඳහා සභාව විසින් හෝ සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ප්‍රදේශය තදළ පිහිටි යම් ඉඩමකට හෝ ඉදිකිරීමක් තුළට ඇතුල්විය හැකි අතර යම් එවැනි කර්යයක් සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ පරීක්ෂාකර බැලීම් සමීක්ෂණ විභාග කිරීම හෝ පරීක්ෂණ කරනු ලැබිය හැකිය.

සභාව විසින් ඉඩම් ආදියට ඇතුල්විය හැකි බව.

56 (1) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක් යටතේ යම් තැනැත්තකු වෙත බාරදිය යුතු බවට නියම කෙරෙන යම් දැන්වීමක් නියමයක් සාධන පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක්.

දැන්වීම් ආදිය බාරදීමේ ආකාරය.

(අ) ඒ තැනැත්තා වෙත ගොස් බාර දීමෙන්, හෝ

(ආ) ඒ තැනැත්තා සාමාන්‍යයෙන් සිටින හෝ ඒ තැනැත්තා අන්තිමට පදිංචි සිටි ස්ථානය ලෙස දන්නා ස්ථානයෙහි නැතහොත් ඒ තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් වන

අවස්ථාවක ඒ සංස්ථාපිත මණ්ඩලයේ ලියාපදිංචි කළ කාර්යාලයෙහි තැබීමෙන්.

(ඇ) ඒ තැනැත්තා සාමාන්‍යයෙන් සිටින හෝ අවසන් වරට ජීවත්ව සිටි ස්ථානයේ තැතහොත් ඒ තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක ඒ සංස්ථාපිත මණ්ඩලයේ ලියාපදිංචි කළ කාර්යාලයෙහි තැබීමෙන්.

බාරදෙනු ලැබිය හැකිය.

(2) පළමු වන උපලේඛනයේ විධිවිධානවලට අනුකූලව බාර දෙන ලද යම් ලේඛණයක් එහි ලිපිනය ලියා ඇත්තේ කවරෙකු වෙත ද ඒ තැනැත්තා වෙත නිසි ලෙස බාර දුන් ලෙස සැලකිය යුතුය.

57 (1) සභාව වෙනුවෙන් එළඹෙනු ලබන ගිවිසුම් පහත සඳහන් ආකාරයෙන් සිදුකරනු ලැබිය හැකිය.

ගිවිසුම් පාලනය කරන රීති.

(අ) සභාව සහ පෞද්ගලික තැනැත්තකු අතර නීතියෙන් ගිවිසුමක් ලිඛිතව ඇති කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, සභාව වෙනුවෙන් එය ලිඛිතව සිදු කළ හැකිය.

(ආ) සභාව සහ පෞද්ගලික තැනැත්තන් අතර නීතියෙන් ගිවිසුමක් ලිඛිතව ඇති කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා වගකිව යුතු පාර්ශ්වයන් අත්සන් කළ යුතු අතර එකී ගිවිසුම සභාව වෙනුවෙන් යම් තැනැත්තකු හෝ මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි ඒ සඳහා නිසි බලය ලත් තැනැත්තන් විසින් ලිඛිතව සිදු කළ යුතුය.

(2) මෙම වගන්තිය ප්‍රකාර සිදු කරන ලද ගිවිසුමක්, එය සිදු කරනු ලැබීමට මෙම වගන්තිය මගින් බලය දී ඇති ආකාරයෙන්ම අත්හැර දැමීමට හෝ අහෝසි කිරීමට හැකිවේ.

58 (1) යම් චාරිකා හෝ සංචාරක සේවයක සේවා නියුක්තිය ලැබීමට කැමති යම් තැනැත්තකු විසින් පත් කාර්ය සඳහා සාදනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව ඒ සඳහා සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු ලෙස සභාවට ලියාපදිංචි විය යුතුය. චාරිකා හෝ සංචාරක සේවාවල සේවා නියුක්තිය ලැබීමට කැමති තැනැත්තන් සභාව වෙත ලියාපදිංචි විය යුතුය.

(2) සභාව වෙත ලියාපදිංචි නොවී චාරිකා හෝ සංචාරක සේවයක සේවා නියුක්තියෙහි නිරත යම් තැනැත්තකු වරදකට වරදකරුවකු වන්නේය.

59 (1) රීති සෑදිය යුතු බවට මේ පනතෙන් බලය දී ඇත්තා වූ හෝ නියමකර ඇත්තා වූ සියලුම කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් සභාව විසින් රීති සෑදනු ලැබිය හැකිය. රීති සෑදීමට සභාවට ඇති බලය

(2) මෙම පනත යටතේ සභාව විසින් සාදන ලද කිසිදු රීතියක් එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක් ක්‍රියාත්මක නොවිය යුතුය. එවැනි සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

60 (1) (අ) මේ පනත යටතේ හෝ මේ පනතේ කාර්ය සඳහා හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියමයක් යටත්‍ත හෝ සාදන ලද හෝ සපයනු ලබන යම් ඉල්ලීමක වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක දැන දැනම යම් වැරදි

අසත්‍ය හෝ වැරදි ප්‍රකාශනයක් කරන්නා වූ, හෝ

(ආ) මෙම පනතින් නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නා වූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ

(ඇ) මේ පනතින් හෝ ඒ යටතේ නැතහොත් ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ එමගින් යම් තැනැත්තකු වෙත පැවරී ඇති හෝ පවනු ලැබ ඇති යම් බලතල කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉටු කිරීමේදී ඒ තැනැත්තාට අවහිර හෝ බාධා කරන්නාවූ,

සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන්නේය. -

(2) මේ පනත යටතේ වරදක් කරන්නාවූ සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපට ලසු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 2 කට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම් යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

61 සභාවේ ලිඛිත අවසරයක් ඇතිව හැර මෙම පනත යටතේ වූ වරදක් සඳහා කිසිදු අධිකරණයක නඩු පවරනු නොබිය යුතුය. නඩු පැවරීම පිණිස සභාවේ අවසරය ලැබිය යුතු බව.

62 මෙම පනත යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් කරනු ලැබූ අවස්ථාවක, පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම් ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයෙකු සහ නිලධාරියෙකුම, හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙකුම,

ඒ වරද සඳහා වරදකරුවකු ලෙස සැලකිය හැකිය. එසේ වුවද ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා හෝ නිලධාරියා නැතහොත් ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරු විසින් ඒ වරද ඔහුගේ දැනුමෙන් තොරව කර ඇති බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු කරන්නේ නම්, ඒ වරද සඳහා ඔහු වරදකරු ලෙස සලකනු නොලැබිය යුතුය.

63 (1) මේ පනත යටතේ වූ යම් වරදක් සඳහා අවසන් නොවූ නඩු කටයුත්තක් නොපවතින්නේ නම්, සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලක් චූදිතයා විසින් ගෙවීම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ වරද සමථයකට පත් කරනු ලැබිය හැකිය. නැතහොත් ඒ වරද සඳහා නඩු කටයුත්තක් සත්‍ය වශයෙන්ම අවසන් නොවී පවතින්නේ නම් මහේස්ත්‍රාත්වරයාගේ එකඟත්වය ඇතිව එසේ සමථයට පත්වීම සඳහා හේතු වාර්තාගත කිරීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් .... වරදක් සමථයට පත් කළ හැකිය.

(2) මෙම වගන්තිය යටතේ වරදක් සමථයට පත් කිරීමෙහි නිදොස් කිරීමක ප්‍රතිඵලය ඇත්තේය -

(3) වරදක් සමථයට පත් කිරීම සඳහා චූදිත තැනැත්තකු විසින් ගෙවනු ලබන මුදල් සභාවේ අරමුදලට බැර කළ යුතුය.

64 (1) 1966 ංක 10 දරන ලංකා සංචාරක මණ්ඩලය පනත මෙයින් ඉවත් කරනු ලැබේ. අමාත්‍යවරයා විසින් නියමයක් ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් එම පනත ඉවත්වීම ක්‍රියාත්මක වන දිනය නියම කරනු ලැබිය යුතුය.

1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත ඉවත් කිරීම.

(2) 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩලය පනත ඉවත් කර ඇති වුවද -

(අ) පනත ඉවත් කරනු ලද දිනයකට ඉහතින්ම වූ දිනයේ දී ලංකා සංචාරක මණ්ඩලය වෙත පැවරී තිබුණු සියලු වංචල හා නිශ්චල දේපළ එකී ඉවත් කිරීම සඳහා නියම කරන ලද දින සිට බලපැවැත්වෙන පරිදි සභාව වෙත පැවරිය යුතුය.

(ආ) ලංකා සංචාරක මණ්ඩලය විසින් හෝ ඒ සමඟ ඇතුළත් වී ඇති සියලු කොන්ත්‍රාත්තු හා ගිවිසුම් ද එකී නියමිත දිනයට ඉහත දී වලංගු වී තිබූ කොන්ත්‍රාත්තු හා ගිවිසුම් සභාව විසින් සහ සභාව සමඟ ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතුය.

(ඈ) ලංකා සංචාරක මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ ඇති වූ ද නියමිත දිනයට ඉහතින් වූ දිනයක දී නිම නොවී පැවැති සියලූ නඩු හා නඩු කටයුතු නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අවස්ථාවෝචිත සභාව විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබූ නඩු සහ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඉදිරියට පවත්වාගෙන ගොස් සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

(ඇ) නියමිත දිනයට ඉහතින් වූ දිනයක දී ලංකා සංචාරක මණ්ඩලයේ සාමාජිකයන්. නිලධාරීන් සහ සේවකයන් නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සභාවේ සාමාජිකයන් නිලධාරීන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

(ඉ) නියමිත දිනයට ඉහතින් වූ දිනයක දී ලංකා සංචාරක මණ්ඩලයේ වාසියට හෝ ඊට විරුද්ධව දෙනු ලැබ සම්පූර්ණ නොකරන ලද සියලූ තීන්දු හා කරුණු ලැබ. සම්පූර්ණ නොකරන ලද සියලූ නියම නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අවස්ථාවෝචිත පරිදි සභාව විසින් හෝ සභාවට විරුද්ධව දෙන ලද තීන්දුවක් හෝ කරන ලද නියමයක් ලෙස සැලකිය යුතු අතර. ඒ අනුව බලාත්මක කරනු ලැබිය යුතුය.

(ඊ) නියමිත දිනයට ඉහතින් වූ දිනයක දී ලංකා සංචාරක මණ්ඩලය විසින් පාලනය සහ

කළමනාකරණය කරමින් පැවැති සියලු පුහුණු කිරීමේ පාසල් සහ ආයතන නියමිත දිනයේ සිට සංචාරක කටයුතු හා චාරිකා පිළිබඳ ජාතික ආයතනයට පැවරුණු ලෙස සැලකිය යුතුය.

(3) 1966 අංක 10 දරන සංචාරක මණ්ඩලය පනතහි විධිවිධාන ප්‍රකාර නිකුත් කරන ලද අවසර පත්‍ර සහ බලපත්‍ර, මෙම පනත යටතේ අවසත් පත්‍ර සහ බලපත්‍ර නිකුත් කරන තෙක් මෙකී අවසර පත්‍ර සහ බලපත්‍ර දිගටම බලාත්මකව සහ ක්‍රියාත්මකව පැවතිය යුතුය.

65 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ. -

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත සංශෝධනය කිරීම.

(1) ඒ පනතේ 1 වන වගන්තියට ඉක්බිතිව ම ඒ පනතේ 1(අ) වගන්තිය ලෙස ක්‍රියාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් -

මේ පනතේ "ප්‍රධාන පනත" සහ මණ්ඩලය යන යෙදුම් යෙදී ඇති කවර හෝ තැනකදී ඒ සඳහන් කිරීම පිළිවෙලින් "2003 අංක ... දරන සංචාරක කටයුතු පනත" ට සහ "2003 අංක .... දරන සංචාරක කටයුතු පනතේ 2 වගන්තියෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව" ට අනුව විමසා බැලිය යුතුය.

"ප්‍රධාන පනත" සහ "මණ්ඩලය" යන පාඨවලට පිළිවෙලින් 2003 අංක .. දරන සංචාරක කටයුතු පනත සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සභාව" යන යෙදුම ආදේශ කිරීම.

(2) ඒ පනතේ iv වන කොටසේ i වන පරිච්ඡේදයේ 77, 78, 79, 80, 81 සහ 82 දරන වගන්ති ඉවත් කිරීමෙන්.

**(3) ඒ පනතේ 103 වගන්තියේ, -**

(අ) "මණ්ඩලය" යන යෙදුමේ අර්ථ නිරූපනය ඉවත් කිරීමෙන්,

(ආ) "කිසි බලධාරියා" යන යෙදුමේ අර්ථ නිරූපනය ඉවත් කිරීමෙන්, සහ

(ඇ) "ප්‍රධාන පනත" යන යෙදුමේ අර්ථ නිරූපනය ඉවත් කිරීමෙන්

(4) ඒ පනතේ හතරවන, පස්වන, හයවන සහ හත්වන උප ලේඛන ඉවත් කිරීමෙන්.

66 (1) මෙම පනත යටතේ සෑදීමට නියමිත හෝ බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. - නියෝග

(2) 1 වන වගන්තිය යටතේ පවරන ලද බලතලවලට අගතියක් නොවන ආකාරයට අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියලු හෝ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකිය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එම නිවේදනය පළ කළ දිනය සිට හෝ නියෝගයෙන් නිශ්චිතව සඳහන් කර ඇති දිනයක සිට එකී නියෝග ක්‍රියාත්මක විය යුතු වන්නේය -

අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ප්‍රකාශයට පත් කර විගසම අනුමතතිය සඳහා

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතුය. මෙම පනත යටතේ අනුමැතිය නොලත් දිනයට පෙර. ගනු ලැබූ කිසියම් ක්‍රියා මාර්ගවලට අගතියක් නොවන පරිදි අනුමැතිය නොලත් ඔනෑම නියෝගයක් අනුමතිය නොලත් එකී දිනයේ සිට පරිච්පින්න කරන්නේ යැයි සැලකිය යුතු වන්නේ ය.

(4) ඔනෑම නියෝගයක් පරිච්පින්න කරන්නේ යැයි සැලකිය යුතු දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කල යුතුය.

67 (1) සභාවට එකී යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් අවශ්‍ය වන අවස්ථාවක රජය විසින් සභාව සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඒ ඉඩම හෝ සම්බන්ධතාව ලබාගත හැකි වන අතර ඒ පනතේ විධිවිධාන අන්‍යාකාරයකින් මෙම වගන්තියේ 2 වන උපවගන්තියේ සපයා ඇත්තම් මිස. මෙහි සඳහන් ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාව අත්කර ගැනීමේ අරමුණ අදාළ වන්නේය. ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්යයන් සඳහා ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව පොදු කාර්යය සඳහා අවශ්‍ය වී ඇති ඉඩමක් හෝ සම්බන්ධතාවක් ලෙස සලකනු ලැබිය යුතුය.

ඉඩම් අනිවාර්යයෙන් අත්පත් කර ගැනීම

(2) එවැනි අත්පත්කර ගැනිමකදී ඒ ඉඩම හෝ සම්බන්ධතාව ලබා ගැනීම් අරමුණ පිළිබඳ පොදු නිවේදනය ඉඩම් අත්පත් කර ගැනීමේ පනත පරිදි මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසර 5 ක කාලපරිච්ඡේදයක් තුළ ඕනෑම කාලයක දී එහි පළ කරනු ලබන අවස්ථාවක දී ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට පටහැනිව කුමක් සඳහන් වී තිබුණද එහි සඳහන් ඉඩමේ හෝ සම්බන්ධතාවේ වෙළඳපොළ වටිනාකම 1977 ජූලි 22 දින එකී ඉඩම හෝ සම්බන්ධාව ලබා තිබූ වටිනාකම එහි වෙළඳපොළ වටිනාකම ලෙස සලකනු ලැබිය යුතු අතර 1977 ජූලි 22 දිනයෙන් පසු එම ඉඩමේ සංවර්ධන කටයුත්තක් නිසා එහි වෙළඳ පොළ වටිනාකම සාධාරණ ප්‍රමාණයකින් ඉහල දැමිය යුතුයැයි සලකනු ලැබ්ය යුතුය.

මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය විය යුතු බව.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස - අර්ථ නිරූපණය

මද්‍යම පරිසර අධිකාරිය යන්නෙන් 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ.

"නයිටා" යන්නෙන්

"තෘතියික සහ වෘත්තිය පුහුණු අධිකාරිය" යන්නෙන් 1990 අංක 20 දරන තෘතියික සහ වෘත්තිය පුහුණු පනත යටතේ ස්ථාපිත අධිකාරිය අදහස් වේ.

## පළමු උපලේඛනය

(45 වන වගන්තිය)

සංචාරක හෝටල නිති රීති සංග්‍රහයේ විධිවිධාන ඇතුලත් කළහැකි කාරණා.

1 නියෝග, අධීක්ෂණ, වර්ග කිරීම්, සෝදිසි කිරීම්, ආයතන පාලනය, සංචාරක හෝටල නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම.

2 අධිකාරිය යටතේ, සහ බලයලත් අධිකාරියක් විසින් නිකුත් කරන ලද යම් අවසර පතක නියමයන් සහ කොන්දේසි යටතේ සහ ඒ අනුව හැර

(අ) සංචාරක හෝටල වශයෙන් යොදා ගැනීමට නියමිත හෝ යොදා ගන්නා ගොඩනැගිලි තැනීම, යළි තැනීම හෝ වෙනස්කම් කිරීම පිළිබඳ හෝ

(ආ) එවැනි හෝටල්වල ව්‍යාපාර කටයුතු හැරුණු විට වෙනත් ඕනෑම කටයුත්තක් වෙනුවෙන් සංචාරක හෝටලයේ හෝ එහි යම් කොටසක් යොදා ගැනීම හෝ එහි පදිංචිවී සිටීම පිළිබඳ වාරණ.

3 එවැනි අවසර පත් සඳහා යම් අධිකාරිය වෙත අයදුම්පත් සැදිය යුතු ආකෘති පත්‍රය සහ ආකාරය සහ මෙම අයදුම් පත් සමඟ යැවිය යුතු ලිපි ලේඛන සහ අනෙකුත් තොරතුරු.

4 එවැනි අයදුම්පත් බාර ගැනීමේදී සහ බැහැර කිරීමේදී අධිකාරිය විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය සහ අධිකාරිය විසින් එවැනි අයදුම්පත් ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ නියෝග සාදනු ලැබීමේ අවස්ථා.

5 සංචාරක හෝටල නීති රීති සංග්‍රහය යටතේ බලයලත් අධිකාරිය විසින් සංචාරක හෝටල පරිශ්‍ර ලියාපදිංචි කිරීම සහ ඒ සඳහා බලපත්‍ර ලබාගැනීම සිදු නොකරන විට සංචාරක හෝටල ව්‍යාපාර කරගෙන යාමේ අරමුණින් එවැනි පරිශ්‍ර භාවිත කිරීමේ වාරණ. එවැනි ලියාපදිංචි කර ගැනීමක් හෝ බලපත්‍ර ලබා ගැනීමක් සඳහා අයදුම් පත්‍ර සැදිය යුතු ආකෘති පත්‍ර සහ ආකාරය. සහ එවැනි ලියාපදිංචි කර ගැනීමක් හෝ බලපත්‍ර ලබා ගැනීමක් සඳහා අයදුම් පත්‍ර බාර ගැනීම හෝ බැහැර කිරීම වෙනුවෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය.

6 එවැනි ලියාපදිංචි කර ගැනීමක් හෝ බලපත්‍ර ලබා ගැනීමක් සඳහා ගෙවිය යුතු ගාස්තු බලයලත් අධිකාරියක් විසින් එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබාගැනීමක් වෙනුවෙන් අවසරදීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ නියෝග දැවතු ගැබිය හැකි අවස්ථා. සහ එවැනි අධිකාරියක් විසින් එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබාගැනීමක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියෝග සාදනු ලැබිය හැකි අවස්ථා.

7 එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබා ගැනීමක් වෙනුවෙන් යටත් විය යුතු කොන්දේසි. මෙවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබාගැනීමක් බාරගනු ලැබිය හැකි ආකෘති පත්‍රය හෝ ආකාරය. එවැනි බලපත්‍ර ලබාගැනීමේ අරමුණින් එවැනි සංචාරක හෝටල වර්ග කිරීම සහ එවැනි වර්ග කිරීම වෙනස් කර ගත හැකි හෝ සමාලෝචනය කරගත හැකි අවස්ථා.

8 එවැනි ලියාපදිංචි කිරීමක හෝ බලපත්‍ර ලබාදීමේ කාල සීමාව.

9 සංචාරක හෝටල ලියාපදිංචි කිරීමේ හෝ ඒ සඳහා බලපත්‍රදීමේ අරමුණින් නාම ලේඛන සහ පොත්පත් පවත්වාගෙන යාම. එවැනි හෝටල සඳහා ලබාදී ඇති වර්ගීකරනය සංචාරකයන්ට දැන්වීමේ අරමුණින් සංචාරක හෝටලවල ප්‍රදර්ශනය කළ යුතු සංකේත සහ පෝස්තර. එවැනි හෝටලවල අදාළව මිල පාලන නියෝගවල විධිවිධාන යටත්ව සහ එයට අනුව සංචාරක හෝටල විසින් අය කරනු ලැබිය හැකි අයබදු හෝ ගාස්තුවල ලැයිස්තුවක් ප්‍රදර්ශනය කිරීම.

10 සංචාරක හෝටල නීති සංග්‍රහය යටතේ සකස් කළ යම් අයදුම්පතක් බලයලත් අධිකාරය විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ එකී අධිකාරිය විසින් එවැනි හෝටලයක් ලියාපදිංචි කිරීම හෝ එවැනි හෝටලයකට බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවීමෙන් හෝ අවලංගු කිරීමෙන් අතෘප්තියට පත් පුද්ගලයන් විසින් මෙම කාරණාව සඳහා මෙම පනත යටතේ ස්ථාපනය කරන ලද අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීම.

11 සංචාරක හෝටල නීති සංග්‍රහය යටතේ සාදන ලද අයදුම්පත් බැහැර කිරීම හෝ එම අයදුම්පත් සමඟ එකඟවීම හෝ සංචාරක හෝටල නීති සංග්‍රයේ විධිවිධාන උල්ලංඝනය හෝ කඩ කිරීම වළක්වා දැමීමට බලයලත් අධිකාරියට හැකියාව ලබාදීමේ අරමුණින් පරිශ්‍රයට ඇතුළුවීම සහ සෝදිසි කිරීම, පොත්පත් සහ ලිපි ලේඛන සෝදිසි කිරීම, වාර්තා හෝ තොරතුරු ඉදිරිපත් කිරීම සහ පොත්පත් හෝ ලිපි ලේඛනවලින් උපුටන හෝ පිටපත් ලබා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි එවැනි බලතල -

12 සංචාරක හෝටලයක් ලියාපදිංචි කර, වර්ගකර සහ එයට බලපත්‍ර ලබාදී නැති නම් මෙම සංචාරක හෝටල නීති සංග්‍රහ යටතේ ලියාපදිංචි කරන ලද වර්ග කරන ලද සහ බලපත්‍ර නිකුත් කරන ලද සංචාරක හෝටලයක යම් නමක් හෝ තිල නාමයක් හෝ එහි කොටසක් ගැනීම හෝ ලබා ගැනීමේ වාරණ.

13 සංචාරක හෝටල සම්බන්ධයෙන් තබා ගත යුතු, පවත්වාගෙන යා යුතු පොත්පත්.

14 සංචාරක හෝටල නීති රීති සංග්‍රහයේ ඕනෑම විධිවිධාන උල්ලංඝනය හෝ කඩ කරවීම, මෙම පනත යටතේ වැරදි සහ එවැනි වැරදි සඳහා දඬුවම් සැපයීම.

15 ව්‍යාජ හෝ වංචනික ලෙස නියෝජනයන් සිදු කරමින් සංචාරක හෝටල නීති රීති සංග්‍රහය යටතේ ලියාපදිංචි කළ යුතු හෝ බලපත්‍ර ලබාදිය

යුතු සංචාරක හෝටලයක හිමිකම් ලබා ගැනීමට හෝ එසේ ලබා ගැනීමට උත්සහ දරන්නේ නම් මෙම පනත යටතේ එය වරදක් වන අතර, එවැනි වැරදි සඳහා දඬුවම්.

16 සංචාරක හෝටල මගින් සපයනු ලබන පහසුකම් හා ඉටු කරනු ලබන සේවා වෙනුවෙන් සංචාරකයන් විසින් ගෙවීම් සිදු කරනු ලබන ක්‍රම සහ ආකාරය සහ එවැනි සංචාරක හෝටල විසින් එවැනි ගෙවීම් ලබා ගන්නා ක්‍ර සහ ආකාරය.

17 පූර්වෝක්ත ඕනෑම කරුණකට සම්බන්ධ හෝ අනුෂාංගික අනෙකුත් සියලු කරුණු.

18 මෙම උප ලේඛනයේ :-

ඕනෑම සංචාරක හෝටලයක් හා සම්බන්ධ "වෙනස් කිරීමක්" යනුවෙන්

(අ) අභ්‍යන්තර බිත්තියක් හෝ වෙන් කිරීමක් ගොඩ නැගීමක්.

(ආ) එවැනි සංචාරක හෝටලයක් හා සම්බන්ධ එළිමහන යම් වෙනසකට බලපාන එවැනි සංචාරක හෝටලයක අභ්‍යන්තර සැකැස්මේ වෙනස්කමක් හෝ එකී සංචාරක හෝටලයේ ජලාපවහනයේ, වාතාශ්‍රයේ හෝ සනීපාරක්ෂක සැකැස්මේ වෙනස්කමක් හෝ

(ඇ) එවැනි සංචාරක හෝටලයක දැනට පවත්නා පහසුකම්, සැපපහසුවේ හෝ සුවපහසුවේ අඩු කිරීමට බලපාන වෙනස්කම් අදහස් වන්නේ. -

"නීති රීති සංග්‍රහය" යන්නෙන් සංචාරක හෝටල නීතිරීති සංග්‍රහය අදහස් කෙරේ.

## 2 වන උපලේඛනය

(45 වන වගන්තිය)

චාරිකා නියෝජිතයන් පිළිබඳ නීති රීති සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් කළ හැකි කාරණා.

1 නියෝග, අධීක්ෂණ, වර්ග කිරීම්, සෝදිසි කිරීම්, අයතන පාලනය, චාරිකා නියෝජිතයන්ගේ ව්‍යාපාර නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම.

2 බලයලත් අධිකාරියක් විසින් චාරිකා නියෝජිතයන්ගෙ ව්‍යාපා ලියාපදිංචි කර හෝ ඒ සඳහා බලපත්‍ර නිකුත් කර නැති නම්, ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ වාරණ, එවැනි ලියාපදිංචි කර ගැනීමක් හෝ බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර සහ ඒවා සකස් කර ගත යුතු ආකාරය සහ එවැනි අයදුම්පත් ලබාගැනීම හෝ බැහැර කිරීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියා පරිපාටිය.

3 එවැනි ලියාපදිංචිකර ගැනීමක් හෝ බලපත්‍ර ලබාගැනීමක් වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු, බලයලත් අධිකාරියක් විසින් එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබාදීමක් සඳහා අවසර දීමෙ හෝ ප්‍රතික්ෂේප කිරීමේ නියෝග සාදනු ලැබිය හැකි අවස්ථා සහ එවැනි අධිකාරියක් විසින් එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබාදීමක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියෝග සාදනු ලැබිය හැකි අවසථා.

4 එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර නිකුත් කිරීමක් වෙනුවෙන් අවසර දීමේ දී යටත් විය යුතු කොන්දේසි, එවැනි ලියාපදිංචි කිමක් හෝ බලපත්‍ර ලබා ගැනීමක් කරගනු ලැබිය හැකි ආකෘති පත්‍රය හෝ ආකාරය, එවැනි ලියාපදිංචි කිරීමක් සඳහා චාරිකා පිළිබඳ නියෝජිතයන් වර්ග කිරීම සහ එවැනි වර්ග කිරීම් වෙනස් කර ගත හැකි හෝ සමාලෝචනය කරගත හැකි අවස්ථා.

5 එවැනි ලියාපදිංචි කිරීමේ හෝ බලපත්‍ර ලබාදීමේ කාල සීමාව

6 චාරිකා පිළිබඳ නියෝජිතවරුන් ලියාපදිංචි කිරීම හෝ ඔවුන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ අරමුණින් නාම ලේඛන සහ පොත් පත් නඩත්තු කිරීම. චාරිකා පිළිබඳ නියෝජිතයන් විසින් ඔවුන්ගේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ සහ ශාඛා කාර්යාලයේදී ලියාපදිංචි කළ බවට සහතිකය සහ බලපත්‍රය ප්‍රදර්ශනය කිරීම සහ චාරිකා පිළිබඳ නියෝජිතයන්ට අදාළව යම් මිල පාලන නියෝගවල විධිවිධාන යටතේ සහ එයට අනුව එකී නියෝජිතයන් විසින් අය කරනු ලැබිය හැකි අයබදු හෝ ගාස්තුවල ලැයිස්තුවක් ප්‍රදර්ශනය කිරීම.

7 නීති රීති සංග්‍රහය යටතේ සකස් කළ යම් අයදුම් පතක් බලයලත් අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ එකී අධිකාරිය විසින් එවැනි නියෝජිතයන් ලියාපදිංචි කිරීම හෝ එවැනි නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවීමෙන් හෝ අවලංගු කිරීමෙන් අතෘප්තියට පත් පුද්ගලයන් විසින් මෙම කාරණාව සඳහා මෙම පනත යටතේ ස්ථාපනය කරන ලද අධිකරණයකට අභියාචනයක් ඉදිරිපත් කිරීම.

8 නීති රීති සංග්‍රහය යටතේ සාදන ලද අයදුම් පතක් බැහැර කිරීම හෝ එම අයදුම්පත සමඟ එකඟවීම හෝ නීති රීති සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය හෝ කඩ කිරීම වළක්වා දැමීමට බලයලත් අධිකාරියට හැකියාව ලබාදීමේ අරමුණින් පරිශ්‍රයට ඇතුළුවීම සහ සෝදිසි කිරීම. පොත් පත් සහ ලිපි ලේඛන සෝදිසි කිරීම. වාර්තා හෝ තොරතුරු ඉදිරිපත් කිරීම සහ පොත් පත් හෝ ලිපි ලේඛනවලින් උපුටන හෝ පිටපත් ලබා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි එවැනි බලතල

9 චාරිකා පිළිබඳ නියෝජිතයෙකුගේ ව්‍යාපාරය ලියාපදිංචි කර, වර්ග කර සහ එයට බලපත්‍ර නිකුත් කර නැති නම් මෙම නීති රීති සංග්‍රහ යටතේ ලියාපදිංචි කරන ලද, වර්ග කරන ලද සහ බලපත්‍ර නිකුත් කරන ලද මිනැම චාරිකා පිළිබඳ නියෝජිතයකුගේ යම් නමක් හො 'තිල නාමයක් හෝ එහි කොටසක් එකතුකර ගැනීමේ හෝ ලබා ගැනීමේ වාරණ.

10 නීති රීති සංග්‍රහයේ ඕනෑම විධිවිධානයන් උල්ලංඝනය හෝ කඩ කිරීම. මෙම පනත යටතේ වැරදි සහ එවැනි වැරදි සඳහා දඬුවම් සැපයීම.

11 ව්‍යාජ හෝ ව්‍යංගතික ලෙස නියෝජනයන් සිදු කරමින් නීති රීති සංග්‍රහය යටතේ ලියාපදිංචි කළ යුතු හෝ බලපත්‍ර ලබාදිය යුතු චනාරිකා පිළිබඳ නියෝජිතයන්ගේ හිමිකම ලබා ගැනීමට හෝ එසේ ලබාගැනීමට උත්සහ දරන්නේ නම් මෙම පනත යටතේ එය වරදක් වන අතර එවැනි වැරදි සඳහා දඬුවම්.

12 චාරිකා පිළිබඳ නියෝජිතයන් විසින් සපයනු ලබන පහසුකම් හා ඉටුකරනු ලබන සේවා වෙනුවෙන් සංචාරකයන් විසින් ගෙවීම් සිදු කරනු ලබන ක්‍රම සහ ආකාරය සහ එවැනි නියෝජිතයන් විසින් එවැනි ගෙවීම් ලබා ගන්නා ක්‍ර සහ ආකාරය.

13 නීති රීති සංග්‍රහය යටතේ යම් චාරිකා පිළිබඳ නියෝජිතයෙකුට නිකුත් කරන ලද ඕනෑම බල පත්‍රයක් ඔහු විසින් පැවරීම වාරණය කිරීම සහ එවැනි පැවරීමක් බල රහිත කළ යුතු බවට ප්‍රකාශනය.

14 පූර්වෝක්ත ඕනෑම කරුණකට සම්බන්ධ හෝ අනුශාංගික අනෙකුත් සියලු කරුණු.

15 මෙම උප ලේඛනයේ "නීති රීති සංග්‍රහය" යන්නෙන් චාරිකා පිළිබඳ නියෝජිතයන්ගේ නීති රීති සංග්‍රහය අදහස් කෙරේ.

## තුන්වන උප ලේඛනය

(45 වන වගන්තිය)

සංචාරක නියමු කථිකාචාරවරුන්ගේ නීති රීති සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් කළ හැකි කාරණා.

1 නියෝග, අධීක්ෂණ, වර්ග කිරීම, සෝදිසි කිරීම, ආයතන පාලනය, සංචාරක මාර්ගෝපදේශකයෙකුගේ ව්‍යාපාරය තඩත්තු ක්‍රම සහ පවත්වාගෙන යාම.

2 බලයලත් අධිකාරියක් විසින් සංචාරක නියමු කථිකාචාර්යවරයෙකුගේ ව්‍යාපාර ලියාපදිංචි කර හෝ ඒ සඳහා බලපත්‍ර නිකුත් කර නැති නම්, එවැන්නකුගේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම වාරණය කිරීම, එවැනි ලියාපදිංචි කර ගැනීමක් හෝ බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර සහ ඒවා සකස් කර ගත යුතු ආකාරය සහ එවැනි අයදුම්පත් ලබා ගැනීම හෝ බැහැර කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය.

3 එවැනි ලියාපදිංචි කර ගැනීමක් හෝ බලපත්‍ර ලබා ගැනීමක් වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු, බලයලත් අධිකාරියක් විසින් එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබාදීමක් සඳහා අවසර දීමෙ හෝ ප්‍රතික්ෂේප කිරීමේ නියෝග සාදනු ලැබිය හැකි අවස්ථා සහ එවැනි අධිකාරියක් විසින් එවැනි ලියාපදිංච කිරීමක් හෝ බලපත්‍ර ලබාදීමක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියෝග සාදනු ලැබිය හැකි අවස්ථා.

4 එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර නිකුත් කිරීමක් වෙනුවෙන් අවසර දීමේ දී යටත් විය යුතු කොන්දේසි, එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබා ගැනීමක් කරගනු ලැබිය හැකි ආකෘති පත්‍රය හෝ ආකාරය, එවැනි ලියාපදිංචි කිරීමක් සඳහා සංචාරක නියමු කථිකාචාර්යවරුන් වර්ග කිරීම සහ එවැනි වර්ග කිරීම් වෙනස් කරගත හැකි හෝ සමාලෝචනය කරගත හැකි අවස්ථා.

5 එවැනි ලියාපදිංචි කිරීමේ හෝ බලපත්‍ර ලබා දීමේ කාල සීමාව

6 සංචාරක නියමු කථිකාචාර්යවරුන් ලියාපදිංචි කිරීම හෝ ඔවුන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ අරමුණින් නාම ලේඛන සහ පොත්පත් පවත්වාගෙන යාම, සංචාරක නියමු කථිකාචාර්යවරුන් විසින් ඔවුන්ගේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ සහ සෑම ශාඛා කාර්යාලයකදී ලියාපදිංචි කළ බවට සහතිකය සහ බලපත්‍ර ප්‍රදර්ශනය කිරීම සහ සංචාරක නියමු කථිකාචාර්යවරුන්ට අදාළව යම් මිල පාලන නියෝගවල විධිවිධාන යටතේ සහ එයට අනුව එකී කථිකාචාර්යවරුන් විසින් අයකරනු ලැබිය හැකි අයබදු හෝ ගාස්තුවල ලැයිස්තුවක් ප්‍රදර්ශනය කිරීම.

7 නීති රීති සංග්‍රහය යටතේ සකස් කළයම් අයදුම් පතක් බලයලත් අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ එකී අධිකාරිය විසින් එවැනි සංචාරක නියමු කථිකාචාර්යවරුන් ලියාපදිංචි කිරීම හෝ එවැනි කථිකාචාර්යවරුන්ට බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවීමෙන් හෝ අවලංගු කිරීමෙන් අතෘප්තියට පත් පුද්ගලයන් විසින් මෙම කාරණාව සඳහා පනත යටතේ ස්ථාපනය කරන ලද අධිකරණයකට අභියාචනයක් ඉදිරිපත් කිරීම.

8 නීති රීති සංග්‍රහය යටතේ සාදන ලද අයදුම්පතක් බැහැර කිරීම හෝ එම අයදුම්පත සමඟ එකඟවීම හෝ නීති රීති සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය හෝ කඩ කිරීම වලක්වා දැම්මට බලයලත් අධිකාරියට හැකියාව ලබාදීමේ අරමුණින් පරිශ්‍රයට ඇතුළුවීම සහ සෝදිසි කිරීම, පොත්පත් සහ ලිපි ලේඛන සෝදිසි කිරීම, වාර්තා හෝ තොරතුරු ඉදිරිපත් කිරීම, සහ පොත් පත් හෝ ලිපි ලේඛනවලින් උපුටන හෝ පිටපත් ලබාගැනීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි එවැනි බලතල.

9 සංචාරක නියමු කථිකාචාර්යවරුන්ගේ ව්‍යාපාරය ලියාපදිංචි කර, වර්ග කර සහ එයට බලපත්‍ර නිකුත් කර නැති නම්, මෙම නීති රීති සංග්‍රහය යටතේ ලියාපදිංචි කරන ලද වර්ග කරන ලද සහ බලපත්‍ර නිකුත් කරන

ලද. ඕනෑම සංචාරක නියමු කථිකාචාර්යවරුන්ගේ ව්‍යාපාරයක යම් නමක් හෝ තිල නාමයක් හෝ එහි කොටසක් එකතුකර ගැනීමේ හෝ ලබාගැනීමේ වාරණ.

10 නීති රීති සංග්‍රහයේ ඕනෑම විධිවිධානයන් උල්ලංඝනය හෝ කඩ කිරීම. මෙම පනත යටතේ වැරදි සහ එවැනි වැරදි සඳහා දඬුවම් සැපයීම.

11 ව්‍යාජ හෝ වාංචනික ලෙස නියෝජනයන් සිදු කරමින් නීති රීති සංග්‍රහය යටතේ ලියාපදිංචි කළ යුතු හෝ බලපත්‍ර ලබා දිය යුතු සංචාරක නියමු කථිකාචාර්යවරයෙකුගේ හිමිකම ලබා ගැනීමට හෝ එසේ හිමිකම ලබා ගැනීමට උත්සහ දරන්නේ නම්. මෙම පනත යටතේ එය වරදක් වන අතර එවැනි වැරදි සඳහා දඬුවම්.

12 සංචාරක නියමු කථිකාචාර්යවරුන් විසින් සපයනු ලබන පහසුකම් හා ඉටුකරනු ලබන සේවා වෙනුවෙන් සංචාරකයන් විසින් ගෙවීම් සිදු කරනු ලබන ක්‍රම සහ ආකාරය සහ එවැනි කථිකාචාර්යවරුන් විසින් එවැනි ගෙවීම් ලබා ගන්නා ක්‍රම සහ ආකාරය.

13 නීති රීති සංග්‍රහය යටතේ යම් සංචාරක නියමු කථිකාචාර්යවරයකුට නිකුත් කරන ලද ඕනෑම බලපත්‍රයක් ඔහු විසින් පැවරීම වාරණය කිරීම සහ එවැනි පැවරීමක් බල රහිත කළ යුතු බවට ප්‍රකාශනය.

14 පූර්වොක්ත ඕනෑම කරුණකට සම්බන්ධ හෝ අනුශාංගික අනෙකුත් සියලු කරුණු.

15 මෙම උප ලේඛනයේ "නීති රීති සංග්‍රහය" යන්නෙන් සංචාරක නියමු කථිකාචාර්වරුන්ගේ නීති රීති සංග්‍රහය අදහස් කෙරේ.

## හතතර වන උප ලේඛනය

(45 වන වගන්තිය)

නිශ්චිත නියම කරනු ලබන සංචාරක සේවා නීති රීති සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් කළ හැකි කාරණා.

1 නියෝග, අධීක්ෂණ, වර්ග කිරීම, සෝදිසි කිරීම, ආයතන පාලනය, නිරූපිත සංචාරක සේවා ව්‍යාපාර නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම.

2 බලයලත් අධිකාරියක් විසින් නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා ව්‍යාපාර ලියාපදිංචි කර හෝ ඒ සඳහා බලපත්‍ර නිකුත් කර නැති නම්, එවැනි ව්‍යාපාර කටයුතු කරගෙන යාම වාරණය කිරීම, එවැනි ලියාපදිංචිකර ගැනීමක් හෝ බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර සහ ඒවා සකස් කර ගත යුතු ආකාරය සහ එවැනි අයදුම්පත් ලබාගැනීම හෝ බැහැර කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය.

3 එවැනි ලියාපදිංචි කර ගැනීමක් හෝ බලපත්‍ර ලබා ගැනීමක් වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු, බලයලත් අධිකාරියක් විසින් එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබාදීමක් සඳහා අවසරදීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ නියෝග සාදනු ලැබිය හැකි අවස්ථා සහ එවැනි අධිකාරියක් විසින් එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබාදීමක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියෝග සාදනු ලැබිය හැකි අවස්ථා.

4 එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර නිකුත් කිරීමක් වෙනුවෙන් අවසර දීමේදී යටත් විය යුතු කොන්දේසි, එවැනි ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍ර ලබා ගැනීමක් කරනු ලැබිය හැකි ආකෘති පත්‍රය හෝ ආකාරය, එවැනි ලියාපදිංචි කර ගැනීමක් සඳහා නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා වර්ග කිරීම සහ එවැනි වර්ග කිරීම වෙනස් කරගත හැකි හෝ සමාලෝචනය කරගත හැකි අවස්ථා.

5 **එවැනි ලියාපදිංචි කිරීමේ හෝ බලපත්‍ර ලබාදීමේ කාල සීමා.**

6 නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා ලියාපදිංචි කිරීම හෝ ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ අරමුණින් නාම ලේඛන සහ පොත්පත් පවත්වාගෙන යාම, ඔවුන්ගේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ සහ සෑම ශාඛා කාර්යාලයක දී නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා ලියාපදිංචි කර ඇති බවට ලබාගත් සහතිකය සහ බලපත්‍රය ප්‍රදර්ශනය කිරීම සහ නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවාවලට අදාළව යම් මිල පාලන නියෝගවල විධිවිධාන යටතේ සහ එයට අනුව එකී සේවා වෙනුවෙන් අය කරනු ලැබිය හැකි අයබදු හෝ ගාස්තුවල ලැයිස්තුවක් ප්‍රදර්ශනය කිරීම.

7 නීති රීති සංග්‍රහය යටතේ සකස් කළයම් අයදුම්පතක් බලය ලත් අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ එකී අධිකාරිය විසින් එවැනි නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සෙවා ලියාපදිංචි කිරීම හෝ එම සේවාවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, අත්හිටුවීමෙන් හෝ අවලංගු කිරීමෙන් අතෘප්තියට පත් පුද්ගලයන් විසින් මෙම කාරණාව සඳහා මෙම පනත යටතේ ස්ථාපනය කරන ලද අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීම.

8 නීති රීති සංග්‍රහය යටතේ සාදන ලද අයදුම් පතක් බැහැර කිරීම හෝ එම අයදුම් පත සමඟ එකඟවීම හෝ නීති රීති සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය හෝ කඩ කිරීම් වළක්වා දැමීමට බලයලත් අධිකාරියට හැකියාව ලබාදීමේ අරමුණින් පරිශ්‍රයට ඇතුළුවීම, සහ සෝදිසි කිරීම, පොත් පත් සහ ලිපි ලේඛන සෝදිසි කිරීම, වාර්තා හෝ තොරතුරු ඉදිරිපත් කිරීම සහ පොත් පත් හෝ ලිපි ලේඛන වලින් උපුටන හෝ පිටපත් ලබා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි එවැනි බලතල.

9 නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා ව්‍යාපාර ලියාපදිංචි කර, වර්ග කර සහ එයට බලපත්‍ර නිකුත් කර නැති නම්, මෙම නීති රීති සංග්‍රහය යටතේ ලියාපදිංචි කරන ලද, වර්ග කරන ලද සහ බලපත්‍ර

නිකුත් කරන ලද ඕනෑම නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවාවක යම් නමක් හෝ නිල නාමයක් හෝ එහි කොටසක් එකතුකර ගැනීමේ හෝ ලබා ගැනීමේ චාරණ.

10 නීති රීති සංග්‍රහයේ ඕනෑම විධිවිධානයක් උල්ලංඝනය හෝ කඩ කිරීම, මෙම පනත යටතේ වැරදි සහ එවැනි වැරදි සඳහා දඬුවම් සැපයීම.

11 ව්‍යාජ හෝ වාංචනික ලෙස නියෝජනයන් සිදු කරමින් නීති රීති සංග්‍රහය යටතේ ලියාපදිංචි කළයුතු හෝ බලපත්‍ර ලබා දිය යුතු නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවාවක හිමිකම ලබා ගැනීම හෝ එසේ හිමිකම ලබා ගැනීමට උත්සහ දරන්නේ නම් මෙම පනත යටතේ එය වරදක් වන අතර එවැනි වැරදි සඳහා දඬුවම්.

12 නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා මගින් සපයා දෙනු ලබන පහසුකම් ඉන් ඉටුවන සේවා වෙනුවෙන් සංචාරකයන් විසින් ගෙවීම් සිදු කරනු ලබන ක්‍රම සහ ආකාරය සහ එවැනි සේවා වෙනුවෙන් ගෙවීම් ලබා ගන්නා ක්‍රම සහ ආකාරය.

13 නීති රීති සංග්‍රහය යටතේ නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් පවරාදීම වාරණය කරීම සහ එවැනි පැවරීමක් බල රහිත කළයුතු බවට ප්‍රකාශනය.

14 පූර්වොක්ත ඕනෑම කාරුණකට සම්බන්ධ හෝ ආනුශංගික අනෙකුත් සියලු කරුණු.

15 මෙම උප ලේඛනයේ "නීති රීති සංග්‍රහය" යන්නෙන් නිශ්චිතව නියම කරනු ලබන සංචාරක සේවා නීති රීති සංග්‍රහය අදහස් කෙරේ.

# නව සංචාරක නීති සමාලෝචනය කිරීම

# සඳහා පත් කළ

# විශේෂ කමිටුවේ වාර්තාව

# සහ

# සංචාරක කටයුතු පිළිබඳ තිරසාර

# සංවර්ධනයක

# ඉදිරි ගමන සඳහා නිර්දේශ

# ඉදිපත් කිරීම.

අ - අතිරේකය

**2006 මැයි**

# අන්තර් ගතයන්

(1) 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත සංශෝධනය කිරීම.

(2) සංචාරක කටයුතු සහ හෝටල කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය ස්ථාපනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා වූ පනත.

# 1966 අංක 10 දරන

# ලංකා සංචාරක මණ්ඩල පනත

# සංශෝධනය කිරීම.

## 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වන පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම පනත 2006 අංක .... දරන ලංකා සංචාරක මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක විය යුතුය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යන දිගු නාමයෙහි සඳහන් "ලංකාවට හෝ ලංකාව තුළ හෝ ලංකාවෙන් පිටතට සිදු කරනු ලබන සංචාරක චාරිකා දිරි ගැන්වීම, ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා වන ලංකා සංචාරක මණ්ඩලය" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවට හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කරනු ලබන සංචාරක චාරිකා දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1996 අංක 10 දරන පනතේ දිගු නාමය සංශෝධනය කිරීම.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ සෙසු සෑම ලිඛිත නීතියකම සඳහන් :- ලංකා සංචාරක මණ්ඩලය සහ ලංකා සංචාරක මණ්ඩල පනත පිළිවෙළින් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය සහ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල පනත යනුවෙන් හැඳින්වීම.

(අ) "ලංකා සංචාරක මණ්ඩලය පනත" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල පනත" යන වචන ද,

(ආ) "ලංකා සංචාරක මණ්ඩලය" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය" යන වචනද,

ආදේශ කළ යුතුය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ලංකා සංචාරක මණ්ඩල පනත" සහ "ලංකා සංචාරක මණ්ඩලය" යනුවෙන් වන සෑම සඳහනක්ම පිළිවෙළින් "ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල පනත" සහ "ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය" යනුවෙන් කියවා වටහා ගත යුතුය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

මණ්ඩලයේ සංයුතිය

(1) මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන්, එනම් :-

(අ) චාරිකා සහ සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ප්‍රකට තැනැත්තෙකුගෙන්,

(ආ) මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය නියෝජනය කරන තැනැත්තෙකුගෙන්,

(ඇ) පළාත් සභා විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, එම අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය නියෝජනය කරන තැනැත්තෙකුගෙන්,

(ඇ) ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය විසින් නම් කරනු ලබන එම සංගමය නියෝජනය කරන තැනැත්තෙකුගෙන්.

(ඈ) ශ්‍රී ලංකා ආගමික චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එම සංගමය නියෝජනය කරන තැනැත්තෙකුගෙන්

(ඊ) ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයෙහි කුඩා හා මධ්‍ය ව්‍යවසාය සංගමය විසින් නම් කරනු ලබන එම සංගමය නියෝජනය කරන තැනැත්තෙකුගෙන්.

(උ) අලෙවිකරණ ක්ෂේත්‍රයෙහි හැකියාව සහ පළපුරුද්ද පෙන්වා ඇති තැනැත්තෙකුගෙන්. සහ

(ඌ) නීති හෝ ඉංජිනේරු හෝ ගිණුම්කරණය හෝ යන ක්ෂේත්‍රයක හැකියාව සහ පළපුරුද්ද පෙන්වා ඇති තැනැත්තෙකුගෙන්.

සමන්විත විය යුතුය.

(2) 1 වන උප වගන්තියෙහි (අ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයා මණ්ඩලයේ සභාපති විය යුතුය.

(3) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තුවෙහි හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක හෝ සාමාජිකයෙකු වේ නම් හෝ සාමාජිකයෙකු බවට පත්වන්නේ නම් හෝ එම පුද්ගලයා මණ්ඩලයේ සාමාජිකයෙකු බවට පත්වීමට හෝ සාමාජිකයෙකු වශයෙන් රැඳී සිටීමට හෝ නුසුදුසු වන්නේය.

(4) මණ්ඩලය විසින් එළැඹුනු ගිවිසුමක් හෝ එළැඹීමට යෝජිත ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රාකාරව උනන්දුවක් දක්වන සාමාජිකයෙකු ස්වකීය මනාපයෙහි ස්වභාවය පිළිබඳව මණ්ඩලයේ රැස්වීමකදී අනාවරනය කළ යුතු අතර එවැනි අනාවරණ මණ්ඩලයේ වාර්තාවල සටහන් කළ යුතුය. එම ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරනු ලබන සාකච්ජා සඳහා හෝ ගනු ලබන තීරණ සඳහා එම සාමාජිකයා සහභාගී නොවිය යුතුය.

(5) මණ්ඩලයේ කවර හෝ සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(6) මණ්ඩලයේ කවර සාමාජිකයෙකු විසින් වුවද, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය. අමාත්‍යවරයා විසින් ලිඛිතව එම ඉල්ලා අස්වීම භාර ගත් දින සිට එය බලාත්මක විය යුතුය.

(7) අසනීපවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් හෝ නිසා සභාපතිවරයාට හෝ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සිය ධුරයේ කටයුතු තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, ඔහු එසේ නොපැමිණ සිටින කාල සීමාව සඳහා, (1) වන උපවගන්තියේ විධිවිධාන සලකා බැලීමෙන් අනතුරුව, සභාපතිවරයා හෝ එම සාමාජිකයා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් යම් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

(8) මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම හෝ නිසා කල් පිරීමට ප්‍රථම ධුරය අත්හරිනු ලැබුවහොත් මිය යෑම සාමාජිකයෙකුගේම ධුර කාලය වසර පහකි. කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේය.

(9) මණ්ඩලයෙහි සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයෙකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීම හේතු කොට ගෙන මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ තීති කර්තව්‍යයක් නිර්බල වූ ලෙස නොසැලකිය යුතුය.

(10) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය සහිතව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි මණ්ඩලයේ අරමුදලෙන් මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතුය.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියෙහි 15අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය. ප්‍රධාන ප්‍රඥප්තියට 15අ නව වගන්තිය ඇතුළත් කිරීම.

15අ(1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත (මෙම වගන්තියෙහි "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංචාරක උපදේශක කමිටුවක් තිබිය යුතුය. සංචාරක උපදේශක කමිටුව.

(අ) පිළිවෙළින් නාගරික හෝටල් නිකේතන සහ සංචාරක හෝටල් නියෝජනය කිරීම සඳහා

ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු.

(ආ) ශ්‍රී ලංකා ආගමික චාරිකා මෙහෙයවන්නන් ගේ සංගමය විසින් නම් කරනු ලබන එක් තැනැත්තෙකු

(ඇ) ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයෙහි කුඩා හා මධ්‍ය ව්‍යවසාය සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු.

(ඈ) ශ්‍රී ලංකා චාරිකා නියෝජිත සංගමය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු.

(ඉ) රජය විසින් ජාතික ගුවන් සේවය වශයෙන් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු.

(ඊ) ගුවන් සේවා නියෝජිත මණ්ඩලය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු. සහ

(උ) චාරිකා හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ප්‍රකට පුද්ගලයන් අතුරින් තිදෙනෙකු මෙම තිදෙනාගෙන් එක් අයෙකු කමිටුවේ සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතුය.

(2) අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් කමිටුවේ කවර සාමාජිකයෙකුට වුවද සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(3) මණ්ඩලයේ කවර හෝ සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, කමිටු සාමාජිකයෙකුගේ ධුර කාලය වසර පහකි.

(5) කමිටුවේ සභාපති ලෙස පත් කරනු ලබන සාමාජිකයා කමිටු රැස්වීම මෙහෙය විය යුතුය. යම් කමිටු රැස්වීමක් සඳහා සභාපති සහභාගී නොවන විට එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන් තමන් අතුරින් කෙනෙකු අදාළ රැස්වීම සඳහා සභාපති වශයෙන් තෝරා පත්කර ගත යුතුය.

(6) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය සහිතව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි මණ්ඩලයේ අරමුදලෙන් කමිටු සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතුය.

(7) කමිටුව එයට අයත් කාර්යයන් ඉටු කරලනු පිණිස අවශ්‍ය සෑම අවස්ථාවකදීම රැස්විය යුතුය.

(8) කමිටුවේ උපදෙස් පතා මණ්ඩලය විසින් එය වෙත යොමු කරනු ලබන සියලුම කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දිය යුතු අතර චාරිකා හා සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට සම්බන්ධ ඕනෑම කරුණක් පිළිබඳව ද මණ්ඩලයට උපදෙස් දිය හැකිය.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) මණ්ඩලය ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී ද, කාර්ය කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී ද අමාත්‍යවරයා විසින් වරින් වර ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි ප්‍රතිපතති විධානවලට යටත් වන අතර එවැනි විධානවලට අනුම ක්‍රියා කළ යුතුය.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (1) වන උපවගන්තිය අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කිරීම මගින් එම වගනතිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය:-

(අ) සංචාරක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු.

(ආ) පිළිවෙළින් අලෙවිකරණ සහ ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව, සැලසුම් සහ සංවර්ධන දෙපාර්තමේන්තුව සහ නියාමන දෙපාර්තමේන්තුව භාර අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු තිදෙනෙකු

සහ

(ඇ) මණ්ඩලයේ කටයුතු නිසි ලෙස කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යැයි මණ්ඩලය විසින සලකනු ලබන වෙනත් නිලධාරින් සහ සේවකයන්"

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තිය අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මණ්ඩලය ස්වකීය කටයුතු නිසි ලෙස හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන අලෙවිකරණ සහ ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවක්, සැලසුම් හා සංවර්ධන දෙපාර්තමේන්තුවක්, තියාමන දෙපාර්තමේන්තුවක් සහ එවැනි වෙනත් දෙපාර්තමේන්තු පිහිටුවා පවත්වාගෙන යා යුතුය."

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන හා 23 වන වගන්ති මෙයින් අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන හා 23 වන වගන්ති ප්‍රතිස්ථාපනය කිරීම.

"22) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව මණ්ඩලයේ ගිණුම් විගණනයට අදාළ විය යුතුය. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 හා 23 වන වගන්ති ප්‍රතිස්ථාපනය කිරීම.

23) (1) සංචාරක සංවර්ධන අරමුදල නම් වූ අරමුදලක් පිහිටුවිය යුතුය. මණ්ඩලයේ ගිණුම් අරමුදල

(2) (අ) 2003 අංක 25 දරන මුදල් පනතේ 2 වන වගන්තිය ප්‍රකාර අපගමන බද්ද ලෙස එකතු කර ගනු ලබන සියලුම මුදල්වලින් තුනෙන් එකක මුදල් ප්‍රමාණයක්. සංචාරක සංවර්ධන අරමුදල.

(ආ) 2003 අංක 25 දරන මුදල් පනතේ 11 වන වගන්තිය යටතේ සංචාරක සංවර්ධන බද්ද ලෙස පනවා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කර ගනු ලබන සියලුම සංචාරක සංවර්ධන අරමුදලට ගෙවිය යුතුය."

(3) මණ්ඩලය විසින් සංචාරක සංවර්ධන අරමුදල කළමනාකරනය කළ යුතුය.

(4) (5) වන උපවගන්තිය යටතේ සංචාරක කර්මාන්තය සහ හෝටල් කළමනාකරනය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය වෙත සංචාරක සංවර්ධන අරමුදලෙන් ලබාදිය යුතු යැයි තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණ මණ්ඩලය විසින් වාර්ෂිකව අදාල ආයතන වෙත ගෙවිය යුතුය.

(5) මණ්ඩලයට සංචාරක කර්මාන්තය සහ හෝටල් කළමනාකරනය පිළිබඳ සිරිමාවෝ බණ්ඩානායක ආයතනයට සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට සංචාරක සංවර්ධන අරමුදලෙන් වාර්ෂිකව ගෙවිය යුතු මුදල, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, සංචාරක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් සහ මණ්ඩලයේ සභාපති යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් තීරණය කළ යුතුය.

(6) (4) වන උපවගන්තිය යටතේ සංචාරක සංවර්ධන අරමුදලෙන් ගෙවනු ලබන මුදල්

මණ්ඩලය, සංචාරක කර්මාන්තය සහ හෝටල් කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය මගින් මානව සම්පත් සංවර්ධනය ඇතුළු සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා පමණක් භාවිත කළ යුතු අතර සංචාරක යටිතල පහසුකම් ව්‍යාපෘතීන්හි ප්‍රාග්ධන ආයෝජන සඳහා යොදා නොගත යුතුය.

(7) 5 වන උපවගන්තිය යටතේ මණ්ඩලය, සංචාරක කර්මාන්තය සහ හෝටල් කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය යන ආයතන වෙත ලබාදෙන මුදල තීරණය කිරීම කමිටුවට පහසු කරලනු වස්, සෑම මුදල් වර්ෂයක් ආරම්භයේදීම එම ආයතනය විසින් අදාළ මුදල් වර්ෂය තුළ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සහ සංවර්ධනය වෙනුවෙන් වැය කිරීමට යෝජිත වියදම් පිළිබඳ විස්තර සහිත වැඩසටහන් අයවැය ප්‍රකාශයක් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

(8) මණ්ඩලය විසින් සංචාරක සංවර්ධන අරමුදලේ ආදායම් හා වියදම් පිළිබඳව සහ සෙසු සියලුම ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතුය.

(9) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව, සංචාරක සංවර්ධන අරමුදලේ ගිණුම් විගණනයට අදාළ වේ.

(10) "අමාත්‍යවරයා" යන අර්ථ දැක්වීමට ඉක්හිතිවම පහළින් පහත සඳහන් අර්ථ දැක්වීම ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

(11) සැක ඇතිවීම වැලැක්වීම පිණිස 2005 අංක 38 දරන සංචාරක කර්මාන්ත පනත මෙයින් අවලංගු වන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. 2005 අංක 38 දරන සංචාරක කර්මාන්ත පනත අවලංගු කිරීම.

(12) මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

# සංචාරක කර්මාන්තය

සහ

# හෝටල් කළමනාකරණය පිළිබඳ

සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය නම් වූ
ආයතනයක් පිහිටුවීම සඳහා ද

ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද
විධිවිධාන සැලැස්වීම සඳහා වූ
පනතකි.

**සංචාරක කර්මාන්තය සහ හෝටල් කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය නම් වූ ආයතනයක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

1. මෙම පනත 2006 අංක ..... දරන සංචාරක කර්මාන්ත සහ හෝටල් කළමනාකරණ පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයකදී ක්‍රියාත්මක විය යුතුය. — ලුහුඬු නාමය.

## I වන කොටස

සංචාරක කර්මාන්තය සහ හෝටල් කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය පිහිටුවීම සහ එහි ව්‍යවස්ථාවලිය.

2. (1) (මෙම පනතේ "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සංචාරක කර්මාන්තය සහ හෝටල් කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතුය. — සංචාරක කර්මාන්තය සහ හෝටල් කළමනාකරණය පිළිබඳ සිරිමාවෝ බණ්ඩාරනායක ආයතනය පිහිටුවීම.

(2) (1) වන උප වගන්තිය මගින් ආයතනය වෙත පවරා දී ඇති නමින් ආයතනය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ආයතනයක් විය යුතු අතර, එම නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකිය.

3. ආයතනයේ කාර්යයන් පහත සඳහන් පරිදි විය යුතුය. :- ආයතනයේ කාර්යයන්

(අ) සත්කාරක සහ සංචාරක කර්මාන්තවල කළමනාකරණ, අධීක්ෂණ, පුහුණු හා අර්ධ-පුහුණු, මිනිස් බලය සඳහා වන දේශීය සහ විදේශීය අවශ්‍යතා සපුරාලනු පිණිස සෑම මට්ටමකම තැනැත්තන් පුහුණු කිරීම සහ එසේ පුහුණු කරනු ලබන තැනැත්තන් සඳහා සහතිකපත් හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

(ආ) වන්දිකා පාසල් ජාලයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ අදාළ පළාත් සභාවෙන් විමසීමෙන් අනතුරුව සෑම පළාතකම යටත් පිරිසෙයින් එක් පැසලක්වත් පිහිටුවීම.

(ඇ) සත්කාරක සහ සංචාරක කර්මාන්තවල සේවයෙහි නියුක්ත තැනැත්තන්ගේ වෘත්තිය නිපුණතා වර්ධනය කරනු වස් අදාළ බලධාරීන්ගේ උපදෙස් ඇතිව ජාතික සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ ක්‍රමයක් ආරම්භ කිරීම සහ එවැනි තැනැත්තන් සඳහා ප්‍රමිතීන් නියම කිරීම.

(ඈ) වෙළඳාම, පරීක්ෂා කිරීම සහ සහතික පත්‍ර ලබාදීම සඳහා පහසුකම් සැපයීම.

(ඉ) වෙනත් සත්කාරක පුහුණු ආයතන සහ විශ්ව විද්‍යාල සමඟ පුහුනු සහ හුවමාරු වැඩසටහන් ආරම්භ කිරීම.

(ඊ) ආයතනයේ කාර්යයන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධ තොරතුරු මහජනතාව සහ වෙනත් අදාල ආයතන අතර ප්‍රචලිත කිරීම.

(උ) සියලුම අංශවලට අයත් සංචාරක මාර්ගෝපදේශකයන් පුහුණු කිරීම සහ සහතිකපත් නිකුත් කිරීම.

(ඌ) සංචාරක කර්මාන්තයේ කාර්යයන් සඳහා විදේශ භාෂා සහ තොරතුරු තාක්ෂණය ඵලදායී ලෙස ඉගැන්වීමේ කාර්යය ප්‍රවර්ධනය කිරීම.

(එ) සංචාරක කර්මාන්තය හා සම්බන්ධ පර්යේෂණ සහ පැවරුම් ආරම්භ කිරීම.

(ඒ) ආයතනය විසින් පිරිනමනු ලබන සහතිකපත් සහ ඩිප්ලෝමා අන්තර්ජාතික මට්ටමින් පිළිගැනීම සහතික කරලනු වස් ප්‍රතීතකරණ ක්‍රමයක් ආරම්භ කර පවත්වාගෙන යාම.

(ඔ) සත්කාරක සහ සංචාරක කර්මාන්තවල පවත්නා රැකියා ප්‍රවණතා, මිනිස් බලය හා පුහුණු අවශ්‍යතා පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.

(ඕ) සත්කාරක සහ සංචාරක කළමනාකරණය පිළිබඳ උසස් පාඨමාලා ආරම්භ කර පවත්වාගෙන යාම, සහ

(ඖ) සත්කාරක සහ සංචාරක කළමනාකරණ ක්ෂේත්‍රයට අදාල පුහුණු කිරීම් සඳහා වාණිජ පදනමක් මත නවාතැන්, ආහාරපාන වර්ග

මෙන්ම සම්මන්ත්‍රණ පැවැත්වීමේ පහසුකම් සහිත ආදර්ශ සංචාරක හෝටලයක් ආයතනය තුළ ක්‍රියාත්මක කිරීම.

4. ආයතනයට පහත දැක්වෙන බලතල තිබිය යුතුය :- ආයතනයේ බලතල

(අ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම, කුලියට දීම, උකස් කිරීම, මඩපතය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(ආ) සත්කාරක සහ සංචාරක කළමනාකරණය පිළිබඳ පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා ක්‍රියාත්මක කිරීම.

(ඇ) සත්කාරක සහ සංචාරක කළමනාකරණ ක්ෂේත්‍රයේ සියලුම අංශ පිළිබඳ පර්යේෂණ කිරීම, සහායවීම, සම්බන්ධීකරණය කිරීම සහ දිරිදීම.

(ඇ) එහි නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් අතර විනය පාලනය ක්‍රියාත්මක කිරීම.

(ඉ) ආයතනය විසින් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු හෝ අය කිරීම් පැනවීම.

(ඊ) ආයතනයේ කාර්යයන් සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ ආම්පන්න ආනයනය කිරීම සහ එහි කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය ආම්පන්න, අරමුදල් සහ අන්‍යාකාරයේ සහාය ලබාගැනීම.

(උ) ආයතනයේ නිලධාරීන් සහ සේවකයන් සඳහා කාර්ය සාධන ප්‍රමිති නියම කර එම ප්‍රමිතීන්ට අනුව ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීම.

(ඌ) ආයතනයේ නිලධාරීන් සහ සේවකයන් සඳහා සුභසාධන සහ විනෝද පහසුකම් ආරම්භ කර පවත්වාගෙන යාම.

(එ) ආයතනයේ නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම, පුහුණු කිරීම සහ උසස් කිරීම, පාරිශ්‍රමික ගෙවීම, විනය පාලනය සහ නිවාඩු ලබාදීම ඇතුළුව ඔවුන් සම්බන්ධයෙන් නීති සකස් කිරීම.

(ඒ) ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් නීති සකස් කිරීම.

(ඔ) සත්කාරක සහ සංචාරක කළමනාකරණය හා සම්බන්ධ ජාතික හා අන්තර්ජාතික ආයතනවලදී සහ සම්මන්ත්‍රණවලදී ආයතනය නියෝජනය කිරීම.

(ඕ) ආයතනයේ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය හෝ ඒවාට හිතකර හෝ ආනුෂංගික සෙසු සියලුම කාර්යයන් කිරීම.

5. ආයතනය ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී හෝ කාර්ය ඉටු කිරීමේදී සත්කාරක සහ සංචාරක කළමනාකරණය සම්බන්ධ රජයේ ප්‍රතිපත්තිවලට සහ අමාත්‍යවරයා විසින් ලිඛිතව නිකුත් කරනු ලබන ප්‍රතිපත්ති නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතුය. ආයතනය අමාත්‍යවරයාගේ නියෝගවලට යටත්ව බලතල ක්‍රියාත්මක කිරීම.

6. 7 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන පාලක මණ්ඩලය විසින් ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සිදු කළ යුතුය.

ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා මණ්ඩලය.

7. (1) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් වෙත පැවරිය යුතුය.

මණ්ඩලයේ සංයුතිය.

(අ) අදාළ කාලපරිච්ඡේදය තුළ සංචාරක කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරන තැනැත්තා, මොහු මණ්ඩලයේ සභාපති විය යුතුය.

(ආ) අදාළ කාලපරිච්ඡේදය තුළ වෘත්තිය පුහුණු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරන තැනැත්තා හෝ එම අමාත්‍යවරයාගේ නාමිකයෙකු වන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තරාතිරමට පහළ නොවන තරාතිරමක් දරන නිලධාරියෙකු.

(ඇ) අදාළ කාල පරිච්ඡේදය තුළ පළාත් සභා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරන තැනැත්තා හෝ එම අමාත්‍යවරයාගේ නාමිකයෙකු වන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තරාතිරමට පහළ නොවන තරාතිරමක් දරන නිලධාරියෙකු.

(ඇ) අදාල කාල පරිච්ඡේදය තුළ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරන තැනැත්තා හෝ එම අමාත්‍යවරයාගේ නාමිකයෙකු වන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තරාතිරමට පහළ නොවන තරාතිරමක් දරන නිලධාරියෙකු.

(ඉ) අදාළ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති ධූරය දරන තැනැත්තා.

(ඊ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතින් ස්ථාපිත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදාළ කාල පරිච්ඡේදය තුළ සභාපති ධූරය දරන තැනැත්තා හෝ එම සභාපති විසින් නම් කරනු ලබන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු. සහ

(උ) සත්කාරක සහ සංචාරක කළමනාකරණය යන ක්ෂේත්‍රවල පිළිගත් සුදුසුකම් සහ පුළුල් අත්දැකීම් සහිත තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන එක් සාමාජිකයෙකු.

(2) 11 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ආයතන ලේඛකාධිකාරිවරයා මණ්ඩලයේ ලේකම් වශයෙන් ක්‍රියා කළ යුතුය.

(3) මෙම පනතේ උප ලේඛනයෙහි අඩංගු විධිවිධාන මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධූර කාලය, එම සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික, මණ්ඩලයේ රැස්වීම් සහ නිල ලාංඡනය සම්බන්ධයෙන් බල පැවැත්වේ.

8\. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත (මෙම වගන්තියේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) උපදේශක සභාවක් තිබිය යුතුය.

ආයතනයේ උපදේශක සභාව.

(අ) සංචාරක අධ්‍යක්ෂ ජනරාල්.

(ආ) ලංකා හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු.

(ඈ) ශ්‍රී ලංකා ආගමික චාරිකා) මෙහෙයවන්නන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු.

(ඉ) ශ්‍රී ලංකා චාරිකා නියෝජිත සංගමය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු.

(ඊ) ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයෙහි කුඩා හා මධ්‍ය ව්‍යාපාර සංගමය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු සහ

(උ) ශ්‍රී ලංකා ජාතික සංචාරක නියමු කථිකාචාර්යවරුන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු.

(2) සභාවේ කවර සාමාජිකයකු විසින් වුවද, අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(3) මණ්ඩලයේ කවර හෝ සාමාජිකයෙකු, අමාත්‍යවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභා සාමාජිකයෙකුගේ ධුර කාලය වසර පහක් විය යුතුය.

(5) සංචාරක අධ්‍යක්ෂ ජනරාල් විසින් සභා රැස්වීම්හි මූලසුන හෙබවිය යුතුය. යම් සභා රැස්වීමක් සඳහා සභාපති සහභාගී නොවන විට, එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන් තමන් අතරින් කෙනෙකු එම රැස්වීමේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත යුතුය.

(6) සභාව එයට අයත් කාර්යයන් ඉටු කරලනු පිණිස අවශ්‍ය සෑම අවස්ථාවකදීම රැස්විය යුතුය.

(7) මෙම වගන්තියේ සෙසු විධිවිධානවලට යටත්ව, සභා රැස්වීම්හිදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ කටයුතු පිළිබඳව සභාවට තීරණය කළ හැකිය.

(8) සභාවේ උපදෙස් පතා මණ්ඩලය විසින් යොමු කරනු ලබන සියලුම කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා දිය යුතු අතර, සත්කාරක හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයෙහි පුහුණු කිරීම් හා සම්බන්ධ කරුණු පිළිබඳවද ස්වායත්තයෙන් මණ්ඩලයට උපදෙස් දිය හයැකිය.

(9) මණ්ඩලයට ස්වකීය බලතල හා කාර්ය ආයතනයේ ප්‍රධානියා හෝ වෙනත් නිලධාරියෙකු වෙත පැවරිය හැකිය.

මණ්ඩලයේ බලතල හෝ වගකීම් පැවරීම.

ii වන කොටස

ආයතනයේ ප්‍රධානියා සහ මණ්ඩලයේ සෙසු නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම.

10. (1) සත්කාරක සහ සංචාරක කළමනාකරණ ක්ෂේත්‍රයෙහි තිසි සුදුසුකම් සහිත (මෙහි මින් මතු "ප්‍රධානියා" වශයෙන් සඳහන් කරනු ලබන) අයෙකු ආයතනයේ ප්‍රධානියා ලෙස මණ්ඩලය විසින් පත් කළ යුතුය. ප්‍රධානියා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතුය.

(2) මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සහ එහි සාමාන්‍ය නියෝගවලට යටත්ව ආයතන කාර්ය මණ්ඩලයේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම ප්‍රධානියාගේ වගකීම විය යුතුය.

(3) මණ්ඩලය විසින් තමා වෙත පවරා දෙනු ලබන පරිදි ප්‍රධානියා විසින් බලතල ක්‍රියාත්මක කිරීම, යුතුකම් ඉටු කිරීම සහ කාර්ය කිරීම සිදු කළ යුතුය.

(4) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රධානියාට පාරිශ්‍රමික ගෙවිය යුතුය.

11\. (1) පනතේ සෙසු විධිවිධානවලට යටත්ව,

ආයතන කාර්ය මණ්ඩලය පත් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල.

(අ) ලේඛකාධිකාරීවරයෙකු සහ ආයතනයේ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන පරිදි වෙනත් නිලධාරීන් සහ සේවකයන් ආයතන කාර්ය මණ්ඩලයට පත් කිරීමට,

(ආ) සේවයෙන් පහ කිරීමට සහ ආයතන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීමට,

(ඇ) ආයතනයේ කාර්ය මණ්ඩලයේ වැටුප් හෝ වේතන හෝ වෙනත් පාරිශ්‍රමික හෝ නියම කිරීමට,

(ඈ) ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවාව සම්බන්ධයෙන් කොන්දේසි සහ නියමයන් තීරණය කරීමට මණ්ඩලයට බලය ඇත.

(2) (1) වන උප වගන්තියෙහි සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් කවර හෝ එකක් සම්බන්ධයෙන් මෙම පනත යටතේ නීති සකස් කළ හැකිය.

12\. (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයෙහි නියුතු කවර හෝ නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම

ආයතන කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධාරීන් පත් කිරීම.

එකඟත්වයක් සහිතව තීරණය කරනු ලබන කාල පරිච්ඡේදයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(2) යම් රාජ්‍ය නිලධාරියෙකු ආයතන කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කළ කල්හි, 1971 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියෙහි (2) වන උප වගන්තියෙහි සඳහන් විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුත්තේය.

(3) යම් රාජ්‍ය නිලධාරියෙකු ආයතන කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කළ කල්හි 1991 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියෙහි (3) වන උප වගන්තියෙහි සඳහන් විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුත්තේය.

(4) රාජ්‍ය සංස්ථාවක කවර හෝ නිලධාරියෙකු හෝ සේවකයෙකු, එම නිලධාරියාගේ හෝ සේවකයාගේ සහ එම සංස්ථාවේ පාලන අධිකාරියේ මනාපය සහිතව එම පාලන අධිකාරිය සහ මණ්ඩලය විසින් එකඟත්වය පළ කරනු ලබන පරිදි අර්ථ සාධක අරමුදල් හිමිකම් සම්බන්ධ නියමයන් ඇතුළුව කොන්දේසි සහ නියමයන් මත ආයතන කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(5) යම් විශේෂිත කාලපරිච්ඡේදයක් තුළ රජයට සේවය කිරීම සඳහා රජය සමඟ ගිවිසුමකට එළඹි පුද්ගලයෙකු ආයතනය මගින් සේවයෙහි නියුක්ත කළ කල්හි, එම පුද්ගලයා විසින් ආයතනයට සේවය කරනු ලබන කාල පරිච්ඡේදය එම ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීම සඳහා රජයට සේවය කළ කාල පරිච්ඡේදයක් වශයෙන් සැලකිය යුතුය.

(6) මෙම වගන්තියෙහි රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් වන කල්හි "පාලන අධිකාරිය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ එම රාජ්‍ය සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම භාර කිනම් ආකාරයකින් හෝ විස්තර කරනු ලබන වෙනත් ආයතනයකි.

13. ආයතනයේ කිසිදු නිලධාරියෙකුට හෝ සේවකයෙකුට මණ්ඩලයේ එකඟත්වය රහිතව අන් කවර හෝ තැනැත්තෙකු වෙත ගෙවීමක් ලැබිය හැකි සේවා ලබා නොදිය යුතුය. ආයතනයේ නිලධාරීන් සහ සේවකයින් විසින් වෙනත් සේවා යෝජකවරුන් වෙත සේවයට සැපයීම.

iii වන කොට

මුදල්

14. (1) ආයතනයට එයටම අයත් අරමුදලක් තිබිය යුතුය. ආයතන අරමුදල

(2) (අ) ආයතනයේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව වරින් වර සම්මත කරනු ලැබිය හැකි සියලුම මුදල් සහ

(ආ) ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල පනතින් ස්ථාපිත කරන ලද සංචාරක සංවර්ධන

අරමුදලෙන් වියදම් සඳහා ආයතනයට ලැබිය හැකි සියලුම මුදල්.

(ඇ) ආයතනය ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදි, කාර්ය කිරීමේදි සහ කර්තව්‍ය ඉටු කිරීමේදි ලැබිය හැකි සියලුම මුදල්.

ආයතන අරමුදලට බැර කළ යුතුය.

(3) ආයතනය විසින් මෙම පනත යටතේ වන බලතල ක්‍රියාත්මක කිරීමේදි, කාර්ය කිරීමේදි සහ කර්තව්‍ය ඉටු කිරීමේදි දරන ලද සෑම වියදමක් ම පියවීමට අවශ්‍ය විය හැකි සියලුම මුදල් ප්‍රමාණ ආයතන අරමුදලෙන් ගෙවිය යුතුය.

15. (1) ආයතනයේ මුදල් වර්ෂය ලින් වර්ෂය විය යුතුය. ආයතනයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

(2) ආයතනයේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ සෙසු සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නියි ගිණුම් පවත්වාගෙන යා යුතුය.

(3) ආයතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ වේ.

## iv වන කොටස

සාමාන්‍ය

16. මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සහ ආයතනයේ නිලධාරීන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් සේ සළකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව වටහා ගත යුතුය. සාමාජිකයන් සහ ආයතනයේ නිලධාරීන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් සේ සැළකීම.

17. (1) ආයතනයේ කාර්යයන් සඳහා යම් නිශ්චල දේපලක් අත්පත් කර ගැනීමට අවශ්‍ය වූ කල්හි අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් එම දේපල රජයේ කාර්යයක් සඳහා අවශ්‍ය සේ සලකනු ලැබිය හැකි බවට යෝජිත අත්පත් කර ගැනීම අනුමත කර ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඒ අනුව අත්කර ගනු ලැබිය හැකි අතර, පසුව ආයතනය වෙත පවරනු ලැබිය හැකිය.

ආයතනය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපල අත්පත් කර ගැනීම.

(2) ආයතනය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපලක් අත්පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු කවර හෝ මුදලක් ආයතන අරමුදලෙන් ගෙවිය යුතුය.

18. (1) ආයතනයේ කාර්යයන් සඳහා රජය සතු නිශ්චල දේපලක් අවශ්‍ය වූ කල්හි, එම කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් ලබාදිය හැකි කාර්යයක් සේ සැලකිය හැකි අතර ඒ අනුව ආයතනයට එම දේපල විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් වශයෙන් පිරිනැමීමට එම ආඥාපනතේ මෙම විධිවිධාන අදාළ කර ගත යුතුය.

චංචල හෝ නිශ්චල රාජ්‍ය දේපලක් ආයතනයට ලබාදීම.

(2) රජය සතු චංචල දේපලක් ආයතනයේ කාර්යයන් සඳහා අවශ්‍ය වූ කල්හි, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් එවැනි දේපලක භාවිතය පිළිබඳ අයිතිය ආයතනය වෙත පැවරීම හෝ ආයතනය සතු කිරීම කළ හැකිය.

19 ආයතනයට ස්වකීය කාර්යයන් නිසි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය සේ සැලකිය හැකි ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් ආයතනයේ භාවිතය සඳහා ලබාදීමට විධිවිධාන සැලැස්වීමට රජයට හැකිය.

ආයතනයේ භාවිතය සඳහා පරිශ්‍ර සහ අනෙකුත් පහසුකම් ලබාදීමට රජය විසින් ලබාදිය යුතු බව.

20 මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති නියෝග අමාත්‍යවරයා විසින් ලිඛිතව ලබාදිය හැකි අතර, එම නියෝග මණ්ඩලය විසින් බලාත්මක කළ යුතුය.

මණ්ඩලයට ප්‍රතිපත්ති නියෝග ලබාදීමට අමාත්‍යවරයා සතු බලතල

21 (1) නීති සෑදීම සඳහා මෙම පනත මගින් බලය දී ඇති හෝ නියම කර ඇති කරුණු සම්බන්ධයෙන් නීති සකස් කිරීමට මණ්ඩලයට බලය ඇත.

නීති

(2) අමාත්‍යවරයා විසින් අනුමත කරන තුරු මණ්ඩලය විසින් සාදනු ලබන කිසිදු නීතියක් බලාත්මක නොවිය යුතුය.

22 (1) මෙම පනත බලාත්මක වන දිනට පෙර දින තෙක් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය සතු වුවද, එම මණ්ඩලය මගින් පවත්වාගෙන යන්නාවූ යම් හෝටල් පාසලක කාර්ය සඳහා භාවිත කරන ලද වූද, සියලුම චංචල සහ නිශ්චල දේපළ මෙම පනත ක්‍රියාත්මක කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ආයතනය සතු දේපලක් විය යුතුය.

(2) මෙම පනත ක්‍රියාත්මක වන දිනට පෙර දින ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සෑම හෝටල් පාසලකම සේවයෙහි නියුක්ත සියලුම නිලධාරීන් සහ සේවකයන් මෙම පනත ක්‍රියාත්මක වන දින සිට සියලුම කාර්යයන්

සඳහා මෙම ආයතනයේ නිලධාරීන් සහ සේවකයන් ලෙස සැලකිය යුතුය.

23. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උප ලේඛනය (වගන්තිය 7(3)

1. යම් තැනැත්තෙකු, උප ලේඛනය (7(3) වගන්තිය

(අ) පාර්ලිමේන්තුවෙහි හෝ පළාත් සභාවෙහි හෝ පළාත් පාලන ආයතනයක හෝ සාමාජිකයෙකු නම් හෝ වන්නේ නම්,

(ආ) ආයතනය විසින් එළැඹුනු ගිවිසුමක් හෝ ආයතනය වෙනුවෙන්,

හෝ යම් ගිවිසුමක් යටතේ සෘජුව හෝ වක්‍රාකාරව යම් අයිතියක් දරන්නේ නම හෝ යම් ප්‍රතිලාභයක් භුක්ති විඳී නම්,

(ඇ) මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ස්වකීය කාර්යයන් ඉටු කිරීමේදී අහිතකර ලෙස බලපෑ හැකි මූල්‍ය හෝ වෙන යම් ආකාරයක සුහසිද්ධියක් තිබේ නම්,

එවැනි පුද්ගලයෙකු මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයෙකු වශයෙන් රැඳී සිටීමට නුසුදුසු වන්නේ ය.

2. (1) 7(1) (උ) වගන්තිය යටතේ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලබන සෑම

සාමාජිකයෙකුම මිය යාම, ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම යනාදී හේතු මත කල් පිරීමට ප්‍රථම ධුරය හැර නොයත්තේ නම්, හැර වසර පහක කාලයක් ධුරයෙහි රැඳී සිටිය හැකිය.

(අ) 7(1) (උ) වගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයෙකු මියගිය හෝ ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කළ කල්හි එම ජේදයේ සඳහන් විධිවිධාන සලකා බැලීමෙන් අනතුරුව එම මියගිය හෝ ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කළ සාමාජිකයා වෙනුවට වෙනත් පුද්ගලයෙකු පත් කිරීමට අමාත්‍යවරයාට හැකිය.

(ආ) ඉහත (අ) ජේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයෙකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් කල් පිරීමට ප්‍රථම ධුරය හැරගියහොත්, හැර සිය පූර්වගාමියාගේ ඉතිරි ධුර කාලය තුළ ධුරයෙහි රැඳී සිටිය යුතුය.

3. 7 (1)(උ) වගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයෙකු අසනීපවීම හෝ වෙනත් දුර්වලතාවක් හෝ ශ්‍රී ලංකාවේ නොසිටීම හෝ හේතු කොටගෙන තාවකාලිකව ස්වකීය ධුරයෙහි රාජකාරි ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවන්හිදී, එම ජේදයේ විධිවිධාන සලකා බැලීමෙන් අනතුරුව එම සාමාජිකයා වෙනුවෙන් වැඩ බැලීමට වෙනත් පුද්ගලයෙකු පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත.

7(1) උ වගන්තිය යටතේ පෙන්වාදුන් හේතු මත මණ්ඩලයේ සාමාජිකයෙකු ධුරයෙන් පහ කිරීමට අමාත්‍යවරයාට බලය ඇත.

4 7(1) ට වගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයෙකුට අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම් දීමෙන් අනතුරුව අවශ්‍ය මොහොතක ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

5. ධූරයෙන් ඉවත් කිරීම මත හැර වෙන යම් හේතුවක් මත ධූරය හැර යන සාමාජිකයෙක් නැවත පත් කිරීමට සුදුසුකම් ලබන්නේය.

6. මණ්ඩලයෙහි සාමාජික ධූර පුරප්පාඩුව පැවතීම හෝ එයට සාමාජිකයෙකු පත් කිරීමේදී සිදුවන යම් අඩුලුහුඩුකමක් හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියාකාරකමක් හෝ කාර්ය පරිපාටියක් වලංගු නොවන බව නොව සැලකිය යුතුය.

7. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය සහිතව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි මණ්ඩලයේ අරමුදලෙන් කමිටු සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය හැකිය.

8. (1) අවම වශයෙන් සෑම මසකටම වරක් මණ්ඩලය රැස්විය යුතුය.

(2) සභාපතිවරයා විසින් ලේඛකාධිකාරි මගින් මණ්ඩලය විසින් පවත්වනු ලබන සෑම රැස්වීමක් පිළිබඳවම එක් එක් සාමාජිකයා වෙත අවම වශයෙන්දින හතකට පෙර ලිඛිතව දැනුම් දිය යුතු අතර අදාල රැස්වීමේදී කටයුතු කිරීමට අපේක්ෂා කරනු ලබන කාර්යයන් පිළිබඳව එහි සඳහන් කළ යුතුය.

(3) ඉහත 2 වන උපජේදයෙහි විධිවිධාන එසේ වුවද, අවම වශයෙන් මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුගේ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර දින හතක් ඇතුළත ලේඛකාධිකාරි මගින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවීමට සභාපතිට බලය ඇත.

(4) මණ්ඩලයේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය හතකි.

(5) සභාපතිවරයා විසින් මණ්ඩලයේ රැස්වීම්වල මූලසුන හෙබවිය යුතු අතර මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා සභාපති සහභාගී නොවන විට මේ රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන් තමන් අතරින් කෙනෙකු එම රැස්වීමේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත යුතුය.

(6) රෝගීවීම හෝ වෙනත් දුර්වලතාවක් හෝ ශ්‍රී ලංකාවේ නොසිටීම හේතු කොටගෙන ස්වකීය ධූරයෙහි රාජකාරි ඉටු කිරීමට සභාපතිවරයා තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, ඔහු වෙනුවෙන් එම ධූරයෙහි වැඩ බැලීමට වෙනත් පුද්ගලයෙකු පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත.

(7) මණ්ඩලයේ රැස්වීමකදී තීරණය කළයුතු කිසියම් කරුණක් සම්බන්ධයෙන් ඡන්දවල සමානත්වයක් ඇතිවන අවස්ථාවකදී සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුත්තේය.

(8) මෙහි සඳහන් විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට ස්වකීය කර්ය පටිපාටිය තීරණය කළ හැකිය.